# ශිෂ්‍ය අත්පොත

## අධ්‍යයන වර්ෂය 2022/2023



**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශ්‍රී ලංකාව**

## කැලණිය විශ්වවිද්‍යාලයේ ඉදිරි දැක්ම

තිරසාර සංවර්ධනයක් උදෙසා දැනුම නිර්මාණය කිරීමේ හා බෙදාහැරීමේ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානයක් බවට පත් වීම.

## කැලණිය විශ්වවිද්‍යාලයේ මෙහෙවර

නිර්මාණශීලිත්වය හා නව්‍යකරණය තුළින් ජාතික සංවර්ධනය උදෙසා බුද්ධිමත් පුරවැසියන් බිහිකිරීම.

## අරමුණු

- උසස් තත්ත්වයෙන් යුතු නම්‍යශීලි ඉගැන්වීමේ සහ ඉගෙනීමේ පරිසරයක් නිර්මාණය කිරිම.
- විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනිම සඳහා උසස් තත්ත්වයෙන් යුතු අධ්‍යයන සහ අනෙකුත් කාර්ය මණ්ඩලයක් සංවර්ධනය කිරිම.
- ගෝලීය ප්‍රමිතිකරණයෙන් යුතු උසස් තත්වයේ බහුවිධි පර්යේෂණ සංස්කෘතියක් බිහිකිරිම.
- ආර්ථික හා සමාජීය සම්බන්ධතා පුළුල් කිරිම මගින් විශ්වවිද්‍යාලයේ කීර්තිනාමය වර්ධනය කිරිම.
- ඵලදායී, කාර්යක්ෂම, පරිපාලන හා මූල්‍ය කළමනාකරණයක් තුළින් විශිෂ්ට පාලන පද්ධතියක් බිහි කිරිම.

## දුරකථන අංක


**කැලණිය විශ්වවිද්‍යාලය**

011 2903903 (Hotline)

**පරිගණක හා තාක්ෂණ පීඨය**

011 3442623

**වෛද්‍ය පීඨය**

011 2961000 (Hotline)

011 2956151 011 2956152
011 2956188 011 2958039
011 2958219

**ෆැක්ස් අංක**
**කැලණිය විශ්වවිද්‍යාලය**
011 2913857

**වෛද්‍ය පීඨය**
011 2958337

**වෙබ් අඩවිය**
www.kln.ac.lk

රාජකාරි ලිපිලේඛන ලේඛකාධිකාරී වෙත යොමු කළ යුතු ය.

**පර්යේෂණ හා ප්‍රකාශන අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශ්‍රී ලංකාව**

# අත්‍යවශ්‍ය දුරකථන අංක

| | දිගුව* | සෘජුව |
|---|---|---|
| විමසීම් | - 0 | 2903903 |
| උපකුලපති කාර්යාලය | - 101 | 2914474 |
| ලේඛකාධිකාරී කාර්යාලය | - 103 | 2911569 |
| අධ්‍යක්ෂක ශිෂ්‍ය කටයුතු | - 157 | 2908161 |
| ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක (වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය) | - 550 | 2903550 |
| ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක (පරිගණක හා තාක්ෂණ පීඨය) | - 3442623 | 3442623 |
| ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක (මානවශාස්ත්‍ර පීඨය) | - 694 | 2903694 |
| ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක (වෛද්‍ය පීඨය) | - | 2961139 |
| ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක (විද්‍යා පීඨය) | - 341 | 2914495 |
| ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක (සමාජීය විද්‍යා පීඨය) | - 865 | 2903865 |
| වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨ කාර්යාලය | - 502 | 2903502 |
| පරිගණක හා තාක්ෂණ පීඨය | - 8867102 | 2912709 |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | - 952/953 | 2903952 |
| මානවශාස්ත්‍ර පීඨ කාර්යාලය | - 702 | 2914484 |
| වෛද්‍ය පීඨ කාර්යාලය | - 129 | 2955283 |
| විද්‍යා පීඨ කාර්යාලය | - 202 | 2903202 |
| | | 2903201 |
| සමාජීය විද්‍යා පීඨ කාර්යාලය | - 808 | 2908168 |
| ශිෂ්‍ය සේවා අංශය | - 125 | 2911892 |
| සාමාන්‍ය පාලන අංශය | - 116 | 2914477 |
| ශාස්ත්‍රීය අංශය | - 105/106 | 2908163 |
| විභාග අංශය | - 112/113 | 2911706 |
| පුස්තකාලය | - 177/494 | 2903177 |
| වෛද්‍ය මධ්‍යස්ථානය | - 153 | 2903153 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය | - 421 | 2910163 |
| ශාරීරික අධ්‍යාපන අංශය | - 162 | 2913853 |
| වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය | - 181 | 2917711 |
| කලණ මිතුරු සෙවන | - 184 | 2917710 |
| විශ්වවිද්‍යාල ආරක්ෂක අංශය | | |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | - 147 | 2917714 |
| ප්‍රධාන කාර්යාලය - පරිපාලන ගොඩනැගිල්ල | - 143 | 2903143 |
| වැඩ අංශය | - 146 | 2903146 |
| විද්‍යා පීඨය | - 465 | 2903465 |
| නුවර පාර පිවිසුම් ඒකකය | - 191 | 2903191 |
| කාර්ය භාර ආරක්ෂක නිලධාරී, ප්‍රධාන කාර්යාලය | - 144 | 2903144 |
| | | 2917714 |
| පෞද්ගලික ආරක්ෂක අංශය - සමාජීය විද්‍යාපීඨ පිවිසුම | - 462 | 2903462 |
| පොලිස් ස්ථානය - කිරිබත්ගොඩ | | 2914985 |
| පොලිස් ස්ථානය - කැලණිය | | 2911922 |
| පොලිස් ස්ථානය - පෑලියගොඩ | | 2911222 |
| පොලිස් ස්ථානය - කඩවත | | 2925222 |

***බාහිර ඇමතුමක් ලබාගන්නේ නම් (2903 + දිගුව) ඇමතීමෙන් සම්බන්ධ විය හැකි ය**

# ශිෂ්‍ය අත්පොත 2022/2023
## කැලණිය විශ්වවිද්‍යාලය
## ශ්‍රී ලංකාව

### සංස්කරණය

මහාචාර්ය එස්.එස්. වැලිගමගේ මිය
සභාපතිනි - වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය ආර්.එම්.ඩී.ඒ.පී. රාජපක්ෂ මිය
සාමාජික - වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
ආචාර්ය අමිලා ජීවන්දර මෙය
සාමාජික - පරිගණක හා තාක්ෂණ පීඨය
ආර්. සමන් රාජපක්ෂ මයා
සාමාජික - සමාජීය විද්‍යා පීඨය
ආචාර්ය පී.කේ.එස්. ගොඩමුන්න මිය
සාමාජික - වෛද්‍ය පීඨය
ආචාර්ය සී.සී. කඩිගමුව මහතා
සාමාජික - විද්‍යා පීඨය
මහාචාර්ය බිහේෂ් ඉන්දික සම්පත් මයා
සාමාජික - මානවශාස්ත්‍ර පීඨය

### සෝදුපත් පරීක්ෂාව

මහාචාර්ය එච්.එම්.කේ. හේරත් මිය (සිංහල මාධ්‍ය)
සිංහල අධ්‍යයනාංශය
ඩී.අයි. ප්‍රනාන්දු මිය (ඉංග්‍රීසි මාධ්‍ය)
ඉංග්‍රීසි අධ්‍යයනාංශය

### කවර නිර්මාණය, ඇතුළත වර්ණ පිටු නිර්මාණය

ඩී.ඩී.ඒ.කේ. අමරකෝන් මයා
ලලිතකලා අධ්‍යයන අංශය

### සම්බන්ධීකාරක

එච්.කේ.ඩී.ඩබ්.එම්.එස්.කේ. හපුහින්න මිය
වැඩබලන නියෝජ්‍ය ලේඛකාධිකාරී - පර්යේෂණ හා ප්‍රකාශන අංශය

### පරිගණක අක්ෂර සංයෝජනය පිටු සැලසුම හා සැකසුම

දිලිනි ශාරංගි මෙය - පර්යේෂණ හා ප්‍රකාශන අංශය

### විශේෂ ස්තුතිය

ආයතන අධ්‍යනාංශයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී ඇතුළු සියලුම අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සන්නිවේදන සහ මාධ්‍ය ඒකකයේ අධ්‍යක්ෂකතුමා ඇතුළු කාර්ය මණ්ඩලය වෙත.

කැලණිය විශ්වවිද්‍යාලයෙන් පිරිනමනු ලබන ප්‍රථම උපාධි පාඨමාලා සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස 2022/2023 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි වූ විද්‍යාර්ථීන් සඳහා මෙම පොත සම්පාදනය කර ඇත. මෙහි සඳහන් ආචාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩලය හා සම්බන්ධ කොටස් 2024.01.31 දක්වා අදාළ වන පරිදි යාවත්කාලීන කර ඇති අතර පීඨාධිපතිවරුන්ගේ සහ අංශාධිපතිවරුන්ගේ තොරතුරු 2024.02.15 දින දක්වා යාවත්කාලීන කර ඇත.

# පටුන

පිටු අංක


උපකුලපතිතුමියගේ පණිවුඩය ........ 1

කැලණිය විශ්වවිද්‍යාලය ........ 2

සියලු ම විද්‍යාර්ථීන් විසින් දත යුතු පොදු කරුණු ........ 5

ශිෂ්‍ය උපකාරක සේවා........ 9

1. ශාස්ත්‍රීය අංශය........ 11
   1.1 නවක සිසුන් ලියාපදිංචිය........ 11
   1.2 පරිපාලන ලියාපදිංචිය ........ 11
   1.3 ශිෂ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම........ 11
   1.4 විශ්වවිද්‍යාල කාලය තුළ සිසුන්ගේ නම් භාවිත කිරීම........ 12
   1.5 අභියාචනා කමිටුව........ 12
   1.6 අධ්‍යයන වර්ෂය දීර්ඝ කර ගැනීම හා සම්බන්ධයෙන් පිළිපැදිය යුතු උපදෙස්........ 13

2. විභාග අංශය........ 15
   2.1 ලිඛිත පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ නීතිරීති........ 15
   2.2 විභාග අක්‍රමිකතා........ 19
   2.3 විභාග අක්‍රමිකතා පිළිබඳ ව පරීක්ෂණ පැවැත්වීම........ 20
   2.4 විභාග අක්‍රමිකතා සඳහා පනවනු ලබන දඬුවම්........ 20
   2.5 අනිවාර්ය දඬුවම්........ 22
   2.6 වෙනත් වැරදි........ 22
   2.7 විභාග අක්‍රමිකතාවයක් මත දඬුවම් පැමිණවූ සිසුන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා........ 22

3. ශිෂ්‍ය සේවා අංශය........ 24
   3.1 ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර සම්බන්ධ උපදෙස්........ 26
   3.2 ශිෂ්‍ය නේවාසිකාගාර සහ නේවාසිකාගාර නීතිරීති........ 28
   3.3 ශිෂ්‍ය සංගම් පිළිබඳ කරුණු........ 33
   3.4 විෂය සංගම් හා අනෙකුත් සංගම් පිළිබඳ කරුණු........ 34
   3.5 රැස්වීම්, උත්සව හා චිත්‍රපට සහ නාට්‍ය දර්ශන සංවිධානය කිරීම පිළිබඳ උපදෙස්........ 37
   3.6 චාරිකා සංවිධානය කිරීම පිළිබඳ උපදෙස්........ 37
   3.7 දැන්වීම් ප්‍රදර්ශනය කිරීම පිළිබඳ උපදෙස්........37

4. විශ්වවිද්‍යාල පුස්තකාලය........ 38

5. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය........ 45
6. කැලණිය විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය........ 47
7. මානවශාස්ත්‍ර පීඨය........ 49
   7.1 නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයනාංශය........ 54
   7.2 ඉංග්‍රීසි අධ්‍යයනාංශය........ 57
   7.3 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය........ 58

7.4 ලලිත කලා අධ්‍යයනාංශය........ 60
7.5 හින්දී අධ්‍යයනාංශය........ 62
7.6 වාග්විද්‍යා අධ්‍යයනාංශය........ 64
7.7 නූතන භාෂා අධ්‍යයනාංශය........ 67
7.8 පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය........ 69
7.9 සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය........ 73
7.10 සිංහල අධ්‍යයනාංශය........ 75
7.11 බටහිර සම්භාව්‍ය සංස්කෘති හා ක්‍රිස්තියානි සංස්කෘති අධ්‍යයනාංශය........ 77
7.12 අධ්‍යාපන ඒකකය........ 79
7.13 ආයතනික පුහුණුව හා ශක්‍යතා සංවර්ධන අධ්‍යයන ඒකකය ........ 80

8. සමාජීය විද්‍යා පීඨය........ 81
8.1 පුරාවිද්‍යා අධ්‍යයනාංශය........ 87
8.2 ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය........ 89
8.3 භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය........ 91
8.4 ඉතිහාසය අධ්‍යයනාංශය........ 94
8.5 ජාත්‍යන්තර අධ්‍යයනාංශය........ 96
8.6 පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය........ 97
8.7 ජනසන්නිවේදන අධ්‍යයනාංශය........ 99
8.8 දර්ශන අධ්‍යයනාංශය........ 101
8.9 දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය........ 103
8.10 සමාජ සංඛ්‍යානය අධ්‍යයනාංශය........ 104
8.11 සමාජ විද්‍යා අධ්‍යයනාංශය........ 105
8.12 ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය........ 107
8.13 තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය ........ 109

9. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවලට අදාළ මූලික කරුණු........ 110

10. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය........ 114
10.1 ගණකාධිකරණ අධ්‍යයනාංශය........ 120
10.2 වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය........ 123
10.3 මූල්‍ය අධ්‍යයනාංශය........ 126
10.4 මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය........ 129
10.5 අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය........ 131

11. විද්‍යා පීඨය........ 133
11.1 රසායන විද්‍යා අධ්‍යයනාංශය........ 140
11.2 කර්මාන්ත පරිපාලන අධ්‍යයනාංශය........ 142

11.3 ගණිත අධ්‍යයනාංශය. .......... 147
11.4 ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය.......... 149
11.5 භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රෝනික විද්‍යා අධ්‍යයනාංශය.......... 150
11.6 ශාක සහ අණුක ජීව විද්‍යා අධ්‍යයනාංශය.......... 152
11.7 සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයනාංශය. .......... 155
11.8 සත්ත්ව විද්‍යා සහ පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය.......... 157
11.9 මෘදුකාංග ඉජිනේරු ඉගැන්වීම් ඒකකය.......... 159
11.10 ක්‍රීඩා හා ශාරීරික විද්‍යා ඒකකය .......... 161

12. වෛද්‍ය පීඨය .......... 162
12.1 කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය.......... 170
12.2 ජෛව රසායන විද්‍යා සහ සායනික රසායන විද්‍යා අධ්‍යයනාංශය.......... 171
12.3 ආබාධිතතා අධ්‍යයනාංශය.......... 172
12.4 පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය..........174
12.5 අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය..........175
12.6 වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය..........176
12.7 වෛද්‍ය ක්ෂුද්‍රජීවී විද්‍යා අධ්‍යයනාංශය..........178
12.8 වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය.......... 179
12.9 ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය.......... 180
12.10 ළමාරෝග හා කෞමාරභෘතීය අධ්‍යයනාංශය.......... 181
12.11 පරපෝෂවේද අධ්‍යයනාංශය.......... 183
12.12 ව්‍යාධිවේද අධ්‍යයනාංශය.......... 184
12.13 භිෂග්වේදය අධ්‍යයනාංශය.......... 185
12.14 භෞතවේදය අධ්‍යයනාංශය.......... **186**
12.15 මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය.......... 187
12.16 මහජන සෞඛ්‍ය අධ්‍යයනාංශය.......... 188
12.17 ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය.......... 189

13. පරිගණක හා තාක්ෂණ පීඨය.......... 191
13.1 ව්‍යවහාරික පරිගණන අධ්‍යනාංශය.......... 199
13.2 පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යනාංශය.......... 200
13.3 මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයානාංශය.......... 201

14. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය.......... 202

15. ශිෂ්‍යත්ව, ස්වර්ණ මුද්‍රිකා සහ ත්‍යාග.......... 206
15.1 ශිෂ්‍යත්ව.......... 206
15.2 ස්වර්ණ මුද්‍රිකා.......... 209
15.3 ත්‍යාග.......... 217

**විෂය පරිබාහිර ක්‍රියාකාරකම් සහ ශිෂ්‍ය සුභසාධන සේවා** ........ 223

**16. කලා මණ්ඩලය** ........ 226

**17. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය** ........ 227

**18. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය** ........ 228

**19. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන කේන්ද්‍රය** ........ 229

**20. ජාත්‍යන්තර සබඳතා මධ්‍යස්ථානය** ........ 232

**21. තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS)** ........ 233

**22. සන්නිවේදන හා මාධ්‍ය ඒකකය කැලණිය විශ්වවිද්‍යාලය** ........ 237

**23. ආබාධ සහිත සිසුන් සඳහා සම්බන්ධීකාරක මධ්‍යස්ථානය** ........ 238

**24. සංස්කෘතික මධ්‍යස්ථානය** ........ 240

**25. කළණ මිතුරු සෙවණ** ........ 242

**26. වෛද්‍ය මධ්‍යස්ථානය** ........ 245

**27. ශාරීරික අධ්‍යාපන අංශය** ........ 247

**28. පර්යේෂණ සභාව** ........ 250

**29. ආරක්ෂක අංශය - කැලණිය විශ්වවිද්‍යාලය** ........ 251
**විනයාරක්ෂක නිලධාරීන්** ........ 252

**30. ශිෂ්‍ය උපදේශක සේවය** ........ 253

**31. තාක්ෂණ වාණිජකරණ හා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (CTTIL)** ........ 256

**ඇමුණුම 01- ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා කැලණිය විශ්වවිද්‍යාලය** ........ 259

**ඇමුණුම 02- 1998 අංක 20 දරන, අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත** ........ 272

**ඇමුණුම 03 - අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත**

**"අ" කොටස - 2015 අංක 4 දරන පනත** ........ 276

**"ආ" කොටස - 2017 අංක 27 දරන සංශෝධිත පනත** ........ 332

**ඇමුණුම 04- ආදී විද්‍යාර්ථී සංසද** ........ 334

# උපකුලපතිතුමියගේ පණිවුඩය



දයාබර විද්‍යාර්ථිනි,

කැලණිය විශ්වවිද්‍යාලය වෙත සරසවි වරම් ලද ඔබ සියලු දෙනා සමස්ත ආයතනය වෙනුවෙන් ම හෘදයාංගම ව පිළිගනිමි. මෙහි සිටින විද්වත් ප්‍රජාවෙහි මාර්ගෝපදේශකත්වය යටතේ මහත් අහ්ලාදයකින් යුක්ත ව අධ්‍යාපනයේ ආකර්ෂණීය වූ චාරිකාව ජය ගැනීම උදෙසා ඔබට සුභාශිංසන එක් කරමි.

කැලණිය විශ්වවිද්‍යාලය යනු හුදෙක් උසස් අධ්‍යාපන ආයතනයක් පමණක් නොවේ. එය නිර්මාණශීලිත්වයේ, සහයෝගීතාවයේ සහ ගවේෂණයේ කේන්ද්‍රස්ථානයකි. විශ්වවිද්‍යාලය මානව හා භෞතික සම්පත් අතින් දිනෙන් දින සංවර්ධනය කෙරෙන්නේ, විෂය නිර්දේශ ආදිය යාවත්කාලීන කෙරෙන්නේ ඔබ අධ්‍යාපනයේ නව මංපෙත් වෙත යොමු කොට ඔබගේ අභිලාෂයන් සාක්ෂාත් කර දීමේ අභිප්‍රායෙනි. නූතන ලෝකය ජයගත හැකි දැනුම, ආකල්ප හා කුසලතාවලින් සන්නද්ධ උපාධිධාරී ප්‍රජාවක් සමාජයට දායාද කරවීමේ ආධ්‍යාශයෙනි.

කැලණිය විශ්වවිද්‍යාලයට පැමිණෙන ඔබ දැනුම අත්පත් කර ගැනීම පමණක් නොව මානව සබඳතා ගොඩනගා ගැනීම, විවේචනාත්මක චින්තන කුසලතා වර්ධනය කර ගැනීම, සාහිත්‍ය-කලා-සංස්කෘතික-ක්‍රීඩා කටයුතුවලට සහ ශිෂ්‍ය සංගම්වල කටයුතුවලට සම්බන්ධ වීම වැනි විෂය බාහිර ක්‍රියාකාරකම්වල ද නිරත වීමට මතක තබා ගන්න. ඔබගේ දැනුම් වපසරිය හා අත්දැකීම් ලෝකය පුළුල් කර ගත හැකි සෑම අවස්ථාවක් ම ප්‍රයෝජනයට ගන්න. අභියෝග වැළඳගන්න. අර්ථවත් සංවාදවල නිරත වන්න.

රජයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයක් වශයෙන් අපි ඔබගේ සාර්ථකත්වය උදෙසා නිරන්තරයෙන් ඇප-කැප වන්නෙමු. ඔබගේ අධ්‍යාපන කටයුතු සඳහා සහාය වීමට අපගේ කාර්යමණ්ඩල නිරන්තරයෙන් සූදානම්ය. කැලණිය විශ්වවිද්‍යාලය ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලින් උසස් ස්ථානයක් ලබාගෙන ඇති බව (2024 TOP 1501+) සහ හරිත මෙට්‍රික් ශ්‍රේණිගත කිරීමේ දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල අතර ප්‍රමුඛස්ථානය ලබාගෙන ඇති බව මේ අවස්ථාවේ දී ඔබ වෙත සිහිපත් කරන්නේ අපගේ ආයතනය පිළිබඳ මහත් ආඩම්බරයකිනි.

විශ්වවිද්‍යාලය තුළ ඔබ ලබන අත්දැකීම්, ඔබ සහභාගී වන ක්‍රියාකාරකම් ආදිය ඔබගේ අධ්‍යාපන චාරිකාවට පමණක් නොව නායකත්ව කුසලතා වර්ධනය කිරීමටත්, කල් පවත්නා මිත්‍රත්වයන් ඇති කර ගැනීමට සහ ජීවිත කාලය පුරාවට ම ඔබ සමඟ රැඳීසිටින මතකයන් නිර්මාණය කිරීමටත් උපකාරී වනු ඇත. සරසවියේ ගෙවන මෙම වසර කිහිපය ඔබගේ ජීවිතයේ අනුස්මරණීය හා ආකර්ෂණීය ම කාලපරිච්ඡේදය වනු ඇත.

සරසවි දිවිය ප්‍රතිඵලදායක අයුරින් ගත කොට වෙසෙස් දැනුමක් අත්පත් කර ගැනීමටත්, ලෝකය දෙස විමර්ශනාත්මක ව බලා වඩාත් යහපත් වූ ලෝකයක් ගොඩනැගීමටත් ඔබට ශක්තිය හා ධෛර්‍ය ප්‍රාර්ථනා කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා
උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය

# කැලණිය විශ්වවිද්‍යාලය

**පූර්වාරම්භය**

1860 රත්මලානේ පුරාණ විහාරයේ පැවිදි හා ගිහි ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා ආරම්භ කළ ප්‍රාචීන පන්තිය, මෙම ඓතිහාසික විද්‍යාස්ථානයේ පූර්වාරම්භයයි. අනතුරු ව, පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක නාහිමියන් විසින් 1875 දී විද්‍යාලංකාර පිරිවෙන යනුවෙන් කැලණිය, පෑලියගොඩ පිහිටුවනු ලැබ, එවක් පටන් ශතවර්ෂාධික කාලයක් තුළ ප්‍රාචීන භාෂා ශාස්ත්‍රාධ්‍යයන කාර්ය විෂයයක ව ලෝක විශ්‍රුත ව පැවත, 1957 අංක 45 දරන විද්‍යෝදය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පනත අනුව 1959 ජනවාරි මස 01 දින ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය යනුවෙන් විශ්වවිද්‍යාල භාවයෙන් සම්භාවිත වූ විද්‍යාස්ථානයේ කාලක්‍රමානුයාත වූ අනුප්‍රාප්තිකායතනයයි. යථෝක්ත විද්‍යාලංකාර පිරිවෙන විශ්වවිද්‍යාලභාවයෙන් ප්‍රතිෂ්ඨාපිත කෙරුණු අවධියේ තත් පරිවේණාධිපතිව වැඩ විසූ අපවත් වී වදාළ පූජ්‍ය කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම අභිනව විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති වශයෙන් පත් කරනු ලැබූහ.

**විද්‍යාලංකාර මණ්ඩපය කැලණිය විශ්වවිද්‍යාලය බවට පත්වීම**

1972 අංක 01 දරන විශ්වවිද්‍යාල පනත මඟින් ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල එකම විශ්වවිද්‍යාලයක් බවට පත් කරනු ලැබූ අවස්ථාවේ 1972 පෙබරවාරි 15 වන දින සිට මෙම විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය බවට පත් විය. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් 1978 දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ව්‍යුහය සංශෝධනය කරනු ලැබූ අවස්ථාවේ දී යථෝක්ත මණ්ඩපය කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව ලෙසින් ස්වායත්ත විශ්වවිද්‍යාලයක් බවට පත් කෙරිණි. 1957 පනත අනුව ආරම්භයේදී ගිහි - පැවිදි ශිෂ්‍යයින් පමණක් ඇතුළත් කරනු ලැබූ මෙම ආයතනයට, 1966 අංක 20 දරන ජාතික උසස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක කරනු ලැබීමත් සමඟ ම ශිෂ්‍යාවන් ද ඇතුළත් කරගත හැකි විය.

**අද්‍යතන අවදිය**

ආරම්භයේ පෑලියගොඩ පිරිවෙන් භූමියෙහි ම පිහිටුවනු ලැබූ මෙම විශ්වවිද්‍යාලය ඉඩකඩ මදිවීම නිසා නොබෝ කලකින් වෙනත් භූමි භාගයකට ගෙන යාමේ අවශ්‍යතාව ඇති විය. ඒ අනුව 1965/1966 අධ්‍යයන වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය කැලණිය දළුගම පරිශ්‍රයේ පිහිටි ගොඩනැගිලිවලට ගෙන එන ලදි. විශ්වවිද්‍යාලය ආරම්භ කරනු ලැබූ 1959 දී එය භාෂා, බෞද්ධ අධ්‍යයන, කලා, විද්‍යා, දර්ශන හා පර්යේෂණ යන පීඨ පහකින් සමන්විත විය. අද වන විට එය මානවශාස්ත්‍ර, සමාජීය විද්‍යා, විද්‍යා, වෛද්‍ය විද්‍යා, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන සහ පශ්චාත් උපාධි අධ්‍යයන, පරිගණක හා තාක්ෂණ වශයෙන් හැඳින්වෙන පීඨ හතකින් සහ අධ්‍යයනාංශ 55 කින් සමන්විත වේ.

**අගනුවර පිහිටීම**

කොළඹට කි.මී. 08 ක් පමණ උතුරින් කැලණිය, දළුගම පිහිටා ඇති මෙම විශ්විද්‍යාලයට කොළඹ-මහනුවර මාර්ගයෙන් ඉතා පහසුවෙන් ළඟා විය හැකි ය. දුම්රිය මාර්ග භාවිතයේ දී ආසන්න හා පහසුම දුම්රිය ස්ථානය වනුයේ පට්ටිය හන්දිය පිහිටි කැලණිය දුම්රිය ස්ථානයයි. විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය රාගම පරිශ්‍රයේත්, පරිගණක හා තාක්ෂණ පීඨය පෑලියගොඩ පරිශ්‍රයේත් පිහිටා ඇති අතර, අනෙකුත් සියලු පීඨ පිහිටා ඇත්තේ කැලණිය, දළුගම පරිශ්‍රයෙහි ය.

**අනුබද්ධ ආයතන**

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ අධ්‍යයන ආයතන දෙකකි. ඒවා නම් කොහුවල පිහිටි පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයත්, කොළඹ 07හි පිහිටි පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයත් ය.

# කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති



ශ්‍රී කල්‍යාණි රජමහා විහාරය හා කිත්සිරිමෙවන් කැලණිය රජමහා විහාරය යන උභය විහාරාධිපති, අග්ගමහා පණ්ඩිත, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික) අතිගෞරවාර්හ කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නායක ස්වාමීන් වහන්සේ

# විශ්වවිද්‍යාල නිලධාරීහු



උපකුලපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ආර්. ද සිල්වා මිය
MBBS (C'bo), MSc (Lond.), MD (C'bo)



පීඨාධිපති - වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

මහාචාර්ය ඩබ්.එම්.සී.බී. වන්නිනායක මයා
B.Sc. (Mkt) Mgt. (Special) (S.J'Pura), Dip.M. (UK), MBA (C'bo), PhD (TUB- Czech Republic)



පීඨාධිපති - පරිගණක හා තාක්ෂණ පීඨය

ආචාර්ය චමිලි පුෂ්පකුමාර මයා
B.Sc. (Special) (Kel'ya), PhD (Sheffield Hallam, UK)



පීඨාධිපති - පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඩී.කේ.පී.ජේ. සෙනෙවිරත්න මයා
B.Sc. (Kel'ya) Ph.D. (Wayne State, USA), M.I.Chem.C.,C.Chem



පීඨාධිපති - මානවශාස්ත්‍ර පීඨය

ආචාර්ය යූ. සුදත් සෙනරත් මයා
B.A. (Kel'ya), M.Phil. (Kel'ya), P.hD. (Kel'ya)



පීඨාධිපති - වෛද්‍ය පීඨය

මහාචාර්ය එම්.එන්. චන්ද්‍රතිලක මයා
M.B.B.S. (C'bo), MMED (Dundee), Ph.D (Dundee)



පීඨාධිපති - විද්‍යා පීඨය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදත් ආර්.ඩී. කාලිංගමුදලි මයා
BSc (Kel'ya), PhD (Sheffield), CSci, CEng, CPhys, FIET, FInstP, FIP (SL), MIEEE



පීඨාධිපති - සමාජීය විද්‍යා පීඨය

මහාචාර්ය එම්.එම්. ගුණතිලක මයා
B.A. (Kel' ya), M.A. (S.J'pura), Ph.D. (Kel' ya)



ලේඛකාධිකාරි

කේ.කේ.කේ. ධර්මතිලක මයා
BA (Hons) Econ SP (C'bo), PGDBFA(ICASL), MSSc Econ (Kel'ya), MBA (Kel'ya)



පුස්තකාලයාධිකාරි

ආචාර්ය සී.සී. ජයසුන්දර මයා
B.A. (Stat, Ruhuna), MSc (Sheffield) DLitt. (South Africa), AALIA (CP) Australia)



මූල්‍යාධිකාරි

යූ.ටී.එම්.අයි.ඩී. තෙන්නකෝන් මිය (අධ්‍යයන නිවාඩු)
B.Sc. (S.J'pura), FCA, CPFA, MBA (UOC)

# සියලු ම විද්‍යාර්ථීන් විසින් දත යුතු පොදු කරුණු

**තොරතුරු සන්නිවේදනය**
විශ්වවිද්‍යාලය මඟින් විද්‍යාර්ථීන්ට අදාළ විවිධ කරුණු සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන නිවේදන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය සහ ශිෂ්‍ය සේවා අංශය, පීඨ කාර්යාල, අධ්‍යයනාංශ, ශිෂ්‍ය මධ්‍යස්ථානය, ශිෂ්‍ය නේවාසිකාගාර, වෛද්‍ය මධ්‍යස්ථානය හා ප්‍රධාන දේශනශාලා, විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය සහ දැන්වීම් පුවරු ආදි පොදු ස්ථානයන්හි ප්‍රදර්ශනය කෙරේ.

## 1. ශිෂ්‍ය ලියාපදිංචිය

### (i) විශ්වවිද්‍යාලයීය ලියාපදිංචිය

සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේ දී ම අභ්‍යන්තර විද්‍යාර්ථීන් ලියාපදිංචි කිරීම සිදු කරනු ලබන්නේ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය අංශය මඟිනි. එම අංශය විසින් මාර්ගගතව නියම කරනු ලබන කාල සීමාව තුළ සෑම විද්‍යාර්ථියකු ම ලියාපදිංචිය අලුත් කරවා ගත යුතු ය. විශ්වවිද්‍යාලයේ **අභ්‍යන්තර** විද්‍යාර්ථියකු වශයෙන් ලියාපදිංචි කරනු ලබන ඕනෑ ම විද්‍යාර්ථියකුට විශ්වවිද්‍යාල භූමියට නිදහසේ පිවිසීමට ද, ඔවුන් උදෙසා විශ්වවිද්‍යාලයෙන් සපයනු ලබන පහසුකම් භුක්ති විඳීමට ද හිමිකම් ලැබේ.

ලියාපදිංචි කරනු ලබන සියලු ම විද්‍යාර්ථීන් සඳහා විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය අංශය මඟින් හැඳුනුම්පත්/ශිෂ්‍ය වාර්තා පොත් නිකුත් කෙරේ. විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයකු, නිලධාරියකු හෝ ආරක්‍ෂක නිලධාරියකු විසින් ඉල්ලා සිටිනු ලබන සෑම අවස්ථාවක දී ම එකී හැඳුනුම්පත හෝ ශිෂ්‍ය වාර්තා පොත හෝ ඉදිරිපත් කිරීමෙන් ඔවුන් ස්වකීය අනන්‍යතාව තහවුරු කළ යුතු වේ.

### (ii) විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන ලියාපදිංචිය, විෂයයන් හා පාඨමාලා ඒකක තෝරා ගැනීම

විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන ලියාපදිංචිය සිදු කරනු ලබන්නේ අදාළ පීඨ මඟිනි. මානවශාස්ත්‍ර, සමාජීය විද්‍යා හා විද්‍යා පීඨවල විද්‍යාර්ථීන්ට විෂයයන් හා පාඨමාලා ඒකක තෝරා ගැනීම සහ අධ්‍යයන ලියාපදිංචිය සඳහා **අධ්‍යයන වර්ෂය ආරම්භ කළ දින සිට සති දෙකක කාලයක්** දෙනු ලැබේ. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයෙහි පාඨමාලා තෝරා ගැනීම සහ අධ්‍යයන ලියාපදිංචිය සඳහා **අධ්‍යයන වර්ෂය ආරම්භ කළ දින සිට සතියක කාලයක්** දෙනු ලැබේ. **මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨවල** එම කාර්යය **අන්තර්පීඨ විෂයමාලා සම්බන්ධීකරණ මධ්‍යස්ථානය** (Inter-Faculty Centre for Co-ordinating the Modular System, ICCMS) මඟින් ද, **විද්‍යා සහ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන යන පීඨ දෙකෙහි පීඨ කාර්යාල** මඟින් ද සිදු කරනු ලැබේ. එක් එක් පීඨ මඟින් පවත්වාගෙන යනු ලබන උපාධි පාඨමාලා පිළිබඳ ව වැඩි විස්තර ඒ ඒ පීඨ මඟින් නිකුත් කරන ශිෂ්‍ය අත්පොත්වල සඳහන් වේ. වෛද්‍ය පීඨය හා පරිගණක හා තාක්ෂණ පීඨයේ ප්‍රථම වසර පාඨමාලා ඒකක තෝරාගැනීමක් නොවන බැවින් වාර්ෂික ව ලියාපදිංචිවන විද්‍යාර්ථීන් විභාගය සඳහා ලියාපදිංචි විය යුතුවේ. වෛද්‍ය පීඨයේ මෙය විභාග ඒකකය හරහා සිදුකරනු ලැබේ.

## 2. ශාස්ත්‍රවේදී හා විද්‍යාවේදී ගෞරව උපාධි සඳහා ලියාපදිංචි කිරීම

ප්‍රථම වර්ෂයේ විභාග ප්‍රතිඵලවලට අනුව, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨවල විද්‍යාර්ථීන් ද, ප්‍රථම සහ දෙවන වර්ෂවල විභාග ප්‍රතිඵල මත විද්‍යා පීඨයේ විද්‍යාර්ථීන් ද, පිළිවෙළින් ශාස්ත්‍රවේදී ගෞරව හා විද්‍යාවේදී ගෞරව උපාධි සඳහා ලියාපදිංචි කර ගනු ලැබේ. විශේෂ විෂය ප්‍රවේශය

යටතේ ඇතුළත් වන විද්‍යාර්ථීන් ප්‍රථම වර්ෂ විභාග අවසානයේ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය සඳහා ලියාපදිංචි වන විට විශේෂ විෂය ප්‍රවේශයට ඇතුළත් වූ විෂයය ම ප්‍රධාන විෂය ලෙස අනිවාර්යයෙන් ම තෝරා ගත යුතු ය.

### 3. දේශන හා අභ්‍යාස/ප්‍රායෝගික පන්තිවලට සහභාගී වීම

විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි නොවූ කිසිදු විද්‍යාර්ථියකුට දේශන සහ අභ්‍යාස/ප්‍රායෝගික පන්තිවලට සහභාගි වීම සපුරා තහනම් වේ. ලියාපදිංචි වූ සෑම විද්‍යාර්ථියකු ම තමන්ට නියමිත දේශනයන්ට සහ අභ්‍යාස/ප්‍රායෝගික පන්තිවලට අනිවාර්යයෙන් ම සහභාගි විය යුතු ය. සෞඛ්‍ය හේතූන් මත යම්කිසි විද්‍යාර්ථියකුට දේශනවලට සහ අභ්‍යාස/ප්‍රායෝගික පන්තිවලට සහභාගි වීමට නොහැකි වුවහොත්, ඒ පිළිබඳ වෛද්‍ය සහතිකයක් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරීගෙන් ලබාගෙන අධ්‍යයනාංශ ප්‍රධාන හා තමන් අයත් පීඨයේ පීඨාධිපති මඟින් නියෝජ්‍ය ලේඛකාධිකාරී (ශාස්ත්‍රීය) වෙත ඉදිරිපත් කළ යුතු ය.

### 4. අභියාචනා ඉදිරිපත් කිරීම

අධ්‍යයන කටයුතු හෝ විභාග සඳහා වන අභියාචනා නියමිත ආකෘති පත්‍රය භාවිතාකර අදාළ කාලය තුල ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

අභියාචනා ඉදිරිපත් කල හැකි හේතු හා ඉදිරිපත් කල යුතු ආකාරය මෙම අත් පොතෙහි ශාස්ත්‍රීය අංශය යටතේ පිටු අංක හි සවිස්තරාත්මක ව දක්වා ඇත.
අභියාචනා පිළිබඳ ව විශ්වවිද්‍යාලය මඟින් ගනු ලබන තීරණ අදාළ විද්‍යාර්ථීන්ගේ පෞද්ගලික ලිපිනයන්ට යොමු කරනු ලැබේ. විශ්වවිද්‍යාලය මඟින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවන්හි දී එය නැවත ඉදිරිපත් කළ යුතු වන හෙයින් එකී තීරණ ඇතුළත් ලිපිය සුරැකිව තමන් ළඟ තබා ගත යුතු වේ.

### 5. විභාග පැවැත්වීම පිළිබඳ නීති-රීති

විශ්වවිද්‍යාලයේ විභාග කටයුතු සංවිධානය කරනු ලබනුයේ අදාළ පීඨ මඟින් හා විශ්වවිද්‍යාලයේ විභාග අංශය මඟිනි. විභාග කටයුතු හා අදාළ නීති-රීති විද්‍යාර්ථීන්ගේ දැනගැනීම සඳහා විභාග අංශය පිළිබඳ තොරතුරු ඇතුළත් කොටසෙහි සඳහන් වේ.

### 6. ශිෂ්‍ය උපදේශනය සහ ශිෂ්‍ය සුභසාධක කමිටුව

විද්‍යාර්ථීන් සඳහා ශිෂ්‍ය උපදේශක හා සුභසාධන සේවාවන් රැසක් සැපයේ. ශිෂ්‍ය නේවාසිකාගාර නීති-රීති, ශිෂ්‍ය සංගම් හා විෂය සංගම් කටයුතු සඳහා අදාළ උපදෙස් විද්‍යාර්ථීන්ගේ දැන ගැනීම පිණිස ශිෂ්‍ය සේවා අංශය පිළිබඳ තොරතුරු ඇතුළත් කොටසෙහි සඳහන් වේ.

ශිෂ්‍ය සුභසාධන කටයුතු පවත්වාගෙන යාම හා පාලනය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් **ශිෂ්‍ය සුභසාධක කමිටුව** පත් කරනු ලැබ ඇත. එහි සංයුතිය මෙසේ යඃ උපකුලපති, පීඨාධිපතිවරු, ලේඛකාධිකාරී, ශිෂ්‍ය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරයෙකු, ප්‍රධාන නේවාසිකාගාර පාලකවරයෙකු හා පාලිකාවකු, ශිෂ්‍ය උපදේශක භික්ෂූන් වහන්සේ නමක, ශිෂ්‍ය උපදේශිකාවක, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සේවා), ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ සහ එක් එක් පීඨයකින් ශිෂ්‍ය නියෝජිතයෙකු වශයෙනි.

### 7. විද්‍යාර්ථීන්ගේ හැසිරීම

විශ්වවිද්‍යාල විද්‍යාර්ථීහු වනාහි වයෝපූර්ණත්වයට පත් වූ වැඩිහිටියෝ ය. ඔවුහු ද අනෙකුත් සියලු පුරවැසියන් මෙන් ම රටේ බලපවත්වන සාමාන්‍ය නීතියට යටත් වූවෝ වෙති.

සියලු විද්‍යාර්ථීහු

(i) රටේ පවත්නා පොදු නිති-රීතිවලට පටහැනි වෙමින් ශාස්ත්‍රීය කටයුතුවලට හා පරිපාලන කාර්යයන්ට බාධා වන අයුරින් කටයුතු කිරීමෙන් හෝ,

(ii) විශ්වවිද්‍යාලයේ කිසිදු ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍යාවකට ශාරීරික ව, වාචික ව හෝ මානසික ව පීඩා කිරීමෙන් හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට බාධා කිරීමෙන් හෝ,

(iii) විශ්වවිද්‍යාලයේ මානව හා භෞතික සම්පත් ඇතුළු අනෙකුත් දේපළවලට හානි වන ලෙස ක්‍රියා කිරීමෙන් හෝ,

(iv) විශ්වවිද්‍යාල භූමියේ දී හෝ ඉන් පිටත දී හෝ විශ්වවිද්‍යාලයේ ගරුත්වයට හානි වන ආකාරයට හැසිරීමෙන් වැළකී සිටිය යුත්තාහ.

විශ්වවිද්‍යාලයන්හි සාමය පවත්වාගෙන යාම මඟින් සෑම විද්‍යාර්ථියකුට ම ඉගෙනීමට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා 1998 අංක 20 දරන උසස් අධ්‍යාපන ආයතනවල නවක වදය හා වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇත. මෙම පනත අනුව,

- සාපරාධී භය ගැන්වීම
- අඩස්සියට ගැනීම
- අයුතු ලෙස අවහිර කිරීම
- අයුතු ලෙස සිර කර තැබීම
- අධ්‍යයන ආයතනයක බලහත්කාරයෙන් පදිංචි වීම හා ඒ දේපළවලට අලාභහානි සිදු කිරීම

යන ක්‍රියා සම්බන්ධයෙන් කරන ලද වරදක් සඳහා පුද්ගලයකු අධිකරණය මඟින් වරදකරු කළ හැකි ය. එසේ වරදකරු කළ විට වරදේ බරපතලකම අනුව, ඒ තැනැත්තා හෝ තැනැත්තිය බන්ධනාගාරගත කිරීම හෝ දඩයකට යටත් කිරීම හෝ ඒ දෙක ම හෝ කළ හැකි ය.

වරදේ ස්වභාවය අනුව, සමහර විටෙක ඇප ලබා දීමේ බලය ඇත්තේ ද මහාධිකරණ විනිශ්චයකාරවරයකුට පමණි. එසේ ම වරදේ බරපතළකම අනුව අත්අඩංගුවට පත් අය ඇප පිට මුදා නොහැරීමට ද පුළුවන. තව ද වරදකරු වූ තැනැත්තා හෝ තැනැත්තිය අධ්‍යාපන ආයතනයෙන් නෙරපා හැරීමට ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත, ඔබගේ අවධානය සඳහා ඇමුණුම 02 ලෙස මෙම ශිෂ්‍ය අත්පොතට ඇතුළත් කර ඇති අතර, සියලු ම සිසුන් එය නිවැරදි ව අධ්‍යයනය කරනු ඇතැ'යි විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි.

ශිෂ්‍ය විනය පවත්වාගෙන යාම සඳහා විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් විනය කමිටුවක් පත් කරනු ලැබ ඇති අතර, තෝරාගත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙම විනය කමිටුවට ඇතුළත් වනු ඇත.

**8. විශ්වවිද්‍යාලයීය ආරක්ෂක සේවාව**

විශ්වවිද්‍යාලයීය ආරක්ෂක සේවාව විශ්වවිද්‍යාල ප්‍රජාවගේ සහ දේපළවල ආරක්ෂාව සඳහා දවසේ පැය 24 පුරා ම ක්‍රියාත්මක වේ. ආරක්ෂක අංශය ශිෂ්‍ය කටයුතුවල දී ශිෂ්‍ය සේවා අංශය හා ශිෂ්‍ය

උපදේශක සේවාව සමඟ සහාය අංශයක් ලෙස කටයුතු කරයි. විවිධ උත්සව අවස්ථාවල දී එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සංවිධාන කටයුතුවලට ද සහාය වෙයි.

විශ්වවිද්‍යාලය හා සම්බන්ධ උත්සව අවස්ථාවල දී විශේෂ ආරක්ෂාව සැලසීම, විශ්වවිද්‍යාලයේ නීති, නියෝග ක්‍රියාත්මක කිරීම සහ සාමය හා විනය පවත්වා ගැනීම සඳහා පරිපාලන නිලධාරීන්ට හා ආචාර්ය මණ්ඩලයට සහාය දැක්වීම ආරක්ෂක අංශය වෙත පැවරුණු වෙනත් කාර්යභාරයෝ වෙති.

**9. විශ්වවිද්‍යාල භූමියට ඇතුළු වීම හා රැඳී සිටීම**

විද්‍යාර්ථීන් රාත්‍රී අටෙන් පසුව විශ්වවිද්‍යාල භූමියෙහි හේතු විරහිත ව රැඳී නොසිටිය යුතු ය. එසේ රැඳී සිටින්නවුනට විශ්වවිද්‍යාලයෙන් පිටවන ලෙස ආරක්ෂක නිලධාරීන් විසින් උපදෙස් දෙනු ඇත.

දේශන සහ අභ්‍යාස පන්ති අවසන් වීමෙන් සහ පුස්තකාලය වසනු ලැබීමෙන් අනතුරුව, අනුමත රැස්වීමක්, සාදයක්, රැඟුමක්, හෝ උත්සවයක් වැනි අවස්ථාවක දී හැරෙන්නට විද්‍යාර්ථීන් විශ්වවිද්‍යාල භූමියෙහි රැඳී නොසිටිය යුතු ය. යථෝක්ත වේලාවල නේවාසික සිසුන් අදාළ බලධාරීන්ගෙන් නිසි පරිදි ලබා ගත් අවසරයක් නොමැති ව තම ශිෂ්‍ය නේවාසිකාගාරවලින් බැහැර ව නොසිටිය යුතු ය.

# ශිෂ්‍ය උපකාරක සේවා



# ශිෂ්‍ය උපකාරක සේවා



එච්.කේ.ඩී.ඩබ්.එම්.එස්.කේ. හපුහින්න මිය
නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශාස්ත්‍රීය අංශය



ආර්. ලෝගේන්ද්‍ර මයා
නියෝජ්‍ය ලේඛකාධිකාරී
විභාග අංශය



ඩබ්.ඒ.කේ.බී. වෙත්තසිංහ මෙය
සහකාර ලේඛකාධිකාරී
ශිෂ්‍ය සේවා අංශය



ආචාර්ය සී.සී. ජයසුන්දර මයා
පුස්තකාලයාධිකාරී
පුස්තකාලය



ආචාර්ය ඒ.පී.ආර්. වික්‍රමාරච්චි මයා
අධ්‍යක්ෂ
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය



අර්ජුන් ද සිල්වා මයා
වෙබ් මාස්ටර්
කැලණිය විශ්වවිද්‍යාලයීය - වෙබ් අඩවිය

# 01. ශාස්ත්‍රීය අංශය

**නියෝජ්‍ය ලේඛකාධිකාරි**
එච්.කේ.ඩී.ඩබ්.එම්.එස්.කේ. හපුහින්න මිය
*B.A. (Perad'ya), PG Dip in Eng (Perad'ya), MBA (Perad'ya)*

### 1.1 නවක සිසුන් ලියාපදිංචිය.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් තෝරා ගන්නා සිසුන්ගේ දත්ත විශ්වවිද්‍යාලය වෙත යොමු කිරීමෙන් අනතුරුව මෙම විශ්වවිද්‍යාල විසින් මාර්ගගතව නවක සිසුන් ලියාපදිංචිය සිදු කරනු ලබයි. මෙම ලියාපදිංචියේදී අදාළ සහතිකවල සාමදාන විනිශ්චයකාරවරයෙකුගේ හෝ විදුහල්පති ලවා සහතික කළ සත්‍ය පිටපත් එම පද්ධතියට උඩුගත කළ යුතුය. තවද මාර්ග ගත පද්ධතිය මගින් යොමු කරන අංක 16 කේත අංකයට තම ගෙවීම සිදු කළ යුතුය. නවක ලිපිගොනු පවත්වාගෙන යාම ද දැනට මාර්ගගත ව සිදු කරන බැවින් වැඩිදුර තොරතුරු අවශ්‍ය වන අවස්ථාවක එකී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු වේ.

සියලු ම විද්‍යාර්ථීන් සඳහා නියමිත ශිෂ්‍ය නම්නීකරණ වැඩසටහන පසු වී මාස තුනක් ඉක්මවූ පසු ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් යොමු කරන ලද විද්‍යාර්ථීන් ලියාපදිංචිකර දීම සිදු වුවද අධ්‍යයන කටයුතු සඳහා අන්තර්ගත කරගන්නේ ඊළග ශිෂ්‍ය කණ්ඩායම සමග බව සලකනු මනාය.

### 1.2 පරිපාලන ලියාපදිංචිය

මෙය තම ශිෂ්‍යභාවය සක්‍රීයව තබා ගැනීම සඳහා නවක විද්‍යාර්ථීන් හැර සියලු විද්‍යාර්ථීන් විසින් සිදු කළ යුත්තකි.

ශිෂ්‍යයන්ගේ පරිපාලන ලියාපදිංචිය සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයට පෙර ශාස්ත්‍රීය අංශය මගින් සිදු කෙරේ. ඒ අනුව සියලු ම විද්‍යාර්ථීන් අදාළ කාලය තුළ විශ්වවිද්‍යාලය විසින් ලබාදුන් ඊ මේල් ලිපිනයට යොමු වන දැන්වීමෙහි උපදෙස් පිළිපදිමින් අදාළ කාලය තුළ එය සිදුකරගත යුතු වේ.

මෙහිදී ද ලියාපදිංචි තොරතුරු පද්ධතිය හරහා තමා වෙනුවෙන් නිකුත් වන අංක 16 කේත අංකයට ගෙවීම් කිරීම අත්‍යවශ්‍ය වේ. එසේ නොකර වෙනත් අංකයකට ගෙවීම් අවස්ථාවකදී තමා විසින් කරන ගෙවීම විශ්වවිද්‍යාලයට බැර වූ බව තහවරු කර ගත නොහැක්කේ නම් නැවත ගෙවා ලියාපදිංචිය කර ගත යුතු බව සැලකුව මනාය.

අවසන් වසර විද්‍යාර්ථීන් ඊළග අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වීම අනවශ්‍ය වන අතර යම් හෙයකින් විභාගයට නැවත පෙනීසිටීමට අවශ්‍ය වුවහොත් හෝ අධ්‍යයන වර්ෂය කල් ලබා ගැනීමක් සිදු වුවහොත් එම අදාළ අධ්‍යයන වර්ෂය හෝ වර්ෂවලට ලියාපදිංචි විය යුතුය.

### 1.3 ශිෂ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම

සෑම විද්‍යාර්ථියකු ම තම අධ්‍යයන කාලය තුළ හැඳුනුම්පතක් සහිත ව සිටිය යුතු ය. ඒ අනුව ලියාපදිංචි වූ සෑම විද්‍යාර්ථියෙකුට ම ශාස්ත්‍රීය අංශය මඟින් හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ. යම් හෙයකින් විද්‍යාර්ථියකුගේ ශිෂ්‍ය හැඳුනුම්පත නැති වුවහොත් නව හැඳුනුම්පතක් ලබා ගැනීමට, ඒ බව **පොලිසියට පැමිණිලි කොට එම පැමිණිලි වාර්තාවේ පිටපතක්,** අදාළ විද්‍යාර්ථියාගේ ඉල්ලීම ද සමඟ **රු.500/ක ගාස්තුවක්** විශ්වවිද්‍යාල සරප් කවුන්ටරය වෙත ලබා ගන්නා ලදුපත සමඟ **ඉදිරිපත් කළ** යුතු ය.

**1.4 විශ්වවිද්‍යාල කාලය තුළ සිසුන්ගේ නම් භාවිත කිරීම**

විශ්වවිද්‍යාල කාලය තුළ සිසුන්ගේ නම් භාවිත කිරීම පිළිබඳ ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කර ඇති 2021.11.05 දිනැති චක්‍රලේඛ අංක 09/2021 හි සඳහන් කොන්දේසි සියලු ම සිසුන්ගේ දැන ගැනීම සඳහා මෙහි දක්වා ඇත. සිසුන්ගේ නම් පිළිබඳ සියලු කටයුතු එම චක්‍රලේඛයේ අඩංගු නියමය පරිදි සිදු කෙරෙන බව දන්වන අතර, එම කොන්දේසිවලට පටහැනි ව කටයුතු සිදු නොකළ යුතු බව විද්‍යාර්ථීන් තරයේ සිහි තබා ගත යුතු ය.

(අ) උපාධි සහතිකවල නම් වෙනස් කිරීම පිළිගනු ලබන්නේ නිසි නීතිමය ක්‍රියා පටිපාටිය අනුගමනය කර ඇත්නම් පමණි.

(ආ) උපාධි සහතිකවල ඇතුළත් කරනු ලබන්නේ කිසියම් පාඨමාලාවක් සඳහා අපේක්ෂකයා විසින් ලියාපදිංචි කරන ලද නමයි.

(ඇ) අපේක්ෂකයාගේ ඉල්ලීම පරිදි කිසියම් නමක කොටස්වල අභ්‍යන්තර වෙනස් කිරීමක් සඳහා ඉඩ දෙනු ලබන්නේ එකී සෑම කොටසක් ම තම උප්පැන්න සහතිකයේ සඳහන් වී ඇත්නම් පමණි.

(ඈ) අවසාන උපාධි පරීක්ෂණය සඳහා කිසියම් නමකින් ලියාපදිංචි වීමෙන් පසු ව පැවිදි විද්‍යාර්ථියෙකු ගිහි බව ලැබුවහොත්, උපාධි සහතිකය නිකුත් කරනු ලබන්නේ එම විද්‍යාර්ථියාගේ උප්පැන්න සහතිකයේ සඳහන් නමට පමණි. එමෙන් ම ගිහි අයෙකු පැවිදි දිවියට ඇතුළත් වන්නේ නම් ද අදාළ පැවිදි සහතිකය උපාධිය බලපැවැත්වෙන දිනට පෙර ඉදිරිපත්කර තිබිය යුතු වේ.

(ඉ) ඉහත (අ,ආ,ඇ,ඈ) යන නමෙහි වෙනස්කම් කිරීම සලකනු ලබන්නේ නිසි නීතිමය ක්‍රියාමාර්ග සම්පූර්ණකර අදාළ ඉල්ලීම උපාධි බලපවත්වන දිනට පෙර යොමුකළ හොත් පමණි.

**1.5 අභියාචනා කමිටුව**

පහත කරුණු පිළිබඳ ව විද්‍යාර්ථීන්ට යම් ගැටලුවක් වේ නම්, එය නිරාකරණය කිරීම සඳහා අභියාචනා කමිටුව පිහිටුවා ඇතඃ

(අ) වෛද්‍ය හේතූන් හෝ වෙනත් හේතූන් මත විභාගයට පෙනී සිටීමට නොහැකි වීම.

(ආ) ප්‍රවේශයට කල් ලබා ගැනීම/අධ්‍යයන වර්ෂය කල් දමා ගැනීම.

(ඇ) නිවාඩු ලබා ගැනීම. (දේශීය/විදේශීය)

(ඈ) අභියාචනා කමිටුවට පිළිගත හැකි වෙනත් පුද්ගලික හේතු.

ඉහත සඳහන් අවශ්‍යතා සඳහා නියමිත ආකෘති පත්‍රය යොදා ගනිමින් ද නියමිත අදාළ පීඨයේ පීඨාධිපතිතුමා මඟින් අභියාචනා කමිටුව වෙත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. මෙම කාණ්ඩ සඳහා නියමිත අයදුම්පත්‍ර ශාස්ත්‍රීය අංශයෙන් ද ලබා ගත හැකිය.

වෛද්‍ය හේතූන් මත විභාගයට පෙනී සිටිමට නොහැකි අවස්ථාවල දී අයදුම්පත ප්‍රථමවතාවට පෙනී සිටින සේ සලකා බැලීමට නම් පහත දැක්වෙන ආකාරයට වෛද්‍ය සහතික ඉදිරිපත් කළ යුතුවේ.

1. විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරි විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික

2. රජයේ රෝහලකින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික (දේශීය/බටහිර)

3. විශේෂඥ වෛද්‍යවරයකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික (දේශීය/බටහිර)

4. පෞද්ගලික හෝ රජයේ රෝහල්ගතවීමකින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික (දේශීය/බටහිර)

❖ **තොරතුරු වසන් කර කරුණු ඉදිරිපත් කර විභාග වංචාවක් සිදු කරන ශිෂ්‍යයන්ට දඬුවම් ලබා දීම:-**

විද්‍යාර්ථියකු සත්‍ය තොරතුරු වසන්කොට විශ්වවිද්‍යාල අධිකාරිය නොමඟ යැවීමට උත්සාහ දරා ඇති බව තහවුරු වූ විට එය විභාග අක්‍රමිකතාවයක් ලෙස සලකා අක්‍රමිකතා කමිටුව මඟින් දඬුවම් පමුණුවනු ඇත. පහත අවස්ථා එසේ නොමඟ යැවීම් ලෙස හඳුනාගත හැක.

1. විභාගයට පෙනී සිට අසමත්වී, එය වසන්කොට ඊළඟ අවස්ථාවක දී ප්‍රථමවතාවට පෙනී සිටින බව පිළිබිඹු වන පරිදි
වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම.

2. නියමිත විභාගයට පෙනී නොසිට ඊළඟ අවස්ථාවක දී ප්‍රථමවතාවට පෙනී සිටින බව පිළිබිඹු වන පරිදි වෛද්‍ය
සහතික ඉදිරිපත් කිරීම.

3. අභියාචනා කමිටුවෙන් නිර්දේශිත අධ්‍යයන වර්ෂයේ පෙනී නොසිට ඊළඟ අවස්ථාවක දී ප්‍රථමවතාවට පෙනී සිටින
බව පිළිබිඹු වන පරිදි වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම.

**උපාධිය සම්පූර්ණකර ගැනීම.**

කැලණිය විශ්වවිද්‍යාලයේ තත්ත්ව ආරක්ෂකතා මාර්ගෝපදේශයට අනුව විද්‍යාර්ථියකු ප්‍රථම උපාධිය සම්පූර්ණ කර ගැනීමට අඛණ්ඩ ව අධ්‍යයන වර්ෂ 5 ක් ඇතුළතත් ගෞරව උපාධි සම්පූර්ණකර ගැනීමට අඛණ්ඩ ව අධ්‍යයන වර්ෂ 6 ක් ඇතුළතත් පාඨමාලාව සම්පූර්ණ කර තිබිය යුතුය. මෙම කාලසීමාවෙන් ඔබ්බට උපාධිය සම්පූර්ණ නොකරන ලද අවස්ථාවලදී එම ඉල්ලීම අභියාචනා මණ්ඩලයට යොමු කළ යුතු අතර ඒ සඳහා ඉදිරිපත් කර ඇති හේතු වෙන වෙන ම සලකා බලා තීරණය කෙරෙන අතර එම ඉල්ලීම් ලියාපදිංචියේ සිට අඛණ්ඩව වසර 10 ක් ඇතුළත ඉදිරිපත්කර තිබිය යුතු වේ. වසර 10 ඉක්මවා උපාධිය සම්පූර්ණ කිරීමට යොමු කරන ලද අභියාචනා කිසිම හේතුවක් මත සලකා නොබැලේ.

මෙකී වසර 5 හෝ 6 කාලය තුල අසමත්වීම හේතුවෙන් නැවත පෙනීසිටීමට සිදුවන අවස්ථාවලට අභියාචනා ඉදිරිපත් කිරීම අනවශ්‍ය වන අතර එතැන් සිට වසර 10 ක් දක්වා විභාගයට පෙනී සිටින අවස්ථා සඳහා අභියාචනා ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීම අත්‍යවශ්‍ය වේ.

**1.6 අධ්‍යයන වර්ෂය දීර්ඝ කර ගැනීම හා සම්බන්ධයෙන් පිළිපැදිය යුතු උපදෙස්**

කිසියම් විද්‍යාර්ථියකුහට තමාට අදාළ අධ්‍යයන වර්ෂය තුළ අධ්‍යයන කටයුතු කරගත නොහැකි වන්නේ නම් අධ්‍යයන වර්ෂය කල් ලබා ගැනීමක් නිල වශයෙන් ලබාගත යුතුය.

(අ) පළමුවැනි අධ්‍යයන වර්ෂය දීර්ඝකර ගැනීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන් අධ්‍යයන වර්ෂය ආරම්භ කරන දිනයට පෙර ඒ සඳහා හේතු ලිඛිත සාක්ෂි සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ඉදිරිපත් කරනු ලබන්නේ වෛද්‍ය හේතු නම්, රජයේ රෝහලකින් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර තිබිය යුතු ය. ඉදිරිපත් කර ඇත්තේ පෞද්ගලික වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් නම්, එය විශ්වවිද්‍යාලයීය ප්‍රධාන වෛද්‍ය නිලධාරීවරයාගෙන් සහතික කරවාගෙන ඉදිරිපත් කළයුතු ය.

(ඇ) ඉදිරිපත් කරනු ලබන්නේ ආර්ථික හේතු මත නම්, එම හේතු සනාථ කිරිම සඳහා ප්‍රදේශයේ ග්‍රාමනිලධාරී හා ප්‍රාදේශිය ලේකම්ගෙන් සහතික කළ ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) පෞද්ගලික හේතු මත ඉදිරිපත් කරන්නේනම් ඒ බව සනාත කිරීම සඳහා අවශ්‍ය ලේඛන ඉදිරිපත් කළ යුතු වේ.

2022/2023 අධ්‍යයන වර්ෂයේ සිට ඉදිරියට විභාගවලට පෙනී සිටීම සඳහා වෛද්‍ය හේතුමත අභියාචනා ඉදිරිපත් කිරිමේ දී ඒ සඳහා අදාල ගාස්තු පහත පරිදි වේ.

.

| **ගෙවීම් වර්ගය** | **මුදල (පාඨමාලා ඒකකයට)** | **දෙවන, තුන්වන වරට ඉදිරිපත් කරන** |
|---|---|---|
| වෛද්‍ය වාර්තා | රු. 100.00<br>පාඨමාලා ඒකකයට | රු.500.00<br>පාඨමාලා ඒකකයකට |
| නැවත පෙනී සිටීම් ඕනෑම අවස්ථාවක | රු. 500.00<br>පාඨමාලා ඒකකයට | - |

දුරකථන අංක - 011 2908163, 011 2903104, 011 2903105, 011 2903106
විද්‍යුත් ලිපිනය - officeacad@kln.ac.lk, stureg@kln.ac.lk
වෙබ් අඩවිය - administration.kln.ac.lk/academic/

# 02. විභාග අංශය

**නියෝජ්‍ය ලේඛකාධිකාරි**
**ආර්.ලෝගේන්ද්‍ර මයා**
*B.Sc. (Jaffna), Postgraduate Diploma in Business & Finance Administration (ICASL)*

කැලණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් සඳහා ලියාපදිංචි වූ සිසුන්ගේ සියලු ම විභාග සම්බන්ධීකරණය කරනු ලබන්නේ කැලණිය විශ්වවිද්‍යාලයේ විභාග අංශය මගිනි. විභාග අංශවල කාර්යයන් අතරට (i) විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් අනුමත කරන ලද අනුමත විභාග රෙගුලාසිවලට අනුව එක් එක් විභාග සඳහා අවශ්‍ය නිවේදන නිකුත් කිරීම සහ ලිඛිත විභාග පැවැත්වීම පිළිබඳ නීති රීති සහ උපදෙස් සැපයීම, (ii) විභාග ප්‍රතිඵල මණ්ඩල පැවැත්වීම ඇතුළත් වේ. එක් එක් අධ්‍යයන වැඩසටහන සම්බන්ධයෙන් සහ ප්‍රතිඵල නිකුත් කිරීම, (iii) අධ්‍යයන වාර්තා නිකුත් කිරීම සහ ප්‍රතිඵල සත්‍යාපනය කිරීම, (iv) පීඨ, ආයතන සහ මණ්ඩප මගින් පවත්වනු ලබන විභාග සම්බන්ධීකරණය කිරීම, (v) විභාග අක්‍රමිකතා විමර්ශන කමිටුව පැවැත්වීම සහ (vi) වාර්ෂික සාමාන්‍ය උපාධි පාඨමාලා සංවිධානය කිරීම විභාග අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. උපාධි පාඨමාලාවල විභාගවලට අමතර ව සහතික පත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි පාඨමාලා සම්බන්ධ විභාග ද විභාග අංශය මගින් පවත්වනු ලැබේ.

**අපේක්ෂකයින් කැලණිය විශ්වවිද්‍යාලයේ විභාග සඳහා පෙනී සිටින විට පහත සඳහන් නීති රීති පිළිපැදිය යුතුය.**

## 2.1 ලිඛිත පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ නීතිරීති

2.1.1 විභාග අපේක්ෂකයන් නියමිත ප්‍රශ්න පත්‍රය ඇරඹීමට විනාඩි 15කට පෙර විභාග ශාලාව අසලට පැමිණිය යුතු අතර, විභාග ශාලාධිපති දැනුම් දුන් විට පමණක් විභාග ශාලාවට පිවිසිය යුතු ය.

2.1.2 විභාග අපේක්ෂකයන් විභාග ශාලාවට පිවිසි වහා ම තමාගේ අංකය දරන අසුනෙහි අසුන් ගත යුතු අතර, විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය මත හැර කිසි විටෙක තම ආසනය වෙනස් කළ නොහැකි ය.

2.1.3 පරීක්ෂණය ආරම්භ වී විනාඩි 30කට පසු ව කිසි ම විභාග අපේක්ෂකයකු ශාලාවට ඇතුළත් කර ගනු නොලැබේ. පරීක්ෂණය ආරම්භ වී විනාඩි 30ක් ගත වීමට පෙර මෙන් ම, පරීක්ෂණය අවසන් වීමට නියමිත අවසන් විනාඩි 30 ඇතුළත ද විභාග අපේක්ෂකයන්ට ශාලාවෙන් පිටවීමට අවසර දෙනු නොලැබේ.

2.1.4.1 සියලු ම විභාග අපේක්ෂකයන් ස්වකීය විභාග ප්‍රවේශ පත්‍රය විභාග අංශයෙන් හෝ පීඨ කාර්යාලයෙන් ලබාගත යුතු අතර ශිෂ්‍ය වාර්තා පොත/ ශිෂ්‍ය හැඳුනුම්පත සමඟ සිය අත්සන යොදා අත්සන ආචාර්යවරයකු විසින් සනාථ කරවා ගත යුතු ය.

2.1.4.2 එම ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය.

2.1.4.3 එබඳු අවස්ථාවක දී විභාගයට පෙනී සිටීම සඳහා ශාලාධිපති විසින් සපයනු ලබන ආකෘති පත්‍රයක විභාග අපේක්ෂකයා අත්සන් කොට ප්‍රකාශයක් ලබා දිය යුතු අතර, ඊළඟ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අවස්ථාවේ දී අනිවාර්යයෙන්ම ඉහත සඳහන් කළ අනන්‍යතාව තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

2.1.4.4 විභාග අපේක්ෂකයා පෙනී සිටින අවසාන හා එක ම ප්‍රශ්න පත්‍රය මෙය නම්, ඉහත සඳහන් ලේඛන ඊළඟ වැඩ කරන දිනයේ දී අදාළ පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/සහකාර ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කළ යුතු ය.

2.1.4.5 විභාගය අතරතුර දී යම් හෙයකින් ශිෂ්‍ය වාර්තා පොත/ශිෂ්‍ය හැඳුනුම්පත නැති වුවහොත් එහි දෙවන පිටපතක් විෂය හැඳුනුම්පත් අදාළ පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/සහකාර ලේඛකාධිකාරි වෙතින් ලබා ගත යුතු ය.

2.1.4.6 ශිෂ්‍ය වාර්තා පොතෙහි/ශිෂ්‍ය හැඳුනුම්පතෙහි සඳහන් නම හා විභාග ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් නම අතර වෙනසක් ඇත්නම් ඒ බව තහවුරු කොට ලේඛකාධිකාරිගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. එබඳු සහතිකයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විට ජාතික හැඳුනුම්පත හෝ බලය ලත් පුද්ගලයකු විසින් සහතික කරනු ලැබූ මෑතක දී ලබා ගත් ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතු ය.

2.1.5 විභාග ශාලා නිරීක්ෂක ඉදිරිපිට දී විභාග අපේක්ෂකයින් තම ප්‍රවේශ පත්‍රයේ නියමිත ස්ථානයෙහි අත්සන් කිරීමෙන් අනතුරු ව දිනපතා විභාග ප්‍රවේශ පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රයේ අදාළ කොටස විභාග ශාලා නිරීක්ෂකට භාර දිය යුතු ය. ඉන් අනතුරු ව විභාගයට පෙනී සිටින සෑම වාරයක දී ම විභාග ප්‍රවේශ පත්‍රයේ නියමිත ස්ථානයෙහි අත්සන් කළ යුතු ය.

2.1.6 විභාග අපේක්ෂකයන් තමන්ගේ ප්‍රයෝජනය සඳහා පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් ආදි වශයෙන්, නීත්‍යානුකූල ව අවසර ලබා දී ඇති අවශ්‍ය උපකරණ පමණක් රැගෙන ආ යුතු ය. මීට අමතර ව පරීක්ෂණයේ දී අනිසි අන්දමින් ප්‍රයෝජනට ගත හැකි කිසි ම ලියවිල්ලක් හෝ සටහනක් හෝ උපකරණයක් විභාග ශාලාවට නොගෙනෙන බවට වග බලා ගත යුතු ය. විශේෂයෙන් ජංගම දුරකතන, ගණක යන්ත්‍ර හෝ වෙනත් විද්‍යුත් සන්නිවේදන උපකරණ හෝ වෙනත් කිසිදු තාක්ෂණික උපකරණයක් ළඟ තබා ගැනීම තහනම් ය.

2.1.7 විභාග ශාලාධිපති විසින් ඉල්ලා සිටි අවස්ථාවක දී විභාග අපේක්ෂකයන් තමා භාරයේ හෝ ළඟ ඇති ඕනෑ ම ලිපි-ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් හෝ ඕනෑම උපකරණයක් ඉදිරිපත් කළ යුතු ය.

2.1.8 කිසිම විභාග අපේක්ෂකයකු තවත් විභාග අපේක්ෂකයකුගෙන් කිසි ම දෙයක් ඉල්ලා ගැනීම, හුවමාරු කර ගැනීම, කතාබස් කිරීම හෝ කොපි කිරීම නොකළ යුතු ය. වෙනත් විභාග අපේක්ෂකයකුගෙන්/පුද්ගලයකුගෙන් හෝ කුමන අන්දමක හෝ ආධාරයක් ලබා නොගත යුතු ය. වෙනත් අපේක්ෂකයකුගෙන් කොපි කිරීම හෝ වෙනත් අපේක්ෂකයකුට කොපි කිරීමට අනුබල දීම හෝ උපකාර කිරීම ද නොකළ යුතු ය.

2.1.9 නියමිත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීම සඳහා එදිනට නිකුත් කරන ලද උත්තර ලියන පොත් හා කඩදාසි පමණක් යොදා ගත යුතු ය. පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර උත්තර ලියන පොත් හෝ/ සහ උත්තර ලියන කඩදාසියේ එදිනට වලංගු දින මුද්‍රාව සහ ඒ මත ශාලාධිපතිගේ හෝ නිරීක්ෂකගේ අත්සන් තිබේ ද යන්න පරීක්ෂා කර බැලීම විභාග අපේක්ෂකයාගේ වගකීම වේ. උත්තර ලියන පොත්වල හෝ කඩදාසිවල වලංගු දින මුද්‍රාව සමඟ ශාලාධිපතිගේ හෝ නිරීක්ෂකගේ අත්සන් නැත්නම් පිළිතුරු ලිවීම ආරම්භ නොකළ යුතු අතර, ඒ බව වහා ම විභාග ශාලාධිපති වෙත දැනුම් දී වලංගු දින මුද්‍රාව සහ පෙර කී අයෙකුගේ අත්සන සඳහන් ලිපි-ලේඛන ලබා ගැනීම විභාග අපේක්ෂකගේ වගකීම වේ.

2.1.10 පිළිතුරු ලිවීම සඳහා අවශ්‍ය කෙරෙන ලිපි ද්‍රව්‍ය (ලියන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ඇඳීමේ කඩදාසි, ලෙජර් හා ජර්නල් කොල යනාදිය) අවශ්‍ය වන පරිදි විභාග අපේක්ෂකයන් වෙත

නිකුත් කරනු ලැබේ. තමාට දෙන ලද කිසිදු කඩදාසියක් හෝ ලියන පොතක් ඉරා දැමීම, සූරා දැමීම, නැවීම, පොඩි කිරීම හෝ වෙනත් අයුරකින් විනාශ කර දැමීම හෝ නොකළ යුතු ය. ශාලාධිපති/නිරීක්ෂක විසින් දෙන ලද ලිපි ද්‍රව්‍ය පමණක් පාවිච්චි කළ යුතු අතර, තමා වෙත සපයන ලද සියලු ම ලිපි ද්‍රව්‍ය හා උපකරණ (පාවිච්චි කළ හෝ නොකළ) ස්වකීය මේසය මත ම තබා යා යුතු ය. ඒවා විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම සම්පූර්ණයෙන් තහනම් ය.

2.1.11 පිළිතුරු ලිවීමට පෙර, තමාට අයත් ලියාපදිංචි අංකය හා පරීක්ෂණයේ නම පැහැදිලි ලෙස පිළිතුරු පතෙහි අදාළ ස්ථානයෙහි ලිවිය යුතු ය. පිළිතුරු ලිවීමට යොදා ගන්නා අනෙකුත් සියලු ම කඩදාසිවල ද ස්වකීය විභාග අංකය සටහන් කර තිබිය යුතු ය. කිසි ම විභාග අපේක්ෂකයකු ස්වකීය නම හෝ වෙනත් හඳුනාගැනීමේ සලකුණු යනාදිය පිළිතුරු පත්‍රවල නොලිවිය යුතු ය. කෙනෙකුගේ පිළිතුරු පත්‍රයට වෙනත් විභාග අංකයක් යෙදීම පරීක්ෂණ විෂමාචාරයක් ලෙස සලකනු ලැබේ. ලියාපදිංචි අංකය යොදා නොමැති හෝ හඳුනාගත නොහැකි පිළිතුරු පත් ප්‍රතික්ෂේප කෙරේ.

2.1.12 කටුවැඩ ආදිය සඳහා යොදා ගන්නා ලද කඩදාසි හා ලියන කඩදාසි ද පිළිතුරු පත්‍රය සමඟ අමුණා තැබිය යුතු ය. එහෙත් පිළිතුරු පත්‍රයට අනවශ්‍ය කොටස් පැහැදිලි සේ ඉරි ගසා කපා දැමිය යුතු ය. ප්‍රවේශ පත්‍රයේ, කාල සටහනේ, ප්‍රශ්න පත්‍රයේ හෝ ශිෂ්‍ය වාර්තා පොතේ කටුවැඩ නොකළ යුතු ය. මෙම උපදෙස් නොපිළිපදින අපේක්ෂකයන් විභාග නීතිරීති උල්ලංඝනය කළා සේ සලකනු ලැබේ.

2.1.13 විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළ විභාග ශාලාධිපතිට නිරීක්ෂකවරුන්ට සහ අනෙකුත් අපේක්ෂකයන්ට බාධා හෝ හිරිහැර නොවන සේ හැසිරිය යුතු ය. විභාග ශාලාව තුළ හා අවට නිශ්ශබ්දතාව රැකිය යුතු ය. හදිසි අවස්ථාවක දී හැර විභාගය පවත්නා අතරතුර විභාග ශාලාවෙන් තාවකාලික ව බැහැර යාමට අවසර නොදෙනු ඇත. හදිසි අවස්ථාවක දී නිරීක්ෂක විසින් තම පරීක්ෂාව යටතේ තාවකාලික ව බැහැර යාමට අවසර දිය හැකි ය. ඉහත උපදෙස් අනුව නොහැසිරෙන අය විභාග ශාලාවෙන් ඉවත් කිරීමට ශාලාධිපතිට බලය තිබේ. පරීක්ෂණය පැවැත්වෙන විට විභාග ශාලාව තුළ දී ශාලාධිපති හෝ නිරීක්ෂකවරයකු සමඟ හැර වෙනක් අය සමඟ කථාබහ කිරීම සම්පූර්ණයෙන් තහනම් අතර, ගැටලු මතුවන අවස්ථාවල දී තම අසුනේ සිට අත එසවීමෙන් ශාලාධිපති හෝ නිරීක්ෂකගේ අවධානය ලබා ගත හැක.

2.1.14 විභාග අපේක්ෂකයින්තමාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමට පහසු වන ආකාරයේ සුදුසු ඇඳුමක් හැඳගෙන විභාග ශාලාවට පැමිණිය යුතු ය.

2.1.15 කිසි ම විභාග අපේක්ෂකයකු තමා විසින් ම ලියන ලද පිළිතුරු මිස ක්ෂේත්‍ර පොතක් හෝ ක්ෂේත්‍ර වැඩසටහනක් හෝ නිබන්ධනයක්, හෝ විභාගයක් සඳහා මුළුමණින් ම හෝ කොටසක් වශයෙන් හෝ අන්‍ය තැනැත්තෙකු විසින් කරන ලද්දක් ඉදිරිපත් නොකළ යුතු ය.

2.1.16 කිසි ම අපේක්ෂකයකු තමා වෙනුවෙන් වෙනත් කෙනෙකුට පරීක්ෂණයට ඉදිරිපත් වීමට අවසර නොදිය යුතු අතර, වෙනත් කෙනෙකු වෙනුවෙන් පෙනී සිටීමට ද කිසිදු අපේක්ෂකයකුට අවසර නැත.

2.1.17 විභාග ශාලාවේ දී උද්ගත වන ඕනෑම කරුණක් වෙනුවෙන් විභාග අපේක්ෂකයකුගෙන් ප්‍රශ්න කිරීමට සහ ප්‍රකාශ ලබා ගැනීමේ පූර්ණ බලතල විභාග ශාලාධිපති සතුවන බව

විභාග අපේක්ෂකයන් දැන සිටිය යුතු ය. එවැනි අවස්ථාවක දී පිළිතුරු ලබාදීමට සහ ප්‍රකාශ අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමට විභාග අපේක්ෂකයකුට නොහැකි වේ.

2.1.18 විභාගය අවලංගු කිරීමට හෝ කල් දැමීමට හේතුවන තත්ත්වයක් උද්ගත වී ඇතැයි විභාග ශාලාධිපතිට ඒත්තු ගියහොත්, වහා ම විභාගය නවත්වා පිළිතුරු පත්‍ර එකතු කොට ඒ පිළිබඳ ව වහා ම නිසි බලධාරීන්ට වාර්තා කිරීමට ශාලාධිපති කටයුතු යොදනු ඇත.

2.1.19 විභාග ශාලාධිපති විසින් විභාගය නැවැත්වීමේ සංඥාව දුන් වහා ම අපේක්ෂකයන් සියලු ම වැඩ නැවැත්විය යුතු වන අතර, මෙම උපදෙස් නොපිළිපදින්නන් පිළිබඳ ව විභාග අංශයට දැන්වීමේ අයිතිය ශාලාධිපති/නිරීක්ෂක සතු වේ.

2.1.20 විභාග අපේක්ෂකයන් ස්වකීය පිළිතුරු පත්‍ර ශාලාධිපතිට හෝ නිරීක්ෂකවරයකුට හෝ සියතින් ම භාර දිය යුතු ය. එමෙන් ම පිළිතුරු පත් එකතු කරන තෙක් සිය අසුනේ ම රැඳී සිටිය යුතු ය. කවර කරුණක් නිසාවත් පිළිතුරු පත්‍ර ශාලා සේවකයකුට හෝ වෙනත් අයකුට භාර නොදිය යුතු ය. පිළිතුරු පත්‍ර භාර දුන් පසු මොන ම කරුණක් නිසාවත් එය ආපසු ඉල්ලා ගැනීමේ අයිතියක් අපේක්ෂකයකුට නැත.

2.1.21 කිසි ම අපේක්ෂකයකුට තමාගේ හෝ වෙනත් අපේක්ෂකයකුගේ පිළිතුරු පත් විභාග ශාලාවෙන් පිටත ට ගෙන යා නොහැක.

2.1.22 පරීක්ෂණයේ දී අනිසි අන්දමින් ප්‍රයෝජනයට ගත හැකි කිසි ම ලියවිල්ලක් හෝ සටහනක් හෝ උපකරණයක් තමන් වෙත නොමැති බවට සෑම විභාග අපේක්ෂකයකු ම වග බලා ගත යුතු ය. තව ද කිසි ම උපකරණයක් හෝ ලියවිල්ලක් හෝ සටහනක් හෝ අනිසි අන්දමින් තම ප්‍රයෝජනයට ගැනීමට වෑයම් නොකළ යුතු ය. පරීක්ෂණ විෂමාචාරයක යෙදෙන බවට හෝ යෙදී ඇති බවට සැක මතු විය හැකි සෑම ක්‍රියාවකින් ම වැළකීමට සෑම අපේක්ෂකයකු ම වග බලා ගත යුතු ය.

2.1.23 පිළිතුරු පත්‍ර ලකුණු කිරීමේ දී, නියමිත සංඛ්‍යාවට වඩා වැඩි ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සපයා ඇති විට, පිළිතුරු සපයා ඇති අනුපිළිවෙළ අනුව නියමිත පිළිතුරු සංඛ්‍යාව පමණක් ලකුණු කරනු ලැබේ. උදා:- නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට අතිරේක ව ප්‍රශ්නයකට පිළිතුරු සපයා ඇති විට අන්තිම පිළිතුර ලකුණු කරනු නොලැබේ. තව ද නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට අතිරේක ව පිළිතුරු සපයා ඇති විටක ලකුණු කිරීමට අනවශ්‍ය පිළිතුරක් හෝ පිළිතුරු කොටසක් තිබේ නම් එය පැහැදිලි ව කපා හැරීමේ බලය විභාග පරීක්ෂක සතු ය.

2.1.24 විභාගය සඳහා ලියාපදිංචි වූ සෑම අපේක්ෂකයකු ම අදාළ විභාගයට අනිවාර්යෙන් ම පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී නොසිටීමට නම්, විභාගයට පෙනී නොසිටීම සම්බන්ධ ව පිළිගත හැකි හේතු සාධක ලිඛිත ව, අදාළ ලිඛිත සාක්ෂි ද සමග අදාළ පීඨයේ පීඨාධිපතිතුමාගේ නිර්දේශය ද සහිත ව අභියාචනා කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කොට අදාළ කාලසීමාව තුළ දී සනාතන සභාවේ අවසරය ලබා තිබිය යුතු ය. යම් අපේක්ෂකයකුට, විභාගයේ කොටසකට පෙනී සිටීමට නොහැකි නම් ඒ පිළිබඳ අදාළ පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/සහකාර ලේඛකාධිකාරී වෙත වහා ම දැනුම් දී පැය 48ක් ඇතුළත දී ලිඛිත ව අදාළ සාක්ෂි ද සමග ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතු ය.

2.1.25 අසනීපයක් හේතුවෙන් මුළු පරීක්ෂණයට හෝ පරීක්ෂණ කොටසකට හෝ පෙනී නොසිටින්නේ නම් ඒ බව පරීක්ෂණ ආරම්භ වීමට ප්‍රථම හෝ පරීක්ෂණ පැවැත්වෙන කාල

සීමාව තුළ හෝ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරී තැන වෙත වාර්තා කර වෛද්‍ය සහතිකයක් ලබා ගත යුතු ය.

2.1.26 යම් අපේක්ෂකයකු සම්පූර්ණ විභාගයට හෝ ඉන් කොටසකට පෙනී නොසිට, ඉහත සඳහන් උපදෙස් පරිදි ක්‍රියාකොට සනාතන සභාවේ අනුමැතිය ලබාගෙන නොමැති නම් ඔහු/ඇය මීළඟ අවස්ථාවේ එකී විභාගයට පෙනී සිටීම පුනර් පරීක්ෂණයකට පෙනී සිටියා සේ සලකා කටයුතු කරනු ඇත.

2.1.27 යම් අපේක්ෂකයකු සම්පූර්ණ විභාගයට පෙනී නොසිටින්නේ නම් ඒ සඳහා සනාතන සභාවේ විශේෂ අනුමැතියක් ලබා නොමැති නම් උපාධිය සම්පූර්ණ කිරීමේ දී පන්ති සාමර්ථ්‍යයකට හිමිකම් නොලැබේ.

2.1.28 නොවැළැක්විය හැකි හේතුවක් මත විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරීතුමාගෙන් වෛද්‍ය සහතිකය ලබා ගැනීමට අපොහොසත් වන අපේක්ෂකයන් තමා පදිංචි ප්‍රදේශයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියාගෙන් හෝ රජයේ ආරෝග්‍ය ශාලාවක උපදේශක වෛද්‍යවරයකුගෙන් හෝ රජයේ ආයුර්වේද රෝහලකින් ලබාගත් වලංගු වෛද්‍ය සහතිකයක් අදාළ පරීක්ෂණය හෝ කොටස පැවැත්වීමට නියමිත දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරී තැන ලවා සහතික කරවා ගත යුතු ය. පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන බටහිර, ආයුර්වේද, හෝ හෝමියෝපති වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික පිළිගනු නොලැබේ. නමුත් මෙවැනි අවස්ථාවක අවස්ථානුකූල ව තීරණය කිරීමට අභියාචනා කමිටුවට හැකි ය.

## 2.2 විභාග අක්‍රමිකතා

විභාග අක්‍රමිකතා මතු දැක්වෙන ආකාරයට වර්ග කර ඇත:

2.2.1 බලය නොලත් ලිපිලේඛන ආදිය සන්තකයේ තබා ගැනීම

2.2.2 කොපි කිරීම

2.2.3 අත්ලෙහි හෝ ශරීරයේ වෙනත් ස්ථානයක හෝ ඇඳුමෙහි හෝ සටහන් ලියාගෙන විභාග ශාලාවට පැමිණීම

2.2.4 වංචා කිරීම

2.2.5 විශ්වවිද්‍යාලයට අයත් ලිපි ද්‍රව්‍ය ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම

2.2.6 විභාග කටයුතුවලට බාධා වන පරිදි අනිසි හැසිරීම

2.2.7 විභාග අපේක්ෂකයා තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම හෝ වෙනත් කෙනෙකු වෙනුවෙන් විභාගයට පෙනී සිටීම.

2.2.8 ප්‍රශ්න පත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැනගැනීම හෝ දැනගැනීමට කුමන ආකාරයකින් හෝ තැත් කිරීම

2.2.9 යම් විභාග අක්‍රමිකතාවක් කිරීමට ආධාර හෝ අනුබල දීම සහ වෙනත් අයගේ සහාය ලබා ගැනීම

2.2.10 විභාග පරීක්ෂකවරුන්ට හෝ අනිත් විභාග නිලධාරීන්ට අයුතු බලපෑම් කිරීම

2.2.11 විභාග ශාලාධිපතිගේ අණ නොපිළිපැදීම හෝ අණට කීකරු නොවීම හෝ විභාග ශාලාධිපතිගේ උපදෙස් නොපිළිපැදීම හෝ විභාග ශාලාධිපති සමඟ හෝ විභාග ශාලාවේ සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලය සමඟ බහින්බස් වීම

2.2.12 ජංගම දුරකථන හෝ කුමන වර්ගයකට හෝ කිසිදු ආකාරයකට අයත් වන තාක්ෂණික උපකරණ විභාග ශාලාවට ගෙන යාම

**2.3 විභාග අක්‍රමිකතා පිළිබඳ ව පරීක්ෂණ පැවැත්වීම**

විභාග අක්‍රමිකතා පිළිබඳ ව අදාළ විභාග ශාලාධිපති විසින් විභාග පිළිබඳ මාණ්ඩලික නිලධාරියාට (නියෝජ්‍ය ලේඛකාධිකාරි/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි) වාර්තා කරනු ඇත. අනතුරු ව විභාග පිළිබඳ මාණ්ඩලික නිලධාරියා විසින් එක් එක් විභාග අපේක්ෂකයින් විසින් සිදු කරන ලද විභාග අක්‍රමිකතා, විභාග අක්‍රමිකතා කමිටුව වෙත ඉදිරිපත් කෙරේ. එලෙස ඉදිරිපත් කරනු ලැබූ විභාග අක්‍රමිකතා පිළිබඳ ව පරීක්‍ෂා කර බැලීමෙන් පසු ව විභාග අක්‍රමිකතා පරීක්ෂණ කමිටුව විසින් දඬුවම් නිර්දේශ කර සනාතන සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනු ලැබේ. විභාග අක්‍රමිකතා පරීක්‍ෂණ කමිටුව සනාතන සභාව විසින් පත් කරනු ලබන පූර්ණ බලැති අනුකමිටුවකි. මෙම පරීක්‍ෂණ කමිටුවේ නිර්දේශ සලකා බලා සනාතන සභාව විසින් අදාළ විභාග අපේක්‍ෂකයින්ට දඬුවම් පමුණුවනු ලබන අතර, සනාතන සභාවේ තීරණය අවසාන තීරණය වේ. සනාතන සභාවෙන් දඬුවම් පැමිණ වූ පසු ව විභාග පිළිබඳ මාණ්ඩලික නිලධාරී (නියෝජ්‍ය ලේඛකාධිකාරි/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/සහකාර ලේඛකාධිකාරි) විසින් දඬුවම් පිළිබඳ ව අදාළ විභාග අපේක්‍ෂකයන් වෙත දැනුම් දෙනු ලැබේ.

**2.4 විභාග අක්‍රමිකතා සඳහා පනවනු ලබන දඬුවම්**

**2.4.1 බලය නොලත් ලිපිලේඛන ආදිය සන්තකයෙහි තබාගැනීම.**

**දඬුවම්:-**
උපරිම වශයෙන් වර්ෂ 02කට විශ්වවිද්‍යාලයේ විභාගයන්ට පෙනී සිටීම තහනම් කිරීම හෝ/ සහ සනාතන සභාවේ අනුමැතිය පරිදි වෙනත් දඬුවම් පැමිණවීම.

**2.4.2 කොපි කිරීම**

**දඬුවම්:-**
විභාග අපේක්‍ෂකත්වය අවලංගු කොට උපරිම වශයෙන් අවුරුදු 03කට විශ්වවිද්‍යාලයේ ඕනෑ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම හෝ/සහ සනාතන සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවම් පැමිණවීම.

**2.4.3 අත්ලෙහි හෝ ශරීරයේ වෙනත් ස්ථානයක හෝ ඇඳුමෙහි හෝ සටහන් ලියාගෙන විභාග ශාලාවට පැමිණවීම.**

**දඬුවම්:-**
විභාග අපේක්‍ෂකත්වය අවලංගු කොට උපරිම වශයෙන් අවුරුදු 03කට විශ්වවිද්‍යාලයේ ඕනෑ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම හෝ/සහ සනාතන සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවම් පැමිණවීම.

**2.4.4 වංචා කිරීම**

දඬුවම්:-
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ සනාතන සභාවේ අභිමතය පරිදි කිසියම් කාලයකට විශ්වවිද්‍යාල පරීක්ෂණ තහනම් කිරීම සහ වෙනත් දඬුවම් පැමිණවීම.

**2.4.5 විශ්වවිද්‍යාලයට අයත් විභාග ලිපිද්‍රව්‍ය ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම:-**

දඬුවම්:
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ සනාතන සභාව මඟින් නියම කරනු ලබන කාල සීමාවකට විශ්වවිද්‍යාලයේ ඕනෑ ම පරීක්ෂණයකට පෙනී සිටීම තහනම් කිරීම.

**2.4.6 විභාග කටයුතුවලට බාධා වන පරිදි අනිසි හැසිරීම**

දඬුවම්:-
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ අවුරුදු 05කට නොවැඩි කාලයකට විශ්වවිද්‍යාලයේ ඕනෑම වෙනත් විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම සහ සනාතන සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවම් පැමිණවීම.

**2.4.7 විභාග අපේක්ෂකයකු තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම හෝ වෙනත් කෙනෙකු වෙනුවෙන් විභාගයට පෙනී සිටීම බරපතල දඬුවම් ලැබිය යුතු වරදකි.**

එවැනි අවස්ථාවක අදාළ පුද්ගලයන් දෙදෙනාට ම දඬුවම් පමුණුවනු ලබන අතර විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍යයකු නොවන අයෙක් විභාග අපේක්ෂකයකු වෙනුවෙන් පෙනී සිට ඇත්නම් ඔහුට/ ඇයට එරෙහි ව සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කරනු ඇත.

දඬුවම්:-
විභාග අපේක්ෂකත්වය අවලංගු කොට, වර්ෂ 05කට නොඅඩු වර්ෂ 10කට නොවැඩි කාලයකට විශ්වවිද්‍යාලයේ ඕනෑම පරීක්ෂණයකට පෙනී සිටීම තහනම් කිරීම හා සනාතන සභාවේ අභිමතය පරිදි පනවනු ලබන ඕනෑම දඬුවමක්.

**2.4.8 ප්‍රශ්න පත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැනගැනීම හෝ දැනගැනීමට කුමන ආකාරයකින් හෝ තැත් කිරීම**

දඬුවම්:-
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ සනාතන සභාවේ අභිමතය පරිදි පනවනු ලබන දඬුවම්

**2.4.9 යම් විභාග අක්‍රමිකතාවක් කිරීමට ආධාර හෝ අනුබල දීම සහ වෙනත් අයෙකුගේ සහාය ලබා ගැනීම**

දඬුවම්:-
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ සනාතන සභාවේ අභිමතය පරිදි පනවනු ලබන දඬුවම්

**2.4.10 විභාග පරීක්ෂකවරුන්ට හෝ අනිකුත් විභාග නිලධාරීන්ට අයුතු බලපෑම් කිරීම**

දඬුවම්:-
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ සනාතන සභාවේ අභිමතය පරිදි පනවනු ලබන දඬුවම්

**2.4.11 විභාග ශාලාධිපතිගේ අණ නොපිළිපැදීම හෝ අණට කීකරු නොවීම හෝ විභාග ශාලාධිපතිගේ උපදෙස් පිළිනොපැදීම හෝ විභාග ශාලාධිපති සමඟ හෝ විභාග ශාලාවේ සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලය සමඟ බහින්බස් වීම**

දඬුවම්:-
විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ අවුරුදු 05කට නොවැඩි කාලයකට විශ්වවිද්‍යාලයේ ඕනෑ ම වෙනත් විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම සහ සනාතන සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවම් පැමිණවීම.

**2.4.12 ජංගම දුරකථන හෝ කුමන වර්ගයකට හෝ කිසිදු ආකාරයකට අයත් වන තාක්ෂණික උපකරණ විභාග ශාලාවට ගෙන යාම**

දඬුවම්:-
විභාග අපේක්ෂකත්වය අවලංගු කොට උපරිම වශයෙන් අවුරුදු 03කට විශ්වවිද්‍යාලයේ ඕනෑම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම හෝ/සහ සනාතන සභාවේ අභිමතිය පරිදි වෙනත් දඬුවම් පැමිණවීම.

**2.4.13 යම් විභාග අක්‍රමිකතාවක දී දෙවන වරට වරදකරුවකු වීම**
යම් විභාග අක්‍රමිකතාවක දී දෙවන වරට වරදකරුවකු වන විභාග අපේක්ෂකයන්ගේ ශිෂ්‍යභාවය අවලංගු කිරීම හෝ / සනාතන සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවමක් පැමිණවීම.

2.5 අනිවාර්ය දඬුවම්

**ඉහත සඳහන් දඬුවම් සමග සනාතන සභාවේ අභිමතය පරිදි පහත සඳහන් අනිවාර්ය දඬුවම් සියල්ල ම හෝ කිහිපයක් එකවර පමුණුවනු ලබන බව සියලු ම විභාග අපේක්ෂකයින් අනිවාර්යෙන් ම දැන සිටිය යුතු ය.**

2.5.1 එම ප්‍රශ්න පත්‍ර ප්‍රතිඵල අවලංගු කිරීම හා අධ්‍යයන වර්ෂයක් ඉක්මවීමෙන් අනතුරුව විභාගයට පෙනී සිටීමට අවසර ලබා දීම. (වසරක විභාග තහතනමක් පැනවීම)
2.5.2 පන්ති සාමර්ථ්‍යයක් ලබා නොදීම
2.5.3 අවලංගු කළ ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටීමේ දී ලකුණු 40% උපරිමයකට සීමා කිරීම
2.5.4 ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර මුදල් ආදිය අවලංගු කිරීම හෝ අත්හිටුවීම
2.5.5 නේවාසික පහසුකම් අහෝසි කිරීම
2.5.6 උපාධි ප්‍රදානෝත්සවයට නොකැඳවීම
2.5.7 උපාධි ප්‍රදානය හා ප්‍රතිඵල නිකුත් කිරීම වර්ෂයකින් ප්‍රමාද කිරීම

**2.6 මෙහි සඳහන් නැති, විභාග අක්‍රමිකතාවක් ලෙස සනාතන සභාව පිළිගනු ලබන වෙනත් ඕනෑම වරදකට සනාතන සභාවේ අභිමතය පරිදි දඬුවම් නියම කෙරේ.**

**2.7 විභාග අක්‍රමිකතාවයක් මත දඬුවම් පැමිණවූ සිසුන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා**

විභාග අක්‍රමිකතා මත දඬුවම් පැමිණවූ සිසුන්ට අභියාචනයක් වේතොත් උපකුලපතිතුමා/තුමිය වෙත ඉදිරිපත් කළ හැකි ය. එවැනි අභියාචනයක් සලකා බැලීම සඳහා විභාග අක්‍රමිකතා පරීක්ෂණ කමිටුවට ම උපකුලපතිතුමා/තුමිය විසින් යොමු කිරීමෙන් පසු ව විභාග අක්‍රමිකතා පරීක්ෂණ කමිටුව රැස්වී අදාළ අභියාචනයේ සඳහන් කරුණු පිළිබඳ ව සලකා බලා සනාතන සභාවට නිර්දේශයන් ඉදිරිපත් කරනු ඇත.
එවැනි අභියාචනා සම්බන්ධයෙන් විභාග අක්‍රමිකතා පරීක්ෂණ කමිටුවේ නිර්දේශ සලකා බලා සනාතන සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

දඬුවමකට එරෙහි ව අභියාචනයක් කළ හැකි වන්නේ තමන්ට දඬුවම් පැමිණවූ බව දන්වා විභාග අංශයේ මාණ්ඩලික නිලධාරියා විසින් ලිඛිත ව එවනු ලබන ලිපිය ලැබී දින 14ක් ඇතුළත දී පමණි. දින 14කට පසු ව අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවසරය නොමැති බව සියලු ම විභාග අපේක්ෂකයන් දැන සිටිය යුතු ය.

| | | |
|---|---|---|
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | - | 011 2911706 / 011 2903111 |
| කාර්යාලය | - | 011 2903112-4 |
| විද්‍යුත් ලිපිනය | - | officeexam@kln.ac.lk |

# 03. ශිෂ්‍ය සේවා අංශය

**සහකාර ලේඛකාධිකාරි**
ඩබ්.ඒ.කේ.බී. වෙත්තසිංහ මෙය
*B.Sc. (Kel'ya), Dip in Management (JIAT)*

ශිෂ්‍යසේවා අංශය මඟින් විද්‍යාර්ථීන් සඳහා සේවාවන් රැසක් සැපයේ.

ඒ සේවාවන් මෙසේ ය:

- ශිෂ්‍ය නිවාස, ආපනශාලා, ශිෂ්‍ය මධ්‍යස්ථානය, පොත්හල, වෙළෙඳසැල්, කිරිහල, කොණ්ඩා සැකසුම් ස්ථානය හා ඡායාපිටපත් ලබා ගැනීමේ සේවාවන් පරිපාලනය කිරීම හා පවත්වා ගෙන යාම
- නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා අයදුම්පත් කැඳවීම, නේවාසිකාගාර සඳහා සිසුන් තේරීම, නේවාසික පහසුකම් සැලසීම සහ නේවාසිකාගාරවල අවශ්‍යතා සපුරාලීම, ශිෂ්‍ය සංගම් කටයුතු හා නිලවරණ කටයුතු සංවිධානය කිරීම
- ශිෂ්‍ය සංගමය, ශිෂ්‍ය කමිටු, ශිෂ්‍ය සුභසාධක සංගම් සහ විෂය සංගම් ලියාපදිංචි කිරීම, ශිෂ්‍යාධාර, මහපොළ ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශිෂ්‍යත්ව හා අනෙක් ශිෂ්‍යත්ව පිළිබඳ කටයුතු
- දුම්රිය හා බස්රිය සඳහා වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ කටයුතු
- ශිෂ්‍ය සංගම් මඟින් සංවිධානය කෙරෙන දේශන, සම්මන්ත්‍රණ, චිත්‍රපට, නාට්‍ය හා රැස්වීම් ආදිය සඳහා අවසර ලබා දීම හා ඊට අදාළ කටයුතු
- ශිෂ්‍ය සංගම්වල මුදල් පාලනය පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු
- වෙබ් අඩවිය – administration.kln.ac.lk/index.php/administration/student-welfare-devision

**ශිෂ්‍ය මධ්‍යස්ථානය**
විද්‍යාර්ථීන්ට පුවත්පත් බැලීම, ක්‍රීඩා කිරීම හා කියවීම සඳහා මෙහි පහසුකම් ඇත. ශිෂ්‍ය මධ්‍යස්ථානය භාරව නිලධාරියකු ද සිටින අතර ඔහු සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 8:00 සිට ප.ව. 4:15 දක්වා සේවයේ යෙදී සිටී. ශිෂ්‍ය මධ්‍යස්ථානයේ ඇති සියලු ම බඩුබාහිරාදිය හා උපකරණ ඔහු භාරයේ ඇත. ඔහුගේ අවසරයක් නොමැති ව එහි ඇති කිසි ම බඩුබාහිරාදියක් හෝ උපකරණයක් පිටතට ගෙන යාම සම්පූර්ණයෙන් ම තහනම් ය. මෙහි ඇති බඩුබාහිරාදියට යම් හානියක් වුවහොත් ඒ සඳහා වගකිවයුතු අයගෙන් අලාභ අය කර ගැනීමට කටයුතු කෙරේ. ශිෂ්‍ය මධ්‍යස්ථානය නිවාඩු කාලයේ හැර අනෙකුත් දිනවල පෙ.ව. 6:00 සිට ප.ව. 8:30 දක්වා විවෘත ව තබනු ඇත.

**පොත්හල**
ශිෂ්‍ය මධ්‍යස්ථානයේ කියවීම් ශාලාවේ පළමුවන මහලේ විද්‍යාර්ථීන්ට අවශ්‍ය පොත්පත් හා ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා පොත්හලක් ඇත.

**ඡායා පිටපත් ලබා ගැනීමේ සේවය**

ඡායා පිටපත් ලබාගැනීම සඳහා විද්‍යාර්ථීන්ට දළුගම පරිශ්‍රයේ ශිෂ්‍ය මධ්‍යස්ථානය හා ප්‍රධාන පුස්තකාලය ද රාගම වෛද්‍ය පීඨය පරිශ්‍රය ද යන ස්ථානයන්හි පහසුකම් සලසා ඇත.

**පොදු කාමර**

ශිෂ්‍ය මධ්‍යස්ථානයේ උඩු මහලේ පැවිදි විද්‍යාර්ථීන්, කාන්තා විද්‍යාර්ථීන් හා පිරිමි විද්‍යාර්ථීන් සඳහා වෙන් වූ පොදු කාමර ඇත.

**ආපනශාලා, වෙළඳසැල් හා කිරිහල්**

- ආචාර්ය සී.ඩබ්.ඩබ් කන්නන්ගර නේවාසිකාගාර ආපනශාලාව සහ වෙළෙඳසැල
- බණ්ඩාරනායක නේවාසිකාගාර ආපනශාලාව සහ වෙළෙඳසැල
- යක්කඩුව ප්‍රඥාරාම නේවාසිකාගාර ආපනශාලාව හා වෙළෙඳසැල
- ශිෂ්‍ය නේවාසිකාගාර ආපනශාලාව සහ වෙළෙඳසැල
- කාර්යය මණ්ඩල ආපනශාලාව
- ශිෂ්‍ය විවේකාගාර ආපනශාලාව
- ශිෂ්‍ය විවේකාගාර කිරිහල
- ශිෂ්‍ය මධ්‍යස්ථාන ආපනශාලාව
- විද්‍යා පීඨ ආපනශාලාව
- විශ්වවිද්‍යාලයීය කිරිහල
- ශිෂ්‍ය විවේකාගාර වෙළෙඳසැල හා කිරිහල
- කොණ්ඩා සැකසුම් ස්ථානය (බාබර් සාප්පුව)
- වෛද්‍ය පීඨ නේවාසිකාගාර ආපනශාලාව
- වෛද්‍ය පීඨ ආපනශාලාව හා කිරිහල
- වෛද්‍ය පීඨ වෙළෙඳසැල
- පරිගණක හා තාක්ෂණ පීඨ ආපනශාලාව

**මහජන බැංකුව, කැලණිය ශාඛාව**

විද්‍යාර්ථීන්ට අවශ්‍ය බැංකු පහසුකම් ලබා ගැනීම සඳහා නුවර-කොළඹ ප්‍රධාන මාර්ගයෙන් විශ්වවිද්‍යාල භූමියට පිවිසෙන ස්ථානයේ මෙම බැංකුව පිහිටා ඇති අතර කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල ඇතුළත ද මෙහි ශාඛාවක් පිහිටුවා ඇත.

**තැපැල් කාර්යාලය**

කැලණිය ප්‍රධාන තැපැල් කාර්යාලය, කැලණිය වෙදමුල්ලේ නුවර පාරේ පිහිටා ඇත. පශ්චාත් උපාධි ගොඩනැගිල්ලේ බිම් මාලයේ උප තැපැල් කාර්යාලයක් පිහිටුවා ඇත.

**මාසික වාර ප්‍රවේශ පත්‍ර**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සඳහා කැලණිය ඩිපෝවේ නිලධාරීන් සෑම මාසයක ම අවසාන දිනවල විශ්වවිද්‍යාලයට පැමිණෙනු ඇත. ශිෂ්‍යසේවා අංශ කාර්යාලයේ දී ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. තව ද, දුම්රිය වාර ප්‍රවේශපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය ආකෘති පත්‍ර සෑම වර්ෂයක ම ජනවාරි හා ජූලි මාසවල ශිෂ්‍ය සේවා අංශයෙන් නිකුත් කරනු ඇත. නේවාසිකාගාර පහසුකම් නොලබන විද්‍යාර්ථීන්ට මෙම දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබාගත හැකි ය.

3.1 ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර සම්බන්ධ උපදෙස්

**මහපොළ ශිෂ්‍යත්වය**

- මේ යටතේ සුදුසුකම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත අධ්‍යයන වර්ෂයකට වාරික 10ක උපරිමයකට යටත් ව මාසික ව අනුමත මුදල ගෙවනු ලැබේ. නිර්දේශිත ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛනයකට අනුව මහපොළ ශිෂ්‍යත්ව මුදල් විද්‍යාර්ථීන්ගේ බැංකු ගිණුම් වෙත මහපොළ භාරකාර අරමුදල මගින් බැර කරනු ලැබේ.

**මහපොළ ශිෂ්‍යත්ව භාරකාර අරමුදලේ ගෙවීම් කොන්දේසි**

ශිෂ්‍යත්වලාභීන් අධ්‍යයන කටයුතුවලට සහභාගී වීමේ ප්‍රතිශතය 80% විය යුතු වේ.

විනය විරෝධී ක්‍රියා හේතුන් මත පන්ති තහනම් කිරීම, විශ්වවිද්‍යාල දේපලවලට හානි සිදු කිරීම හා ඒ මත දඬුවම් ලැබීම, නවක වදය සම්බන්ධයෙන් දඬුවම් ලැබීම, අපචාර සිද්ධීන්ට සම්බන්ධ වීම හා ඒ මත දඬුවම් ලැබීම ආදි හේතුන් මත ශිෂ්‍යත්ව වාරික ගෙවීම අත්හිටුවනු ලබන අතර ශිෂ්‍යත්වය අහෝසි කිරීම සම්බන්ධයෙන් මහපොළ භාරකාර අරමුදල තීරණය කරනු ඇත.

ශිෂ්‍යත්වය සඳහා තේරී ඇති පාඨමාලාව වෙනුවට වෙනත් පාඨමාලාවක් හැදෑරීම, පාඨමාලාවට සහභාගී නොවීම, වාර්ෂික විභාග අසමත් වීම පාඨමාලාව අත් හැරීම, රැකියාවක නියුක්ත වීම ආදි කරුණු ශිෂ්‍යත්වය අවලංගු වීමට හේතු වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරනු ලබන පරිත්‍යාග ශිෂ්‍යත්ව සඳහා වෙනත් ආධාර මුදලක් නොලබන ශිෂ්‍යයන්ගෙන් අයදුම්පත් කැඳවා සුදුස්සන් තෝරා ගනු ලැබේ. රජයේ ශිෂ්‍යත්වවලට අමතර ව වෙනත් ආයතන හා පුද්ගලයන් විසින් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව ද තිබේ.

**ශිෂ්‍යාධාර**

ශිෂ්‍යාධාර ලැබීමට සුදුස්සන් තේරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ යටතේ සුදුසුකම් ලබන විද්‍යාර්ථීන්ට මාසික ව අනුමත මුදල ශිෂ්‍යාධාර වශයෙන් ගෙවනු ලැබේ. මහපොළ ශිෂ්‍යත්වය හෝ වෙනත් ශිෂ්‍යත්වයක් නොලබන ශිෂ්‍යයන්ට ශිෂ්‍යාධාර සඳහා ඉල්ලුම් කළ හැකි ය.

**ශිෂ්‍යාධාර ගෙවීම සම්බන්ධයෙන් බලපවත්වනු ලබන කොන්දේසි**

(1) තම අයදුම්පතෙහි ඇතුළත් කිසිම ප්‍රකාශයක් අසත්‍ය හෝ සාවද්‍ය බව ඔප්පු වුවහොත් හෝ අයදුම්පතෙහි කිසියම් වැදගත් කරුණක් හෙළි කිරීමට අසමත් වූ බව ඔප්පු වුවහොත් අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් ඔබගේ ලියාපදිංචිය අවලංගු කිරීමට යටත් වේ.

(2) ඔබගේ පවුලේ ආදායම, විවාහක තත්ත්වය, සේවා නියුක්ති ආදායම වැනි දෑ සම්බන්ධයෙන් වෙනසක් වී ඇත්නම්, ඒ බව වහා ම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(3) ශිෂ්‍යාධාර මුදල් ගෙවිය හැක්කේ, අධ්‍යයන කටයුතුවල යෙදී සිටින කාලය තුළ දී පමණි. කිසියම් හේතුවක් නිසා තාවකාලික ව පාඨමාලාව නවත්වන්නේ නම් හෝ පාඨමාලාව අවසන් කරන්නේ නම්, ඒ බව විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි වෙත ලිඛිත ව දැනුම් දිය යුතු ය.

(4) පහත සඳහන් එක් එක් කරුණක් හෝ ඊට වඩා වැඩි ගණනක් නිසා ඔබට මුදල් ගෙවීම සම්පූර්ණයෙන් ම නතර කිරීමට හෝ තාවකාලික ව අත්හිටුවීමට හැකි ය.

(අ) ඔබ කිසියම් විභාගයකින් සම්පූර්ණයෙන් අසමත් වීම. එසේ වුවහොත් ප්‍රථම වර්ෂ පරීක්ෂණයෙන් ඌණ සාමාර්ථයක් ලබා, දෙවන වර්ෂය සඳහා නියමිත පාඨමාලාවක් හදාරන්නේ නම් ශිෂ්‍යාධාර ගෙවිය හැකි ය.

(ආ) උපකුලපතිවරයාට පිළිගත නොහැකි කිසියම් හේතුවක් නිසා ලැබී ඇති ප්‍රථම අවස්ථාවේදී කිසියම් විභාගයකට පෙනී සිටීමට ඔබ අසමත් වීම.

(ඇ) ඔබ තම අධ්‍යයන කටයුතු උනන්දුවෙන් කරගෙන නොයාම.

(ඈ) ඔබ විනය විරෝධි ලෙස හැසිරීම.

(ඉ) විශ්වවිද්‍යාල පාලනාධිකාරිය විසින් තීරණය කරනු ලබන වෙනත් ප්‍රමාණවත් හේතුවක්

(5) ශිෂ්‍යාධාර ගෙවීම තාවකාලික ව හෝ සම්පූර්ණයෙන් අත්හිටවූ විට එම මුදල යළි ගෙවීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල බලධාරීන් විසින් සිය අභිමතය පරිදි තීරණය කරනු ලැබේ.

(6) සුදුසුකම් ලබන ඔබට අධ්‍යයන වර්ෂයකට වාරික 10 ක උපරිමයකට යටත්ව ගෙවීම් කරනු ලබයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ පූර්ණ අනුමැතියකින් තොරව වාරික 10කට වඩා වැඩියෙන් කිසි ම හේතුවක් නිසාවත් ගෙවීම් කරනු නොලැබේ.

(7) මහපොළ ශිෂ්‍යත්ව ආධාර ලබන්නේ නම් ශිෂ්‍යාධාර ගෙවනු නොලැබේ. ශිෂ්‍යාධාර වාරික මුදල් කැලණිය මහජන බැංකු ශාඛාව මඟින් ගෙවනු ලැබේ.

(8) සෑම අධ්‍යයන වර්ෂයක ම පළමුවන හා දෙවන අර්ධ වාර්ෂිකයේ පළමු ශිෂ්‍යාධාර වාරිකය සෑම ශිෂ්‍යාධාරලාභි සිසුවෙකු විසින් ම තම නිවැරදි ගිණුම් විස්තර ද සමඟින් සිය අත්සන තැබිය යුතු ය.

**අනිකුත් ශිෂ්‍යත්ව**

- රජයෙන් ලබාදෙන ශිෂ්‍යත්වවලට අමතර ව ආයතන හා පුද්ගලයින් විසින් ද ශිෂ්‍යත්ව ලබා දෙනු ලැබේ.
- මහපොළ ශිෂ්‍යාධාර හා උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර නොලැබෙන සිසුනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබේ.
- විවිධ ආයතන හා පුද්ගලයන් මඟින් ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව පිළිබඳ විස්තර විශ්වවිද්‍යාල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කරනු ලැබේ.

**උපකුලපති අරමුදල**

විශේෂ අවස්ථාවක දී සිසුනට මුදලින් ආධාරයක් කිරීමේ අපේක්ෂාවෙන් මේ අරමුදල පිහිටුවා ඇත. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ශිෂ්‍ය සේවා අංශයෙන් ලබාගත හැකි ය.

**ශිෂ්‍ය සුභසාධන අරමුදල** - Student Welfare Fund

අධ්‍යයන කාලපරිච්ඡේදය තුළ දී විද්‍යාර්ථීන්ට සිදුවන බරපතල අනතුරක දී/මරණයක දී මූල්‍ය ආධාර ලබා දීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත. මේ සඳහා සිසුන් ශිෂ්‍ය සේවා අංශයේ වෙබ් අඩවිය ඔස්සේ ලියාපදිංචි විය යුතු අතර, ආදාළ ආධාර මුදල ලබා දීමේ දී එම තොරතුරු සැළකිල්ලට ගනු ලැබේ.

### 3.2 ශිෂ්‍ය නේවාසිකාගාර සහ නේවාසිකාගාර නීතිරීති

#### 3.2.1 ශිෂ්‍ය නේවාසිකාගාර

විද්‍යාර්ථීන් සීමිත සංඛ්‍යාවක් සඳහා විශ්වවිද්‍යාලය මඟින් නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ. මෙම නේවාසිකාගාර විශ්වවිද්‍යාල පරිශ්‍රයෙහි සහ ඉන් පිටත පිහිටා ඇත. ඒ ඒ නේවාසිකාගාරයන්හි ශාලාධිපතිවරුන්, අර්ධ කාලීන උපශාලාධිපතිවරුන් සහ පූර්ණ කාලීන උපශාලාධිපතිවරුන් පත්කරනු ලැබ සිටිති. නේවාසිකාගාරයට ඇතුළත් වීමේ ගාස්තුව රු.100/-කි. ඊට අමතර ව අධ්‍යයන වර්ෂයක් සඳහා ශාලා ගාස්තුව රු.500/-කි. මෙය සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේ දී ම ගෙවිය යුතු ය. ප්‍රථම වසර සිසුන් සඳහා රු.500/-ක තැන්පත් මුදලක් ගෙවිය යුතු අතර, එය අධ්‍යයන කාලසීමාව අවසානයේ දී ආපසු ගෙවනු නොලැබේ. ඒ අනුව ප්‍රථම වසර සිසුන්ගේ සම්පූර්ණ නේවාසිකාගාර ගාස්තුව රු. 1100/-කි.

නේවාසිකාගාරය සඳහා තෝරා ගැනුණු සිසුන් විශ්වවිද්‍යාලයට පැමිණීමට දැනුම් දෙන ලද දිනයේ දී නේවාසිකාගාරයට පැමිණිය යුතු ය. එසේ දැනුම් දෙන ලද දිනයේ සිට දින 07ක් ඇතුළත නොපැමිණෙන සිසුන් වෙනුවට වෙනත් අය ඇතුළත් කිරීමට විධිවිධාන යොදනු ඇත. දැනුම් දෙන දිනයේ සිට වලංගු වන පරිදි නේවාසිකාගාර ගාස්තු සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු ය. නියමිත දිනට නේවාසිකාගාර ගාස්තු නොගෙවුවහොත් නේවාසික ගාස්තුව මෙන් තුන් ගුණයක මුදලක් අධිභාරයක් වශයෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. නේවාසිකාගාරයට තෝරා ගන්නා ලද නමුත්, නේවාසික ගාස්තු සම්පූර්ණයෙන් ගෙවන තෙක් විද්‍යාර්ථීන් ශාලාවට ඇතුළත් කර ගනු නොලැබේ.

සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේ දී ම සියලු ම නේවාසිකාගාරයන්හි ශාලාධිපති/ ශාලාධිපතිනියගේ ප්‍රධානත්වයෙන් ශිෂ්‍ය නේවාසිකාගාර කමිටු පත් කරනු ලැබේ. සිසුන්ගේ සුභසාධනයට අදාළ කටයුතු පිළිබඳ ව ශාලාධිපති/ශාලාධිපතිනියට වාර්තා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම, එම කමිටුවල වගකීම වේ.

**පූජ්‍ය කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නේවාසිකාගාරය**

ශාලාධිපති : පූජ්‍ය බී. සෝමානන්ද හිමි
පූර්ණ කාලීන උපශාලාධිපති: පූජ්‍ය බලදොර ධම්මාලංකාර හිමි

**ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර නේවාසිකාගාරය**

ශාලාධිපති : මහාචාර්ය ආර්.එම්.සී.එස් රත්නායක මයා
ආචාර්ය ජී.ඩබ්.ජේ.එස්. ප්‍රනාන්දු මයා
පූර්ණ කාලීන උපශාලාධිපති : අයි.ආර්.පී. විජයවර්ධන මයා

**පූජ්‍ය යක්කඩුවේ ප්‍රඥාරාම නේවාසිකාගාරය**

ශාලාධිපති : ආචාර්ය ඩී. එම්. එන්. එස්. ඩබ්. දිසානායක
පූර්ණ කාලීන උපශාලාධිපති : එල්.ජී.සී.එස්. රණසිංහ මයා

**කොහල්විල නේවාසිකාගාරය**

ශාලාධිපති : එස්.ඒ. දිල්හානි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : එස්.ඩී.කේ.එම්. කුමාරි මිය

**ලක්මැදුර නේවාසිකාගාරය**

ශාලාධිපති : එස්.ඒ. දිල්හානි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : එස්.ඩී.කේ.එම්. කුමාරි මිය

**සීවලි මාවත නේවාසිකාගාරය**

ශාලාධිපති : එස්.ඒ. දිල්හානි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : එස්.ඩී.කේ.එම්. කුමාරි මිය

**පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමි අනුස්මරණ නේවාසිකාගාරය**

ශාලාධිපති : ආචාර්ය කේ.ආර්.එන්. හර්ෂනි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : එච්.එම්.එස්.කේ. හේරත් මිය

**බණ්ඩාරනායක නේවාසිකාගාරය**

ශාලාධිපති : ආචාර්ය ඊ.ජේ.ඒ. සමරකෝන් මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : ආර්.එස්. හෙට්ටිආරච්චි මිය

**සංඝමිත්තා නේවාසිකාගාරය**

ශාලාධිපති : ආචාර්ය ඊ.ජේ.ඒ. සමරකෝන් මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : ආර්.එස්. හෙට්ටිආරච්චි මිය

**විහාරමහාදේවි නේවාසිකාගාරය**

ශාලාධිපති : ආචාර්ය ඊ.ජේ.ඒ. සමරකෝන් මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : ආර්.එස්. හෙට්ටිආරච්චි මිය

**එදිරිවීර සරත්චන්ද්‍ර නේවාසිකාගාරය**

ශාලාධිපති : ආචාර්ය කේ.ආර්.එන්. හර්ෂනි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : එච්.එම්.එස්.කේ. හේරත් මිය

**ඊ.ඩබ්. අධිකාරම් නේවාසිකාගාරය**

ශාලාධිපති : ආචාර්ය කේ.ආර්.එන්. හර්ෂනි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : එච්.එම්.එස්.කේ. හේරත් මිය

**ගුණපාල මලලසේකර නේවාසිකාගාරය**

ශාලාධිපති : ආචාර්ය කේ.ආර්.එන්. හර්ෂනි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : ඒ.කේ.ආර්. මධුමාලි මිය

**හේමචන්ද්‍ර රායි නේවාසිකාගාරය**

ශාලාධිපති : ආචාර්ය කේ.ආර්.එන්. හර්ෂනි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : එච්.එම්.එස්.කේ. හේරත් මිය

**සෝමගුණමහල් නේවාසිකාගාරය**

ශාලාධිපති : එස්.ඒ. දිල්හානි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : එස්.ඩී.කේ.එම්. කුමාරි මිය

**වෛද්‍යපීඨ කාන්තා නේවාසිකාගාරය**

ශාලාධිපති : මහාචාර්ය පී.ඒ.එස්. එදිරිසිංහ මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : එම්.එන්.ඩී. සෙනවිරත්න මිය

**වෛද්‍යපීඨ පිරිමි නේවාසිකාගාරය**

ශාලාධිපති : වෛද්‍ය ආර්.ඒ.පී.ජේ.කේ.එම්.එස්. රූපසිංහ මයා
පූර්ණ කාලීන උපශාලාධිපති : ඩී.ඩී.ඩී. විතානගේ මයා

**වෛද්‍යපීඨ කාන්තා නේවාසිකාගාරය (C පරිශ්‍රය)**

ශාලාධිපති : වෛද්‍ය කේ.එම්.එන්. පෙරේරා මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : පී.එච්.එම්.එන්.එස්. ගෙදරගොඩ මිය

**ශ්‍රීමත් ඩී.බී. ජයතිලක නේවාසිකාගාරය**

ශාලාධිපති : ආචාර්ය කේ.ආර්.එන්. හර්ෂනි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : ඒ.කේ.ආර්. මධූමාලි මිය

**මහර හන්දිය නේවාසිකාගාරය**

ශාලාධිපති: මහාචාර්ය ආර්.එම්.සී. එස්.රත්නායක මයා
පූර්ණ කාලීන උපශාලාධිපති : ඒ.එම්.සී. කුමාර මයා

**වේවැල්දූව නේවාසිකාගාරය**

ශාලාධිපති : එස්.ඒ. දිල්හානි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : ඒ.කේ.ආර්. මධූමාලි මිය

**එන්.ටී.එස් නේවාසිකාගාරය**

ශාලාධිපති : එස්.ඒ. දිල්හානි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : ඒ.කේ.ආර්. මධූමාලි මිය

**බුළුගහ හන්දිය නේවාසිකාගාරය**

ශාලාධිපති : එස්.ඒ. දිල්හානි මිය
පූර්ණ කාලීන උපශාලාධිපති : එස්.ඩී.කේ.එම්. කුමාරි මිය

### 3.2.2 නේවාසිකාගාර නීති රීති

(අ) නේවාසිකයන්ට නේවාසිකාගාරයේ කාමර වෙන් කර දෙනු ලබනුයේ පූර්ණකාලීන උපශාලාධිපති විසිනි.

(ආ) පූර්ණකාලීන උපශාලාධිපති/ශාලාධිපතිනියගේ අවසර නොමැති ව කිසි ම නේවාසිකයකු අනෙකකු සමඟ එම කාමරය මාරු නොකළ යුතු ය.

(ඇ) රාත්‍රී 10.00න් පසු ව නේවාසිකයෝ තම කාමරවල සිටිය යුත්තාහ. එසේ ම ඔවුහු සියලු කල්හි ම අන්‍ය ශිෂ්‍යයන්ගේ පෞද්ගලිකත්වයට ගරු කළ යුත්තාහ.

(ඈ) කිසිම නේවාසිකයකු තම කාමරය තුළ හෝ ඉන් පිටත හෝ අන්‍යයන්ට බාධා වන අයුරින් නොහැසිරිය යුතු ය.

(ඉ) නේවාසිකයන් පූර්ණකාලීන උපශාලාධිපති/ශාලාධිපතිනියගේ අවසරය නොමැති ව විශ්වවිද්‍යාලයීය සාමාජිකයකුට හෝ විශ්වවිද්‍යාලයෙන් පරිබාහිර කිසි ම අමුත්තකුට ලැගුම් නොදිය යුතු ය.

(ඊ) පූර්ණකාලීන උපශාලාධිපති/ශාලාධිපතිනියගේ අවසරය නොමැති ව කිසි ම නේවාසිකයකු එක් කාමරයක ඇති බඩුබාහිරාදිය වෙනත් කාමරයකට ගෙන යාමෙන් වැළකිය යුතු ය.

(උ) කාමරවල ලී බඩු අව්වැසිවලට හසු නොවන පරිදි තබා ගත යුතුය. එමෙන් ම කාමරවලින් පිටත හෝ නොතැබිය යුතු ය.

(ඉ) නේවාසිකයන් එක් අයකුට වැඩි ගණනක් වෙසෙන කාමරයක ඇති චංචල හා නිශ්චල දේපළවල ආරක්ෂාව ගැන ඔවුහු වෙන් වෙන් ව ද, සාමූහික ව ද, වගකිව යුත්තාහ. නැති වීම හෝ විනාශ වීම හෝ විරූප කිරීම වෙනුවෙන් දැරීමට සිදු වන වියදම් ඊට වගකිව යුතු පුද්ගලයාගෙන් හෝ පුද්ගල කණ්ඩායමෙන් අය කර ගනු ලැබේ.

(එ) නේවාසිකයකු ස්වකීය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා තමන් වෙත භාර දෙන ලද උපකරණ හැර නිවාසයකට අයත් කිසිවක් සිය කාමරයෙහි තබා නොගත යුතු ය.

(ඒ) නේවාසිකයන්ට භාර දෙන ලද කාමරවල යතුරු හා වෙනත් උපකරණ නිවාඩු කාලය ආරම්භයේ දී මෙන් ම නේවාසිකාගාරයෙන් ඉවත් ව යන දිනයේ දී පූර්ණකාලීන උපශාලාධිපති/ශාලාධිපතිනියට භාර දිය යුතු ය. නේවාසිකාගාරයෙන් අස් වී යන විට ඒ බව නේවාසිකාගාර පූර්ණකාලීන උපශාලාධිපතිට/ශාලාධිපතිනියට දැනුම් දීම අනිවාර්ය වේ.

(ඔ) නැති වූ යතුරු වෙනුවට යතුරු සැපයීමේ හෝ කැඩුණු යතුරු අලුත්වැඩියා කිරීමේ හෝ වියදම් එයට වගකිව යුතු නේවාසිකයා විසින් දැරිය යුතු ය.

(ඕ) නිවාඩු කාලවල අනවසරයෙන් ශිෂ්‍ය නේවාසිකාගාරයකට ඇතුළු වීම තහනම් ය.

**පෞද්ගලික විදුලි උපකරණ භාවිතය**

(අ) පූර්ණකාලීන උපශාලාධිපතිගේ/ශාලාධිපතිනියගේ අවසරය කලින් නොලබා කේතල, විදුලි උදුන්, ඉස්ත්‍රික්ක හා මේස ලාම්පු ආදි පෞද්ගලික විදුලි උපකරණ කිසිවක් පරිහරණය නොකළ යුතු ය. අවසර ඇති ව පරිහරණය කරන එවැනි උපකරණ සියල්ල ම පූර්ණකාලීන උපශාලාධිපති/ ශාලාධිපතිනිය විසින් විශ්වවිද්‍යාලයීය විදුලි කාර්මිකයකු ලවා පරීක්ෂා කර අනුමත කරවා ගත යුතු ය.

**නිවාඩු ලබාගැනීම**

(අ) ශාලාධිපතිගේ/ශාලාධිපතිනියගේ හෝ උපශාලාධිපතිගේ/ශාලාධිපතිනියගේ අවසර නොලබා කිසි ම නේවාසිකයකු පෙ.ව. 6:00ට පෙර තම නිවාසයෙන් බැහැර නොයා යුතු ය. නේවාසිකයන් ශාලාධිපතිගේ/උපශාලාධිපතිගේ අවසර නොමැති ව රාත්‍රි 10:00න් පසුව ශාලාවෙන් බැහැර නොයා යුතු ය.

(ආ) නිවාඩු ලබා ගෙන ගොස් පෙරළා පැමිණීමෙන් පසු ව නේවාසිකයා විසින් සිය අවසර පත්‍රය ශාලාධිපතිට/ශාලාධිපතිනියට භාර දිය යුතු ය.

**ගිලන් වීම**

කිසිම නේවාසිකයකු පළමු ව විශ්වවිද්‍යාලයීය වෛද්‍ය නිලධාරීතැනට නොදන්වා බාහිර වෛද්‍යාධාර සෙවිය යුතු නොවේ. එහෙත් විශේෂ අවස්ථාවක දී බාහිර වෛද්‍ය උපදෙස් ලබා දීමට නිවාස උපශාලාධිපතිට/උපශාලාධිපතිනියට බලය තිබේ. එවැනි අවස්ථාවක දී ඒ බව හැකි විගස විශ්වවිද්‍යාලයීය වෛද්‍ය නිලධාරීතැන වෙත දැන්විය යුතු ය.

**සමිති**

ශාලාධිපතිගේ/ශාලාධිපතිනියගේ අවසරය නොමැති ව ශිෂ්‍ය නිවාසයේ කිසි ම සමිතියක් ආරම්භ නොකළ යුතු ය. ශාලාධිපතිගෙන්/ශාලාධිපතිනියගෙන් ලබා ගත් අවසරයක් නොමැති ව කිසිදු දේශනයක් සඳහා අමුත්තන් නොකැඳවිය යුතු ය.

**අමුත්තෝ**

(අ) අවශ්‍ය වෙතැ'යි හැඟී ගියහොත්, කවර අමුත්තකුට හෝ කවර අවස්ථාවක වුව නිවාසයෙන් බැහැර වන ලෙසට ශාලාධිපතිට/ශාලාධිපතිනියට නියම කළ හැකි ය.

(ආ) ශිෂ්‍යාවක නම්, ශාලාධිපතිනියගේ අවසරය නොමැති ව පුරුෂ පක්ෂයේ කිසිවකු හෝ ශිෂ්‍යයකු නම්, ශාලාධිපතිගේ අවසරය නොමැති ව ස්ත්‍රී පක්ෂයේ කිසිවකු හෝ තම කාමරයට නොකැඳවිය යුතු ය.

**තුටුපඬුරු**

සේවකයනට තුටුපඬුරු දීමෙන් වැළකිය යුතු ය.

- **නේවාසිකත්වය සම්බන්ධ උපදෙස්**

**(අ) නේවාසිකාගාර කාමර පිරිසිදු කිරීම**

(i) නේවාසිකාගාරයේ තමාට හිමි කාමරය දිනපතා අතුගා පිරිසිදු කළ යුතු අතර සතියකට වරක් මකුළු දැල් කඩා උපකරණ පිරිසිදු කිරීම කළ යුතු ය.

(ii) පොත්පත්, ඇඳුම් පැළඳුම් නියමිත පරිදි පිරිසිදුව හා පිළිවෙළට තබාගත යුතු ය.

**(ආ) ඇඳුම් හා ඇඳුම් පිරිසිදු කිරීම**

(i) ඇඳුම්, කවුළුවල, දොරවල්වල හෝ සඳලුතලවල හෝ වේලීමට වනා තැබිය යුතු නොවේ. එමෙන් ම ශාලාවේ ලී බඩු මත ද ඇඳුම් වේලීම නොකළ යුතු ය.

(ii) නාන කාමරවල ඇති බේසම්වල පෙඟීම පිණිස ඇඳුම් බහා නොතැබිය යුතු ය.

**(ඇ) විදුලිපහන්**

(i) නේවාසිකයන් ස්වකීය කාමරවලින් හා නානකාමර ආදියෙන් බැහැර යන විට විදුලි පහන් නිවා දැමිය යුතු ය.

(ii) ආලින්ද හා විවේකාගාරයන්හි සියලු විදුලි පහන් රාත්‍රී 10:00ට නිවා දමනු ලැබේ.

**(ඈ) ඝන අපද්‍රව්‍ය**

(i) සපයන ලද භාජනවල හැර ආලින්දයන්හි සහ වත්තේ ද ඝන අපද්‍රව්‍ය නොදැමිය යුතු ය.

(ii) නේවාසිකයන් තම කාමර පිරිසිදු ව තබා ගත යුතු ය. දිනපතා කාමර අතුගා එක් වන අපද්‍රව්‍ය ශාලා සේවකයන්ට ඉවත් කළ හැකි වන සේ පෙ.ව. 8:00ට පෙර පිටදොර රැස් කළ යුතු ය. ඒ සඳහා සෑම කාමරයකට ම කොස්ස බැගින් සපයනු ලබන අතර, එම කාමර පිරිසිදු කර ගැනීමේ කාර්යය එහි නේවාසිකයන් විසින් කළ යුතු ය.

**(ඉ) නිශ්ශබ්දතාව**

(i) රාත්‍රී 9:30 සිට උදෑසන 6:00 දක්වා අතර කාලය තුළ නේවාසිකයන් නේවාසිකාගාරයේ නිශ්ශබ්දතාව රැකිය යුතු ය.

(ii) නිවාසයේ පොදු ගුවන්විදුලි හා රූපවාහිනී යන්ත්‍ර ඇතුළු කවර සංගීත භාණ්ඩයක් වුව ද රාත්‍රී 9:30 සිට පෙ.ව. 6:00 දක්වා අතර කාලය තුළ භාවිතයට ගැනීමට අවසර දෙනු නො ලැබේ.

සෑම ශිෂ්‍ය නිවාසයකට ම අයත් වන සියලු ම සිසුන් මෙහි ඉහත දක්වා ඇති නීතිරීති පිළිපැදිය යුතු ය. මෙම නීතිරීති කඩ කරන සිසුන්ට පහත දැක්වෙන පරිදි දඬුවම් කිරීමට ශාලාධිපතිට/ශාලාධිපතිනියට බලය ඇත.

අ. රු. 200/-කට නොවැඩි දඩයක් අය කිරීම හා/හෝ

ආ. නේවාසිකාගාරය පරිහරණය කිරීමේ අයිතිය නියමිත කාලයකට අහිමි කිරීම

එබඳු දඬුවමක් දුන් සෑම විටක ම ඒ බව ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුවේ සටහන් කර තබන අතර, දෙමව්පියන්ට/භාරකරුවන්ට ද දැනුම් දෙනු ලැබේ.

**විශ්වවිද්‍යාලය තුළ හෝ නේවාසිකාගර තුළට කිසිදු අවස්ථාවක මත්ද්‍රව්‍ය රැගෙන ඒම හා භාවිතා කිරීම සපුරා තහනම් වන අතර, යම් අවස්ථාවක එසේ සිදුකර හසු වුවහොත් දැඩි විනය ක්‍රියාමාර්ග ගනු ලබන අතර නේවාසිකත්වය හා ශිෂ්‍යභාවය අහෝසි කරනු ලැබේ.**

නේවාසිකාගාර සම්බන්ධ ඉහත සඳහන් උපදෙස් පිළිපැදිය යුතු අතර ඔබ විසින් යථෝක්ත උපදෙස් පිළිපදින්නේදැයි පරීක්ෂාකිරීමට නේවාසිකාගාර කමිටුව විසින් කටයුතු කරනු ලැබේ. යහපත් නේවාසිකත්වය සම්බන්ධයෙන් ඉහත කමිටුව එක් එක් කාමරයේ සිටින සිසුන් අධීක්ෂණය කරනු ලබන අතර ඔවුන් සඳහා ලකුණු ලබා දීමක් ද සිදු කෙරේ.

නැවත නේවාසිකාගාර පහසුකම් ලබා දීමේ දී ඉහත ලකුණු ඇගයීමට ලක් කරනු ලබන අතර අයහපත් පැවැත්ම හේතුවෙන් ලකුණු අහිමිවීම් පදනම් කරගෙන නේවාසිකාගාර අහිමි විමට ද හැකිය.

### 3.3 ශිෂ්‍ය සංගම් පිළිබඳ කරුණු

සංගම් අතුරු ව්‍යවස්ථා අනුව පීඨ ශිෂ්‍ය සමිති හා විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සමිතිය පිහිටුවනු ලැබේ. එක් එක් පීඨ ශිෂ්‍ය සමිති සඳහා නිලවරණයක් මඟින් පහත සඳහන් පරිදි නිලධාරීන් හා අනෙකුත් සාමාජිකයන් පත් කරනු ලැබේ:

සභාපති
උපසභාපති
ලේකම්
සංස්කාරක
කනිෂ්ඨ භාණ්ඩාගාරික
කමිටු සාමාජිකයන්

පීඨයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව අනුව, පත් කළ යුතු කමිටු සාමාජිකයන් සංඛ්‍යාව තීරණය කෙරේ.

**විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතිය**

සියලු ම පීඨ ශිෂ්‍ය සමිති සඳහා තේරී පත් වන නිලධාරීන් හා අනෙකුත් සාමාජිකයන් විසින් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සමිතිය සඳහා පහත දැක්වෙන නිලධාරීහු පත් කර ගනු ලබත්:

සභාපති
උපසභාපති
ලේකම්
සංස්කාරක
කනිෂ්ඨ භාණ්ඩාගාරික

ශිෂ්‍ය සමිතිවලින් තේරී පත් වී ඇති අනෙකුත් නිලධාරීන් හා සාමාජිකයෝ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ සාමාජිකයෝ වෙති.

3.4 විෂය සංගම් හා අනෙකුත් සංගම් පිළිබඳ කරුණු

- **නව සංගම් ලියාපදිංචි කිරීම**

කැලණිය විශ්වවිද්‍යාලයේ යම්කිසි ශිෂ්‍ය කණ්ඩායමකට නව විෂය සංගමයක් පිහිටුවා ගැනීමට අවශ්‍ය නම්, සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සේවා) වෙතින් ඒ සඳහා උපදෙස් ලබා ගත යුතු ය. මෙසේ සංගමයක් ආරම්භ කිරීමට අදහස් කරන විද්‍යාර්ථීන් ඒ පිළිබඳ ව විශ්වවිද්‍යාලය තුළ ප්‍රමාණවත් ප්‍රචාරයක් කළ යුතු ය. ඉන් අනතුරු ව ප්‍රසිද්ධ රැස්වීමක් කැඳවා ව්‍යවස්ථාවක් සම්පාදනය කළ යුතු ය. මේ සඳහා ආදර්ශ ව්‍යවස්ථා පිටපතක් ශිෂ්‍ය සේවා අංශයෙන් ලබා ගත හැකි ය.

(අ) සංගමයේ සාමාජිකත්වය හිමි විය යුත්තේ කැලණිය විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි විද්‍යාර්ථීන්ට පමණි.

(ආ) සංගමය විශ්වවිද්‍යාලයෙන් බැහැර කිසිම සංවිධානයකට අනුබද්ධ නො විය යුතු ය.

(ඇ) ලියාපදිංචි නො වූ කිසි ම සංගමයකට විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වීමට බලය නොමැත. සංගමයක් ලියාපදිංචි කිරීම අධ්‍යයන වර්ෂය ආරම්භ වී මාස දෙකක් ඇතුළත සිදු කළ යුතු අතර සංගමය මඟින් අධ්‍යයන වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් විස්තරය ලියාපදිංචි වී දෙසතියක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

- **සංගම් සඳහා මුදල් ලබා ගැනීම**

සෑම විෂය සංගමයකට ම ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයකු මෙන් ම කනිෂ්ඨ භාණ්ඩාගාරිකවරයකු සිටිය යුතු ය. සංගම් සඳහා අරමුදල්, සාමාජික ගාස්තු එකතු කිරීමෙන් සහ වෙනත් ක්‍රම මඟින් සපයා ගත යුතු ය.

එසේ සෑම සංගමයක් විසින් ම තම සංගමය නමින් වෙන ම බැංකු ගිණුමක් තබා ගත යුතු ය. සෑම ගෙවීමක් ම වවුචරයක් මඟින් කළ යුතු ය. සෑම ගෙවීමකට ම ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකගේ අනුමතිය ලබා ගත යුතු ය. අධ්‍යයන වර්ෂය අවසන් වී සතියක් ඇතුළත සෑම සංගමයක ම අයවැය ලේඛනය ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මඟින් සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සේවා) වෙත ඉදිරිපත් කළ යුතු ය.

විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන විෂය සංගම් හා අනෙකුත් සංගම් මතු වගුවෙහි දැක්වේ.

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

- ගණකාධිකරණ ශිෂ්‍ය සංගමය
- "AHEAD" Students' Association
- "Blue key" Students' Association
- ව්‍යාපාර හා තාක්ෂණය සඳහා වූ ශිෂ්‍ය සංගමය
- Commerce Club
- ගිණුම්කරණ තොරතුරු පද්ධති ශිෂ්‍ය සංගමය
- මූල්‍ය කළමනාකරණ ශිෂ්‍ය සංගමය
- Finance Students' Association
- Future Marketers' Association
- තරුණ ව්‍යවසායකත්ව ශිෂ්‍ය සංගමය
- වාණිජ හා මූල්‍යය කළමනාකරණ ශිෂ්‍ය සංගමය
- ව්‍යෝහාරික ගිණුම්කරණ ශිෂ්‍ය සංගමය

**පරිගණක හා තාක්ෂණ පීඨය**

- පරිගණක විද්‍යා ශිෂ්‍ය සංගමය
- තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය සංගමය
- Legion ශිෂ්‍ය සංගමය
- Green Club
- ඉංජිනේරු තාක්ෂණ ශිෂ්‍ය සංගමය
- " Kelani Focus" Students' Association

**මානවශාස්ත්‍ර පීඨය**

- TESL Student's Association
- Academic Players Student's Association
- භික්ෂු ශිෂ්‍ය සංගමය
- හින්දි පර්ෂදය
- චීන භාෂා සංසදය
- සිනමා හා රූපවාහිනී සංසදය
- English Student's Association
- ප්‍රංශ භාෂා ශිෂ්‍ය සංගමය
- ජර්මානු කවය ශිෂ්‍ය සංගමය
- කොරියානු භාෂා ශිෂ්‍ය සංගමය
- ජපන් භාෂා ශිෂ්‍ය සංගමය
- ලලිත කලා ශිෂ්‍ය සංගමය
- ක්‍රිස්තියානි සංස්කෘතිය විෂය සංගමය
- භාෂා පරිවර්තන කවය
- වාග් විද්‍යා පර්ෂදය
- පාලි හා බෞද්ධ අධ්‍යයන ශිෂ්‍ය සංගමය
- ඡායාරූප හා සිනමා ශිෂ්‍ය සංගමය
- රුසියානු ශිෂ්‍ය සංගමය
- සංප්‍රාශා පර්ෂදය
- සිංහල ශිෂ්‍ය සංගමය
- Western Classics Association
- දෙමළ භාෂා අධ්‍යයන සංසදය
- විකල්ප පර්යේෂකයන්ගේ සංගමය

**වෛද්‍ය පීඨය**

- වෛද්‍ය පීඨ බෞද්ධ සංගමය
- Catholic Student Movement
- Green Society
- MEDKEL Beyond Boundaries
- වෛද්‍ය පීඨ ඉස්ලාම් ශිෂ්‍ය සංගමය
- වෛද්‍ය පීඨ හින්දු ශිෂ්‍ය සංගමය
- වෛද්‍ය පීඨ ඡායාරූප සංගමය
- වෛද්‍ය පීඨයේ - කථන හා ශ්‍රවනවේදි ශිෂ්‍ය සංගමය
- Speech Therapy & Audiology Student's Association
- වෛද්‍ය පීඨ ක්‍රීඩා සංගමය
- Art Society

**විද්‍යා පීඨය**

- American Chemical Society Student Chapter
- Aquatic Club
- තාරකා හා අභ්‍යවකාශ විද්‍යා ශිෂ්‍ය සංගමය
- ජෛව රසායන විද්‍යා ශිෂ්‍ය සංගමය
- කලා කවය
- බෞද්ධ ශිෂ්‍ය සංගමය
- රසායන විද්‍යා ශිෂ්‍ය සංගමය
- Chemical Society International Chapter
- ඉලෙක්ට්‍රෝනික ශිෂ්‍ය සංගමය
- පරිසර සංරක්ෂණ හා කළමනාකරණ ශිෂ්‍ය සංගමය
- Hiking and Survival ශිෂ්‍ය සංගමය
- ජීව විද්‍යා සිසුන්ගේ සංසදය
- සත්ත්ව විද්‍යා ශිෂ්‍ය සංගමය
- කර්මාන්ත පරිපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය
- 'Intellex' ශිෂ්‍ය සංගමය
- විද්‍යා පීඨ කලා සංසදය
- කැලණි පික්සල් සංගමය
- **M.S.** ශිෂ්‍ය සංගමය
- ගණිත ශිෂ්‍ය සංගමය
- ක්ෂුද්‍ර ජීව විද්‍යා සංගමය
- ශාක හා අණුක ජීව විද්‍යා සංගමය
- "Nature Club"
- "Nimnada" සංගීත සංගමය
- භෞතික විද්‍යා ශිෂ්‍ය සංගමය
- විද්‍යා පීඨ රොටරැක්ට් සමාජය
- Software Community
- මෘදුකාංග ඉංජිනේරු ශිෂ්‍ය සංගමය
- සංඛ්‍යානය හා පරිගණක විද්‍යා ශිෂ්‍ය සංගමය
- විදුලකර එකමුතුව
- ක්‍රීඩා විද්‍යා ශිෂ්‍ය සංගමය

- "Invetor's Club"
- ව්‍යවහාරික රසායන විද්‍යා ශිෂ්‍ය සංගමය
- Young Computing Professional's Society
- ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යා ශිෂ්‍ය සංගමය

**සමාජීය විද්‍යා පීඨය**

- පුරා විද්‍යා ශිෂ්‍ය සංගමය
- සිනමාව හා දෘෂ්‍ය කලා සංගමය
- Unik Radio Society
- සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමය
- ආර්ථික විද්‍යා ශිෂ්‍ය සංගමය
- භූගෝල විද්‍යා ශිෂ්‍ය සංගමය
- ඉතිහාසය ශිෂ්‍ය සංගමය
- ජාත්‍යන්තර අධ්‍යයන ශිෂ්‍ය සංගමය
- ගවේශක ශිෂ්‍ය සංගමය
- Millenniums' Power Society
- පුස්තකාල හා විඥාපන විද්‍යා ශිෂ්‍ය සංගමය
- පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය ඉංග්‍රීසි සංගමය
- ජනසන්නිවේදන ශිෂ්‍ය සංගමය
- හුස්ම එකමුතු සංසදය
- සාම සංගමය
- දර්ශන ශිෂ්‍ය සංගමය
- දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගමය
- මහජන සම්බන්ධතා හා මාධ්‍යය කළමනාකරණ ශිෂ්‍ය සංගමය
- විප්ලවවාදී ශිෂ්‍ය සංගමය
- සිබා ශිෂ්‍ය සංගමය
- සමාජ විද්‍යා ශිෂ්‍ය සංගමය
- සමාජ සංඛ්‍යානය ශිෂ්‍ය සංගමය
- ක්‍රීඩා හා විශ්‍රාන්ති කළමනාකරණ ශිෂ්‍ය සංගමය
- Tourism Club
- Wellness Club
- අසරණයන් සඳහා වූ තරුණ සංවිධානය
- 'SURA' ශිෂ්‍ය සංගමය
- මනෝවිද්‍යා ශිෂ්‍ය සංගමය

**විශ්වවිද්‍යාලීය පොදු ශිෂ්‍ය සංගම් හා ශිෂ්‍ය සමාජ**

- Gavel Club
- Leo Club
- Humane Society
- Dance Club
- ROTARACT Club
- Adventure Club
- Zero Plastic Movement
- Community of Digital Explores
- ISACA Student Group
- IEEE Students' Association
- LED KLN
- AIESEC Students' Association
- Free and Open Source software community
- Young Journalist club
- බෞද්ධ ශිෂ්‍ය සංගමය
- කතෝලික ශිෂ්‍ය සංගමය
- ඉස්ලාම් ශිෂ්‍ය සංගමය
- දෙමළ ශිෂ්‍ය සංගමය
- ක්‍රිස්තියානි ශිෂ්‍ය සංගමය
- කැලණිය සහෘද ශිෂ්‍ය සංගමය
- විවාද සංසදය
- Gender Club
- UOK-MUN
- Beyond the Art සංගමය
- සමාජවාදී ශිෂ්‍ය සංගමය
- හරිත කවය
- අභ්‍යවකාශ ගවේෂණ හා සංවර්ධන ශිෂ්‍ය සංගමය

### 3.5 රැස්වීම්, උත්සව හා චිත්‍රපට සහ නාට්‍ය දර්ශන සංවිධානය කිරීම පිළිබඳ උපදෙස්

කැලණිය විශ්වවිද්‍යාලයේ කිසියම් ශිෂ්‍ය සංගමයකට රැස්වීමක් හෝ උත්සවයක් හෝ චිත්‍රපට දර්ශනයක් හෝ පැවැත්වීමට වුවමනා වූ විට ඒ සඳහා අවශ්‍ය අයදුම් පත්‍ර ශිෂ්‍ය සේවා අංශයෙන් ලබා ගත හැකි ය. යථෝක්ත රැස්වීම් ආදිය සඳහා ශිෂ්‍ය සංගමයක ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකගේ නිර්දේශය ඇති ව අනුමැතිය ලබා ගත යුතු ය.

### 3.6 චාරිකා සංවිධානය කිරීම පිළිබඳ උපදෙස්

විවිධ ශිෂ්‍ය සංගම් මඟින් සංවිධානය කරනු ලබන සෑම අධ්‍යයන චාරිකාවක් සඳහා ම ශිෂ්‍ය කටයුතු අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගත යුතු ය. ඒ සඳහා පහත සඳහන් නියමයන් බලපානු ඇත.

(අ) සෑම චාරිකාවක් ම විශ්වවිද්‍යාලයේ නිවාඩු දිනයන්ට යෙදෙන සේ සංවිධානය කළ යුතු ය. යම්කිසි චාරිකාවක් මීට වෙනස් ව සංවිධානය කිරීම අවශ්‍ය වෙතොත්, ඒ සඳහා අදාළ පීඨාධිපතිවරයාගේ අනුමැතිය ලබා ගත යුතු ය.

(ආ) චාරිකා සඳහා ලිඛිත ව ඉල්ලුම් කළ යුතු ය.

(ඇ) චාරිකාවට සම්බන්ධ සිසුන්ගේ නාම ලේඛන, එයට සම්බන්ධ වන කථිකාචාර්යවරුන්ගේ කැමැත්ත දක්වන ලිපි හා චාරිකාව සඳහා ගත වන කාලය, පිටත් වන දිනය හා වේලාව, ආපසු පැමිණෙන දිනය හා පැමිණීමට අපේක්ෂිත වේලාව සහ රාත්‍රී නවතින ස්ථාන ද දැක්විය යුතු ය.

(ඈ) යම් චාරිකාවකට ශිෂ්‍යාවන් සහභාගි වේ නම්, ඔවුන් සමඟ ස්ථිර ආචාර්ය මණ්ඩලයේ කථිකාචාර්යවරියක ද සහභාගි විය යුතු ය. එසේ සහභාගි වන කථිකාචාර්යවරිය විසින් තමන් එයට සහභාගී වන බවට සහතික කරන ලද ලිපියක් ද සංවිධායකයන් විසින් ඉදිරිපත් කළ යුතු ය

### 3.7 දැන්වීම් ප්‍රදර්ශනය කිරීම පිළිබඳ උපදෙස්

දැන්වීම් හා පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් අයුරින් කටයුතු කළ යුතු ය.

(අ) සියලු ම දැන්වීම් ශිෂ්‍ය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂකගේ අනුමතිය ඇති ව දැන්වීම් සඳහා වෙන් කර ඇති ස්ථානයන්හි පමණක් ප්‍රදර්ශනය කළ යුතු ය.

(ආ) සෑම දැන්වීමක් ම දින 10කට පමණ සීමා කිරීමට අපේක්‍ෂා කෙරේ.

**සහකාර ලේඛකාධිකාරි/ශිෂ්‍යසේවා - දු.අංකː 0112 903 124**
**ශිෂ්‍යසේවා අංශය - දු.අංකː 0112 903 124**

# 04. විශ්වවිද්‍යාල පුස්තකාලය

**පුස්තකාලයාධිකාරි**
ආචාර්ය සී.සී. ජයසුන්දර මයා
*B.A. Stat (Ruhuna), M.Sc. (Sheffield) DLitt. (South Africa), AALIA (CP) (Australia)*

**අධ්‍යයන කාර්ය මණ්ඩලය**
සී.එම්. අබේගුණසේකර මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි I
*B.Sc. Agri (Perad'ya), PgDLS. (London), M.A. (London)*
ආචාර්ය ආර්.ජී.ජී.එස්. රණවීර මෙය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි I
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), Ph.D. (Wuha, P.R. China)*
ආචාර්ය ඩබ්ලිව්.එම්.ටී.ඩී. රණසිංහ මයා - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි I
*B.A. (Kel'ya) MSSc. (Kel'ya), Ph.D. (CNU, S.Korea), ALA (Sri Lanka)*
ජී.එස්. රූබසිංහ මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි I
*B.A (Kel'ya), M.A. (Kel'ya), MSSc. (Kel'ya)*
ඩී.එස්. ප්‍රියංගිකා මෙය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි I
*B.Sc. (Kel'ya), PGD in Comp. Tec. (C'bo), MLIS (C'bo)*
ජී.පී.යු. ද සිල්වා මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි I
*B.A. (Kel'ya.), MSSc. (Kel'ya), ALA (Sri Lanka)*
එම්.පී.එල්.ආර්. මාරසිංහ මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි I
*B.Sc. (Kel'ya), MLS (C'bo), Ph.D (Kel'ya)*
අයි.කේ.ඩී. දිලිනි බෝධිනායක මෙය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි II
*B.A (Kel'ya), MSSc. (Kel'ya)*
ආර්.එම්.ඩී.පී. රත්නායක මයා - සහකාර පුස්තකාලයාධිකාරි
*B.A. (Kel'ya), MSSc (Kel'ya), ASLLA*
බී.ජී.එස්.පී. විමලසිරි මිය - සහකාර පුස්තකාලයාධිකාරි
*B.A. (Kel'ya), MSSc (Kel'ya), ASLLA*
කේ.එස්. මුණසිංහ මයා - සහකාර පුස්තකාලයාධිකාරි
*B.A. (Kel'ya), M.Sc. ( SLIIT),PgDIS (SLIIT)*

**පරිපාලන කාර්ය මණ්ඩලය**
කේ.ඩී. ජයනායක මයා - සහකාර ලේඛකාධිකාරි (පුස්තකාල සේවා)
*B.A. (Perad'ya), M.A. (Kel'ya), Dip. Lib. & Inf. Sc. (Kel'ya), Dip. Business Eng. (Kel'ya)*

**හැඳින්වීම**
කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය 65 වසරකට ආසන්න ඉතිහාසයකට හිමිකම් කියනු ලබයි. වර්ෂ 1959 දී එවකට පැවැති විද්‍යාලංකාර පිරිවෙන, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය බවට පත්වීමත් සමඟ එහි වූ වටිනා ග්‍රන්ථ එකතු ව පදනම් කොටගෙන ඇරඹුණු පුස්තකාලය වත්මන් ගොඩනැගිල්ලට ගෙන එනු ලැබුවේ වර්ෂ 1977 දී ය. මෙම ගොඩනැගිල්ලේ ඉඩකඩ ප්‍රමාණවත් නොවූ බැවින් 2013 වර්ෂයේ දී සිව් මහල් නව ගොඩනැගිල්ල පුස්තකාලයට එකතු කරන ලදි. දැනට විවිධ විෂයයන්ට අයත් ග්‍රන්ථ 252,838 ක් පමණ තැන්පත් කර ඇති අතර දේශීය හා විදේශීය මුද්‍රිත වාර සඟරා 25 කට ආසන්න ප්‍රමාණයකට සෘජු දායකත්වය ලබා ඇත.

කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලය විසින් EBSCO, JSTOR, Research4life, Emerald, Oxford University Press Cambridge, Elsevier, Wiley, ProQuest සහ Taylor and Francis දත්ත සමුදායන්හි වාර සඟරා සහ ඉලෙක්ට්‍රොනික පොත් සඳහා ප්‍රවේශය ලබාදී ඇත. මෙම දත්ත සමුදායන් හරහා

ශාස්ත්‍රීය විද්‍යුත් වාර සඟරා (Academic full text journals) 12,500 කට අධික ප්‍රමාණයකටත්, විද්‍යුත් පොත් 100,000 ආසන්න ප්‍රමාණයකටත් පූර්ණ ප්‍රවේශ පහසුකම් ලබා දී ඇත.
පාඨක තොරතුරු අවශ්‍යතා සහ තොරතුරු සාක්ෂරතා පුහුණුව සපුරාලනු පිණිස එක් එක් අධ්‍යයන පීඨය සඳහා වෘත්තීයමය විෂය මූලික පුස්තකාලයාධිපතිවරුන් අනුයුක්ත කර ඇති අතර, පාඨක ඔබගේ ඕනෑම තොරතුරු අවශ්‍යතාවයක් සඳහා අදාළ විෂය මූලික පුස්තකාලයාධිපතිවරුන් සමඟ ඕනෑම මොහොතක සම්බන්ධ විය හැකි ය.

කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය තුළ නොමැති පොත් අන්තර් පුස්තකාල පිරුළු සේවය හරහා වෙනත් විශ්වවිද්‍යාල පුස්තකාලයකින් ගෙන්වා දෙනු ලබන අතර, වාර සඟරා ලිපි බ්‍රිතාන්‍ය පුස්තකාල ලේඛන හුවමාරු සේවාව හරහා ගෙන්වා දෙනු ලැබේ.

**4.1 පාඨක ලියාපදිංචිය:**
පහත අය පාඨකයන් වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි.

- විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී සිටින උපාධි අපේක්ෂිත අභ්‍යන්තර සිසුන්,
- විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී සිටින පශ්චාද් උපාධි සිසුන්,
- විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවයේ නියුතු සාමාජිකයින්,
- විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තාවකාලික සේවයේ නියුතු සාමාජිකයින්,
- විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවයේ නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්

ස්වකීය අනන්‍යතාව තහවුරු කෙරෙන පහත දැක්වෙන ලේඛන අතුරින් තමාට අදාළ ලේඛනය පුස්තකාලයේ පාඨක සේවා අංශය වෙත ඉදිරිපත් කර අදාළ සාමාජිකත්ව ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර දීමෙන් පසු පුස්තකාල සාමාජිකත්වය ලබා ගත හැකි ය.

(1) ශිෂ්‍ය හැඳුනුම්පත
(2) ශාස්ත්‍රීය අංශයෙන් හෝ විශ්වවිද්‍යාලයෙහි වෙනත් අදාළ අංශයකින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ ලිපි
(3) විශ්වවිද්‍යාල හැඳුනුම්පත සහ පත්වීමේ ලිපිය

පහත දැක්වෙන පරිදි අභ්‍යන්තර මූලික උපාධි පාඨමාලා හදාරන සිසුන්ට තම හැඳුනුම්පත පාඨක සේවා කවුන්ටරය වෙත ඉදිරිපත් කිරීමෙන් පොත් බැහැරගෙන යා හැකි වේ.

| | විමර්ශන අංශය | බැහැරදෙන අංශය |
|---|---|---|
| පළමු වසර | 1 | 2 |
| දෙවන වසර | 1 | 2 |
| තෙවන වසර | 2 | 3 |
| සිව්වන වසර | 3 | 4 |

විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ පශ්චාද් උපාධි අපේක්ෂකයින්ට විශ්වවිද්‍යාල හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු පුස්තකාලයේ බැහැරදෙන අංශයේ බලපත්‍රයක් සහ විමර්ශන අංශයේ බලපත්‍රයක් ලබා ගත හැකි ය. මේ සඳහා පශ්චාද් උපාධි සිසුන්ගෙන් රුපියල් 2,000.00 ක ආපසු නොගෙවන අනිවාර්ය ගාස්තුවක් හා එක් බලපත්‍රයක් වෙනුවෙන් රුපියල් 7,500.00 ක ආපසු නොගෙවන තැන්පතු ගාස්තුවක් අය කෙරේ. එක් අයෙකුට නිකුත් කරන උපරිම බලපත්‍ර සංඛ්‍යාව දෙකකි.

ලියාපදිංචි වන අවස්ථාවේ දී පුස්තකාලය පිළිබඳ සියලු විස්තර ඇතුළත් පුස්තකාල අත්පොතක් පාඨකයන්ට නිකුත් කරනු ලැබේ.

**4.2 පුස්තකාලය විවෘතව තබන වේලාවන්**

| අංශය | සතියේ දිනවල | සති අන්තය | |
|---|---|---|---|
| | | සෙනසුරාදා | ඉරිදා |
| විමර්ශන අංශය | පෙ.ව.8.00- රාත්‍රී 10.00 | පෙ.ව.8.00 - ප.ව. 10.00 | පෙ.ව.8.00-ප.ව. 10.00 |
| බැහැරදෙන අංශය | පෙ.ව.8.00- රාත්‍රී 6.00 | පෙ.ව.8.00 - ප.ව. 6.00 | පෙ.ව.8.00- ප.ව. 6.00 |
| නිත්‍ය විමර්ශන අංශය | පෙ.ව.8.00 - ප.ව. 4.00 | පෙ.ව.8.00 - ප.ව. 6.00 | වසා ඇත |
| ශ්‍රී ලංකා එකතුව | පෙ.ව.8.00 - ප.ව. 4.00 | පෙ.ව.8.00 - ප.ව. 6.00 | |
| පාඨක සේවා කාර්යාලය | පෙ.ව.8.00 - ප.ව. 4.00 | පෙ.ව.8.00 - ප.ව. 6.00 | |
| කෞතුකාගාරය හා දුර්ලභ මූලාශ්‍ර | පෙ.ව.8.00 - ප.ව. 4.00 | පෙ.ව.8.00 - ප.ව. 6.00 | |
| ඡායා පිටපත් ඒකකය | පෙ.ව.8.00 - ප.ව. 4.00 | පෙ.ව.8.00 - ප.ව. 4.00 | |
| අන්තර්ක්‍රියාකාරි මාධ්‍ය ඒකකය | පෙ.ව.8.00 - ප.ව. 6.00 | පෙ.ව.8.00 - ප.ව. 6.00 | |

**4.3 පුස්තකාලයේ සේවා අංශ**

පුස්තකාලයේ දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන සේවා අංශ පහත සඳහන් පරිදි වේ.

- පාඨක සේවා අංශය (Reader Services Section)
- විමර්ශන අංශය (Reference Section)
- බැහැරදෙන අංශය (Lending Section)
- අන්තර්ක්‍රියාකාරි මාධ්‍ය ඒකකය (Interactive Media Unit)
- පරිගණක විද්‍යාගාරය (Computer Lab)
- බාහිර නිදහස් කියවීම් ශාලාව - (F12 ගොඩනැගිල්ල හෙවත් සරුංගලය)
- වාර ප්‍රකාශන අංශය (Periodical Section)
- ශ්‍රව්‍යදෘෂ්‍ය පුස්තකාලය (Audio-visual Library)

**4.4 විශේෂ පුස්තකාල එකතුන්**

- ශ්‍රී ලංකා එකතුව (Sri Lanka Collection)
- නිර්දේශිත ග්‍රන්ථ එකතුව (Recommended Readings Collection)
- පාඨ ග්‍රන්ථ එකතුව (Text Books Collection)
- කෞතුකාගාරය (Museum) හා දුර්ලභ ග්‍රන්ථ එකතුව (Rare Material Collection)
- නිත්‍ය විමර්ශන එකතුව (Permanent Reference Collection)
- පර්යේෂණ නිබන්ධන එකතුව (Theses Collection)

**4.5 පීඨ සම්බන්ධතා විෂය මූලික පුස්තකාලයාධිපතිවරුන් විසින් සපයන පාඨක මාර්ගෝපදේශන සේවා**

- විමර්ශන මූලාශ්‍රය සම්පාදනය
- තොරතුරු සාක්ෂරතා පාඨමාලා (Information Literacy Courses)
- ප්‍රකාශන චෞරත්වය (Plagiarism) පරීක්ෂා කිරීම
- නම්නීකරණ වැඩසටහන් (Library orientation programmes)
- අන්තර් පුස්තකාල පිරුළු සේවය
- ශාස්ත්‍රීය ලිපි සැපයීම් සේවය (Document Supply Service)
- ශාස්ත්‍රීය ලිපි හා නිබන්ධන සැකසීමේ උපදේශන සේවාව
- විෂය මූලික තොරතුරු මූලාශ්‍ර සේවාව (Subject Guidance)
- සාහිත්‍ය විමර්ශන උපදේශන සේවාව
- විශේෂ පර්යේෂණ මෘදුකාංග පුහුණු සේවාව

**4.6 මාර්ගගත සේවා**

- පුස්තකාල වෙබ් අඩවිය
- ඩිජිටල් කියවන වෙබ් අඩවිය
- පුස්තකාල කළමනාකරණ පද්ධතිය
- සංඛ්‍යාංක පුස්තකාලය (Digital Repository)
- Library Mobile App
- Instant Message Service
- Audio Book project
- Braille Collection
- ඒකාබද්ධ ගවේෂණ යන්ත්‍රය (Federated Search Engine)
- මෘදුකාංග භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම

**4.7 අනෙකුත් සේවා**

- Wi-Fi පහසුකම්
- ඡායා පිටපත් සේවය
- ස්කෑන් සේවය
- අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ශාස්ත්‍රීය ලේඛන බැඳීම් සේවය

**4.8 විෂය මූලික පුස්තකාලයාධිපතිවරුන් (Subject Liaison Librarians)**

විශ්වවිද්‍යාලයේ සියලු ම පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ අධ්‍යයන හා පර්යේෂණ අවශ්‍යතාවලට සහාය වීම සඳහා එක් එක් පීඨවලට අදාළ ව පහත සඳහන් පීඨ පුස්තකාලයාධිපතිවරුන් පත්කර ඇත. එම පීඨ පුස්තකාලයාධිපතිවරුන් විසින් අදාළ පීඨයේ පාඨක අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කරනු ලබන අතර එයට අමතර ව පර්යේෂණවල දී පාඨක ප්‍රජාවගේ අවශ්‍යතාවයන්ට අනුව සාහිත්‍ය ගවේෂණය (Literature Survey), උද්ධරණ ක්‍රම (Citation) විශ්ලේෂණය, ආශ්‍රේය ග්‍රන්ථ නාම ලැයිස්තු (Reference Styles) සකස් කිරීම සඳහා සහාය වීම, ප්‍රකාශන චෞරත්වය (Plagiarism) පරීක්ෂා කිරීම, අන්තර් පුස්තකාල පිරුළු සේවා සහ ලේඛන හුවමාරු සේවා සිදු කරනු ලැබේ.

1. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
   ආචාර්ය ආර්.ඒ.ඒ.එස්. රණවීර මෙය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
   විද්‍යුත් ලිපිනය (e-mail) - achala@kln.ac.lk

2. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
   ආචාර්ය ඩබ්.එම්.ටී.ඩී. රණසිංහ මයා - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
   විද්‍යුත් ලිපිනය (e-mail) - tharangad@kln.ac.lk

3. මානවශාස්ත්‍ර පීඨය
   ඒ.එස්. රූබසිංහ මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
   විද්‍යුත් ලිපිනය (e-mail) - sajeewanie@kln.ac.lk

4. විද්‍යා පීඨය
   සී.එම්. අබේගුණසේකර මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
   විද්‍යුත් ලිපිනය (e-mail) – chithra@kln.ac.lk

5. සමාජීය විද්‍යා පීඨය
   ආචාර්ය ඩබ්.එම්.ටී.ඩී. රණසිංහ මයා - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
   විද්‍යුත් ලිපිනය (e-mail) - tharangad@kln.ac.lk

6. වෛද්‍ය පීඨය
   ආචාර්ය එම්. පී. එල්. ආර්. මාරසිංහ මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
   විද්‍යුත් ලිපිනය (e-mail) - lakmini@kln.ac.lk

7. පරිගණක හා තාක්ෂණ පීඨය
   ඒ.පී.යූ. ද සිල්වා මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
   විද්‍යුත් ලිපිනය (e-mail) - udayangani@kln.ac.lk

ඔබට අවශ්‍ය ඕනෑ ම අධ්‍යයන හා පර්යේෂණ අවශ්‍යතාවක් සඳහා අදාළ පීඨයන්හි විෂය මූලික පුස්තකාලයාධිපතිවරුන් සමග සම්බන්ධ විය හැකි ය. විශේෂයෙන් ම අවසන් වසර ඉගෙනුම ලබන අභ්‍යන්තර සිසුන්ගේ සහ පශ්චාද් උපාධි අපේක්ෂක සිසුන්ගේ නිබන්ධන සකස් කිරීමේ දී ඉහත සඳහන් සේවාවන් වෙනුවෙන් පීඨ පුස්තකාලයාධිපතිවරුන්ගේ සහය ඕනෑ ම අවස්ථාවක දී ලබා ගත හැකි ය.

#### 4.9 වෛද්‍ය පීඨ පුස්තකාලය

උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලයේ පුස්තකාලය ලෙස ඇරඹුණු වෛද්‍ය පීඨ පුස්තකාලය රාගම තලගොල්ලේ පිහිටි වෛද්‍ය පීඨ පරිශ්‍රයේ පිහිටා ඇත. වෛද්‍ය පීඨ ආචාර්යවරුන්ගේ හා ශිෂ්‍යයන්ගේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවලට අදාළ තොරතුරු හා සේවා සැපයීම මෙම පුස්තකාලයේ මූලික අරමුණ වේ.

වෛද්‍ය විද්‍යා විෂයන්ට අදාළ පොත් 18,600 ට අධික ප්‍රමාණයක් මෙම පුස්තකාලයේ ඇති අතර වෛද්‍ය විද්‍යුත් වාර සඟරා සඳහා EBSCO දත්ත පදනම මගින් ප්‍රවේශය ලබා දී ඇත. ProQuest EBook Central, සහ Taylor & Francis Ebook දත්ත පදනම් මගින් ප්‍රධාන වෛද්‍ය සහ කථන ශ්‍රවණ විද්‍යා විද්‍යුත් පෙළපොත් 30 ක් සහ විශේෂිත විද්‍යුත් පොත් 16 ක් සඳහා ද පුස්තකාල විසින් දුරස්ථ ප්‍රවේශය සපයනු ලැබේ. මීට අමතර ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ කොන්සෝටියම (UCG consortium) සහ ප්‍රධාන පුස්තකාලය විසින් දායක වී ඇති සියලු ම පූර්ණ පෙළ සඟරා දත්ත සමුදායන් වෙත දුරස්ථව ද ප්‍රවේශ විය හැක.

වෛද්‍ය පීඨයේ ලියාපදිංචි වන සියලු ම සිසුන්ට හා වෛද්‍ය පීඨ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට පුස්තකාල සාමාජිකත්වය ලබා ගත හැකි ය. පුස්තකාලය සතියේ දිනවල පෙ.ව. 8.30

සිට ප.ව. 7.00 දක්වාත්, සෙනසුරාදා දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 6.00 දක්වාත් විවෘත ව තබන අතර, ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල වසා තබනු ලැබේ.

වෛද්‍ය පීඨ පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමේ දී පළමු වසර සිසුන්ට වෛද්‍ය පුස්තකාල මාර්ගෝපදේශකය (Medical Library Guide) නිකුත් කරනු ලැබේ. වැඩිදුර විස්තර ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී (වෛද්‍ය පීඨ පුස්තකාලය) මඟින් ලබාගත හැකි වේ.

දුරකථන අංක: 011 2961154
විද්‍යුත් තැපැල: libmed@kln.ac.lk

**4.10 විද්‍යා පීඨ පශ්චාද් උපාධි පුස්තකාලය**

විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ විද්‍යා පීඨ පශ්චාද් උපාධි පුස්තකාලය ස්ථාපිත කර ඇත. මෙහි විද්‍යා විෂයන්ට අදාළ ග්‍රන්ථ පමණක් සංවිධානය කර ඇති අතර ග්‍රන්ථ 2000 ට අධික ප්‍රමාණයක් ඇත. පීඨ සාමාජික අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ පශ්චාද් උපාධි අපේක්ෂකයන්ට මෙහි පොත් නිකුත්කරනු ලබන අතර විද්‍යා පීඨ සියලු ම අධ්‍යයන වර්ෂවල සිසුන්ට මෙම පුස්තකාලය පරිශීලනය කිරීමට අවස්ථාව ලබා දී ඇත. රජයේ නිවාඩු දිනයන් සහ සති අන්ත දින හැර සතියේ සෑම දිනක ම පෙරවරු 8.00 සිට පස්වරු. 4.15 දක්වා පුස්තකාලය විවෘතව පවතී.

දුරකථන අංකඃ 011 2903423

**4.11 පුස්තකාල වගකීමෙන් නිදහස් වීම**

සියලුම උපාධි හා පශ්චාද් උපාධි සිසුන් විසින් අදාළ පාඨමාලා අවසානයේ පුස්තකාලයෙන් ලබාගෙන ඇති පුස්තකාල ග්‍රන්ථ ආපසු පුස්තකාලයට භාරදී ඒ පිළිබඳ අදාළ සටහන් තබා ගත යුතු වේ. විශ්වවිද්‍යාලයේ විභාග අංශය මගින් විභාග සහතික ඉල්ලුම් කිරීමේ දී පුස්තකාල වගකීම්වලින් මිදී ඇති බවට සහතිකයක් අවශ්‍ය බැවින් එවැනි අවස්ථාවල දී ඇති වන අනවශ්‍ය ප්‍රමාදයන් හා අපහසුතාවයන් කලින් ම වළක්වා ගැනීම පිණිස පුස්තකාල වගකීම්වලින් නිදහස් වී ඇති බවට පුස්තකාලයෙන් සහතික කරගැනීම අත්‍යවශ්‍ය බව සැලකිය යුතු ය.

**4.12 වැඩි විස්තර**

පුස්තකාලයෙන් ලබාගෙන ඇති පොත් නිසි වේලාවට ආපසු භාරදිය යුතු ය. එලෙස භාර නොදෙන්නේ නම් පහත දැක්වෙන පරිදි ඊට අදාළ ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සිදු වේ.

| පුස්තකාලය විවෘතව තබන එක් දිනකට | |
|---|---|
| බැහැරදෙන පොතක් සඳහා | විමර්ශන පොතක් සඳහා |
| රු. 2.00 | රු. 5.00 |

ඔබට පුස්තකාලයෙන් ලබාගත් පොත් නැවත අලුත් කර ගැනීමට අවශ්‍ය නම් පොත් භාරදිය යුතු දිනයේ හෝ ඊට පෙර පුස්තකාල කවුන්ටරයට තම විශ්වවිද්‍යාල හැඳුණුම්පත ඉදිරිපත් කර තවත් එක් වතාවකට පුස්තකාලයෙන් ලබාගෙන ඇති පොත් අලුත් කර ගත හැකි ය. මෙහි දී පොත් අලුත් කරගැනීමට ලබාගත් පොත් නැවත පුස්තකාලයට රැගෙන ඒම අවශ්‍ය නොවේ.

පුස්තකාලයෙන් ලබාගත් පොතක් ඔබ අතින් අස්ථානගත වුවහොත් ඒ බව කඩිනමින් සහකාර පුස්තකාලයාධිකාරී (පාඨක සේවා) වෙත ලිඛිත ව දැනුම් දී අවශ්‍ය උපදෙස් ලබාගත යුතු ය. එසේ දැනුම්දීමට ප්‍රමාද වන්නේ නම් එම පමා කාලයට ද ප්‍රමාද ගාස්තු අය කරනු ලැබේ.

දැනට පුස්තකාලයේ ක්‍රියාත්මක ඡායා පිටපත් ගාස්තු පහත සඳහන් පරිදි වේ.

| A4 කඩදාසිය | |
|---|---|
| තනි පැත්ත | දෙපැත්ත |
| රු. 8.00 | රු. 8.00 |

පුස්තකාලය සතු කිසිම භෞතිකමය තොරතුරු මූලාශ්‍රයන් කුමන හෝ කාරණයක් මත නිසි බැහැරදීමේ ක්‍රියා පිළිවෙතින් තොර ව පුස්තකාලයෙන් පිටතට ගෙන යා නොහැකි ය. එවැනි කාරණා ඉතා ඕනෑකමින් සලකා බලන අතර, එයට මුලික වූ පාඨකයන්ව විධිමත් විනයානුකූල ක්‍රියාදමයකට යොමු කරනු ලැබේ. තවද පුස්තකාලයේ ඕනෑ ම ආකාරයක උපකරණ, කියවීමේ ද්‍රව්‍ය සොරකම් කිරීම හෝ ඒවාට හානි කිරීම සහ වෙනත් පරිශීලකයෙකුට තම විශ්වවිද්‍යාල හැඳුනුම්පත ලබා දීම මගින් පුස්තකාලයෙන් පොත් බැහැර ගෙන යාම විනයානුකූලව පියවර ගත හැකි කරුණු බව සැලකිය යුතු ය.

පුස්තකාල වෙබ් අඩවියට *(library.kln.ac.lk)* පිවිසීමෙන් පුස්තකාල සේවා පිළිබඳ තොරතුරු ලබා ගැනීමට මෙන් ම, පුස්තකාල වෙබ් සූචිය (Web-OPAC) පරීක්ෂාව මගින් ග්‍රන්ථ සම්භාරය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ද හැකියාව ඇති බව සැලකිය යුතු ය.

| | | |
|---|---|---|
| **දුරකථන අංක:** | - | පුස්තකාලයාධිකාරී: 011-2911918, 011-2903170 |
| | - | සහකාර පුස්තකාලයාධිකාරී (පාඨක සේවා): 011-2917709, 011-2903177 |
| | - | පුස්තකාලයාධිකාරී: 170 |
| | - | සහකාර පුස්තකාලයාධිකාරී (පාඨක සේවා): 177 |
| **ෆැක්ස් අංකය:** | - | පුස්තකාලයාධිකාරී: 011-2911918 |
| **විද්‍යුත් ලිපිනය:** | - | පුස්තකාලයාධිකාරී: librarian@kln.ac.lk |
| | - | සහකාර පුස්තකාලයාධිකාරී (පාඨක සේවා): dhammikapr@kln.ac.lk |

# 05. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය

**අධ්‍යක්ෂ**
ආචාර්ය ඒ.පී.ආර්. වික්‍රමාරච්චි මයා
*B.Sc. (Kel' ya), M.Phil (Cambridge), Ph.D. (Sheffield Hallam)*

**අධ්‍යයන සහාය**
ඒ. සමරවීර මිය - පරිගණක වැඩසටහන් සම්පාදක සහ පද්ධති විශ්ලේෂක - II ශ්‍රේණිය
*B.Sc. (Perad' ya), Dip. in Computer Sc. (C'bo)*
ටී.පී. නන්දලාල් මයා - පරිගණක උපදේශක - I ශ්‍රේණිය
*B.Sc. (Kel' ya)*
ආචාර්ය ඩී.ඩී.එම්. දොළවත්ත මයා - පරිගණක වැඩසටහන් සම්පාදක සහ පද්ධති විශ්ලේෂක - I ශ්‍රේණිය
*B.Sc. (Kel' ya), M.Sc. (C'bo), Ph.D. (S. J'pura)*
ඩබ්ලිව්.ආර්.එස්. ප්‍රනාන්දු මයා - සහකාර ජාල කළමනාකරු - I ශ්‍රේණිය
*B.Sc. (Kel' ya), M.Sc. in MIT (Kel'ya)*
ඒ.ඒ.අයි.එස්. විජයවික්‍රම මයා - පද්ධති ඉංජිනේරු
*B.Sc. (Kel' ya) Dip. in Computer Sc. (C'bo)*
ජී.පී.බී.එස්. ගොඩකුරු මයා - පරිගණක වැඩසටහන් සම්පාදක සහ පද්ධති විශ්ලේෂක - I ශ්‍රේණිය
*B.Sc. in MIT (Kel'ya), M.Sc. in IT (C'bo)*
යු.එස්. තිවංක මයා - සහකාර ජාල කළමනාකරු - II ශ්‍රේණිය
*B.A in CS. (Kel' ya) B.Eng,(UK), PGD in CS (SLIIT), MS.c in CS (SLIIT)*
ඩී.ආර්.බී. ජිනසේන මයා - පරිගණක වැඩසටහන් සම්පාදක සහ පද්ධති විශ්ලේෂක - III ශ්‍රේණිය
*B.Sc (NSBM), M.Sc.in MIT (Moratuwa)*

පරිගණක මධ්‍යස්ථානය ලෙස පෙර හඳුන්වන ලද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය කැලණිය විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ පරිගණක කුසලතා ඔප්නැංවීම සඳහා 1980 දශකයේ මැද භාගයේදී ආරම්භ කරන ලදී. තොරතුරු තාක්ෂණයේ දියුණුවත්, තාක්ෂණය විසින් ඉටුකරන කාර්යභාරයේ වෙනස්වීමත් සමඟ, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ මූලික තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවා සැපයුම්කරු බවට පත්ව ඇත.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විසින් සපයනු ලබන සේවාවන් අතර ප්‍රකාශ තන්තු ජාලය ඇතුළු විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ ජාලය නඩත්තු කිරීම, Wi-Fi සේවා සැපයීම, කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට විද්‍යුත් තැපැල් සේවා සැපයීම, විද්‍යුත් ඉගෙනුම් සේවා සැපයීම, කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා IT helpdesk system හඳුන්වා දීම, ZOOM වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා නොමිලේ office 365 package ලබා දීම, කාර්ය මණ්ඩලය සහ සිසුන්ගේ ඉගැන්වීම් කටයුතු සඳහා Microsoft Azure Dev Tools ලබා දීම, විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවි නිර්මාණය හා නඩත්තු කිරීම, සිසුන් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම, දෘඩාංග හා මෘදුකාංග ස්ථාපනය කිරීම, පීඨ/ දෙපාර්තමේන්තු/අංශවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ නඩත්තු කිරීම සඳහා සහාය වීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ උපකරණ මිලදී ගැනීම සඳහා උපදෙස් දීම, නිර්දේශ කිරීම සහ තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම යනාදිය හඳුනාගත හැක.

පරිගණක සාක්ෂරතාවය, තොරතුරු තාක්ෂණය, ජාවා ක්‍රමලේඛනය, වෙබ් අඩවි නිර්මාණය කිරීම, පරිගණක දෘඩාංග තාක්ෂණය, උසස් ජාලකරණය, ග්‍රැෆික් නිර්මාණකරණය සහ සංස්කරණය යන

සහතික පත්‍ර පාඨමාලා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබයි. පරිගණක සාක්ෂරතා පාඨමාලාවේ පරමාර්ථය වනුයේ විද්‍යාර්ථීන්ට පරිගණක භාවිතය, Microsoft Office, Open Office වැනි කාර්යාල ඵලදායිතා මෘදුකාංග කට්ටල භාවිත කිරීම සහ අන්තර්ජාලය පදනම් කරගත් සේවාවන් භාවිත කිරීම පිළිබඳ මූලික කුසලතා ලබා දීමයි. තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව තොරතුරු තාක්ෂණයේ ප්‍රධාන සංකල්ප පිළිබඳ හැඳින්වීමක් සපයයි. මෙම පාඨමාලා දෙක ම සියලු ම උපාධි අපේක්ෂකයින් සඳහා විවෘතය. මෙම පාඨමාලා සඳහා සකස් කළ පෙළපොතක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විසින් ප්‍රකාශයට පත් කර ඇත. ජාවා ක්‍රමලේඛන, වෙබ් සැලසුම්කරණය, පරිගණක දෘඩාංග තාක්ෂණය, උසස් ජාලකරණය, ග්‍රැෆික් නිර්මාණකරණය සහ සංස්කරණය පිළිබඳ පාඨමාලා සීමිත බඳවා ගැනීමේ පාඨමාලා වන අතර විද්‍යාර්ථීන් තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාවේදී දක්වන කාර්ය සාධනය මත පදනම් ව සහ තෝරාගැනීමේ පරීක්ෂණ මඟින් මෙම උසස් තොරතුරු තාක්ෂණ පාඨමාලා සඳහා සිසුන් තෝරාගනු ලැබේ.

ඊට අමතර ව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන, අධ්‍යයන සහාය, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා වැඩමුළු සහ පුහුණු සැසි ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබේ.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා පරිගණක ඉගැන්වීම් විද්‍යාගාර 5 ක පරිගණක 245 කින්, මුද්‍රණ යන්ත්‍ර, ස්කැනර්, වීඩියෝ සම්මන්ත්‍රණ උපකරණ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ අනෙකුත් උපකරණවලින් සමන්විත වේ.

සතියේ දිනවල උදේ 8.00 සිට පස්වරු 6.30 දක්වා සහ සති අන්ත දිනවල උදේ 8.00 සිට පස්වරු 5.30 දක්වා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විවෘතව පවතී. අධ්‍යයන නිවාඩු සහ විභාග කාලය තුළදී මධ්‍යස්ථානය විවෘත ව තබන වේලාවන් දීර්ඝ කෙරේ.

නේවාසිකාගාර ඇතුළු සමස්ත විශ්වවිද්‍යාලය ආවරණය වන පරිදි විශ්වවිද්‍යාලය පුරා රැහැන් රහිත ජාලයක් පිහිටුවා ඇත. එසේ ම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් අන්තර්ජාලය පදනම් කරගත් සේවාවන් වන විද්‍යුත් තැපෑල, විද්‍යුත් ඉගෙනුම් පද්ධති, Wi-Fi සහ අන්තර්ජාලයට ප්‍රවේශ වීම සඳහා තනි පූරණ පද්ධතික් (single-sign-on system) හඳුන්වා දී ඇත.

දුරකථන අංකය - 011 2910163
අභ්‍යන්තර අංක - 420, 421
ෆැක්ස් අංකය - 011 2910163
විද්‍යුත් ලිපිනය - ictc@kln.ac.lk

# 06. කැලණිය විශ්වවිද්‍යාලයීය - වෙබ් අඩවිය

**වෙබ් මාස්ටර්**
ජී. එච්.බී. අර්ජුන් ද සිල්වා මයා
*Reading for Ph.D. (Moratuwa), MBA (PIM - USJ), B.Sc. (Bu.Ad.-IS) (USJ), MAAT, CBA*

**නියෝජ්‍ය වෙබ් මාස්ටර්**
බුද්ධික ගොඩකුරු මයා
*B.Sc. in MIT (Kel'ya), M.Sc. in IT (C'bo)*
සදුන් ප්‍රනාන්දු මයා
*B.Sc. (Kel' ya), M.Sc. in MIT (Kel'ya)*
මලිනි රණවීර මෙය
*B.Sc. (Kel' ya), M.Sc. IT (SLIIT), PDG in IT (BCS/UK),MBCS*
ටී.ඩී. කරුණානායක මයා
*MBA (PIM-USJ),B.B.Mgt (Marketing) Special (Kel'ya), D.Bit.P.Dip (Digital Marketing)*
කෞමදී බමුණුසිංහ මෙය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
ජයනාත් සමරවික්‍රම මයා
*B.Sc. (Hons) Bus. Admin (Information System), (S.J'pura) M.Sc. (Computer Science), (S.J'pura), MCS(SL), Reading for Ph.D. (USJP)*

අධ්‍යාපන ක්‍රියාවලිය තුළ අන්තර්ජාල තාක්ෂණය වැදගත් අංගයක් බවට පත් ව ඇති බැවින්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජාතික විශ්වවිද්‍යාල අතරින් එකක් වන කැලණිය විශ්වවිද්‍යාලය විශ්වාසනීය, ඵලදායී හා ආකර්ෂණීය වෙබ් අඩවියක් පවත්වාගෙන යෑමේ වැදගත්කම හඳුනාගෙන ඇත. කැලණිය විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය, විශ්වවිද්‍යාල ප්‍රජාව, අනාගත සේවායෝජකයින්, ශිෂ්‍යයන්, රාජ්‍ය හා සංස්ථාපිත අංශ සහ වඩාත් පුළුල් අන්දමින් ජාතික හා අන්තර්ජාතික වශයෙන් විශ්වවිද්‍යාල හා සම්බන්ධ වන්නන් සඳහා වැදගත් සන්නිවේදන මාධ්‍යක් වශයෙන් සුවිසල් සේවාවක් ඉටු කරයි.

අධ්‍යයන පීඨ සහ අධ්‍යයන අංශවල වෙබ් අඩවි ඇතුළත් වන විශ්වවිද්‍යාල වෙබ් අඩවිය යාවත්කාලීන, අදාළ සහ නිවැරදි තොරතුරු සැපයේ.
කැලණිය විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ අන්තර්ගතය පහත පරිදි වේ.

- විශ්වවිද්‍යාලය හා එහි අධ්‍යයන පීඨ, අධ්‍යයන අංශ, මධ්‍යස්ථාන, කමිටු, මණ්ඩල, අංශ සහ ඒකක පිළිබඳ තොරතුරු
- අධ්‍යයන පීඨ, අධ්‍යයන අංශ සහ මධ්‍යස්ථාන මගින් පිරිනමනු ලබන සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලාවල විෂය ධාරාවන්
- අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලවල සාමාජිකයන්ගේ නම් සහ ඔවුන් හා සන්නිවේදනය කළ හැකි ආකාර පිළිබඳ තොරතුරු
- සමුළු හා සම්මන්ත්‍රණ ඇතුළු ව විශ්වවිද්‍යාලයට සම්බන්ධ වැදගත් පුවත් හා දැන්වීම්
- ශිෂ්‍යයකු හෝ කාර්ය මණ්ඩල සාමාජිකයකු, අධ්‍යයන අංශයක්, අධ්‍යයන පීඨයක් හෝ විශ්වවිද්‍යාලයේ වෙනත් අංශයක් විසින් අත්කරගන්නා ජාතික හෝ අන්තර්ජාතික වශයෙන් පිළිගැනීමට ලක්වන ජයග්‍රහණ පිළිබඳ තොරතුරු

- ශිෂ්‍ය සංගම්, සමිති, සමාජ හා ආදි විද්‍යාර්ථීන්ගේ සංගම් පිළිබඳ පුවත් හා ඒවායේ ක්‍රියාකාරකම්
- අර්ධ වාර්ෂික පරීක්ෂණවල ප්‍රතිඵල, අන්තර්ජාලගත සම්පත් සහ ශිෂ්‍ය සුබසාධන පහසුකම් ඇතුළු ව දේශීය හා විදේශීය ශිෂ්‍යයන්ට අදාළ වන තොරතුරු
- කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රකාශන අන්තර්ගත විද්‍යුත් - තොරතුරු ගබඩාව
- විශ්වවිද්‍යාලය මඟින් ලබාදෙන උපදේශන සේවා පිළිබඳ තොරතුරු
- ප්‍රජාවට නොමිලේ ලබාදෙන අධ්‍යාපනික සේවාවන්

| | | |
|---|---|---|
| විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය | : | www.kln.ac.lk |
| **Facebook** | : | https://www.facebook.com/university.kelaniya/ |
| **Linkedin** | : | https://www.linkedin.com/school/15099978/ |
| **Twitter** | : | https://twitter.com/KelaniyaUni |
| විද්‍යුත් ලිපිනය | : | webmaster@kln.ac.lk |
| දුරකථන අංක | : | 011 2910163/ 011 2903420 |
| ෆැක්ස් අංකය | : | 011 2910163 |

# මානවශාස්ත්‍ර පීඨය



# මානවශාස්ත්‍ර පීඨය

## පීඨාධිපති, අධ්‍යයනාංශ ප්‍රධානින් සහ පරිපාලන නිලධාරි



ආචාර්ය යූ. සුදත් සෙනරත් මයා
පීඨාධිපති, මානවශාස්ත්‍ර පීඨය



උපුල් ජයන්ත රනේපුර මයා
අංශ ප්‍රධාන
නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයනාංශය



ආචාර්ය ශෂිකලා අස්සැල්ල මෙය
අංශ ප්‍රධාන
ඉංග්‍රීසි අධ්‍යයනාංශය



ජීවනී ප්‍රහලාදන් මිය
අංශ ප්‍රධාන
ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය



ටී.එල්.ඩී. ද සිල්වා මෙය
අංශ ප්‍රධාන
ලලිත කලා අධ්‍යයනාංශය



ආචාර්ය ඩබ්ලිව්.එන්. එස්. සෙනෙවිරත්න මිය
අංශ ප්‍රධාන
හින්දී අධ්‍යයනාංශය



ආචාර්ය කවිතා රාජරත්නම් මිය
අංශ ප්‍රධාන
වාග්විද්‍යා අධ්‍යයනාංශය



පූජ්‍ය මහාචාර්ය නැදලගමුවේ ධම්මදින්න හිමි
අංශ ප්‍රධාන
නූතන භාෂා අධ්‍යයනාංශය



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි
අංශ ප්‍රධාන
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය



මහාචාර්ය කේ.බී. ජයවර්ධන මහතා
අංශ ප්‍රධාන
සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය



මහාචාර්ය එච්.ඒ.ඒ.ස්වර්ණා ඉහළගම මිය
අංශ ප්‍රධාන
සිංහල අධ්‍යයනාංශය



ආචාර්ය ඩබ්ලිව්. පී. රොෂාන් ප්‍රනාන්දු පියතුමා
අංශ ප්‍රධාන
බටහිර සම්භාව්‍ය සංස්කෘති හා
ක්‍රිස්තියානි සංස්කෘති අධ්‍යයනාංශය



ආචාර්ය ආර්.එම්.එස්. ප්‍රියදර්ශනී මෙය
ඒකක ප්‍රධාන
අධ්‍යාපන ඒකකය



ආචාර්ය අමිල කළුආරච්චි මයා
ඒකක ප්‍රධාන
ආයතනික පුහුණු හා ශක්‍යතා සංවර්ධන
අධ්‍යයන ඒකකය



ඩී. පී. තරංගනී මිය
වැඩබලන සහකාර ලේඛකාධිකාරී
මානවශාස්ත්‍ර පීඨය

# 07. මානවශාස්ත්‍ර පීඨය

**පීඨාධිපති**
ආචාර්ය යූ. සුදත් සෙනරත් මයා
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya)*

**සහකාර ලේඛකාධිකාරි (වැඩබලන)**
**ඩී. පී. තරංගනී මිය**
*B.A. (Kel'ya), M.A. (Kel'ya), MPM (SLIDA), Dip Eng.(SLIDA), Dip. Counselling (SJP)*

මානවශාස්ත්‍ර පීඨය, අධ්‍යයනාංශ දහයකින් සමන්විත වන අතර, ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාල හා සැසඳීමේ දී මානවශාස්ත්‍ර පීඨය භාෂා, සංස්කෘති, බෞද්ධ අධ්‍යයන, ආගම් සහ ලලිත කලා යන අධ්‍යයන ක්ෂේත්‍රයන් පිළිබඳ ප්‍රමුඛත්වය දරයි.

මානවශාස්ත්‍ර පීඨය සහ සමාජීය විද්‍යා පීඨය මඟින් ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රවේදී ගෞරව යන මූලික උපාධි පිරිනමනු ලබයි. ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා සඳහා මානවශාස්ත්‍ර පීඨයේ එක් එක් අධ්‍යයනාංශ හා ඒකක මඟින් ඉදිරිපත් කරනු ලබන විෂයයන් පහත දැක්වේ.

| අධ්‍යයනාංශ/ඒකක | | විෂයයන් |
|---|---|---|
| සිංහල අධ්‍යයනාංශය | :- | සිංහල, සාහිත්‍ය විචාරය |
| ඉංග්‍රීසි අධ්‍යයනාංශය | :- | ඉංග්‍රීසි අධ්‍යයන |
| පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය | :- | පාලි, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ දර්ශනය, බෞද්ධ මනෝවිද්‍යාව |
| සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය | :- | සංස්කෘත, වාස්තුශාස්ත්‍ර |
| හින්දී අධ්‍යයනාංශය | :- | හින්දී |
| නූතන භාෂා අධ්‍යයනාංශය | :- | ප්‍රංශ, ජපන්, ජර්මන්, චීන, රුසියන්, කොරියන්, ස්පාඤ්ඤ |
| වාග්විද්‍යා අධ්‍යයනාංශය | :- | වාග්විද්‍යාව, භාෂා පරිවර්තන ක්‍රම, දෙවන භාෂාවක් ලෙස දෙමළ ඉගැන්වීම, දෙමළ, භාෂා පරිවර්තන අධ්‍යයන |
| බටහිර සම්භාව්‍ය සංස්කෘති හා ක්‍රිස්තියානි සංස්කෘති අධ්‍යයනාංශය | :- | බටහිර සම්භාව්‍ය සංස්කෘතිය, ක්‍රිස්තියානි සංස්කෘතිය |
| ලලිත කලා අධ්‍යයනාංශය | | |
| දෘශ්‍ය කලා, සැලසුම්කරණ හා ප්‍රාසංගික කලා අධ්‍යයන ඒකකය | :- | දෘශ්‍ය කලා හා සැලසුම්කරණය, ප්‍රාසාංගික කලා, සාහිත්‍ය, ප්‍රාසාංගික කලා (නර්තනය) |
| නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය | :- | නාට්‍ය හා රංග කලාව, ප්‍රතිබිම්බ කලා, සිනමා හා රූපවාහිනී අධ්‍යයන |
| ඉංග්‍රීසි ඉගැන්වීමේ අධ්‍යයනාංශය | :- | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම |
| අධ්‍යාපන ඒකකය | :- | අධ්‍යාපනවේදය |

මානවශාස්ත්‍ර පීඨයේ ඒ ඒ විෂයයන් පිළිබඳ සවිස්තර තොරතුරු අදාළ අංශ ප්‍රධානින් හමු වී ලබා ගත හැකි ය. අධ්‍යයන හා වෘත්තීය අවශ්‍යතා උදෙසා මෙන් ම, දෙවන භාෂාවක් වශයෙන් හැදෑරීම

සඳහා ද වන ඉංග්‍රීසි විෂය පිළිබඳ පාඨමාලා ඒකක ඉංග්‍රීසි ඉගැන්වීමේ අධ්‍යයනාංශය මඟින් ඉදිරිපත් කෙරේ.
ශාස්ත්‍රවේදී උපාධිය අධ්‍යයන වර්ෂ 03ක පාඨමාලා හැදෑරීමෙන් ද ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය අධ්‍යයන වර්ෂ 04ක පාඨමාලා හැදෑරීමෙන් ද අදාළ පරීක්ෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු ලබා ගත හැකි ය. ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවන්ට අදාළ මූලික කරුණු සඳහා පිටු අංක 110-112 බලන්න.

සෑම විද්‍යාර්ථියකු ම ප්‍රථම වර්ෂයෙහි දී ලියාපදිංචි කරනු ලබන්නේ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා වන අතර, විද්‍යාර්ථියාගේ ප්‍රථම වර්ෂාවසාන විභාගයේ ප්‍රතිඵල අනුව අදාළ අවශ්‍යතා සම්පූර්ණ කොට ඇත්නම් ශාස්ත්‍රවේදී ගෞරව උපාධියට ලියාපදිංචි වීම සඳහා අයදුම් කළ හැකි ය.

දුරකථන අංකය - 011 2914484
ෆැක්ස් අංකය - 011 2908787
විද්‍යුත් ලිපිනය - officehu@kln.ac.lk

## 7.1 නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයන අංශය

**ආචාර්ය මණ්ඩලය**

උපුල් ජයන්ත රනේපුර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.A. M.phil, Dip. In Photo (NPAS-SL)*
මහාචාර්ය ආර්.එම්. පැට්‍රික් රත්නායක මයා - විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.A. (Kel'ya), Dip. in Japanese (Osaka), M.A. (Nihon), Ph.D. (Nihon, Japan)*
ආචාර්ය යූ.ජී. ගුණසේකර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Sc. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya), Dip. in Journ. (C'bo), ANPAS, FNPAS, Hon. FNPAS (NPAS-SL), Dip in Photo (NPAS-SL), AFIAP (Belg.)*
ප්‍රියංකර රත්නායක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.A.(SJP)*
ජී.ආර්. නොයෙල් විජයරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II(අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.A. Sinhala (Kel'ya), M.A. Drama (Kel'ya), MSSc (Kel'ya), PG Dip. (Kel'ya), PG. Dip. (USJP)*
ඒ. ප්‍රභාත් චතුරංග සිල්වා මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Dip in Photo (NPAS-SL)*
අනුරාධ සුබසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.Phil. (Perad'ya)*
දිවංක රන්දුල පෝද්දුවගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
සම්පත් පෙරේරා මයා - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), PGDE (UOC)*
සංජීව ගුණරත්න මයා - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya)*
රවීන් පූර්ණික මයා - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya)*
ඩී.ආර්.වී. පද්මසේන - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya)*

නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයන අංශය මූලික විෂයන් තුනක් පදනම් කොට පහත සඳහන් පාඨමාලා පවත්වාගෙන යනු ලබයි.

- නාට්‍ය හා රංග කලාව
- සිනමා හා රූපවාහිනී අධ්‍යයනය
- ප්‍රතිබිම්බ කලාව

පාඨමාලා

1. නාට්‍ය හා රංග කලා ශාස්ත්‍රවේදී උපාධිය
2. ප්‍රතිබිම්බ කලා ශාස්ත්‍රවේදී උපාධිය
3. නාට්‍ය හා රංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
4. ප්‍රතිබිම්බ කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
5. සිනමා හා රූපවාහිනී අධ්‍යයන ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය
6. නාට්‍ය හා රංග කලා ශාස්ත්‍රවේදී උපාධිය
7. ඡායාරූපකරණ ඩිප්ලෝමා පාඨමාලාව
8. සිනමා හා රූපවාහිනී අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව
9. නාට්‍ය හා රංග කලා ඩිප්ලෝමා පාඨමාලාව
10. පිටපත් රචනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

මෙම අධ්‍යයන අංශය මගින් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර තුනක් යටතේ අධ්‍යයන පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. පළමුවැන්න **නාට්‍ය හා රංග කලා අධ්‍යයන** පාඨමාලාව වන අතර, එහි අන්තර්ගතය සෛද්ධාන්තික හා ප්‍රායෝගික යන දෙඅංශයෙන් ම යුක්ත වේ.
දේශීය හා විදේශීය නාට්‍ය ඉතිහාසය, විශ්ව නාට්‍ය ශෛලීන්, සම්ප්‍රදායන් හා ප්‍රවණතා පිළිබඳ පුළුල් ශාස්ත්‍රීය අධ්‍යයනයකින් සමන්විත වන මෙම පාඨමාලාව රංගනය, නාට්‍ය නිෂ්පාදනය හා අධ්‍යක්ෂණය පිළිබඳ ප්‍රායෝගික අභ්‍යාස හා වැඩමුළුවලින් ද යුක්ත ය. මෙම පාඨමාලාව ශාස්ත්‍රවේදී උපාධි සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා ලෙස පවත්වනු ලැබේ.

දෙවැන්න **ප්‍රතිබිම්බ කලා** පිළිබඳ අධ්‍යයන පාඨමාලාවයි. මෙහි පාඨමාලා අන්තර්ගතය කැමරාව මූලික වන ඡායාරූප, චිත්‍රපට, වීඩියෝ, රූපවාහිනී යන මාධ්‍ය හා පරිගණක පදනම් කරගත් ඩිජිටල් ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණය කරණය යන අංශවලින් සමන්විත ය. සෛද්ධාන්තික හා ප්‍රායෝගික විෂය ඒකකවලින් යුක්ත මෙම පාඨමාලාව යටතේ ඡායාරූප, සිනමාව, වීඩියෝ හා රූපවාහිනී කලාවන් පිළිබඳවත්, එහි ව්‍යවහාරය හා නිර්මාණාත්මක භාවිතය පිළිබඳවත් අධ්‍යයනය කෙරේ. මෙම අධ්‍යයන පාඨමාලාව ශාස්ත්‍රවේදී උපාධි සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා ලෙස පැවැත්වේ.

අභිනවයෙන් විශ්වවිද්‍යාලයට ඇතුළු වන මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨවලට අයත් විද්‍යාර්ථීන්ට ඉහත කී පාඨමාලා දෙක හැදෑරීමට අවස්ථාව ලැබෙන අතර, විෂයානුබද්ධ පූර්ව සුදුසුකම් කිසිවක් අපේක්ෂා නොකෙරේ. එහෙත් නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන පාඨමාලා දෙක සඳහා විද්‍යාර්ථීන් තෝරාගැනීමේ දී සංගීතය, නර්තනය, නිර්මාණාත්මක රචනය, නාට්‍යකරණය, චිත්‍ර කලාව, ඡායාරූපකරණය, වීඩියෝකරණය පිළිබඳ කුසලතා හා විශේෂ දක්ෂතා පෙන්නුම් කරන අය කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු  ලැබේ.

තෙවැන්න සිනමා හා රූපවාහිනී අධ්‍යයන පාඨමාලාවයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ඍජු ප්‍රවේශය යටතේ විද්‍යාර්ථීන් බඳවාගැනීම මෙහි දී සිදු කෙරේ. ඒ සඳහා අධ්‍යයන ඒකකය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයකින් විද්‍යාර්ථීන් තෝරාගනු ලැබේ. එම පරීක්ෂණය ලිඛිත හා වාචික යන අංශ දෙක යටතේ පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන විද්‍යාර්ථීන් සඳහා පමණක් වාචික පරීක්ෂණය පැවැත්වේ. වාචික පරීක්ෂණය විශ්වවිද්‍යාලයට කැඳවීම මගින් හෝ මාර්ගගතව හෝ පැවැත්විය හැකිය. එම පරීක්ෂණයන් සමත් වන විද්‍යාර්ථීන්ගේ Z අගය ද සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් විද්‍යාර්ථීන් තෝරා ගනු ලැබේ. උසස් පෙළ විද්‍යා, කලා, වාණිජ යන විෂය ධාරා යටතේ සමත්වන ඕනෑ ම අයෙකුට මෙම පාඨමාලාවට අයදුම් කළ හැකි ය. යෝග්‍යතා පරීක්ෂණය පුවත්පත් දැන්වීම් මගින් හෝ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය මගින් හෝ දැනුවත් කෙරේ. සිනමා හා රූපවාහිනී අධ්‍යයනය වසර හතරක ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාවක් වශයෙන් හැදෑරීමට අවස්ථාව හිමිවන බව සැලකිය යුතු ය. සාමාන්‍ය ප්‍රවේශ යටතේ විශ්වවිද්‍යාලයට පැමිණෙන විද්‍යාර්ථීන්ට මෙම උපාධි පාඨමාලාව හැදෑරීමට අවස්ථාව හිමි නොවේ.

නාට්‍ය හා රංග කලාව, ප්‍රතිබිම්බ කලා යන පාඨමාලා දෙකෙහි හර විෂය ඒකක නොහදාරන විද්‍යාර්ථීන්ට පමණක් අධ්‍යයනාංශයේ අනුමැතිය යටතේ නාට්‍ය කලාව, ඡායාරූප ශිල්පය, සිනමාව පිළිබඳ ආධාරක විෂය ඒකක තෝරාගැනීමට අවස්ථාව හිමි වේ.

**පශ්චාත් උපාධි පාඨමාලා**
නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව අධ්‍යයන ඒකකය මගින් පවත්වාගෙන යනු ලැබේ. මීට අමතර ව නාට්‍ය කලාව, ඡායාරූප ශිල්පය, සිනමාව, රූපවාහිනී මාධ්‍ය යන විෂය ක්ෂේත්‍ර යටතේ ශාස්ත්‍රපති, දර්ශනපති සහ දර්ශන ශූරී පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට සහ පර්යේෂණ සිදුකරගෙන යෑමට අවශ්‍ය මගපෙන්වීම් සිදු කෙරේ.

**ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා පාඨමාලාව**

ඡායාරූප ශිල්පය හා කලාව පිළිබඳ උනන්දු වන බාහිර විද්‍යාර්ථීන් අරමුණුකොට ගෙන ආධුනික, ප්‍රවීණ මෙන් ම වෘත්තීය මට්ටමේ ඡායාරූප ශිල්පීන් සඳහා සෛද්ධාන්තික හා ප්‍රායෝගික යන දෙඅංශය පිළිබඳ අවධානය යොමු කොට එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් මෙම අධ්‍යයන අංශය මගින් පවත්වාගෙන යනු ලැබේ. ඡායාරූප ශිල්පය හා කලාව පිළිබඳ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මෙන්ම ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් මෙම පාඨමාලව සඳහා සම්පත් දායකත්වයක් සපයති.

**සිනමා හා රූපවාහිනී ඩිප්ලෝමා පාඨමාලාව**

සිනමා හා රූපවාහිනී විෂය පිළිබඳ උනන්දුවක් දක්වන බාහිර විද්‍යාර්ථීන් සඳහා පවත්වනු ලබන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස මෙය හැඳින්විය හැකිය. සෛද්ධාන්තික හා ප්‍රායෝගික යන දෙඅංශය පිළිබඳ අවධානය යොමු කොට ගත් මෙම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ආචර්යවරුන් මෙන් ම සිනමා හා රූපවාහිනී ක්ෂේත්‍රයේ පර්යේෂකයින්, නිර්මාණකරුවන් හා ක්ෂේත්‍රයේ නියැලෙන වෘත්තිකයන් මෙම පාඨමාලාවේ සම්පත් දායකයින් ලෙස කටයුතු කෙරේ.

**නාට්‍ය හා රංග කලා ඩිප්ලෝමා පාඨමාලාව**

නාට්‍ය හා රංග කලා විෂය පිළිබඳ උනන්දුවක් දක්වන බාහිර විද්‍යාර්ථීන් සඳහා පවත්වනු ලබන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස මෙය හැඳින්විය හැකිය. සෛද්ධාන්තික හා ප්‍රායෝගික යන දෙඅංශය පිළිබඳ අවධානය යොමු කොට ගත් මෙම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මෙන් ම  නාට්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂකයින්, නිර්මාණකරුවන් හා ක්ෂේත්‍රයේ නියැලෙන වෘත්තිකයන් මෙම පාඨමාලාවේ සම්පත් දායකයින් ලෙස කටයුතු කෙරේ.

**පිටපත් රචනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

නාට්‍ය හා රංග කලාව,  සිනමා  හා රූපවාහිනි අධ්‍යයන, ප්‍රතිබිම්භ කලා පිළිබඳ උනන්දුවක් දක්වන බාහිර විද්‍යාර්ථීන් අරමුණු කොට පවත්වනු ලබන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස මෙය හැඳින්විය හැකිය.සෛද්ධාන්තික ව මෙන් ම ප්‍රායෝගික යන දෙඅංශය පිළිබඳ අවධානය යොමු කෙරෙන මෙම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මෙන් ම නාට්‍ය, සිනමා හා රූපවාහිනි මෙන් ම ප්‍රතිබිම්බ කලාව පිළිබඳ පර්යේෂකයින්, නිර්මාණකරුවන් හා ක්ෂේත්‍රයේ නියලෙන නිරීක්ෂකයින් මෙම පාඨමාලාවේ සම්පත් දායකයින් ලෙස කටයුතු කෙරේ. මෙම පාඨමාලාව හැදෑරීමට අභ්‍යන්තර විද්‍යාර්ථීන්ට හැකියාව පවතින අතර ඒ සඳහා නියමිත පාඨමාලා ගාස්තු ගෙවීමට සිදු වේ.

## 7.2 ඉංග්‍රීසි අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය එස්. එම්. අස්සැල්ල මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*B.A. (SUSL), M.A. (JNU, India), Ph.D. (Nottingham, UK)*
මහාචාර්ය එම්.කේ. වික්‍රමසිංහ මිය - විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Lond., UK), M.A. (C'bo), Ph.D. (Lond, UK)*
මහාචාර්ය ඊශා මනෝහාරී හේවාබෝවල මිය - මහාචාර්ය
*B.A. (Kel'ya), M.Phil. (Manch.), Dip. & Superior Dip. in French Lan. & Lit. (Alliance Francaisc de Paris), A.T.C.L. & L.T.C.L. in Dramatic Art (A.T.W.M.S. Colombo)*
මහාචාර්ය පී.එම්. මනුරත්න මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සේවයෙන් නිදහස් කර ඇත)
*B.A. (Kel'ya), M.A. (Kansas, USA), Ph.D. (Buffalo, USA)*
ඩී.අයි. ප්‍රනාන්දු මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.A. (Reading, UK)*
ජේ.එස්. නයිල්ස් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (C'bo)*

ඉංග්‍රීසි අධ්‍යයනාංශය ඉගැන්වීමේ කටයුතු, පර්යේෂණ සහ සමාජීය සාධක යන කාරණා තුනෙහි සුසංවාදී සම්බන්ධතාව වෙනුවෙන් නිරන්තරයෙන් ම කැප වී සිටියි.

වර්තමානයේ අප අධ්‍යයනාංශය මඟින් ශාස්ත්‍රවේදී උපාධි සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලබන අතර, දර්ශනපති හා දර්ශන විශාරද යන පශ්චාත් උපාධි සඳහා ද ලියාපදිංචි විය හැකි ය.

අප අධ්‍යයනාංශය ඉංග්‍රීසි විෂය ඉගැන්වීමේ දී අන්තර් ශික්ෂණ සහ බහු ශික්ෂණ ප්‍රවේශයක් අනුගමනය කරයි. මෙම ප්‍රවේශය ලොව පුරා ඉංග්‍රීසි විෂය ඉගැන්වීමේ ප්‍රවණතා පිළිබිඹු කරන්නකි. ඉංග්‍රීසි සාහිත්‍යය, දකුණු ආසියානු සාහිත්‍යය, ස්ත්‍රීවාදී හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන, සමාජ විද්‍යා විචාර න්‍යායයන්, භාෂා අධ්‍යයන, පශ්චාත් යටත්විජිත සාහිත්‍යය, ශ්‍රී ලාංකේය ඉංග්‍රීසි සාහිත්‍යය, සංක්‍රමණික සාහිත්‍යය සහ සංස්කෘතික න්‍යායයන් ආදි අප ආචාර්ය මණ්ඩලයෙහි විශාරදයින් උනන්දුව දක්වන ක්ෂේත්‍රයන් මෙහි විෂය මාලාව තුළ පිළිබිඹු වේ.

ඉංග්‍රීසි අධ්‍යයනාංශය විසින් විද්‍යාර්ථීන්ගේ අනාගත හා වෘත්තීයමය අවශ්‍යතාවන්ට අනුකූල ව, ඔවුන්ගේ සභ්‍ය සම්පන්න නිපුණතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපාංග ද විෂය මාලාවට ඇතුළත් කර තිබේ. අප අධ්‍යයනාංශයේ උපාධිලාභීහු පුවත්පත් කලාවේදය, වෙළඳ ප්‍රචාරණය, ගුරු වෘත්තිය, විශ්වවිද්‍යාල කථිකාචාර්ය සේවය, කළමනාකරණය සහ විදේශීය තානාපති සේවය ආදි ක්ෂේත්‍රයන්හි විශිෂ්ට කුසලතා දැක්වීමට සමත් වී සිටිති.

## 7.3 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ජී. ප්‍රහලාදන් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.A. (Jaffna), M.A. (Kel'ya)*
මහාචාර්ය සී.ඩී.එස්. වැත්තැව මිය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Nijmegen, Netherlands)*
ආචාර්ය ආර්.ආර්. ජයසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Perad'ya), Dip. in TESL (Kel'ya), M.A. (Kel'ya), Ph.D. (Hyderabad, India)*
ආචාර්ය රොමෝලා රසූල් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සේවයෙන් නිදහස් කර ඇත)
*B.A. (Kel'ya), M.A. (Columbia, USA), Ph.D. (Melbourne, Australia)*
ආර්.කේ.එම්.සී. රණවීර මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (North Arizona University, USA)*
එච්.පී.එච්.පී.කේ. පතිරණ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.A. (C'bo), M.A. (C'bo), M.A. (Kel'ya)*
ටී.ඒ. පුෂ්පරාජා මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Jaffna), M.A. (C'bo), M.A. (Kel'ya)*
ටී.අයි. වික්‍රමආරච්චි මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Perad'ya), M.A. (OUSL)*
ආර්.කේ. චිත්‍රසේන මයා - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), LL.B. (Hons) London, M.Ed. (Exon), CELTA (Cantab.)*

කැලණිය විශ්වවිද්‍යාලය තුළ ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීමේ කාර්යභාරය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යනාංශය (DELT) මඟින් සිදු කරනු ලබයි.

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශයේ ප්‍රධාන අරමුණ වනුයේ සියලු විද්‍යාර්ථීන්ට ඉංග්‍රීසි භාෂාව සමීප කිරීමයි. මෙම අධ්‍යයනාංශයහි ප්‍රධාන කාර්යභාරය වනුයේ විද්‍යාර්ථීන්ගේ, ඉංග්‍රීසි භාෂාව හා සම්බන්ධ සන්නිවේදන මෙන් ම ලිවීමේ හැකියාවන් වැඩිදියුණු කරමින් ඔවුන්ගේ අනාගත වෘත්තීන් සඳහා පුහුණු කිරීමයි. තවද, ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීමේ උපාධිධාරීන් අධ්‍යාපනික කුසලතා, ක්‍රමවේදයන්, න්‍යායාත්මක ආදානය හා පර්යේෂණ පසුබිමක් සහිත වෘත්තීකයන් බවට පත්කිරීම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශයේ පරමාර්ථයයි.

මෙම අධ්‍යයනාංශය මානවශාස්ත්‍ර පීඨයට අයත් වුවද, සියලුම පීඨයන් සඳහා පාඨමාලා සපයනු ලබයි. මෙම අධ්‍යයනාංශයයේ ශක්තිය වනුයේ ඕනෑම විෂයකට අදාල වන ආකාරයට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම හා අධ්‍යයන කටයුතු කිරීම සඳහා අවශ්‍ය පාඨමාලා සැපයීමයි. English for Specific Purposes (ESP) හා English for Academic Purposes (EAP) යන පාඨමාලාවන් ද විද්‍යාර්ථීන්ට මෙන්ම කාර්ය මණ්ඩලයට මෙම අධ්‍යයනාංශය මඟින් සපයනු ලබයි. මෙම අධ්‍යයනාංශය මඟින් පළමු වසරේ සිට සිව්වන වසර දක්වා සියලු ම විද්‍යාර්ථීන්ට ඉංග්‍රීසි භාෂා පාඨමාලා ප්‍රදානය කරයි. මෙම අධ්‍යයනාංශය මඟින් සියලුම පීඨයන්ට වෘත්තීය ඉංග්‍රීසි පාඨමාලා ප්‍රදානය කරන අතර සිව්වන වසරේ විද්‍යාර්ථීන් සඳහා ඔවුන්ගේ පර්යේෂණ නිබන්ධන ලිවීමේ හැකියාව ඔප් නැංවීම සඳහා විශේෂ වූ පාඨමාලාවක් මෙහෙයවනු ලබයි.

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය මඟින් නව උපාධියක් ලෙස දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL) උපාධි පාඨමාලාව හඳුන්වා දෙන ලද අතර, 2013 වර්ෂයේ සිට TESL ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව ආරම්භ කරන ලදී. මෙම උපාධිය ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂාව උගන්වන ගුරුවරුන් උදෙසා ම පාදක කොටගත් උපාධියක් වන අතර, ඉංග්‍රීසි අධ්‍යයනාංශය මඟින් ලබාදෙන ඉංග්‍රීසි උපාධියට වඩා වෙනස් වූවකි. ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ විද්‍යාර්ථීන් ඉංග්‍රීසි සාහිත්‍යය හා වාග්විද්‍යාව හදාරන අතර, TESL උපාධිය මඟින් ව්‍යවහාරික

වාග්විද්‍යාව ඉගැන්වීමේ ක්‍රමවේද සහ භාෂා මූලධර්ම සම්බන්ධව ද හැදෑරීමට අවස්ථාව සලසා දෙනු ලබයි. තවද, උපාධි අපේක්ෂකයින් පර්යේෂණ සංස්කෘතියට හුරුකරවන අතර, විවිධ පාඨමාලා ඒකක මගින් පර්යේෂණවල යෙදීම පුහුණු කිරීමට මෙම අධ්‍යයනාංශය මගින් සිදුකරනු ලබයි. මෙම අධ්‍යයනාංශය මඟින් ලබාදෙන පුළුල් සීමාවාසික වැඩසටහන න්‍යායාත්මක කරුණු ප්‍රායෝගික භාවිතයට ගැනීමට මනා පසුබිමක් සකස් කර දෙනු ලබයි.

සාම්ප්‍රදායික අධ්‍යයන කටයුතුවලට අමතර ව ශාස්ත්‍රීය උන්නතිය සඳහා ‘Perkumpulan’ යන තේමාව ඔස්සේ ඉංග්‍රීසි ඉගැන්වීමේ අධ්‍යයනාංශය මඟින් මාසික දේශන මාලාවක් සංවිධානය කරනු ලබයි.

2017 වර්ෂයේ දී පවත්වනු ලැබූ අධ්‍යයනාංශ ප්‍රගති සමාලෝචන සැසියේ දී ශාස්ත්‍රීය කටයුතු කෙරෙහි අධ්‍යයනාංශය දක්වනු ලබන කැපවීම “A”සාමාර්ථයකින් පිදුම් ලැබීම.

ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය හා ඒ හා සබැඳි පර්යේෂණවල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා මෙම අධ්‍යයනාංශයේ ආචාර්යභවතුන් නිබඳව නොමඳ දායකත්වයක් දක්වයි. කනිෂ්ඨ ආචාර්ය භවතුන්ගේ කාර්ය සාධක වැඩමුළු අඛණ්ඩව වසර ගණනාවක් මෙහෙයවනු ලැබුවේ මෙම අංශය විසිනි. මීට අමතර ව අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩිදියුණු කිරීමේ පාඨමාලා දියත් කිරීමත්, ඉංග්‍රීසි භාෂාව හා සබැඳි ලේඛන හා පරිවර්තන කාර්යයන්වල මෙන් ම අනෙකුත් කාර්යයන්වල දී මෙම අධ්‍යයනාංශය විසින් නොමඳ සහයක් දක්වයි. මීට අමතර ව ඉංග්‍රීසි භාෂාව හා වාග්විද්‍යාව සබැඳි ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රවේදී විශේෂ හා පශ්චාත් උපාධි අපේක්ෂකයන්ගේ අධ්‍යයන පාඨමාලා පැවැත්වීමටත්, ඔවුන්ගේ පර්යේෂණ හා නිබන්ධන අධීක්ෂණ කටයුතු සිදු කිරීමටත් මෙම අධ්‍යයනාංශය නොමසුරු සහයෝගයක් දක්වයි. එපමණක් නොව මෙම අධ්‍යයනාංශය මඟින් බාහිර සිසුන් සඳහා විවිධ ගාස්තුන් යටතේ පාඨමාලාවන් සපයනු ලැබේ.

- Diploma in English for Professional Purposes (DEPP)
- ‘CONNECT’ An Intermediate Course in English and
- English for International Students.

## 7.4 ලලිත කලා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ටී.එල්.ඩී. ද සිල්වා මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.A. (Kel'ya), PG. Dip. (PGIAR), M.Sc (Mor'wa)*
මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ මිය - මහාචාර්ය (සේවයෙන් නිදහස් කර නිවාඩු ලබා දී ඇත)
*B.A. (Kel'ya), Dip.in Archaeology (PGIAR), PG Dip. in ACOMAS (Mo'tuwa), MSc (PCIAR), Ph.D. (Calif. USA)*
ආචාර්ය කේ.ඩී.එල්. මනරංජනී මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A.(Kel'ya), PG Dip. in Archaeology (PGIAR), M. Music. (B.H.U. India), Ph.D. (Slovenia)*
දුලංගා ගුණරත්න මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), Bharatha Nattyam Dip. (India), M.Phil. (Kel'ya)*
ජේ.සී.ආර්. කුමාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ( අධ්‍යයන නිවාඩු)
*B.A.(Kel'ya), M.A. in Hindustani Music (Delhi,India),M.Phil. (Kel'ya)*
අසිත අමරකෝන් මහතා - කථිකාචාර්ය
*B.A. (Kel'ya), MFA (Kel'ya)*
ටී.එම්.එම්.කේ. තෙන්නකෝන් මයා - ආධුනික කථිකාචාර්ය
*BPA (University of Visual Arts & Performing Arts)*
එල්.ආර්.එස්. ද සිල්වා මයා - ආධුනික කථිකාචාර්ය
*B.A.(Kel'ya)*

මෙම අධ්‍යයන අංශය මගින් අධ්‍යයන පාඨමාලා තුනක් හඳුන්වා දී ඇත. දෘශ්‍ය කලා සහ සැලසුම්කරණ ඒ අතරින් එක් පාඨමාලාවක් වන අතර අනෙක් විෂය ධාරා වන්නේ ප්‍රාසංගික කලා සංගීතය සහ ප්‍රාසංගික කලා නර්තනයයි. මින් පලමු ව සඳහන් කරන ලද විෂය යටතේ කලා ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක් ද, උද්‍යාන සැලසුම්කරණය (Garden Design) සහ ගෘහාභ්‍යන්තර සැලසුම්කරණය (Interior Design) පිළිබඳ ප්‍රායෝගික සහ ශාස්ත්‍රීය දැනුමක් ද, චිත්‍ර ශිල්පය, මූර්ති ශිල්පය සහ පරිගණක සැලසුම්කරණය (Computer Graphic Design) පිළිබඳ පූර්ණ ප්‍රායෝගික පුහුණුවක් ද සිසුන්ට ලබා දෙනු ලැබේ. ප්‍රසාංගික කලා සංගීතය ප්‍රායෝගිකව අධ්‍යයනය කරන සිසුන් සඳහා ගායනය මෙන් ම වාදනය ද අනිවාර්ය වේ. ප්‍රාසංගික කලා නර්තනය යටතේ උඩරට, පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන් මෙන් ම සාම්ප්‍රදයික බෙර වාදනය ද උගන්වනු ලැබේ. සංගීතය සහ නර්තනය හදාරන සියලු ම සිසුන්ට ශ්‍රී ලාංකේය ජන ගී පිළිබඳ ශාස්ත්‍රීය හා ප්‍රායෝගික දැනුමක් ද ලබා දේ. මීට අමතර ව ක්ෂේත්‍ර අධ්‍යයන මෙන් ම සීමාවාසික වෘත්තීය පුහුණුව ද උපාධි කාල සීමාව තුළ විද්‍යාර්ථීන්ට ලබා දීමට සැලසුම් කොට ඇත.

පරිගණක සැලසුම්කරණය විෂය යටතේ පරිගණක සැලසුම්කරණය (Computer Graphic Design), ඩිජිටල් චිත්‍රකරණය (Digital Painting), අක්ෂරකරණය (Tyopography), පිටු සැලසුම්කරණය (Page Layout Design), ද්වීමාන සහ ත්‍රිමාන සජීවීකරණය (2D and 3D Animation), වීඩියෝ සංස්කරණය (Video Editing), ආදිය පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

ඩිජිටල් සැලසුම්කරණය විෂය යටතේ ඩිජිටල් මාධ්‍ය (Digital Media), පරිගණක සැලසුම්කරණය (Computer Graphic Design), ඩිජිටල් චිත්‍රකරණය (Digital Painting), ද්වීමාන සහ ත්‍රිමාන සජීවීකරණය (2D and 3D Animation), පිළිබඳව න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාවේ විශේෂත්වය වන්නේ තෙවන වසරේ සිට විද්‍යාර්ථීන්ට ස්වර්ණාභරණ සැලසුම්කරණය (Jewelary Design), විලාසිතා සැලසුම්කරණය (Fashion Design), ගෘහනිර්මාණ සැලසුම්කරණය (Architectural Design), යන ක්ෂේත්‍ර ඔස්සේ විශේෂ ප්‍රාගුණ්‍යයක් ලැබීමට අවස්ථාව හිමි වීමයි.

දෘශ්‍ය කලා සහ සැලසුම්කරණ විෂය හැදෑරීම සඳහා අ.පො.ස. (උසස් පෙළ) පරීක්ෂණයෙන් චිත්‍ර විෂයය සඳහා C සාමාර්ථය ලබා තිබීම පූර්ව අවශ්‍යතාවක් වෙයි. එසේ නොමැති නම්, අධ්‍යයන අංශය මගින් පවත්වනු ලබන චිත්‍ර ශිල්පය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකට සිසුන් පෙනී සිටිය යුතු ය. ප්‍රාසංගික කලා විෂයය හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන් අ.පො.ස. (උසස් පෙළ) පරීක්ෂණයෙන් නර්තනය හෝ සංගීතය විෂයය සඳහා C සාමාර්ථයක් ලබා තිබිය යුතුය. පරිගණක සැලසුම්කරණය (Computer Graphic Design) හා ඩිජිටල් සැලසුම්කරණය (Digital Design) යන විෂය හැදෑරීම සඳහා පූර්ව අවශ්‍යතා සැපිරිය යුතු නොවුව ද, අ.පො.ස. (උසස් පෙළ) පරීක්ෂණයෙන් චිත්‍ර හෝ පරිගණක සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ විෂයට C හෝ ඊට ඉහළ සාමාර්ථය ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

**පශ්චාද් උපාධි පාඨමාලා :**

ලලිත කලා දැවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ද, සංගීතය හා නර්තනය පිළිබඳ දැවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලා ද, සංගීතය, නර්තනය, කලා ඉතිහාසය වැනි විෂය ක්ෂේත්‍ර යටතේ දර්ශනපති සහ දර්ශනශූරි උපාධි පාඨමාලා හැදෑරීමේ සහ පර්යේෂණ කටයුතුවල නිරත වීමේ අවස්ථාව හිමි වේ.

## 7.5 හින්දී අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය ඩබ්ලිව්. නීතා සුභාෂිණී සෙනෙවිරත්න මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අංශ ප්‍රධාන)
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Ambedkar University, Delhi, India)*
මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ මයා - විශ්‍රාම ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), PG. Dip. (S. J'pura), Vadya Visharad (L'now,India), Ph.D. (JNU, New Delhi, India)*
මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Dip. in Hindi (Agra, India), Vadya Visharad (L'now, India), Ph.D. (Allahabad, India)*
ආචාර්ය අනුෂා නිල්මිණි සල්වතුර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya)*
ආනන්ද අබේසුන්දර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Dip. in Hindi (Agra, India), Ph.D (Reading)*
හසාරා දසුනි හිරිමුතුගොඩ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A.(Kel'ya), Dip. in Translation (Kel'ya), M.A. (Kel'ya)*
ඩබ්ලිව්. උදේශිකා පියුමාලි පෙරේරා මෙය - ආධුනික කථිකාචාර්ය
*B.A.(Kel'ya), Dip. in Tamil (IHRA, C'bo), Dip. in Translation (Kel'ya), M.A. (Reading)*

අපගේ යාබද රට වන, ලෝකයේ දෙවැනි විශාලතම ජන සංඛ්‍යාව වාසය කරන භාරතයෙහි වැඩිදෙනාගේ මව් භාෂාව මෙන් ම, එරටෙහි රාජ්‍ය භාෂාව ද වනුයේ හින්දී භාෂාව ය. භාෂාත්මක වශයෙන් සිංහලයට බොහෝ සෙයින් සමාන ලක්ෂණවලින් යුතු හින්දී භාෂාව, ලෝකයේ ව්‍යවහාරයේ පවතින විවිධ භාෂා අතුරින් වඩාත් ප්‍රිය උපදවන, ඉතා මධුර භාෂාවකි. චිත්‍ර, නැටුම්, සංගීතය, ඉතිහාසය, පුරාවිද්‍යාව, වාග්විද්‍යාව, දර්ශනය, ආයුර්වේදය, සිනමාව, සිංහල හා බෞද්ධ සංස්කෘතිය වැනි විෂයයන් ප්‍රගුණ කරන විද්‍යාර්ථීන්ට මෙන් ම, විද්‍යාව, තාක්ෂණය, වාණිජ හා කළමනාකරණය වැනි විෂය ක්ෂේත්‍රයන්ට අයත් විද්‍යාර්ථීන්ට ද හින්දී භාෂාව හැදෑරීම මහෝපකාරී වේ.

හින්දී භාෂාව, සාහිත්‍යය හා තදාශ්‍රිත සංස්කෘතිය පිළිබඳ ව උසස් ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා දීම ද, එම ක්ෂේත්‍ර යටතේ ශ්‍රී ලාංකිකයනට වැඩදායක වන්නා වූ පර්යේෂණ මෙහෙයවීම ද අරමුණු කොට ගෙන මෙම විශ්වවිද්‍යාලය ආරම්භයේදී ම පිහිටුවනු ලැබූ හින්දී අධ්‍යයනාංශයේ ප්‍රථම මහාචාර්යවරයා ලෙස හින්දී පඬිවරයකු වූ මහාචාර්ය භදන්ත් ආනන්ද් කෝසල්‍යායන් හිමිපාණෝ සේවය කළහ. 70 දශකයේදී විශ්වවිද්‍යාල ව්‍යුහයේ ඇති කරන ලද සංශෝධනවලට අනුව නූතන භාෂා අධ්‍යයනාංශයට අනුයුක්ත කෙරුණු හින්දී අධ්‍යයනාංශය 1995 මාර්තු මස නැවත වරක් ස්වාධීන අධ්‍යයනාංශයක් ලෙස ස්ථාපිත කරන ලද අතර, හින්දී පිළිබඳ ජාත්‍යන්තර කීර්තියට පත්, මහාචාර්ය ඉන්ද්‍රා දසනායක මහත්මිය එහි අංශාධිපතිනිය ලෙස පත්විය.

**ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව**
මෙම පාඨමාලාවට ඇතුළත් වීම සඳහා **හින්දී භාෂාව පිළිබඳ පූර්ව දැනීමක් අවශ්‍ය නො වේ.** මුල සිට හින්දී ඉගෙන ගනිමින්, හින්දී භාෂාව, සාහිත්‍යය සහ තදාශ්‍රිත සංස්කෘතිය පිළිබඳ දැනීමක් ලබා ගැනීමට හැකි වන අන්දමින් පාඨමාලා සකස් කර තිබේ. **ප්‍රථම වර්ෂය අවසානයේ දී, හින්දී භාෂාව පහසුවෙන් හසුරුවා ගැනීමට විද්‍යාර්ථියා සමතකු කරනු ලැබේ.** හින්දී විෂය ප්‍රධාන විෂයයක් ලෙස නොහදාරන විද්‍යාර්ථීන් සඳහා මුල සිට ම හින්දී ඉගෙනීම වෙනුවෙන් ආධාරක ඒකක ලෙස **හින්දී භාෂා ප්‍රවීණතා පාඨමාලාව** හඳුන්වා දී ඇත.

**ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව**
ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම වර්ෂාවසාන පරීක්ෂණයේ දී ඉහළ ප්‍රවීණත්වයක් දක්වන විද්‍යාර්ථීන්ට මෙම පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලැබේ. හින්දී විෂයයෙන් ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව සඳහා හින්දී භාෂාව, හින්දී ජන සාහිත්‍යය, හින්දී සම්භාව්‍ය සාහිත්‍යය හා හින්දී භාෂක කලාපයේ සංස්කෘතිය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙනු ලැබේ. මෙම පාඨමාලාව පිළිබඳ වැඩි විස්තර හින්දී අධ්‍යයනාංශ ප්‍රධාන වෙතින් ලබා ගත හැකි ය.

**පශ්චාද් උපාධි පාඨමාලා**
හින්දී භාෂාව, හින්දී ජන සාහිත්‍යය, හින්දී සම්භාව්‍ය සාහිත්‍ය, හින්දී භාෂක කලාපයේ සංස්කෘතිය යන විෂයයන් යටතේ **දර්ශනපති** සහ **දර්ශන විශාරද** යන පශ්චාද් උපාධි සඳහා සුදුසුකම් ලත් විද්‍යාර්ථීන්ට මේ සඳහා ඉදිරිපත් වීමට පුළුවන. මේ පිළිබඳ වැඩි විස්තර හින්දී අධ්‍යයනාංශ ප්‍රධානගෙන් ලබා ගත හැකි ය.

**හින්දී භාෂා සහතිකපත්‍ර පාඨමාලාව**
හින්දී භාෂාවෙන් කථා කිරීම හා ලේඛන හැකියාව ලබා දීම සඳහා සකස් කර ඇති මෙය දෑවුරුදු පාඨමාලාවකි. සියලු ම අධ්‍යයන වර්ෂවල විද්‍යාර්ථීන්ට මෙම පාඨමාලාවට ඇතුළත් විය හැකි ය. මේ සඳහා **හින්දී පිළිබඳ මූලික දැනීමක් අවශ්‍ය නො වේ.**

**හින්දී ඩිප්ලෝමා පාඨමාලාව**
හින්දී භාෂාව පිළිබඳව උනන්දුවක් දක්වන බාහිර විද්‍යාර්ථීන් සඳහා පවත්වනු ලබන එක් අවුරුදු පාඨමාලාවකි.

**හින්දී විෂය හදාරන විද්‍යාර්ථීන් සඳහා ඉන්දියානු රජයෙන් පිරිනැමෙන ශිෂ්‍යත්ව**
ශාස්ත්‍රවේදී හෝ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය සඳහා හින්දී විෂයය අධ්‍යයනය කරන විද්‍යාර්ථීන්ට ඉන්දියානු රජය මඟින් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව මඟින් උත්තර භාරතයේ ආග්‍රාහි **කේන්ද්‍රීය හින්දී සංස්ථාන්** ආයතනයේ මාස දහයක පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ඇත.

**හින්දී අධ්‍යයනය සඳහා අවශ්‍ය පොත්පත්-වාර සඟරා**
අධ්‍යයනාංශයෙහි පවත්වාගෙන යනු ලබන **මහාචාර්ය ඉන්ද්‍රා දසනායක හින්දී පුස්තකාලයෙන්** හා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයෙන් හින්දී අධ්‍යයනය සඳහා අවශ්‍ය පොත්පත් සහ වාර සඟරා ලබා ගත හැකි ය.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 011 2987105 |
| | - | 011-2903760 |
| විද්‍යුත් ලිපිනය | - | hodhind@kln.ac.lk |

## 7.6 වාග්විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය කවිතා රාජරත්නම් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.A. (Perad'ya), M.A. (Kel'ya), Ph.D. (Kel'ya)*
මහාචාර්ය ජී.ජේ.එස්. විජේසේකර මිය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Delhi, India), Ph.D. (Kel'ya)*
ආචාර්ය සී.ඩී.එච්.එම්. ප්‍රේමරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.A. (Hitotsubashi, Japan), Ph.D. (Hitotsubashi, Japan)*
ආචාර්ය යූ. සුදත් සෙනරත් මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(පීඨාධිපති - මානවශාස්ත්‍ර පීඨය)**
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya)*
කුමුදු නයනි ගමගේ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), PG. Dip. TraSt. (Perad'ya)*
ආචාර්ය පූජ්‍ය කපුගොල්ලෑවේ ආනන්දකිත්ති හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (Pune India), Ph.D. (Pune, India)*
ආචාර්ය වින්ධ්‍යා අනුරුද්ධිකා වීරවර්ධන මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya)*
ඩී.ජී.ටී. අනුරාධා ජයසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
බී.ඒ. කෞමදී මහේෂිකා බමුණුසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
පූජ්‍ය කුරුපිට අස්සජිතිස්ස හිමි - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*Royal Pandith, B.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
ඒ. කවිතා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Jaffna), M.Phil. (Jaffna)*
ඩබ්ලිව්.ටී.සී. ජයමල් ද සිල්වා මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
පූජ්‍ය උඩගලදෙනියේ ධම්මවිමල හිමි - ආධුනික කථිකාචාර්ය
*Royal Pandith, B.A. (Kel'ya), M.A. (Kel'ya)*

**වාග්විද්‍යා අංශය**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ වාග්විද්‍යාව සඳහා වෙනම අධ්‍යයනාංශයක් කැලණිය විශ්වවිද්‍යාලයේ පිහිටුවනු ලැබූයේ 1972 වර්ෂයේ දී ය. එය මානවශාස්ත්‍ර පීඨය යටතේ **'වාග්විද්‍යා අංශය'** ලෙස ප්‍රතිෂ්ඨාපනය කරන ලදි. පසුගිය දශක සතරක කාලයෙහි මෙම අධ්‍යයනාංශය මගින් ආරම්භ කරන ලදුව ව්‍යාප්තියට පත් කරන ලද **වාග්විද්‍යාව, පරිවර්තන අධ්‍යයන, භාෂා පරිවර්තන ක්‍රම සහ දෙවන භාෂාවක් ලෙස දෙමළ භාෂාව යනුවෙන් උපාධි පාඨමාලා සතරක් ද, වරණීය ඒකකයක් ලෙස දෙමළ භාෂාව ද, දෙමළ භාෂාව පිළිබඳ කෙටිකාලීන පාඨමාලාවක් ද, විදේශීය විද්‍යාර්ථීන් උදෙසා දෙමළ සහතික පත්‍ර පාඨමාලාවක් ද** ඉදිරිපත් කරනු ලැබේ.

**වාග්විද්‍යාව පාඨමාලාව**

වාග්විද්‍යාව යනු භාෂාව පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයයි. එය සමස්ත මානව භාෂාව පිළිබඳ ව ම කෙරෙන පොදු අධ්‍යයනයකි. මිනිස් භාෂාවේ අනන්‍යතාව, සංස්ථිතිය, ඉතිහාසය මෙන්ම වෙනත් විෂය ක්ෂේත්‍ර සමඟ භාෂාවේ ඇති සම්බන්ධය පිළිබඳව ද එහි දී සාකච්ඡා කෙරෙයි.

වාග්විද්‍යා දැනුම භාවිතයෙන්, ප්‍රායෝගික අධ්‍යයනයන් කළ හැකි විෂය ඒකකයන් ද හඳුන්වාදී තිබේ. සායනික වාග්විද්‍යාව, ව්‍යවහාරික වාග්විද්‍යාව, සන්නිවේදන දුබලතා, සංඥා භාෂාව, වාක්කෝෂකරණය හා භාෂා සැලසුම්කරණය ඉන් කිහිපයකි.

භාෂාව ගැන අවශ්‍යයෙන් ම දත යුතු විද්‍යාත්මක තොරතුරු රාශියක් මෙම පාඨමාලාවෙන් හඳුන්වා දෙනු ලැබේ. **වාග්විද්‍යාව විෂය** තෝරා ගැනීම සඳහා පූර්ව අවශ්‍යතා කිසිවක් අපේක්ෂා නොකෙරේ. භාෂාව විද්‍යාත්මක ස්වරූපයෙන් හදාරනු කැමති, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨවලට අයත් විද්‍යාර්ථීන් කවරෙකුට වුව ද එය විවෘත ය.

**පරිවර්තන අධ්‍යයනය**

**පරිවර්තන අධ්‍යයන,** ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය සඳහා පමණක් සීමා වූ විෂයයකි. මේ සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට ඕනෑම විෂය ධාරාවක් යටතේ පෙනී සිට සමත් වන විද්‍යාර්ථීන්ට විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිට අපේක්ෂිත ලකුණු ලැබීමෙන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් Z - අගය මත මෙම පාඨමාලාව සඳහා ප්‍රවේශය ලබාදෙනු ලැබේ. මෙම විෂය තෝරාගන්නා අපේක්ෂකයන් සඳහා සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා පිළිබඳ ප්‍රවීණත්වයත් භාෂා පරිවර්තනය පිළිබඳ න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙනු ඇත.

**භාෂා පරිවර්තන ක්‍රම**

**භාෂා පරිවර්තන ක්‍රම විෂය** ශාස්ත්‍රවේදී උපාධිය සඳහා පමණක් සීමා වූ ප්‍රායෝගික විෂයකි. මෙම විෂය තෝරාගන්නා අපේක්ෂකයන්ගෙන් සිංහල හා ඉංග්‍රීසි යන භාෂා දෙක පිළිබඳ ව ම ව්‍යවහාරික දැනීමක් අපේක්ෂා කෙරේ. **මෙම විෂය තෝරා ගනු කැමති විද්‍යාර්ථීන් අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් විය යුතු අතර අවම විද්‍යාර්ථීන් පස්දෙනෙකුගේ** (05) ලියාපදිංචියට යටත්ව මෙම පාඨමාලාව ක්‍රියාත්මක වේ. පරිවර්තන ක්‍රම ඉගැන්වීමේදී ඉංග්‍රීසි හා සිංහල යන භාෂා මාධ්‍ය දෙක ම යොදා ගැනේ. විද්‍යාර්ථීන් අවසාන වර්ෂයේදී පරිවර්තනය පිළිබඳ වෘත්තීය පුහුණුව සඳහා වූ ඒකකයකට ද සහභාගි කෙරේ.

**දෙවන භාෂාවක් ලෙස දෙමළ**

ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා **දෙමළ දෙවන භාෂාවක් ලෙස** හැදෑරීමට බලාපොරොත්තු වන විද්‍යාර්ථීන් **අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිට ඉන් සමත් විය යුතු ය.** මෙහිදී භාෂණ දෙමළ ව්‍යවහාරයට අවශ්‍ය මඟපෙන්වීම ලබාදී පසුව ලේඛන දෙමළ ව්‍යාකරණය, දෙමළ සාහිත්‍යය, හින්දු සංස්කෘතිය, ජනමාධ්‍ය භාවිතය සඳහා දෙමළ, දෙමළ නවකතා, දෙමළ කෙටිකතා ආදී කොටස් පිළිබඳ දැනුමක් ලබාදෙනු ලැබේ.

**වරණීය ඒකකයක් ලෙස දෙමළ**

විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථියකු වශයෙන් කටයුතු කරන ඕනෑම විද්‍යාර්ථියකුට වරණීය ඒකකයක් ලෙස මෙම විෂය ඒකකය හැදෑරිය හැකි ය. ඒ සඳහා දෙමළ භාෂාව පිළිබඳ පූර්ව සුදුසුකම් අපේක්ෂා නොකෙරේ.

**දෙමළ භාෂා ප්‍රවීණතාව**

මෙම පාඨමාලාව වර්ෂයක් පුරා පැවැත්වේ. ඒ සඳහා ඇතුළත් වීමට මූලික සුදුසුකම් සලකා නොබැලෙන අතර විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථියකු වශයෙන් කටයුතු කරන කාලසීමාව තුළ ලියාපදිංචි විය හැකිය.

**සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව**

මෙම පාඨමාලාව වසර දෙකක් පුරා පැවැත්වෙන අතර, එයට ඇතුළත් වීමේ මූලික සුදුසුකම් සලකා නොබැලෙන අතර පළමු හා දෙවන වර්ෂයන් හි ලියාපදිංචි විය හැකි ය.

**විදේශීය විද්‍යාර්ථීන් උදෙසා දෙමළ සහතික පත්‍ර පාඨමාලාව**

මෙම පාඨමාලාව වර්ෂයක් පුරා විදේශීය විද්‍යාර්ථීන් සඳහා ගාස්තු අයකර පවත්වාගෙන යනු ලැබේ.

**ඩිප්ලෝමා පාඨමාලා**

දෙමළ භාෂාව සහ භාෂා පරිවර්තනය පිළිබඳව උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන් සඳහා ශාස්ත්‍ර අයකර පවත්වාගෙන යනු ලබන සති අන්ත (සෙනසුරාදා/ඉරිදා),

i . දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව

ii . භාෂා හා භාෂණ පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව

වශයෙන් එක් අවුරුදු පාඨමාලා දෙකක් ද පවත්වනු ලැබේ.

**පශ්චාද් උපාධි පාඨමාලා**

ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාවන් අවසන් කරනු ලබන විද්‍යාර්ථීන් සඳහා වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (දෑ අවුරුදු), දර්ශනපති හා දර්ශන විශාරද යන පශ්චාද් උපාධි පාඨමාලා අධ්‍යයනාංශය මඟින් ඉදිරිපත් කෙරේ.


දුරකථන අංක - අංශ ප්‍රධාන : 670 / 0112-903670
අංශය : 0112-908786
අභ්‍යන්තර අංක - 671, 672
විද්‍යුත් ලිපිනය - ling@kln.ac.lk

## 7.7 නූතන භාෂා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

පූජ්‍ය මහාචාර්ය නැදලගමුවේ ධම්මදින්න හිමි - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.A. (Hons) (Nanjing,China), M.A.,Ph.D.(Shanghai, China),Royal Pandit, H.S.K. High Level (China)*
මහාචාර්ය කේ.එල්.කේ.එන්.සී. ප්‍රේමවර්ධන මිය - විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. M.Phil. (Kel'ya), Ph.D. (Siegen, Germany), Deutschlehrer Dipl. (Munich, Germany)*
මහාචාර්ය දිල්රුක්ෂි රත්නායක මිය - මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Nagoya, Japan), M.A. (Kel'ya), Ph.D. (Nagoya, Japan)*
පූජ්‍ය ආචාර්ය මීමුරේ ගුණානන්ද හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*M.A. (Moscow, Russia) M.A. PGIPBS (Kel'ya), Ph.D. (Moscow, Russia)*
ආචාර්ය කේ.එම්.යූ.අයි. ද සිල්වා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.A. (Japan,Hitotsubashi), M.A. (Kel'ya), Ph.D. (Japan - Hitotsubashi)*
ආචාර්ය එච්.එස්.එම්.එම්. ජයවර්ධන මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.A. (JNU, New Delhi, India) Ph.D. (JNU, New Delhi, India)*
ආචාර්ය ජේ.ඒ.කේ.පී. ජයසූරිය මැණිකේ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (Nanjing, China), Ph.D. (Nanjing, China)*
ආචාර්ය ඒ. ජානි අල්විස් සමරකෝන් මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.A (Kel'ya), M.A. (CCNU, China), Ph.D. (CCNU, China)*
ආචාර්ය සරසි කන්නන්ගර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.A. (University of Kassel),Ph.D. (Technical university of Darmstadt)*
බී. මධුපාලි සුගන්ධිකා කුරේ මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), MPhil (Kel 'ya)*
ඩී.එම්.ඒ.එස්.පී. රත්නායක මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.A.(BLCU Beijing, China)*
බී.එම්.එස්.කුරේ මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), MPhil. (Kel'ya)*
එස්. චතුරිකා නිලානි මෙය - කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Seoul, South Korea)*
එච්.එම්.ඩී.ටී.කේ. ජයතිලක මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya)*
එම්. අමිලජිත් නිසංක ලීලාරත්න මයා - ආධුනික කථිකාචාර්ය - (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (Hanyang, Seoul)*
ඒ.ඒ. ඉමාලි රුවන්තිකා එදිරිසූරිය මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Korea University, Seoul)*
එන්.බී. මාතරහේවගේ මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Moscow, Russia)*
අයි. අයි. පී. නුවන්සිරි මයා - ආධුනික කථිකාචාර්ය
*B.A. (Hons) (Kel'ya)*

වර්තමාන ලෝකයේ විවිධ රටවල එදිනෙදා කටයුතු කරගැනීමේදී ද, පරිපාලනය, අධ්‍යාපනය, ශාස්ත්‍රීය පර්යේෂණ පැවැත්වීම ආදි කටයුතු සඳහා ද භාවිත කරනු ලබන **'ජීවභාෂා'** නූතන භාෂා වශයෙන් හඳුන්වනු ලැබේ. නූතන භාෂා විෂයයන්ට අදාළ ව භාෂාව පමණක් නොව, ඒ හා සම්බන්ධ සාහිත්‍යය, සංස්කෘතිය හා දර්ශනය පිළිබඳ ව උසස් ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා දීම ද, පර්යේෂණ මෙහෙයවීම ද අරමුණු කොටගෙන මෙහි පාඨමාලා සකස් කොට ඇත.

මෙම අධ්‍යයනාංශයේ සේවය කරන ස්ථිර ආචාර්යභවතුන්ට අමතර ව ඒ ඒ නූතන භාෂාවන්ට සම්බන්ධ විදේශීය රාජ්‍ය වෙතින් සැපයෙන ආචාර්යවරුන්ගේ සේවය ද සහිත ව චීන, ප්‍රංශ, ජර්මන්, ජපන්, ස්පාඤ්ඤ, රුසියන් හා කොරියන් යන භාෂා උගන්වනු ලැබේ.

**ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව**

(අ) ඉහත දක්වන ලද විෂයයන් අතරින් **ප්‍රංශ** හා **ජපන්** යන විෂයයන් හැර අනෙක් නූතන භාෂා විෂයයකින් ප්‍රථම වර්ෂ පාඨමාලාවක් හැදෑරීම සඳහා **අදාළ නූතන භාෂාව පිළිබඳ පූර්ව දැනීමක් ලබා තිබීම අවශ්‍ය නොවේ. ප්‍රංශ භාෂාව හෝ ජපන් භාෂාව හෝ හැදෑරීමට බලාපොරොත්තු වන විද්‍යාර්ථීන් අ.පො.ස. (උ.පෙ.) පරීක්ෂණයෙන් අදාළ විෂයය සමත් වී සිටිය යුතු ය.** එසේ සාමර්ථ්‍යයක් ලබා නැති, එහෙත් විෂයය පිළිබඳ පූර්ව දැනුමක් ඇති විද්‍යාර්ථීන්ට, අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් වුවහොත් පමණක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා අවස්ථාව ලැබේ.

(ආ) තෝරා ගනු ලබන නූතන භාෂා විෂයයට අදාළ ව භාෂාව, සාහිත්‍යය හා සංස්කෘතිය පිළිබඳ ව අධ්‍යයනය කිරීම අපේක්ෂිත ය.

(ඇ) වර්ෂාවසාන පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලැබීමට නම්, අවුරුද්ද මුළුල්ලේ පවත්වනු ලබන දේශන සඳහා අවම වශයෙන් 80%ක සහභාගිත්වය තිබීම අනිවාර්ය වේ.

ඉහත සඳහන් විෂයයන් ප්‍රධාන විෂයයක් වශයෙන් නොහදාරන විද්‍යාර්ථීන්ට එම විෂයයන්ට අදාළ ආධාරක ඒකක හැදෑරිය හැකි ය.

**ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව**

ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා **ජර්මන්, ප්‍රංශ,** රුසියන්, **ජපන්, චීන, හා කොරියන්** යන භාෂා තෝරා ගත හැකි අතර, වැඩි විස්තර අධ්‍යයනාංශයෙන් ලබා ගත හැකි ය.

**නූතන භාෂා සහතිකපත්‍ර පාඨමාලා**

**(චීන, ජපන්, ප්‍රංශ, රුසියන්, ජර්මන්, කොරියන්, අරාබි, ඉතාලි, ස්පාඤ්ඤ)**

ඉහත භාෂා පාඨමාලා සඳහා ඕනෑ ම පීඨයක **ප්‍රථම** වසරේ හෝ දෙවන වසරේ හෝ විද්‍යාර්ථීන්ට ඇතුළත් විය හැකි ය. මෙහි දී අදාළ නූතන භාෂාව පිළිබඳ දැනුම ප්‍රගුණ කිරීම පමණක් අපේක්ෂිත ය. මේ සඳහා අදාළ භාෂාව පිළිබඳ ව පූර්ව දැනීමක් ලබා තිබීම අවශ්‍ය නොවේ. පාඨමාලාව අවසානයේ දී හැදෑරූ භාෂාවට අදාළ සහතිකයක් පිරිනමනු ලබන අතර, පාඨමාලාවේ කාලය අවුරුදු එකකි.

දුරකථන අංකය - 011 2914494
ෆැක්ස් අංකය - 011 2914494

## 7.8 පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.A (Kel'ya), M.A. (Kel'ya), M.A. (BPU), Ph.D. (Delhi,India), Pracina Pandita*
මහාචාර්ය පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි - විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (BPU), Ph.D. (Delhi,India), Pracina Pandita* (සප්ත වාර්ෂික නිවාඩු)
මහාචාර්ය පූජ්‍ය තැරැල්ලේ ධම්මරතන හිමි - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (BHU), Ph.D. (Delhi,India)*
මහාචාර්ය උදිත ගරුසිංහ මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.A (Kel'ya), M.A.( Kel'ya), M.A.(Otani,Japan), Ph.D. (Otani,Japan)*
මහාචාර්ය පූජ්‍ය නාඔටුන්නේ විමලඤාණ හිමි - මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Sc. (Kel'ya),), Dip. in Ed. (C'bo), Ph.D. (Kel'ya)*
මහාචාර්ය අයි.ඩබ්ලිව්. රාජිත පුෂ්පකුමාර මයා - මහාචාර්ය
*B.A. (Kel'ya), M.A., M.Phil (Kel'ya), Ph.D. (Renmin,China)*
ආචාර්ය පූජ්‍ය දොඩම්කුඹුරේ ධම්මදස්සි හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Sc. (Kel'ya), Ph.D. (Kel'ya), Dip. (Arch) (Kel'ya)*
පූජ්‍ය දෙනියායේ පඤ්ඤාලෝක හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
ආචාර්ය පූජ්‍ය වැලිමඩගම කුසලධම්ම හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A., M.A., M.Phil. (Kel'ya), Ph.D. (West,USA), PG. Dip. (BPU), Pracina Pandita (OSS)*
ආචාර්ය ඩබ්ලිව්.ඒ. ගාමිණී විජයසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya), Dip. in Ed. (C'bo), PG Dip in Counseling (C'bo), Pracina Pandita (OSS)*
ආචාර්ය අමිල කළුආරච්චි මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (USJP), M.A. (BPU), Ph.D. (USJP) Dip in Psychology & Counseling (SMHF)*
පූජ්‍ය විජිතපුර ගුණරතන හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II - (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya), Dip in Counseling, Pracina Pandita (OSS)*
පූජ්‍ය අම්පාරේ ආනන්ද හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II - (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya), PG Dip in Counseling (C'bo), Dip in BPC (Kel'ya), Pracina Pandita (OSS)*
පූජ්‍ය මුවපැටිගේවෙල පඤ්ඤාලෝක හිමි - කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Dip in Counseling (Kel'ya), Dip in BPC (Kel'ya), Pracina Pandita (OSS)*
පූජ්‍ය සූරියවැව විජයවිමල හිමි - කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya), PG Dip in Counseling (C'bo), Dip in BPC (Kel'ya), Dip in English (BPU)*
පූජ්‍ය වලස්මුල්ලේ භද්දිය හිමි - කථිකාචාර්ය
*B.A.(BPU), M.A. (Kel'ya), M.A.B.C. (PGIPBS, Kel'ya) PG Dip in Counseling (C'bo), Dip in Advanced English (C'bo), Dip in English (BPU/Aquinas)*
ආර්.ඩී. ශ්‍රියානි හේමලතා මහත්මිය - කථිකාචාර්ය
*B.A. (USJP), M.A. (BPU), MS.c.(PGIAR), M.Phil. (PGIPBS, Kel'ya), PGD in Buddhism (BPU), PGD in Archaeology (PGIAR), PGD in Education (C'bo), Dip. in Buddhism (BPU)*
පූජ්‍ය මානාපිටියේ වජිරබුද්ධි හිමි - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.A. (Perad'ya), Pracina Pandita (OSS)*

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය කැලණිය විශ්වවිද්‍යාලයෙහි සුවිශේෂ ස්ථානයක් හිමිකොට ගනියි. පූර්වයෙහි මෙම සරසවිය '**විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය**' යනුවෙන් නම් ලද අවධියෙහි එය '**බෞද්ධ පීඨය**' යනුවෙන් හඳුන්වනු ලැබී ය. මෙම අධ්‍යයනාංශයෙහි පරමාර්ථය වන්නේ පාලි ත්‍රිපිටකයෙහි අන්තර්ගත බුද්ධ ධර්මය, එයට අදාළ වන අනෙකුත් සියලු ම ආනුෂංගික විෂය ධාරාවන් ද සමඟින්

ඉතා උසස් අයුරින් ශාස්ත්‍රීය අධ්‍යයනයට පාත්‍ර කරවීමට මඟ සැලසීම යි. විශේෂයෙන් ම බුද්ධ ධර්මයෙහි දාර්ශනික සහ සංස්කෘතික අංශයන් මෙහි දී ඍජු පර්යේෂණයන්ට විෂය වේ. අධ්‍යයනාංශය මඟින් සිදුවන මෙම කාර්යභාරය හේතු කොටගෙන '**බෞද්ධ අධ්‍යයනය**' නමැති පෘථුල විෂය ක්ෂේත්‍රය වෙත මැනැවින් අවතීර්ණ වී එහි සාර්ථක ලෙස විමර්ශනයෙහි නියුක්ත වීමට විද්‍යාර්ථියාට අවකාශ හිමි වේ. පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ මනෝවිද්‍යාව යන විෂයයන්ගෙන් ශාස්ත්‍රවේදී උපාධියේ සිට දර්ශන විශාරද උපාධිය දක්වා අධ්‍යයනයන්හි නියුක්ත වීමට මෙම අධ්‍යයනාංශය යටතේ අවකාශ සැලසේ. කැලණිය විශ්වවිද්‍යාලයීය බෞද්ධ අධ්‍යයනය විෂය ධාරාව දේශීය වශයෙන් මෙන් ම විදේශීය වශයෙන් ද ප්‍රසිද්ධියට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් චීනය, කොරියාව, වියට්නාමය, කාම්බෝජය, මියන්මාරය සහ බංග්ලාදේශය වැනි රටවල විද්‍යාර්ථීහු විශාල පිරිසක් වර්තමානය වන විට මෙම අධ්‍යයනාංශය යටතෙහි ස්වකීය අධ්‍යයනයන්හි නියුක්ත වෙති. එසේ ම කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිතව සිංගප්පූරුව, මලයාසියාව, චීනය වැනි රටවල පිහිටුවා ඇති බෞද්ධ අධ්‍යයන ආයතනවල පවා මෙම අධ්‍යයනාංශයෙහි විෂය නිර්දේශයට අදාළ ව අධ්‍යයන කටයුතු මෙන් ම උපාධි ප්‍රදානයන් ද සිදු වෙයි.

**පාලි**

පාලි භාෂාව යනු ශබ්දාර්ථ රසයන්ගෙන් පරිපෝෂිත වූ ද, මනහර භාවයෙන් ආඪ්‍ය වූ ද ලෝකයේ පවත්නා ඓතිහාසික අගයෙන් යුත් පර්යේෂණාත්මක භාෂාවන් අතුරින් උසස් ස්ථානයක් හිමිකර ගනු ලබන්නකි. එය අධ්‍යයනයට නතු කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ ථෙරවාදී බුද්ධ ධර්මය තත්ත්වාකාරයෙන් වටහා ගැනීමට අවකාශ සැලසීමයි. පාලි ත්‍රිපිටකයෙහි අන්තර්ගතය විධිමත් අයුරින් විශ්ලේෂණයට පාත්‍ර කිරීමෙන් බෞද්ධ දර්ශනය විෂයයෙහි මෙන් ම සමකාලීන භාරතීය සමය සම්ප්‍රදායයන් සම්බන්ධයෙන් ද පෘථුල පරිඥානයක් ලැබිය හැකි වේ. මෙම විෂය නිර්දේශය මඟින් පාලි ත්‍රිපිටකය සහ තදනුබද්ධ අර්ථ විවරණ සම්බන්ධයෙන් ප්‍රාමාණික පරිචයක් විද්‍යාර්ථියාට සම්ප්‍රදානය කිරීමට අපේක්ෂිත ය. බෞද්ධ ඥාන විභාගය, තර්ක ශාස්ත්‍රය වැනි අංශයන් පිළිබඳ ව මෙන් ම සෞන්දර්ය රසාස්වාදය, කාව්‍ය විචාර ආදි අංශයන්ට අදාළ ව පවත්නා පාලි ත්‍රිපිටකාගත ආස්ථානය ද මෙහි දී විමර්ශනයට ලක් කෙරේ. එසේ ම විද්‍යාර්ථියාගේ තුලනාත්මක ඥානය වර්ධනය වීමට ඉවහල් වන සේ බෞද්ධ සංස්කෘත, ප්‍රාකෘත වැනි භාෂාවලින් රචිත මූලාශ්‍රය සාධකයන් වෙතට ද මෙහි දී අවධානය යොමු කෙරේ. තව ද තද් විෂය විද්‍යාර්ථියාගේ අභිමතය පරිදි සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙන් ම හැදෑරීමට පහසුකම් සපයා ඇත.

**බෞද්ධ දර්ශනය**

බෞද්ධ දර්ශනය, භාරතීය දර්ශනවාද අතර සුවිශේෂ ලක්ෂණ සහිත එක් චින්තන ධාරාවකි. සෙසු සම්ප්‍රදායනට සාපේක්ෂ ව එහි පවත්නා විශේෂත්වය නම්, එම දර්ශනයට අයත් මූලධර්ම අතර පිළිබිඹු වන ඒකාබද්ධතාව හා සියවස් දෙදහසකටත් වැඩි කාලයක් තුළ ආසියානු ජන ජීවිතය හා චින්තනය පෝෂණය කරමින් වර්තමානය තෙක් ම අවිච්ඡින්න ව පැවතීම ය. බෞද්ධ දර්ශනයේ මූලික ලක්ෂණ හා විෂය ක්ෂේත්‍රය නිශ්චය කර ගැනීමට ඉවහල් වන මූලාශ්‍රය ග්‍රන්ථාවලීන් තුනක් දැනට අප හමුවෙහි පවතී. ඒවා නම් පාලි ත්‍රිපිටකය, චීන ත්‍රිපිටකය හා ටිබෙට් ත්‍රිපිටකය යි. මේ අතරින් වඩාත් පුරාණතම මූලාශ්‍රය ග්‍රන්ථාවලිය වන්නේ පාලි ත්‍රිපිටකය යි. එහෙයින් ප්‍රධාන වශයෙන් පාලි ත්‍රිපිටකය, අට්ඨකථා, ටීකා ආදි මූලාශ්‍රයෙහි ඇතුළත් චින්තනය, ඓතිහාසික, විචාරාත්මක හා තුලනාත්මක ශාස්ත්‍රීය ශික්ෂාව අනුව අධ්‍යයනය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

සත්ත්වයා හා ලෝකය පිළිබඳ විග්‍රහය, ආචාර ධර්ම, ඥාන විභාගය, මනෝ ධර්ම විශ්ලේෂණය, සමාජය, ආර්ථික හා දේශපාලන දර්ශනය, පරිසරය, සන්නිවේදනය යන විෂය ක්ෂේත්‍රයන් මෙන් ම මහායාන චින්තනයට අදාළ මධ්‍යමක, යෝගාචර දර්ශනවාද, වජ්‍රයානය හා තදාශ්‍රිත ඉගැන්වීම් ද, ඒ ඒ භූගෝලීය කලාපයන්හි බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායන්ගේ වර්ධනය හා විශේෂත්වය යන

ක්ෂේත්‍රයන් ද මෙම අධ්‍යයනයට ඇතුළත් වේ. බෞද්ධ දර්ශනය විෂයය යටතේ, ප්‍රථම උපාධියේ සිට දර්ශන විශාරද උපාධිය දක්වා අධ්‍යයන කටයුතු සිදු කිරීමට මෙහි පහසුකම් සලසා ඇත. තව ද සිංහල සහ ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන් ම තද් විෂයය හැදෑරීමේ පහසුකම් ඇත.

**බෞද්ධ සංස්කෘතිය**

බෞද්ධ සංස්කෘතිය විෂයයේ දී බුදු දහම හා ඒ ඇසුරින් ගොඩනැගුණු සංස්කෘතිය පිළිබඳ උසස් ශාස්ත්‍රීය අධ්‍යයනයක් සිදු කෙරේ. ඒ යටතේ ප්‍රථම උපාධියේ සිට දර්ශනපති හා දර්ශන විශාරද උපාධිය දක්වා අධ්‍යයන කටයුතු සිදු කිරීමට පහසුකම් සලසා ඇත. අ.පො.ස.(උ.පෙ.) විභාගයේ දී ඕනෑ ම කලා විෂයයක් හැදෑරූ ශිෂ්‍යයෙකුට මෙම විෂය හැදෑරිය හැකි ය. මෙම විෂයය යටතේ භාරතීය සංස්කෘතික පසුබිම, බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම, මූලාශ්‍රය අධ්‍යයනය, බෞද්ධ කලා හා පුරාවස්තු, සමාජ සංස්ථා හා චින්තනය, පුද-පූජා හා චාරිත්‍ර, ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය, බුදු සමයේ ජාත්‍යන්තර ව්‍යාප්තිය හා ප්‍රවණතා, මහායාන බුදුසමය, තුලනාත්මක ආගම් අධ්‍යයනය ප්‍රධාන වශයෙන් සිදු වේ. මෙයට අමතර ව ශ්‍රී ලාංකේය සංස්කෘතිය, නූතන අධ්‍යයන විෂයයන් හා ප්‍රවණතාවන්ට අනුගත වෙමින් එම ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය පුළුල් කරලීම සඳහා කළමනාකරණය, උපදේශනය, පාරිසරික ආචාර ධර්ම, බෞද්ධ කලාව, ආයුර්වේදය, ජ්‍යොතිෂය ආදිය පිළිබඳ බෞද්ධ සංකල්ප හඳුන්වා දීමට අතිරේක පාඨමාලාවන් ඉදිරිපත් කොට තිබේ. මෙම විෂය ඒකකයන් පූර්ව අවශ්‍යතාවයකින් තොර ව ඕනෑ ම විෂයයක් හදාරන විද්‍යාර්ථියකුට අධ්‍යයනය කළ හැකි වේ. තව ද බුදුසමය පිළිබඳ වර්තමානයේ වැඩිවෙමින් පවතින ජාතික හා ජාත්‍යන්තර දැනුම් අවශ්‍යතාවන්ට සරිලන සේ සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍යයන් දෙකෙන් ම මෙම විෂයය අධ්‍යයනයට පහසුකම් සලසා තිබේ.

**බෞද්ධ මනෝවිද්‍යාව**

මනෝවිද්‍යාව වනාහි දර්ශනයෙහි එක් සුවිශේෂ පැතිකඩකි. එය මනස පිළිබඳ අධ්‍යයනය කරනු ලබන විද්‍යාත්මක විෂය පථය ද වේ. කෙටියෙන් කිවහොත් නූතන මනෝවිද්‍යාවෙහි මූලික අරමුණ වන්නේ සමාජගත පුද්ගලයාගේ සාර්ථකත්වයට මෙන් ම එදිනෙදා ජීවිතයේ පැනනගින්නා වූ ගැටලුවලට වඩාත් සාර්ථක මනෝවිද්‍යාත්මක මග පෙන්වීමක් ලබාදීමයි. වර්තමානය වන විට මානව සමාජයේ ඇති වූ සංකීර්ණතාවලට අනුකූලව මෙම විෂය ක්ෂේත්‍රය විවිධ උපශාඛා ඔස්සේ සංවර්ධනයට පත්ව ඇත. නිදසුන් වශයෙන් උපදේශන මනෝවිද්‍යාව, සායනික මනෝවිද්‍යාව, ළමා මනෝවිද්‍යාව, අධ්‍යාපන මනෝවිද්‍යාව, පාසැල් මනෝවිද්‍යාව, සංවර්ධන මනෝවිද්‍යාව, අසාමාන්‍ය මනෝවිද්‍යාව ආදිය දැක්විය හැකිය.

මිනිස් ජීවිතයේ සෑම අංශයක් ම ආවරණය වන, ඉතා ගැඹුරු මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයක් සහිත සුවිශේෂ ඉගැන්වීමක් වශයෙන් බුද්ධ දේශනාව හඳුන්වාදිය හැකි ය. බුදුසමය මිනිස් ක්‍රියාකාරකම් විෂයෙහි මනසෙහි ප්‍රමුඛතාව අවධාරණය කරයි. මෙම සුවිශේෂී ලක්ෂණය නිසාම වර්තමාන විද්වත්හු බුදුසමය මනෝවිද්‍යාවක් වශයෙන් පිළිගැනීමට වඩාත් රුචිකත්වයක් දක්වති. බෞද්ධ මනෝවිද්‍යාවෙහි මූලික අරමුණ වන්නේ මිනිස් ගැටලුවල මූලික හේතුසාධක සහ මූලාරම්භයන් ගැඹුරින් විස්තර කිරීමයි. එමගින් පුද්ගලයාට ස්වකීය ජීවිතාභිවෘද්ධිය ඇති කර ගත හැකිය. ඒ අනුව බෞද්ධ මනෝවිද්‍යාව යනු මානසික සංවර්ධනය හරහා පුද්ගල සංවර්ධනය ඇති කිරීම අරමුණු කොටගත් විෂයපථයකි. කෙසේ වෙතත් වර්තමානය වන විට බුදුසමයෙහි නිරූපනය වන මෙම මනෝවිද්‍යාත්මක හරය ප්‍රායෝගිකකරණය කිරීමේ ශාස්ත්‍රීය ව්‍යායාමයන්හි අඩුවක් දැකිය හැකිය.

කැලණිය විශ්වවිද්‍යාලයීය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය මෙම ශාස්ත්‍රීය හිඩැස පිරවීමේ අරමුණින් බෞද්ධ මනෝවිද්‍යාව නම් වූ සුවිශේෂ විෂයය, විද්‍යාර්ථීන් වෙත ප්‍රදානය කිරීමට කටයුතු කොට ඇත. සාමාන්‍ය උපාධිය හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන්ට සිය උපාධියේ එක් විෂයයක් වශයෙන් මෙය තෝරා ගත හැකි අතර විශේෂ උපාධිය හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන්ට ද

ස්වකීය උපාධිය සඳහා මෙම විෂයය තෝරා ගත හැකි ය. සමස්තයක් වශයෙන් මෙම නව විෂයයෙන් බෞද්ධ මනෝවිද්‍යාවේ මූලික සිද්ධාන්ත, සංජානනය පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාව, මනෝරෝග පිළිබඳ බෞද්ධ විග්‍රහය, බෞද්ධ මනෝප්‍රතිකාර, මරණය පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාව, බෞද්ධ ආතති කළමනාකරණය, බෞද්ධ උපදේශන මනෝවිද්‍යාව, මානව ශක්‍යතා වර්ධනය සඳහා බෞද්ධ භාවනාව ආදිය අන්තර්ගත වේ. මෙම විෂයය ද සිංහල හා ඉංග්‍රීසි යන භාෂාද්වයෙන් ම හැදෑරීමේ අවස්ථාව විද්‍යාර්ථීන් හට හිමි වේ. එම නිසා බෞද්ධ මනෝවිද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන විද්‍යාර්ථීයාට ස්වකීය උපාධිය සඳහා සාමාජීය මෙන් ම වෘත්තීමය වටිනාකමක් ඇති විෂයයක් ස්ථාපනය කිරීම පිළිබඳ ආහ්ලාදයට පත් වන අතර මෙය ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ ප්‍රථමයෙන් ම ස්ථාපනය කරන ලද බෞද්ධ මනෝවිද්‍යා උපාධි පාඨමාලාව වශයෙන් ද හඳුන්වාදිය හැකි ය.

දුරකථන අංකය - 011-2914492
විද්‍යුත් ලිපිනය - pbs@kln.ac.lk

## 7.9 සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය කේ.බී. ජයවර්ධන මයා - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.A. (Kel'ya), M.A., Ph.D. (BHU, India), Dip. In Yoga, Advance Dip. In Hindi,*
*PG Dip. In Agama Tantra (BHU, India)*
මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A., M.A. (Kel'ya), Ph.D. (Pune, India), Royal Pandith (OSS)*
පූජ්‍ය ඇඹෝගම විමලඤාණ හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A., MPhil (Kel'ya), PG Dip. In Edu. (NIE), Royal Pandith (OSS)*
පූජ්‍ය වලපනේ ඤාණසේන හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I - (අධ්‍යයන නිවාඩු)
*B.A., MPhil (Kel'ya) M.A. (B&PU), PG Dip. In Edu. (C'bo), Royal Pandith (OSS)*
පූජ්‍ය උඩවෙල රේවත හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A., MA, MPhil Dip. In Korean (Kel'ya), Royal Pandith (OSS)*
පූජ්‍ය දේවගොඩ පියරතන හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A., MPhil (Kel'ya), M.A. (B&PU) PG Dip. In Edu. (C'bo), Dip. In Tamil. (Kel'ya) Royal Pandith (OSS)*

සංස්කෘත අධ්‍යයනාංශය ලෙස පැවති මෙම අධ්‍යයනාංශය කැලණිය විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ නිර්දේශයට අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අංක 2069/16 දරන ගැසට් පත්‍රය මගින් 2015/2016 අධ්‍යයන වර්ෂයේ සිට සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

සංස්කෘත භාෂාව බොහෝ දුරට පිරිවෙනට සීමා වී ඇති බවක් දක්නට ලැබේ. ඒ නිසා බොහෝ දෙනෙක් එය භික්ෂූන් වහන්සේ විසින් පමණක් අධ්‍යයනය කළ යුතු ආගමික භාෂාවකැයි විශ්වාස කරති. ගිහි ශිෂ්‍ය ප්‍රජාව සංස්කෘත අධ්‍යයනයෙන් බැහැර වීමට මෙය හේතුවකැයි සිතේ. එය එසේ නොවේ. එක දෙයකට, එක පළාතකට, එක කොටසකට සීමාවක් නොවන සංස්කෘත භාෂාව ලොව පුරා විවිධ විෂය ක්ෂේත්‍ර කෙරෙහි ඍජු ව ම බලපෑම් කරනු දැකිය හැකි ය.

සිංහල, පාලි, හින්දී වැනි භාෂාධ්‍යයනයෙහි නියැලි විද්‍යාර්ථියෙකු සංස්කෘත නොදනිත් නම් පත්වෙන අපහසුතාව පැහැදිලි කළ නොහැකි තරම් ය. ඉතිහාසය, පුරාවිද්‍යාව, ගණිතශාස්ත්‍රය, ආර්ථික විද්‍යාව, ආකාශ විද්‍යාව, කළමනාකරණය, සංගීතය හා ලලිත කලා වැනි විෂයයන් කෙරෙහි සංස්කෘත භාෂාව දුන් දායකත්වය කෙතරම් ද යත් ඒ ඒ විෂය ක්ෂේත්‍රය සතු පාරිභාෂික ශබ්ද මාලාව ම දෘෂ්ටාන්ත කළ හැකි ය. යම් සාහිත්‍යයික විෂයක් සංස්කෘතයෙන් ආලෝකය නොලබයි නම් එය සාහිත්‍යයක් ලෙස හැඳින්වීම කෙතරම් උගහට ද යනු තීරණය කිරීම ප්‍රාඥයින්ගේ ම කර්තව්‍යයෙකි.

සංස්කෘතය හා බැඳුණු විෂයධාරා රාශියකි. වාස්තුවිද්‍යාව, යෝගශාස්ත්‍රය, ජ්‍යොතීර් ශාස්ත්‍රය, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව, හින්දු දර්ශනය සංස්කෘත (මහායාන) බෞද්ධ දර්ශනය ඒ අතර කිහිපයකි. අධ්‍යයනාංශයේ නාමය පුළුල් කිරීමේ අරමුණ ද මෙබඳු විෂය රාශියක් ග්‍රහණය කර ගැනීම යි. මෙසේ විෂයධාරා රාශියක් ග්‍රහණය කර ගන්නා සංස්කෘතය අධිකාරී විෂයකි. එය හදාරන විද්‍යාර්ථියෙකු වෙතොත් ඔහු හෝ ඇය ක්ෂේත්‍ර ගණනාවකින් සිය අනාගතය කල එළි කර ගනියි.

අධ්‍යයනාංශයේ වපසරිය පුළුල් වීමත් සමග ම පහත සඳහන් පරිදි ගෞරව ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා ප්‍රදානය කරනු ලැබේ.

1. සංස්කෘත ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව

2. වාස්තුශාස්ත්‍ර ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව

ඉහත සඳහන් උපාධි පාඨමාලා සඳහා පූර්ව අවශ්‍යතා කිසිවක් අපේක්ෂා නොකෙරේ. ගෞරව උපාධිය හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලයේ වෙනත් ගෞරව උපාධි හැදෑරීමට අදාළ නිර්ණායක ප්‍රථම වර්ෂය තුළ විද්‍යාර්ථීන් විසින් සපුරා ගත යුතු ය. ශාස්ත්‍රවේදී උපාධිය හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන්ට සංස්කෘත හා වාස්තුශාස්ත්‍ර යන විෂයන් තෝරාගත හැකි අතර සෑම විෂය නිර්දේශයක් ම මුල සිට ඉතා සරල ව සකස් කොට තිබේ. හින්දු දර්ශනය ශාස්ත්‍රවේදී උපාධියේ විෂයයන් වශයෙන් ඉදිරියේ දි හඳුන්වා දීමට නියමිතය.

විශ්වවිද්‍යාල ප්‍රවේශය ලත් කවර හෝ විද්‍යාර්ථියෙකු සංස්කෘත විෂය තෝරා ගනු ලබන්නේ නම් ඔවුහු සංස්කෘත භාෂාවත් ඒ හා බැඳුණු ව්‍යාකරණය, සාහිත්‍ය, නාට්‍ය කලාව, විචාර සිද්ධාන්ත, දර්ශනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ පුළුල් දැනුම් සම්භාරයක් උරුම කර ගනිති. දේශීය වාස්තු හඳුන්වා දීමේ අරමුණ ඇති ව සම්පාදිත විෂය නිර්දේශයක් වන වාස්තුශාස්ත්‍රය/ශාස්ත්‍ර උපාධිය හදාරන විද්‍යාර්ථීන් පැරණි දේශීය වාස්තු ශාස්ත්‍රය, නූතන වාස්තු මෙන් ම AutoCAD වැනි නවීන තාක්ෂණික ඥානය ද සහිත දේශීය වාස්තුශාස්ත්‍රඥයෙකු බවට පත් වනු ඇත.

වෙනත් කවර වුව ද විෂය ධාරාවක් හදාරන අභ්‍යන්තර විද්‍යාර්ථීන් උදෙසා සංස්කෘත සහතික පත්‍ර හා සංස්කෘත උසස් සහතික පත්‍ර පාඨමාලාවක් මෙම අධ්‍යයනාංශය මගින් පවත්වනු ලැබේ. මෙය උපාධි පාඨමාලාවට අයත් නොවන අතර අතිරේක සුදුසුකමකි.

බාහිර උපාධිය සඳහා සංස්කෘත විෂය හදෑරීමට ඉඩකඩ සලසා තිබෙන අතර, බාහිර ඕනෑ ම අයෙකුට හැදෑරිය හැකි වාස්තුශාස්ත්‍ර හා ජ්‍යොතීර් විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා හා යෝග දර්ශනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාවක් ද පැවැත් වේ. සංස්කෘත භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ද පැවැත්වේ.

සංස්කෘත විෂය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව නුදුරු දිනයක දී හඳුන්වා දීමට නියමිත වන අතර පෙර සඳහන් සහතික පත්‍ර පාඨමාලාවන්හි ඩිප්ලෝමා පාඨමාලා ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට වැඩ කටයුතු සලසා තිබේ.

අධ්‍යනාංශයේ විද්‍යාර්ථීන්ගේ සංප්‍රාශා විද්‍යාර්ථී පර්ෂද් මගින් වාර්ෂික ව එළි දක්වෙන සාධනා සඟරාව සිසුන්ගේ පර්යේෂණ කුසලතා වර්ධනය කර ගැනීමට ඉඩ සලසා ඇති අතර අධ්‍යයනාංශය මගින් වාර්ෂික ව සංවිධානය කරන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව බොහෝ දෙනෙකුගේ පර්යේෂණ සඳහා ඉමහත් ශක්තියකි.

සංස්කෘත හෝ වෙනත් පෙරදිග විෂය ක්ෂේත්‍රයක් ඔස්සේ දර්ශනපති, දර්ශනශූරී වැනි උපාධි සඳහා අධ්‍යයනයේ (පර්යේෂණයන්හි) නියැලෙන විද්‍යාර්ථීන් සඳහා පහසුකම් අධ්‍යයනාංශය සතු වේ.

ඔබට සංස්කෘත, වාස්තුශාස්ත්‍රය හැදෑරීමට අප අධ්‍යයනාංශය සමග එකතු වන්නට ආරාධනා කර සිටිමු.

දුරකථන අංකය - 0112987101

## 7.10 සිංහල අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය එච්.ඒ.ඒ. ස්වර්ණා ඉහළගම මිය - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.A, M.Phil. (Kel'ya), Ph.D. (Wuhan, China)*
මහාචාර්ය එම්.ඒ. නිමල් කරුණාරත්න මයා - විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (BPU), M.Phil. (Kel'ya), M.A., Ph.D., Dip. in Japanese (Hitotsubashi, Japan)*
මහාචාර්ය යූ.ජී. හර්සන් ඩයස් මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A., M.A., Ph.D. (Kel'ya)*
මහාචාර්ය එච්.ඩබ්ලිව්.බී.අයි. සම්පත් මයා - මහාචාර්ය
*B.A. (S.J'pura), M.Phil. (Ruhuna), Ph.D. (BPU)*
මහාචාර්ය අනුරින් ඉන්දිකා දිවාකර මිය - මහාචාර්ය
*B.A., M.A., M.Phil. (Kel'ya), Ph.D. (C'bo)*
මහාචාර්ය පූජ්‍ය මල්වානේ චන්දරතන හිමි - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.A. M.Phil. (Kel'ya), Ph.D. (Pune India)*
මහාචාර්ය කුසුම් හේරත් මිය - මහාචාර්ය
*B.A., M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya)*
එස්.බී. අනුරුද්ධිකා කුමාරි කුලරත්න මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A., M.Phil. (Kel'ya)*
ආචාර්ය බී.කේ.සී. අංජලී වික්‍රමසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A., M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya)*
එම්.බී. බුද්ධික ජයසුන්දර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A., M.Phil. (Kel'ya)*
ඊ.එම්.එන්. පුෂ්පකුමාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A., M.A. (Perad'ya), M.Phil. (Kel'ya)*
චින්තක රණසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (C'bo), M.A. (Kel'ya)*
ජී.ඒ. මදාරා කරුණාරත්න මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A.(Kel'ya), M.Phil. (Kel'ya)*
පී.ඩබ්. චින්තා පවිත්‍රානි මිය - කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
බී.ඒ. නිපුණ හේමින්ද බස්නායක මයා - කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)
*B.A. (Kel'ya), M.A. (Kel'ya), P.G.D. (J'pura)*
කේ. කිත්මි පෙරේරා මිය - කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)
*B.A. (Kel'ya), M.A. (Kel'ya)*
ජේ.ඒ.ඩී. සුදේශ් කවීශ්වර මයා - කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)
*B.A. (Kel'ya), M.A. (Kel'ya)*

කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය මඟින් **සිංහල සහ සාහිත්‍ය විචාරය** යන විෂයයන් දෙකක් යටතේ ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලබන අතර **මෙම විෂයයන් හැදෑරීම සඳහා අ.පො.ස. (උ.පෙ.) සඳහා සිංහල විෂය හදාරා තිබීම අවශ්‍ය නොවේ.** මීට අමතර ව ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශන විශාරද යන පශ්චාද් උපාධිවලට අදාළ පාඨමාලා හැදෑරීමට සහ පර්යේෂණ කරගෙන යෑමට ද අවශ්‍ය පහසුකම් සැපයේ. තව ද විදේශීය ශිෂ්‍යයන් සඳහා එක් අවුරුදු සහ සමාසික සිංහල සහතික පත්‍ර පාඨමාලාවන් දෙකක් ද ක්‍රියාත්මක කරනු ලබයි. මීට අමතර ව සිංහල නොවන ශ්‍රී ලාංකිකයන් සඳහා ද එක් අවුරුදු සිංහල ඩිප්ලෝමා පාඨමාලාවක් ද පැවැත්වේ.

ශාස්ත්‍රවේදී හා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා, සිංහල භාෂාව හා ව්‍යාකරණය, ශිලා ලිපි හා පුරාක්ෂර විද්‍යාව, සම්භාව්‍ය ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය, ඡන්දස් අලංකාර, සිංහල සංස්කෘතිය

ජනශ්‍රැතිය හා ශිල්ප කලා, සිංහල කෙටිකතා, නවකතා, නූතන සිංහල පද්‍ය කාව්‍ය, සිංහල නාට්‍ය හා සිනමාව යන විෂය ක්ෂේත්‍රවලට අදාළ ව සකස් කරනු ලැබ ඇත. මීට අමතර ව පෙර'පර දෙදිග සාහිත්‍ය විචාරය අධ්‍යයනය කරලීමට අවස්ථාව ලබාදෙමින් සාහිත්‍ය විචාරය (Literary Criticism) පිළිබඳ ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා ද හඳුන්වා දී ඇත. ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම වර්ෂයේ වර්ෂාවසාන පරීක්ෂණයෙන් ලබා ගන්නා ඉහළ ලකුණු පදනම් කොට ගෙන සිංහල සහ සාහිත්‍ය විචාරය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා සඳහා විද්‍යාර්ථීහු බඳවා ගනු ලැබෙත්.

වර්තමානයෙහි පොදුවේ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ සිංහල දැනුම පිළිබඳ ගැටලු පැනනැඟී ඇති බවක් පෙනේ. විශේෂයෙන් අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අනතුරුව සිංහල භාෂා අධ්‍යයනයක් නොලද විද්‍යාර්ථීන් තම දැනුම සිංහල භාෂාවෙන් ප්‍රකට කිරීමට යාමේ දී මුහුණ පාන ගැටලු පිළිබඳ ව සලකා බලා අප අධ්‍යයන අංශය මගින් සිංහල නොහැදෑරූ විද්‍යාර්ථීන්ට ද සිංහල විෂය හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත. විද්‍යා, වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨවලට අයත් සිංහල හැදෑරීමට රුචිකත්වයක් දක්වන ඕනෑම විද්‍යාර්ථියෙකුට මේ පාඨමාලාවේ **ආධාරක ඒකක** (ප්‍රායෝගික සිංහල) හැදෑරීම සඳහා ඉල්ලුම් කළ හැකි ය.

මීට අමතර ව නූතන භාෂා සහතික පත්‍ර පාඨමාලා යටතේ **මව්බස සිංහල නොවන විද්‍යාර්ථීන් සඳහා සිංහල සහතික පත්‍ර පාඨමාලාවක්** ද ආරම්භ කර ඇත. විශේෂයෙන් ම දෙමළ හා මුස්ලිම් සිසුන්ගේ සිංහල භාෂා සන්නිවේදන අවශ්‍යතාව සපුරාලීම මෙම පාඨමාලාවේ අරමුණ යි. මෙම පාඨමාලාව සඳහා සිංහල විෂය පිළිබඳ පූර්ව දැනුමක් අපේක්ෂා නොකෙරේ.

දුරකථන අංකය - 011 2914493
අභ්‍යන්තර අංක - 680, 682
විද්‍යුත් ලිපිනය - sinhala@kln.ac.lk

## 7.11 බටහිර සම්භාව්‍ය සංස්කෘති හා ක්‍රිස්තියානි සංස්කෘති අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය ඩබ්ලිව්.පී. රොෂාන් ප්‍රනාන්දු පියතුමා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.Ph. (Rome), B.Th. (Rome), M.A. (K.U.Leuven, Belgium), S.T.L. (Belgium), Ph.D. (Belgium)*
මහාචාර්ය ෂර්ලි ලාල් විජේසිංහ මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*Dip. Phil. (Colombo), B.Th. (Rome), S.S.L. (Rome),*
*Ph.D. (Louvain-la-Neuve, Belgium), Elēre titulaire (Jerusalem)*
මහාචාර්ය ඉන්දිරා කමනී ජයසේකර මිය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya) Ph.D. (Kel'ya)*
ඊශා ගම්ලත් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
විජිත් රොහාන් ප්‍රනාන්දු මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Ph. (Rome), B.Th. (Rome), M.Phil. (Kel'ya), M.Phil (K.U.Leuven, Belgium) S.T.L.I. (Belgium)*
ඩබ්ලිව්.වී. ක්‍රිෂානී ප්‍රබෝධා පෙරේරා - කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)
*B.A., M.A., M.Phil. (Kel'ya)*

ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා දෙකක් මෙම අධ්‍යයනාංශයෙන් ඉදිරිපත් කෙරේ. එනම්, බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හෙවත් ග්‍රීක-රෝම සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතියයි. **ශාස්ත්‍රවේදී උපාධිය සඳහා මෙම විෂයයන් තෝරා ගැනීමට ඉහත විෂයයන් දෙකෙන් එකක්වත් කලින් හදාරා තිබීම අවශ්‍ය නැත.** මෙම උපාධි පාඨමාලා සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට හැකි ය.

**බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හෙවත් ග්‍රීක-රෝම සංස්කෘතිය**
බටහිර ශිෂ්ටාචාරයේ මුල් බිම වූ ග්‍රීසියෙහි හා රෝමයෙහි සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනයකි. මෙම විෂය යටතේ, ග්‍රීක සහ රෝම සාහිත්‍යය, සාහිත්‍ය විචාරය, නාට්‍ය කලාව, රංග පීඨය, කාව්‍ය හා මහාකාව්‍ය යනාදිය ද ඉපැරණි ග්‍රීසියෙහි වූ ශිෂ්ටාචාර, පුරාවස්තු හා කලාවන් ද හැදෑරීමට අවස්ථාව සලසා ඇත. ග්‍රීක දර්ශනය, ග්‍රීක සහ රෝම ආගම, ග්‍රීක චින්තනය ආදි විෂයයන් ද මේ පාඨමාලාවට අයත් වෙයි. මෙම විෂය ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙන් ම සිංහල මාධ්‍යයෙන් ද හැදෑරිය හැකි ය.

**ක්‍රිස්තියානි සංස්කෘතිය**
ක්‍රිස්තියානි සංස්කෘතිය විද්‍යාත්මක විග්‍රහයකට භාජන කිරීම මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණකි. විවිධ ක්‍රිස්තියානි නිකායන්ට අයත් ක්‍රිස්තු භක්තිකයන්ට ක්‍රිස්තියානිය පිළිබඳ විද්‍යාත්මක දැක්මකට පිවිසීමට රුකුලක් වන මෙම අධ්‍යයනය ඕනෑ ම ආගමික හෝ මතවාදී හෝ පසුබිමකට අයත් විද්‍යාර්ථීන්ට සමයාන්තර සහ සමය දාර්ශනික දැනුම ප්‍රගුණ කර ගැනීමට ඉවහල් වේ. ඉංග්‍රීසි, ප්‍රංශ, ඉතාලි, ස්පාඤ්ඤ, රුසියන් සහ ජර්මන් භාෂා ක්‍රිස්තියානි සංස්කෘතියට සම්බන්ධ ව විකාසය වී ඇති බැවින් එම විෂයයන් හදාරන විද්‍යාර්ථීන්ට ද ක්‍රිස්තියානි සංස්කෘතිය විෂය හැදෑරීම ප්‍රයෝජනවත් විය හැකි ය. ක්‍රිස්තියානි ලියවිලි විග්‍රහය, දාර්ශනික චින්තනය, මූලධර්ම, ශාඛා, සාහිත්‍යය, කලාව සහ ඉතිහාසය මෙන් ම බයිබලය පිළිබඳ ඓතිහාසික විග්‍රහය ද මෙම අධ්‍යයනයට අයත් වේ.

විශේෂ ප්‍රවේශයෙන් ක්‍රිස්තියානි සංස්කෘතිය හැදෑරීමට විශ්වවිද්‍යාලයට ඇතුළත් කරගනු ලබන්නේ එම විෂය ප්‍රගුණ කරලීම අරභයාය. එබැවින් ක්‍රිස්තියානි සංස්කෘතිය ගෞරව උපාධිය හැදෑරීම එම විද්‍යාර්ථීන්ගෙන් අපේක්ෂා කෙරේ.

ක්‍රිස්තියානි සංස්කෘතිය ගෞරව උපාධි පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන්ට පරිගණක හා තාක්ෂණවේදය පීඨයෙන් ලබා දෙන අධ්‍යයන සම්භාර 18ක් ද හැදෑරීමට අවකාශය ලැබේ.

දුරකථන අංකය - 0112903690, 0112903717
අභ්‍යන්තර අංකය - 690 ,717

## 7.12 අධ්‍යාපන ඒකකය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය ආර්.එම්.එස්. ප්‍රියදර්ශනී මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II **(ඒකක ප්‍රධාන)**
*B.A. (Kel'ya), M.ed. Ph.D. (Hiroshima University, Japan)*

නූතන අධ්‍යාපන ක්ෂේත්‍රය හා සම්බන්ධ සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් උදෙසා මෙරට උසස් අධ්‍යාපන ආයතන කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වන පාඨමාලා අතර **අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවට** ප්‍රමුඛස්ථානයක් ලැබේ. අධ්‍යාපන විෂය හා සම්බන්ධ න්‍යායාත්මක දැනුම සම්ප්‍රේෂණය කිරීම මගින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පර්යේෂණ වැඩි දියුණු කිරීම හා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නංවාලීමට මෙමඟින් අවකාශ සැලසේ. අධ්‍යාපනික වගකීම් හා අභියෝග හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීමටත් ශිල්පීය කුසලතා සහිත විශේෂඥ ව්‍යවසායකයින් සමාජයට දායාද කිරීමටත් අධ්‍යාපන විෂය පිළිබඳ අධ්‍යාපනය බෙහෙවින් උපකාර වේ.

අධ්‍යාපනය සමස්තයක් ලෙස පුද්ගලයා තුළ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ විධිමත් ක්‍රියාවලියක් ලෙස අර්ථ ගැන්විය හැකි ය. එසේ ම එය ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම, රසවිඳීම හා පුහුණුව සඳහා අදාළ ක්‍රමවේද ද සන්නිවේදනය කරනු ලැබේ. භෞතික පරිසරය ශීඝ්‍රයෙන් සංවර්ධනය වීමත් සමඟ අධ්‍යාපනය ද ඊට සරිලන අයුරින් සංවර්ධනය වීම අවශ්‍ය වන්නේ ය. එය තිරසර සංවර්ධනයට ද සෘජු ව ම සම්බන්ධ වූ සාධයකි. අධ්‍යාපන ක්‍රමවේද 21 වැනි සියවසට අදාළව හැඩගැස්වීමේදී එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම පිණිස ලංකාවේ විශ්වවිද්‍යාල ආයතනයන්ගෙන් සුවිශේෂ කාර්යභාරයක් ඉටුවේ.

විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් අධ්‍යාපන විෂය හැදෑරීමට මීට පෙර කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ට අවස්ථාවක් නොවීය. මෙම අවශ්‍යතාව හඳුනාගත් කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨය, **අධ්‍යාපන ඒකකයක්** ස්ථාපිත කොට විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන අභ්‍යන්තර සිසුන් සඳහා **අධ්‍යාපනය** නමින් විෂයයක් අධ්‍යයනය කිරීමට අවකාශ ලබා දෙමින් 2020 වර්ෂයේ සිට ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවට අදාළ විෂයයන්ගෙන් එක් විෂයයක් ලෙස තෝරා ගැනීමට අවසර ලබා දී තිබේ.

2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා සිසු සිසුවියන් විශාල පිරිසක්, විෂයයක් ලෙස අධ්‍යාපන විෂය හැදෑරීමට ලියාපදිංචි වීමෙන් පැහැදිලි වන්නේ මෙම අභිනව විෂය වැඩි දෙනකුගේ සැලකිල්ලට භාජන වී ඇති බවයි. තව ද අධ්‍යාපනවේදී ගෞරව උපාධිය (BEd Hons) ආරම්භ කිරීමට මූලික සැලසුම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් අනුමැතිය ලද වහාම එම පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු සූදානම් කොට ඇත.

## 7.13 ආයතනික පුහුණුව හා ශක්‍යතා සංවර්ධන අධ්‍යයන ඒකකය

**ඒකක ප්‍රධාන**
ආචාර්ය අමිල කළුආරච්චි මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II (ඒකක ප්‍රධාන)
*B.A. (USJP), M.A. (BPU), Ph.D. (USJP) Dip in Psychology & Counseling (SMHF)*

කලා විෂය ධාරාව ඔස්සේ කැලණිය විශ්වවිද්‍යාලයට උපාධිය හැදෑරීමට ප්‍රවේශය ලබන විද්‍යාර්ථීන් හට අධ්‍යයන කාලසීමාවෙන් පසු උපාධිධරයකු වශයෙන් මුහුණ දීමට සිදුවන සංකීර්ණ අභියෝග ජය ගැනීමට හැකි වන පරිදි විධිමත් පෞරුෂයක් නිර්මාණය කිරීමේ අභිලාෂයෙන් උක්ත අධ්‍යයන ඒකකය පිහිටුවා ඇති බව සතුටින් සඳහන් කරනු කැමැත්තෙමි.

ආයතනික පුහුණුව හා ශක්‍යතා සංවර්ධන අධ්‍යයන ඒකකය කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨයෙහි ස්ථාපනය කරනු ලබන්නේ 2019 වසරේ දී ය. ඒ ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වූ AHEAD ව්‍යාපෘති යෝජනාවේ සංකල්පයකට අනුවයි. මෙම අධ්‍යයන ඒකකය පිහුටවීමේ මූලික අරමුණ වූයේ විද්‍යාර්ථීන්ගේ රැකියා නියුක්තිය ඉහළ නැංවීම හා එයට අදාළ අනුසාංගික ශක්‍යතා සංවර්ධනය කිරීමයි.
එහිදී,

- උපාධිය හදාරණ කාලසීමාව තුළ ම තමන් හදාරනු ලබන විෂය ක්ෂේත්‍රය ඔස්සේ හෝ ඉන් පරිබාහිරව වුවද රැකියා නියුක්තියට අදාළ ව ප්‍රාමාණික ආයතනික පුහුණුවක් සඳහා විද්‍යාර්ථීන් යොමු කරවීම.
- ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සමග සම්බන්ධ වී ආයතනික පරිපාලන ව්‍යුහය හා කළමනාකරණය, ආයතනික නීතිරීති හා ආචාරධර්මවල ක්‍රියාකාරීත්වය සහ වැඩපරිසරයක ස්වභාවය ආදි කරුණු පිළිබඳ වෘත්තීය නිපුණතාව ලබා ගැනීම සඳහා විද්‍යාර්ථීන්ට අවස්ථාව සලසා දීම.
- රැකියා නියුක්තිය විෂයෙහි සංවර්ධිත පෞරුෂයක් ගොඩනගා ගැනීමට උපකාර වන සේවාවන් හා අවස්ථාවන් පුලුල් කිරීම.
- සිංහල, ඉංග්‍රිසි හා දෙමළ යන භාෂා ත්‍රිත්වය කාර්යාලයීය කටයුතු සඳහා මෙහෙයවීමේ හැකියාව විද්‍යාර්ථීන් තුළ වර්ධනය කිරීම.
- වර්තමානයේ දී වෘත්තීය නිපුණතාවට අදාළව සුවිශේෂ අවශ්‍යතාවක් ව පවත්නා තොරතුරු තාක්‍ෂණය හා පරිගණක සාක්‍ෂරතාව පිළිබඳ පරිචය විද්‍යාර්ථීන් තුළ වැඩිදියුණු කිරීම.
- නායකත්ව ගුණාංග වර්ධනය කරගැනීමට හා කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට (Team Work) අදාළ නිපුණතාව මෙන් ම තීරණ ගැනීම, සංවිධානය කිරීම හා කිසියම් කාර්යයක් මනාව සිදු කිරීමට අදාළ ශක්‍යතාව විද්‍යාර්ථීන් තුළ ප්‍රවර්ධනය කිරීම.
- විවිධ භාෂා, සංස්කෘතීන් හා ජීවන ශෛලීන්හි සංකලනයෙන් ගොඩනැගී ඇති ශ්‍රී ලාංකික සමාජය තුළ අනෙකාට ගරුකරමින් හා අනෙකාගේ අයිතීන් උල්ලංඝණය නොවන අයුරින් කටයුතු කිරීමේ හැකියාව වර්ධනය කිරීම.
- ඕනෑ ම වැඩ පරිසරයකට අනුගතවීමේ හැකියාව දියුණු කිරීම හා පුරවැසි වගකීම මෙන් ම වගවීම පිළිබඳ සංවේදීතාවක් විද්‍යාර්ථීන් තුළ ගොඩනැගීම.
- විෂයානුබද්ධ දැනුමට අමතර ව විද්‍යාර්ථීන් තුළ පැවතිය යුතු ඉදිරිපත්වීමේ හා ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම මෙන් ම කාර්යාලයීය කටයුතුවලදී අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු මූලික සංඛ්‍යානමය හා විශ්ලේෂණාත්මක දැනුම වර්ධනය කිරීම.

ආදි අරමුණු සුවිශේෂ වේ. උක්ත අරමුණු සාධනය කරගැනීම සඳහා මේ වන විට ආයතනික පුහුණුව හා ශක්‍යතා සංවර්ධන අධ්‍යයන ඒකකය අධ්‍යයන සම්භාර 12 ක් ආවරණය වන පරිදි **වෘත්තීය අභිමුඛ විෂය ඒකක 08 ක්** පමණ හඳුන්වා දී ඇත. මෙම විෂය ඒකක උපාධි පාඨමාලාවේ අත්‍යවශ්‍ය අංග ලෙස සම්පූර්ණ කිරීමට අවස්ථාව සලසා දී තිබීම මගින් තම උපාධි සහතිකයට ද නව අගයක් එක්කොට ගැනීමට ලැබීම විද්‍යාර්ථීන් වශයෙන් ඔබ ලද භාග්‍යයක් ලෙස ද සඳහන් කළ හැකිය.

# සමාජීය විද්‍යා පීඨය



# සමාජීය විද්‍යා පීඨය

## පීඨාධිපති, අධ්‍යයනාංශ ප්‍රධානීන් සහ පරිපාලන නිලධාරී



මහාචාර්ය එම්.එම්. ගුණතිලක මයා
පීඨාධිපති, සමාජීය විද්‍යා පීඨය



ආචාර්ය එච්.පී.පී. ශ්‍රියාණි මිය
අංශ ප්‍රධාන
පුරාවිද්‍යා අධ්‍යයනාංශය



මහාචාර්ය ඩබ්.එම්. සේමසිංහ මයා
අංශ ප්‍රධාන
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය



මහාචාර්ය ආර්.කේ. ලාල් මර්වින් ධර්මසිරි මයා
අංශ ප්‍රධාන
භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය



මහාචාර්ය ඩී.ටී. කොග්ගලගේ මෙය
අංශ ප්‍රධාන
ඉතිහාස අධ්‍යයනාංශය



මහාචාර්ය චාමින්ද අබේසිංහ මයා
අංශ ප්‍රධාන
ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශය



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්ලිව්.කේ.එම්.එම්.කේ. වීරසිංහ මයා
අංශ ප්‍රධාන
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී.ඩබ්ලිව්. රූපසිංහ මයා
අංශ ප්‍රධාන
ජනසන්නිවේදන අධ්‍යයනාංශය



ආචාර්ය මනෝජි හරිස්චන්ද්‍ර මිය
අංශ ප්‍රධාන
දර්ශන අධ්‍යයනාංශය



මහාචාර්ය ටී. ඩබ්ලිව්. කේ. ඔසන්ත එන්. තල්පාවිල මයා
අංශ ප්‍රධාන
දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය



එල්. ඩබ්ලිව්. දසනායක මිය
අංශ ප්‍රධාන
සමාජ සංඛ්‍යානය අධ්‍යයනාංශය



මහාචාර්ය ඩී.එම්. උඩබේසේකර දිසානායක මයා
අංශ ප්‍රධාන
සමාජ විද්‍යා අධ්‍යයනාංශය



එම්.කේ.ඒ. අනෝමා රත්නායක මිය
අංශ ප්‍රධාන
ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය



මහාචාර්ය අජිත් දිසානායක මයා
අංශ ප්‍රධාන
තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය



ආචාර්ය කේ. එම්. එල්. එම්. මංජුල ගුණර ත්න මයා
අධ්‍යක්ෂ
අන්තර් පීඨ විෂයමාලා සම්බන්ධීකරණ මධ්‍යස්ථානය



එන්.එන්. කන්දෙවත්ත මයා
සහකාර ලේඛකාධිකාරී
සමාජීය විද්‍යා පීඨය

# 08. සමාජීය විද්‍යා පීඨය

**පීඨාධිපති**
මහාචාර්ය එම්.එම්. ගුණතිලක මයා
*B.A. (Kel'ya), M.A. (S.J'pura), Ph.D. (Kel'ya)*

**සහකාර ලේඛකාධිකාරි**
එන්.එන්. කන්දෙවත්ත මයා

සමාජීය විද්‍යා පීඨයට අයත් වන අධ්‍යයනාංශ සංඛ්‍යාව දහතුනකි. එම අධ්‍යයනාංශ මගින් උගන්වනු ලබන විෂයයන් සංඛ්‍යාව 18කි. එම විෂයයන් යටතේ ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා හැදෑරීමට විද්‍යාර්ථීන්ට අවකාශ සැලසේ. උපාධි පාඨමාලාවලට අදාළ දේශන සහ අනෙකුත් උපකාරක ක්‍රියාකාරකම්වලට අමතර ව විද්‍යාර්ථීන්ගේ බුද්ධි වර්ධනය සඳහා විවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥයින්ගේ සහභාගිත්වයෙන් දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම ද අධ්‍යයනාංශ හා පීඨය මගින් සිදු කෙරේ.

එමෙන්ම සමාජීය විද්‍යා පීඨයේ තෝරාගත් විෂය ධාරාවලින් පූර්ව උපාධි සහතිකපත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා, පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලා, ශාස්ත්‍රපති (MA) එක් අවුරුදු සහ සමාජීය විද්‍යාපති (MSSc.) දෑ අවුරුදු උපාධි පාඨමාලා පැවැත්වීම ද, අදාළ සියලු ම විෂයයන්ගෙන් පර්යේෂණ මත පදනම් වූ දර්ශනපති (MPhil) සහ දර්ශන විශාරද (PhD) පශ්චාද් උපාධි හැදෑරීමේ පහසුකම් ද සමාජීය විද්‍යා පීඨය මගින් සලසා තිබේ.

SIDA/SAREC පර්යේෂණ ව්‍යාපෘති ආධාර මත පදනම් ව ආරම්භ කර ඇති සමාජීය විද්‍යා පීඨ SIDA/SAREC පර්යේෂණ පුස්තකාලය විවිධ පර්යේෂණ කෘති, වාර ප්‍රකාශන හා සඟරා දහස් ගණනක එකතුවකින් සමන්විත වේ. එහි ම අංගයක් ලෙස ස්ථාපනය කර ඇති **තොරතුරු මධ්‍යස්ථානය** පර්යේෂකයින් සඳහා අන්තර්ජාල සහ පර්යේෂණ මූලාශ්‍රය පහසුකම් ලබා දීම සඳහා වෙන් වී තිබේ.

අන්තර්ජාල, නවීන මෘදුකාංග හා අනෙකුත් තාක්ෂණික පහසුකම්වලින් සමන්විත අංග සම්පූර්ණ පරිගණක විද්‍යාගාර තුනක් සමාජීය විද්‍යා පීඨයට අයත් K3 සහ K4 ගොඩනැගිලිවල ස්ථාපනය කොට ඇත. අධ්‍යයන කටයුතු සඳහා මෙකී පරිගණක භාවිත කිරීමට විද්‍යාර්ථීන්ට සියලු පහසුකම් සපයා ඇත. මීට අතිරේක ව පීඨයේ ප්‍රධාන දේශන ශාලා ශ්‍රව්‍ය-දෘශ්‍ය උපකරණ භාවිතයෙන් කෙරෙන දේශන හා ඉගැන්වීම් සඳහා සුදුසු පරිදි සකස් කර තිබේ.

පීඨ ශිෂ්‍ය ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා අති නවීන පහසුකම්වලින් සමන්විත ශ්‍රව්‍ය-දෘශ්‍ය ශබ්දාගාරයක් (Audio-Visual Studio) ජනසන්නිවේදන අධ්‍යයනාංශය යටතේ (K4) ගොඩනැගිල්ලේ පළමු මහලේ ස්ථාපනය කර ඇත.

සමාජීය විද්‍යා පීඨය යටතේ ජාත්‍යන්තර සහ ජාතික වැදගත්කමින් යුතු කාලීන පර්යේෂණ කටයුතු සිදු කිරීමේ අරමුණින් **සමාජීය විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය** පිහිටුවා ඇති අතර, ශාස්ත්‍රීය පර්යේෂණ සිදු කිරීම හා ඒවා ප්‍රකාශයට පත් කිරීම සඳහා ආධාර ලබා දීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කෙරේ. සමාජීය විද්‍යා පීඨ පර්යේෂණ මධ්‍යස්ථානය (RCSS) මගින් *Journal of Social Sciences, Sri Lanka* නමැති ත්‍රෛමාසික විද්වත් වාර ප්‍රකාශනය එළි දක්වනු ලැබේ. ඒ හැරුණු විට පීඨයේ සෑම අධ්‍යයනාංශයක් විසින් ම ඒ ඒ විෂයයන්ට අදාළ පර්යේෂණ ලිපි ඇතුළත් සඟරා කලාප 02ක් වාර්ෂික ව එළි දක්වනු ලැබේ. මෙම පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් අන්තර්ජාතික සමාජීය විද්‍යා සම්මන්ත්‍රණය කාලීනව පවත්වාගෙන යනු ලබන අතර, ආචාර්ය මණ්ඩලය, ප්‍රමුඛ

වශයෙන් ශිෂ්‍ය විද්‍යාර්ථීන් සඳහා පර්යේෂණ ක්‍රමවේදය ඇතුළු අදාළ වෙනත් මාතෘකා ඔස්සේ දේශන, සාකච්ඡා, වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කරනු ලැබේ.

**පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය** මෙරට දේශීය දැනුම සංරක්ෂණය කර ඒවා විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ කටයුතු සඳහා ලබාදීමේ අරමුණින් මෙම මධ්‍යස්ථානය පිහිටුවා ඇත. මෙහි ඉතා දුර්ලභ පුස්කොල පොත් මෙන් ම සංඛ්‍යාංකකරණය ලද පුස්කොල පත් ඉරු විශාල ප්‍රමාණයක් අඩංගු වේ.

## 8.1 පුරාවිද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය ශ්‍රියාණි හතුරසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.A. (Kel'ya), PG. Dip (Kel'ya), M.Sc. (Kel'ya), Ph.D. (Kel'ya)*
මහාචාර්ය අනුර මනතුංග මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Pune, India), M.Sc. (Kel'ya), FSLCA*
මහාචාර්ය ප්‍රශාන්ත ගුණවර්ධන මයා - විශ්‍රාම ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya), FSLCA*
මහාචාර්ය මාලිංග අමරසිංහ මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya), FSLCA*
මහාචාර්ය උදා හෙට්ටිගේ මිය - මහාචාර්ය
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya), FSLCA*
මහාචාර්ය මංගල කටුගම්පොළ මයා - මහාචාර්ය (නිවාඩු)
*B.A. (Kel'ya), PG. Dip. (Kel'ya), M.Phil. ((Kel'ya), Ph.D. (Sichuan, China) FSLCA*
ආචාර්ය චන්දිම බෝගහවත්ත මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (S. J'pura), PG. Dip (Kel'ya), M.Sc. (Kel'ya), Ph.D. SDU (China) FSLCA*
පී.බී.ඒ.එන්.ඩබ්ලිව්. බණ්ඩාර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), PG. Dip. (Kel'ya), M.Sc. (Kel'ya)*
අචාර්ය සෙනරත් බණ්ඩාර දිසානායක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.Sc.(Kel'ya), Ph.D. (Kel'ya)*
ඩී.ඒ.කේ. අනුපමා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), PG Dip. (S.J'pura), MHRM (Kel'ya)*
හරේන්ද්‍රලාල් නාමල්ගමුව මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), PG. Dip. (Kel'ya), M.Sc. (Kel'ya), MSLCA*
යූ.ආර්. රම්මුංගොඩ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.Sc. (Kel'ya), MSLCA*
සුමේද විරාජ් අපොන්සු මයා - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), PG Dip. (Kel'ya)*
ඉන්ද්‍රචාපා වීරසිංහ මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), MTEHM (C'bo)*

සමාජීය විද්‍යා සහ මානවශාස්ත්‍ර යන පීඨවලට ඇතුළත් වන විද්‍යාර්ථීන්ට ප්‍රථම වර්ෂ පරීක්ෂණය සඳහා පුරාවිද්‍යා අධ්‍යයන අංශය මගින් පිරිනමනු ලබන පුරාවිද්‍යාව, මානවවිද්‍යාව සහ සංචරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය යන විෂයයන් හැදෑරිය හැකි ය.

**ප්‍රථම වර්ෂයේ දී මෙම විෂයයන් තෝරා ගැනීමේ පූර්ව අවශ්‍යතා නොමැති අතර, උපාධිය සඳහා සම්භාර සම්පූර්ණ කිරීම සඳහා විෂය තුනෙන් ඒකක තෝරාගත හැකි ය.** ප්‍රථම වර්ෂ පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබා සමත්වන ශිෂ්‍යයන්ට පුරාවිද්‍යාව සහ සංචරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය යන විෂය දෙකෙන් එකකින් ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව සඳහා අයදුම් කළ හැකි අතර, අධ්‍යයනාංශයේ පවතින ක්‍රමවේදය සහ සම්පත් ප්‍රමාණය ආදි කරුණු සලකා බලා වාර්ෂික ව බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව යටතේ ඒ පිළිබඳ ව පූර්ණ උද්යෝගයකින් සහ කැපවීමකින් යුක්ත ව විද්‍යාර්ථීන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වන අතර, අධ්‍යයනාංශයේ පවතින පුරාවිද්‍යා හා මානවවිද්‍යා කෞතුකාගාරය, විද්‍යාගාරය සහ පුස්තකාලය භාවිත කිරීමේ අවස්ථාව විද්‍යාර්ථීන් සතුව පවතී. පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍ර ප්‍රවීණයන් ආරාධිත දේශකයන් ලෙස පාඨමාලාවට සම්බන්ධ කරගන්නා අතර, එමගින් විද්‍යාර්ථීන්ට ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් සමග අන්තර් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමත්, පුළුල් දැනුමක් ලබා ගැනීමටත්, අවස්ථාව ලබා දී ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනය හා මෙම අධ්‍යයනාංශය අතර සමීප සම්බන්ධතාවක් පවතින හෙයින් එම ආයතනයේ සම්පත් පරිහරණයට ද ව්‍යාපෘතීන් සඳහා සහභාගී වීමට ද අවස්ථාව හිමි වේ. ඊට අමතර ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල සමඟ පවත්නා සම්බන්ධය හේතුකොට ගෙන ක්ෂේත්‍රයේ කටයුතු සම්බන්ධ ජාතික වැදගත්කමක් හිමි ව පවතී. දැනට දිවයිනේ ක්‍රියාත්මක ප්‍රධාන පුරාවිද්‍යා ව්‍යාපෘතීන් හා ජාත්‍යන්තර ව්‍යාපෘතීන් රැසක අධීක්ෂණය සහ උපදේශකත්වය ද අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් දරනු ලබයි. මෙමඟින් විද්‍යාර්ථීන්හට අධ්‍යයන කටයුතු සඳහා අනගි අවස්ථා හිමි වේ. තවද, පුරාවිද්‍යා පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන්ට විදේශගත පුහුණුවීම් සඳහා ද අවස්ථාව ලැබේ.

තවද අප අධ්‍යයනාංශය සංචාරක ව්‍යාපාරයට අනුබද්ධිත පිළිගත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන ගණනාවක් සමඟම ඉතා සමීපව කටයුතු කරන අතර එමඟින් සංචරණය විෂයය හදාරන විද්‍යාර්ථීන් හට පුළුල් ප්‍රායෝගික අත්දැකීම්, දැනුම සහ පුහුණුවක් ලබා දෙමින් මෙම පාඨමාලාවේ ගුණාත්මකභාවය වර්ධනයට කටයුතු කර ඇත. පුරාවිද්‍යාව සහ සංචරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාවන්හි විද්‍යාර්ථීන් තම උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා අනිවාර්යයෙන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට සහභාගී විය යුතු අතර සංචරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය විශේෂවේදී සිසුන්,එම විෂය පාඨමාලාවට අදාළව හැදෑරීමට හැකි **එක් නූතන** භාෂාවක් හැදෑරීම අනිවාර්ය වේ.

තවද 2021/2022 අධ්‍යයන වර්ෂයේ සිට සංචරණය සහ සංස්කෘතික සම්පත් කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් ඉගැන්වීම් කටයුතු සිදු කිරීම සුවිශේෂ කරුණක් වේ.

පුරාවිද්‍යාව සහ මානවවිද්‍යාව පිළිබඳ ව උනන්දුවක් දක්වන විද්‍යාර්ථීන් සඳහා එක් අවුරුදු පුරාවිද්‍යා උරුමය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හා මානවවිද්‍යාව ඩිප්ලෝමා පාඨමාලාවක් ද, ශාස්ත්‍රපති හා සමාජීය විද්‍යාපති පශ්චාද් උපාධි පාඨමාලාවන් ද, දර්ශනපති හා දර්ශනශූරී පාඨමාලාවන් ද අධ්‍යයන අංශය මගින් ආරම්භ කර ඇත.

දුරකථන අංකය - 011 2908779
ෆැක්ස් අංකය - 011 2908779
විද්‍යුත් ලිපිනය - dep.of.archaeology@gmail.com

## 8.2 ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ඩබ්ලිව්.එම්. සේමසිංහ මයා - මහාචාර්ය **(අංශ ප්‍රධාන )**
*B.A. (Kel'ya), PG. Dip. In Social Statistics (S.J'pura), M.A. (S.J'pura), Ph.D. (Kel'ya)*
මහාචාර්ය එම්.එම්. ගුණතිලක මයා - මහාචාර්ය **(පීඨාධිපති - සමාජීය විද්‍යා පීඨය)**
*B.A. (Kel'ya), M.A. (S.J'pura), Ph.D. (Kel'ya)*
මහාචාර්ය එම්.ජී. කුලරත්න මයා - මහාචාර්ය
*B.A. (Perad'ya), M.Sc. (ITC) (Netherlands), Ph.D. (Queensland, Australia)*
මහාචාර්ය එච්.ආර්. අනුලාවතී මැණිකේ මිය - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (S.J'pura), Ph.D. (Pune university, India)*
මහාචාර්ය ආර්.ජී.එස්.පී. බණ්ඩාර මිය - මහාචාර්ය
*B.A. (Kel'ya), MSSc (Kel'ya), M.A. (Waseda, Japan), PG. Dip.in Social Statistics (S.J'pura), Ph.D. (Waikato, New Zealand)*
මහාචාර්ය අජිත් දිසානායක මයා - මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (S.J'pura), Ph.D. (Kel'ya)*
මහාචාර්ය ජේ.ඒ.පී. කුමාරි මිය - මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), PGDRP (Kel'ya), M.Phil (Kel'ya), Ph.D. (Management and Science University - Malaysia)*
මහාචාර්ය එච්.එම්. නවරත්න බණ්ඩා මයා - සහාය මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (C'bo), M.Sc. (York, UK), Ph.D. (Kel'ya)*
ආචාර්ය පී.ඩී.සී.එස්. ධර්මදාස මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Perad'ya), M.Sc. (Saga University - Japan), Ph.D. (Saga University - Japan)*
ආචාර්ය එන්.පී.ඩී. පද්මකාන්ති මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Perad'ya), M.Phill (Perad'ya), MSSc (National University of Singapore), Ph.D. (Saga University - Japan)*
ආචාර්ය ජී.කේ.ආර්. ජයවීර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A.(Perad'ya), MSSc (National University of Singapore), Ph.D. (University of Wollongong, Australia)*
ඩබ්ලිව්.එම්.එම්.එස්.කේ. වේරකේ මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya)*

කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය ස්ථාපිත කරනු ලැබුවේ 1959 දී විශ්වවිද්‍යාලයේ ආරම්භයත් සමග ය. මෙම අධ්‍යයනාංශය මගින් ආර්ථික විද්‍යාව, ශාස්ත්‍රවේදී උපාධි හා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි මට්ටමින් ඉගැන්වේ. 2017/18 අධ්‍යයන වර්ෂයේ සිට ආර්ථික විද්‍යාව ගෞරව උපාධි පාඨමාලාව සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍ය ද්විත්වයෙන් ම ඉදිරිපත් කෙරේ. ඊට අමතර ව මෙම අධ්‍යයන අංශය මඟින් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (M.A.) සහ සමාජීය විද්‍යාපති (MSSc.) උපාධි පාඨමාලා සිංහල සහ ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන්ම පවත්වාගෙන යනු ලබන අතර, ආර්ථික විද්‍යාව දර්ශනපති (M.Phil.) සහ දර්ශන විශාරද (Ph.D.) උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ද අවස්ථාව ලබා දී ඇත.

**ආර්ථික විද්‍යාව**

I. ප්‍රථම වසර පරීක්ෂණයට ආර්ථික විද්‍යාව විෂය තෝරා ගැනීම සඳහා විෂය පූර්ව අවශ්‍යතා නොමැත.

II. ප්‍රථම වසර පරීක්ෂණයේ දී ආර්ථික විද්‍යා විෂයට ඉහළ ම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවෝ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීමට සුදුසුකම් ලබති.

III. ආර්ථික විද්‍යාව ගෞරව උපාධි පාඨමාලාව, විෂය ඒකක විසිහතකින් (27) යුක්ත ය. ඒ තුළ ආයතනික පුහුණු (Internship Training) පාඨමාලා ඒකකයක් සහ ස්වාධීන නිබන්ධයක් ද අන්තර්ගත වේ. ආයතනික පුහුණුව අවසානයේ දී ඒ පිළිබඳ වාර්තාවක් ද ඉදිරිපත් කළ යුතු ය.

දුරකථන අංකය - 0112914488
විද්‍යුත් ලිපිනය - econ@kln.ac.lk

## 8.3 භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ආර්.කේ. ලාල් මර්වින් ධර්මසිරි මයා - විශ්‍රාන්ත ජ්‍යෙෂ්ඨ මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.A. (Hons) (Kel'ya), M.A. (SKU, India), PG. Dip. & M.Sc. (AUN. Norway), Ph.D. (Pune, India)*
මහාචාර්ය ඒ.ජී. අමරසිංහ මයා - මහාචාර්ය
*B.A. (Perad'ya), M.Phil. (Perad'ya), PhD. (Kel'ya)*
මහාචාර්ය එස්.ඒ. නිශාන් පී. සකලසූරිය මයා - මහාචාර්ය
*B.A. (Hons) (Kel'ya), MSSc. (Kel'ya), PhD. (Kel'ya)*
ඩබ්ලිව්.වී.ඩබ්ලිව්. ගීතිකා වනිගනෙත්ති මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.A. (Hons) (Kel'ya), MDS. (C'bo), M.A.(Kel'ya)*
එස්.ආර්.එල්. සුජානි රත්නසේකර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Hons) (Kel'ya), MSSc. (Kel'ya)*
කේ.ඒ. සසිකා එස්. විජේසේකර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Hons) (C'bo) M.Sc. (Perad'ya)*
ඊ.ජී. මංගල ජයරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Hons) (Kel'ya), M.Sc. (S.J'pura)*
එච්.ඒ. සම්පත් අරුණශාන්ත මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Hons) (Kel'ya), M.Sc. (S.J'pura)*
ආර්.ඒ.සී. කාංචනා මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Hons) (Kel'ya), MDS (C'bo)*
බී.කේ.කේ.ජී. පෙරේරා මයා - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.A. (Hons) (Kel'ya)*
ඩී.ආර්. අප්සරා කේ. ධනසේකර මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Hons) (Kel'ya)*
කේ.එල්. වත්සලා අයි. ගුණතිලක මෙය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Hons) (C'bo)*
කේ.බී. ඉඳුනිල් එස්. රන්වැල්ල මයා - ආධුනික කථිකාචාර්ය
*B.A. (Hons) (Kel'ya)*
පී.පී.ජී. ජයතිලක මයා - ආධුනික කථිකාචාර්ය
*B.A. (Hons) (C'bo), M.Sc. (S. J'pura)*
කේ. නිශාන්ති මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Hons)(South Eastern) PGD (Colombo)*

භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය භූගෝලවිද්‍යාව හා සංවර්ධන අධ්‍යයන යන විෂයයන් ද්විත්වය සඳහා ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි යනුවෙන් උපාධි පාඨමාලා හතරක් ඉදිරිපත් කරනු ලැබේ.

භූගෝලවිද්‍යාව සහ සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී 2021 වර්ෂයේ සිට උපාධි පාඨමාලාවන් විෂය ඒකක ක්‍රමය අනුව ව්‍යුහගතකොට ඇත. ඒ අනුව ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි භූගෝලවිද්‍යාව විෂය ධාරාව සඳහා අධ්‍යයන සම්භාර 120 කින් යුත් ප්‍රධාන විෂය ඒකක 28 ක් ද, සංවර්ධන අධ්‍යයනය විෂය ධාරාව සඳහා අධ්‍යයන සම්භාර 120 කින් යුත් ප්‍රධාන විෂය ඒකක 36 ක් ද ඇතුළත් වේ.

**ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - භූගෝලවිද්‍යාව**
භූගෝලවිද්‍යාව ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන් 01 වන මට්ටමේ දී (ශාස්ත්‍රවේදී පළමු වසර - Level 1) භූගෝලවිද්‍යාව විෂය ඒකක 02 ක් හැදෑරිය යුතුය. දෙවන හා තෙවන (Level 2 and 3) මට්ටම්වල දී භූගෝලවිද්‍යාවේ ප්‍රධාන විෂය ඒකක 28 ක් හැදෑරියුතු ය. තුන්වන මට්ටමේ දෙවන අර්ධ වාර්ෂිකයේදී ආයතනික පුහුණුව

(Institutional Training) සඳහා විද්‍යාර්ථීන් යොමු කරන අතර මෙයද ප්‍රධාන විෂය ඒකකයක් ලෙස සැලකේ. 4වන මට්ටමේදී ප්‍රධාන විෂය ඒකක 07 ක් හා අධ්‍යයන සම්භාර 08කින් සමන්විත පර්යේෂණ උපාධි නිබන්ධනයක් සකස් කළ යුතුය.

**ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - සංවර්ධන අධ්‍යයනය**

සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන් 01 වන මට්ටමේදී (ශාස්ත්‍රවේදී පළමු වසර Level 1) සංවර්ධන අධ්‍යයනය විෂය ඒකක 02 ක් හැදෑරිය යුතු ය. දෙවන හා තෙවන මට්ටම්වල දී (Level 2 and 3) භූගෝලවිද්‍යා අධ්‍යයන අංශයෙන් ඉදිරිපත් කර ඇති ප්‍රධාන විෂය ඒකක 28 ක් හා ආර්ථික විද්‍යා හා සමාජ විද්‍යා අධ්‍යයන අංශවලින් ඉදිරිපත් කර ඇති ප්‍රධාන විෂය ඒකක 02 ක් හා ප්‍රධාන විෂය ඒකක 28 ක් හැදෑරිය යුතු ය. එයට අමතරව දෙවන හා තෙවන මට්ටම්වලදී පීඨයේ වෙනත් අධ්‍යයන අංශ දෙකකින් ඉදිරිපත් කරනු ලබන ආධාරක විෂයයන් දෙකක් ද හැදෑරිය හැකිය. තෙවන මට්ටමේ දෙවන අර්ධ වාර්ෂිකයේ දී ආයතනික පුහුණුවකට (Institutional Training) විද්‍යාර්ථීන් යොමුකරන අතර එයට ප්‍රධාන විෂය ඒකකයකට ලැබෙන සම්භාර වටිනාකම හිමි වේ. 04 වන මට්ටමේදී අධ්‍යයන සම්භාර 08 කින් යුක්ත ප්‍රධාන විෂය ඒකකයක් වන ස්වාධීන නිබන්ධිකාව ඇතුළු ව විෂය ඒකක 09 ක් හැදෑරිය යුතු වේ.

භූගෝලවිද්‍යාව සහ සංවර්ධන අධ්‍යයනය උපාධි පාඨමාලාවන්ට සම්බන්ධ ආචාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු පවත්වනු ලැබේ. ක්ෂේත්‍රයේ දී එක් එක් විෂය ඒකකවලට සම්බන්ධ ආචාර්යවරුන් දේශන හා සාකච්ඡා පවත්වන අතර අවසානයේදී ක්ෂේත්‍රයෙන් ලබාගත් තොරතුරු ඇතුළත් පැවරුමක් හා ඉදිරිපත් කිරීමක් විද්‍යාර්ථීන් විසින් සිදු කළ යුතු ය.

නවීන මෘදුකාංග හා දෘඩාංගවලින් යුත් භූගෝලවිද්‍යා තොරතුරු පද්ධති (GIS) විද්‍යාගාරයක් භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය මඟින් පවත්වාගෙන යයි. භූගෝලවිද්‍යාව හා සංවර්ධන අධ්‍යයන ශාස්ත්‍රවේදී හා ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි විද්‍යාර්ථීන්ට භූගෝලීය තොරතුරු පද්ධති යනුවෙන් ප්‍රධාන විෂය ඒකකයක් ඉදිරිපත් කර ඇත. මෙයින් විද්‍යාර්ථීන්ගේ දැනුම වර්ධනය සඳහා අවශ්‍ය ප්‍රායෝගික පංති, වැඩමුළු හා ව්‍යාපෘති පැවැත්වේ. එසේ ම භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණයේ න්‍යායාත්මක හා සංකල්පනාත්මක දැනුම ද මෙයින් ලබා දෙයි.

1997 වර්ෂයේ සිට පශ්චාත් උපාධි පාඨමාලා භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය මගින් පවත්වාගෙන යයි. ඒවා මතු දැක්වේ.

**භූගෝල විද්‍යාව පශ්චාත් උපාධිය** ( M Geog)
විෂයානුබද්ධ දේශනවලින් යුත් භූගෝල විද්‍යාව පශ්චාද් උපාධි එක් අවුරුදු පාඨමාලාව.

**භූගෝල විද්‍යාව ශාස්ත්‍රපති** ( MA Geog)
විෂයානුබද්ධ දේශන සහිත දැවුරුදු පර්යේෂණ නිබන්ධනය සහිත දැවුරුදු පාඨමාලාව.

මෙම පාඨමාලාවන්ට අමතරව අධ්‍යයන අංශය මගින් පහත සඳහන් පාඨමාලා ද පවත්වාගෙන යනු ලැබේ.

(i). ආපදා කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
(ii). ප්‍රාදේශීය සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
(iii). භූගෝලවිද්‍යා තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

මීට අමතරව දර්ශනපති (M.Phil) සහ දර්ශනශූරී (Ph.D) උපාධි පිරිනැමීමද භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය මගින් සිදුකෙරේ. මේ ඕනෑ ම පාඨමාලාවක් පිළිබඳ පූර්ණ විස්තර ලබාගැනීමට භූගෝලවිද්‍යා අධ්‍යයන අංශයේ ss.kln.ac.lk/depts./geography වෙබ් පිටුවට පිවිසෙන්න.

දුරකථන අංකය - 0112-903920
විද්‍යුත් ලිපිනය - hodgeog@kln.ac.lk

## 8.4 ඉතිහාස අධ්‍යයනාංශය

### ආචාර්ය මණ්ඩලය

මහාචාර්ය ඩී.ටී. කොග්ගලගේ මෙය - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.A. (C'bo), M.Phil. (Kel'ya), Ph.D. (Kel'ya), Attorney-at-Law*
මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.A. (Kel'ya), Ph.D. (Kel'ya)*
මහාචාර්ය ජේ.එම්. සුධර්මාවතී මිය - මහාචාර්ය
*B.A. (Kel'ya), M.Sc. (PGIAR), Ph.D. (Kel'ya), PG. Dip. (PGIAR)*
මහාචාර්ය වී.ඩී.එන්.එස්. ගුණවර්ධන මිය - මහාචාර්ය
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Pondicherry, India)*
ආචාර්ය ඩී.කේ. මනතුංග මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.Sc. (PGIAR) , Ph.D. (Kel'ya), PG. Dip. (PGIAR)*
ආචාර්ය එච්.එච්.එන්.එස්. හේවාවසන් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.Sc. (PGIAR) , Ph.D. (Kel'ya), PG. Dip. (PGIAR)*
එස්.ඒ. දිල්හානි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc. (Kel'ya)*
ආචාර්ය එච්.එම්.එස්.බී. හේරත් මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), Ph.D. (Ruhuna), Dip. in Pali Language (BPUSL), Dip. in Sanskrit Language (Kel'ya)*
ආචාර්ය ආර්.එම්.ජී.ඩබ්. දිසානායක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Perad'ya), M.Phil. (Perad'ya), Ph.D. (Kel'ya), Royal Pandith*
ඒ.එස්.පී.එස්.පී. සංජීව මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), LLB (Sri Lanka), M.A. (S.J'pura), Dip. in English (Kel'ya), PG Dip. in Ed. (C'bo), PG Dip. in IR (BCIS)*
ආචාර්ය එන්.ඩී. කැකුලාවල - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (S.J'pura), M.Phil. (PGIAR), Ph.D. (PGIAR)*
ඊ.ඩබ්.ඒ.එච්.සී. ගුණසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), PG Dip. in Ed. Admin. (NIE)*

ඉතිහාස අධ්‍යයනාංශය කැලණිය විශ්වවිද්‍යාලයේ පැරණිතම අධ්‍යයනාංශවලින් එකකි. කීර්තිධර ඉතිහාසඥයකු වූ මහාචාර්ය හෙම් චන්ද්‍ර රාය මහතා යටතේ ආරම්භ වූ මෙම අංශය විසින් බිහිකරන ලද උපාධිධාරීහු විශ්වවිද්‍යාල සේවය, අධ්‍යාපන සේවය, පරිපාලන සහ විදේශ සේවය වැනි විවිධ ක්ෂේත්‍රයන්හි උසස් තනතුරු දරමින් පුළුල් ජාතික සේවයක යෙදී සිටිති.

කාලීන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ප්‍රතිසංවිධානය කර ඇති ඉතිහාසය ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා ලංකා ඉතිහාසයේ පුරාතන, මධ්‍යකාලීන හා නූතන යන යුගත්‍රයම ආවරණය වන පරිදි සකස් වී ඇත. ඊට අමතරව පෙරදිග හා අපරදිග ඉතිහාසය හැදෑරීමේදී වැදගත් වන, ඉන්දියාවේ හා යුරෝපයේ ඉතිහාසය, ඉතිහාසකරණය හා පෙර අපර දෙදිග දේශපාලන චින්තනය ආදී අංශ කෙරෙහි අවධානය යොමුවන ආකාරයට විෂය මාලාව සකස් වී ඇත.

ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව මගින් ඒ සෑම අංශයක් සම්බන්ධයෙන් ම සාමාන්‍ය අවබෝධයක් ලබාදීමට අපේක්ෂා කරන අතර, ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව, විෂය පිළිබඳ විශේෂඥ දැනුමක් ලබාදෙන අයුරින් සකස් කර ඇත. ඉතිහාසය ශාස්ත්‍රවේදී හෝ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය හැදෑරීම සඳහා විශේෂ පූර්ව අවශ්‍යතාවක් සම්පූර්ණ කළ යුතු නොවේ.

ඉතිහාසය ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව විෂය ඒකක හයකින් (06) සමන්විත වන අතර ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය හැදෑරීම සඳහා ප්‍රථම වසර පරීක්ෂණයේදී ඉතිහාසය විෂයයට ඉහළම ලකුණු ලබාගත් විද්‍යාර්ථීහු සුදුසුකම් ලබති. ඉතිහාසය ගෞරව උපාධි පාඨමාලාව විෂය ඒකකය විසිහතකින් (27) සහ ස්වාධීන නිබන්ධිකාවකින් සමන්විත ය.

දුරකථන අංකය - 0112914491
විද්‍යුත් ලිපිනය - hist@kln.ac.lk

## 8.5 ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය චාමින්ද අබේසිංහ මයා - මහාචාර්ය I (**අංශ ප්‍රධාන**)
*B.A. (Kel'ya), M.A. (Waseda, Japan), Ph.D. (Meiji, Japan)*
ජේ.ටී.එස්. ගුණසේන මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (C'bo)*
බී.ඩබ්ලිව්.ජී. සිතාර ප්‍රියදර්ශන මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (සප්ත වාර්ෂික නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (C'bo)*
කේ.එම්.එච්.වී. විජේසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.A. (C'bo)*
එම්.එස්.ටී. පෙරේරා මිය - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), LLB (London), Attorney-at-Law*
එච්.එස්.ජී. ප්‍රනාන්දු මිය - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya)*

**ජාත්‍යන්තර අධ්‍යයනය**

ජාත්‍යන්තර අධ්‍යයනය ශාස්ත්‍රවේදී උපාධිය විෂය ඒකක හයකින් සමන්විත වන අතර දේශන පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙනි. ශාස්ත්‍රවේදී ප්‍රථම වසර පරීක්ෂණයට ජාත්‍යන්තර අධ්‍යයනය විෂය තෝරා ගැනීම සඳහා කිසිදු පූර්ව අවශ්‍යතාවක් නොමැත.

ප්‍රථම වසර පරීක්ෂණයේ දී ජාත්‍යන්තර අධ්‍යයනය විෂයට ඉහළම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථීහු ජාත්‍යන්තර අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබති. ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර ඔවුන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අධ්‍යයන අංශය විසින් පවත්වනු ලබන ශක්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

ජාත්‍යන්තර අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව ජාත්‍යන්තර සබඳතාවලට අදාළව ඒකක 26 කින් සමන්විතය. එසේම විෂය නිර්දේශය ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශය මගින් පවත්වන ඉංග්‍රීසි භාෂා ඒකක 04 කින්, පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ ඒකක දෙකකින්, ආයතනික පුහුණු පාඨමාලා ඒකකයකින් සහ ස්වාධීන නිබන්ධනයකින් යුක්ත වේ. මීට අමතර ව වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන වෛකල්පික විෂය ඒකක ද මෙයට ඇතුළත් වේ.

එසේ ම ජාත්‍යන්තර අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය හැදෑරීමේදී ජාත්‍යන්තර භාෂාවක් හැදෑරීම අනිවාර්ය වේ. මේ සඳහා විද්‍යාර්ථීන් විසින් දැනට නූතන භාෂා අධ්‍යයනාංශය මගින් පවත්වාගෙන යනු ලබන රුසියන්, චීන, ජර්මන්, ප්‍රංශ හෝ කොරියන් යන භාෂා අතරින් එක් භාෂාවක් තෝරා ගත යුතුය.

දුරකථන අංකය - 0112903830
විද්‍යුත් ලිපිනය - ints@kln.ac.lk

## 8.6 පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ඩබ්ලිව්.කේ.එම්.එම්.කේ. වීරසිංහ මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.A. (Kel'ya), M.Lib.I.Sc. (Punjab), Ph.D. (Kel'ya)*
මහාචාර්ය ඩබ්ලිව්.ඒ. වීරසූරිය මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (Kel'ya), M. Lib.I.Sc. (Punjab), Ph.D. (Pune,India)*
එච්.එම්. ටිකිරි හේරත් ගුණතිලක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc. (Kel'ya)*
ආචාර්ය ඒ.ඩබ්ලිව්.ඒ.පී.එල්. වනිගසූරිය මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), Ph.D. (Wuhan, China)*
ආචාර්ය පූජ්‍ය ලැගුම්දෙනියේ පියරතන හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya) MSSc. (Kel'ya)*
ආචාර්ය කේ.ආර්.එන්. හර්ෂණී මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), Ph.D. (MSU, Malaysia)*
ආර්.එම්.එන්. සංජීවනී මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya) MSSc. (Kel'ya)*
එච්.කේ.අයි. සෙව්වන්දි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), MSSc. (Kel'ya)*
ජේ.එම්. ශලනි දිලිනිකා මිය - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), MSSc. (Kel'ya)*
පී.ඩබ්ලිව්.ඒ.එස්.ඩී. රන්සර මයා - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya)*
කේ.අයි.ඩී. සේනාරත්න මෙය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya)*
පූජ්‍ය බී. සෝමානන්ද හිමි - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya)*

පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය 1973 වසරේ දී පිහිටුවන ලද්දේ උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා පුළුල් කිරීමේ අරමුණ සහිත ව ය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනයට මෙන් ම පුද්ගලයන්ගේ නිර්මාණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ද පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානවලින් ඉමහත් සේවයක් සිදු කරනු ලබයි.

රටක සංවර්ධනය සඳහා තොරතුරු ප්‍රධාන සාධකයක් වන හෙයින් දැනුම කේන්ද්‍රීය සංවර්ධනයෙහි පුස්තකාල හා තොරතුරු සේවා මගින් සුවිශේෂ කාර්යභාර්යක් ඉටු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ මෙන් ම විදේශ රටවල ද, ශාස්ත්‍රීය හෙවත් අධ්‍යාපනික පුස්තකාල (විශ්වවිද්‍යාල, පාසල්, කාර්මික විද්‍යාල, පිරිවෙන්) මහජන පුස්තකාල සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල පුස්තකාල, ජාතික පුස්තකාල සඳහා මානව සම්පත් සැපයීම හා පුහුණු කිරීම මෙම අධ්‍යයනාංශයේ මූලික කාර්යයන් වේ.

උසස් මට්ටමේ රැකියා අවස්ථා ඉලක්ක කර ගනිමින් විද්‍යාර්ථීන් පුස්තකාල වෘත්තිකයන් බවට පත් කිරීමේ දී ඔවුන් සඳහා ගුණාත්මක ඉගැන්වීම, උපදෙස් දීම සහ පුහුණුව යන කාර්යයන් සම්බන්ධ ව පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් වී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අනුබද්ධ ගුණාත්මකභාවය සුරැකීමේ සහ ප්‍රතීථන සභාව විසින් (Quality Assurance and Accreditation Council) මෑතක දී පවත්වන ලද විෂය විමර්ශනයේ දී තත්ත්ව ආරක්ෂණ දර්ශක 8කින්, 6ක් සඳහා A (විශිෂ්ටතම) ශ්‍රේණි දිනාගැනීම, මෙම අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලයේ දායකත්වය, ඉගැන්වීම හා මග පෙන්වීම යන කරුණුවල ගුණාත්මක බව තහවුරු කිරීමක් ද වේ.

අධ්‍යයනාංශයේ දැක්ම වනුයේ '**තිරසාර සංවර්ධනයක් සඳහා පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ දැනුම නිර්මාණය කිරීම හා දැනුම ව්‍යාප්ත කිරීමේ විශිෂ්ටත ම මධ්‍යස්ථානයක් බවට පත්වීම.**' මෙහෙවර වනුයේ '**කාර්යක්ෂම ඉගැන්වීම, දැනුම බෙදාහැරීම, පර්යේෂණ හා නවෝත්පාදනය යන ක්‍රියාමාර්ග තුළින් අනර්ඝ වූත්, විචක්ෂණ වූත්, සේවයට කැපවුණු පුහුණු පුස්තකාල හා විඥාපන විද්‍යා විද්වත් වෘත්තිකයන් සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ජාතික වශයෙන් මෙන් ම ජාත්‍යන්තර ලෙස ද දායාද කිරීමයි.**'

ආචාර්ය මණ්ඩලය දේශීය මෙන් ම විදේශීය විද්‍යායතනයන්හි අධ්‍යාපනය හා පුහුණුව ලද ආචාර්යවරුන්ගෙන් හා මෙරට ප්‍රවීණ පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තිකයන්ගෙන් ද සමන්විත වේ.

**ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව**

මෙම පාඨමාලාව වෘත්තීයාභිමුඛ පාඨමාලාවකි. රාජ්‍ය හා පෞද්ගලික අංශය සඳහා පුස්තකාල හා විඥාපන වෘත්තිකයන් බිහි කරලීම සඳහා මෙම පාඨමාලාව සකස් කර ඇත. පුස්තකාල කටයුතු සඳහා පරිගණක යෙදුම්, පුස්තකාල ස්වයංක්‍රීයකරණය, පුස්තකාල හා තොරතුරු සේවා සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය, පුස්තකාල කළමනාකරණය. තොරතුරු සාක්ෂරතාව, වර්ගීකරණය, සුචිකරණය, අනුක්‍රමණිකාකරණය, විමර්ශන මූලාශ්‍රය හා සේවා, ප්‍රලේඛනය හා තොරතුරු සමුද්ධරණය වැනි විෂයන් සහ පිළිගත් පුස්තකාලයක මාස තුනක පුහුණුවක් මෙම පාඨමාලාව මඟින් සපයනු ලැබේ. පුස්තකාල කටයුතු සඳහා පරිගණක භාවිතය වැඩිවීම තුළ මෙම පාඨමාලාව සඳහා පරිගණක විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් පුලුල් වශයෙන් මෙම පාඨමාලාවට ඇතුලත් කර ඇත. ප්‍රථම වසර පරීක්ෂණයට පුස්තකාල හා විඥාපන විද්‍යාව විෂය සඳහා විෂය පූර්ව අවශ්‍යතා නැත.

**ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව**

මෙම පාඨමාලාව ද වෘත්තීයාභිමුඛ පාඨමාලාවකි. පාසල් හා මහජන පුස්තකාල ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සඳහා මානව සම්පත් සම්පාදනය පිණිස මෙම පාඨමාලාව සකස් කර ඇත. තොරතුරු සාක්ෂරතාව, පුස්තකාල කළමනාකරණය, එකතු සංවර්ධනය, විමර්ශන සහ තොරතුරු සේවා, පුස්තකාල සඳහා පරිගණක භාවිතය හා පුස්තකාල පුහුණුව යන විෂය ඒකක මෙම පාඨමාලාවට අයත් වේ.

**පශ්චාත් උපාධි පාඨමාලා**

පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (MA) සහ දෑ අවුරුදු පර්යේෂණ උපාධියක් වන සමාජීය විද්‍යාපති (MSSc) පාඨමාලාව මෙන් ම දර්ශනපති (M.Phil.) සහ දර්ශන විශාරද (Ph.D.) පාඨමාලා ද පවත්වාගෙන යනු ලැබේ.

**පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා**

ශ්‍රී ලංකාවේ සහ විදේශීය රටවල පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන වල රැකියා ඉලක්ක කර ගත් පහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලා සති අන්ත දිනවල දී පවත්වාගෙන යනු ලැබේ.

- පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - ප්‍රථම කොටස
- පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - දෙවන කොටස
- පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- තොරතුරු කළමනාකරණය සහ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

දුරකථන අංකය - 011-2917712
අභ්‍යන්තර අංකය - 900
ෆැක්ස් අංකය - 011-2917712
විද්‍යුත් ලිපිනය - delis@kln.ac.lk

## 8.7 ජනසන්නිවේදන අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

විජයානන්ද රූපසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Dip. in Development Journalism (IIMC, New Delhi, India)*
අරුණ ලොකුලියන මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Dip: in Tel. Prod: (NYSC), Cert. in Film Aesthetics (Pune, India), Cert: in Media Studies (Ohio, USA)*
චන්දිමා නිශ්ශංක මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Cert.in Russian (Pushkin Ins.) (Moscow, Russia), Dip. In Development Journalism (IIMC, New Delhi, India)*
මනෝජ් පුෂ්පකුමාර ජිනදාස මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.A.(Kel'ya), MSSc.(Kel'ya), PG. Dip.in Translation (Perad'ya), Cert in Research (C'bo), PG. Dip. in Psychology (Perad'ya), Sangeeth Visharad, Sangeeth Nipun (Lucknow, India)*
එස්.එච්. සමන්තිකා ප්‍රියදර්ශනී මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), Cert. in Film Appreciation (Pune,India)*
ආර්. සමන් රාජපක්ෂ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
ධම්මික බණ්ඩාර හේරත් මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), Dip. in Translation (Kel'ya)*
දර්ශන සම්පත් සෝමරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc. (Kel'ya)*
ඒ.එච්. දිතිති ජයසේකර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), Attorney-at-Law, LLB (OUSL), Dip. in Translation (Kel'ya)*
මංගල කීර්ති ද පැස්කුවල් මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), MSSc. (Kel'ya)*
ඒ.ජී. අමාලි උත්පලා නන්දසිරි මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya), Dip in Traslation (Kel'ya)*
එල්. දිනීෂා ලියනගේ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
ආචාර්ය ඒ.එම්.එස්.ඒ. අබේකෝන් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Eastern), MSc. (Perad'ya), Ph.D. (Deakin, Asutralia)*
එච්.ජී.ඩී. ලක්ෂිකා මිය - කථිකාචාර්ය (තහවුරු නොකල)
*B.A. (Kel'ya), MSSc (Kel'ya)*
ආර්.පී.අයි. හංසනී මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
එල්. යූ.එල්.ඩී.ඒ.එම්. විජේසිංහ - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
ඩී.අයි. මධුරසිංහ මෙය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), Ph.D in IR (BCIS)(Colombo)*

1973 දී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් ප්‍රථම වරට කැලණිය විශ්වවිද්‍යාලය තුළ ජනසන්නිවේදනය විෂය වෘත්තීයාභිමුඛ පාඨමාලාවක් වශයෙන් ආරම්භ කරන ලදි. දැනට මෙම අධ්‍යයනාංශය මඟින් ශාස්ත්‍රවේදී හා ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. එම පාඨමාලා සන්නිවේදනය පිළිබඳ න්‍යායාත්මක දැනුම මෙන් ම ගුවන්විදුලි, රූපවාහිනී, සිනමා, පුවත්පත්, ඩිජිටල් මාධ්‍ය හා තොරතුරු තාක්ෂණය යන ජනසන්නිවේදන මාධ්‍ය ක්ෂේත්‍රයන් පිළිබඳ ප්‍රායෝගික දැනුම අන්තර්ගත වන අයුරින් සකස් කර ඇත.

1997 දී ආරම්භ කරන ලද ජනසන්නිවේදනය පිළිබඳ එක් අවුරුදු (ශාස්ත්‍රපති) සහ දෑවුරුදු (සමාජීය විද්‍යාපති) පශ්චාද් උපාධි පාඨමාලාවන් ද, 2000 වසරේ දී ආරම්භ කරන ලද ජනසන්නිවේදන ඩිප්ලෝමා පාඨමාලාව ද දැනට ක්‍රියාත්මක වන අතර, විද්‍යාර්ථීන්ට දර්ශනපති හා දර්ශන විශාරද යන පශ්චාද් උපාධි හැදෑරීමට ද අවස්ථාව ලබා දී ඇත.

මීට අමතර ව ජනසන්නිවේදන අධ්‍යයනාංශය යටතේ මාධ්‍ය හා මානව හිමිකම් අධ්‍යයනය කේන්ද්‍රය (CSMHR) පවත්වාගෙන යනු ලබයි. මෙමඟින් පර්යේෂකයින්ට සහ විද්‍යාර්ථීන්ට මානව හිමිකම් සහ එම විෂය ක්ෂේත්‍රයට අදාළ දැනුවත් කිරීම්,පුහුණු වැඩමුළු සහ උසස් අධ්‍යයන ක්‍රියාත්මක කරනු ලැබේ. එමෙන් ම සන්නිවේදන පර්යේෂණ ඒකකය (CRU) ද ක්‍රියාත්මක වේ. මෙමඟින් මාධ්‍ය සහ සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට අදාළ උසස් පර්යේෂණ, පර්යේෂණ වැඩමුළු හා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරනු ලැබේ.

මහජන සම්බන්ධතාව සහ මාධ්‍ය කළමනාකරණය යන විෂය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුළින් ප්‍රථම වරට කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය මඟින් හඳුන්වා දී තිබේ. ජනසන්නිවේදන අධ්‍යයන අංශය මඟින් 2015 වසරේ සිට ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ විෂය ක්ෂේත්‍රයක් ලෙස මහජන සම්බන්ධතාව සහ මාධ්‍ය කළමනාකරණය විද්‍යාර්ථීන් සඳහා තෝරා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ. 2016 වසරේ සිට මහජන සම්බන්ධතාව සහ මාධ්‍ය කළමනාකරණය ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව ක්‍රියාත්මක වේ.

මෙයට අමතර ව 2013 වසරේ සිට මහජන සම්බන්ධතාව පිළිබඳ ලංකාවේ පළමු ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර පවත්වාගෙන යන අතර, සන්නිවේදනය හා මහජන සම්බන්ධතාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව යන පාඨමාලා ජනසන්නිවේදන අධ්‍යයන අංශය මඟින් හඳුන්වා දී තිබේ. සන්නිවේදන සහ මහජන සම්බන්ධතා උසස් ඩිප්ලෝමා පාඨමාලාව වෘත්තීය සුදුසුකම් ඇති පුද්ගලයින් සඳහා විශ්වවිද්‍යාලයීය උසස් අධ්‍යාපනය හැදෑරීමේ ප්‍රවේශයක් ලෙස සකස් කර ඇති පාඨමාලාවකි. 2023 වසරේ සිට මහජන සම්බන්ධතා සහ මාධ්‍ය කළමනාකරණය පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ද ආරම්භ කර ඇත.

2022 වසරේ සිට Unik Radio නමින් විශ්වවිද්‍යාල වෙබ් ගුවන්විදුලි සේවාවක් ද ක්‍රියාත්මක වේ. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනයට අදාළ විද්‍යුත් සඟරාවක් sanniwedakaya.lk නමින් පවත්වාගෙන යනු ලැබේ.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 0112917713 |
| අභ්‍යන්තර අංක | - | 860, 862 |
| Email | - | masscommunication@kln.ac.lk |
| Web Site | - | http://ss.kln.ac.lk/depts/maco/ |
| Facebook | - | Department of Mass Communication, University of Kelaniya, Sri Lanka |
| Instagram | - | masscommuok |
| Twitter | - | MASS.COMM |
| You Tube (Dept) | - | Department of Mass Communication,UOK |
| You Tube (PRMM) | - | PRMM |
| Unik Radio | - | https://ss.kln.ac.lk/depts/maco/ |
| Linkedin | - | https://www.linkedin.com/in/mass-communication-uok-76432728a/ |

## 8.8 දර්ශන අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය මනෝජි හරිස්චන්ද්‍ර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), PhD. (BPU), AMPC, Dip. in Counselling (IPS)*
මහාචාර්ය ගාමිණී හපුආරච්චි මයා - මහාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), MIPC*
ආචාර්ය පූජ්‍ය කුඹුකන්දන රේවත හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Perad'ya), MPhil. (Kel'ya), PhD. (SLBU), Dip. in Counselling (IPS)*
ආචාර්ය එන්.ඩී.ජී. ගයන්ත මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A.(S.J'pura), PhD.(S'.J'pura) Dip in Counselling (SLMHF), Advanced Dip. In Psychotherapy (SLMHF)*
ඩී.ඩී.ආර්.ද සිල්වා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), Dip. in Counselling (IPS)*
ආර්.එම්.ජී. කරුණාරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Perad'ya), MSSc. (Kel'ya), M.Phil (C'bo)*
ආචාර්ය පී.පී.ජී.සී. සිරිවර්ධන මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.A.(Kel'ya), PhD. (S.J'pura)*
ජී.එස්.පී. රූපසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Perad'ya), MPhil. (Perad'ya), Dip. in Counselling (S.J'pura), Dip. in Drama and Theatre, P.G Dip. in Writership and Communication (S.J'pura)*
කේ.ඩී.එන්. ප්‍රනාන්දු මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), MPhil. (S.J'pura)*
අයි.කේ. ගලගම මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), MSc. (Antwerp), M.A. (Thribuvan), Dip. in Disarmament and No proliferation (UPeace)*
එච්.එම්.ඕ.වී. හේරත් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), MPhil (C'bo), PQHRM (IPM), Dip. in Counselling (RIPCn)*
ජී.ආර්. කුමාරනායක මයා - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.A. (Perad'ya), MSc. (Mysore), M.Phil (Kel'ya)*

**දර්ශන අංශය**

දර්ශන අංශය කැලණිය විශ්වවිද්‍යාලයේ පුරෝගාමී අධ්‍යයනාංශයකි. එය, දර්ශනය, මනෝවිද්‍යාව, සාමය හා ගැටුම් නිරාකරණය යන විෂය ක්ෂේත්‍ර සඳහා උපාධි පිරිනමයි.

**දර්ශනය**

දර්ශනය සියලු විද්‍යාවන් අතරින් පැරණිම විද්‍යාව වශයෙන් සලකනු ලබන අතර එය 'සියලු විද්‍යාවන්ගේ විද්‍යාව' වශයෙන් ද හඳුන්වනු ලැබේ. පැරණි ග්‍රීක භාෂාවෙන් මෙහි අර්ථය 'ප්‍රඥාවට ඇති කැමැත්ත' වන අතර පැරණි සංස්කෘත භාෂාවෙන් 'නිවැරදි දැකීම' යන අර්ථය ලබා දෙයි. දර්ශනය යනු සංකල්පීය කරුණු අධ්‍යයනය කරන විෂයයකි. සෑම විෂයයකට ම අයත් වියුක්ත ඥානය එමගින් අධ්‍යයනය කරයි. මේ නිසා දර්ශනය විෂය යටතේ විද්‍යාවේ දර්ශනය, නීති දර්ශනය හා දේශපාලන දර්ශනය වැනි උප විෂයක්ෂේත්‍ර දැකගත හැකි ය. ඒ අතර ම දර්ශනය, එයට ම ආවේණික වූ තර්ක ශාස්ත්‍රය, පාරභෞතිකවාදය, ආචාරධර්ම හා ඥානවිභාගය වැනි විෂය ක්ෂේත්‍ර ද අධ්‍යයනය කරයි. දර්ශනය මෑතකාලයේ දී තමන්ගේ දේශ සීමා - පරිසර අධ්‍යයනය (පරිසර දර්ශනය), මනෝවිද්‍යාව (දාර්ශනික මනෝවිද්‍යාව), සාම අධ්‍යයනය (මානව අයිතිවාසිකම් පිළිබඳ දර්ශනය) වැනි නව භූමි ප්‍රදේශ වෙත ද ව්‍යාප්ත කර තිබේ.

**මනෝවිද්‍යාව**

මනෝවිද්‍යාව මානව හා සත්ත්ව චර්යාව අධ්‍යයනය කරන විෂය ක්ෂේත්‍රය වශයෙන් චර්යාවේ විවිධ මානයන් අධ්‍යයනය කරයි; උදාහරණ වශයෙන් චර්යාවේ සාමාන්‍ය ස්වභාව (සාමාන්‍ය මනෝවිද්‍යාව), අසාමාන්‍ය චර්යාවන් (අසාමාන්‍ය මනෝවිද්‍යාව), ඉගෙනුම් චර්යාවන් (අධ්‍යාපන මනෝවිදයාව), වැඩ චර්යාවන් (සංවිධාන චර්යා මනෝවිද්‍යාව) සහ සමාජ චර්යාවන් (සමාජ මනෝවිද්‍යාව) වේ. මේ අතර ළමා මනෝවිද්‍යාව හා සංවර්ධන මනෝවිද්‍යාව මානව චර්යාවේ සංවර්ධන මානයන්, කායික සංවර්ධනය, ප්‍රජානන සංවර්ධනය, සමාජ - චිත්තවේග සංවර්ධනය සහ සදාචාර සංවර්ධනය අධ්‍යයනය කරයි. මනෝවිද්‍යාව පුද්ගල මිනිසාගේ චර්යාවන් අධ්‍යයනය කරන විෂයක් වශයෙන් නූතන ලෝකයේ වැඩිම ආකාර්ශනයක් දිනාගෙන සිටියි.

**සාමය හා ගැටුම් නිරාකරණය**

යුද්ධ හා ගැටුම් සුලබ සංසිද්ධියක් වන නූතන සමාජයේ සාමය පිළිබඳ අධ්‍යයනයට ඉහළ ඉල්ලුම් ලැබී තිබේ. සාමය හා ගැටුම් නිරාකරණය පිළිබඳ අපගේ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය දකුණු ආසියාවේ එවැනි ප්‍රථම උපාධියයි. සාමය හා ගැටුම් නිරාකරණයේ විවිධ ක්ෂේත්‍ර මෙම විෂය යටතේ අධ්‍යයනය කරයි. යුද්ධ හා ගැටුම්වල ඉතිහාසය හා ඒවායේ විවිධ ස්වරූපයන්; සාමය හා ගැටුම්වල දර්ශනය හා මනෝවිද්‍යාව; ගැටුම් කළමනාකරණ ක්‍රමශිල්ප හා කුසලතා.

**පූර්ව අවශ්‍යතා හා දේශන මාධ්‍ය**

දර්ශනය හා මනෝවිද්‍යාව ශාස්ත්‍රවේදී උපාධිවලට ශිෂ්‍යයන් තෝරාගැනීම සඳහා පූර්ව අවශ්‍යතා කිසිවක් නොමැත. එසේ නමුත්, සාමය හා ගැටුම් නිරාකරණය අධ්‍යයනය කරන ශිෂ්‍යයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරාගනු ලැබේ.

දර්ශන විෂයට අදාළ දේශන සිංහල භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර මනෝවිද්‍යාව විෂය සඳහා සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය ද්විත්වයෙන්ම දේශන පවත්වනු ලැබේ. සාමය හා ගැටුම් නිරාකරණය විෂයට අදාළ දේශන ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

**අධ්‍යයන අංශය විසින් ඉදිරිපත් කරනු ලබන උපාධි පාඨමාලා**

දර්ශනය ශාස්ත්‍රවේදී
මනෝවිද්‍යාව ශාස්ත්‍රවේදී
දර්ශනය ශාස්ත්‍රවේදී ගෞරව
මනෝවිද්‍යාව ශාස්ත්‍රවේදී ගෞරව (සිංහල මාධ්‍ය)
මනෝවිද්‍යාව ශාස්ත්‍රවේදී ගෞරව (ඉංග්‍රීසි මාධ්‍ය)
සාමය හා ගැටුම් නිරාකරණ ගෞරව (ඉංග්‍රීසි මාධ්‍ය)
දර්ශනය ශාස්ත්‍රපති (එක් අවුරුදු)
දර්ශනය සමාජීය විද්‍යාපති (දෑ අවුරුදු)
දර්ශනපති ශාස්ත්‍රශූරී හා දර්ශන ශූරී

**උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

දර්ශනය අධ්‍යයන අංශය විසින් උපදේශනය විෂයට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවක් ද ඉදිරිපත් කරනු ලැබේ. විශ්වවිද්‍යාලයෙන් පරිබාහිර පුද්ගලයන්ට උපදේශනය විෂයයෙහි මූලික සංකල්ප පිළිබඳ දැනීම ලබා ගැනීමට ද ඔවුන්ගේ පෞරුෂ කුසලතා වර්ධනය කර ගැනීමට ද එමගින් සමාජයේ යහපත වර්ධනය කරගැනීමට ද අවස්ථාවක් ලබා දීම මෙම පාඨමාලාවේ අරමුණයි.

## 8.9 දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ටී.ඩබ්ලිව්.කේ. ඔසන්ත නයනප්‍රිය මයා - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.A. (C'bo), M.A. (C'bo), MSSc. (Kel'ya), Ph.D (USM, Malaysia)*
එම්. යමුනා නිරංජනී මෙන්ඩිස් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (C'bo), M.A. (C'bo), Attorney-at-Law, M.Phil (Kel'ya)*
ආචාර්ය ප්‍රියන්ත ඩබ්ලිව්. මුදලිගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D (Saga-Japan)*
ආචාර්ය එම්.කේ.එන්. දමයන්ති මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Perad'ya), PG Dip. (C'bo), MPPG (North-South), M.Phil. (Perad'ya), Ph.D(Flinders - Aus)*
ආචාර්ය ආර්.ඩී.පී. සම්පත් රාජපක්ෂ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Perad'ya), M.Phil. (Perad'ya), Ph.D. (CCNU)*
යූ.එල්. හිමාෂා ඩිල්ෂානි පෙරේරා මිය - කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
ඩබ්ලිව්. එම්. සරසි ෂායා බණ්ඩාර මෙනවිය - කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
එච්.ඩී. හසිතා ජීවන්ති මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (C'bo), M.A. (Perad'ya)*

දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය 2017 අගෝස්තු මස පළමුවන දින ස්ථාපනය කරනු ලැබීය. 1997 වර්ෂයේ දී ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය යටතේ දේශපාලන විද්‍යා ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව ආරම්භ කරන ලද අතර 1998 වර්ෂයේ දී එම අධ්‍යයන අංශය යටතේ ම දේශපාලන විද්‍යා විශේෂවේදී උපාධි පාඨමාලාව ආරම්භ කරනු ලැබීය.

මෙම අධ්‍යයනාංශය මඟින් ශාස්ත්‍රවේදී උපාධි හා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි මට්ටමින් ඉගැන්වේ. මෙම අධ්‍යයන අංශය මඟින් ශාස්ත්‍රපති (M.A.) සහ සමාජීය විද්‍යාපති (MSSc.) උපාධි පාඨමාලා පවත්වාගෙන යනු ලබන අතර දර්ශනපති (M.Phil.) සහ දර්ශන විශාරද (Ph.D.) උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ද අවස්ථාව ලබා දී ඇත.

**දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය මඟින් පවත්වනු ලබන උපාධි පාඨමාලා**
ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම වසර පරීක්ෂණයට දේශපාලන විද්‍යා විෂයය තෝරා ගැනීම සඳහා කිසිඳු පූර්ව අවශ්‍යතාවක් නොමැත. එම පරීක්ෂණයේ දී දේශපාලන විද්‍යා විෂයය සඳහා ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවෝ දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබති.

දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයන් දෙකෙන්ම පැවැත්වෙන අතර විෂය ඒකක විසිනමයකින් (29) යුක්ත ය. මෙය ප්‍රශ්න පත්‍ර විසිහයකින් (26), නිපුණතා සංවර්ධන විෂය ඒකක තුනකින් (03), ආයතනික පුහුණු පාඨමාලා ඒකකයකින් හා ස්වාධීන නිබන්ධිකාවකින් ද සමන්විත ය. ආයතනික පුහුණුව අවසානයේ දී ඒ පිළිබඳ වාර්තාවක් ද සැපයිය යුතු ය.

විද්‍යුත් ලිපිනය - hodpols@kln.ac.lk

## 8.10 සමාජ සංඛ්‍යානය අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

එල්.ඩබ්ලිව්. දසනායක මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*B.Sc. (Kel'ya), PG. Dip. (C'bo), MSSc. (Kel'ya)*
ආචාර්ය කේ.එම්.එල්.එම්. මංජුල ගුණරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), Ph.D. (UMS, Sabah)*
සී.ඩී. චතුරංග මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Sc. (C'bo)*
ආචාර්ය එච්.ආර්.එස්. සුලෝචනී - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.A. (SMU, S.Korea), Ph.D. (SNU, S.Korea)*
ඒ.අයි. ඇඹුල්දෙනිය - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), M.Sc. (C'bo)*
ඩී.එස්. කොඩිතුවක්කු - කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A(C'bo), M.Sc. (Moratuwa)*

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ සංඛ්‍යානය අධ්‍යයනාංශය ආරම්භ කරනු ලැබුවේ 2017 වසරේ අගෝස්තු මස 01 වන දින වන නමුත් සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රවේදී උපාධි සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලා පිළිවෙළින් 1991 වර්ෂයේ සහ 1992 වර්ෂයේ සිට ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය යටතේ පැවතිණි. එයට අමතර ව සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය මඟින් සමාජ සංඛ්‍යානය පිළිබඳ දර්ශනපති (M.Phil.) සහ දර්ශන විශාරද (Ph.D.) උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව ලබා දී ඇත.

**සමාජ සංඛ්‍යානය උපාධි පාඨමාලාව**

අ.පො.ස (සා.පෙ.) පරීක්ෂණයේ දී ගණිතය සඳහා C හෝ ඊට ඉහළ ශ්‍රේණියක් ලැබූ හෝ ඊට සමාන සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා සමාජ සංඛ්‍යානය විෂය තෝරාගැනීමට සුදුසුකම් ලබති.

ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම වසර පරීක්ෂණයේ දී සමාජ සංඛ්‍යානය විෂයයට ඉහළ ම ශ්‍රේණි ලකුණු සාමාන්‍ය ලබාගන්නා අයදුම්කරුවෝ සමාජ සංඛ්‍යානය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගැනීමට සුදුසුකම් ලබති.

සමාජ සංඛ්‍යානය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පරීක්ෂණය විෂය ඒකක තිස් එකකින් (31) සමන්විත ය. මෙය ප්‍රශ්න පත්‍ර විසිහයකින් (26), නිපුණතා සංවර්ධන විෂය ඒකක තුනකින් (03), ආයතනික පුහුණු පාඨමාලා ඒකකයකින් හා ස්වාධීන නිබන්ධිකාවකින් යුක්තය. ආයතනික පුහුණුව අවසානයේ දී ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වන අතර, ස්වාධීන නිබන්ධිකාව සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිතයෙන් තෝරාගත් විෂය ක්ෂේත්‍රයට අදාළ ව ඉදිරිපත් කළ යුතු ය.

## 8.11 සමාජ විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ඩී.එම්. උබේසේකර දිසානායක මයා - මහාචාර්ය
**(අංශ ප්‍රධාන)**
*B.A. (Kel'ya ), MSSc. (Kel'ya ), Ph.D. (Wuhan, PRC)*
මහාචාර්ය කේ. කරුණාතිලක මයා - විශ්‍රාම ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A. (S.J'pura), M.A. (S.J'pura), Ph.D. (JNU, India)*
මහාචාර්ය ඒ.වී.කේ. වසන්තා සුබසිංහ මිය - මහාචාර්ය
*B.A. (Kel'ya ), MSSc. (Kel'ya), Ph.D. (Wuhan, PRC)*
මහාචාර්ය කේ.එම්.ජී.සී.කේ. අමරතුංග මිය - මහාචාර්ය
*B.A. (S.J'pura), MSSc. (Kel'ya) Ph.D. (Kel'ya)*
මහාචාර්ය ටී.එම්.ඩී. සුභාෂිණී මිය - සහාය මහාචාර්ය
*B.A. (S.J'pura), M.A. (S.J'pura), Ph.D. (Kel'ya)*
ජී.ඩබ්ලිව්.ඩී.එන්. සිසිර කුමාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (S.J'pura.), MSSc. (Kel'ya)*
ආචාර්ය එල්.ඩී. සරත් විතාරණ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya ), MSSc. (Kel'ya ), Ph.D. (JNU, India)*
ආචාර්ය ඊ.ඒ.ඩී. අනූෂා එදිරිසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (S.J'pura), M.A. (S.J'pura), Ph.D (S.J'pura)*
එච්.ඒ. කුමුදු සුමේධා සංජීවනී මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), MSSc. (Kel'ya)*
ජේ.කේ. සුධීර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (S.J'pura), M.Phil. (S.J'pura)*
ඩබ්ලිව්.ඒ.ඩබ්ලිව්.එල්. වික්‍රමආරච්චි මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.A. (Kel'ya), MSSc (Kel'ya)*
ආර්.පී.අයි. චන්ද්‍රමාලී මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc (Kel'ya)*
ඩබ්.එම්.ජී.එන්. පනම්පිටිය මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), MSSc (Kel'ya)*
එච්.එස්.එන්. සිල්වා මිය - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), M.A. (Kel'ya)*
ආර්.එම්.ඒ.ඩී.බී. රත්නායක මයා - ආධුනික කථිකාචාර්ය
*B.A. (Kel'ya), MSSc (Kel'ya)-(Reading)*

සමාජීය විද්‍යා පීඨයට අයත් එක් අධ්‍යයනාංශයක් වන සමාජවිද්‍යා අධ්‍යයනාංශය වසර 30 ක ඓතිහාසික, සංඩිස්ථාන රැසක් සනිටුහන් කළ දීප්තිමත් අධ්‍යයනාංශයකි. මෙම අධ්‍යයනාංශය ස්වාධීන අධ්‍යයනාංශයක් ලෙස ස්ථාපිත වූයේ 1991 වසරේ දී ය. විශ්වවිද්‍යාලයේ ප්‍රමුඛ අධ්‍යයනාංශයක් ලෙස වැඩි ම ශිෂ්‍ය පිරිසක් මෙම අධ්‍යයනාංශයේ අධ්‍යයන කටයුතුවල නිරතව සිටිති. අභ්‍යන්තර ප්‍රථම උපාධි පාඨමාලාවට අමතර ව විවෘත හා දූරස්ථ අධ්‍යාපන උපාධි පාඨමාලාව ලෙස පාඨමාලා දෙකක් අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන අතර, සමාජීය විද්‍යා පීඨයේ දර්ශනපති හා දර්ශනශූරී පශ්චාත් උපාධි ඇතුළත් ව වැඩි ම පශ්චාත් උපාධි විද්‍යාර්ථීන් පිරිසකගේ අධ්‍යයන කටයුතු ද මෙහෙයවනු ලබයි. සමාජවිද්‍යා අධ්‍යනාංශය අභ්‍යන්තර ප්‍රථම උපාධි පාඨමාලාව හා පශ්චාත් උපාධි පාඨමාලා සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍යයන් දෙකෙන් ම පවත්වා ගෙන යනු ලබයි. කාලීන සමාජ ක්‍රියාකාරීත්වය හා අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අධ්‍යයනාංශය මඟින් පවත්වා ගෙන යනු ලබන සෑම උපාධි පාඨමාලාවක් ම ප්‍රායෝගික ඉගෙනුම් විෂය ඒකක සහිතව සැලසුම් කර තිබේ.

වර්තමානයේ අධ්‍යයනාංශය තුළ දේශීය හා ආසියානු කලාපයේ ඉතා ඉහළ ශ්‍රේණිගත විශ්වවිද්‍යාලවලින් තම ආචාර්ය උපාධි සම්පූර්ණ කර ගත් ඉහළ සුදුසුකම් සහිත ආචාර්ය මණ්ඩලයක් සේවය කරනු ලබන අතර, ඔවුන්ගේ ශාස්ත්‍රීය ලිපි ලේඛන දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රකාශන ලෙස එළි දක්වා තිබීම ද විශේෂත්වයකි. සමාජවිද්‍යා අධ්‍යයනාංශය ස්වකීය ශාස්ත්‍රීය පර්යේෂණ ශක්‍යතාව හා ධාරිතාව තහවුරු කරමින්, ආපදා කළමනාකරණය, සංවර්ධනාභිමුඛ ක්‍රියාකාරී සැළසුම්, ඇගයිම් සහ ප්‍රතිපත්ති සම්පාදනය ආදී ජාතික අවශ්‍යතා සපුරාලීමේ කාර්යයට ද උර දී සිටියි. අධ්‍යයනාංශයේ ආචාර්ය භවතුන් ගෝලීය සංවර්ධනය හවුල්කාරීත්වය සහිතව තිරසාර සංවර්ධනය සඳහා වූ ආසියාවේ දුප්පත්කම අවම කිරීමේ වැඩ සටහන්වලට ද සිය දායකත්වය ලබා දී තිබේ. එපමණක් ද නොව සමාජ විද්‍යා අධ්‍යයනාංශය සිය ශක්‍යතාව තහවුරු කරමින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන ශාස්ත්‍රීය කටයුතුවල නිරත වෙමින්, ආයතනික අවශ්‍යතා මත සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව හා විශෝධනය හා පුනරුත්ථාපනය පිළිබඳ ඩිප්ලෝමාව යන පාඨමාලා පවත්වා ගෙන යමින් ජාතික හා දකුණු ආසියාතික කලාපයේ අවශ්‍යතා සපුරාලීමේ කාර්යේ ද නිරතව සිටියි.

අධ්‍යයනාංශයේ දැක්ම (Vision) වන්නේ 'ජාතික සහ අන්තර් ජාතික මට්ටමට ගැළපීමට සමත් න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අත්දැකීම්වලින් පරිපූර්ණ වූ උසස් මට්ටමේ උපාධිධාරීන් බිහි කිරීමයි.' මෙම ඉලක්කය වෙත ළඟා වීමේ දී අධ්‍යයනාංශය සතු භූමිකාව වන්නේ 'උපාධිලාභීන්ට මානව සමාජය පිළිබඳ මනා දැනුම, ප්‍රතිජනනාත්මක ආකල්ප, ඇගයුම් සහ භාවිතයන් සංවර්ධනය කර ගනිමින් ඉතා ඉහළ හැකියාවක් සහ මට්ටමක් කරා ළඟා වීමට ඉඩ ප්‍රස්ථා ලබා දීමයි.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 011 2914490/ 011 2903930 (අංශ ප්‍රධාන) |
| | - | 011 2903939 (කාර්යාලය) |

## 8.12 ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

එම්.කේ.ඒ. අනෝමා රත්නායක මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), M.S.Sc. (SNU, South Korea)*
ජයන්ත කලන්සූරිය මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Com (Kel'ya), PG Dip. in International Affairs (BCIS), MA in Japanese Studies (C'bo), M.Com.(Kel'ya)*
ආචාර්ය පී.ඩී.වී. චාරිකා වික්‍රමරත්න මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), MSSc (Kel'ya), Ph.D. (MSU, Malaysia)*
නිලන්ත රාමනායක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), MA (Kel'ya), M.Phil. (Kel'ya)*
ඩබ්.එම්.ඒ.එම්. ජයවර්ධන මයා - කථිකාචාර්ය
*B.A. (Kel'ya), MSc (Northumbria, UK)*
ඩබ්.එම්.ආර්.කේ. වීරකෝන් මයා - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), MSc (Northumbria, UK)*
ඩී.එල්.අයි.එච්.කේ. පීරිස් මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.A. (Kel'ya), CCHRM (IPM in SL), Dip. in Counselling & Psychotherapy (IPS, SL),*
*Dip. in Management of Olympic Sport Organizations (NOC, SL), M.A. (Tsukuba, Japan)*
ඩබ්.ජී.ඩී.එස්. වැහිගල්දෙනිය මෙය - කථිකාචාර්ය
*B.A.(Kel'ya), M.SM (SNU, South Korea)*

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය 2015 වසරේ ස්ථාපිත කරන ලදි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ ශාස්ත්‍රවේදී උපාධිය සහ ගෞරව උපාධිය පිරිනැමීමට කැපවූ පළමු අධ්‍යයන අංශය මෙයයි. මෙම උපාධි පාඨමාලාවන්හි මූලික පරමාර්ථය වන්නේ, මනා සමබර පෞරුෂයකින් යුතු පුරවැසියකු බිහි කිරීමට උපකාරී වන ක්‍රියාශීලී, සෞඛ්‍ය සම්පන්න, සාමකාමී පුද්ගලයකු බවට පත් වීමට උපකාරීවන දැනුම, කුසලතා, ආකල්ප තුළින් විද්‍යාර්ථියකු බිහි කිරීමයි. රටක සංවර්ධනය සඳහා අවශ්‍ය වන කාර්යක්ෂමතාව, ඵලදායිතාව, කැපවීම, වගකීම, වගවීම්, යන ගුණාංගයන්ගෙන් යුතු පෞරුෂයන් බිහිකිරීම අවශ්‍ය වේ. මෙම භෞතික නොවන සංස්කෘතික වටිනාකම් බොහොමයක් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ද මග පාදනු ඇත.

ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ ශාස්ත්‍රවේදී උපාධිය සහ ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ ගෞරව උපාධි පාඨමාලා ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණය සඳහා අවශ්‍ය අධ්‍යයන පදනම සංවර්ධනය කිරීම, ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණය සඳහා අවශ්‍ය දැනුම ලබා දීම, කුසලතා සහ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා සකස් කර ඇත. ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ විෂය, ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික ක්ෂේත්‍රයට අයත් විෂයක් මෙන් ම ප්‍රධාන අංගයක් ලෙස හඳුන්වා දිය හැකි ය. ගෞරව උපාධි පාඨමාලාව තුළ ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳව පුළුල් ලෙස අවධානය යොමු කෙරෙනු ඇත.

ප්‍රථම උපාධි මට්ටමේ පාඨමාලාවන් පමණක් නොව, ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය වන අනෙකුත් අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කිරීම මඟින් සිය සේවාව ස්තර පරාසයන් දක්වා ව්‍යාප්ත කිරීමට සමාජීය විද්‍යා පීඨයේ ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය කටයුතු කර ඇත. ඒ අනුව 2018 වසරේ දී ක්‍රීඩා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව, 2019 වසරේ දී ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සහ 2023 වසරේ දී ශාරීරික අධ්‍යායපන සහ ක්‍රීඩා කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ද පවත්වාගෙන යනු ලැබේ. මෙම පාඨමාලාවන් මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ විධායක නිලධාරීන්, පරිපාලකයන්, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ

පුහුණුකරුවන් මෙන් ම ක්‍රීඩා නිලධාරීන් අතර ජනප්‍රිය පාඨමාලාවන් බවට පත්ව ඇත. ක්‍රීඩා ක්ෂේත්‍රයේ අධ්‍යාපනය හැදෑරීමට බලාපොරොත්තු වන තරුණ තරුණියන් විශාල පිරිසක් මෙම පාඨමාලාවන් සඳහා සහභාගී වීමට අපේක්ෂා කෙරේ.

ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ ශාස්ත්‍රවේදී උපාධිය සහ ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ ගෞරව උපාධිය ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණය සඳහා අවශ්‍ය වන ශාස්ත්‍රීය පදනමක් සකස් කිරීමට මෙන්ම, එය ආර්ථික වටිනාකමින් හෙබි ක්‍රියාදාමයක් ලෙස සකස් කිරීමට අවශ්‍ය දැනුම වර්ධනය කිරීමට සුදුසු වන අයුරින් සකස් කර ඇත. කලා විෂය ධාරාවන් යටතේ උපාධිය හැදෑරීමට සුදුසුකම් ලබන ඕනෑ ම විද්‍යාර්ථියකු සඳහා කළමනාකරණ විෂයන්ගේ දැනුම ලබා ගත හැකි උපාධි පාඨමාලාවක් ලෙස ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ උපාධි පාඨමාලාව හඳුන්වා දිය හැකිය. මීට අමතර ව මෙම විෂය යටතේ වරණීය සහ ආධාරක විෂය ඒකක පහක් විශ්වවිද්‍යාලයේ සියලුම විද්‍යාර්ථීන්ට අධ්‍යයනය කළ හැකි පරිදි සකස් කර ඇත. මෙම උපාධි පාඨමාලා තුළ කළමනාකරණය, ආර්ථික විද්‍යාව, අලෙවිකරණය, මානව සම්පත් කළමනාකරණය, ඉසව් කළමනාකරණය, ප්‍රතිපත්ති සම්පාදනය, තොරතුරු තාක්ෂණය, මනෝවිද්‍යාව, නීතිය, සමාජ විද්‍යාව, සන්නිවේදනය, සංඛ්‍යානය සහ මූල්‍ය යනාදී විෂයන් ක්‍රීඩා සහ විශ්‍රාන්ති ක්ෂේත්‍රයට අදාළව හැදෑරීම සඳහා අවධානය යොමු කෙරේ. ඒ අනුව ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා හරස් විනය සහ බහුවිධ ශික්ෂණයක් ලබා දෙන අධ්‍යාපනික වැඩසටහන් වීම විශේෂත්වයකි.

මෙම උපාධිය හැදෑරීම සඳහා විශේෂ සුදුසුකම් සපුරාලීම අවශ්‍ය නොවන අතර, කලා විෂය ධාරාවන් යටතේ උපාධිය හැදෑරීමට අපේක්ෂා කරන ඕනෑම විද්‍යාර්ථියකු සඳහා ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවක් සහ ගෞරව උපාධි පාඨමාලාවක් ලෙස හැදෑරීමට පහසුකම් සලසා ඇත. සමාජීය විද්‍යා පීඨය/මානව ශාස්ත්‍ර පීඨය යටතේ ලියාපදිංචි වන ඕනෑම විද්‍යාර්ථියකුට මෙම උපාධි පාඨමාලාව හැදෑරීමට හැකියාව පවතී. මෙම උපාධිය හැදෑරීමට ක්‍රීඩා පිළිබඳ මූලික කුසලතාවන් ලබා තිබීම අත්‍යවශ්‍ය නොවේ. මෙම ශාස්ත්‍රවේදී උපාධිය සහ ගෞරව උපාධිය සිංහල මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලැබේ.

ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ ගෞරව උපාධිය හැදෑරීම සඳහා, ප්‍රථම වසර පරීක්ෂණයේ දී ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ විෂයට ඉහළ සාමාර්ථ ගන්නා විද්‍යාර්ථීන් සුදුසුකම් ලබයි. විශේෂයෙන් ගෞරව උපාධිය හදාරන විද්‍යාර්ථීන් සඳහා සීමාවාසික පුහුණු වැඩසටහනක් පවත්වා ගෙන යනු ලැබේ. ඒ සඳහා මෙම විෂය ක්ෂේත්‍රයන්ට අදාළ රාජ්‍ය සහ පෞද්ගලික ආයතනයන් සඳහා විද්‍යාර්ථීන් යොමු කිරීම විශේෂත්වයකි. තවද මෙම විෂය ක්ෂේත්‍රයට අදාළව පවතින ජාතික සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ඇති අවස්ථා, විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ පර්යේෂණ අවස්ථාවන් සඳහා විද්‍යාර්ථීන් යොමු කරවීමට හැකි වන පරිදි අධ්‍යයන කටයුතු සකස් කර ඇත.

ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය, ක්‍රීඩා සහ විශ්‍රාන්ති ක්ෂේත්‍රයට සම්බන්ධ ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සමීප සබඳතා ඇත. ක්‍රීඩා අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජිත ආයතනය, සමඟ සබඳතා ගොඩ නඟා ගනිමින් ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ උපාධිධාරීන් රටේ සංවර්ධනය වෙනුවෙන් පමණක් නොව ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණ ක්ෂේත්‍ර සඳහා දායක කරගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට පියවරගෙන ඇත. තවද ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සම්පත් දායකයින්ගේ සේවාව ලබා ගැනීමට සැලසුම් සකස් කර ඇත. සමාජීය විද්‍යා පීඨයේ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට අධ්‍යයන අංශයක් ලෙස දායකත්වය ලබා දීම සඳහා මෙම සියලු ක්‍රියාදාමයන් උපකාරී වනු ඇත.

දුරකථන අංකය -011 2903942 අභ්‍යන්තර අංක - 011 2903935 / 941, 942

# 8.13 තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය

**අධ්‍යන කාර්යමණ්ඩලය**

මහාචාර්ය අජිත් දිසානායක මයා - මහාචාර්ය
B.A. (Kel' ya), M.A. (S.J' pura), Ph.D. (Kel'ya)
කේ.එ.ටි චාමර මයා - ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
BSc.(Sp)(Kel'ya), MSSc.(Kel'ya), BIT (HDIT)(Colombo), SCJP
පී.ආර්.අයි.එල් ජයසූරිය මයා - කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)
BSc (Special) in Computer Science (kel'ya), MCS (UCSC)
ජී පිටිගල මයා - පරිගණක තාක්ෂණ උපදේශක ශ්‍රේණිය (II) (නිවාඩු)
M.Sc.(IT) PgD(P.A) B.Sc.(kln)
කේ.එ.එස් මදුසංඛ මයා - පරිගණක තාක්ෂණ උපදේශක ශ්‍රේණිය (II)
MSc (Kel'ya)(Reading) ,B.Sc.(Kel'ya)

## තොරතුරු තාක්ෂණය අධ්‍යනාංශය

තොරතුරු තාක්ෂණ දියුණුවේ ගතික වෙනස්වීම්වලටවලට අනුගත වෙමින් කලා උපාධිධාරින්ගෙන් බහුතරයක් තොරතුරු තාක්ෂණ දැනුමැති උපාධිධාරීන් ලෙස ලෝකයට දායාද කිරීමේ අරමුණින්, 2022 අප්‍රේල් 6 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයක් යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ 13 වැනි අධ්‍යානාංශය ලෙස ආරම්භ කරන ලදී.

## තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව

කලා උපාධිධාරින්ගේ රැකියා අවස්ථා ඉහළ නැංවීමේ අරමුණින් මෙම අධ්‍යනාංශය විසින් සමජීය සමජීය විද්‍යා පීඨයට සහ මානව ශාස්ත්‍ර පීඨයට ඇතුළත් වූ සිසුන් 1700කට ආසන්න සංඛ්‍යාවකට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ කාලීන හා අදාළ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව පිරිනමයි. සිසුන්ට තම ප්‍රධාන උපාධි පාඨමාලාවට සමගාමී ව බාස්කට් 6ක් යටතේ තමන් කැමති විෂය ධාරාවක් තෝරාගෙන මෙම තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව අවසන් කිරීමට හැකියාව ඇත. අධ්‍යයන සම්භාර 30 කින් සමන්විත Dip (IT) (SLQF Level 3) වැඩසටහනේ කාලසීමාව මාස 36 ක් වන අතර එය සිංහල සහ ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන් ම මෙහෙයවනු ලබයි. එමෙන්ම ශාස්ත්‍රවේදි සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාවේ තොරතුරු තාක්ෂණ සම්බන්ධ විෂය ඒකක මෙහෙයවීම ද තොරතුරුව තාක්ෂණ අධ්‍යනාංශය මගින් සිදු කරනු ලබයි.

මෙම අධ්‍යානාංශයේ ප්‍රමුඛත ම අරමුණ වන්නේ ගෝලීය වශයෙන් රැකියා නියුක්ත පුද්ගලයන් බිහි කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි කලා උපාධිධාරින්ගේ උනන්දුව ඇති කරන අතර ම එමගින්, ශ්‍රම වෙළෙඳපොල රැකියා අවශ්‍යතා පියවීම සඳහා ඔවුන්ගේ කුසලතා සහ නිපුණතා ඔප් නැම්වීමයි.

# 09. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවලට අදාළ මූලික කරුණු

කැලණිය විශ්වවිද්‍යාලයේ කලා උපාධි පාඨමාලා මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ දෙක මගින් පවත්වාගෙන යනු ලැබේ. කලා උපාධි පාඨමාලා සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ පසු අ.පො.ස. (උසස් පෙළ) සඳහා හදාරනු ලැබූ විෂයයන් සහ (Z-Score) අගය පදනම් කරගෙන පීඨ දෙකට සිසුන් වෙන් කරනු ලැබේ. ශිෂ්‍යයා අයත් වන පීඨයෙන් උපාධිය සඳහා අවම වශයෙන් විෂයයන් දෙකක් තෝරා ගැනීම අනිවාර්ය වේ.

ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව ඒකක ක්‍රමය යටතේ අර්ධ වාර්ෂික දෙකකින් යුත් අධ්‍යයන වර්ෂ 3ක් තුළ පැවැත් වේ. **තම රුචිය පරිදි තෝරා ගනු ලබන විෂය සංකලන හැදෑරීමට** පහසු වන පරිදි මෙම පාඨමාලා සංවිධානය කරනු ලැබ ඇත. මෙම ක්‍රමය යටතේ ඇති **ඒකක** නම් කරනු ලැබ ඇත්තේ පිළිවෙළින් ඉංග්‍රීසි අකුරු හතරකින් ආරම්භ ව අංක කීපයක් සහිත වන සංකේත මඟිනි. මුල් ඉංග්‍රීසි අකුරු හතර එම පාඨමාලා ඒකකයට අයත් විෂය හැඳින්වෙන ඉංග්‍රීසි වචනයේ සංක්ෂේපණයකි.

එක් විෂයයකට අයත් වන පාඨමාලාවක්, ඒකක කීපයකින් සමන්විත ය. ඒකකයකට දේශන පැය 30ක හෝ 60ක හෝ 90ක හෝ කාලයක් ඇතුළත් වේ.

ශාස්ත්‍රවේදී උපාධිය සඳහා ප්‍රධාන විෂයයන් 3ක් තෝරා ගැනීමට අවස්ථාව ඇත. මෙම සංකලන සැකසී ඇත්තේ විද්‍යාර්ථියාට තමන් විසින් හදාරනු ලබන විෂයයන් පිළිබඳ ප්‍රමාණවත්, ගැඹුරු දැනුමක් මෙන් ම විවිධ විෂයයන් පිළිබඳ පෘථුල දැනුමක් ලබා ගැනීමට අවකාශ සැලසෙන පරිදිය. තම විෂය සංකලනයේ අනිවාර්ය පාඨමාලා ඒකක හැදෑරීමට අතිරේක ව මානවශාස්ත්‍ර, සමාජීය විද්‍යා, මෙන් ම වාණිජ හා කළමනාකරණ අධ්‍යයන හෝ විද්‍යා යන සෙසු පීඨයන් මඟින් ඉදිරිපත් කරනු ලබන ඇතැම් පාඨමාලා ඒකක තම රුචිය පරිදි තෝරාගෙන හැදෑරීමට මෙම ක්‍රමය මඟින් අවකාශ සලසා තිබේ.

පාඨමාලා ඒකකයක වටිනාකම මැනීම පිණිස එම ඒකකයක් සඳහා පවත්වනු ලබන දේශන පැය සංඛ්‍යාවට සාපේක්ෂ ව '**අධ්‍යයන සම්භාර**' (Credit) නමින් මිනුම් ඒකකයක් හඳුන්වා දී ඇත. ඒ දේශන පැය 15ක් අඩංගු වන පාඨමාලා ඒකකයක් අධ්‍යයන සම්භාර 01ක අගයකින් යුක්ත ය. සෑම විද්‍යාර්ථියකු ම, අධ්‍යයන වර්ෂයක් තුළ දී අවම වශයෙන් අධ්‍යයන සම්භාර 30ක අගයකින් යුතු පාඨමාලා ඒකක හදාරා තිබිය යුතු වන අතර ශාස්ත්‍රවේදී උපාධිය සඳහා වන අධ්‍යයන වර්ෂ 3 තුළ දී, අවම වශයෙන් අධ්‍යයන සම්භාර 90කින් යුත් පාඨමාලා ඒකක හදාරා තිබිය යුතු ය. මෙම පීඨ දෙකෙහි සමහර විෂයයන් සඳහා **පූර්ව අවශ්‍යතා** සපුරා තිබීම අවශ්‍ය වේ.

### 9.1 විෂයයන් තෝරා ගැනීමේ පූර්ව අවශ්‍යතා

ශාස්ත්‍රවේදී උපාධි සඳහා පහත සඳහන් විෂයයන් හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන්, එම විෂයයට අදාළ ව දක්වා ඇති පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු යః

| **විෂයයන්** | | **පූර්ව අවශ්‍යතා** |
|---|---|---|
| **ප්‍රංශ/ජපන්** | - | අ.පො.ස. (උ. පෙ.) විභාගයෙන් ප්‍රංශ/ජපන් විෂය සමත් වී තිබීම හෝ අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම. |
| **ඉංග්‍රීසි/ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම** | - | අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් ඉංග්‍රීසි විෂය සමත් වීම. |

| | | |
|---|---|---|
| **භාෂා පරිවර්තන ක්‍රම** | - | සිංහල/ඉංග්‍රීසි ප්‍රවීණතාව පිළිබඳ ව වාග්විද්‍යා අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන පරීක්‍ෂණයෙන් සමත් වීම. |
| **දෙමළ/දෙවන භාෂාවක් ලෙස දෙමළ ඉගැන්වීම** | - | අ.පො.ස. (සා.පෙ.) දෙවන බස - දෙමළ විෂයය සමත් වීම හා වාග්විද්‍යා අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම. |
| **සමාජ සංඛ්‍යානය** | - | ගණිතය සඳහා අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සම්මාන සාමර්ථ්‍යය ලබා තිබීම. |
| **භූගෝල විද්‍යාව** | - | අ.පො.ස (උ.පෙ.) විභාගයෙන් භූගෝල විද්‍යාව විෂයය සමත් වීම. |
| **සිනමා සහ රූපවාහිනී අධ්‍යයන** | - | නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය මඟින් පවත්වන පරීක්ෂණයෙන් සමත් වීම |

**9.2 විෂය සමූහ**

තම විෂය සංකලනයේ මූලික විෂයයන් තෝරා ගැනීමේ දී පූර්ව අවශ්‍යතාවන්ට අමතර ව විෂය වර්ගීකරණය යටතේ දක්වා ඇති සංකලන ද සැලකිල්ලට ගත යුතු ය. **විෂය කාණ්ඩ සමූහයේ අන්තර්ගත එක් විෂය කාණ්ඩයකින් තෝරාගත හැක්කේ එක් මූලික විෂයයක් පමණි.**

(වරණීය හෝ ආධාරක ඒකක තෝරා ගැනීමේ දී මේ සීමාව බලපවත්වයි.)

| | | |
|---|---|---|
| විෂය කාණ්ඩ 01 | : | ANTH/BUCU/HIND/ SOST/ TCRM |
| විෂය කාණ්ඩ 02 | : | FREN/GEOG/PALI/VIAD/PADN/PAMU/SPNS |
| විෂය කාණ්ඩ 03 | : | ARCH/CHCU/KORE/POLS/LTCR |
| විෂය කාණ්ඩ 04 | : | HIST/IMAT/LING/ PHIL |
| විෂය කාණ්ඩ 05 | : | BUPH/CHIN/ECON/GERM/WCCU |
| විෂය කාණ්ඩ 06 | : | INTS/JPNS/LISC/ PSYC/ RUSS/SANS/BUPS |
| විෂය කාණ්ඩ 07 | : | DVST/SOCI/TRMD/EDUC |
| විෂය කාණ්ඩ 08 | : | SINH |
| විෂය කාණ්ඩ 09 | : | MACO/ENGL/PRMM/VAST |
| විෂය කාණ්ඩ 10 | : | COST/DMAT/SRMG/TASL |

**9.3 නිශ්චිත අධ්‍යයන පාඨමාලා - පහතින් සඳහන් පාඨමාලා හැදෑරීමට විශ්වවිද්‍යාලයට ප්‍රවේශය ලබන සිසුන් අදාළ අධ්‍යයන අංශයෙන් පාඨමාලා පිළිබඳ විස්තර ලබා ගත යුතුය.**

i. භාෂා පරිවර්තන ක්‍රම (TRMD)
ii. සිනමා හා රූපවාහිනී අධ්‍යයනය (BAFT)
iii. දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL)
iv. සාමය හා ගැටුම් නිරාකරණය (PECR)

| හැකුළුම | විෂයය | හැකුළුම | විෂයය |
|---|---|---|---|
| ANTH | මානව විද්‍යාව | ECON | ආර්ථික විද්‍යාව |
| ARCH | පුරාවිද්‍යාව | ENGL | ඉංග්‍රීසි |
| BUCU | බෞද්ධ සංස්කෘතිය | DELT | සාමාන්‍ය ඉංග්‍රීසි |
| BUPH | බෞද්ධ දර්ශනය | FREN | ප්‍රංශ |
| CHCU | ක්‍රිස්තියානි සංස්කෘතිය | GEOG | භූගෝල විද්‍යාව |
| CHIN | චීන | GERM | ජර්මන් |

| | |
|---|---|
| COST | පරිගණක අධ්‍යයනය |
| DMAT | නාට්‍ය හා රංග කලාව |
| DVST | සංවර්ධන අධ්‍යයනය |
| INTS | ජාත්‍යන්තර අධ්‍යයනය |
| JPNS | ජපන් |
| KORE | කොරියන් |
| LING | වාග්විද්‍යාව |
| LISC | පුස්තකාල හා විඥාපන විද්‍යාව |
| LTCR | සාහිත්‍ය විචාරය |
| MACO | ජනසන්නිවේදනය |
| PALI | පාලි |
| PRMM | මහජන සම්බන්ධතා හා මාධ්‍ය කළමනාකරණය |
| TRMD | භාෂා පරිවර්තන ක්‍රම |
| PECR | සාමය හා ගැටුම් නිරාකරණය |
| PHIL | දර්ශනය |
| PSYC | මනෝවිද්‍යාව |
| SANS | සංස්කෘත |
| VAST | වාස්තුශාස්ත්‍ර |
| BAFT | සිනමා සහ රූපවාහිනී අධ්‍යයන |
| TRSP | භාෂා පරිවර්තන අධ්‍යයනය |
| HIND | හින්දී |
| HIST | ඉතිහාසය |
| IMAT | ප්‍රතිබිම්බ කලා |
| SINH | සිංහල |
| SOCI | සමාජ විද්‍යාව |
| SOST | සමාජ සංඛ්‍යානය |
| SRMG | ක්‍රීඩා හා විශ්‍රාන්ති කළමනාකරණය |
| TAML | දෙමළ |
| TASL | දෙවන භාෂාවක් ලෙස දෙමළ |
| TCRM | සංචරණය හා සංස්කෘතික සම්පත් කලමනාකරණය |
| TESL | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම |
| VIAD | දෘශ්‍ය කලා |
| WCCU | බටහිර සම්භාව්‍ය සංස්කෘතිය |
| POLS | දේශපාලන විද්‍යාව |
| RUSS | රුසියන් |
| PADN | ප්‍රාසාංගික කලා නර්තනය |
| PAMU | ප්‍රාසාංගික කලා සංගීතය |
| EDCU | අධ්‍යාපනවේදය |
| SPNS | ස්පාඤ්ඤ |
| BUPS | බෞද්ධ මනෝවිද්‍යාව |

## 9.4 අන්තර් පීඨ විෂයමාලා සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
### [Inter-Faculty Center for Co-ordinating the Modular Systems (ICCMS)]

**අධ්‍යක්ෂ**
ආචාර්ය කේ.එම්.එල්.එම්.එම්. ගුණරත්න මයා
*B.A. (Kel'ya), MSSc. (Kel'ya), Ph.D. (UUS,Sabah)*

**අධ්‍යයන සහය කාර්යමණ්ඩලය**
ඩී.එම්.එන්.ජේ. දිසානායක මයා - පරිගණක වැඩසටහන් සම්පාදක සහ පද්ධති විශ්ලේෂක (I ශ්‍රේණිය)
*MIT (UCSC), B.Sc. (Kel'ya), H.Dip.in Electronics (London-Tec.), SLCDL (NAITA)*
පී.එච්.ඩබ්. නයනානන්ද මයා - පරිගණක වැඩසටහන් සම්පාදක සහ පද්ධති විශ්ලේෂක (II ශ්‍රේණිය)
*B.Sc. Hons (Kel'ya)*
කේ.පී.එච්.එම්. කාරියවසම් මිය - සහකාර ශිෂ්‍ය උපදේශිකා (II ශ්‍රේණිය)
*B.A. (Kel'ya), MA (Kel'ya), Dip. in Counselling Psychology (SLMHF), Ad dip in Psychotherapy (SLMHF), Dip in drug counselling (NDDCB), Dip in HRM (IMBS University)*
කේ.එම්. රණසිංහ මිය - සහකාර ශිෂ්‍ය උපදේශිකා (II ශ්‍රේණිය)
*B.A. Sp in Philosophy and Phychology (S.J'pura), MA (NIIBS), PGD in Counseling (UOC), Dip in Counseling Psychology (MHF), PCSA membership ID 303/2019, LLB (Hons) UK, AAL (Reading) SLLC*

මානවශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨවලට අයත් අභ්‍යන්තර විද්‍යාර්ථීන්, විෂයයන් හා පාඨමාලා ඒකක සඳහා ලියාපදිංචි කිරීමේ කටයුතු මෙම මධ්‍යස්ථානය (ICCMS) (K3-017) මගින් සිදු කෙරේ. තව ද කාලසටහන් සකස් කිරීම (දේශන හා විභාග), විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සහතික පත්‍ර සකස් කිරීම, අධ්‍යයන වාර්තා ලබාදීම, විභාග ප්‍රතිඵල අන්තර්ජාලයට එක්කිරීම යනාදී කටයුතු ද මෙම මධ්‍යස්ථානය මඟින් සිදු කෙරේ.

විෂය ලියාපදිංචිය සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේ ම සිදු කරනු ලැබේ. එනම් සෑම විද්‍යාර්ථියෙකු ම තම අධ්‍යයන වර්ෂයට නියමිත පාඨමාලාවට අදාළ විෂයයන් තෝරා ගත් පසුව එම විෂයයන් සඳහා ICCMS හි ලියාපදිංචි විය යුතුය. **දේශන ආරම්භ වී සති දෙකක් අවසන් වීමට පෙර මෙම ලියාපදිංචි කිරීමේ කටයුතු අවසන් කෙරේ.**

ප්‍රථම වසර නවක විද්‍යාර්ථීන් සහ විශේෂ උපාධි පාඨමාලාවේ ප්‍රථම වසර විද්‍යාර්ථීන් හැර මානවශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨවලට අයත් සෙසු සියලු ම විද්‍යාර්ථීන් තම අධ්‍යයන ලියාපදිංචිය අන්තර්ජාලය හරහා සිදු කළ යුතු අතර ඒ සඳහා ICCMS නිල වෙබ් අඩවියට පිවිසිය යුතු ය. ICCMS මධ්‍යස්ථානයට අදාළ සියලු ම දැන්වීම් ICCMS නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

දුරකථන අංකයඃ 2987416
අභ්‍යන්තර අංකඃ 640/641/642/643
විද්‍යුත් ලිපිනය: iccms@kln.ac.lk
ICCMS නිල වෙබ් අඩවිය: iccms.kln.ac.lk

# වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය



# වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

## පීඨාධිපති, අධ්‍යයනාංශ ප්‍රධානීන් සහ පරිපාලන නිලධාරී



මහාචාර්ය ඩබ්ලිව්.එම්.සී.බී. වන්නිනායක මයා
පීඨාධිපති, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය



මහාචාර්ය ඩී.කේ. යාපා අබේවර්ධන මිය
අංශ ප්‍රධාන
ගණකාධිකරණ අධ්‍යයනාංශය



මහාචාර්ය එච්.ඒ. කේ.එන්. එස්. සුරංගි මිය
අංශ ප්‍රධාන
වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය



ආචාර්ය ජේ.එම්.ආර්. ප්‍රනාන්දු මිය
අංශ ප්‍රධාන
මූල්‍ය අධ්‍යයනාංශය



එම්.ඩී.පී. පීරිස් මයා
අංශ ප්‍රධාන
මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය



ආචාර්ය එස්. එස්. ජේ. පටබැඳිගේ මයා
අංශ ප්‍රධාන
අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය



එච්.ඒ.ඒ.අයි. හෙට්ටිආරච්චි මිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

# 10. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**පීඨාධිපති**
මහාචාර්ය ඩබ්ලිව්.එම්.සී.බී. වන්නිනායක මයා
*B.Sc. (Mkt.) Mgt. (Special) (S.J'Pura), Dip. in M. (UK), MBA (C'bo), P.hD. (TBU-Czech Republic)*

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි**
එච්.ඒ.ඒ.අයි. හෙට්ටිආරච්චි මිය
*BSc (Hons) (Perad'ya), PG Dip in GIS and Remote Sensing (Perad'ya)*

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය 1995 දී පිහිටවනු ලැබී ය. අ.පො.ස.(උ.පෙළ) පරීක්ෂණයේ වාණිජ විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාලයට ඇතුළත් වන විද්‍යාර්ථීන් සඳහා වාණිජ හා කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ ප්‍රථම උපාධිය පිරිනැමීම පීඨයේ ප්‍රධාන කර්තව්‍යය වේ. එසේ ම පීඨය මඟින් වසරකට තුන්වතාවක් *'Kelaniya Journal of Management'* නමින් පර්යේෂණ සඟරාවක් ද ප්‍රකාශයට පත් කරනු ලබයි.

මෙම පීඨය වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය, ගණකාධිකරණ අධ්‍යයනාංශය, අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය සහ මූල්‍ය අධ්‍යයනාංශය නම් වූ අධ්‍යයන අංශ පහකින් සමන්විත වේ. මෙම පීඨය මඟින් ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි, ව්‍යාපාර පරිපාලන දර්ශන විශාරද උපාධි පාඨමාලාව සහ ඩිප්ලෝමා පිරිනැමේ. මීට අමතරව පීඨය මඟින් වාණිජ හා කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපාර පරිපාලනපති උපාධියක් ද පවත්වාගෙන යනු ලබයි. මෙම සියලු ම උපාධි පාඨමාලා, *Sri Lankan Qualification framework (SLQF)* සහ වෙළඳපොළ අවශ්‍යතාවලට අනුකූලව සකස් කර ඇත.

**ප්‍රථම උපාධි පාඨමාලා**

- වාණිජවේදී ගෞරව උපාධිය [Bachelor of Commerce Honours Degree] - වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය
- වාණිජවේදී ව්‍යාපාර තාක්ෂණ ගෞරව උපාධිය [Bachelor of Commerce Honours Degree in Business Technology] - වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය
- වාණිජවේදී ව්‍යවසායකත්ව ගෞරව උපාධිය [Bachelor of Commerce Honours Degree in Entrepreneurship] - වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය
- වාණිජවේදී මූල්‍ය කළමනාකරණ ගෞරව උපාධිය [Bachelor of Commerce Honours Degree in Financial Management] - වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය
- ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් ගෞරව උපාධිය [Bachelor of Business Management Honours Degree in Human Resource] - මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය
- ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව ගණකාධිකරණ උපාධිය [Bachelor of Business Management Honours in Accountancy Degree] - ගණකාධිකරණ අධ්‍යයනාංශය

- ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව විගණනය හා වෝහාරික ගිණුම්කරණය උපාධිය [Bachelor of Business Management Honours in Auditing and Forensic Accounting Degree] - ගණකාධිකරණ අධ්‍යයනාංශය
- ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව ගිණුම්කරණ තොරතුරු පද්ධති උපාධිය [Bachelor of Business Management Honours in Accounting Information Systems Degree] - ගණකාධිකරණ අධ්‍යයනාංශය
- ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධිය [Bachelor of Business Management Honours Degree Finance] - මූල්‍ය අධ්‍යයනාංශය
- ව්‍යාපාර කළමනාකරණවේදී බැංකුකරණ ගෞරව උපාධිය (යෝජිත නම - ව්‍යාපාර කළමනාකරණවේදී බැංකුකරණ හා මූල්‍ය ගෞරව උපාධිය - වි.ප්‍ර.කො. අනුමැතියට යටත්ව ) [Bachelor of Business Management Honours Degree in Banking] - මූල්‍ය අධ්‍යයනාංශය
- ව්‍යාපාර කළමනාකරණවේදී රක්ෂණ ගෞරව උපාධිය (යෝජිත නම - ව්‍යාපාර කළමනාකරණවේදී රක්ෂණ හා මූල්‍ය ගෞරව උපාධිය - වි.ප්‍ර.කො. අනුමැතියට යටත්ව ) [Bachelor of Business Management Honours Degree in Insurance] - මූල්‍ය අධ්‍යයනාංශය
- ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණ ගෞරව උපාධිය [Bachelor of Business Management Honours Degree in Financial Engineering] - මූල්‍ය අධ්‍යයනාංශය
- ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණ ගෞරව උපාධිය [Bachelor of Business Management Honours Degree in Marketing] - අලෙවි කළමනාකරණ අධ්‍යයනාශය
- ව්‍යාපාර කළමනාකරණවේදී ඩිජිටල් අලෙවිකරණ ගෞරව උපාධිය [Bachelor of Business Management Honours in Digital Marketing] - අලෙවි කළමනාකරණ අධ්‍යයනාශය
- වාණිජවේදී (විශේෂ) උපාධිය - බාහිර Bachelor of Commerce (Special / General) Degree – External - වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනිංශය
- ව්‍යාපාර කළමනාකරණවේදි (සාමාන්‍ය) උපාධිය - බාහිර Bachelor of Business Management. (General) Degree - External] - මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය

**පශ්චාද් උපාධි පාඨමාලා**

- වාණිජ විද්‍යාපති උපාධිය
  [Master of Commerce Degree]
- ව්‍යාපාර පරිපාලනපති උපාධිය
  [Master of Business Administration Degree
- මානව සම්පත් කළමනාකරණපති උපාධිය
  [Master of Human Resource Management Degree]
- ව්‍යාපාර පිළිබඳ ගිණුම්කරණපති උපාධි පාඨමාලාව
  [Master of Business in Accounting Degree]
- ව්‍යාපාර ගිණුම්කරණපති උපාධි පාඨමාලාව
  [Master of Business Accounting Degree]
- ව්‍යාපාර මූල්‍යපති උපාධි පාඨමාලාව
  [Master of Business Finance Degree]
- අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණපති උපාධිය
  [Master of Business Management in Marketing]
- ව්‍යාපාර පරිපාලන දර්ශන විශාරද උපාධි පාඨමාලාව
  [Doctor of Business Administration]
- ව්‍යාපාර අධ්‍යයනපති උපාධිය
  [Master of Business Studies]
- ව්‍යාපාර අධ්‍යයනපති උපාධිය (චීන)
  (Master of Business Studies Degree (China)
- වෘත්තීය මූල්‍ය පශ්චාද් උපාධිය
  (Master of professional Finance Degree)
- ව්‍යාපාර පිළිබඳ ඩිප්ලෝමාව
  [Diploma in Business]
- අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව
  [Diploma in Marketing]
- පුද්ගල කුසලතා පිළිබඳ ඩිප්ලෝමාව - අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් සඳහා
  [Diploma in People Skills - For undergraduates]
- ව්‍යවසායකත්ව සම්පත් සැලසුම්කරණ ඩිප්ලෝමා පාඨමාලාව - අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් සහ බාහිර අයදුම්කරුවන් සඳහා
  [Diploma in Enterprise Resource Planning (ERP) - For undergraduate and for external candidates]

- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව
  [Higher Diploma in Human Resource Management]
- මූල්‍ය සේවා කළමනාකරණ උසස් ඩිප්ලෝමාව
  [Higher Diploma in Financial service Management]
- ව්‍යාපාර මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව/ උසස් ඩිප්ලෝමාව
  [Diploma/ Higher Diploma in Business Finance]
- ව්‍යාපාර පිළිබඳ උසස් ඩිප්ලෝමාව
  [Higher Diploma in Business]
- අලෙවිකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව
  [Higher Diploma in Marketing]
- ව්‍යාපාර ගිණුම්කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව
  [Higher Diploma in Business Accounting]

අධ්‍යයන, පුහුණු හා උපදේශන වැනි විවිධ අරමුණු සඳහා සම්පත් මධ්‍යස්ථාන පීඨයේ ස්ථාපිත කර ඇත. පර්යේෂණ මධ්‍යස්ථානය (කළමනාකරණ පර්යේෂණ සඳහා වන මධ්‍යස්ථානය) ජාතික ලේඛනකරණ මධ්‍යස්ථානය (online library), නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානය, කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය, උසස් අලෙවිකරණ මධ්‍යස්ථානය හා විමර්ශන පුස්තකාලය යන සම්පත් මධ්‍යස්ථාන මීට අයත් වේ.

පීඨය මඟින් ඒ ඒ විෂය ක්ෂේත්‍ර පිළිබඳ දැනුම ඇති අභ්‍යන්තර හා බාහිර විශේෂඥයින් ලවා විද්‍යාර්ථීන්ගේ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වනු ලබයි. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය දේශන පවත්වාගෙන යාම සඳහා නවීන පහසුකම් අයත් කරගෙන ඇත. සිසුන්ගේ භාවිතය සඳහා නව මෘදුකාංග, අන්තර්ජාල පහසුකම් හා අනෙකුත් තාක්ෂණික පහසුකම් ඇතුළත් ව අංගසම්පූර්ණ පරිගණක විද්‍යාගාර පහක් පීඨය තුළ ස්ථාපිත කර ඇත. පීඨයේ දේශන ශාලා විද්‍යාර්ථීන් 50-250 දක්වා අධ්‍යයන කටයුතුවල යෙදිය හැකි අයුරින් නවීන පහසුකම් (multimedia) හා අදාළ අනෙකුත් පහසුකම් සහිත ව සකස් වී ඇත. එසේ ම පුද්ගලයින් 350 කට පමණ අසුන්ගත හැකි ආකාරයේ නවීන පහසුකම් සහිත ශ්‍රවණාගාරයකින් ද පීඨය සමන්විත වේ. එමෙන් ම එක් එක් දෙපාර්තමේන්තුව මඟින් ඉගෙනුම් හා ඇගයීම් ක්‍රියාවලින් සඳහා විද්‍යුත් අධ්‍යයන පරිසරයක්, උසස් ක්‍රියාකාරීත්වයෙන් යුතු LMS පද්ධතියක් හරහා සකස් කර ඇත.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 011 2903501, 011 2903502, 011 2903503, 011 2903506 |
| අභ්‍යන්තර අංකය | - | 501, 502, 503, 506 |
| විද්‍යුත් ලිපිනය | - | officecm@kln.ac.lk |
| වෙබ් අඩවිය | - | https://fcms.lkn.ac.lk |

## 10.1 ගණකාධිකරණ අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය බී.කේ. යාපා අබේවර්ධන මිය - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.Com. (USJ), M.Sc. Mgt (USJ), MAAT, Ph.D. (B'ham, UK)*
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.එම්.ඩී. ආරියරත්න මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.Com. (Kel' ya), M.Com. (Kel' ya), Ph.D. (USQ, Australia) FCA*
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (උපකුලපති - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)
*B.Com. (Kel'ya), M.Com. (Punjab, India), Ph.D. (Aegean, Greece)*
මහාචාර්ය යූ.එල්.ටී.පී. ගුණසේකර මිය - මහාචාර්ය
*B.Sc. Bus. Ad., (USJ), MBA (C'bo), Ph.D. (Kel'ya)*
මහාචාර්ය කේ.කේ. තිලකසිරි මයා - මහාචාර්ය
*B.Com. (USJ), M.Sc. (Mgt.) (USJ) Ph.D. (Victoria, Australia)*
මහාචාර්ය එම්.ඩබ්ලිව්. මදුරප්පෙරුම මිය - මහාචාර්ය
*B.A. (Econ) (C'bo), M.A. (Econ) (C'bo), M.Com (Kel'ya), Ph.D. (Rdg.UK)*
මහාචාර්ය එම්.ජී.ටී.කේ. මුණසිංහ මිය - මහාචාර්ය
*B.Sc. (Acc) (USJ), MBA (C'bo), Ph.D. (UK), FCA, ACMA*
ආචාර්ය ඩබ්ලිව්.වී.ජී.ඩී. කරුණාරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.B.Mgt. (Acc) (Kel'ya), PGD in Bus. Stat (USJ), M.Com. (Kel'ya), MAAT, Ph.D. (CCNU), China*
සී.ආර්. තිලකරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Perad'ya), M.Sc. (C'bo)*
ආචාර්ය ඩබ්ලිව්.එම්.එච්.එන්. විජේකෝන් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.B.Mgt. (Acc) (Kel'ya), MBA (C'bo), CA Passed Finalist, Ph.D. (New Zealand)*
ආචාර්ය ජී.එම්. මුදිත් සුජීව මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.B.Mgt. (Acc) (Kel'ya), M.Sc.in Applied Finance (USJ), ACA, PhD Forensic Accounting, ACFE (USA)*
ආචාර්ය ආර්.එම්.ඩී.ජී.පී. රාජපක්ෂ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.B.A. (Finance) (C'bo), MSc in Applied Finance (USJ), Ph.D (Malaysia),CBA*
එච්.ජී.පී.එල්. පෙරේරා මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.B.Mgt. (Finance) (Kel'ya), MSC in IT (Moratuwa), AMA (CMA Australia)*
ඩබ්.ඩී.එන්. අරුප්පල මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.B.Mgt. (Finance) (Kel'ya), MBA in MOT (Moratuwa), CA Strategic level II*
එම්.ඩී.පී. කෞශල්‍ය මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.B.Mgt. (Acc) (Kel'ya), MBA (C'bo), CA Passed Finalist, CIMA (UK) Passed Finalist*
කේ.එච්. පෙරේරා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*BSc (Acc) (USJ), MBA (USJ), FCA*
ඩබ්ලිව්.ටී.එන්.එම්. පෙරේරා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.B.Mgt. (Acc) (Kel'ya), MSc in Applied Finance (USJ), ACMA, CIMA (UK) Passed Finalist*
පී.ආර්.එම්.ආර්. පෙරේරා මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.B.Mgt. (Acc) (Kel'ya), MSc in Mgt (USJ), ACMA (UK), CGMA*
එන්.කේ.එල්. සිල්වා මිය - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt. (Acc) (Kel'ya), CMA Passed Finalist (ICMASL), DBF (IBSL)*
එන්.එල්.සී. සිල්වා මයා - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt. (Acc) (Kel'ya)*
වී.එල්. වීරවික්‍රම මයා - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt. (Acc) (Kel'ya), MBA in IT (Moratuwa), CIMA (UK), Passed Finalist.*

එම්. ආර්.එච්.පෙරේරා මිය- ආධුනික කථිකාචාර්ය
*B.Sc. (Acc) (USJ),MBA (UK),CIMA (UK) Passed Finalist*

ආර්.ජී.එස්. රාජපක්ෂ මයා - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt. (Acc) (Kel'ya), CIMA (UK) Passed Finalist*
එච් මුතුනායක මයා - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt. (Acc)(kel'ya), MBA (PIM – USJ), ACMA (UK), CGMA*
ජී.ජී.එච්.එස්.කේ. විජේරත්න මිය - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt. (Acc) (Kel'ya),MSc in Applied Finance (USJ), CIMA (UK) Passed Finalist*
පී.එම්.ඩී.එස්. පතිරාජ මයා - ආධුනික කථිකාචාර්ය
*B.Sc. (Acc) (Wayamba), ACMA, MAAT,DABF (IBSL)*
එච්.එම්.එම්.එන්. හේරත් මයා - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt. (Acc) (Kel'ya), AAT Passed Finalist*

1993 වර්ෂයේ දී ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පාඨමාලාව ආරම්භ වූ අතර 1999 වර්ෂයේ දී ගණකාධිකරණ අධ්‍යයනාංශය ස්ථාපිත කරන ලදී. වර්තමානයේ ගණකාධිකරණ අධ්‍යයනාංශය මඟින් ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පාඨමාලාව පිරිනමනු ලබන අතර මෙම පාඨමාලාව මඟින් ගණකාධිකරණය විෂයය ක්ෂේත්‍රය පිළිබඳ ව පුළුල් ලෙස අධ්‍යයනය කෙරෙන අතර, එම පාඨමාලාව තුළ කළමනාකරණය, ව්‍යාපාර මූල්‍ය, ආර්ථික විද්‍යාව, ප්‍රමාණාත්මක ශිල්ප ක්‍රම හා තොරතුරු තාක්ෂණය යන විෂයය ක්ෂේත්‍ර ද අන්තර්ගත කර තිබේ. මෙම උපාධියෙහි අධ්‍යයන කටයුතු ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලබන අතර, විභාග කටයුතු සිදු කරනුයේ අර්ධ වාර්ෂික ක්‍රමය අනුව ය. 2004 වසරේදී ගණකාධිකරණ අධ්‍යයන අංශය විසින් සිව්වන වසර විද්‍යාර්ථීන් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන අනිවාර්යය විෂයය ඒකකයක් ලෙස හඳුන්වා දුන් අතර එය සංඛ්‍යාංක (Digital) වාර්තාකරණ හා ඇගයීම් පද්ධතියක් යොදා ගනිමින් ඇගයීමට භාජන කරනු ලැබේ.

ලෝක බැංකුවේ මූල්‍යමය අනුග්‍රහයෙන් උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (Improvement of Relevance and Quality of Undergraduate Education - IRQUE) යටතේ ගණකාධිකරණ අධ්‍යයනාංශය විසින් රුපියල් මිලියන 100ක මූල්‍ය ප්‍රදානයක් 2005 වර්ෂයේ දී දිනා ගැනීමට සමත් විය. මෙම ව්‍යාපෘතිය වර්ෂ 06 ක කාල පරාසයක් තුළ (2005 - 2010) ක්‍රියාත්මක වූ අතර, ඒ මගින් ගණකාධිකරණ උපාධි පාඨමාලාවෙහි ගුණාත්මක භාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. අදාළ ව්‍යාපෘතිය මගින් උපාධි අපේක්ෂකයන්ගේ කුසලතාවන් වර්ධනය කිරීමටත්, ඒ තුළින් රැකියා වෙළෙඳපළට උචිත උපාධිධාරීන් බිහි කිරීමටත් අවශ්‍ය කටයුතු විවිධ වැඩසටහන් මගින් ක්‍රියාත්මක කරන ලද අතර යෝජනා කරනු ලැබූ සියලු කාර්යයන් සාර්ථක ව නිම කොට එම කටයුතු සියල්ල ලෝක බැංකුවේ ඇගයීමට ලක්විය. ලබා ගත් සාර්ථක ප්‍රතිඵල ගණකාධිකරණ අධ්‍යයනාංශයේ අනාගත දියුණුවට අතිමහත් පිටුවහලක් විය.

ගණකාධිකරණ, මූල්‍ය සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයන්හි උපාධිධාරීන් හා වෘත්තිකයින් සඳහා වන අධික ඉල්ලුම සපුරාලීම සඳහා ගණකාධිකරණ අධ්‍යයනාංශය විසින් 2009 වර්ෂයේ දී පශ්චාද් උපාධි පාඨමාලාව හඳුන්වා දෙන ලදී. එසේ ම තවදුරටත් තම කාර්යභාරය පුළුල් කරමින් 2013 වර්ෂයේ දී නවීන තාක්ෂණය පදනම් කරගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් භාවිතයෙන් (E Learning) ගණකාධිකරණ හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් උපාධි පාඨමාලාව සහ 2014 වසරේදී ගණකාධිකරණය පිළිබඳ උසස් ව්‍යාපාර ගිණුම්කරණ ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වා දෙන ලදී. එසේ ම ගණකාධිකරණ අධ්‍යයනාංශය, ගිණුම්කරණ වෘත්තියෙහි නව්‍ය ක්ෂේත්‍රයන් ආවරණය කරමින් කාලීන ජාතික හා ජාත්‍යන්තර අවශ්‍යතා හඳුනා ගනිමින් 2020 වසරේ සිට ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව - විගණනය හා වෝහාරික ගිණුම්කරණය උපාධිය ද 2022 වසරේ සිට ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව - ගිණුම්කරණ තොරතුරු පද්ධති උපාධියද හඳුන්වා දෙන ලදී. 2018 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, දෙපාර්තුමේන්තුවල ගුණත්වය පාලනය කිරීම සඳහා කරන ලද ඇගයීම

වෙනුවෙන් ගණකාධිකරණය අධ්‍යයන අංශයට ලකුණු 89ක් ලබා A සාමාර්ථයක් ලබා ගැනීම විශේෂ ඇගයීමකි.

ගණකාධිකරණ අධ්‍යයන අංශය විසින් රුපියල් මිලියන 18ක් වටිනා තරගකාරී මූල්‍ය ප්‍රධානයක් 2019 වර්ෂයේ දී ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වන Accelerating Higher Education Expansion and Development (AHEAD) ව්‍යාපෘති මඟින් දිනා ගැනීමට සමත් විය.

මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන වශයෙන් ක්‍රියාකාරකම් 05ක් ක්‍රියාත්මක වන අතර එම ක්‍රියාකාරකම් සැකෙවින් මෙසේ ය. විෂයය මාලා සහ ඉගැන්වීම්, ඉගැනුම් සහ තක්සේරු කිරීම්, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් අධ්‍යාපනය සක්‍රීය කිරීම, සමාජ හා අන්තර් සංස්කෘතික සහජීවනය වැනි විෂයය බාහිර ක්‍රියාකාරකම් වන අතර එම සියලුම ක්‍රියාකාරකම් ගණකාධිකරණ අධ්‍යයන අංශයේ අධ්‍යයන සහ පුරෝකථන මත සකස් කර ඇත. ගණකාධිකරණ අධ්‍යයන අංශයේ විශ්වාසය වන්නේ නූතන ලෝකයට සරිලන උපාධිධාරියෙකු බිහි කිරීමට ඉහත ක්‍රියාකාරකම් සෘජු ව ම දායක වන බවයි.


දුරකථන අංකය - 011 2903550
අභ්‍යන්තර අංකය - 550, 551
ෆැක්ස් අංකය - 011 2917708 (වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය)
විද්‍යුත් ලිපිනය - doa@kln.ac.lk

## 10.2 වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය එච්.ඒ.කේ.එන්.එස්. සුරංගි මිය - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.Com. (Perad'ya), M.Phil. (Perad'ya), Ph.D. (Lincoin, UK)*
මහාචාර්ය ඩී.එම්. සේමසිංහ මයා - මහාචාර්ය
*B.Com. (Kel'ya), M.Com. (Kel'ya), Ph.D. (QUT- Australia)*
මහාචාර්ය ඩබ්ලිව්.ආර්.පී.කේ. ප්‍රනාන්දු මයා - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Com. (Kel'ya), M.Com. (Kel'ya), Ph.D. (Bharathidesan Uni-India)*
මහාචාර්ය සී. පතිරවසම් මයා - මහාචාර්ය
*B.Sc. (Bus. Ad.) (S.J'Pura), PG. Dip. in Acc. & Fin. Mgt. (S.J'pura), M.Sc. in Mgt. (S.J'pura), MBA (Saga-Japan), Ph.D. (UTB-Czech Republic)*
මහාචාර්ය එල්.වී.කේ. ජයතිලක මිය - මහාචාර්ය
*B.Com. (Kel'ya), PG Dip. in Bus. Stat. (Ruhuna), M.Phil. (Ruhuna), MBA (AeU-Malaysia), Ph.D. (Ruhuna)*
මහාචාර්ය එම්.ජේ.එම්. රාසි මයා - මහාචාර්ය
*B.Com. (C'bo), MBA (C'bo), Ph.D. (IIUM, Malaysia)*
මහාචාර්ය සී.එන්. වික්‍රමසිංහ මයා - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Com. (S.J'pura), PG. Dip.in IT (Kel'ya), MBA in IT (Mora'wa), Ph.D. (UPM-Malaysia), MAAT*
මහාචාර්ය එස්.එම්.ඒ.කේ. සමරකෝන් මයා - මහාචාර්ය
*B.Com. (Kel'ya), M.Sc. (Kel'ya), Ph.D. (TBU-Czech Republic), MAAT*
මහාචාර්ය එම්.ආර්.කේ.එන්. යටිගම්මන මිය - මහාචාර්ය
*B.Com. (Kel'ya), M.Sc. in MIT(Kel'ya), Ph.D. (MSU-Malaysia)*
එස්. අමරතුංග මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.A. Econ. (S.J'pura), M.A. Econ (C'bo), M.Sc. Econ (Saga- Japan)*
එස්.ඩී. එදිරිසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A.( Stat.) (S.J'pura), M.Sc. (Kel'ya) Dip. in Eng (Kel'ya)*
ආචාර්ය ජී.ඩබ්ලිව්.ජේ.එස්. ප්‍රනාන්දු මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Com. (Kel'ya), M.Com. (Kel'ya), Ph.D. (Griffith-Australia)*
ආචාර්ය ජී.කේ. රත්නායක මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Com. (Kel'ya), M.Com. (Kel'ya) Ph.D. (Kel'ya)*
ආචාර්ය එම්.එම්.එම්. ෂාමිල් මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Com. (Kel'ya), MBA (C'bo), Ph.D. (Curtin), CMA (Australia), MCPM*
ආචාර්ය එස්.සී. තුෂාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Com. (Kel'ya), MIntBus (Hons) (Griffith, Australia), ACMA, CMA (Australia), Ph.D. (Griffith, Australia) AFHEA(UK), GTA(UQ-Australia)*
ආචාර්ය එච්.එම්.ටී.එස්. හේරත් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Com. (Kel'ya), MEcon (C'bo), Ph.D. (C'bo)*
ආචාර්ය කේ.ජී.එම්. නානායක්කාර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.B.Mgt. (Acc) (Kel'ya), MBA in Finance (C'bo), FCA, ACMA, ACPM, Ph.D. (Federation University, Australia)*
ආචාර්ය එස්.ජී.සී.එල්. සෙනරත් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Com. (C'bo), MEcon (C'bo),Ph.D. (RMIT, Australia), CPA, ACMA (UK), CGMA*
ඩබ්ලිව්.ඒ.ඩී.එස්. විජේතුංග මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Com. (Kel'ya), MBA (S.J'pura), Reading for Ph.D. (MSU, Malaysia)*
ආචාර්ය එන්.එල්.ඊ. අබේවර්ධන මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Com. (Kel'ya), MBA in Finance (S.J'pura), CBA, AAT, Ph.D. (MSU, Malaysia)*
ආචාර්ය පී.එම්. ජීවන්දරගේ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Com. (Kel'ya), M.Acc. (CQU-Australia), MBA (C'bo), Ph.D. (QUT, Australia)*

එස්.ඒ.ආර්. ලසන්ත මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.Sc. Finance (S.J'pura), MBA (PIM-S.J'pura), ACA, ACMA, Reading for Ph.D. (Griffith, Australia)*
ආචාර්ය ඩී.එම්.එන්.එස්.ඩබ්ලිව්. දිසානායක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Com. (Kel'ya), M.phil. (C'bo), AMIMSL, AMABE (UK), Ph.D. (Waikato, New Zealand)*
එච්.ඒ.එච්. හෙට්ටිආරච්චි මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Com .(Bus.Tech.) (Kel'ya), MBA in IT (Mora'wa), MCS (SL)*
බී.කේ.එච්.ඩී. අනුරංග මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Com. (Kel'ya), MBA (C'bo)*
බී.ඒ.එච්. කෞශලා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.Com. (Bus.Tech.) (Kel'ya), CBA, MSc in Mgt.(Finance) (S.J'pura), Reading for Ph.D. (Surrey,UK)*
කේ.එස්.එච්. සරත්චන්ද්‍ර මිය - කථිකාචාර්ය
*B.Com. (Bus. Tech.) (Kel'ya), Adv. Dip. in Mgt. Acc., MBA in IT (Sp.) B.A. (Mora'wa)*
කේ.එම්. පණ්ඩිතරත්න මිය - කථිකාචාර්ය
*B.Com. (Kel'ya), CBA, M.Sc. in Applied Finance (S.J'pura)*
ආර්.එස්. රන්වල මිය - කථිකාචාර්ය
*B.Com. (Entr.) (Kel'ya), PQHRM (IPM), MEntr (S.J'pura)*
ජී.කේ.එස්. නිමේෂි මිය - කථිකාචාර්ය
*B.Com. (Entr.) (Kel'ya), MEntr (S.J'pura)*
එන්.පී.කේ. ඒකනායක මිය - කථිකාචාර්ය
*BBA in Acc. (C'bo) CIMA passed Finalist, Dip. in ERP.M.Sc. in Mgt., Finance Sp. (S.J'pura)*
ආර්.කේ.එච්.එස්. විමලසිරි මයා - ආධුනික කථිකාචාර්ය
*B.Com. (Kel'ya), Reading for M.Phil. (Mora'wa)*
ආර්.එස්.එල්.බී. රණසිංහ මයා - ආධුනික කථිකාචාර්ය
*B.Com. (Kel'ya), Adv. Dip. in Mgt Acc., Attorney-At-Law, Reading for MBA (Perad'ya)*
පී.එස්. මලලගේ මිය - ආධුනික කථිකාචාර්ය
*B.Com. (sp.) (Kel'ya), Reading for M.Phil. (C'bo), CQHRM(CIPM,SL), ACIPM*
කේ.පී.පී. ලක්මාල් මයා - ආධුනික කථිකාචාර්ය
*B.Com. (Bus. Tech)(sp.) (Kel'ya)*
ආර්.එම්.එස්.එස්. රත්නායක මිය - ආධුනික කථිකාචාර්ය
*B.Com. (Fin.Mgt.) (Kel'ya), Reading for M.Phil. (C'bo) , Adv.Dip In MA, Dip In Fintech*
ඩබ්ලිව්.එම්.එච්.කේ. බණ්ඩාර මිය - ආධුනික කථිකාචාර්ය
*BBM (sp.) (Entr.) (UWA), Reading for M.Phil. (Kel'ya)*
පී.ඩී.ඊ. ලක්මාලි මෙය - ආධුනික කථිකාචාර්ය
*B.Sc. (Hons) (MIT) (Kel'ya), Reading for MSc in Data Science & AI (S.J'pura)*
එස්. ප්‍රදීපිකා මෙය - ආධුනික කථිකාචාර්ය
*B.Sc. (Hons), (CM) (Perad'ya)*
ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. එස්. විජේසුන්දර මෙය - ආධුනික කථිකාචාර්ය
*B.Sc. Finance (SP) (J'pura), Reading for M.Sc in Mgt J'pura*

1976 දී ශාස්ත්‍ර පීඨයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ උප අධ්‍යයන අංශයක් ලෙස ආරම්භ කරන ලද වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යාපනය සඳහා මූලික වූ අධ්‍යයනාංශය වන අතර, එය 1995 දී වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය පිහිටුවීම සඳහා පදනම් වූ අධ්‍යයනාංශය ද වේ. ශ්‍රී ලංකාවේ වාණිජ හා කළමනාකරණ අධ්‍යාපනයේ විශිෂ්ටත්වය කරා ළඟා වීම වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශයේ දැක්මයි.

වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ, මධ්‍ය හා ඉහළ පෙළ කළමනාකරණ තනතුරු සඳහා සුදුසු උපාධිධාරීන් බිහි කරයි.

තව ද, ජාතික ආර්ථිකය සඳහා දායකත්වයක් සැපයීම සඳහා නව රැකියා අවස්ථා ජනිත කරන, නව ව්‍යාපාර බිහි කිරීමට හැකියාවක් සහිත උපාධිධාරීන් ද මෙම අධ්‍යයනාංශය විසින් නිර්මාණය කරනු ලැබේ.

වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය මඟින්, ප්‍රධාන වශයෙන් උපාධි පාඨමාලාවන් පහක් පවත්වනු ලබයි. එනම්, වාණිජවේදී ගෞරව උපාධි පාඨමාලාව, වාණිජවේදී ව්‍යවසායකත්ව ගෞරව උපාධි පාඨමාලාව, වාණිජවේදී ව්‍යාපාර තාක්ෂණය ගෞරව උපාධි පාඨමාලාව, වාණිජවේදී මූල්‍ය කළමනාකරණ ගෞරව උපාධි පාඨමාලාව, වාණිජවේදී විශේෂ (බාහිර) උපාධි පාඨමාලාව වේ. ඊට අමතරව මෙම අධ්‍යයනාංශය මගින් වාණිජ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව, වාණිජ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව (චීන කණ්ඩායම), ව්‍යාපාර අධ්‍යයනපති පශ්චාත් උපාධි පාඨමාලාව සහ ව්‍යාපාර අධ්‍යයනපති පශ්චාත් උපාධි පාඨමාලාව, (චීන කණ්ඩායම) පවත්වාගෙන යනු ලැබේ. වර්තමානයේ දී සිසුන් 1100ක් පමණ පිරිසක් මෙම උපාධි පාඨමාලාවන් යටතේ ඉගෙනුම් කටයුතු කරනු ලබයි. තවද අධ්‍යයනාංශය මගින් ව්‍යාපාර පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් කුඩා පරිමාන ව්‍යාපාර හසුරුවන, ස්වයං රැකියා නියුක්තික සහ පාසල් හැර ගිය පුද්ගලයින් සඳහා හඳුන්වා දී ඇත.

වර්තමානයේ දී වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය 40 දෙනෙකුගෙන් සමන්විත ආචාර්ය මඩුල්ලකින් යුක්ත වේ. දැනට මෙම අධ්‍යයනාංශයේ මහාචාර්යවරුන් 9 දෙනෙක්ද ආචාර්ය උපාධි හිමි 19 දෙනෙකු ද සේවය කරන අතර තවත් 02 දෙනෙකු ආචාර්ය උපාධි සඳහා අන්තර්ජාතික විශ්වවිද්‍යාලවල තම අධ්‍යයන කටයුතු හදාරමින් සිටිති.

ලෝක බැංකුව මඟින් ප්‍රදානය කරනු ලැබූ තරඟකාරී අරමුදලක් වන ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය [Improvement of Relevance and Quality of Undergraduate Education (IRQUE)] මඟින් 2006 වසරේ දී වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශයට ප්‍රතිපාදන හිමිවිය. 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ලෝක බැංකුව මගින් ප්‍රදානය කරන AHEAD ව්‍යාපෘති ප්‍රදානය තරඟකාරි පදනමක් මත දිනා ගැනීමට සමත් විය.


දුරකථන අංකය - 011 2914485
අභ්‍යන්තර අංකය - 011 2903578
විද්‍යුත් ලිපිනය - dcfm@kln.ac.lk

## 10.3 මූල්‍ය අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය ජේ.එම්.ආර්. ප්‍රනාන්දු මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.B.Mgt. (Finance) (Kel'ya) M.Sc. (Mgt.) (S.J'pura), Ph.D. (UWNZ)*
මහාචාර්ය ආර්.පී.සී. රංජනී මිය - විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.Com. (Kel'ya), M.Com. (Panjab), Ph.D. (Panjab)*
මහාචාර්ය එස්.එස්. වැලිගමගේ මිය - මහාචාර්ය සහ වෘත්තීය මූල්‍යපති උපාධි පාඨමාලා සම්බන්ධීකාරක
*B.Com. (Ruhuna), MBA (AIT, Thailand), MEB (ESCP-EAP-UK), Ph.D. (Punjab), CBA (CASL), PGDC (C'bo)*
මහාචාර්ය ආර්. අබේසේකර මයා - මහාචාර්ය
*B.Sc. (Kel'ya), DipM (UK), MBA (C'bo), Ph.D. (UK)*
මහාචාර්ය පී.එන්.ඩී. ප්‍රනාන්දු මයා - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.B.Mgt. (Acc) (Kel'ya), MBA (WBUT), Ph.D. (CCNU)*
සී.එස්.පී.කේ. ප්‍රනාන්දු මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Mkt.Mgt) (S.J'pura), M.Sc. (Mgt) Special in finance (S.J'pura), CFA, Reading for Ph.D.*
එම්.ආර්.පී. විජේසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.B.Mgt. (Finance) (Kel'ya), CA Exams Qualified, MBA (C'bo), Reading for Ph.D.*
ඩබ්.බී.එම්.ඩී. බස්නායක මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.B.Mgt. (Finance) (Kel'ya), ACMA, CGMA, (UK), MBA (PIM-S.J'pura), Reading for Ph.D.*
ආචාර්ය ඩී.සී.ජේ. ලියනගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II, කළමනාකරණ පර්යේෂණ මධ්‍යස්ථාන අධ්‍යක්ෂක සහ මූල්‍ය සාක්ෂරතා මධ්‍යස්ථාන අධ්‍යක්ෂක
*B.B.Mgt. (Acc.) (Kel'ya), MBA (C'bo) Ph.D. (OUSL), ACMA (UK), PMP (USA)*
එස්.ඩී.පී. පියනන්ද මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II සහ බැංකුකරණ උපාධි පාඨමාලා සම්බන්ධීකාරක
*B.B.Mgt. (Finance) (Kel'ya), MBA (PIM-SJP),MPhil (C'bo),FCA, FMAAT, ACMA*
ඩබ්.ඩී.ජේ.ඩී. වීරසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II සහ මූල්‍ය ඉංජිනේරුකරණ උපාධි පාඨමාලා සම්බන්ධීකාරක
*B.B.Mgt. (Finance) (Kel'ya), M.Sc. (Mgt.) (S.J'pura)*
එච්.එම්.ඒ.එල්. ගුණසේකර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II සහ ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා / උසස් ඩිප්ලෝමා සම්බන්ධීකාරක
*B.B.Mgt. (Finance) (Kel'ya), CIMA Exams Qualified, M.Sc. (Applied Finance) (S.J'pura)*
එච්.ජේ.ආර්. බුද්ධික මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II සහ රක්ෂණ උපාධි පාඨමාලා සම්බන්ධීකාරක
*B.B.Mgt. (Finance) (Kel'ya), MA (Kel'ya), MBA (PIM- S.J'pura), ACPM, Reading for Ph.D.(NIIBS)*
ඒ.ජේ.පී. සමරවික්‍රම මයා - කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)
*B.Sc. (Hons) Bus. Admin (Information System), (S.J'pura), M.Sc. (Computer Science), (S.J'pura), MCS(SL), Reading for Ph.D. (USJP)*
පී.ඩබ්.ඩී. මදූෂානි මිය - කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)
*B.Sc. (Finance) (S.J'pura), M.Sc. (Applied Finance) (S.J'pura), ACMA, CGMA (UK)*
එල්.ඒ.එස්. පෙරේරා මයා - ආධුනික කථිකාචාර්ය සහ මූල්‍ය උපාධි පාඨමාලා සම්බන්ධීකාරක
*B.B.Mgt. (Finance) (Kel'ya), Reading for M.Sc*
එච්.එම්.එන්.පී. හේරත් මිය - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt. (Finance) (Kel'ya), CFA, Reading for MPhil/Ph.D.*
ඩී.එම්.යූ.එච්. දිසානායක මිය - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt. (Finance) (Kel'ya), AAT(Finalist), DABF, Reading for M.Sc.*
පී.ඒ.පී. කෙත්මි මිය - ආධුනික කථිකාචාර්ය
*B.Sc.(Maths) (Kel'ya), Reading for M.Sc.*
එස්.එල්. සුදසිංහ මිය - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt. (Finance) (Kel'ya), Reading for M.Sc.*
එස්.ටී.එම්.එස්. තෙන්නකෝන් මිය - ආධුනික කථිකාචාර්ය

*B.B.Mgt. (Finance) (Kel'ya), MBA (UWL,UK), Reading for MPhil*
ටී.ආර්. හෙට්ටිආරච්චි මිය - ආධුනික කථිකාචාර්ය
*B.Sc.(Maths) (Perad'ya), Reading for M.Sc.*

මූල්‍ය අධ්‍යයන අංශය මඟින් ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධි, ව්‍යාපාර කළමනාකරණවේදී රක්ෂණ ගෞරව, ව්‍යාපාර කළමනාකරණවේදී බැංකුකරණ ගෞරව සහ ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණ ගෞරව උපාධි පාඨමාලාවන් ප්‍රධානය කරනු ලැබේ.

ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව මූල්‍ය උපාධි පාඨමාලාව 2004 වසරේ ගණකාධිකරණ අධ්‍යයන අංශය යටතේ ආරම්භ කරන ලදී. 2011 ජූනි මස මූල්‍ය අධ්‍යයන අංශය නමින් නව දෙපාර්තමේන්තුවක් ලෙස වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයට අනුබද්ධව ස්ථාපිත කරන ලදී. රැකියා වෙළඳපළේ මූල්‍ය, බැංකුකරණය, රක්ෂණය සහ මූල්‍ය ඉංජිනේරු උපාධිධාරීන් සඳහා ඇති ඉහළ ඉල්ලුම පදනම් කරගෙන මෙම උපාධි පාඨමාලාව තෝරා ගැනීමට සිසුන් අතර දැඩි තරඟකාරී ඉල්ලුමක් පවතී. මෙම පාඨමාලාවන් සඳහා වසරකට සිසුන් 220ක් තෝරාගනු ලැබේ. මෙම පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වාගෙන යන අතර, විභාග කටයුතු අර්ධ වාර්ෂික ක්‍රමය අනුව සිදු වේ. ව්‍යාපාර හා රජයේ ආයතනවල මූල්‍ය කළමනාකරණ අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය න්‍යායාත්මක දැනුම, කුසලතා, ආකල්ප සහ ප්‍රායෝගික පුහුණුව සහිත උපාධිධාරීන් බිහි කිරීම අධ්‍යයන අංශයේ අරමුණ වේ. තවද, මෙම අධ්‍යයන අංශය මගින් මූල්‍ය, රක්ෂණ, සහ බැංකු ක්ෂේත්‍රයන්හි උපාධි සහ ශාස්ත්‍රපති උපාධි මට්ටම දක්වා අධ්‍යාපනය කරගෙන යාමට කැමති සිසුන්ට මාර්ගයක් සැකසීම සඳහා ව්‍යාපාර මුල්‍ය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් පිරිනමයි. එසේ ම මූල්‍ය අධ්‍යයන අංශය, උපාධිධාරීන්ගේ වෘත්තීය සුදුසුකම්වල ධාරිතාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය විනය පිළිබඳ ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ දැනුම දියුණුකර ගැනීමට වෘත්තීය මූල්‍යපති උපාධි ද පිරිනමයි.

මෙය ඇමෙරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂක (CFA-USA) වෘත්තිය ආයතනයේ පිළිගත් උපාධි පාඨමාලාවක් වන අතර, එය මූල්‍ය උපාධි සඳහා වත්මන් ව්‍යාපාර ප්‍රජාව තුළ වන පිළිගැනීම වර්ධනයටත් උපාධිලාභීන් සඳහා වන දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ පුළුල් වීමටත් ඉවහල් වී ඇත. එසේ ම මූල්‍ය අධ්‍යයන අංශය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ස්වයං ඇගයීම් වාර්තාව සඳහා 2013-2018 කාල පරිච්ඡේදය සඳහා "A" සාමාර්ථයක් හිමි කරගෙන ඇත.

නව්‍යතාවයන් හඹායන මූල්‍ය අධ්‍යයන අංශයෙහි තවත් එක් සංධිස්ථානයක් සනිටුහන් කරමින් 2022 පෙබරවාරි මස 23 වන දින ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනය විසින් "ISO 9001 : 2015/" ප්‍රමිතිකරණ සහතිකය මූල්‍ය අධ්‍යයනාංශය පිරිනමන ලදී. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් පිරිනමනු ලබන සහතිකපත්, ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලාවන් හි විෂය නිර්දේශයන්, ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලීන් සහ රක්ෂණ, බැංකුකරණ මූල්‍ය සහ මූල්‍ය ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන පර්යේෂණ මෙම ප්‍රමිතිකරණයන් මගින් සහතික කර ඇත.

ව්‍යාපාර කළමනාකරණවේදී රක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව හඳුන්වා දෙනු ලැබ ඇත්තේ සීඝ්‍රයෙන් වෙනස් වන ව්‍යාපාර ලෝකයේ අවශ්‍යතාවන්ට අනුකූලව, රක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ දැනුමෙන් යුතු උපාධිධරයන් බිහිකරලීම උදෙසායි. රක්ෂණයට සම්බන්ධ මූලික ක්ෂේත්‍රයන්ට අදාළ විෂයන් වන ප්‍රතිරක්ෂණ කළමනාකරණය, රක්ෂණ හිමිකම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, ආයුගනක තක්සේරුකරණය යනාදියෙන් සමන්විත වී ඇති මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කරනු ලැබ ඇත්තේ එකී ක්ෂේත්‍රයන් හි විශේෂ දැනුමෙන්, නිපුණතා, ආකල්ප හා පරිචයෙන් යුතු අනාගත රක්ෂණ වෘත්තිකයන් බිහිකරලීම අරමුණු කර ගෙනයි.

බැංකු ක්ෂේත්‍රයේ අභිප්‍රායයන් මත පදනම් ව ව්‍යාපාර කළමනාකරණවේදී බැංකුකරණ ගෞරව උපාධි පාඨමාලාව නිර්මාණය වී ඇති අතර, මෙහි අරමුණු වී ඇත්තේ උපාධි අපේක්ෂකයන් බැංකුකරණය ක්ෂේත්‍රය පිළිබඳ සිව් වසරක් පුරාවට ලබාගත් දැනුමෙන්, කුසලතාවයෙන්, ආකල්ප වලින්, පරිචයෙන් හා අවබෝධයෙන් එම ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛතාවක්ගෙන කටයුතු කරන අනාගත වෘත්තිකයන් බවට පත් කිරීමය.

ශීඝ්‍රයෙන් වෙනස් වන මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට අනුකූල ව මූල්‍ය ඉංජිනේරුකරණ පිළිබඳ විශේෂ දැනුමෙන් හෙබි උපාධිධාරීන් බිහි කිරීම අරමුණු කරගෙන ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණ ගෞරව උපාධි පාඨමාලාව හඳුන්වා දී ඇත. මෙම පාඨමාලාව ද ඇමරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂක (CFA-USA) වෘත්තිය ආයතනය විසින් පිළිගත් උපාධි පාඨමාලාවක් වේ.

මෙම පාඨමාලා හැදෑරීමට ඇතුළත් කරගන්නා සිසුන් අවසාන වසරේ දී බැංකු, මූල්‍ය, රක්ෂණ යනාදී ක්ෂේත්‍රයන්හි අනිවාර්ය ප්‍රායෝගික පුහුණුවක් සහ ස්වාධීන පර්යේෂණ නිබන්ධනයක් ඉදිරිපත් කිරීම කළ යුතු වේ. එලෙස ම ප්‍රායෝගික පුහුණුව සඳහා අංශය මගින් පුද්ගලික අංශය සමග අන්‍යොන්‍ය ගිවිසුම්වලට එළඹී ඇති අතර, එමගින් මෙම උපාධිධාරීන් හට අනාගත රැකියා සඳහා යොමුවීමට අවස්ථා සැලසෙනු ඇත.


| | | |
|---|---|---|
| දුරකථන අංකය | - | 0112903553 |
| අභ්‍යන්තර අංකය | - | 544/ 554/ 549 |
| ෆැක්ස් අංකය | - | 011 2913857 |
| විද්‍යුත් ලිපිනය | - | dfin@kln.ac.lk |

## 10.4 මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

එම්.ඩී.පී. පීරිස් මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*M.Phil (Comp.Sci) (Kel'ya), B.Sc. (C'bo), PGD in Comp.Tech. (ICT - C'bo), (Kel'ya)*
මහාචාර්ය ප්‍රසාදිනී එන්. ගමගේ මිය - මහාචාර්ය
*Ph.D. (MSU-Ma'sia), MSc. (Mgt.) (USJ), B.Sc. (Bus.Ad) (USJ), Attorney at Law*
මහාචාර්ය කේ.ඒ.එස්. ධම්මික මයා - මහාචාර්ය (සේවයෙන් මුදාහැර ඇත.)
*Ph.D. in Mgt. (MSU-Ma'sia), M.Com. (Kel'ya), PGD in Bus. Stat. (USJ), B.B.Mgt. (HRM) (Kel'ya), PG Cert.in HRM (PIM), MIM (SL)*
මහාචාර්ය ඒ. චමරු ද අල්විස් මයා - මහාචාර්ය
*Ph.D. (Tomas Bata -Zlín, CZ), M.Sc. (Mgt.) (USJ), B.Sc. (Bus.Ad.) (USJ)*
මහාචාර්ය එම්.පී.එන්. ජනාදරී මිය - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*Ph.D. (UUM), M.Sc. (Mgt.) (USJ), B.B.Mgt. (HRM)*
මහාචාර්ය අයි. වැල්මිල්ල මිය - මහාචාර්ය
*Ph.D. (Kel'ya), M.Com. (Kel'ya), B.Com. (USJ)*
ආචාර්ය ඩී.යූ. මොහාන් මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*Ph.D. (UPM - Ma'sia), MBA-PIM (USJ), B.B.Mgt. (HRM) (Kel'ya)*
ආචාර්ය ඩබ්ලිව්.ඒ.එස්. වීරක්කොඩි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*Ph.D. (Swin University-Australia), M.Sc. in Mgt. (USJ), B.B.Mgt. (HRM) (Kel'ya)*
වයි.එම්.එස්.ඩබ්ලිව්.වී. සඟරන්දෙනිය මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*M.Sc. (Mgt.) (USJ), B.B.Mgt. (HRM) (Kel'ya), MAAT, HNDA, HNDE, ACA, Dip in Computer Studies (LBS)*
ආචාර්ය ආර්.ඒ.අයි.සී. කරුණාරත්න මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*Ph.D. (Georg August - Germany), M.Sc. (Mgt.) (USJ), B.B.Mgt. (HRM) (Kel'ya), CMA, (PII) Dip. (Psychology), Ad. Dip. in Acc. and Bus.(ACCA, UK), ACPM*
ආචාර්ය ඩබ්ලිව්.එම්.එස්.කේ. වනිගසේකර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*Ph.D. (QUT - Australia), M.Phil (Perad'ya),B.Com. (SP) (Perad'ya), HNDM*
ආචාර්ය ජේ.ඒ.සී.බී. ජයසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*Ph.D. (University of Surrey - UK), MBA (C'bo), B.B.Mgt. (HRM) (Kel'ya), Diploma in Counseling, Associate member of SLNIP*
ආචාර්ය පී. විජේවන්ත මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*Ph.D. (MSU-Mal'sia), MBA (C'bo), B.Sc. (HRM) (USJ), Associate Member (CIPM), ACCA Part qualified*
එච්.එම්. නිශාන්ති මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*Reading for Ph.D. (UOW-Australia), MBA (PIM-USJ), B.B.Mgt. (HRM) (Kel'ya), CIMA Part qualified*
ජී.එච්.බී.ඒ. ද සිල්වා මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*Reading for Ph.D. (Moratuwa), MBA (PIM - USJ), B.Sc. (Bu.Ad.-IS) (USJ), MAAT, CBA*
එච්.එම්.එස්.වී. සිල්වා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*Reading for Ph.D. (USJ), MBA (C'bo), B.B. Mgt. (HRM) (Kel'ya)*
ආර්.කේ.එන්.ඩී. දර්ශනී මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*Reading for Ph.D. (Kel'ya), MBA (PIM-USJ), B.Sc. (Bus. Mgt.) (SUSL)*
ටී.ජේ.ආර්. තිසේරා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*Reading for Ph.D.(Griffith-Australia), MBA (C'bo), B.Sc. (HRM) (USJ)*
ටී.ඩී. වීරසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBA (PIM-USJ), B.Sc. (HRM) (USJ)*
එස්.එම්.ඩී.වයි. ජයරත්න මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*Reading for Ph.D. (UniSA- Australia), M.Sc. (HR) (Salford-UK), MBA (C'bo), B.B.Mgt. (HRM) (Kel'ya)*
වී.එම්. ගුණසේකර මිය - කථිකාචාර්ය
*MBA (PIM - USJ) B.Sc. HRM (SP) (USJ) Dip. in Psychology (ACHE)*

එම්.ඩී. රසිකා හර්ෂනි මිය - කථිකාචාර්ය
*MBA (PIM - USJ), B.B. Mgt. (SP) HRM (Kel'ya), CIMA Part qualified*
වී.ආර්. රණසිංහ මිය - කථිකාචාර්ය
*MBA (PIM - USJ), B.Sc. (SP) HRM (USJ), ICASL Part qualified, National Dip. In Counselling*
ඊ. රෙබෙකා මිය - කථිකාචාර්ය
*MBA (PIM - USJ), B.B. Mgt. (SP) HRM (Kel'ya), AAT Passed Finalist, CBA II*
ඊ.එම්.එච්.එල්. ඒකනායක මිය - ආධුනික කථිකාචාර්ය
*MBA (IT – Moratuwa), MHRM (Kel'ya), B.B.Mgt(sp) HRM (Kel'ya), Dip. In Counselling (MHF)*

මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය මගින් ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් ගෞරව උපාධි පාඨමාලාව පවත්වාගෙන යනු ලබන අතර, මෙම ගෞරව උපාධිය මානව සම්පත් කළමනාකරණ ක්‍ෂේත්‍රය පිළිබඳ ව පුළුල් ලෙස අවධානය යොමු කෙරෙනු ඇත. 2011/2012 අධ්‍යයන වර්ෂයේ සිට මෙම පාඨමාලාවට අදාළ ව අවසන් වසර සිසුන් සඳහා මානව සම්පත් කළමනාකරණ හෝ මානව සම්පත් කළමනාකරණ නොවන ක්ෂේත්‍රවල සය මාසික ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් විෂයමාලාවට ඇතුළත් කර ඇත. තවද, මෙම අධ්‍යයනාංශය මගින් කළමනාකරණ ක්‍ෂේත්‍රයට අදාළව ව්‍යාපාර කළමනාකරණවේදී බාහිර උපාධි පාඨමාලාවක් 1999 සිට පවත්වාගෙන යනු ලබන අතර, ඒ සඳහා විශාල ඉල්ලුමක් පවතී.

2006 වසරේ සිට මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් පවත්වාගෙන යනු ලබන අතර, 2010 වසරේ සිට මානව සම්පත් කළමනාකරණපති (Master of HRM) උපාධිය ද පිරිනමනු ලැබේ. ඉහළ ම ලකුණු ලබන උපාධි අපේක්ෂකයින් අතර මානව සම්පත් කළමනාකරණපති උපාධිය හැදෑරීමට වසරේ මානව සම්පත් කළමනාකරණ ශිෂ්‍යයාට/ශිෂ්‍යයාවට ශිෂ්‍යත්වයක් ලබාදෙන අතර මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට වසරේ විශිෂ්ටත ම කාර්ය සාධක ශිෂ්‍යයාට/ශිෂ්‍යයාවට හා ඉහළම ලකුණු ලාභියාට ශිෂ්‍යත්ව දෙකක් පිරිනැමේ. එසේම 2014 වසරේ සිට මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ. එසේ ම අධ්‍යයනාංශය මඟින් මාස 6කට වරක් *'Kelaniya Journal of Human Resource Management'* නමින් පර්යේෂණ සඟරාවක් ද 2005 වසරේ සිට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධිය**

මෙම පාඨමාලාව අනිවාර්ය, අතිරේක සහ සහායක විෂය ඒකකයන්ගෙන් සමන්විත වන අතර, මෙහි දී අනිවාර්ය විෂය ඒකකයන් මගින් මානව සම්පත් කළමනාකරණයට සෘජුව අදාළ වන දැනුම හා නිපුණතාවන් ලබාදීම සිදුකරන අතර, මෙහි දී, මානව සම්පත් කළමනාකරණය, මානව සම්පත් සංවර්ධනය, නිපුණතා සංවර්ධනය, ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය, නීතිය, සමාජවිද්‍යාව, මනෝවිද්‍යාව හා සංවිධාන චර්යාව ආදී විෂයයන් ආවරණය කරයි.

අපගේ විෂය නිර්දේශය තුළින්, ශිෂ්‍ය කුසලතා සංවර්ධනය හා බාහිර ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යයින් යොමු කිරීම ද සිදුකෙරේ. ක්‍රියා ඉගෙනුම් ව්‍යාපෘති, ව්‍යාපාර ක්ෂේත්‍රය මූලික කොටගත් පැවරුම්, වැඩමුළු හා විශේෂ කුසලතා සංවර්ධන ව්‍යාපෘති සිසුන්ගේ කුසලතා හා හැකියා වර්ධනය කර ගැනීම සඳහා යොදාගන්නා ක්‍රමෝපායයන් වේ. අපගේ අධ්‍යයනාංශයේ ශිෂ්‍ය සංගමය වන AHEAD ශිෂ්‍ය සංගමය මඟින්, සමාජ සත්කාර වැඩසටහන්, සිසුන්ගේ කුසලතා දැක්වීමේ ප්‍රසංග, ව්‍යාපාර ක්ෂේත්‍රය හා සමගාමී ව සිදුකරන්නා වූ වැඩසටහන් හා අනෙකුත් ශිෂ්‍ය කුසලතා වර්ධනය සඳහා ඉවහල්වන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා ක්‍රියාවට නැංවීම සිදුකරනු ලැබේ.

දුරකථන අංකය - 0112903602, 0112914483 අභ්‍යන්තර අංකය - 601/602

## 10.5 අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය එස්.එස්.ජේ. පටබැඳිගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.B.A. (C'bo), M.Econ (C'bo), P.hD. (RMIT, Australia), FCMA (UK), CGMA, ACIM (UK), Dip.M. (UK), PG. DIP in Finance (ICASL)*
මහාචාර්ය ආර්.ඒ.එස්. වීරසිරි මයා - මහාචාර්ය
*B.Com. (Kel'ya), M.Com. (Kel'ya), FDPM (IIMA-India), P.hD. (SCUT-China)*
මහාචාර්ය ඩබ්ලිව්.එම්.සී.බී. වන්නිනායක මයා -මහාචාර්ය **(පීඨාධිපති-වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය)**
*B.Sc. (Mkt.) Mgt. (Special) (S.J'Pura), MBA (C'bo), P.hD. (TBU-Czech Republic), Dip. in M. (UK)*
මහාචාර්ය ඩී.එම්.ආර්. දිසානායක මයා - මහාචාර්ය
*B.B.Mgt (Mkt) (Kel'ya), MBA (PIM-USJ), DBA (European University Switzerland), P.hD.(Taylor's University - Malaysia) , Dip. in Mkt (SLIM)*
මහාචාර්ය එල්.ඒ.පී. මේදිස් මයා - මහාචාර්ය
*B.Com. (Kel'ya), MBA (PIM-USJ), MCIM (UK), P.hD. (Malaysia), CMA (Australia),*
සී.බී. විජේසුන්දර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.B.Mgt (Mkt) (Kel'ya), M.Sc. in MIT (Kel'ya)*
ජී.එන්.ආර්. පෙරේරා මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අධ්‍යයන නිවාඩු)
*B.B.Mgt (Mkt) (Kel'ya), MBA (PIM-USJ), MCIM, MSLIM, MCPM*
බී.එස්.එස්.යූ. බණ්ඩාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.B.Mgt (Mkt) (Kel'ya), MBA (PIM-USJ)*
එස්.අයි. විජේනායක මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. MIT (Special) (Kel'ya), MBA in HRM (C'bo)*
ඩී.ඒ.ජී.පී.කේ. ගයාත්‍රී මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.B.Mgt (Mkt) (Kel'ya), MBA in Mkt (C'bo)*
ඩබ්.ඒ.ඩී.එන්.ආර්. ගුණවර්ධන මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.B.Mgt (Mkt) (Kel'ya), Diploma in Brand Mgt (SLIM), AMSLIM, MBA (PIM-USJ)*
ආර්.කේ.ටී.ඩී. කරුණානායක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBA (PIM-USJ),B.B.Mgt (Marketing) Special (Kel'ya), D.Bit.P.Dip (Digital Marketing)*
පී.වී.එම්.වී.ඩී. උඩෝව්ට මිය - ආධුනික කථිකාචාර්ය
*B.Com (Special) (SEUSL)), M.Sc.in Mgt (PDN), PGDip in Marketing (SLIM), AMSLIM, AMSLISM*
*එන්. ටී. හේවාපතිරණ මයා* - ආධුනික කථිකාචාර්ය
*B.B.Mgt (Mkt) (Kel'ya),Diploma in ERP(Kel'ya), SEOMaster Class (APIDM)*
එස්.එම්. ජයවර්ධන මයා - කථිකාචාර්ය (කොන්ත්‍රාත්)
*B.B.A (C'bo), MBA (C'bo), Six Sigma BlackBelt(BMGI)*
එස්.එම්.ඒ.එන්.එම්. සුභසිංහ මෙනවිය - කථිකාචාර්ය (කොන්ත්‍රාත්)
*B.B.Mgt (Mkt) (Kel'ya), MBA(Kel'ya), MDA(Kel'ya) (Reading), PGDM (SLIM), Dip. In Business IT and HR (SIBT), CDM(CÄ), AMSLIM, ACPM, CMA(Australia)*
යූ.ජේ. මිරැන්ඩෝ මයා - කථිකාචාර්ය (කොන්ත්‍රාත්)
*B.Sc. Operations & Technology Management (Special) (USJ), MBA(Kel'ya), AAT Passed finalist*
එස්.ඩබ්.අයි. උදාරා මෙනවිය - ආධුනික කථිකාචාර්ය(කොන්ත්‍රාත්)
*B.Sc.(Hons) Information Technology (Information System Engineering) (SLIIT), MBA (SLIIT) Reading*

වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශයෙහි ඒකකයක් වශයෙන් අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය 1998 වර්ෂයේ දී ස්ථාපිත කරනු ලැබූ අතර එය 2005 වර්ෂයේ දී අධ්‍යයන අංශයක් බවට පත් කෙරිණි. වර්තමානයේ මෙම අධ්‍යයන අංශය මඟින් ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණ ගෞරව උපාධි පාඨමාලාව සහ ව්‍යාපාර කළමනාකරණවේදී ඩිජිටල් අලෙවිකරණ ගෞරව උපාධි පාඨමාලාව පවත්වාගෙන යන අතර ව්‍යාපාර ලෝකයේ වෙනස් වන අවශ්‍යතා

සපුරාලීම මේ මඟින් අපේක්ෂිත ය. මෙම පාඨමාලා වසර 4 ක අධ්‍යයන කාලයකින් යුක්ත වන අතර අලෙවි කළමනාකරණය පිළිබඳවත් ඒ හා සම්බන්ධිත මූල්‍ය කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳවත් පුළුල් හා ගැඹුරු දැනුමක් ලබා දීමට මේ මඟින් කටයුතු කරනු ලැබේ. මෙම පාඨමාලා මඟින් විද්‍යාර්ථීන්ගේ මෘදු කුසලතා සංවර්ධනය කිරීම සඳහා විශේෂ ප්‍රවේශයකින් කටයුතු කරන අතර ම, එක් අවුරුදු අනිවාර්ය ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් මඟින් දැනුම පදනම් කරගත් ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීම ද සිදු කෙරේ.

අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය මඟින් ආයතනික සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් (Diploma in Enterprise Resource Planning) හා පුද්ගල කුසලතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් (Diploma in Peoples' Skills) අලෙවිකරණ විද්‍යාර්ථීන්ට හැදෑරීමට අවස්ථාව ලබා දී ඇත. මෙමඟින් බහු කුසලතාවලින් යුතු දක්ෂ, නිපුණ සහ ආත්ම විශ්වාසයෙන් හෙබි ව්‍යාපාරික අභියෝග ජයගත හැකි උපායශීලී විද්‍යාර්ථීන් බිහි කිරීමට අපේක්ෂා කෙරේ.

අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය මගින් පිරිනමනු ලබන උපාධි පාඨමාලාව හා ඩිප්ලෝමා පාඨමාලාවන් ද්විත්වය සම්පූර්ණ කරන ලද උපාධිධරයින් හට "Certified Professional Marketing Graduate - CPMG" යනුවෙන් උදෘතයක් ලබාදෙනු ලැබේ. මෙය ලබාගැනීම උදෙසා තරඟකාරී වෘත්තීය ඇගයීම් පටිපාටියක් හඳුන්වා දී ඇති අතර ඒ සඳහා CPMG සහතික කිරීමේ කමිටුවක් (අධ්‍යයන සහ ආයතනික සාමාජිකයින් ඇතුලත්ව) පිහිටුවා ඇත. මීට අමතරව අධ්‍යයන අංශය මගින් ව්‍යාපාර කළමණාකරණවේදී අලෙවිකරණ විශ්ලේෂ ගෞරව උපාධිය නමින් නව උපාධි පාඨමාලාවක් එළඹෙන වසරේදී හඳුන්වා දීමට නියමිතය.

එසේම මෙම අධ්‍යයන අංශය මඟින් අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක්, උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් හා අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණපති උපාධි පාඨමාලාවක් හඳුන්වා දී ඇති අතර පෞද්ගලික අංශයේ මෙන් ම රාජ්‍ය අංශයේ විධායක නිලධාරින්ට අලෙවිකරණය හා කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රීය ඥානය වර්ධනය කර ගැනීමට ඒ මඟින් අවකාශ සලසනු ලැබේ. මෙම අධ්‍යයන අංශයෙහි අවසාන අපේක්ෂාව වන්නේ නූතන ගෝලීය වෙනස්කම් පදනම් කර ගනිමින් දේශීය පරිසරය අවබෝධ කරගත හැකි බහු කුසලතා සහිත අනාගත උපායශීලී විද්‍යාර්ථීන් බිහි කිරීමයි.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 011 2903631, 011 2903624, 011 2903625 |
| අභ්‍යන්තර අංකය | - | 631, 624, 625 |
| ෆැක්ස් අංකය | - | 011 2917708 (වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය) |
| විද්‍යුත් ලිපිනය | - | mktm@kln.ac.lk, dmmktuk@gmail.com |

# විද්‍යා පීඨය



# විද්‍යා පීඨය

## පීඨාධිපති, අධ්‍යයනාංශ ප්‍රධානින් සහ පරිපාලන නිලධාරී



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදත් ආර්.ඩී. කාලිංගමුදලි මයා
පීඨාධිපති, විද්‍යා පීඨය



මහාචාර්ය ඩබ්.ඒ.පී.ජේ. ප්‍රේමරත්න මයා
අංශ ප්‍රධාන
රසායන විද්‍යා අධ්‍යයනාංශය



මහාචාර්ය ඩබ්.එම්.ජේ.අයි. විජයනායක මහතා
අංශ ප්‍රධාන
කර්මාන්ත පරිපාලන අධ්‍යයනාංශය



ආචාර්ය එල්. පී. එන්. ඩී. ප්‍රේමරත්න
අංශ ප්‍රධාන
ගණිත අධ්‍යයනාංශය



මහාචාර්ය අයි.වී.එන්. රත්නායක මිය
අංශ ප්‍රධාන
ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.බී.ඩී.ආර්.පී. විජේසුන්දර මයා
අංශ ප්‍රධාන
භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රෝනික විද්‍යා අධ්‍යයනාංශය



මහාචාර්ය ආර්.එම්.සී.එස්. රත්නායක මයා
අංශ ප්‍රධාන
ශාක සහ අණුක ජීව විද්‍යා අධ්‍යයනාංශය



ආචාර්ය ඒ.එම්.සී.එච්. අත්තනායක මිය
අංශ ප්‍රධාන
සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයනාංශය



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.ඩී. අමරසිංහ මිය
අංශ ප්‍රධාන
සත්ත්ව විද්‍යා සහ පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය



ආචාර්ය නලින් වර්ණජිත් මයා
අංශ ප්‍රධාන
මෘදුකාංග ඉංජිනේරු ඉගැන්වීම් ඒකකය



මහාචාර්ය ඩබ්ලිව්.ටී.එම්.ඒ.පී.කේ. වන්නිනායක මයා
අංශ ප්‍රධාන
ක්‍රීඩා හා ශාරීරික විද්‍යා ඒකකය



නාගරාජා සුබෝදිනි මෙනවිය
සහකාර ලේඛකාධිකාරි
විද්‍යා පීඨය

# 11. විද්‍යා පීඨය

**පීඨාධිපති**
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදත් ආර්.ඩී. කාලිංගමුදලි මයා
*B.Sc. (Kel'ya), Ph.D. (Sheffield), CSci, CEng, CPhys, FIET, FInstP, FIP (SL), MIEEE*

**සහකාර ලේඛකාධිකාරී**
නාගරාජා සුබෝදිනි මෙනවිය
*B.Sc. (RUSL), PgDBM (Colombo SL), MBA (USJ)*

විද්‍යා පීඨය අධ්‍යයනාංශ අටකින් සමන්විත වේ. ඒවා නම් කර්මාන්ත පරිපාලන, ක්ෂුද්‍රජීව විද්‍යා, ගණිත, භෞතික විද්‍යා සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා, රසායන විද්‍යා, ශාක හා අණුකජීව විද්‍යා, සත්ත්ව විද්‍යා හා පරිසර කළමනාකරණ, සංඛ්‍යාන හා පරිගණක විද්‍යා යන අධ්‍යයනාංශයන් ය. තවද විද්‍යා පීඨය මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව ඉගැන්වීමේ ඒකකය සහ ක්‍රීඩා හා ශාරීරික විද්‍යා ඒකකය යන අංශ දෙකකින් ද සමන්විත වේ.

මෙම පීඨය මඟින් විද්‍යාවේදී උපාධි 06ක් වසර 03 කාලයක් සඳහා පිරිනමනු ලබන අතර විද්‍යාවේදී ගෞරව උපාධි 19 ක් වසර 04ක කාලයක් සඳහා පිරිනමනු ලැබේ.

**විද්‍යාවේදී උපාධි පාඨමාලා**

(i) විද්‍යාවේදී උපාධි පාඨමාලාව
(ii) ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව විද්‍යාවේදි උපාධි පාඨමාලාව
(iii) පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය විද්‍යාවේදී උපාධි පාඨමාලාව
(iv) තොරතුරු තාක්ෂණය විද්‍යාවේදි උපාධි පාඨමාලාව
(v) කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය විද්‍යාවේදි උපාධි පාඨමාලාව
(vi) භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව විද්‍යාවේදී උපාධි පාඨමාලාව

**විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා**

(i) ව්‍යවහාරික රසායන විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(ii) ජෛව රසායන විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(iii) රසායන විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(iv) පරිගණක විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(v) පරිගණක අධ්‍යයනය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(vi) ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(vii) පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(viii) තොරතුරු තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(ix) කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(x) ගණිතමය භෞතික විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(xi) ගණිතය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(xii) ක්ෂුද්‍රජීව විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(xiii) අණුකජීව විද්‍යාව සහ ශාක ජෛව තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(xiv) භෞතික විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(xv) ශාක ජීවවිද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

(xvi) මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(xvii) ක්‍රීඩා විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(xviii) සංඛ්‍යානය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
(xix) සත්ත්ව විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

පාඨමාලා ඒකක ක්‍රමය අනුව මෙම පීඨයේ අධ්‍යයන කටයුතු සිදු කෙරේ. මෙම ක්‍රමය යටතේ අධ්‍යයන වර්ෂයක් අර්ධ වාර්ෂික (සමාසික) දෙකකින් සමන්විත වන අතර, සෑම අර්ධ වාර්ෂිකයක් (සමාසිකයක්) අවසානයේ දී ම එයට අදාළ පාඨමාලා ඒකක සඳහා පරීක්ෂණ පැවැත්වේ.

**(a) විද්‍යාවේදී හා විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා**

**විද්‍යාවේදී උපාධි පාඨමාලාව : ජෛවීය විද්‍යා විෂය ධාරාව, පළමු අධ්‍යයන වසර - පළමු අර්ධ වාර්ෂිකය**
ජෛවීය විද්‍යා විෂයධාරාව හදාරන විද්‍යාර්ථීන් එම විෂය ධාරාව සඳහා පළමු වසරේ පළමු අර්ධ වාර්ෂිකය සඳහා නම් කොට ඇති සියලු ම අනිවාර්යය පාඨමාලා ඒකක තෝරා ගත යුතු ය.

**විද්‍යාවේදී උපාධි පාඨමාලාව : ජෛවීය විද්‍යා විෂය ධාරාව, පළමු අධ්‍යයන වසර - දෙවන අර්ධ වාර්ෂිකය හා ඉන් ඉදිරියට**
පළමු වසරේ පළමු අර්ධ වාර්ෂිකයෙන් පසුව විද්‍යාර්ථීන්ට කාලසටහනෙහි අවකාශ ඇති පරිදි පහත සඳහන් විෂයයන් අතුරින් **විෂයයන් තුනක්** හා අමතර විෂයයන්ගෙන් **ආධාරක පාඨමාලා ඒකක** තෝරා ගැනීමට හැකි ය. ජෛවීය විද්‍යා විෂය ධාරාවෙහි, සීමිත විද්‍යාර්ථීන් සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනෙන විෂයයන් සඳහා විද්‍යාර්ථීන් තෝරා ගැනීම විද්‍යාර්ථියකු පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණයේ දී දක්වන කුසලතාව සහ ඔහුගේ/ඇයගේ කැමැත්ත මත, පළමුවන අධ්‍යයන වර්ෂයේ දෙවන අර්ධ වාර්ෂිකය ආරම්භයේ දී සිදු කෙරේ.

**ජෛවීය විද්‍යා විෂය ධාරාව**

BIOC - ජෛව රසායන විද්‍යාව
COST - පරිගණක අධ්‍යයනය
CHEM - රසායන විද්‍යාව
MIBI - ක්ෂුද්‍රජීව විද්‍යාව
PLBL - ශාක ජීවවිද්‍යාව
ZOOL - සත්ත්ව විද්‍යාව

ජෛවීය විද්‍යා විෂය ධාරාවේ ජෛව රසායන විද්‍යාව (BIOC), පරිගණක අධ්‍යයනය (COST), ක්ෂුද්‍රජීව විද්‍යාව (MIBI) යන විෂයයන් සඳහා සීමිත විද්‍යාර්ථයින් සංඛ්‍යාවක් තෝරාගනු ලැබේ. ජෛවීය විද්‍යා විෂය ධාරාවේ පළමු වසරේ දෙවන අර්ධ වාර්ෂිකයේ හා ඉන් ඉදිරියට හා දෙවන වසරේ විද්‍යාර්ථීන්ට තෝරාගත හැකි විෂය සංකලන විද්‍යාපීඨ ශිෂ්‍ය අත්පොතේ සඳහන් වේ.

**විද්‍යාවේදී උපාධි පාඨමාලාව : භෞතීය විද්‍යා විෂය ධාරාව, පළමු වසර**
භෞතිය විද්‍යා විෂය ධාරාව හදාරන විද්‍යාර්ථීන්ට පළමු වසරේදී අනිවාර්ය ශුද්ධ ගණිතය හා ව්‍යවහාරික ගණිතය පාඨමාලා ඒකක ඇතුළු ව පහත සඳහන් විෂයයන් කිහිපයකින් සමන්විත විෂය සංකලන තෝරා ගැනීමට හැකි ය. වැඩි විස්තර සඳහා විද්‍යා පීඨ ශිෂ්‍ය අත්පොත බලන්න.

- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව
- පරිගණක විද්‍යාව

- පරිගණක අධ්‍යයනය
- සංඛ්‍යානය
- ඉලෙක්ට්‍රොනික විද්‍යාව

භෞතීය විද්‍යා විෂය ධාරාවෙහි සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගනු ලබන පාඨමාලා සඳහා පළමු වසර පළමු සමාසිකය ආරම්භයේ දී ශිෂ්‍යයන් තෝරා ගනු ලැබේ.

**භෞතීය විද්‍යා විෂය ධාරාව**

AMAT - ව්‍යවහාරික ගණිතය
CHEM - රසායන විද්‍යාව
COSC - පරිගණක විද්‍යාව
COST - පරිගණක අධ්‍යයනය
ELEC - ඉලෙක්ට්‍රොනික විද්‍යාව
PHYS - භෞතික විද්‍යාව
PMAT - ශුද්ධ ගණිතය
STAT - සංඛ්‍යානය

භෞතීය විද්‍යා විෂය ධාරාවේ රසායන විද්‍යාව (CHEM), පරිගණක විද්‍යාව (COSC), පරිගණක අධ්‍යයනය (COST), ඉලෙක්ට්‍රොනික විද්‍යාව (ELEC), භෞතික විද්‍යාව (PHYS), සංඛ්‍යානය (STAT) යන විෂයයන් සඳහා සීමිත විද්‍යාර්ථීන් සංඛ්‍යාවක් තෝරා ගනු ලැබේ.

සෑම විද්‍යාර්ථියකු ම පළමු වසරේ දී ලියාපදිංචි කරනු ලබන්නේ විද්‍යාවේදී උපාධිය සඳහා වන අතර, අදාළ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා සඳහා විද්‍යාර්ථීන් තෝරා ගනු ලබනුයේ දෙවන වසර අවසානයේ දී ය. මුල් වසර දෙක තුළ දී උපරිම දක්ෂතා දක්වන විද්‍යාර්ථීන් අතරින් තෝරා ගත් සීමිත විද්‍යාර්ථීන් සංඛ්‍යාවක් විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා සඳහා තෝරා ගනු ලැබේ.

**විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා**

විද්‍යා පීඨයේ පහත සඳහන් විෂයයන්ගෙන් විද්‍යාවේදී ගෞරව උපාධි පිරිනමනු ලැබේ.

- ජෛව රසායන විද්‍යාව
- රසායන විද්‍යාව
- පරිගණක විද්‍යාව
- පරිගණක අධ්‍යයනය
- පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය
- ගණිතමය භෞතික විද්‍යාව
- ගණිතය
- ක්ෂුද්‍රජීව විද්‍යාව
- අණුකජීව විද්‍යාව සහ ශාක ජෛව තාක්ෂණය
- භෞතික විද්‍යාව
- ශාක ජීවවිද්‍යාව
- සංඛ්‍යානය
- සත්ත්ව විද්‍යාව

**තෙවන වසර සහ සිව්වන වසර**

තෙවන සහ සිව්වන වසරවල දී අදාළ පරිදි කාලසටහනේ අවකාශ ලැබෙන අයුරින් විෂය ඒකක සංකලන තෝරා ගත හැකි ය. ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු විද්‍යා පීඨ ශිෂ්‍ය අත්පොතේ සඳහන් වේ.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 011 2903201, 011 2903202, 011 2903203 |
| ෆැක්ස් අංකය | - | 011 2903203 |
| විද්‍යුත් ලිපිනය | - | officesc@kln.ac.lk |

## 11.1 රසායන විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ඩබ්ලිව්.ඒ.පී.ජේ. ප්‍රේමරත්න මයා - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.Sc. (Kel'ya), Ph.D. (Birmingham, UK)*
මහාචාර්ය පී.ඒ. පරණගම මිය - විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.Sc. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (Glas, UK), F.I.Chem.C., C.Chem.*
මහාචාර්ය ජේ.ඒ. ලියනගේ මිය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (සේවයෙන් නිදහස් කරන ලද)
*B.Sc. (S.J'pura), Ph.D. (Cardiff, UK), FRSC, F.I.Chem.C., C.Chem., C.Sci.*
මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න මයා - ජ්‍යෂ්ඨ මහාචාර්ය (**පීඨාධිපති - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය**)
*B.Sc. (Kel'ya), Ph.D. (Wayne State, USA), M.I.Chem.C., C.Chem.*
මහාචාර්ය බී.එම්. ජයවර්ධන මිය - ජ්‍යෂ්ඨ මහාචාර්ය
*B.Sc. (C'bo), Ph.D. (Illinois in Chicago, USA)*
මහාචාර්ය එම්.කේ.බී. වීරසූරිය මිය - මහාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (Bristol, UK), M.I.Chem.C., C.Chem.*
මහාචාර්ය එන්. ජයතිලක - මහාචාර්ය
*B.Sc. (Wisconsin Superior, USA), Ph.D. (Southern California, USA)*
මහාචාර්ය සී.කේ. ජයසූරිය මිය - මහාචාර්ය
*B.Sc. (C'bo), M.Sc. (Cincinnati, USA), Ph.D. (Cincinnati, USA)*
මහාචාර්ය ඩී.එස්.එම්. ද සිල්වා මිය - මහාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (Sheffield, UK), M.I.Chem.C.*
මහාචාර්ය පී.ඒ.එස්.ආර්. වික්‍රමාරච්චි මිය - මහාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (Sheffield Hallam, UK)*
මහාචාර්ය ඩී.ආර්. පණ්ඩිතවිදාන මයා - මහාචාර්ය
*B.Sc. (C'bo), Ph.D. (Georgia, USA)*
මහාචාර්ය ඒ.එම්.ටී. අමරකෝන් මයා - මහාචාර්ය
*B.Sc. (Perad'ya), Ph.D. (Southampton, UK)*
මහාචාර්ය සී.එස්.කේ. රාජපක්ෂ මිය - මහාචාර්ය
*B.Sc. (Perad'ya), M.Phil. (CUNY, USA), Ph.D. (CUNY, USA)*
ආචාර්ය ඒ.ඒ.එල්. රත්නතිලක මයා - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), Dip. In Chem. (Zurich, Switzerland), Ph.D. (Zurich, Switzerland)*
ආචාර්ය ආර්.සී.එල්. ද සිල්වා මයා - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (C'bo), Ph.D. (Iowa, USA)*
ආචාර්ය එම්.පී. දීයමුල්ල මයා - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), Ph.D. (Cambridge, UK), MRSC*
මහාචාර්ය එම්.ඒ.වයි.එල්. නදීෂ මයා - මහාචාර්ය
*B.Sc. (Kel'ya) Ph.D. (Oklahoma State, USA)*
ආචාර්ය ඒ.ජී.එම්.ජේ. ගුණරත්න මිය - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (C'bo), Ph.D. (Kansas State, USA)*
ආචාර්ය ජේ.එන්. දහනායක මිය - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (C'bo), Ph.D. (Wichita State, USA)*
ආචාර්ය සී.සී. කඩිගමුව මහතා - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (Wichita State, USA) Ph.D. (Wichita State, USA)*
ආචාර්ය ඩී.ඩී.සී. ද එස්. වන්නිආරච්චි මිය - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Perad'ya), Ph.D. (Wayne State, USA)*
ආචාර්ය ඒ. එම්. ඩී. එම්. බි. අබේකෝන් මයා - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Perad'ya), Ph.D. ( University of Maryland ,USA)*

රසායන විද්‍යා අධ්‍යයනාංශය මගින් ශිෂ්‍යයින් සඳහා රසායන විද්‍යාව හා ජෛව රසායන විද්‍යාවට අදාළ ව පුළුල් අධ්‍යාපනයක් ලබා දෙන අතර ජෛවීය විද්‍යා හා භෞතීය විද්‍යා විෂය ධාරා යටතේ විද්‍යාවේදී උපාධි සඳහා අවශ්‍ය රසායන විද්‍යාව හා ජෛව රසායන විද්‍යාවට අදාළව පාඨමාලා ඒකක ඉදිරිපත් කරනු ලබයි. තවද පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාවට අදාල රසායන විද්‍යා පාඨමාලා ඒකක ඉගැන්වීම ද රසායන විද්‍යා අධ්‍යයනාංශය මඟින් සිදු කරනු ලබයි.

පළමු අධ්‍යයන වර්ෂ දෙකෙහි දී හදාරනු ලබන අනිවාර්ය රසායන විද්‍යා හා ජෛව රසායන විද්‍යා පාඨමාලා ඒකක සඳහා දක්වන දක්ෂතාවය මත සීමිත විද්‍යාර්ථීන් සංඛ්‍යාවක් පිළිවෙලින් රසායන විද්‍යාව සහ ජෛව රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා සඳහා තෝරා ගනු ලැබේ. විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව හදාරන විද්‍යාර්ථියෙකු, සිව්වන අධ්‍යයන වර්ෂය තුළ දී, අංශය මගින් නම් කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකුගේ අධීක්ෂණය යටතේ පර්යේෂණ ව්‍යාපෘතියක නිරත විය යුතු වේ. මීට අමතර ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා විශේෂ ප්‍රවේශ යටතේ ව්‍යවහාරික රසායන විද්‍යාව පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව සඳහා සීමිත විද්‍යාර්ථීන් සංඛ්‍යාවක් බඳවා ගැනේ.

අකාබනික රසායනය, කාබනික රසායනය, භෞතික රසායනය, විශ්ලේෂණ රසායනය, ජෛව රසායනය සහ ජෛව තාක්ෂණය, පරිගණක රසායනය, පාරිසරික රසායනය, ද්‍රව්‍යමය රසායනය සහ බහු අවයවික රසායනය යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පහසුකම් මෙම අධ්‍යයනාංශය සතු ව ඇත. කර්මාන්ත හා පාරිසරික රසායන විද්‍යාව, විශ්ලේෂණ රසායන විද්‍යාව සහ ජෛව රසායන විද්‍යාව හා ජෛව තාක්ෂණය යනුවෙන් විද්‍යාපති (MSc) පාඨමාලා තුනක් රසායන විද්‍යා අධ්‍යයනාංශය මගින් පවත්වාගෙන යනු ලබයි. පර්යේෂණ මත පදනම් වූ දර්ශනපති (MPhil) සහ දර්ශන විශාරද (PhD) යන පශ්චාද් උපාධි සඳහා අවශ්‍ය පහසුකම් ද මෙම අංශය සතුය.

රසායන විද්‍යා අධ්‍යයනාංශය යටතේ ස්ථාපිත ජාතික විද්‍යාත්මක වීදුරු උපකරණ නිර්මාණ මධ්‍යස්ථානය මගින් අප විශ්වවිද්‍යාලය තුළ මෙන් ම අනෙකුත් විශ්වවිද්‍යාලවල ඉගැන්වීම් සහ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය විද්‍යාත්මක වීදුරු උපකරණ නිපදවීම සහ අලුත්වැඩියාව සිදුකරනු ලබයි. ඊට අමතර ව මෙම මධ්‍යස්ථානය මගින් පර්යේෂණ ආයතන සහ කර්මාන්ත සඳහා ද ඉහත සේවාවන් සපයනු ලබයි.

දුරකථන අංක - 011 2914486, 011 2903251

## 11.2 කර්මාන්ත පරිපාලන අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ඩබ්.එම්.ජේ.අයි. විජයනායක මහතා - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.Sc. Hons (Kel'ya), M.Eng (Tokyo Tech, Japan), Ph.D. (Tokyo Tech, Japan)*
මහාචාර්ය පී.එල්.එස්. පීටර් මහතා - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Sc. Hons (Kel'ya), M.Sc. (Georgia Tech, USA), M.Phil. (MSM, Netherlands), DBA (MSM, Netherlands)*
ආචාර්ය ජී.පී.ආර්. වික්‍රමාරච්චි මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. Hons (Kel'ya), M.Phil. (Cambridge, UK), Ph.D. (Sheffield Hallam, UK)*
ආචාර්ය එස්.ජී.වී.එස්. ජයලාල් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Sc. Hons (Kel'ya), PG. Dip. (C'bo), Ph.D. (Keele, UK)*
ආචාර්ය එච්.කේ.ටී.කේ. විජයසිරිවර්ධන මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. Hons (Kel'ya), M.Sc. (C'bo) Ph.D. (La Trobe, Australia)*
ආචාර්ය ඩී.එන්. වික්‍රමආරච්චි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. Hons (Kel'ya), M.Sc. (C'bo), Ph.D. (La Trobe, Australia)*
ආචාර්ය ආර්.ජී.සී.පී. රාජපක්ෂ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. Hons (Kel'ya), MEng (Tokyo Tech, Japan), DEng. (Tokyo Tech, Japan)*
ආචාර්ය ජී.එස්. විතානආරච්චි මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. Hons (Kel'ya), M.Phill. (Kel'ya), MFA (La Trobe, Australia), Ph.D. (Newcastle, Australia)*
සී. ආර්. ඔරුතොටආරච්චි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. Hons (C'bo), M.Phil. (Kel'ya)*
පී.පී.ජී. දිනේෂ් අසංක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. Eng (Mor'wa), M.Sc (Mor'wa), MBA (Mor'wa)*
ආචාර්ය කේ.සී. අයන්ති මෙනවිය - කථිකාචාර්ය (තහවුරු නොකළ)
*B.Sc. Hons (Mor'wa), MEng (Tokyo Tech, Japan), D.Eng. (Tokyo Tech, Japan)*
ආචාර්ය කේ.ආර්. තිළිනි වී. මහානාම මෙනවිය - කථිකාචාර්ය (තහවුරු නොකළ)
*B.Sc. (Kel'ya), M.Sc. (Texas Tech, USA), Ph.D. (Texas Tech, USA)*
එන්.එන්. ලියනාරච්චි මයා - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. Eng Hons (Mor'wa)*
බී.ජේ. වටවන මයා - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*BTech (Uva Wellassa)*
එච්.ජී.ආර්. නිලානී මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. Hons (Kel'ya), M.Sc. (C'bo)*
බී.කේ. ජයවර්ධන මයා - ආධුනික කථිකාචාර්ය
*B.Sc. Hons (Kel'ya)*
වී.කේ. තාරකා මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. Hons (Mor'wa), MBA (S.J'pura)*
ඩබ්ලිව්.ජී.එම්. නිරංගා මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*BBA Hons (Perad'ya), MBA (C'bo), MLRHRM (C'bo)*
ඩී.එච්.එච්. නිවුන්හැල්ල මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. Hons (Kel'ya)*
ජේ.එම්.ඩී. සේනානායක මයා - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. Hons (Kel'ya)*
ඩබ්ලිව්.එච්.එල්. යෙහෙමිණි ජයතිස්ස මිය - ආධුනික කථිකාචාර්ය
*B.Sc. Hons (Kel'ya), MBA (S.J'pura)*

**හැඳින්වීම.**

කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය විද්‍යා පීඨයේ ප්‍රධාන අධ්‍යයන අංශයක් ලෙස 1967 දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ විද්‍යා පීඨයක ඇති ප්‍රථම සහ එකම කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය වන එහි ආරම්භය, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුවිශේෂ සිදුවීමක් වූ අතර එය අදටත් එහි සතු විශිෂ්ටත්වයකි.

අධ්‍යයන අංශයේ ආරම්භයේ සිටම විද්‍යාවේදී උපාධිය හදාරන විද්‍යාර්ථීන්ට කළමනාකරණය තනි විෂයක් ලෙස ලබාදෙන ආයතනයක් විය. 1990 දශකයේ මුල් භාගයේදී එය ප්‍රධාන විෂයන් දෙකක් සමගින් තොරතුරු තාක්ෂණය තම පාඨමාලාවන්ට ඇතුළත් කිරීම දක්වා සීඝ්‍රයෙන් වර්ධනය වී ඇත.

විද්‍යාර්ථීන්ට කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණ යන විෂය පථයන් ද්විත්වය සඳහා විශේෂකරණයන් ලබාදීමට ගත් තීරණය මගින් අධ්‍යයන අංශයේ සැලකිය යුතු වර්ධනයක් සිදුවිය. පෙරළිකාර පියවරක් ලෙස 2003දී අධ්‍යයන අංශය තමාගේ ම උපාධි වැඩසටහනක් එනම් කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි වැඩසටහනක් හඳුන්වා දීමට පුරෝගාමී විය. තෝරාගත් සිසුන් පනස් දෙනෙකුට කළමණාකරනය සහ තොරතුරු තාක්ෂණය ඒකාබද්ධ කරන උපාධියක් මගින් ඔවුන් සවිබල ගැන්වීමට අවස්ථාව සලසාදී ඇති අතර එම සම්මිශ්‍රණය, විද්‍යාර්ථීන් ඵලදායි සහ සවල පුද්ගලයන් බවට පත් කරයි. විද්‍යාර්ථීන්ගේ නායකත්වය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කරගැනීම සඳහා විෂය බාහිර ක්‍රියාකාරකම් සංවිධානය කර ඇත. මෙම ක්‍රියාකාරකම් අපගේ සියලු ම විද්‍යාර්ථීන් සඳහා අනිවාර්ය වේ. ක්ෂේත්‍ර චාරිකා, සීමාවාසික පුහුණුව, කඳවුරු ශෛලීයේ ක්‍රියාකාරකම් මීට ඇතුළත් වේ.

එතැන්සිට කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය සිය විශේෂඥතාව උපයෝගි කරගනිමින් වෘත්තිකයින්ට පශ්චාත් උපාධි වැඩසටහන් තුනක් හඳුන්වාදීමෙන් සිරස් සංවර්ධනයක් ද කර්මාන්තවලට වෘත්තීය සේවා සැපයීමෙන් තිරස් සංවර්ධනයක් ද ළඟා කරගෙන ඇත. අපගේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ද්විත්වය වන කර්මාන්ත හා ව්‍යාපාර කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ අපගේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව වන කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය එම ක්ෂේත්‍රවල උසස් යෙදුම් කුසලතා ලබා ගැනීමට අපේක්ෂා කරන වෘත්තිකයින් සහ විද්වතුන් ඉලක්ක කර ඇත. අධ්‍යයන අංශය තොරතුරු තාක්ෂණ ශාස්ත්‍රපති (Master in IT) සහ විප්ලවීය තොරතුරු විශ්ලේෂණ ශාස්ත්‍රපති (Master in Data Analytics) උපාධි පාඨමාලා ආරම්භ කරමින් දැන් එහි විෂය පථය පුළුල් කර ඇත.

ආයතනික අවශ්‍යතා සහ කර්මාන්ත ප්‍රවණතා තක්සේරු කිරීමේදී ගත් ක්‍රියාකාරී ස්ථාවරය, කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය යන දෙඅංශයේ පළපුරුදු අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කැපවීම, තම කාලය ඉගෙනුමට සහ ඉගෙනුම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට ආයෝජනය කරන විද්‍යාර්ථීන්ගේ කැපවීම කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශයේ පාඨමාලාවල සාර්ථකත්වයට හේතු වේ.

අධ්‍යයන අංශයේ ප්‍රධාන උපායමාර්ගික ශක්තිය එහි කාර්ය මණ්ඩලයේ අධ්‍යයන සහ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද වේ. එක් අධ්‍යයන අංශයක ඉංජිනේරු, තොරතුරු තාක්ෂණ සහ කළමනාකරණ පසුබිම් සහිත බාහු-විනය අධ්‍යයන කාර්ය මණ්ලයේ සම්මිශ්‍රණය අද්විතීය වන අතර එය කර්මාන්තයේ වත්මන් අවශ්‍යතාවක් වන විවිධ කුසලතා ඇති විශේෂඥ උපාධිධාරීන් බිහිකිරීම සපුරාලීමට උපාය මාර්ගික වාසියක් සපයයි. එමගින් තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය ඒකාබද්ධ කිරීමේ දිවයිනේ ප්‍රමුඛත ම ආයතනයක් බවට පත්වීමට මෙම අධ්‍යයන අංශයට හැකිවී තිබේ.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් ඉස්මතු කරන ලද අදාළ විෂයන් පිළිබඳ සමස්ත දැනුම සහ කුසලතා, සන්නිවේදන සහ නායකත්ව කුසලතා සහ කණ්ඩායම් පරිසරයක හොඳින් වැඩකිරීමේ හැකියාව පිළිබඳ ව අපගේ සිසුන්ට කර්මාන්තයෙන් ඉහළ ප්‍රතිචාරයක් ලැබී ඇත. තවද කළමණාකරනය සහ තොරතුරු තාක්‍ෂණය පිළිබඳ විද්‍යාර්ථීන්ගේ හැකියාව, කුසලතා පිළිබඳ විශ්වාසය සහ කර්මාන්ත සහ රැකියා විස්තර හරහා එම කුසලතා ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව ඇති මනා වෘත්තිකයෙකු ගොඩනැගීමේ අපගේ උත්සාහයට ඔවුන් ඉතා ධනාත්මක ලෙස ප්‍රතිචාර දක්වා ඇත. අපගේ විද්‍යාර්ථීන්ගේ සාර්ථකත්වය ඔවුන්ගේ සාමාන්‍ය ආරම්භක වැටුප සහ උපාධියෙන් පසු රැකියා ආරම්භක අනුපාතය සහ ද්විත්වයෙන් ම පිළිබිඹු වේ. MIT උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය ඉහළ රැකියා ආරම්භක අනුපාත මගින් පිළිබිඹු වන අතර විද්‍යාර්ථීන් බොහෝ දෙනෙක් අවසන් වසර විභාග අවසන්වීමටත් පෙර සේවා නියුක්තිකයන් බවට පත්ව ඇත. අපගේ උපාධිධාරීන් ව්‍යාපාර විශ්ලේෂක, මෘදුකාංග ඉංජිනේරු, විධායක - තත්ත්ව සහතික, කළමණාකරන අභ්‍යාසලාභීන් වැනි පුළුල් පරාසයක තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

අපගේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සැලකිය යුතු උපදේශන සහ පර්යේෂණ ව්‍යාපෘති ගණනාවක නියැලී සිටින අතර එවායේ ප්‍රතිඵල ඉහළ පිළිගැනීමක් ඇති අතර එවා දේශීය සහ විදේශීය සඟරා ගණනාවක ප්‍රකාශයට පත් කර ඇත. තවද අපගේ කාර්ය මණ්ඩලය වටිනා පෙළපොත් ප්‍රකාශයට පත් කර ඇති අතර ඔවුන් විවිධ ජාත්‍යන්තර සඟරාවල කර්තෘ මණ්ඩලවල ද සේවය කරයි. මෙයට අමතර ව අප අධ්‍යයන කාර්ය මණ්ඩලය විවිධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විධායක මණ්ඩලවල සේවය කරයි.

විශ්වවිද්‍යාලය සහ කර්මාන්ත අතර සබඳතා වර්ධනය කර ගැනීම සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රායෝගික නිරාවරනයේ අමතර ප්‍රතිලාභ උදෙසා අධ්‍යයන අංශය රට තුළ තත්ත්ව කළමණාකරන උපදේශන සේවා සඳහා කීර්තියක් අත්කර ගෙන ඇත. ලෝක බැංකුව, UNDP, UNIDO, ILO මෙන් ම දේශීය පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතන ගණනාවක් සඳහා එවැනි උපදේශන සේවා සිදුකර ඇත.

UNDP අරමුදල් සහිත UNIDO විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් මගින් විශේෂ මධ්‍යස්ථානයක් අධ්‍යයන අංශයට අනුබද්ධව පිහිටුවන ලදී. එය ව්‍යවසාය කළමණාකරන තොරතුරු සේවා මධ්‍යස්ථානය (Centre for Enterprise Management Information Services - CEMIS) වන අතර එය සංවර්ධනය වෙමින් පවතින රටක UNIDO විසින් පිහිටුවන ලද පළමු එවැනි මධ්‍යස්ථානය වේ.

ජාතියේ දිගුකාලීන සංවර්ධන අරමුණු සපුරාලීම උදෙසා මානව ප්‍රාග්ධනය නිෂ්පාදනය කිරීම සඳහා එහි වත්මන් වැඩසටහන් පුළුල් කරමින් සහ එහි මූලික නිපුණතා මත ප්‍රයෝජනයට ගනිමින් නව වැඩසටහන් ඉදිරිපත් කරමින් සංවර්ධනයේ ඊළඟ අදියර ක්‍රියාත්මක කිරීමට කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය අදහස් කරයි. දිවයිනේ හඳුනාගත් ප්‍රධාන ක්ෂේත්‍රවල ප්‍රමුඛතම පර්යේෂණ මධ්‍යස්ථානයක් බවට පත්වීමේ උපාය මාර්ගයක් ද අධ්‍යයන අංශය විසින් සකස් කර ඇත.

**කළමනාකරණය සහ තොරතුරු තාක්‍ෂණ ගෞරව උපාධි පාඨමාලාව/ තොරතුරු තාක්‍ෂණ ගෞරව උපාධි පාඨමාලාව**

මෙම සිව් අවුරුදු ගෞරව උපාධි වැඩසටහන් කළමනාකරණ සහ තොරතුරු තාක්‍ෂණ විෂයන්වල සම්මිශ්‍රණයක් ලෙස පුළුල් පරාසයක දැනුම සහ කුසලතා පිරිනමයි. තෝරාගත් විද්‍යාර්ථීන්ට පළමු අධ්‍යයන වසර අවසානයේ කළමනාකරණය සහ තොරතුරු තාක්‍ෂණ ගෞරව උපාධි (BSc. Honours in MIT) හෝ තොරතුරු තාක්‍ෂණ ගෞරව උපාධි (BSc. Honours in IT) පාඨමාලාව

තෝරාගැනීමට සිදුවේ. එම තෝරාගැනීම ශිෂ්‍ය කාර්යසාධනය සහ විද්‍යාර්ථීන්ගේ කැමැත්ත මත පදනම්ව සිදු කෙරේ. තොරතුරු තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාවේ ඊළඟ වසර තුන විද්‍යාර්ථීන්ගේ වෘත්තීය අරමුණු මත පදනම්ව ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ නිපුණතා ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. මෙම උපාධි පාඨමාලාව පරිගණක වෘත්තිකයන් සඳහා වැඩිවන ජාතික සහ ජාත්‍යන්තර අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සැලසුම් කර ඇත. මෙහි විෂය මාලාව ACM සහ IEEE වැනි පිළිගත් වෘත්තීය ආයතනවල නවතම මාර්ගෝපදේශ අනුගමනය කරන අතර මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව (Software Engineering), දත්ත විද්‍යාව (Data Science), පද්ධති ඉංජිනේරු (Systems Engineering), දත්ත සමුදා පරිපාලන (Data Base Administration), ව්‍යාපාර විශ්ලේෂණය (Business Analysis), ජාල ඉංජිනේරු විද්‍යාව (Network Engineering), මෘදුකාංග තත්ත්ව ඉංජිනේරු විද්‍යාව (Software quality Engineering) වැනි විෂයන් මගින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තියක් තෝරා ගැනීමට අවශ්‍ය දැනුම සහ කුසලතා විද්‍යාර්ථීන්ට ලබාදීමට අරමුණු කරයි.

කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව සඳහා තෝරාගත් විද්‍යාර්ථීන්ට දෙවන අධ්‍යයන වර්ෂය අවසානයේ පහත සඳහන් ක්ෂෙත්‍රවලින් එකකට විශේෂීකරණයවීමට අවස්ථාව තිබේ. ව්‍යාපාර පද්ධති ඉංජිනේරු (Business Systems Engineering - BSE), මෙහෙයුම් සහ සැපයුම්දාම කළමනාකරණය (Operation & Supply Chain Management - OSCM) සහ තොරතුරු පද්ධති (Information Systems - IS) එම ක්ෂේත්‍රවේ.

### අ). ව්‍යාපාර පද්ධති ඉංජිනේරු (Business Systems Engineering - BSE)

ව්‍යාපාර පද්ධති ඉංජිනේරු විද්‍යාව යනු ව්‍යාපාරයක් සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ව්‍යාපාර ක්‍රියාවලි, කාර්යයන් සහ ගණුදෙනු හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමේ සවිස්තරාත්මක ප්‍රවේශයකි. ගෝලීය වෙළඳපොළ තුළ තරඟ කිරීමට සහ අපගේ ආයතන මෙම ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය මගින් සවිබල ගැන්වූ ගෝලීය මට්ටමේ කළමණාකරන භාවිතයන් සමගින් ඔවුන්ගේ ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම වැදගත් වේ.

### ආ). මෙහෙයුම් සහ සැපයුම්දාම කළමනාකරණය (Operation & Supply Chain Management - OSCM)

මෙම වැඩසටහනේ විෂය මාලාව පදනම් වී ඇත්තේ සැපයුම්දාම මෙහෙයුම් කළමනාකරණය ගෝලීය මට්ටමේ භාවිතයන් පිළිබඳ තොරතුරු තාක්ෂණයේ සක්‍රීය යෙදුම මතය එබැවින් මෙහෙයුම් සහ සැපයුම්දාම කළමනාකරණ ක්ෂේත්‍රයේ යෙදුම් සඳහා අභිරුචිකරණය කරන ලද ව්‍යාපාර ක්‍රියාවලි, කළමනාකරණය පිළිබඳ වෘත්තීය දැනුම සහ කුසලතා ලබාදීම මෙහි අරමුණයි.

### ඇ). තොරතුරු පද්ධති (Information Systems - IS)

ව්‍යාපාර ප්‍රධානීන්ට තීරණ ගැනීම සඳහා කාලෝචිත තොරතුරු ලබාදීම සහතික කිරීම සඳහා තොරතුරු පද්ධති උපායමාර්ගික කාර්යභාරයක් ඉටුකරයි. එය තම පාරිභෝගිකයන් වෙත නිෂ්පාදන සහ සේවා ලබාදීමේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිකරන අතර පාර්ෂවකරුවන්ට උපරිම ප්‍රතිලාභ ලබාදීමට සහය වේ. එබැවින් මෙම ගතික සහ තරඟකාරී පරිසරය තුළ ව්‍යාපාරය සාර්ථක වීමට නම් තොරතුරු තාක්ෂණ සම්පත් කළමනාකරණය ඉතා වැදගත් වේ. තොරතුරු පද්ධති විශේෂීකරණයේ මූලික පරමාර්ථය වන්නේ අවශ්‍ය මානව හා භෞතික සම්පත් කළමනාකරණය කරමින් ආයතනික උපාය මාර්ග හා ක්‍රියාවලීන් සමග ඉතා තදින් බැඳී ඇති තොරතුරු පද්ධති ලබාගැනීම, නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ඇති වෘත්තිකයන් සංවර්ධනය කිරීමයි.

දැනුම සහ කුසලතා හැරුණුවිට උපාධි පාඨමාලා දෙකකම උපාධිධාරීන්ට වෘත්තීය ලෝකයට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය මෘදුකුසලතා ද සංවර්ධනය කරයි.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 011 2903281, 011 2903282, 011 2903285, 011 2914482 |
| අභ්‍යන්තර අංක | - | 282 |
| ෆැක්ස් අංකය | - | 011 2903281 |
| වෙබ් අඩවිය | - | www.dim.kln.ac.lk |
| විද්‍යුත් ලිපිනය | - | im@kln.ac.lk |

## 11.3 ගණිත අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය එල්.පී.එන්.ඩී. ප්‍රේමරත්න මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.Sc. (Kel'ya), M.Sc. (Mor'wa), Ph.D. (Massey, New Zealand)*
ආචාර්ය ජී.එස්. විජේසිරි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.A. (Oakland, USA), Ph.D. (Oakland, USA)*
ආචාර්ය එන්.පී.ඩබ්ලිව්.බී.වී.කේ. සේනානායක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.Sc. (Kyushu, Japan), Ph.D. (Saga, Japan)*
එන්.ජී.ඒ. කරුණාතිලක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.Sc. (Kaiserslautern, Germany)*
ජේ. මුණසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.Sc.nat. (Kaiserslautern, Germany)*
ආචාර්ය කේ.කේ.කේ.ආර්. පෙරේරා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.Sc. (C'bo), M.Sc. (Kyushu, Japan), Ph.D. (Kyushu, Japan)*
එන්.ඒ.එස්.එන්. විමලධර්ම මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.Phil (Kel'ya)*
ආචාර්ය ඩබ්ලිව්.පී.ටී. හංසමීනු මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.Sc. (Texas Tech, USA), Ph.D. (Texas Tech, USA)*
ආචාර්ය බී.බී.යූ.පී. පෙරේරා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Ruh.), BCS, ACS, M.Sc. (Mor'wa), Ph.D. (Potsdam,Germany)*
කේ.ඩී.ඩබ්ලිව්.ජේ. කටුගම්පල මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Phil. (Kel'ya)*
ආචාර්ය එම්.එච්.එල්. වීරසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (Missouri S&T, USA), Ph.D. (Missouri S&T, USA)*
ආචාර්ය ටී.එම්.එම්. ද සිල්වා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (Texas Tech, USA), Ph.D. (Texas Tech, USA)*
ආචාර්ය එස්.වී.ඒ. අල්මේදා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (Texas Tech, USA), Ph.D. (Texas Tech, USA)*
ආචාර්ය එම්. සී. එස්. ප්‍රනාන්දු මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Run), M.Sc. (LUT, Finland), Ph.D.(Kaiserslautern, Germany)*
එස්.එච්.ඩී.එස්. ද සිල්වා මෙය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Kel'ya), M.Sc. (Illinois, USA)*
එච්.ඒ.ඩී. ප්‍රියසාද් මයා - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Kel'ya)*
කේ.ජී.එම්.යූ. වික්‍රමසිංහ මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (SP) (Kel'ya)*

වර්ෂ 1959 දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය ආරම්භ කිරීමත් සමග ඇති කරන ලද අධ්‍යයන අංශ අතරට ගණිත අධ්‍යයනාංශය ද ඇතුළත් විය. 1967 දී කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය ආරම්භ කිරීමත් සමගම එවකට කලා පීඨය යටතේ පැවැති ගණිත අධ්‍යයනාංශය විද්‍යා පීඨයට අන්තර්ග්‍රහණය කරන ලදි. එතැන් සිට විද්‍යා පීඨයේ ඇති දෙපාර්තමේන්තු අතරින් එකක් වන ගණිත අධ්‍යයනාංශය, ගණිත අධ්‍යාපනය දේශීය හා විදේශීය වශයෙන් පුළුල් කිරීම සඳහා සහ දායකත්වය ලබා දෙමින් සිටී.

ගණිත අධ්‍යයනාංශය මගින් භෞතීය විද්‍යා අංශයේ විද්‍යාවේදී උපාධිය සඳහා ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය යන ප්‍රධාන විෂයන් දෙකකට අයත් පාඨමාලා ඒකක පිරිනමයි. ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය පිළිබඳ ගෞරව උපාධි ගණිත අධ්‍යයන අංශය මගින් පවත්වා ගෙන

යනු ලබන අතර සංඛ්‍යාන සහ පරිගණක අධ්‍යයන අංශය සමඟ එක්ව ශුද්ධ ගණිතය සහ සංඛ්‍යානය පිළිබඳ ගෞරව උපාධිය ද භෞතික විද්‍යා අංශය සමඟ එක්ව ගණිතමය භෞතික විද්‍යා ගෞරව උපාධිය ද පිරිනැමීමට කටයුතු කරනු ලැබේ.

පළමු සහ දෙවන වසරවල ඉහළම දක්ෂතා දක්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙවන වසර අවසානයේ සිට ගෞරව උපාධි පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගැනේ. එම පාඨමාලා සඳහා තේරී පත්වීමට, නම් පළමු සහ දෙවන වසර තුළ ව්‍යාවහාරික ගණිතය, සංඛ්‍යානය, භෞතික විද්‍යා යන විෂයයන් තුනෙන් එකක් සමග ශුද්ධ ගණිතය හදාරා තිබිය යුතුය.

මීට අමතර ව ජීව විද්‍යා සහ කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය උපාධි පාඨමාලා සඳහා මෙන්ම මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව හා පරිගණක විද්‍යාව ගෞරව උපාධි පාඨමාලා සඳහා ද අවශ්‍ය වන මූලික ගණිත දැනුම ලබා දෙන පාඨමාලා කිහිපයක් ගණිත අධ්‍යයන අංශය විසින් පිරිනමනු ලැබේ. භෞතීය විද්‍යා නොවන විද්‍යාර්ථීන්ගේ ගණිත දැනුම ඉහළ නැංවීම සඳහා මෙම පාඨමාලා සකස් කොට ඇත. තවද අධ්‍යයනාංශය මගින් වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ මූල්‍ය අධ්‍යයනාංශයේ මෑතක දී ආරම්භ කරනු ලැබූ මූල්‍ය ඉංජිනේරු පිළිබඳ වාණිජ කළමනාකරණ ගෞරව උපාධිය සඳහා ද දායක වනු ලැබේ.

පර්යේෂණ මත පදනම් වූ ආචාර්ය සහ ශාස්ත්‍රපති උපාධි ලබා ගැනීමේ පහසුකම් ගණිත අධ්‍යයන අංශය ලබා දේ. ජාත්‍යන්තර ව පිළිගැනීමට ලක්වන පර්යේෂණ, විශිෂ්ට උපාධි පාඨමාලා සහ දේශීය පාසල්වල ගණිතය ප්‍රචලිත කොට වැඩි දියුණු කිරීම ආදී ක්‍රියාකාරකම් මගින් ගණිත අධ්‍යයන අංශයෙහි සාමාජිකයන් ගණිත දැනුම ප්‍රගුණ කිරීම හා බෙදා හැරීමේ කටයුතුවල නිරත වී සිටිති.

ගණිත විෂය ක්ෂේත්‍රයෙහි විද්වත් නායකත්වය සැපයීමට කටයුතු කිරීම මගින් රටටත් එහි පුරවැසියන්ටත් සිය යුතුකම් සහ වගකීම් ඉටු කිරීම ගණිත අධ්‍යයනාංශයේ ප්‍රධාන අරමුණයි.


දුරකථන අංක - 0112903301

විද්‍යුත් ලිපිනය - maths@kln.ac.lk

## 11.4 ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය අයි.වී.එන්. රත්නායක මිය - මහාචාර්ය I (අංශ ප්‍රධාන)
*B.Sc. (Kel'ya), M.Sc. (NUS, Singapore), Ph.D. (UniSA, Australia)*
ආචාර්ය එම්.එම්. ගුණවර්ධන මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.Phil. (Edinburgh, UK)*
ආචාර්ය ජී.ඩී.ඩී.කේ. ගුණසේන මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Sc. (Kel'ya), Ph.D. (Reading, UK)*
ඊ.ඒ.ඒ.ඩී. එදිරිසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.Sc. (S.J'pura)*
ආචාර්ය ආර්. අමරකෝන් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Perad'ya), M.Sc. (Perad'ya), Ph.D. (TomasBata, Czech Republic)*
ආචාර්ය ඩබ්.එම්.ඒ.පී. හල්මිල්ලවැව මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), Ph.D. (Calgary, Canada)*
පී.ඩී.එස්. වීරසිංහ මිය - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Kel'ya)*
එස්.ජී.එම්.ආර්.එල්. විමලසේකර මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Kel'ya)*
ටී.ඩබ්.එන්.කේ. පෙරේරා මිය - ආධුනික කථිකාචාර්ය
*B.Sc. (Kel'ya)*

ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයන අංශය යනු දිවයිනෙහි විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විද්‍යාවේදී උපාධිය සඳහා ක්ෂුද්‍රජීව විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරීම වෙනුවෙන් ම පිහිටුවා ඇති එක ම අධ්‍යයන අංශය වේ. බොහෝ කර්මාන්ත සහ සේවාවන් සඳහා ක්ෂුද්‍රජීවවේදීන්ගේ සේවය අවශ්‍ය වන හෙයින් මෙම විෂයය හදාරන ලද උපාධිධාරීන් හට රැකියා අවස්ථා සුලබය. විද්‍යාගාරවල සීමිත ඉඩ පහසුකම නිසා ජෛවීය විද්‍යා සිසුන්ගේ පළමු අධ්‍යයන වර්ෂයේ, පළමු අර්ධ වාර්ෂිකයේ විභාග ප්‍රතිඵල මත ශිෂ්‍ය ශිෂ්‍යාවන් 60 තෝරා ගනු ලැබේ. ක්ෂුද්‍රජීව විද්‍යාව විෂයය හදාරන සිසුන් අතුරින් හත් දෙනෙකු පළමු අධ්‍යයන වර්ෂ දෙක තුළ අධ්‍යයන කටයුතු පිළිබඳ දක්වන කුසලතාව පමණක් සැලකිල්ලටගෙන, ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

ව්‍යවහාරික ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ සහ ආහාර හා පෝෂණය පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාවන් දෙකක් ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයන අංශය මගින් පවත්වනු ලැබේ. තවද දර්ශනපති සහ දර්ශන විශාරද යන උපාධි සඳහා පර්යේෂණ පැවැත්වීමේ පහසුකම් ද අධ්‍යයන අංශය සතු ය.

දුරකථන අංක - 0112914481

## 11.5 භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රෝනික විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය එල්.බී.ඩී.ආර්.පී. විජේසුන්දර මයා - විශ්‍රාම ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (**අංශ ප්‍රධාන**)
*B.Sc. MPhil (Kel'ya), DSc (Kyushu, Japan), CPhys, FIP (Sri Lanka)*
මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි මයා - ජ්‍යෂ්ඨ මහාචාර්ය - (**පීඨාධිපති - විද්‍යා පීඨය**)
*B.Sc. (Kel'ya), Ph.D. (Sheffield), CSci, CEng, CPhys, FIET, FInstP, FIP (SL), MIEEE*
මහාචාර්ය පී.ඒ.ඒ. පෙරේරා මයා - ජ්‍යෂ්ඨ මහාචාර්ය
*B.Sc. (C'bo), MA (Rochester, USA), Ph.D. (Rochester, USA), CPhys, FIP (Sri Lanka)*
මහාචාර්ය එච්.එච්. සුමතිපාල මයා - ජ්‍යෂ්ඨ මහාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (Perad'ya), CPhys, FIP (Sri Lanka)*
මහාචාර්ය පී.එස්. හේවාගීගන මයා - ජ්‍යෂ්ඨ මහාචාර්ය
*B.Sc. (Kel'ya), M.Sc. (GSU, USA), Ph.D. (GSU, USA), CPhys, MIP (Sri Lanka)*
මහාචාර්ය ඩබ්ලිව්.ජේ.එම්. සමරනායක මිය - මහාචාර්ය
*B.Sc. (Perad'ya), DEng (Kumamoto, Japan), MIEE (Japan), CPhys, FIP (Sri Lanka)*
මහාචාර්ය කේ.එම්.ඩී.සී. ජයතිලක මයා - මහාචාර්ය
*B.Sc. (Kel'ya), MPhil (Kel'ya), Ph.D. (C'bo), MIEEE, CPhys, MIP (Sri Lanka)*
මහාචාර්ය ඒ.එල්.ඒ.කේ. රණවීර - මහාචාර්ය (ජ්‍යෂ්ඨ අධ්‍යයන උපදේශක - B.Sc. ඉලෙක්ට්‍රොනික සහ පරිගණක විද්‍යා ගෞරව උපාධි පාඨමාලාව )
*B.Sc. (Kel'ya), Ph.D. (Kyung Hee), MIEEE, MURSI*
මහාචාර්ය අරුණ වන්නිනායක - මහාචාර්ය
*B.Sc. (Kel'ya), M.Sc. (Perad'ya) MS (Creighton), MS (UWM), Ph.D. (UWM), CPhys, MIP (SL)*
මහාචාර්ය එම්.ඒ. පුණ්‍යසේන මයා - සහාය මහාචාර්ය
*B.Sc. (Kel'ya), M.Sc. (Alberta, Canada), Ph.D. (Alberta, Canada), CPhys, FIP (Sri Lanka)*
ආචාර්ය යූ.කේ. අබේවර්ණ මිය - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. M.Sc. (Perad'ya), Ph.D. (C'bo), CPhys, FIP (Sri Lanka)*
ආචාර්ය ජේ.ඒ. සෙනෙවිරත්න - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II
**(ජ්‍යෂ්ඨ අධ්‍යයන උපදේශක - B.Sc. (PHEL) උපාධි පාඨමාලාව)**
*B.Sc. (Kel'ya), M.Sc. (MSU, USA), PhD (MSU, USA)*
ආචාර්ය එෆ්.එස්.බී. කාෆි මිය - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), Ph.D. (Kel'ya)*
ආචාර්ය කේ. ඩී. බී. එච්. ගුණවර්ධන - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (HSU, USA), Ph.D (GSU, USA)*
ආචාර්ය ඩබ්ලිව්. පී. සී. කුමාරගේ - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc., Ph.D (Perad'ya), Ph.D. (Brescia, Italy), CPhys, MIP (Sri Lanka)*
ආචාර්ය පී.එල්.ඒ.කේ. පියුමාල් මයා - ආධුනික කථිකාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (Kel'ya) , MIEEE*

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය 1967 ඔක්තෝබර් මස දී ආරම්භ කරන ලද අතර භෞතික විද්‍යා අධ්‍යයනාංශය එහි එක් අධ්‍යයනාංශයක් විය. එතැන් සිට නියමිත කාල වකවානුවල දී පාඨමාලා යාවත්කාලීන කිරීම, පරීක්ෂණාගාර පහසුකම් වැඩි දියුණු කිරීම යනාදිය මගින් මෙම අධ්‍යයනාංශයේ අධ්‍යයන කටයුතු වැඩි දියුණු කර ඇත. 2019 දී අධ්‍යයනාංශය භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රෝනික විද්‍යා අධ්‍යයනාංශය ලෙස නම් කරනු ලැබූණි. දැනට මෙම අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ලෙස මහාචාර්යවරුන් දහදෙනෙකු ඇතුළු දාහත් දෙනෙකුගෙන් සමන්විත ආචාර්ය මණ්ඩලයක් ද, තාවකාලික ප්‍රදර්ශකවරු විසිදෙනෙකු පමණ ද, අනධ්‍යයන කාර්ය මණ්ඩලය ලෙස දොළොස් දෙනෙක් ද සේවය කරති. මෙහි විද්‍යාර්ථීන්ගේ ප්‍රයෝජනය සඳහා පරීක්ෂණාගාර හයක් ද, පශ්චාත් උපාධි හදාරන විද්‍යාර්ථීන්ගේ ප්‍රයෝජනය සඳහා

පරීක්ෂණාගාර තුනක් ද ඇත. පර්යේෂණ මත පදනම් වූ දර්ශනපති (MPhil) සහ දර්ශන විශාරද (PhD) යන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා පහසුකම් ද අධ්‍යයනාංශය සතු ය.

භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රෝනික විද්‍යා අධ්‍යයනාංශය මගින් විද්‍යාවේදී උපාධිය සඳහා භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රෝනික විද්‍යාව යන විෂයයන් දෙකට අදාළ පාඨමාලා ඒකක ඉදිරිපත් කෙරේ. භෞතීය විද්‍යා විෂය ධාරාවට ඇතුළත් වන විද්‍යාර්ථීන්ට භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රෝනික විද්‍යාව විෂයයන් ලෙස තෝරා ගැනීමට පුළුවන. පහසුකම් සීමිත බැවින් භෞතික විද්‍යාව හදාරන විද්‍යාර්ථීන්ගෙන් සීමිත සංඛ්‍යාවක් පමණක් ඉලෙක්ට්‍රෝනික විද්‍යාව හැදෑරීම සඳහා තෝරා ගනු ලැබේ. පළමු වසර දෙක තුළ භෞතික විද්‍යා විෂයය සඳහා ඉහළ ප්‍රවීණත්වයක් දක්වන භෞතීය විද්‍යා විෂය ධාරාවේ විද්‍යාර්ථීන් අතරින් තෝරා ගනු ලබන සීමිත සංඛ්‍යාවකට පමණක් විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා භෞතික විද්‍යාව විෂයයක් ලෙස හැදෑරීමේ අවස්ථාව ඇත. සෛද්ධාන්තික භෞතික විද්‍යාව ඉහළ මට්ටමකින් හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන්ට ගණිතමය භෞතික විද්‍යාව හදාරා විද්‍යාවේදී ගෞරව උපාධිය ලබා ගත හැකි ය. මේ සඳහා භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය යන විෂයයන්ගෙන් පළමු වසර දෙකෙහි දී ඉහළ ප්‍රවීණත්වයක් දක්වනු ලබන විද්‍යාර්ථීන් අතරින් තෝරා ගත් සංඛ්‍යාවක් පමණක් ඇතුළත් කර ගැනේ. මෙම විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රෝනික විද්‍යා, සහ ගණිත යන අධ්‍යයනාංශ දෙක මගින් ඒකාබද්ධ ව පවත්වනු ලබන්නකි.

2015/2016 අධ්‍යයන වර්ෂයේ සිට භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රෝනික විද්‍යා අංශය මගින් BSc (PHEL) උපාධි පාඨමාලාව ඉදිරිපත් කර ඇත. මෙම උපාධි පාඨමාලාවට ප්‍රධාන විෂයයන් ලෙස භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රෝනික විද්‍යාව අඩංගු වන අතර ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය සහ පරිගණක අධ්‍යයනය යන විෂයයන්ගෙන් තෝරා ගත් විෂය ඒකක කීපයක් ද ඇතුළත් වේ. තවද වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයෙන් ඉදිරිපත් කරනු ලබන කළමනාකරණය අනිවාර්ය විෂය ඒකක කීපයක් ද මෙම උපාධි පාඨමාලාවට ඇතුළත් වේ.

2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයනාංශය මගින් BSc ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව ගෞරව උපාධි පාඨමාලාව, සංඛ්‍යානය සහ පරිගණක විද්‍යා හා ගණිත යන අධ්‍යයනාංශ සමග එක්ව ඉදිරිපත් කර ඇත. IoT නවීන යුගයේ ජාතික ආර්ථිකයට දායක විය හැකි දෘඩාංග සහ මෘදුකාංග යන දෙඅංශයෙන් ම නිපුණ උපාධිධාරීන් බිහි කිරීම සඳහා මෙම උපාධි වැඩසටහන් ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව යන ක්ෂේත්‍රවල න්‍යායික හා ප්‍රායෝගික දැනුම සපයයි.


| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 0112914495 |
| විද්‍යුත් ලිපිනය | - | phys@kln.ac.lk |

## 11.6 ශාක සහ අණුක ජීව විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ආර්.එම්.සී.එස්. රත්නායක මයා - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.Sc. (Perad'ya), Dip. (Agri), M.Phil. (Perad'ya), Ph.D. (Hong Kong), M.I.Biol. C.Biol (Sri Lanka)*
මහාචාර්ය ආර්.ඒ.එස්.පී. සේනානායක මිය - මහාචාර්ය
*B.Sc. (Kel'ya), M.Phil. (R'dg, UK), F.I.Biol. C.Biol (Sri Lanka)*
මහාචාර්ය බී.ටී.එස්.ඩී.පී. කන්නන්ගර මිය - මහාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (Kel'ya)*
මහාචාර්ය කේ.පී.ආර්.එන්. අත්තනායක මෙය - මහාචාර්ය
*B.Sc. (Kel'ya), M.Sc, Ph.D. (Washington State University, USA)*
මහාචාර්ය ඩී. ඒ. ඩී. ඒ. දරණගම මිය - මහාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (MFLU, Thailand)*
ආචාර්ය එච්.එම්. හේරත් මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.Sc. (Perad'ya), Ph.D. (Murdoch, Australia)*
ආචාර්ය ආර්.පී. වනිගතුංග මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Ruhuna), Ph.D. (C'bo, Sri Lanka)*
ආචාර්ය එම්.ටී.ආර්. ප්‍රනාන්දු - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Perad'ya), Ph.D. (MTSU, USA)*
ඒ.අයි.එස්. ප්‍රියදර්ශන් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Phil (Kel'ya)*
ආචාර්ය කේ.එච්.ඩබ්ලිව්.එල්. ද සිල්වා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (UCAS)*
ඩබ්.එච්.එම්.වී.පී. එදිරිසිංහ මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (Saskatchewan, Canada)*
ටී.ඩී. කොඩිතුවක්කු මයා - ආධුනික කථිකාචාර්ය
*B.Sc. (Kel'ya)*

විද්‍යා පීඨය ආරම්භයේදී උද්භිද විද්‍යා අධ්‍යයනාංශය ලෙස 1967 දී ආරම්භ කරන ලද මෙම අධ්‍යයනාංශය 1968 දී විද්‍යාවේද (සාමාන්‍ය) උපාධි පාඨමාලාව සඳහා උද්භිද විද්‍යාව විෂයයක් ලෙස ඉදිරිපත් කරමින් එහි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. 1976 සිට අධ්‍යයනාංශය උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේද විශේෂ උපාධි පාඨමාලාව හඳුන්වා දෙන ලදී. මුල් වසරවල ඉගැන්වූ මූලික විෂය ක්ෂේත්‍ර වූයේ ශාක කායික විද්‍යාව, රූප විද්‍යාව, ව්‍යූහ විද්‍යාව, ජෛව රසායනය, පරිසර විද්‍යාව, ප්‍රවේණි විද්‍යාව, ශාක විවිධත්වය සහ වර්ගීකරණයයි. ඉන් පසුව ක්ෂුද්‍රජීව විද්‍යාව, ශාක ව්‍යාධි විද්‍යාව, දිලීර විද්‍යාව, අණුක ජීව විද්‍යාව, ජාන තාක්ෂණය, ජෛව තොරතුරු විද්‍යාව, ක්ෂුද්‍රජීවී ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනය, උද්‍යාන විද්‍යාව සහ ප්‍රමාණාත්මක පරිසර විද්‍යාව ඇතුළත් උද්භිද විද්‍යාවේ භාවිතයන් දක්වා ක්‍රමයෙන් විෂය ක්ෂේත්‍ර පුළුල් විය. 2002 දී ගෞරව උපාධි පාඨමාලාව සමඟ අණුක ජීව විද්‍යාව සහ ශාක ජෛව තාක්ෂණය (MBBT) විෂයයක් ලෙස හඳුන්වා දෙන ලදී. අධ්‍යයනාංශය විසින් සිදුකරන අධ්‍යයන හා පර්යේෂණ පිළිඹිබු කිරීම සඳහා එය 2019 දී ශාක හා අණුක ජීව විද්‍යා අධ්‍යයනාංශය ලෙස නම් කරන ලදී. ඊට සමගාමී ව උද්භිද විද්‍යා විෂයයෙහි පාඨමාලා ව්‍යුහය සහ පාඨමාලා අන්තර්ගතයන් මෑතකාලීන වර්ධනයන්ට අනුගත වන පරිදි සංශෝධනය කර නව විෂයක් ලෙස ශාක ජීව විද්‍යාව (PLBL) හඳුන්වා දෙන ලදී .

අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියැලී සිටින අතර පර්යේෂණ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය ආයතන සහ විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. ජලජ වල් පැලෑටි පාලනය, දේශීයව පවතින සම්පත් භාවිතයෙන් පසු අස්වනු භාවිත ක්‍රම වැඩිදියුණු කිරීම, ශාකවල ජෛව ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම, පාංශු සාරවත් බව වැඩි දියුණු කිරීම සඳහා පාංශු යෙදීම් ලෙස ශාක භාවිත කිරීම,

පාරිසරික තත්ත්ව අධීක්ෂණය, පරිසර පද්ධති කාබන් තිර කිරීම, පාරිසරික ගැටලු සඳහා ශාක පදනම් වූ විසඳුම්, පරිනාමික බන්ධුතා, භෝග වැඩිදියුණු කිරීම, අණුක ජීව විද්‍යාව සහ ශාක ප්‍රජනක ජීව විද්‍යාව ඇතුළු පර්යේෂණ රාශියක් අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. පර්යේෂණ සොයා ගැනීම් ජාතික හා ජාත්‍යන්තර විද්‍යාත්මක සඟරාවල ප්‍රකාශයට පත් කෙරේ. ජාතික විද්‍යා පදනම (NSF), ජාතික පර්යේෂණ සභාව (NRC), උසස් අධ්‍යාපන අමාත්‍යංශය, ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන යටතේ විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යංශය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP) සහ විදේශ රටවලින් ලැබෙන අරමුදල්වලින් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පශ්චාත් උපාධි පර්යේෂණ සිදු කරයි.

මෙම අධ්‍යයනාංශය විසින් පර්යේෂණ හා ඉගැන්වීම් කටයුතු සඳහා ආවේණික, විසිතුරු, ජලජ සහ ඖෂධීය ශාකවලින් සමන්විත උද්භිද උද්‍යානයක්, ශාකාගාරයක් සහ දිලීර එකතුවක් පවත්වාගෙන යයි. පසුගිය දශක කිහිපය තුළ අධ්‍යයනාංශයේ මානව හා භෞතික සම්පත් සංවර්ධනය විදේශ මූල්‍ය ආධාර හරහා සිදු කර ඇත.

2004 වසරේ උපාධි අපේක්ෂකයින්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අදාළත්වය සහ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා වන ලෝක බැංකු ව්‍යාපෘතිය (IRQUE) යටතේ රුපියල් මිලයන 80 ක ප්‍රදානයක් දිනා ගැනීම අධ්‍යයනාංශය ලැබූ ප්‍රධාන ජයග්‍රහණයකි. විසිවන සියවස සඳහා උසස් අධ්‍යාපනය (HETC) ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකුව විසින් අරමුදල් සපයන පශ්චාත් උපාධි පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සඳහා අධ්‍යයනාංශය විද්‍යා පීඨය සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇත . දැනට උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීම (AHEAD) ව්‍යාපෘතිය යටතේ කාර්ය මණ්ඩල සාමාජිකයෝ පශ්චාත් උපාධි පර්යේෂණ වැඩසටහන් පැවැත්වීමේ නිරතව සිටිති. තවද, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා (AHEAD) ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 18 ක ප්‍රදානයක් ලබා ගැනීමට අධ්‍යයනාංශයට හැකි විය.

දැනට ශාක හා අණුක ජීව විද්‍යා අධ්‍යයනාංශය විෂයයන් දෙකක් පිළිබඳ විද්‍යාවේදී සහ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා ඉදිරිපත් කරයි. එනම් ශාක ජීව විද්‍යාව ( PLBL) සහ අණුක ජීව විද්‍යාව සහ ශාක ජෛව තාක්ෂණය (MBBT). පළමු වසර දෙක තුළ ඔවුන්ගේ අධ්‍යයන කටයුතුවල විශිෂ්ඨත්වය සැලකිල්ලට ගනිමින් දෙවන වසර අවසානයේ ඉහත විෂයයන් දෙකෙහි විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගනු ලැබේ. තුන්වන වසරේ දෙවන අර්ධ වාර්ෂිකයේදී ශාක ජීව විද්‍යාව, අණුක ජීව විද්‍යාව සහ ශාක ජෛව තාක්ෂණය භාවිතයන් පිළිබඳ සහායක විෂය ඒකක පිරිනමනු ලැබේ. කැලණිය විශ්වවිද්‍යාලයේ ජීව විද්‍යා නොවන සිසුන් සඳහා ජනතාව සහ ශාක පිළිබඳ පාඨමාලා ඒකකයක්ද පිරිනමනු ලැබේ.

විද්‍යා පීඨයේ ආදි ශිෂ්‍ය සංගමයේ රන් පදක්කම් දෙකක් ශාක ජීව විද්‍යාව සහ අණුක ජීව විද්‍යාව සහ ශාක ජෛව තාක්ෂණ විෂයයන් සඳහා වැඩිම විශිෂ්ටත්වයක් දක්වන විද්‍යාර්ථීන්ට ප්‍රදානය කෙරේ. විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා ප්‍රධාන විෂයයක් ලෙස ශාක ජීව විද්‍යාව හදාරන සහ එම විෂය ඒකක සඳහා ඉහළ ම GPA ලබාගෙන පළමු පන්තියේ උපාධිය ලබාගන්නා විද්‍යාර්ථියෙකුට මහාචාර්ය අයි. බාලසූරිය අනුස්මරණ රන් පදක්කම හිමි වේ. ශාක හා අණුක ජීවවිද්‍යා සංගමය මගින් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව, ශාක ජීව විද්‍යා පාඨමාලා ඒකකවලට අදාළ පළමු සහ දෙවන වසර විභාග සඳහා විශිෂ්ටත ම දක්ෂතා දක්වන විද්‍යාර්ථීන් සඳහා ප්‍රදානය කරනු ලබයි.

අධ්‍යයනාංශය මගින් MPhil සහ PhD උපාධි සඳහා පශ්චාද් උපාධි පාඨමාලා (පර්යේෂණ මගින්) ඉදිරිපත් කරයි. 2016 සිට "බෝග ආරක්ෂණය සහ ශාක ජෛව තාක්ෂණය" (SLQF මට්ටම 10) පිළිබඳ පූර්ණ කාලීන MSc පාඨමාලාවක් හඳුන්වා දී ඇත. එමගින් බෝග ආරක්ෂණ

ක්ෂේත්‍රවල ගැඹුරු දැනුමක් සහ බෝගවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පිළිබඳ කුසලතා ලබා ගැනීමට උපාධිධාරීන්ට අවස්ථාවක් සැලසේ.

නවීන අණුක ජීව විද්‍යාත්මක භාවිතයන් සහ පටක රෝපන භාවිතයෙන් නව විසිතුරු ශාක ප්‍රභේද නිපදවීමේ පර්යේෂණ සඳහා අධ්‍යයනාංශය විසින් 2015 වසරේ ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ මල් වගා පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇත. මෙම මධ්‍යස්ථානය මඟින් විසිතුරු ශාක වගා කරන්නන් සඳහා බෝග ව්‍යාප්තිය සහ තවාන් කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබා දේ. අධ්‍යයනාංංශයේ උපාධි සහ පශ්චාද් උපාධි පර්යේෂණ සඳහා ද එම මධ්‍යස්ථානයේ පහසුකම් ඇත. වර්තමානයේ ශාක හා අණුක ජීවවිද්‍යා ක්ෂේත්‍රයේ ඇතිවන ගැටලු සඳහා පිළියම් සොයා දීමට හැකිවන පරිදි දැනුම සමාජයට සම්ප්‍රේෂණය කිරීම අපගේ අධ්‍යයන අංශයේ මූලික දැක්ම වේ.


දුරකථන අංක - 0112914480

විද්‍යුත් ලිපිනය - headbota@kln.ac.lk

## 11.7 සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය ඒ.එම්.සී.එච්. අත්තනායක මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අංශ ප්‍රධාන)
*B.Sc. (Kel'ya), MSc (Mor'wa), Ph.D. (C'bo)*
මහාචාර්ය එන්.වී. චන්ද්‍රසේකර මිය - මහාචාර්ය
*B.Sc. (C'bo), MA (C'bo), MBCS, MAFE (Colombo), Ph.D. (Colombo)*
මහාචාර්ය ඩී.ඩී.එම්. ජයසුන්දර මිය - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Sc. (Kel'ya), M.Sc. (Kaiserslautern, Germany), Ph.D. (Kaiserslautern, Germany)*
ආචාර්ය ඒ.පී. හේවාආරච්චි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (C'bo), M.Sc. (North Florida, USA), M.Sc. (Georgia Southern, USA) Ph.D. (Clemson, USA)*
ආචාර්ය යූ.පී. ලියනගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (C'bo), M.Sc. (Kaiserslautern, Germany), Ph.D. (Kaiserslautern, Germany)*
ආචාර්ය එස්.පී. පිටිගල මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (C'bo), M.Sc. (MTSU, USA), Ph.D. (MTSU, USA), MIEEE, MACM*
ඩබ්.ජී.ඩී.එම්. සමන්කුල මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Kel'ya), M.Phll. (Kel'ya)*
ආචාර්ය ඩී.එම්.පී.වී. දිසානායක මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (Texas Tech, USA), Ph.D. (Texas Tech, USA)*
ආචාර්ය ඩබ්ලිව්.ඒ.සී. වීරකෝන් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (UCSC), Ph.D. (Mor'wa), MIEE*
ආචාර්ය එච්.ඩබ්ලිව්.බී. කාවිංග මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (TTU, USA), Ph.D. (TTU, USA)*
ආචාර්ය බී.එම්.ටී. කුමාරිකා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (GSU, USA), Ph.D. (GSU, USA)*
ඩී.බී. ජයසූරිය මිය - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Mor'wa), M.Sc. (Mor'wa)*
ඒ.ඩී. ද සිල්වා මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Kel'ya)*
එම්.එස්.එම්.එස්. කුමාර මයා - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Kel'ya)*
එන්.එම්.ටී. ද සිල්වා මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Kel'ya), M.Sc. (UCSC)*
එම්.ඒ.එච්.සී. මුණසිංහ මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (J'Pura), M.Sc. (Mor'wa)*
ඩී.එම්.එල්.එම්. දිසානායක මිය - ආධුනික කථිකාචාර්ය
*B.Sc. (Kel'ya)*

විද්‍යා පීඨයේ සංඛ්‍යානය හා පරිගණක විද්‍යා අධ්‍යයනාංශය, සංඛ්‍යානය සහ ආගණනය විෂයයන් සපුරාලීම සඳහා 1999 ජූලි 1 වන දින ස්ථාපනය කරන ලදී. ආරම්භයේදී මෙම අධ්‍යයනාංශය විද්‍යාවේදී උපාධිය සඳහා සංඛ්‍යානය සහ ආගණනය යන විෂය භෞතික විද්‍යා සිසුන් සඳහා පිරිනමා ඇත. නව ප්‍රවණතා හඳුනාගනිමින් සංඛ්‍යානය සහ ආගණනය යන විෂය ප්‍රතිශෝධනය කර සංඛ්‍යානය සහ පරිගණක විද්‍යාව ලෙස 2000/2001 අධ්‍යයන වර්ෂයේ සිට නම් කරන ලදී. තවද එම වර්ෂයේදී ආරම්භ කරන ලද සංඛ්‍යානය සහ පරිගණක විද්‍යාවේදී (විශේෂ) උපාධිය 2007/2008 අධ්‍යයන වර්ෂය දක්වා පිරිනමා ඇත. මීට අමතර ව පරිගණක විද්‍යා විෂය හැදෑරීමට නොහැකි වූ ජීව විද්‍යා සහ භෞතික විද්‍යා ධාරාවෙන් තෝරාගත් සිසුන් පිරිසක් සඳහා තොරතුරු තාක්ෂණික විෂය ධාරාව මත පදනම් වූ පරිගණක අධ්‍යයනය පාඨමාලාව පිරිනමනු ලැබේ.

ඊට අමතර ව අප අධ්‍යයනාංශය සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨයන් හි ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා, ද පරිගණක අධ්‍යයන විෂය පිරිනැමීම සිදුකරනු ලැබේ.
2007/2008 අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයනාංශය විසින් පරිගණක සහ සංඛ්‍යානය විෂයයන් තනි විෂය ධාරාවන් දෙකක් ලෙස භෞතික විද්‍යා සිසුන් සඳහා පිරිනැමීම ආරම්භ කරන ලදී. මීට සමගාමීව 2009/2010 අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයනාංශය විසින් සංඛ්‍යානය විෂය සඳහා විද්‍යාවේදී ගෞරව උපාධිය ද, පරිගණක විද්‍යාව සඳහා විද්‍යාවේදී ගෞරව උපාධිය ද පිරිනමනු ලැබේ.

2011/2012 අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයනාංශය විසින් ශාස්ත්‍රවේදී පරිගණක අධ්‍යයනය ගෞරව උපාධිය මානව ශාස්ත්‍ර පීඨය සහ සමාජ විද්‍යා පීඨවල සිසුන් සඳහා ද පිරිනමයි. තවද 2012/2013 අධ්‍යයන වර්ෂයේ සිට භෞතික විද්‍යා සිසුන් සඳහා විද්‍යාවේදී පරිගණක අධ්‍යයනය ගෞරව උපාධිය පිරිනමයි. මීට අමතර ව අධ්‍යයනාංශය 2015/2016 අධ්‍යයන වර්ෂයේ සිට භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාවේදී උපාධි අපේක්ෂකයන්ට පරිගණක අධ්‍යයනය විෂය ඒකක සපයනු ලැබේ. ගණිතය විද්‍යාවේදී විශේෂ උපාධි පාඨමාලාව හදාරන සිසුන් සඳහා ද සංඛ්‍යානය විෂය ඒකක අප අධ්‍යයනාංශය විසින් පිරිනමනු ලබයි.

තවද, 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිට අප අධ්‍යයනාංශය, භෞතික විද්‍යාව හා ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයනාංශය සහ ගණිත අධ්‍යයනාංශය සමග එක්ව ''ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව'' පිළිබඳ ගෞරව උපාධිය පිරිනමනු ලබයි.

සංඛ්‍යානය සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය උපාධිධාරී සිසුන් සඳහා විද්‍යාපති, දර්ශනපති සහ දර්ශනශූරී උපාධි හැදෑරීම සඳහා අවස්ථා සලසා ඇත.

දුරකථන අංක - 0112903371
විද්‍යුත් ලිපිනය - dscs@kln.ac.lk

## 11.8 සත්ත්ව විද්‍යා සහ පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය එල්.ඩී. අමරසිංහ මිය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*B.Sc. (Kel'ya), D.I.C., Ph.D. (London, UK), C.Biol (Sri Lanka), F.I. Biol. (Sri Lanka)*
මහාචාර්ය ඩබ්ලිව්.යූ. චන්ද්‍රසේකර මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (Newcastle-upon Tyne, UK), C.Biol. (Sri Lanka), F.I. Biol. (Sri Lanka)*
මහාචාර්ය එම්.එම්.එම්. නාජිම් මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Sc. (Perad'ya), M.Eng. (AIT, Thailand), Ph.D. (University Putra Malaysia)*
මහාචාර්ය ආර්.කේ. ශ්‍රියානි ඩයස් මිය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Sc. (Kel'ya), M.Sc. (AIT), Ph.D. (Wales, UK), FRES*
මහාචාර්ය ජී.ඒ.එස්.එම්. ගනේහිආරච්චි මයා - මහාචාර්ය
*B.Sc. (Kel'ya), M.Phil. (Kel'ya), Ph.D. (N.Dakota State, USA)MI Biol. (Sri Lanka), F.I.Biol. (Sri lanka)*
මහාචාර්ය යූ.පී.කේ. ඇපා මයා - මහාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (Deakin, Australia), F.I.Biol. (Sri Lanka)*
මහාචාර්ය ඩබ්ලිව්.එම්.ඩී.එන්. විජයරත්න මිය - මහාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (N.Dakota State, USA)*
මහාචාර්ය එම්.ඩී.එම්.ඩී.ඩබ්ලිව්.එම්.එම්.කේ. යටවර මිය - මහාචාර්ය(සප්ත වාර්ෂික නිවාඩු)
*B.Sc. (Kel'ya), M.Sc. (Kel'ya), Ph.D. (CUG, China)*
මහාචාර්ය වී.පී.ඒ. වීරසිංහ මිය - මහාචාර්ය
*B.Sc. (Perad'ya), M.Sc. (Perad'ya), M.Sc. (Stuttgart, Germany), Ph.D. (Hohenheim, Germany)*
ආචාර්ය ආර්.පී.ජී.කේ. රාජපක්ෂ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (C'bo), Ph.D (Houston, USA)*
ආචාර්ය එම්.ජී.අයි.එස්. පරාක්‍රම මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Kel'ya), M.Sc. (Kel'ya), Ph.D. (CIFE, Mumbai)*
ආචාර්ය බී.ජී.එන්. සෙව්වන්දි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Perad'ya), M.Phil. (Perad'ya), Ph.D. (Saitama, Japan)* (ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපදේශක - පරිසර සංරක්ෂණ හා කළමනාකරණ පාඨමාලාව)
ආචාර්ය එච්.ඒ.සී.සී. පෙරේරා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (Kel'ya), Ph.D. (UCAS, China)*
ආචාර්ය කේ. සුබසිංහ මෙනවිය - කථිකාචාර්ය
*B.Sc. (Kel'ya), M.Sc. (Perad'ya), Ph.D. (ANU, Australia)*
කේ.එම්.එස්. රුවින්ද මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Phil. (Kel'ya)*
ආචාර්ය එච්.එම්.ටී.ආර්. සමරකෝන් මිය - කථිකාචාර්ය II
*B.Sc. (Kel'ya), M.Sc. (CGI, Thailand) , Ph.D (Saitama,Japan)*
ආචාර්ය එච්. ඒ. කේ. රණසිංහ මිය - කථිකාචාර්ය
*B.Sc. (Kel'ya),Ph.D.(Kel'ya)*

සත්ත්ව විද්‍යා සහ පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුවේ දැක්ම වන්නේ සත්ත්ව විද්‍යාව සහ පරිසර කළමනාකරණය පිළිබඳ ඉගැන්වීම් සහ පර්යේෂණ විශිෂ්ටත්වය සඳහා ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රමුඛත ම අධ්‍යයන දෙපාර්තමේන්තුව වීමයි.

සත්ත්ව විද්‍යා හා පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මෙහෙවර වන්නේ මානව වර්ගයාගේ තිරසාර සංවර්ධනය සහ යහපැවැත්ම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දිය හැකි ඉහළ මට්ටමේ උපාධිධාරීන් සහ පශ්චාත් උපාධිධාරීන් බිහි කිරීම, උසස් දැනුම උත්පාදනය කිරීම සඳහා ඉහළ මට්ටමේ පර්යේෂණ පැවැත්වීම; ස්වභාවික සම්පත් තිරසාර භාවිතය සහ සංරක්ෂණය සඳහා පරිසරය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඇති කිරීම සහ, සත්ත්ව විද්‍යාව සහ පරිසර කළමනාකරණය සම්බන්ධ ක්ෂේත්‍ර සඳහා උපදෙස් සහ උපදේශන සේවා සැපයීමයි.

ජීව විද්‍යා විෂය ධාරාව යටතේ විද්‍යාවේදී උපාධි පාඨමාලාව සහ සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව පාඨමාලාව ප්‍රධාන විෂය ලෙස සත්ත්ව විද්‍යා සහ පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් පිරිනමයි. මෙම දෙපාර්තමේන්තුව පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ද පිරිනමයි. පීඨ ශිෂ්‍ය අත්පොතෙහි දක්වා ඇති පරිදි අධ්‍යයන වර්ෂය 1 සහ අධ්‍යයන වර්ෂය 2 හි ශිෂ්‍යයන්ගේ විෂය සම්බන්ධ කුසලතා මත පදනම්ව 2 වන අධ්‍යයන වර්ෂය අවසානයේ ගෞරව උපාධි පාඨමාලාවන් සඳහා සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් තෝරාගනු ලබයි.

පරිසර කළමනාකරණය විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති සහ ජලජීවී වගාව සහ ධීවර කළමනාකරණ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (MSc) උපාධි පාඨමාලාවන් දෙකට අමතර ව, දර්ශනපති (MPhil) සහ ආචාර්ය (PhD) උපාධි පාඨමාලාවන් සඳහා ද දෙපාර්තමේන්තුව පහසුකම් සපයයි.

දුරකථන අංක - 0112914479
විද්‍යුත් ලිපිනය - zool@kln.ac.lk

## 11.9 මෘදුකාංග ඉංජිනේරු ඉගැන්වීම් ඒකකය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය කේ.එන්.එස්. වර්ණජිත් මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*B.Sc. (Kel'ya), Pg. Dip. in IT (Kel'ya), Ph.D. (Ibaraki, Japan)*
ආචාර්ය අයි.යූ. හේවාපතිරණ මිය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (C'bo), Ph.D. (Canterbury, New Zealand)*
ඩබ්ලිව්.ඒ.ටී. මධුශංක මයා - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. Eng Hons (Mor'wa)*
එස්. එන්.එම්.එන්.ඩී.කේ.අරඹේපොල මිය
*B.Sc. Hons (Kel'ya)*

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රථම වරට මෘදුකාංග ඉංජිනේරු උපාධිය පිරිනැමීම සඳහා 2017 සැප්තැම්බර් මාසයේදී මෘදුකාංග ඉංජිනේරු ඉගැන්වීම් ඒකකය ආරම්භ කරන ලදී. පරිගණකකරණයේ ඉංජිනේරු ක්‍රම සහ විද්‍යාත්මක මූලධර්ම පිළිබඳ මනා අවබෝධයක් ලබා දීම මගින් මෘදුකාංග ඉංජිනේරු ක්ෂේත්‍රයේ සාර්ථක වෘත්තීන් සඳහා මෘදුකාංග ඉංජිනේරු උපාධිධාරීන් බිහි කිරීම මෙහි අරමුණ වේ.

**මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව**
ජාත්‍යන්තරව පිළිගත් ACM මාර්ගෝපදේශයන්ට අනුව මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව සකස් කර ඇත. එමගින් සිසුන්ට අවශ්‍ය කුසලතා, දැනුම මෙන්ම දේශීය හා ජාත්‍යන්තර තලයේ මෘදුකාංග ඉංජිනේරුවන් ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය ආකල්ප හා ඉංජිනේරු පුහුණුව ලබා ගැනීමට මෙම උපාධි පාඨමාලව උපකාරී වේ. හය මාසයක ප්‍රායෝගික සීමාවාසික පුහුණු කාල සීමාවක් සඳහා මෘදුකාංග ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් සමාගම් සහ ආයතන වෙත සිසුන් යොමු කරන අතර එමගින් ඔවුන් ලබා ගන්නා තාක්ෂණික දැනුම සහ පළපුරුද්ද ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට සහ වෘත්තීය භාවිතය වැඩි දියුණු කර ගැනීමට ද අවස්ථාව හිමි වේ. මීට අමතර ව මෙම උපාධි පාඨමාලවේ ඇති සුවිශේෂත්වය වන්නේ පළපුරුදු උපදේශකයන්ගේ මග පෙන්වීම යටතේ අවසන් වර්ෂයේ මෘදුකාංග ඉංජිනේරු ක්ෂේත්‍රයේ ශාස්ත්‍රීය පර්යේෂණයක් සිදු කිරීමට අවස්ථාව උදා වීමයි. මෙම උපාධි පාඨමාලාව සඳහා මෘදුකාංග ඉංජිනේරු විශේෂිත වූ ක්ෂේත්‍ර හයක් (06) ක් අන්තර්ගත කර ඇති අතර සිසුන්ගේ කැමැත්ත අනුව ඒවා තෝරා ගැනීමට නම්‍යශීලීභාවයක් ලබා දී ඇත. වෙබ් කේන්ද්‍රීය (Net Centric), ජංගම දුරකතන සඳහා පරිගනකකරණය (Mobile Computing), පරිගනක ක්‍රීඩා සහ සජීවනය (Digital Gaming and Animations), සෞඛ්‍ය තොරතුරු තාක්ෂණය (Health Informatics), ව්‍යාපාර යෙදවුම් (Buiness Engineering Applications) සහ දත්ත විද්‍යාව (Data Science and Engineering Applications) එම ක්ෂේත්‍රයන් වේ.

**(අ.) වෙබ් කේන්ද්‍රය (Net Centric)**
වෙබ් කේන්ද්‍රීය විෂය ක්ෂේත්‍රය මගින් උසස් වෙබ් යෙදුම්, බෙදාහැරීම් සහ වලාකුළු පරිගණකකරණය සහ අර්ථකථන වෙබ් සහ ඔන්ටොලොජිකල් ඉංජිනේරු විද්‍යාවේ සාර්ථක මෘදුකාංග ඉංජිනේරුවන් වීමට අවශ්‍ය උසස් කුසලතා සහ දැනුම වර්ධනය කිරීම අරමුණු කරයි.

**(ආ.) ජංගම දුරකතන සඳහා පරිගනකකරණය (Mobile Computing)**
ජංගම පරිගණකකරණය යනු දැවැන්ත වෙළඳපළ විභවයක් සහ වර්ධනයක් ඇති වේගයෙන් නැගී එන ක්ෂේත්‍රයකි. මෙම විෂය ක්ෂේත්‍රය හැදෑරීමට අවකාශය සැලසීම මගින් ජංගම පරිගණක තාක්ෂණයන්, ජංගම ජාල සහ ජංගම යෙදුම් සංවර්ධනයට අදාළ උසස් කුසලතා ගොඩනැගීමට අවශ්‍ය සම්පූර්ණ දැනුමක් සපයයි.

**(ඇ.) පරිගණක ක්‍රීඩා සහ සජීවනය (Digital Gaming and Animation)**

මෙම ක්ෂේත්‍රයෙන් අති නවීන ඩිජිටල් ක්‍රීඩා සහ සජීවිකරණ තාක්ෂණයන් පිළිබඳ දැනුම ලබා දෙන අතර ඩිජිටල් ක්‍රීඩා සහ සජීවිකරණ කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය උසස් කුසලතා ගොඩනඟා ගැනීමට උපකාරී වේ.

**(ඈ.) සෞඛ්‍ය තොරතුරු තාක්ෂණය (Health Informatics)**

මෙම විෂය ක්ෂේත්‍රය හැඳෑරීමට අවකාශ සැලසීම මගින් සෞඛ්‍ය තොරතුරු කළමනාකරණය, සෞඛ්‍ය තොරතුරු පද්ධති සැලසුම් කිරීම සහ සංවර්ධනය සහ වෛද්‍ය රූපකරණය සහ ජෛව වෛද්‍ය සංඥා සැකසීම පිළිබඳ උසස් දැනුමක් ලබා දීම අරමුණු කරයි.

**(ඉ.) ව්‍යාපාර යෙදවුම් (Buiness Engineering Applications)**

මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව නවීන ව්‍යාපාරික යෙදුම්වල අනිවාර්ය අංගයකි. ව්‍යාපාර ඉංජිනේරු යෙදුම් විශේෂිකරණය පාඨමාලාව මඟින් ව්‍යාපාර ක්‍රියාවලි සහ සේවා වැඩිදියුණු කිරීම සඳහා මෘදුකාංග ඉංජිනේරුවරයෙකු විසින් අනුගමනය කළ යුතු සැලසුම් සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ කුසලතා පිළිබඳ දැනුම වර්ධනය කරයි. මෙම විෂය මාලාවට ව්‍යාපාර පද්ධති ආකෘති නිර්මාණය සහ ප්‍රශස්තකරණය, පරිගණක පාදක මෙහෙයුම් කළමනාකරණය සහ ව්‍යාපාර ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව යන විෂයධාරාවන් ඇතුළත් වේ.

**(ඊ.) දත්ත විද්‍යාව (Data Science and Engineering Applications)**

දත්ත විද්‍යාව සහ ඉංජිනේරු යෙදුම් විෂය ක්ෂේත්‍රය තුළින් ව්‍යාපාර බුද්ධිය සහ කළමනාකරණ ආධාරක පද්ධති ගොඩනැගීම, විශාල දත්ත යටිතල පහසුකම් සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම, තීක්ෂණ බුද්ධිය ලබා දීම සහ නව සබඳතා සොයා ගැනීම සඳහා විශාල දත්ත විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය ඉහළ දැනුම සහ කුසලතාවලින් සිසුන් සන්නද්ධ කිරීම අරමුණ වේ.

දුරකථන අංක - 0112903286
විද්‍යුත් ලිපිනය - setu@kln.ac.lk

## 11.10 ක්‍රීඩා හා ශාරීරික විද්‍යා ඒකකය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ඩබ්ලිව්.ටී.එම්.ඒ.පී.කේ. වන්නිනායක මයා (අංශ ප්‍රධාන)
*BSc (Kel'ya), MSc (Perad'ya),, MS (Creighton), MS (UWM), Ph.D. (UWM), CPhys, MIP (SL)*
ආචාර්ය පී. බුවනේන්දිරන් මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*BPE (India), MPE (SAI, Kerala) Ph.D. (Bangalore) DYS (India) L-1ANT (ISAK) Specialized Field: Exercise Science and Physical Education*
අයි.එම්. රණසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (තාවකාලික)

ක්‍රීඩා හා ශාරීරික විද්‍යා උපාධි පාඨමාලාව සැලසුම් කර ඇත්තේ එමගින් සිසුන්ගේ දැනුම කුසලතා ආකල්ප සහ යහපත් මානසිකත්වය ඇති කිරිම සහ එදිනෙදා ජීවිතයට මෙන් ම ක්‍රීඩා ක්ෂේත්‍රයේ වෘත්තීය ජිවිතය සාර්ථක කර ගැනිම සඳහා වේ. ක්‍රීඩා හා ශාරීරික විද්‍යා උපාධි පාඨමාලාව සඳහා සිසුන් සූදානම් කිරීම සඳහා සති හතරක (4) පදනම් පාඨමාලාවක් සම්පූර්ණ කළ යුතු අතර එමගින් මූලික විද්‍යාවන් පිළිබඳ දැනුමක් සහ කුසලතාවක් ලබා දීම සිදු කරනු ලැබේ. මෙම පදනම් පාඨමාලාව මඟින් ක්‍රීඩා හා ශාරීරික විද්‍යා උපාධිය හැදෑරීම සඳහා කෙටි කාලයක් ඇතුළත සිසුන් සූදානම් කොට ඒ සඳහා අවශ්‍ය පසුබිම ලබා දේ. එම නිසා මෙය ඕනෑ ම විෂය ධාරාවක් යටතේ අ.පො.ස උසස් පෙළ විභාගය සමත් වූ සිසුන් සඳහා විද්‍යාවේදී උපාධියක් ලබා ගැනීමට ඇති හොඳම මාර්ගයක් වේ. තවද පදනම් පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කරන සිසුන් සඳහා ඒ පිළිබඳ සහතිකයක් ප්‍රදානය කෙරේ.

# වෛද්‍ය පීඨය



# වෛද්‍ය පීඨය

## පීඨාධිපති, අධ්‍යයනාංශ ප්‍රධානීන් සහ පරිපාලන නිලධාරී



මහාචාර්ය එම්.එන්. චන්ද්‍රතිලක මයා (විනේතෘ මහාචාර්ය)
පීඨාධිපති, වෛද්‍ය පීඨය



මහාචාර්ය වී. අබේසූරිය මයා
අංශ ප්‍රධාන
කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය



ආචාර්ය සී.ඩබ්ලිව්. සුබසිංහ මෙය
අංශ ප්‍රධාන
ජෛව රසායන විද්‍යා සහ සායනික රසායන විද්‍යා  අධ්‍යයනාංශය



ආචාර්ය ඒ.ඩී.එස්.ඒ. බක්මීවැව මිය
අංශ ප්‍රධාන
ආබාධිතතා අධ්‍යයනාංශය



ආර්. ඒ. පී. ජේ. මෛත්‍රී එස්. රූපසිංහ මයා
අංශ ප්‍රධාන
පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය



මහාචාර්ය ඩබ්ලිව්.එන්.එස්. පෙරේරා මිය
අංශ ප්‍රධාන
අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය



ආචාර්ය පී. කේ. එස්. ගොඩමුන්නේ මිය
අංශ ප්‍රධාන
වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය



මහාචාර්ය ඩබ්ලිව්.ආර්.පී.එල්.අයි. විජේසූරිය මිය
අංශ ප්‍රධාන
වෛද්‍ය ක්ෂුද්‍රජීවී විද්‍යා අධ්‍යයනාංශය



මහාචාර්ය එස්.එෆ්. ජයමාන්න මයා
අංශ ප්‍රධාන
වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය



වෛද්‍ය බී. අසන්ත ද සිල්වා මයා
අංශ ප්‍රධාන
ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය



ආචාර්ය ශෝභාවි රන්දෙනිය මිය
අංශ ප්‍රධාන
ළමාරෝග හා කෞමාරභෘතීය අධ්‍යයනාංශය



වෛද්‍ය එන්.එච්. මනම්පේරි මිය
අංශ ප්‍රධාන
පරපෝෂවේද අධ්‍යයනාංශය



වෛද්‍ය ඊ.එස්.ආර්. ද සිල්වා මයා
අංශ ප්‍රධාන
ව්‍යාධිවේද අධ්‍යයනාංශය



වෛද්‍ය එස්.ඒ.එෆ්. කුරුකුලසූරිය මිය
අංශ ප්‍රධාන
භිෂග්වේදය අධ්‍යයනාංශය



වෛද්‍ය ඩබ්.එල්. දිලේෂා මිය
අංශ ප්‍රධාන
භෞතවේදය අධ්‍යයනාංශය



මහාචාර්ය ඩබ්.එම්.එම්.එල්. චන්ද්‍රදාස මයා
අංශ ප්‍රධාන
මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය



වෛද්‍ය කේ.එම්.එන්. පෙරේරා මෙය
අංශ ප්‍රධාන
මහජන සෞඛ්‍ය අධ්‍යයනාංශය



වෛද්‍ය බී. එන්. එල්. මුණසිංහ මයා
අංශ ප්‍රධාන
ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය



ඩබ්ලිව්.ඊ.එම්. වගලත් මිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
වෛද්‍ය පීඨය



ඩබ්.එල්.එස්. විජේසේකර මිය
නියෝජ්‍ය මූල්‍යාධිකාරී
වෛද්‍ය පීඨය



ආචාර්ය එම්.පී.එල්.ආර්. මාරසිංහ මිය
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
වෛද්‍ය පීඨය



අයි.එස්.ඩී.එස්. පොතුහැර මෙය
සහකාර ලේඛකාධිකාරී
වෛද්‍ය පීඨය

# 12. වෛද්‍ය පීඨය

**පීඨාධිපති**
**මහාචාර්ය එම්.එන්. චන්ද්‍රතිලක මයා - විශ්‍රාමික මහාචාර්ය**
*M.B.B.S. (C'bo), MMED (Dundee), Ph.D (Dundee)*

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**
ඩබ්ලිව්.ඊ.එම්. වගලත් මිය
*B.A. (Kel'ya), Dip in Mgt. (OUSL), Dip in English (C'bo)*

**නියෝජ්‍ය මූල්‍යාධිකාරි**
ඩබ්.එල්.එස්. විජේසේකර මිය
*B.Sc. Mgt. (Public) (SJP), MPM (SLIDA), CBA, MAAT, Dip. in English (C'bo)*

**ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි**
ආචාර්ය එම්.පී.එල්.ආර්. මාරසිංහ මිය
*B.Sc. (Kel'ya), MLS (C'bo), Ph.D. (Kel'ya)*

**සහකාර ලේඛකාධිකාරි**
**අයි.එස්.ජී.එස්. පොතුහැර මෙය**
*B.Sc.(Hons)(Perad'ya)*

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා එහි සංශෝධනයන්හි ප්‍රතිපාදන යටතේ 1991 වර්ෂයේ දී රාගම, තලගොල්ල පාරේ පිහිටි උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ලෙස ස්ථාපිත කෙරිණ. මෙහි ආරම්භක පීඨාධිපතිවරයා වූයේ මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා ය. මෙම වෛද්‍ය පීඨයට මුල් ම විද්‍යාර්ථීන් කණ්ඩායම ඇතුළත් කර ගන්නා ලද්දේ 1991 සැප්තැම්බර් 02 දා ය.

වෛද්‍ය පීඨය අධ්‍යයනාංශ 17කින් සමන්විත වේ. එම අධ්‍යයනාංශ නම්, අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය, සායනික කායව්‍යවච්ඡේද අධ්‍යයනාංශය, ජෛව රසායන විද්‍යා සහ සායනික රසායන විද්‍යා අධ්‍යයනාංශය, පරපෝෂවේද අධ්‍යයනාංශය, මහජන සෞඛ්‍ය අධ්‍යයනාංශය, පවුල් වෛද්‍ය අධ්‍යයනාංශය, ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය, භිෂග්වේද අධ්‍යයනාංශය, භෞතවේද අධ්‍යයනාංශය, මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, ව්‍යාධිවේද අධ්‍යයනාංශය, වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, ළමා රෝග හා කෞමාරභෘතීය අධ්‍යයනාංශය, ආබාධිතතා අධ්‍යයනාංශය, වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය, පාරිසරික මධ්‍යස්ථානය සහ ව්‍යාපෘති සහායක මධ්‍යස්ථානයි.

**වෛද්‍ය පීඨය මඟින් දැනට පහත සඳහන් පාඨමාලා පවත්වනු ලැබේ:**

**ප්‍රථම උපාධි පාඨමාලා**
වෛද්‍ය විද්‍යා හා ශල්‍ය වෛද්‍ය විද්‍යා උපාධිය (M.B.B.S.)
කථන හා ශ්‍රවණ විද්‍යාව **පිළිබඳ විද්‍යාවේද** ගෞරව උපාධිය B.Sc. Honours in Speech & Hearing Sciences
**වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය** B.Sc. Honours in Occupational Therapy

**පශ්චාද් උපාධි පාඨමාලා**
මහජන සෞඛ්‍ය විද්‍යාපති උපාධිය (M.P.H.)

දර්ශනපති උපාධිය (M.Phil.)
දර්ශන විශාරද උපාධිය (Ph.D.)
වෛද්‍ය විශාරද උපාධිය (D.M.)
වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවේදී උපාධි පාඨමාලාවේ අධ්‍යයන කාලය අවුරුදු 5ක් වන අතර, කථන හා ශ්‍රවණ විද්‍යාවේදී උපාධි පාඨමාලාවේ අධ්‍යයන කාලය අවුරුදු 4 ක් සහ වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාවේ අධ්‍යයන කාලය අවුරුදු 4 කි. වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවේදී උපාධි පාඨමාලාවට පහත සඳහන් පරීක්ෂණ ඇතුළත් වේ. *(මේ විභාග පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහා වෛද්‍ය පීඨ ශිෂ්‍ය අත්පොත බලන්න.)*

**වෛද්‍ය උපාධි ප්‍රථම පරීක්‍ෂණය**
මේ සඳහා වාර 05කින් සමන්විත අධ්‍යයන පාඨමාලාවක් හැදෑරිය යුතු වන අතර, අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණ 03ක් මෙම පරීක්ෂණයට පෙර පැවැත්වේ.

**වෛද්‍ය උපාධි දෙවන පරීක්‍ෂණය**
මේ සඳහා වාර 06කින් සමන්විත අධ්‍යයන පාඨමාලාවක් හැදෑරිය යුතු වන අතර, ඇගයීම් පරීක්ෂණ 06ක් සඳහා පෙනී සිටිය යුතු ය.

**වෛද්‍ය උපාධි අවසාන පරීක්‍ෂණය**
මේ සඳහා විෂයයන් 05කින් සමන්විත අධ්‍යයන පාඨමාලා හා සායනික පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

රට තුළ සම සෞඛ්‍ය වෘත්තීන් පුළුල් කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයට අනුකූලව වෛද්‍ය පීඨය 1993 දී අබාධිතතා අධ්‍යයන ඒකකය සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවකයින් සඳහා පාඨමාලා පවත්වන නිවර්තන වෛද්‍ය හා ජාත්‍යන්තර සෞඛ්‍ය මධ්‍යස්ථානය 1999 දී පිහිටුවන ලදී. බෝවන රෝග සඳහා අණුක රෝග විනිශ්චය පහසුකම් වැඩි දියුණු කිරීම සහ - ඇගිලි සළකුණු ලබා දීමේ අරමුණින් 2003 දී අණුක වෛද්‍ය ඒකකය පිහිටුවන ලදී. 2008 වසරේදී අබාධිත අධ්‍යයන ඒකකය අධ්‍යයනාංශයක් බවට පත්කරනු ලැබිණ. මෙම අධ්‍යයනාංශය මගින් අබාධ සහිතව සිටින පුද්ගලයින්ගේ සෞඛ්‍ය සහ ජීවන තත්ත්වයන් ඉහළ නැංවීම සඳහා ඔවුන් විශේෂඥ පුනුරුත්තාපන අංශ වෙත යොමු කෙරේ. දකුණු ආසියාතික කලාපයේ ඇති විශ්වවිද්‍යාලයක් මගින් අබාධ සහිත පුද්ගලයින් සඳහා ක්‍රියාත්මක වන එකම අධ්‍යයනාංශය මෙය වේ. මෙම අධ්‍යයන අංශය මගින් උපාධි අපේක්ෂක වෘත්තීය පාඨමාලා දෙකක් (02) පිරිනමයි; එනම් කථන හා ශ්‍රවන විද්‍යාව පිළිබඳ **විද්‍යාවේදී** (ගෞරව) **උපාධිය** සහ **වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී** (ගෞරව) **උපාධිය වේ.**
ඉහත සඳහන් උපාධි පාඨමාලා දෙකේ ම සෑම අධ්‍යයන වර්ෂයකම අධ්‍යයන වාර දෙකක් සහිත වසර 4 ක වැඩසටහනකින් සමන්විත වූවකි. විෂය මාලාව (Credit Based) මත පදනම් කරගත් පාඨමාලා ඒකක පද්ධතියකි. සෑම පාඨමාලා ඒකකයක්ම අදාළ අධ්‍යයන වාරය අවසානයේ හෝ අධ්‍යයන වර්ෂය අවසානයේදී ඇගයුම් කරන් ලැබේ. 1 වන අධ්‍යයන වර්ෂයේදී සිසුන් විකල්ප අධ්‍යයන මාර්ග දෙකෙන් එකක් තෝරා ගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව කථන හා භාෂා චිකිත්සාව හෝ ශ්‍රවන විද්‍යාව මත පදනම් ව කථන හා භාෂා චිකිත්සකයෙකු හෝ ශ්‍රවන විද්‍යා සම්මානලාභියෙකු ලෙස වෘත්තීය සුදුසුකමක් පිරිනමනු ලැබේ. මෙම වැඩසටහනට පන්තිකාමර පදනම් කරගත් ඉගැන්වීම්, සායනික පුහුණුව සහ අවසන් වසරේ අනිවාර්ය පර්යේෂණ ව්‍යාපෘතියක් ඇතුළත් වේ.
**වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී** (ගෞරව) **උපාධිය** 2022 දී ආරම්භ වූ එවැනිම වසර 4 ක උපාධි පාඨමාලාවකි. එය **වෘත්තීය ප්‍රතිකාර පිළිබඳ වෘත්තීය සුදුසුකමකට මග පාදයි.** කථන හා භාෂා චිකිත්සාව හෝ ශ්‍රවන විද්‍යාවට සමානම විෂය මාලාව (Credit Based) මත පදනම් කරගත් පාඨාමලා ඒකක පද්ධතියකි. මෙම පාඨමාලාවට පන්ති කාමර පදනම් කරගත් ඉගැන්වීම්, සායනික පුහුණුව සහ අවසන් වසරේ අනිවාර්ය පර්යේෂණ ව්‍යාපෘතියක් ඇතුළත් වේ.

රාගම අක්කර 35ක භූමි භාගයක පිහිටා ඇති කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙහි දැනට විද්‍යාර්ථීන් දහසක් පමණ ශාස්ත්‍රෝද්ග්‍රහණය කරන අතර, සීමිත විදේශීය විද්‍යාර්ථීන් සංඛ්‍යාවක් සඳහා ද අධ්‍යයන පහසුකම් සැපයේ. මෙම පීඨයෙහි ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය ආචාර්ය භවතුන් 130 දෙනෙකුගෙන් පමණ සමන්විත වන අතර, තාවකාලික ආචාර්ය මණ්ඩලය 40 දෙනෙකුගෙන් පමණ සමන්විත වේ. මීට අමතර ව, අනුබද්ධ ශික්ෂණ රෝහල්වල සේවයේ නියුතු විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු ව බාහිර ව පැමිණෙන ආචාර්යවරුන් 60 දෙනෙකුගේ සේවය ද මෙම පීඨයට ලැබේ. මෙම පීඨය සතු ව අංග සම්පූර්ණ පුස්තකාලයක් ද ඇත.

පීඨය ආරම්භ කොට ගත වූ පසුගිය වසර 25 ඇතුළත මෙම පීඨයේ ආචාර්ය භවතුන් විසින් පර්යේෂණ හා ප්‍රකාශන විශාල සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කරන ලද අතර, ජාතික හා අන්තර් ජාතික විද්‍යා සම්මේලනයන්හි දී එම ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබූ අධ්‍යයන කාර්ය මණ්ඩලය ගෞරව බහුමානයට පාත්‍ර ව සම්මාන හිමි කර ගෙන ඇත.

මෙම පීඨයේ අධ්‍යයනාංශ කිහිපයක් ඔක්ස්ෆර්ඩ්, එඩින්බරා, ලිවර්පූල් හා ලන්ඩන් වැනි විදේශ විශ්වවිද්‍යාල සමඟ අධ්‍යාපනික සම්බන්ධතා පවත්වා ගෙන යයි.

මෙම පීඨය සතු ව පවතින පරිගණක මධ්‍යස්ථානය වෛද්‍ය ශිෂ්‍යයින්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පරිගණක අවශ්‍යතා සපුරයි. වර්ෂ 1996 දී ස්ථාපනය කරන ලද මෙම පරිගණක මධ්‍යස්ථානය, පෞද්ගලික පරිගණක නොමැති බොහෝ විද්‍යාර්ථීන්ට මහෝපකාරී වේ. ඊට අමතර ව කාන්තා හා පිරිමි නේවාසිකාගාර දෙක සඳහා ද පරිගණක මධ්‍යස්ථාන 02ක් ස්ථාපනය කර ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයට අනුබද්ධ ප්‍රධාන ශික්ෂණ රෝහල වන්නේ උතුරු කොළඹ ශික්ෂණ රෝහලයි. පීඨයේ සායනික අධ්‍යයනාංශ යටතේ පවතින වාට්ටු, රෝහලේ අලුතෙන් ඉදි කරන ලද සිව්මහල් ගොඩනැගිල්ලේ ස්ථාපනය කර ඇති අතර, වර්ෂ 2000 මැයි මස අභිනවයෙන් විවෘත කරන ලද ගොඩනැගිල්ලේ හදිසි අනතුරු හා හදිසි අවස්ථා ඒකක හා සියලු ම බාහිර රෝගී අංශ ස්ථාපනය කර ඇත. රාගම වාතරක්තවේදී හා පුනරුත්ථාපන රෝහල, වැලිසර ළය රෝහල, මීගමුව හා ගම්පහ මූලික රෝහල් මෙම පීඨය හා එක් ව කටයුතු කරන අනෙකුත් ශික්ෂණ රෝහල් ය. **2018 දී ආරම්භ කරන ලද “අයති” මධ්‍යස්ථානය ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා බහුවිධ සායනික සේවා සපයන අතිනවීන පහසුකම් සපයනු ලබන ජාතික මධ්‍යස්ථානයකි. ආබාධිතතා අධ්‍යයනාංශයේ ප්‍රධානතම සායනික පුහුණු මධ්‍යස්ථානයද මෙය වේ.**

වර්ෂ 1997 දී පීඨය තුළ වෛද්‍ය අධ්‍යාපන මධ්‍යස්ථානයක් (Medical Education Centre) පිහිටුවන ලදි. මෙම ඒකකය 2016 වසරේදී අධ්‍යයන අංශයක් බවට පත්කරනු ලැබිණි. එමගින් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය අධ්‍යාපනයේ පවතින විවිධ ක්‍රමවේදයන් සහ එහි මූලධර්ම පිළිබඳ අවබෝධයක් ලබා දෙන අතර ම, විෂයමාලා සංවර්ධනය, ඉගැන්වීමේ සහ ඉගෙන ගැනීමේ ක්‍රමවේදයන් සහ ඒවායේ සාර්ථකත්වය පරීක්ෂා කිරීමේ විධි ගැන විශේෂ උපදේශයන් හා මාර්ගෝපදේශ ද සැපයෙයි. තව ද විද්‍යාර්ථීන් සඳහා ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය ආශ්‍රයෙන් අමතර ඉගැන්වීමේ කටයුතු කිරීමට ද මෙහි පහසුකම් සපයා ඇත.

මෙම පීඨය මඟින් අණුක වෛද්‍ය විද්‍යා ඒකකයක් (Molecular Medicine Unit), පරපෝෂවේද අධ්‍යයනාංශයට අනුබද්ධ ව 2002 වසරේ දී ආරම්භ කරන ලදි. එයට අදාළ මූලික විද්‍යා උපකරණ හා රසායනික ද්‍රව්‍ය, ජාත්‍යන්තර පරමාණු බලශක්ති අධිකාරිය, ජාතික විද්‍යා සභාව, ජාතික ළමා රක්ෂණ අධිකාරිය යන ආයතනවල පර්යේෂණ ව්‍යාපෘති මඟින් ලබා ගන්නා ලදි. මැලේරියාව, ඩෙංගු, බරවා, හෙපටයිටිස්, ක්ෂය රෝගය හා ලීෂ්මානියාව වැනි රෝග විනිශ්චයන් සඳහා නවතම විශේෂ DNA පරීක්ෂණ සේවාවන් මෙම ඒකකය මඟින් සැපයීමට කටයුතු කරගෙන යනු ලැබේ. එසේ ම මෙම ඒකකය මඟින් පීතෘත්වය/මාතෘත්වය තහවුරු කිරීමේ DNA පරීක්ෂණ සේවාවක් 2002 මැයි මස සිට අරඹන ලද අතර, දිවයිනේ විවිධ ප්‍රදේශවල උසාවි මඟින් යොමු කරනු ලබන

පීතෘත්වය/මාතෘත්වය තහවුරු කිරීමේ DNA පරීක්ෂණ පැවැත්වීම මෙම ඒකකය මඟින් සිදු කරනු ලබයි. 2003 වසරේ දී මෙම ඒකකය සඳහා ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයක් පත් කරනු ලැබිණි.

මීට අමතර ව අන්තර් ජාතික පරමාණුක බලශක්ති අධිකාරියෙන් ලද පරිත්‍යාගයකින් විකිරණ සහ පිළිකා කාරක මඟින් වර්ණ දේහවල ඇති වන වෙනස්වීම් විශ්ලේෂණය කිරීමේ පර්යේෂණාගාරයක් 2010 මැයි මාසයේ දී ස්ථාපනය කරන ලදි.

මේ වන විට විශ්වවිද්‍යාලය මඟින් පීඨයේ සියලු ම විද්‍යාර්ථීන් හට නේවාසික පහසුකම් සැපයේ. වෛද්‍ය පීඨය සතුව සංස්කෘතික මධ්‍යස්ථානයක්, එළිමහන් රංග පීඨයක් සහ ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ද ඇත. තලගොල්ල නේවාසිකාගාර භූමියේ දැල්පන්දු, වොලිබෝල්, පැසිපන්දු සහ ටෙනිස් ක්‍රීඩා සඳහා දිවා-රාත්‍රී ක්‍රීඩාංගණයක් ද, මධ්‍යම ප්‍රමාණයේ ක්‍රීඩාපිටියක් ද ඉදි කර ඇත.

## 12.1 කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය වී. අබේසූරිය මයා - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*MBBS (S.J'pura), M.Phil. (Kel'ya), MD (Surgery) (C'bo), MRCS (Eng), FRCS(Glas.)*
මහාචාර්ය ඒ.එල්. කරුණානායක මයා - මහාචාර්ය
*MBBS (NCMC), DM (Kel'ya), DOH & S (C'bo), Dip. Tox. (C'bo), FSS (Hyderabad), D.Sp.Med. (C'bo), Dip. In Coun. MBASEM (UK), MSc SEM (UK)*
මහාචාර්ය ආර්. හසන් මයා - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*MBBS (NCMC), Ph.D. (Ruhuna)*
වෛද්‍ය කේ.ඒ. සැල්වින් මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*MBBS (Ruhuna), MD (Opththalmology) (C'bo), FRCS (Opththalmology)*
ආචාර්ය ආර්.එම්.එස්.එල්. රණවීර මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්ත වාර්ෂික නිවාඩු)
*B.Sc. (S.J'pura), PG. Dip. Arch. (Kel'ya), Ph.D. (Bangkok)*
වෛද්‍ය ඒ.ජී.පී.එම්. පාදෙනිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*MBBS (Perad'ya) MSc in Clinical Genetics*
වෛද්‍ය ඊ.ඩී.පී.එස්. ප්‍රනාන්දු මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (C'bo), M.Phil. (Kel'ya), MRCGP (Int.), DFM (C'bo)*
වෛද්‍ය එස්.ඒ.එස්.ආර්. සිරිවර්ධන - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (Kel'ya), MD (Radiology) (C'bo)*
වෛද්‍ය කේ.ඩබ්..එස්.එම්. විජයවර්ධන - ආධුනික කථිකාචාර්ය
*MBBS (C'bo)*

මෙම අධ්‍යයනාංශය මඟින් ප්‍රථම හා ද්විතීය වර්ෂයන්හි වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ට කායව්‍යවච්ඡේද විද්‍යා විෂයය ඉගැන්වෙන අතර ආබාධිතතා අධ්‍යයනාංශයේ කථන හා ශ්‍රවණවේදී උපාධි අපේක්ෂකයන්ට කායව්‍යවච්ඡේද විද්‍යා විෂය ඉගැන්වේ. මෙයට අමතර ව කැලණිය විශ්වවිද්‍යාලය මඟින් මෙහෙයවනු ලබන වෙනත් ඩිප්ලෝමා සහ පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා ද දායක වේ.

කායව්‍යවච්ඡේදය සඳහා අවශ්‍ය නවීන තාක්ෂණයෙන් සහ අංගෝපාංගයන්ගෙන් මෙම අධ්‍යයනාංශය සමන්විත ය. විද්‍යාර්ථීන්ගේ ප්‍රයෝජනය සඳහා වන සංරක්ෂිත නිදර්ශන විශාල සංඛ්‍යාවක් මෙම අධ්‍යයනාංශය සතු ව ඇත. අංග සම්පූර්ණ පටක විද්‍යා රසායනාගාරයක් මෙම අධ්‍යයනාංශය සතු වන අතර, අධ්‍යයන අවශ්‍යතා සඳහා උපයෝගීතා නිරූපණ අන්වීක්ෂයකට සම්බන්ධිත සංවෘත පරිපථ රූපවාහිනී පද්ධතියක් ද, ශරීරයේ සෑම පටකයක් ම පරිගණකය හරහා නිරීක්ෂණය කළ හැකි විද්‍යාගාරයක් ද මෙහි ඇත. මීට අමතර ව අස්ථි විද්‍යාව, පුරාඅස්ථි විද්‍යාව, කුඩා සහ මහා අන්ත්‍රවල ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම, ප්‍රජනක හෝමෝන ආශ්‍රිත පර්යේෂණ, කලල බන්ධය සම්බන්ධ පර්යේෂණාත්මක අධ්‍යයනය හා අක්මාව, අග්න්‍යාශය සහ පිත්තාශය පිළිබඳ පර්යේෂණ සහ ප්‍රවේණි විද්‍යාව පිළිබඳ පර්යේෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. එසේ ම ඊකීරක්ෂා සුරක්ෂිතභාවය සහ සනීපාරක්ෂාව පිළිබඳ පරීක්ෂණ ද සිදු කරනු ලැබේ.


දුරකථන අංක - 94 11 2961123
විද්‍යුත් ලිපිනය - anat@kln.ac.lk

## 12.2 ජෛව රසායන විද්‍යා සහ සායනික රසායන විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය සී.ඩබ්ලිව්. සුබසිංහ මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.Sc. (Hons) (C'bo), Ph.D. (Mich' State)*
මහාචාර්ය එස්. චක්‍රවර්ති මිය - විශ්‍රාමික මහාචාර්ය
*B.Sc. (Hons) (Kel'ya), Ph.D. (Glas)*
මහාචාර්ය බී.පී. ගල්හේන මයා - මහාචාර්ය (සේවයෙන් නිදහස් කර ඇත)
*BDS (Perad'ya), M.Phil. (Perad'ya) Ph.D. (Kel'ya)*
මහාචාර්ය පී.එස්. පෙරේරා මිය - මහාචාර්ය
*B.Sc. (C'bo), M.Phil. (S.J'pura), Ph.D. (Kel'ya)*
වෛද්‍ය කේ.ඒ.ඩී.සී. ගුණසේකර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*MBBS (Ruhuna), Ph.D (Nagasaki)*
ආචාර්ය පී.එම්.ටී.බී. වික්‍රමසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc. (Hons) (C'bo), Ph.D. (Arizona)*
වෛද්‍ය කේ.කේ.එම්. ප්‍රනාන්දු මිය - ආධුනික කථිකාචාර්ය
*MBBS (Kel'ya)*

මෙම අධ්‍යයනාංශය මඟින් ප්‍රථම හා දෙවන වර්ෂයන්හි වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ට ජෛව රසායන විද්‍යාව ඉගැන්වේ. එයට අමතර ව භෞතචිකිත්සකවේදය, කථන චිකිත්සකවේදය සහ ආහාර හා පෝෂණවේදය යන උපාධි පාඨමාලාවන් සඳහා ඉගැන්වීම ද සිදු කෙරේ. පශ්චාත් උපාධි පර්යේෂණ අධීක්‍ෂණ කටයුතු ද සිදු කෙරේ.

මෙම අධ්‍යයන අංශයේ ප්‍රධාන පර්යේෂණ විෂයයන් අතර බෝ නොවන රෝගවල රුධිරයේ ඇති වන වෙනස්කම් වල ජෛව රසායනික පදනම විශ්ලේෂණය කිරීම, ප්‍රතිඔක්සීකාරක ඖෂධීය පැළෑටිවල සහ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ඖෂධවල ඇති ජෛව රසායනික හා ඖෂධීය ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම සහ පාසැල් දරුවන් අතර පවතින පෝෂණ (මන්දපෝෂණය සහ රක්තහීනතාවය) ගැටලු විශ්ලේෂණය කෙරෙයි.

එමෙන්ම මෑතකදී ස්ථාපනය කරන ලද අණුක විද්‍යාව හා සෛල විද්‍යාව සම්බන්ධ පර්යේෂණ රසායනාගාරයක් පවත්වාගෙන යනු ලබන අතර එමඟින් විවිධ බෝවන හා බෝනොවන රෝග ආශ්‍රිතව ඇති වන්නාවූ ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකෙරේ.

ඉගැන්වීමේ හා පර්යේෂණ කටයුතුවලට අමතර ව මෙම අධ්‍යයනාංශය මඟින් රාගම ශික්ෂණ රෝහලට අවශ්‍ය ඇතැම් සායනික පරීක්ෂණ සඳහා සහයෝගය ලබා දෙන අතර, අවශ්‍යතාවය මත බාහිර රෝගීන්ගේ රුධිර පරීක්ෂණ සිදු කිරීම සඳහා සේවා අංශයක් ද පවත්වාගෙන යනු ලබයි.


දුරකථන අංක - 94 11 2961123
විද්‍යුත් ලිපිනය - bioc@kln.ac.lk

## 12.3 ආබාධිතතා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය ඒ.ඩී.එස්.ඒ. බක්මීවැව මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*B.Sc. (BASLP) (M'lore), M.Sc (UK), Ph.D. (UK),*
මහාචාර්ය වෛද්‍ය එස්.පී සුමනසේන මිය - මහාචාර්ය
*MBBS (Col), MD (Paed), MSc. (Disability Studies) (UK), DCH (Col), FRCPCH(UK)*
මහාචාර්ය එස්. හෙට්ටිආරච්චි මෙය - මහාචාර්ය
*BA (Hons) (Kel'ya), M.Sc. (Oxon), M.Sc. (UK), MA (UK), Ph.D. (UK)*
ආචාර්ය එල්.බී.ටී.සී. ලොකුබාලසූරිය මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (SHS) (Kel'ya), Ph.D.(C'bo),*
ආචාර්ය නන්දන වෙලගේ මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*BSc(OT) (Kel'ya), Dip. In OT (Col), MSc (OT)(Hong-Kong), Ph.D. (Australia),*
එන්. දිදුලනි දන්තනාරයන මෙය - කථිකාචාර්ය
*B.Sc. (Hons) (SHS) (Kel'ya),M.Sc (Australia), M.Sc (UK),*
එම්.ඩී.කේ. ද සිල්වා මිය - කථිකාචාර්ය
*BSc (SHS) (India), Dip. In sign Language (NIE), MSc (Stat) (C'bo), MSc(ASLP) (India),*
පී.කේ. කොඩිතුවක්කු මිය - ආධුනික කථිකාචාර්ය
*BSc (SHS) (Kel'ya), MSc.(Arkansas)*
සී.එල්.ජයතිලක මෙය - ආධුනික කථිකාචාර්ය
*BSc.(Hons) (SHS) (Kel'ya),Grad.Chem. (CCS)*
ඩබ්ලිව්.පී.එස්.එස්. කරුණාරත්න මිය - ආධුනික කථිකාචාර්ය
*BSc (ASLP) (Ind), MSc (ASLP) (Ind)*
බී.ටී.එන්. අධිකාරි මිය - ආධුනික කථිකාචාර්ය
*BSc (Hons)(Kel'ya) Certificate in postgraduate Research (Col)*
කේ. එම්. බී. දේවගිරි මෙය - ආධුනික කථිකාචාර්ය
*BSc SHS(Hons)(Kel'ya), Certificate in postgraduate Research (Col)*
ජී. වී. පබෝධනී මෙය - ආධුනික කථිකාචාර්ය
*BSc (Hons)(Kel'ya*

1993 වසරේ කැලණිය විශ්වවිද්‍යාලය හා ස්වීඩනයේ උප්සලා (Uppsala) විශ්වවිද්‍යාලයේ එකමුතුවෙන් ආබාධිතතා අධ්‍යයන ඒකකය ආරම්භ කළ අතර, 1995 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නිත්‍ය ඒකකයක් ලෙස පවත්වාගෙන යාමට අනුමැතිය ලබා දෙන ලදි. 2008 වර්ෂයේ දී මෙය වෛද්‍ය පීඨයේ අධ්‍යයනාංශයක් වශයෙන් ස්ථාපනය කරන ලදි. මෙම අධ්‍යයන අංශයේ මූලික පරමාර්ථය වනුයේ කථන හා ශ්‍රවන විද්‍යාවේදි ගෞරව උපාධිය කථන හා භාෂා චිකිත්සාව සහ ශ්‍රවනවේදය වෙනුවෙන් පිරිනැමීමයි. 2022 වර්ෂයේ සිට මෙම අධ්‍යයනාංශය, වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය පාඨමාලාව ආරම්භ කර ඇති අතර මේ වන විට ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් බඳවා ගෙන ඇත.

**කථන හා ශ්‍රවන විද්‍යාවේදි ගෞරව උපාධිය**

2008 වර්ෂයේ සිට පිරිනමනු ලබන මෙම සිව් අවුරුදු උපාධිය ශිෂ්‍යයෙකුට කථන හා භාෂා චිකිත්සකවරයකු හෝ ශ්‍රවනවේදියෙකු ලෙස උපාධිය පිරිනමයි. මෙම උපාධි පාඨමාලාවට සිසුන් තෝරා ගනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂයට "S" සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා ගත් සිසුන් ශ්‍රවනවේදි විෂය ක්ෂේත්‍රය හැදෑරීමට සුදුසුකම් ලබති. සියලු ම සිසුන් විසින් අවසන් වසරේදි පර්යේෂණ ව්‍යාපෘතියක් සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. **මෙම උපාධි පාඨමාලාවේ සියලුම**

**ඉගැන්වීම්වල විභාග, සහ පර්යේෂණ ව්‍යාපෘති සංරචකයන් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පවත්වනු ලබන අතර පාඨමාලාව හැදෑරීමට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඉහළ ප්‍රවීණතාවයක් අවශ්‍ය වේ.** මෙම උපාධි පාඨමාලාව ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාල සභාව (CMCC) සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) විසින් ප්‍රතීතනය කර ඇත .

**වෘත්තීය චිකිත්සා විද්‍යාවේදි ගෞරව උපාධිය**

මෙම සිව් අවුරුදු උපාධි පාඨමාලාව 2022 වර්ෂයේ සිට හඳුන්වා දී ඇති අතර එය වෘත්තීය චිකිත්සාව පිළිබඳ වෘත්තීය නිපුනතාවයක් ලබා දෙයි. කථන හා ශ්‍රවන විද්‍යාවේදි පාඨමාලවේ ලෙසින්ම මෙම උපාධි පාඨමාලාව සඳහා ද සිසුන් තෝරා ගනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි. මෙම උපාධි පාඨමාලාව සාර්ථක ව සම්පූර්ණ කිරීම වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ප්‍රධානය කිරීමට හේතු වේ. විෂය මාලාවට න්‍යායාත්මක දේශන පදනම් කර ගත් ඉගෙනුම් ක්‍රමවලට අමතර ව සායනික පුහුණුව හා අවසන් වසරේ සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පර්යේෂණ ව්‍යාපෘතියක් ද ඇතුළත් වේ. මෙම උපාධි පාඨමාලාවේ සියලු ම ඉගැන්වීම්, විභාග සහ පර්යේෂණ ව්‍යාපෘති සංරචකයන් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පවත්වනු ලබන අතර පාඨමාලාව හැදෑරීමට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඉහළ ප්‍රවීණතාවයක් අවශ්‍ය වේ.

**සායනික පුහුණුව සහ සේවා**

අධ්‍යයනාංශය විසින් රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරිත්වයක ප්‍රතිඵලයක් ලෙස පීඨ පරිශ්‍රය තුළ පිහිට වූ "අයති" මධ්‍යස්ථානය මගින් බහුවිධ සායනික සේවා සපයයි. මෙම නවීන පහසුකම් සහිත මධ්‍යස්ථානය, අධ්‍යයනාංශයේ ප්‍රධානත ම සායනික පුහුණු මධ්‍යස්ථානය වන අතර, එය ආබාධ සහිත ළමුන් සඳහා ඇති ජාතික සායනික මධ්‍යස්ථානයකි. එමගින් කල් ගත වී ඇති වූ හෝ සංජානනීය, ස්නායුක සහ වර්ධන ආබාධ සහිත ළමුන් මෙන් ම වැඩිහිටියන් සඳහා කථන හා භාෂා චිකිත්සක සේවා, ශ්‍රවනවේදී ප්‍රතිකාර, වෘත්තීය චිකිත්සක සේවා ඇතුළු බහුවිධ වෛද්‍ය සහ පුනරුත්ථාපන සේවා සැපයීම සිදු වේ.

දුරකථන අංක - 94 11 2961207
විද්‍යුත් ලිපිනය - diststaff@kln.ac.lk

## 12.4 පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

වෛද්‍ය ආර්.ඒ.පී.ජේ.කේ.එම්.එස්. රූපසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අංශ ප්‍රධාන)
*MBBS (C'bo), DFM (C'bo), Pg Dip MCGP(SL), MRCGP (INT) , MD Family Medicine (C'bo),FCGP(SL), MCCFP(SL)*
වෛද්‍ය ඩී.පී. පෙරේරා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (Kel'ya), Dip Med Edu (C'bo), DFM (C'bo), MRCGP (INT), MD Family Medicine (C'bo)*
මහාචාර්ය ආර්.පී.ජේ.සී. රාමනායක මයා - මහාචාර්ය
*MBBS (C'bo), DFM (C'bo), MD Family Medicine (C'bo)*
වෛද්‍ය එස්.එස්. විතාන මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (විශේෂ නිවාඩු)
*MBBS (Kel'ya), MPhil, (Family Medicine)*

ජීව විද්‍යාත්මක, සායනික හා චර්යා රටා පිළිබඳ දැනුම සංකලනය කරගනිමින් තනි පුද්ගලයන්ට හා පවුල් ඒකකවලට පුළුල් පරාසයක විහිද පවත්නා රෝග වළක්වාලීම හා රෝග නිවාරණය පිළිබඳ දැනුම ලබා දෙන්නේ පවුල් වෛද්‍ය විද්‍යාව මඟිනි.

වර්ෂ 1996 දී ආරම්භ කරන ලද විශ්වවිද්‍යාලයීය පවුල් වෛද්‍ය සායනය මඟින් ප්‍රජාවගේ වෛද්‍ය අවශ්‍යතාවයන් සපුරන අතර ම එය වෛද්‍ය ශිෂ්‍යයන් හා පශ්චාත් උපාධි අපේක්ෂකයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් පිළිගෙන ඇත.

මෙම අධ්‍යයනාංශය මඟින් සිසුන්ට දේශන පැවැත්වීමට අමතරව පවුල් වෛද්‍ය සායනික පුහුණුව ද ලබා දෙයි. විද්‍යාර්ථීන්ගේ සායනික හා සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීමට විවිධ ඉගැන්වීමේ ක්‍රම භාවිත කරන අතර සුලභ සෞඛ්‍ය ගැටලු මත පදනම් වු කුඩා කණ්ඩායම් සාකච්ඡා ඉන් විශේෂ තැනක් ගනී. මීට අමතර ව අනෙකුත් ප්‍රාථමික සත්කාර සේවා සපයන ආයතන කිහිපයකට ද සිසුන් අධ්‍යයන කටයුතු සඳහා යොමු කෙරේ. මෑත කාලයේ දී බහු පුද්ගල වෛද්‍ය සායනික භාවිතයට සුදුසු පරිශීලනයට පහසු ව්‍යුහගත වෛද්‍ය වාර්තාවක් ද හඳුන්වා දෙන ලදී.

ඇගයීම්.

01. අඛණ්ඩ ඇගයීම් 2 - පවුල් වෛද්‍ය විද්‍යා දේශන හා කුඩා කණ්ඩායම් සාකච්ඡා මත සැකසුණ ව්‍යුහගත රචනා ප්‍රශ්න 4ක් අඩංගු පැයක ප්‍රශ්න පත්‍රය තෙවන වසර අවසානයේ පැවැත්වේ.

02. අඛණ්ඩ ඇගයීම් 3 - සායනික පුහුණුව අවසානයේ පවත්වන සායනික ගැටලු පදනම් කරගත් සායනික කරුණු අරමුණු කරගත් ව්‍යුහගත ගැටලු (OSCE) 5ක්

03. 5 වන ඒකක ඇගයීම -
   a. බහුවරණ ප්‍රශ්න (MCQ) 07 සහ තනි හොඳම පිළිතුරු ප්‍රශ්න (SBA) 10
   b. පවුල් වෛද්‍ය විද්‍යා මූලධර්ම හා සායනික ගැටලු පදනම් කරගත් ව්‍යුහගත රචනා ප්‍රශ්න 4ක් අඩංගු පැය 2ක ප්‍රශ්න පත්‍රය
   c. මිනිත්තු 6 බැගින් වූ සායනික කරුණු අරමුණු කරගත් ව්‍යුහගත ගැටලු (OSCE) 10ක්

දුරකථන අංක - 94 11 2961170
විද්‍යුත් ලිපිනය - fmed@kln.ac.lk

## 12.5 අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ඩබ්ලිව්.එන්.එස්. පෙරේරා මිය - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*MBBS (Kel'ya), DLM (C'bo), MD (C'bo)*
මහාචාර්ය පී.ඒ.එස්. එදිරිසිංහ මිය - විශ්‍රාන්ත මහාචාර්ය
*MBBS (NCMC), DLM (C'bo), MD (C'bo), DMJ (Lon.), MFFLM (UK)*
මහාචාර්ය පී. පරනිදරන් මයා - මහාචාර්ය
*MBBS (Jaffna), DLM (C'bo), MD (C'bo)*
මහාචාර්ය අයි.ඩී.ජී. කිතුල්වත්ත මිය - මහාචාර්ය
*MBBS (C'bo), DLM (C'bo), MD (C'bo)*
වෛද්‍ය ජේ.ඒ.පී.ජේ. විජේරත්න මිය - ආධුනික කථිකාචාර්ය
*MBBS (Kel'ya)*
වෛද්‍ය වයි. තිවාහරන් මිය - ආධුනික කථිකාචාර්ය
*MBBS University Tianjin Medical University, China*

මෙම අධ්‍යයනාංශය මඟින් වෛද්‍ය විද්‍යාර්ථීන්ගේ සිව්වන වසරේ දී අධිකරණ වෛද්‍ය විද්‍යාව ඉගැන්වෙයි. ඊට අමතර ව මෙම අධ්‍යයනාංශය වෛද්‍ය පශ්චාද් උපාධි ආයතනය මඟින් පවත්වනු ලබන අධිකරණ වෛද්‍ය විද්‍යාව සඳහා වන M.D. උපාධිය, පටක අධිකරණ ව්‍යාධිවේදය පිළිබඳ ව විශේෂ පුහුණුව සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ලෙසින් ද කටයුතු කරයි. මෙම අධ්‍යයනාංශය උතුරු කොළඹ ශික්ෂණ රෝහලට හා අනෙකුත් අනුබද්ධ රෝහල්වලට අධිකරණ වෛද්‍ය සේවාවන් සපයන අතර, ගම්පහ දිස්ත්‍රික්කයේ යොමු කිරීමේ මධ්‍යස්ථානයක් (Referral Centre) ලෙස ද කටයුතු කරයි.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 0112956153 |
| විද්‍යුත් ලිපිනය | - | fore@kln.ac.lk |

## 12.6 වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය පී.කේ.එස්. ගොඩමුන්නේ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (අංශ ප්‍රධාන)
*BSc (Psychology) (East Lon), MA (Psychology) (Delhi), Pg CME (C'bo), PhD (Kel'ya)*
*මහාචාර්ය* එම්.එන්. චන්ද්‍රතිලක මයා - විශ්‍රාමික මහාචාර්ය
*MBBS (C'bo),MMED(Dundee),PhD (Dundee)*
වෛද්‍ය කේ.ජී. කොඩිකාර - ආධුනික කථිකාචාර්ය
*MBBS (Kel'ya), Pg CME (C'bo), MMEd (C'bo)*
වෛද්‍ය එම්.එච්.එම්. වික්‍රමසේකර - ආධුනික කථිකාචාර්ය
*MBBS (Kel'ya), Pg CME (C'bo)*

වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය පීඨයේ දැක්ම සහ මෙහෙවර සාර්ථක කර ගැනීම උදෙසා අංශ කිහිපයකින් තම දායකත්වය සපයයි.

- සම්මන්ත්‍රණ වැඩමුළු ආදියෙන් වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රවණතා සහ මූලධර්ම පිළිබඳව අධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
  කාර්ය මණ්ඩල සංවර්ධනය හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ බාහිර අධ්‍යයන කාර්යය මණ්ඩල සඳහා වැඩමුළු සංවිධානය කිරීම.

- විෂයමාලා ඉගැන්වීමේ ඉගෙනුම් ක්‍රම සහ ඇගයීම් සම්බන්ධයෙන් පීඨයට අඛණ්ඩ මාර්ගෝපදේශන සැපයීම.
  තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා වන ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා අධ්‍යයන අංශයක් ලෙස පාඨමාලා පිළිබඳ නිරන්තර ඇගයීම් සිදු කරනු ලබයි.

- වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා අධ්‍යයන වැඩසටහන් යාවත්කාලීනව තබා ගැනීම.
  අධ්‍යයන වැඩසටහන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව තබාගැනීම සඳහා වෛද්‍ය අධ්‍යාපනයේ වර්තමාන ප්‍රවණතා ගවේෂණය කරයි.

- උපාධි අපේක්ෂක සිසුන්ගේ අධ්‍යයන කටයුතු සම්බන්ධීකරණය.
  වෘත්තීය සංවර්ධනය සහ පවුල් වෛද්‍ය විද්‍යාව යන අංශවල වෘත්තීය සංවර්ධනය පිළිබඳව පාඨමාලා සම්බන්ධීකරණය. මෙමගින් සිසු සිසුවියන් අතර ආකල්ප හා වෘත්තීය භාවය වැඩි දියුණු කරයි. වෘත්තීය සංවර්ධන, පවුල් වෛද්‍ය විද්‍යාව සහ ප්‍රජා සෞඛ්‍යය ඇතුළු විවිධ ඉගෙනුම් ක්ෂේත්‍රයන්හි ඉගැන්වීමට අධ්‍යයන අංශ කාර්ය මණ්ඩලය සම්බන්ධ වේ.

- බහු මාධ්‍ය ඉගෙන්වීමේ ක්‍රම සංවර්ධනය කිරීම.
  පීඨයේ මාර්ගගත (Online) ඉගෙනුම් පරිසරය (CAL) පවත්වාගෙන යාමේ මූලික වගකීම අධ්‍යයනාංශය සතු වේ. එමගින් සිසුන්ගේ ශාස්ත්‍රීය අධ්‍යයන කටුයතු වැඩි දියුණු කිරීම සඳහා බහුමාධ්‍ය ඉගැන්වීමේ ක්‍රම සංවර්ධනය කරයි. මේ සම්බන්ධයෙන් විශාල කාර්යභාරයක් අධ්‍යයනාංශයේ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය විසින් සිදු කරයි.

- සායනික කුසලතා පිළිබඳ පුහුණුව මගින් රෝගියාගේ ආරක්ෂාව සහ ගෞරවය වැඩි දියුණු කිරීම.
  අධ්‍යයනාංශයට අයත් සායනික නිපුණතා පුහුණු මධ්‍යස්ථානය මගින් වෛද්‍ය සිසුන්ට සායනික හා ප්‍රායෝගික කුසලතා පිළිබඳ අනුමාන පරිසරයක් තුළ දැනුවත් කිරීම සහ පුහුණු කිරීම.

- භාෂා කුසලතා වර්ධනය කිරීම.
අධ්‍යයනාංශයේ ඉංග්‍රීසි භාෂා ඒකකය මගින් සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතාව වැඩි දියුණු කිරීම.

- අධ්‍යාපන පර්යේෂණ කටයුතු පැවැත්වීම සහ ප්‍රවර්ධනය කිරීම.
වෛද්‍ය අධ්‍යාපනයේ යහ භාවිතයන් පිළිබඳ ව සාක්ෂි ජනනය කිරීම හා භාවිත කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනාංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

- තත්ත්ව පාලන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.
තත්ත්ව පාලන පද්ධතියේ දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා තත්ත්ව සහතික සංකල්ප ප්‍රවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක මගින් ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සිදු කරයි. ඉගැන්වීම සහ ඉගෙනීම්වල විශිෂ්ටයන් වන විශ්වවිද්‍යාල සහ සායනික ආචාර්යභවතුන්, සිසුන් සඳහා මෙන් ම තෝරාගත් කාර්ය සාධන විශිෂ්ටයන් වන අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත වාර්ෂික පීඨාධිපති විශිෂ්ටතා සම්මාන ප්‍රදානය සිදු කරනු ලබයි.

- රෝගීන්ගේ රැකවරණය සඳහා දායකත්වය සැපයීම.
පීඨය විසින් පවත්වාගෙන යනු ලබන ළමා සායනය සඳහා මානසික සෞඛ්‍ය පිළිබඳව දායක්තවය ලබාදීම.


දුරකථන අංක - 0112961158
විද්‍යුත් ලිපිනය - medu@kln.ac.lk

## 12.7 වෛද්‍ය ක්ෂුද්‍රජීවී විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ඩබ්.ආර්.පී.එල්.අයි. විජේසූරිය මිය - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*MBBS (Kel'ya), Dip. Med. Micro. (C'bo),MD Med.Micro (C'bo), M.Phil. (Kel'ya)*
වෛද්‍ය සී.එන්. බදනසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*MBBS (S.J'pura), MD (C'bo) Dip. Med. Micro. (C'bo)*
වෛද්‍ය ජී.පී.එස්. ගුණරත්න මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (Ruhuna), Dip. in Med. Micro. (C'bo), MD Med. Micro. (C'bo), M.Phil (S.J'pura)*
වෛද්‍ය ඩබ්.එම්.සී.අයි. ෆොන්සේකා මිය - කථිකාචාර්ය
*MBBS (Kel'ya), Dip. Med. Micro. (C'bo), MD (C'bo)*
වෛද්‍ය ඩී.එන්. වීරකොන් මිය - ආධුනික කථිකාචාර්ය
*MBBS (Perad'ya) Dip. Med. Micro. (C'bo), MD (C'bo)*
වෛද්‍ය කේ.ඒ.සී.සී. ජේමසිරි මිය - ආධුනික කථිකාචාර්ය
*MBBS (S.J'pura), Dip. Med. Micro. (C'bo), MD (C'bo)*

මෙම අධ්‍යයනාංශය මඟින් වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ට පළමුවෙනි, තෙවන හා සිව්වන වසරේ දී ක්ෂුද්‍රජීවී විද්‍යා විෂය සහ ප්‍රතිශක්ති විද්‍යාව ඉගැන්වෙන අතර ඒ සඳහා මෙම අංශය සතුව සිසුන් 50කට එකවර විද්‍යාගාර කටයුතුවල නියැලිය හැකි අංග සම්පූර්ණ විද්‍යාගාරයක් ඇත. තවද ආබාධිතතා අධ්‍යයන අංශයේ කථන සහ ශ්‍රවණවේදය හදාරන විද්‍යාර්ථීන් සඳහා වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ දේශන ද මෙම අංශය මඟින් පවත්වනු ලබයි.

එසේම කොළඹ විශ්වවිද්‍යාලයීය පශ්චාත් වෛද්‍ය ආයතනය මගින් මෙහෙයවනු ලබන වෛද්‍ය ක්ෂුද්‍රජීවී විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා උපාධිය සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස මෙම අධ්‍යයනාංශය කටයුතු කරයි.

දැනට මෙම අංශය මඟින් වෛද්‍ය ක්ෂුද්‍රජීවී විද්‍යාව පිළිබඳ විවිධ පර්යේෂණ සිදු කරනු ලබයි. මෙයට අමතර ව එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව හා ස්වීඩනය යන රටවල ඇතැම් විද්‍යාගාර සමඟ පර්යේෂණ සබඳතා ද පවත්වයි.

මෙම අංශය මගින් රෝගීන් සඳහා රෝග විනිශ්චයට අදාළ සායනික සේවාවන් ලබා දෙයි. තවද මෙම අංශය මඟින් ආසාත්මිකතාවය හා ප්‍රතිශක්තිය ඌන වීම නිසා ඇති වන තත්වයන්ට ප්‍රතිකාර කිරීම ද සිදු කරයි. මෙම දෙපාර්තමේන්තුව ක්ෂුද්‍රජීවී විද්‍යාවට අදාළ රෝග විනිශ්චය සේවාවන් සහ ජල සාම්පල පරීක්ෂාව ද සිදුකරයි.


දුරකථන අංක - 0112961138
විද්‍යුත් ලිපිනය - mmic@kln.ac.lk

## 12.8 වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය එස්.එෆ්. ජයමාන්න මයා - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*MBBS (C'bo), MD (C'bo), MRCP (UK), FRCP (Edin), FCCP*
මහාචාර්ය ඒ.පී. ප්‍රේමවර්ධන මයා - විශ්‍රාමික මහාචාර්ය
*MBBS (Perad'ya), MD (C'bo), MRCP (UK), FRCP (Lond), DPhil (Oxon), FCCP, FNAS (SL)*
මහාචාර්ය බී.ඒ.එච්.ආර්. ප්‍රේමරත්න මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*MBBS (C'bo), MD (C'bo), FRCP (Glasg), FCCP*
මහාචාර්ය ඒ.පී. ද සිල්වා මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*MBBS (NCMC), MD (C'bo), MSc (Oxford)*
මහාචාර්ය යූ.කේ. රණවක මයා - මහාචාර්ය
*MBBS (NCMC), MD (C'bo), MRCP (UK), FRCP (London), FAAN, FAHA, FCCP*
මහාචාර්ය එස්.ටී. ද සිල්වා මිය - මහාචාර්ය
*MBBS (C'bo), MD (C'bo), MRCP (Lond), FRCP (UK), FCCP (SL)*
මහාචාර්ය එම්.ඒ. නිරිඇල්ල මයා - මහාචාර්ය
*MBBS (C'bo), MD (C'bo), MRCP (UK), FRCP (Lond)*
වෛද්‍ය එස්.යූ.බී. දසනායක - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (C'bo), MD (C'bo), MRCP (UK), MRCP (Lond), SCE in Gastroenterology (UK)*

මෙම අධ්‍යයනාංශය මඟින් *M.B.B.S.* පාඨමාලාවේ 3වන වසරේ සිට අවසාන වසර දක්වා වසර තුනක විද්‍යාර්ථීන් සඳහා වෛද්‍ය විද්‍යාව ප්‍රගුණ කෙරෙයි. වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය මඟින් මෙහෙයවනු ලබන *M.D.* පශ්චාත් උපාධි පාඨමාලාව සහ කථනය හා භාෂාව පිළිබඳ උපාධි පාඨමාලාවෙහි ඉගැන්වීමේ කටයුතුවලට ද මෙම අධ්‍යයනාංශය සහභාගි වේ.

මෙම අධ්‍යයනාංශය මඟින් කෙරෙන විවිධ පර්යේෂණ කටයුතු අතර විශේෂ අවධානයක් යොමුව ඇති ක්ෂේත්‍ර වනුයේ, නිවර්තන වෛද්‍ය විද්‍යාව, ආමාශයික ආන්ත්‍රිකවේදය, අක්මාවේදය, ස්නායු වෛද්‍ය විද්‍යාව හා බෝවනරෝගයි. තව ද මෙම අධ්‍යයනාංශය සතු ව පර්යේෂණ හා සේවාවන් සඳහා රසායනාගාර 03ක් ඇති අතර, ඉන් එකක් ආමාශයික හා ආන්ත්‍රික කායික විද්‍යාව සඳහා වෙන් කර ඇත. එම රසායනාගාරය, නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් ආහාර මාර්ගයේ ඉහළ හා පහළ කොටස් පිරික්සීමට හැකි එන්ඩොස්කොපි පරීක්ෂණ, ගලනාලයේ අභ්‍යන්තර පීඩනය මැනීමේ පරීක්ෂණ හා ගලනාලයේ හා ආමාශයේ චලනයන් මැනීමේ පරීක්ෂණ සිදු කිරීමේ පහසුකම්වලින් යුක්ත වේ.

අනෙක් රසායනාගාරය ස්නායු කායික විද්‍යාව සඳහා වෙන් කර ඇත. එය සතුව ද ඉලෙක්ට්‍රොමයෝග්‍රෆි පරීක්ෂණ, ස්නායු ආවේග සම්ප්‍රේෂණ පිළිබඳ පරීක්ෂණ හා ඊ.ඊ.ජී. පරීක්ෂණ සඳහා පහසුකම් ඇත. 2003 වර්ෂයේ දී, රක්තවේද රසායනාගාරයක් ද ස්ථාපනය කරන ලදී. මෙය විශේෂයෙන් ම රතු රුධිරාණු අසාමාන්‍යතා ගවේෂණය සඳහා යොදා ගනු ලැබේ. පර්යේෂණාත්මක කටයුතු මෙන් ම රෝග නිර්ණ කටයුතු ද මෙම රසායනාගාරයෙන් ඉටු කෙරේ.

මෙයට අමතර ව නව යොවුන් වියේ සහ වැඩිහිටි වියේ තැලසීමියා රෝගීන් සඳහා වෙන් වූ දිවයිනේ ප්‍රථම ඒකකය ද රාගම ශික්ෂණ රෝහලට අනුබද්ධ ව විවෘත ව ඇත.

පසුගිය වසර කිහිපය තුළ මෙම අධ්‍යයනාංශය මඟින් නිකුත් කරන ලද පර්යේෂණ වාර්තා අග්‍රගන්‍ය අන්තර්ජාතික සඟරාවන්හි පළ වී ඇති අතර, අන්තර්ජාතික ප්‍රකාශකයන් විසින් නිකුත් කරන ලද විශේෂඥ ඒකක විෂය නිබන්ධන හා ඇතැම් පරිච්ඡේද සඳහා ආචාර්ය මණ්ඩලයේ ඇතැම් සාමාජිකයන් විසින් දායකත්වය ලබා දී ඇත.

## 12.9 ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

වෛද්‍ය බී.ඒ. ද සිල්වා මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*MBBS (NCMC), MD (C'bo), FRCA (London)*
මහාචාර්ය ටී.ඩී. ඩයස් මයා - මහාචාර්ය
*MBBS (C'bo), FRCOG (UK), MD (London), Dip (Fetal Med) UK*
මහාචාර්ය එච්.එම්.ආර්.පී. හේරත් මයා - මහාචාර්ය
*MBBS (C'bo), MD (C'bo) MRCOG (UK)*
මහාචාර්ය ජී.එස්. පද්මදාස මයා - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
*MBBS (C'bo), MD (C'bo), FRCOG (UK)*
ආචාර්ය ඩී.එම්.ඒ.බී. දිසානායක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*BSc. sp. (S.J'pura), Dip in Mgt & Admin, M.Phil (Kel'ya), PhD (Kel'ya)*

ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය මඟින් තෙවන, සිව්වන හා අවසාන වසරවල වෛද්‍ය විද්‍යාර්ථීන් සඳහා ප්‍රසව හා නාරිවේද පාඨමාලාව ප්‍රධාන වශයෙන් පවත්වනු ලැබේ. මීට අමතර ව කොළඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පශ්චාද් උපාධි ආයතනයේ පුහුණු කටයුතු ද සිදු කරනු ලබයි.

මෙම අධ්‍යයනාංශය මඟින් මඳසරුතාව සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාත්මක ප්‍රසව හා නාරිවේදය යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සිදු කරනු ලබයි. මඳසරු භාවයට අදාළ පරීක්ෂා, ප්‍රතිකාර සහ පර්යේෂණ සඳහා පර්යේෂණ රසායනාගාරයක් ආරම්භ කර ඇති අතර, දරු ප්‍රසූතියට පෙර කළලයේ පවතින අසාමාන්‍යතා විනිශ්චය කිරීම සඳහා උප ඒකකයක් ද එම රසායනාගාරයට අනුබද්ධ ව ඇති කිරීමට සැලසුම් කර ඇත. මෙම අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ 24 සහ 25 වාට්ටුවලට සහ නාරිවේද, ප්‍රසව, මඳ සරු හා උපත් පාලන අංශ මඟින් පවත්වනු ලබන බාහිර රෝගී සායන සඳහා ද සිය සේවය ලබා දෙනු ලැබේ.


දුරකථන අංක - 0112958219
විද්‍යුත් ලිපිනය - Obst@kln.ac.lk

## 12.10 ළමාරෝග හා කෞමාරභෘතීය අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය ආර්.ඒ.එන්. ශෝභාවි රන්දෙනි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අංශ ප්‍රධාන)
*MBBS (Kel'ya) ), MD (C'bo)*
මහාචාර්ය ඩී.එස්.ජී. මෙත්තානන්ද මයා - මහාචාර්ය
*MBBS (C'bo), DCH (C'bo), MD (C'bo), DPhil (Oxon), FRCP (Edin), FRCPCH (UK)*
මහාචාර්ය කේ.ඒ.ඩබ්ලිව්. කරුණාසේකර මිය - මහාචාර්ය
*MBBS (Ruhuna), DCH (C'bo), MD (C'bo), M.Med.Sc. (Otago), FRCP (UK)*
වෛද්‍ය සී.එම්.පී. ප්‍රනාන්දු මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (Kel'ya), DCH (C'bo), MD (C'bo), MRCPCH (UK)*
වෛද්‍ය එම්.බී.කේ.සී. දයාසිරි මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (C'bo), DCH (C'bo), MD (C'bo), MPhil (Kel'ya), DCH (Lond), FRCPCH (UK), Dip.Ch.Psy (UK), Dip. UKMP (Liverpool)*
වෛද්‍ය එස්.වී.ටී.එන්.පී. සූරියප්පෙරුම මිය - කථිකාචාර්ය
*MBBS (Kel'ya), MD (C'bo)*
වෛද්‍ය එස්.එස්. වික්‍රමරත්න මිය - කථිකාචාර්ය
*MBBS (C'bo), DCH (C'bo), MD (C'bo)*
වෛද්‍ය ඒ.එස්. අතපත්තු මයා - ආධුනික කථිකාචාර්ය
*MBBS (C'bo), DCH (C'bo),MD (C'bo)*
වෛද්‍ය එච්. කේ. පතිරාජ මයා - ආධුනික කථිකාචාර්ය
*MBBS (Kel'ya)*

මෙම අධ්‍යයනාංශය මගින් වෛද්‍ය උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධිය හදාරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ළමාරෝග හා කෞමාරභෘතීය පාඨමාලාව ඉගැන්වේ. අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලය ළමාරෝග හා ළදරු ප්‍රතිකාර පිළිබඳ විශේෂඥයන්ගෙන් සමන්විත වේ. රාගම ශික්ෂණ රෝහලේ පිහිටා ඇති ළමාරෝග ඒකකයට ඇඳන් හැටඅටකින් සමන්විත වාට්ටුවක්, ඇඳන් හයකින් සමන්විත ළමා දැඩිසත්කාර ඒකකයක්, ඇඳන් අටකින් සමන්විත ළදරු දැඩිසත්කාර ඒකකයක්, ඇඳන් අටකින් සමන්විත විශේෂ ළදරු ප්‍රතිකාර ඒකකයක්, ළමා තැලිසීමියා ඒකකයක් සහ ළමා හිංසනයට ලක්වූ ළමුන් පුනරුත්ථාපන ඒකකයක් ඇතුළත් වේ. නේවාසික රෝගීන්ට ප්‍රතිකාර ලබා දීමට අමතර ව සෑම සතියක ම බාහිර රෝගි ළමාරෝග සායන පහක් හා ළදරු සායනයක් පැවැත් වේ.

වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සඳහා වන පාඨමාලව දේශන, නිබන්ධන අධ්‍යනය, කුසලතා පුහුණු ඒකකයෙන් ලබන පුහුණුව සහ සායනික අනුයුක්ත කිරීම්වලින් ලබාගන්නා සායනික පුහුණුවකින් යුක්ත වේ. මෙම පාඨමාලාවට තෙවැනි සහ සිව්වන වසරවල දී පැවැත්වෙන සායනික පුහුණු සැසි දෙකක් ද, අවසාන වසරේ දී විශ්වවිද්‍යාල ළමා රෝග ඒකකයේ ලබාදෙන දෙමසක සායනික පුහුණුවක් ද ඇතුළත් වේ. සායනික පුහුණුවේ දී රෝගීන්ගේ සායනික ඉතිහාසය ලබා ගැනීම, රෝගීන් පරීක්ෂාව හා ප්‍රතිකාර විධි සහ ක්‍රම ස්වභාවයන් පිළිබඳ ව සිසුන්ට පුහුණුව ලබා දෙයි.

මීට අමතර ව කථන හා භාෂා චිකිත්සක පුහුණු අධ්‍යනාංශයේ සිසුන් සඳහා දේශන ලබා දීම ද ළමාරෝග අධ්‍යයනාංශය මගින් සිදු කෙරේ. ළමා රෝග පිළිබඳ පශ්චාත් උපාධි හදාරන වෛද්‍යවරුන්ට සායනික පුහුණුව ලබා දීම ද, දර්ශනපති සහ දර්ශන විශාරද උපාධිවල නිබන්ධන අධීක්ෂණය ද මෙම අධ්‍යනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය මගින් සිදුකෙරේ. විදේශ වෛද්‍ය විද්‍යාලවල ඉගෙනුම ලබන වෛද්‍ය සිසුන්ට වෛකල්පිත සායනික පුහුණුව ලබා දීම ද මෙම අධ්‍යයනාංශය මගින් සිදු කෙරේ.

අවසාන MBBS විභාගය පැවැත්වීමට අමතරව 3 සහ 4 වසරවල පැවැත්වෙන විභාග සඳහා ද කථන හා භාෂා චිකිත්සක සිසුන්ගේ විභාග සඳහා ද මෙම අධ්‍යනාංශයේ කාර්ය මණ්ඩලය විසින්

දායකත්වය සපයනු ලැබේ. මීට අමතර ව කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වනු ලබන වෛද්‍ය විශාරද (ළමා රෝග) සහ ළමා සෞඛ්‍යය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව යන පාඨමාලා සඳහා ද දායකත්වය සපයනු ලැබේ. තවද අනෙකුත් විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨයන්හි අවසන් වසරේ පැවැත්වෙන සායනික විභාග කටයුතුවලට පරීක්ෂකවරු ලෙස ද සහභාගී වෙති.

ශිෂ්‍ය අධ්‍යයන කටයුතු හා සායනික කටයුතුවලට අමතර ව උසස් මට්ටමේ විද්‍යාත්මක පර්යේෂණ සඳහා ප්‍රවීණතාවය දක්වන අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් ද මෙම අධ්‍යනාංශය සමන්විත වේ. ආහාර මාර්ග පද්ධතිය ආශ්‍රිත රෝග, අක්මාව ආශ්‍රිත රෝග, තැලසීමියාව, රතු රුධිර සෛල සංකූලතා, ඇදුම, ළමා වර්ධනය, ළමා හිංසනය, පෝෂණය, මව්කිරි ප්‍රවර්ධනය, අන්තරාල පද්ධතිය ආශ්‍රිත රෝග, හා ළදරු රෝග මෙම අධ්‍යනාංශයේ ප්‍රමුඛ පර්යේෂණ මාතෘකා අතර වේ. මෙම පර්යේෂණ ව්‍යාපෘති වලින් බහුතරයක් ලොව ප්‍රමුඛපෙළේ විද්‍යාත්මක සඟරා වන Nature Reviews, Gastroenterology and Hepatology, Nature Communication, Archives of Diseases in Childhood, Blood, Hematologica, Paediatric Gastroenterology and Hepatology, Journal of Tropical Pediatrics යන සගරාවල පළවී ඇත. අධ්‍යයන අංශයේ ආචාර්ය මණ්ඩලය මෙම පර්යේෂණ ව්‍යාපෘති සඳහා ජනාධිපති සම්මාන ඇතුළු සම්මාන රැසක් දිනාගෙන ඇත.

දුරකථන අංකය - 0112961116

## 12.11 පරපෝෂවේද අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

වෛද්‍ය එන්.එච්. මනම්පේරි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*MBBS (Kel'ya), Ph.D. (C'bo), Dip. Med. Micro. (C'bo)*
මහාචාර්ය එන්.ආර්. ද සිල්වා මිය - විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*MBBS (C'bo), M.Sc. (Lond), MD (C'bo)* **(උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය)**
මහාචාර්ය එන්.කේ. ගුණවර්ධන මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*MBBS (Ruhuna), Ph.D. (Nagasaki)*
මහාචාර්ය ටී.ජී.ඒ.එන්. චන්ද්‍රසේන මිය - මහාචාර්ය
*MBBS (C'bo), Dip. in Med. Micro. (C'bo), MD (C'bo)*
මහාචාර්ය පී.ඒ.ඩී.එච්.එන්. ගුණතිලක මයා - මහාචාර්ය
*B.Sc. (Kel'ya), Ph.D. (Kel'ya), MI Biol (Sri Lanka)*

පරපෝෂවේද අධ්‍යයනාංශයේ ප්‍රධාන කාර්යභාරයන් වන්නේ ඉගැන්වීම්, පුහුණු කිරීම් පර්යේෂණ හා රෝග නිර්ණයයි.

වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සඳහා පවත්වන පරපෝෂවේද විෂයය ඉගැන්වීමට අමතර ව මෙම අධ්‍යයනාංශය මඟින් වෛද්‍ය පරපෝෂවේදය කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි ආයතනයේ පාඨමාලා හදාරන විද්‍යාර්ථීන් සඳහා දේශන පැවැත්වීම හා පර්යේෂණ ව්‍යාපෘති වැඩසටහන් මෙහෙයවීම ද සිදු කෙරේ.

අධ්‍යයනාංශය මඟින් සිදු කරනු ලබන රෝග නිර්ණය කිරීමේ පරීක්ෂණ අතර රුධිර සාම්පල මැලේරියා හා බරවා රෝග පරපෝෂිතයන් සඳහාත්, මළ සාම්පල ආන්ත්‍රික පරපෝෂිතයන් සඳහාත්, ලිශ්මානියාව හා රිකට්සියා රෝග නිර්ණ පරීක්ෂණ දෛනිකව සිදු කෙරේ. මීට අමතර ව පණුවන්, සර්පයන් හා වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ ආත්‍රපෝඩාවන් හඳුනා ගැනීම ද මෙම අංශය මඟින් විශේෂ ඉල්ලීමක් ලැබුණු විට ඉටු කරනු ලබයි.

ආචාර්යවරුන් විසින් දැනට කරගෙන යනු ලබන පර්යේෂණ ප්‍රධාන වශයෙන් පණු රෝග, බරවා, මැලේරියා, ටොක්සොප්ලස්මාව, ලිශ්මානියාව ඩෙංගු හා රිකට්සියා රෝග වාහකයන් පිළිබඳව හා සර්ප දෂ්ටනය පිළිබඳ ව වේ.


දුරකථන අංක - 0112961160
විද්‍යුත් ලිපිනය - para@kln.ac.lk

## 12.12 ව්‍යාධිවේද අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

වෛද්‍ය ඊ.එස්.ආර්. ද සිල්වා මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II - **(අංශ ප්‍රධාන)**
*M.B.B.S. (S.J'pura), D. Path. (C'bo), MD Chemical Pathology (C'bo)*
මහාචාර්ය එස්.ජේ. ද එස්. හේවාවිසෙන්ති මිය - විශ්‍රාම ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*M.B.B.S. (C'bo), Dip. Path. (C'bo), MD Histopathology (C'bo)*
මහාචාර්ය එච්.එස්.ඒ. විලියම්ස් මිය - මහාචාර්ය
*M.B.B.S. (NCMC), Dip. Path (C'bo), MD Haematology (C'bo), FRC Path (UK), FCCP*
මහාචාර්ය බී.ඒ.ජී.ජී. මහේන්ද්‍ර මිය - මහාචාර්ය
*M.B.B.S. (C'bo), Dip. Path (C'bo), MD Histopathology (C'bo)*
වෛද්‍ය ටී.පී.එම්. බෝපාගොඩ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*M.B.B.S. (C'bo), Dip. Path (C'bo), MD Histopathology (C'bo)*
වෛද්‍ය එස්.කේ. ලියනගේ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*M.B.B.S. (Kel'ya), Dip. Path (C'bo), MD Histopathology (C'bo)*
වෛද්‍ය එම්.ඊ.සී. මුහන්දිරම් මිය - ආධුනික කථිකාචාර්ය
*M.B.B.S. (C'bo), Dip.path (C'bo)*

මෙම අධ්‍යයන අංශය මගින් වෛද්‍ය විද්‍යාර්ථීන්හට අවුරුදු දෙකක ව්‍යාධිවේදී පාඨමාලාවක් ඉගැන්වෙයි. සායනික අංශ හා සැලසුම් සහගත සම්බන්ධතාවකින් යුතු ව ක්‍රියාත්මක කරන මෙම පාඨමාලාව සඳහා නවීනත ම විද්‍යාගාර පහසුකම් උපයෝගී කරගනී.

කොළඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය මගින් මෙහෙයවනු ලබන ව්‍යාධිවේදය සහ සායනික රක්තව්‍යාධිවේදය සඳහා වන ඩිප්ලෝමා පාඨමාලාව සහ එම්.ඩී. පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස මෙම අධ්‍යයනාංශය පිළිගෙන ඇත.

මෙහි ආචාර්ය මණ්ඩලයේ පර්යේෂණ කටයුතුවල දී ආන්ත්‍රික ප්‍රදාහ තත්ත්වයන් වන Chronic Inflammatory Bowel Disease **අක්මා** ප්‍රදාහ තත්ත්වයන් වන Chronic hepatitis, පිළිබඳව ද පියයුරු පිළිකා සහ ගැබ් ගෙළ සෛල සහ රක්ත ව්‍යාධිවේදය යන **ක්ෂේත්‍ර** කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කෙරේ.

මෙම අධ්‍යයන අංශය උතුරු කොළඹ ශික්ෂණ රෝහලට හා එයට සම්බන්ධ අනෙකුත් ශික්ෂණ රෝහල්වලට **පටක** ව්‍යාධිවේදය හා රක්තව්‍යාධිවේද විද්‍යාව පිළිබඳ උපදේශාත්මක සේවා ද සපයනු ලැබේ.

මෙම අංශයට අන්තර් ජාතික පරමාණු බලශක්ති ඒජන්සිය මගින් පිරිනමන ලද විශේෂ රසායනාගාරයක් ද ඇත. එමගින් විකිරණවලින් උපදවන සෛල න්‍යෂ්ඨික ආපදා හඳුනාගැනීමට හැකි ය.


දුරකථන අංක - 0112958039
විද්‍යුත් ලිපිනය - path@kln.ac.lk

## 12.13 භිෂග්වේදය අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

වෛද්‍ය එස්.ඒ.එෆ්. කුරුකුලසූරිය මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (**අංශ ප්‍රධාන**)
*MBBS (C'bo), MD (C'bo)*
මහාචාර්ය එච්.ජේ. ද සිල්වා මයා - විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*MBBS (NCMC), DPhil (Oxon), FRCP (Lon)*
මහාචාර්ය ඒ.එස්. දසනායක මයා - මහාචාර්ය
*MBBS (C'bo), MD (C'bo), FCCP*
මහාචාර්ය සී.ඩී. රණසිංහ මයා - මහාචාර්ය
*BSc (Pharmacology, Lon), MBBS (Lon), MRCP (UK), DTM & H (Lond) FRCP (Lon), FCCP*
මහාචාර්ය කේ.සී.ඩී. මෙත්තානන්ද මිය - මහාචාර්ය
*MBBS (Perad'ya), MD (C'bo), MRCP (UK), PhD*
වෛද්‍ය ඒ.යූ. මැදගෙදර මිය - ආධුනික කථිකාචාර්ය
*MBBS (Kel'ya)*
වෛද්‍ය කේ.ආර්.කේ. ප්‍රනාන්දු මයා - ආධුනික කථිකාචාර්ය
*MBBS (Kel'ya)*

කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීමෙන් වසර 2ක් ඇවෑමෙන්, එනම්, 1993 දී භිෂග්වේද අධ්‍යයනාංශයේ ඉගැන්වීම් කටයුතු ආරම්භ කරන ලදි. අධ්‍යයනාංශයේ ප්‍රධාන අරමුණ වනුයේ තෙවන හා සිව්වන වසරවල වෛද්‍ය උපාධි අපේක්ෂකයින්ට ඖෂධ හා ඒවායේ භාවිතය පිළිබඳ මනා දැනුමක් ලබා දීම ය. එය එක් එක් පද්ධති-විශේෂිත මොඩියුල පෙළ භාර අධ්‍යයනාංශයේ එක් එක් ආචාර්යවරුන් විසින් සිදු කරනු ලබයි. මෙහි ආරම්භය සනිටුහන් කරමින් හඳුන්වා දීමේ මොඩියුලයට මූලික මූලධර්මවලට අමතර ව සාමාන්‍ය භිෂග්වේදයට අදාළ ඇතැම් මාතෘකා ද ඇතුළත් කර ඇත.

2005 වර්ෂයේ දී වෛද්‍ය පීඨය තුළ සායනික පරීක්ෂණ ඒකකය ස්ථාපිත කිරීමෙන් පීඨය තුළත්, ඉන් පිටතත් සායනික පරීක්ෂණවලට මහඟු පිටුවහලක් ලැබිණ. දැනට මෙම ඒකකය භිෂග්වේදය අංශය තුළ පවත්වාගෙන යන අතර, බොහොමයක් ජාතික හා අන්තර්ජාතික පරීක්ෂණ සඳහා දායකත්වය සපයා ඇත. අධ්‍යයනාංශය මඟින් දැනට අවධානය යොමු කර ඇති පරීක්ෂණ ක්ෂේත්‍ර අතරට සායනික පරීක්ෂණ ක්‍රමවේදය, වියපත් වීම සහ විමනස්‍යය (Dementia), ස්වසන චිකිත්සක රෝග, මත්පැන් ආශ්‍රිත යාකෘතික රෝගල ආඝාතය (Stroke) සම්බන්ධ සායනික පරීක්ෂණ සහ වස හා විෂ විද්‍යාව ආදිය ඇතුළත් වේ. මීට අමතර ව වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය හා උතුරු කොළඹ ශික්ෂණ රෝහල සම්බන්ධ කර ගනිමින් අන්තර් අධ්‍යයනාංශ සායනික සමීක්ෂණ කටයුතු ද මෙම අධ්‍යයනාංශය මඟින් මෙහෙයවනු ලැබේ.

දුරකථන අංක - 0112961244
විද්‍යුත් ලිපිනය - phar@kln.ac.lk

## 12.14 භෞතවේදය අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

වෛද්‍ය ඩබ්ලිව්.එල්. දිලේෂා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*MBBS (Kel'ya), MD (C'bo)*
මහාචාර්ය එන්.එම්. දේවනාරායන මිය - විශ්‍රාමික මහාචාර්ය
*MBBS (Ruhuna), DM (Kel'ya), PhD (Amsterdam)*
මහාචාර්ය ඩී.සී. ද සිල්වා මෙය - මහාචාර්ය
*MBChB (Aberd), MRCP (UK)*
මහාචාර්ය කේ. මැදගොඩ මයා - මහාචාර්ය
*MBBS (C'bo), MD (C'bo), MRCP (UK)*
වෛද්‍ය ඩී.සී. කොට්ටහච්චි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (Kel'ya), MD (C'bo)*
වෛද්‍ය ඩී.ටී.ඩී. වර්ණකුලසූරිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II (අධ්‍යයන නිවාඩු)
*MBBS (Kel'ya), MPhil (Kel'ya)*
වෛද්‍ය එච්.පී.ඩී.පී. ලූක් - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*MBBS (Kel'ya), MD (C'bo)*

මෙම අධ්‍යයනාංශය මඟින් වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සඳහා භෞතවේදය පාඨමාලාව ඉගැන්වෙන අතර, එහි දී සාම්ප්‍රදායික උපදේශාත්මක දේශන වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය නව ප්‍රවේශයකට වැඩි නැඹුරුතාවක් දැක්වේ. එහි මූලික පියවරක් ලෙස භෞතවේදය විෂයයට අදාළ බොහෝ දේශන විද්‍යාර්ථීන්ගේ පරිශීලනය පිණිස වෛද්‍ය පීඨයේ අභ්‍යන්තර පරිගණක ජාලය ඔස්සේ ලබා ගැනීමට ඉඩ සලසා ඇත. අධ්‍යයනාංශය සතු නවීන උපකරණ සහිත විද්‍යාගාරයෙහි ඇති ඊ. සී. ජී. යන්ත්‍ර, ශ්‍රවණමාන හා ශ්වසනමාන යනාදිය පිළිබඳ ව විද්‍යාර්ථීන්ට පුළුල් අත්දැකීමක් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.

MBBS පාඨමාලාවට අමතර ව, ආබාධිතතා අධ්‍යයනාංශය මඟින් මෙහෙයවනු ලබන කථන හා ශ්‍රව්‍ය විද්‍යා උපාධි වැඩ සටහන සහ වෛද්‍ය පීඨය මඟින් මෙහෙයවනු ලබන ප්‍රජා සෞඛ්‍ය සහතිකපත්‍ර පාඨමාලාව සඳහා ද මෙම අධ්‍යයනාංශය දායකත්වය සපයයි.

මෙම අධ්‍යයනාංශයේ ප්‍රධාන පර්යේෂණ ක්ෂේත්‍රයන් ලෙස ආහාර මාර්ගය, ශ්වසන මාර්ගය හා ජාන විද්‍යාව පාරිසරික භෞතවේද විද්‍යාව හා වෛද්‍ය අධ්‍යාපනය හැඳින්විය හැකි ය. මෙම අධ්‍යයනාංශයට අනුබද්ධ ව ස්ථාපනය කර ඇති විද්‍යාගාරය මඟින් ආහාර මාර්ගය හා ස්වසන පද්ධතිය ආශ්‍රිත රෝග විනිශ්චයන් පිළිබඳ ව විශේෂඥ සේවා සැපයෙයි සහ නිද්‍රා පරීක්ෂණ විද්‍යාගාරය.මෙම අධ්‍යයනාංශය මඟින් විවිධ පරීක්ෂණ පහසුකම් හා වෛද්‍ය උපදෙස් ලබා දීමෙන් ද (උදා: ජාන විද්‍යාව, අන්තරාසර්ග රෝග හා ස්වතන්ත්‍ර ස්නායු පරීක්ෂණ මඟින්) උතුරු කොළඹ ශික්ෂණ රෝහලට සේවාවන් සපයනු ලැබේ.

දුරකථන අංක - 0112961128
විද්‍යුත් ලිපිනය - phyl@kln.ac.lk

## 12.15 මනෝ වෛද්‍ය අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

මහාචාර්ය ඩබ්.එම්.එම්.එල්. චන්‍ද්‍රදාස මයා - මහාචාර්ය **(අංශ ප්‍රධාන)**
*M.B.B.S. (C'bo), MD.Psych (C'bo), Child Psych AdvCert (Australia), MRCPsych (UK)*
මහාචාර්ය කේ.ඒ.එල්.ඒ. කුරුප්පුආරච්චි මයා - විශ්‍රාපක ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*M.B.B.S. (Perad'ya), MD.Psych (C'bo), FRCPsych (UK), FSLCOP*
මහාචාර්ය එස්.එස්. විලියම්ස් මයා - මහාචාර්ය
*M.B.B.S. (Jaffna), M.Phil. (Kel'ya), MD.Psych (C'bo), MRCPsych (UK), FSLCOP*
වෛද්‍ය සී.ඒ. විජේසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*M.B.B.S. (C'bo), MD.Psych (C'bo), MRCPsych (UK)*
වෛද්‍ය ඩබ්.කේ.ටී.ආර්. ප්‍රනාන්දු මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*M.B.B.S. (Kel'ya), MD.Psych (C'bo)*
වෛද්‍ය ඒ.කේ.ඒ.බී. බැම්මිණිවත්ත මයා - ආධුනික කථිකාචාර්ය
*M.B.B.S. (Perad'ya) , MD.Psych (C'bo)*

මනෝ වෛද්‍ය අධ්‍යයනාංශය පළමු වසරේ සිට සිව්වන වසර දක්වා විද්‍යාර්ථීන් සඳහා චර්යාධර්ම, මානසික සෞඛ්‍යය සහ ආචාරධර්ම පාඨමාලාව ඉගැන්වීමට දායක වන අතර, තෙවන වසරේ සිට අවසාන වසර දක්වා මනෝ වෛද්‍ය පාඨමාලාව ඉගැන්වීම සිදු කරයි.

මීට අමතර ව මෙම අධ්‍යයනාංශය කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පශ්චාද් උපාධි ආයතනය මඟින් මෙහෙයවනු ලබන මනෝ වෛද්‍ය පශ්චාද් උපාධිය සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරන අතර, එම ආයතනය විසින් මෙහෙයවන කායික වෛද්‍ය සහ පවුල් වෛද්‍ය පශ්චාද් උපාධි පාඨමාලාවල මනෝ වෛද්‍ය කෙටි පාඨමාලාව හැදෑරිය හැකි මධ්‍යස්ථානයක් ලෙස ද කටයුතු කරයි.

කථනය, භාෂාව සහ ශ්‍රවණවේදය සහ වෘත්තීය චිකිත්සක පිළිබඳ ව වෛද්‍ය පීඨය මඟින් පවත්වනු ලබන විද්‍යාවේදී උපාධි පාඨමාලාවේ ඉගැන්වීමේ කටයුතුවලට ද මෙම අධ්‍යයනාංශයේ දායකත්වය සැපයේ.

ඉහත සඳහන් ඉගැන්වීම් හා පුහුණු කටයුතුවලට අමතර ව මෙම අධ්‍යයනාංශය පර්යේෂණ කටයුතුවල ද නියැලෙන අතර, ඒ අතරින් මත්පැන් හා මත්ද්‍රව්‍ය ආශ්‍රිත මානසික ගැටලු සිය දිවි හානි කර ගැනීම්, ළමාවිය ආශ්‍රිත මානසික ගැටලු සංස්කෘතිය හා බැඳුණු මානසික තත්ත්ව, වැඩිහිටි මානසික සුවය, මරණාසන්න අත්දැකීම් පිළිබඳ පර්යේෂණ කටයුතු ප්‍රධාන තැනක් ගනී.

මෙම සියලු කටයුතුවලට සමගාමී ව මනෝ වෛද්‍ය අධ්‍යයනාංශය මඟින් සතියකට හතර වාරයක් උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ බාහිර රෝගී සායන පවත්වනු ලබන අතර, එම රෝහලේ 28 සහ 29 වාට්ටුවල නේවාසික ප්‍රතිකාර පවත්වාගෙන යනු ලැබේ. ළමාවියේ සිට වයෝවෘද්ධ විය දක්වා ඇති වන විවිධ මානසික තත්ත්ව සඳහා මෙම අංශය මඟින් ප්‍රතිකාර කරනු ලැබේ. ඒ සඳහා ඖෂධ ප්‍රතිකර්මවලට අමතර ව මනෝ චිකිත්සක ප්‍රතිකාර ක්‍රම ද යොදාගනු ලැබේ. සෑම මසක ම රෝගීන් දහස් ගණනකට අවශ්‍ය ප්‍රතිකාර ලබා දෙනු ලැබේ.

දුරකථන අංකය - 011 2961115
අභ්‍යන්තර අංකය - 115

## 12.16 මහජන සෞඛ්‍ය අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

වෛද්‍ය කේ.එම්.එන්. පෙරේරා මිය - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*MBBS (Kel'ya), MSc (C'bo), MD (C'bo)*
මහාචාර්ය ඒ.ආර්. වික්‍රමසිංහ මයා - විශ්‍රාමික ජ්‍යෂ්ඨ මහාචාර්ය
*MBBS (C'bo), MPH (Tulane), PhD (Tulane), PhD (LSUMC)*
මහාචාර්ය එච්.ටී.සී.එස්. අබේසේන මයා - ජ්‍යෂ්ඨ මහාචාර්ය (සේවයෙන් නිදහස්කර ඇත)
*MBBS (C'bo), MSc (C'bo), MD (C'bo), BA (Rome), MA (Kel'ya), MA (C'bo), PgDip.Stat (J'pura)*
මහාචාර්ය කේ.ටී.ඒ.ඒ. කස්තුරිරත්න මිය - මහාචාර්ය
*MBBS (Kel'ya), MSc (C'bo), MD (C'bo)*
වෛද්‍ය ඒ.ඒ.එල්.කේ. ආතාවුද මිය - ජ්‍යෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (J'pura), MPH (Kel'ya), PhD (Auckland)*
වෛද්‍ය ටී.සී. පන්නල - ආධුනික කථිකාචාර්ය
*MBBS (Kel'ya), MSc (C'bo)*

මෙම අධ්‍යයනාංශය මගින් වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ට මහජන සෞඛ්‍ය/ප්‍රජා වෛද්‍ය විද්‍යාව උගන්වනු ලබයි. අධ්‍යයන කටයුතු සිදු වන්නේ පාඨමාලාවේ මුල් සිව් වසර තුළ දී ය. මෙම විෂයේ විශේෂ ලක්ෂණ වන්නේ ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘතියක් සහ වසරක් පුරා තෝරාගත් ප්‍රජාවක සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ශිෂ්‍යයන් මූලිකත්වය ගන්නා ප්‍රජා මූලික අධ්‍යයන වැඩ සටහනක් ඇතුළත් වීමයි.

මෙයට අමතර ව මෙම අධ්‍යයනාංශය කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ වෛද්‍ය විශාරද (ප්‍රජා වෛද්‍ය) පශ්චාත් උපාධි අපේක්ෂකයන්ට පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියා කරයි. ආචාර්ය මණ්ඩලය පර්යේෂණාත්මක පශ්චාත් උපාධි අධීක්ෂණ කටයුතුවල නිරත වෙයි.

මෙම අධ්‍යයනාංශය මගින් මහජන සෞඛ්‍ය විද්‍යාපති උපාධි පාඨමාලාවක් ද පවත්වයි. පීඨය මගින් පවත්වන භාෂා හා කථන සහ ශ්‍රවණ විද්‍යා, වෘත්තීය චිකිත්සක සහ භෞත චිකිත්සක විද්‍යාවේදී උපාධි වැඩසටහන්වල ඉගැන්වීම් කටයුතු සඳහා ද ආචාර්ය මණ්ඩලය දායක වෙයි.

මෙම අධ්‍යයනාංශයේ පර්යේෂණ කටයුතු ප්‍රධාන වශයෙන් ම යොමු වී ඇත්තේ බෝනොවන රෝග, යෞවන හා ප්‍රජනක සෞඛ්‍ය, වෘත්තීමය සෞඛ්‍ය, සෞඛ්‍ය ප්‍රවර්ධනය, ප්‍රජාව බල ගැන්වීම, මහජන සෞඛ්‍ය කෙරෙහි කර්මාන්තකරුවන්ගේ බලපෑම්, නිවර්තන කලාපීය රෝග, සෞඛ්‍ය ආර්ථික විද්‍යාව සහ සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවය ආශ්‍රිත ගැටලු යන විෂයයන් කෙරෙහිය.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 0112961140 |
| විද්‍යුත් ලිපිනය | - | publichealth@kln.ac.lk |

## 12.17 ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

වෛද්‍ය බී.එන්.එල්. මුණසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I(**අංශ ප්‍රධාන**)
*MBBS (Kel'ya), MS (C'bo), MRCSEd*
මහාචාර්ය පී.සී. චන්ද්‍රසිංහ මයා - විශ්‍රාමික මහාචාර්ය
*MBBS (Kel'ya), MD (C'bo), PhD (Imp.Lon) MRCS (Eng), MRCSEd, FHEA (UK)*
මහාචාර්ය ආර්.සී. සිරිවර්ධන මයා - මහාචාර්ය
*MBBS (C'bo), MS (C'bo), MRCS (Eng)*
වෛද්‍ය එම්.බී. ගුණතිලක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (C'bo), MD (Anaes) (C'bo), MRCA (UK)*
වෛද්‍ය එස්. කේ. කුමාරගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (C'bo), MS (C'bo), FRCS (Ed)*
වෛද්‍ය ඩබ්.එල්.ඒ.ඩී.ඒ. ප්‍රසන්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (C'bo), MD (C'bo), MRCSEd*
වෛද්‍ය එම්.එස්.බී. තිලකරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*MBBS (C'bo), MD (C'bo), MRCSEd*
වෛද්‍ය එම්.ඩී.පී. පින්ටෝ මයා - කථිකාචාර්ය
*MBBS (Kel'ya), MD (C'bo), MRCS (Glasg)*

මෙම අධ්‍යයනාංශය, උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුන්ගේ සහය ද සහිතව වෛද්‍ය විද්‍යා උපාධි අපේක්ෂකයන්ට ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මනා පුහුණුවක් ලබා දෙන අතර, ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි සඳහා වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයට ද සේවාවන් සපයයි. වසරකට වෛද්‍ය සිසුන් 180-200 කට ආසන්න ප්‍රමාණයක් ද 20-30 පමණ පශ්චාත් උපාධි අපේක්ෂකයන් ප්‍රමාණයක් ද අප අංශය විසින් පුහුණු කරනු ලැබේ. තව ද මෙම අධ්‍යයනාංශය සතු ආමාශය හා අන්ත්‍රය ආශ්‍රිත එන්ඩොස්කොපි ඒකකය, වෛද්‍ය උපාධි ආයතනය මඟින් පිළිගෙන ඇති එන්ඩොස්කොපි පුහුණු ඒකක දෙකෙන් එකකි. මෙම අංශය වාට්ටු අංක 41 හා 42 මඟින් උතුරු කොළඹ ශික්ෂණ රෝහලට නේවාසික සේවාවන් සපයන අතර, සතියකට අට වතාවක් බාහිර රෝගී සායන පවත්වයි.

ලැපරස්කෝපය මඟින් පිත්තාශය ඉවත් කිරීම, රෝග විනිශ්චය හා ප්‍රතිකාර සඳහා එන්ඩොස්කෝපය භාවිතය, ආපාන ගුද කපාට පිළිසකර කිරීම සහ ආන්ත්‍ර ප්‍රදාහ තත්ත්වයන් සඳහා කෙරෙන ශල්‍යකර්ම, මහාන්ත්‍රය ආශ්‍රිත පිළිකා හා අක්මාව ආශ්‍රිත පිළිකා හා අක්මා බද්ධ කිරීම, රුධිර වාහිනී ආශ්‍රිත ශල්‍යකර්ම, වකුගඩු බද්ධ කිරීම, තයිරොයිඩ් ග්‍රන්ථි ඇතුළු අන්තරාසර්ග ග්‍රන්ථිවල ශල්‍යකර්ම, පියයුරුවල ආපදා හා පිළිකා යන ක්ෂේත්‍රයන් ගැන වෛද්‍ය සිසුන්ට වෛකල්පික සායනික පුහුණුව ලබා දීමට ද මෙම අධ්‍යයනාංශයේ ආචාර්යවරු නිපුණතාවයක් හා ප්‍රවීණතාවයක් දක්වයි.

මෙම අධ්‍යයනාංශය නිර්නල ග්‍රන්ථි ආශ්‍රිත ශල්‍යකර්මයන් (තයිරොයිඩ්/ පැරාතයිරොයිඩ්/ අධිවෘක්ක) සඳහා පිළිගත් ඒකකයක් වන අතර පියයුරු පිළිකා ආශ්‍රිතව පියයුරු සංරක්ෂණය හා ප්‍රතිනිර්මාණය යන නවතම ශල්‍යකර්ම ක්‍රමයන් උපයෝගී කර ගැනීම ද සිදුවේ. එමෙන්ම මෙම අංශයේ විශේෂඥ වෛද්‍යවරුන් කණ්ඩායමක් විසින් අක්මා බද්ධ කිරීමේ ඒකකයක් පවත්වාගෙන යනු ලබන අතර එය රට ම පිළිගත් ඒකකයක් බවට පත්වී ඇත.

මෙම අධ්‍යයනාංශයේ සිදු කරනු ලබන පර්යේෂණ ක්ෂේත්‍ර අතර ආන්ත්‍රික චලන, ආපන ගුද පීඩන, මළබද්ධ, මහාන්ත්‍රික හා අධෝමර්ගික පිළිකා, ආන්ත්‍රික ප්‍රදාහ තත්ත්වයන් හා තයිරොයිඩ්, අක්මාව හා පිත්ත නාල පද්ධතිය, අග්න්‍යාශය සහ පැරාතයිරොයිඩ් ග්‍රන්ථීන් හි රෝග යන විෂයයන්

ප්‍රධාන ස්ථානයක් ගනියි. මෙම අධ්‍යනාංශය මගින් සිදු කරන ලද පර්යේෂණ අතර මහාන්ත්‍රික හා අධෝමාර්ග සහ අන්තරාසර්ග ග්‍රන්ථි ආශ්‍රිත රෝග, පියයුරු පිළිකා පිළිබඳ ව ලියවුණු පර්යේෂණ හා ප්‍රකාශන ප්‍රධාන තැනක් උසුලයි.

# පරිගණක හා තාක්ෂණ පීඨය



# පරිගණක හා තාක්ෂණ පීඨය

## පීඨාධිපති, අධ්‍යයනාංශ ප්‍රධානීන් සහ පරිපාලන නිලධාරී



ආචාර්ය චම්ලි පුෂ්පකුමාර මයා
පීඨාධිපති, පරිගණක හා තාක්ෂණ පීඨය



ආචාර්ය ලාලිත ලියනගේ මයා
අංශ ප්‍රධාන
ව්‍යවහාරික පරිගණන අධ්‍යයනාංශය



ආචාර්ය කේ.පී.එච්.ඩී. වීරසිංහ මයා
අංශ ප්‍රධාන
පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය



ආචාර්ය එස්.ආර්. ලියනගේ මයා
අංශ ප්‍රධාන
මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයනාංශය



එන්.එන්. කන්දෙවත්ත මයා
වැඩබලන සහකාර ලේඛකාධිකාරී
පරිගණක හා තාක්ෂණ පීඨය

# 13. පරිගණක හා තාක්ෂණ පීඨය

**පීඨාධිපති**
ආචාර්ය චම්ලි පුෂ්පකුමාර මයා
*B.Sc. (Special) (Kel'ya), PhD (Sheffield Hallam,UK)*

**වැඩබලන සහකාර ලේඛකාධිකාරී**
එන්.එන්. කන්දෙවත්ත මයා

**අධ්‍යක්ෂ - පරිගණක හා තාක්ෂණ සඳහා කර්මාන්ත අන්තර් සම්බන්ධතා ඒකකය (IIC*f*CT)**
ආචාර්ය පී.ඩබ්ලිව්. සමරසේකර මයා
*B.Sc. (Special) (C'bo), Ph.D. (USA)*

**අධ්‍යක්ෂ - තාක්ෂණ අධ්‍යාපනයේ විශිෂ්ඨතාවය සඳහා වූ ඒකකය (CETE)**
ආචාර්ය ලාලිත ලියනගේ මයා
*B.Sc. (Special) (Perad'ya), MSc (Mississippi, USA), Ph.D. (Mississippi, USA)*

**අධ්‍යක්ෂ** - Director/Center for Advanced Materials and Smart Manufacturing **(CAMSM)**
ආචාර්ය අයි.ඩබ්ලිව්. සිරිවර්ධන මිය
*B.Sc. (Chemistry) Hons (C'bo), M.Sc. (Iowa,USA), MBA (PIM),Ph.D. (C'bo)*

2015 දෙසැම්බර් 30 වන දින නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/24 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව, ව්‍යවහාරික පරිගණන අධ්‍යයන අංශය, පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයන අංශය සහ මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයන අංශය යන අධ්‍යයනාංශ 3න් සමන්විත පරිගණක හා තාක්ෂණ පීඨය පිහිටුවන ලදි. මෙම නව පීඨය එහි මෙහෙයුම් කටයුතු 2016 ජනවාරි මස 18 වන දින ආරම්භ කරන ලදි.

පරිගණක හා තාක්ෂණ පීඨයට, 2015/2016 අධ්‍යයන වර්ෂයේ සිට සිසුන් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදි. 2015/2016 අධ්‍යයන වර්ෂයේ සිට තාක්ෂණ විෂය ධාරාවේ සිසුන්ට උපාධි පාඨමාලා 2ක් පිරිනැමීම ආරම්භ කළ අතර, ඒවා නම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව සහ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව වේ. 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට මෙම පීඨය විද්‍යාවේදී ගෞරව පරිගණක විද්‍යා උපාධි පාඨමාලාව ද පිරිනමනු ලබයි.

මීට අමතර ව, ජෛව තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව ද ඉදිරියේ දී පිරිනැමීමට කටයුතු යොදා ඇත. පරිගණක විද්‍යාව, මෘදුකාංග ඉංජිනේරු, තොරතුරු තාක්ෂණය සහ ඉංජිනේරු තාක්ෂණය යන ක්ෂේත්‍රයන්ට අදාළ ව පශ්චාද් උපාධි පිරිනැමීමට ද මෙම පීඨය මඟින් සැලසුම් කර තිබේ. මීට අමතර ව මෙම පීඨය මඟින් දැනට ලබා දෙන පශ්චාද් උපාධි පාඨමාලා පවතී.

මෙම පීඨය මඟින් විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ හැසිරවීම සිදු කරනු ලබයි. මෙම පීඨයෙහි පර්යේෂණ ව්‍යවසාය, මූලික පරිගණක විද්‍යාවේ සිට කර්මාන්ත සහ සමාජයට අවශ්‍ය යෙදුම් සහිත ව නවීන තාක්ෂණයේ ප්‍රවර්ධනය තෙක් විකාශනය කෙරේ. නව තාක්ෂණයෙහි සොයා ගැනීම් සහ නිර්මාණ පරිගණක හා තාක්ෂණ දර්ශන විශාරද උපාධි පාඨමාලාවල මූලික හරය වේ.

නුදුරු අනාගතයේදී පහත සඳහන් පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට පරිගණක හා තාක්ෂණ පීඨය බලාපොරොත්තු වේ.

- නැනෝ තාක්ෂණ මධ්‍යස්ථානය
- භාෂා ඉංජිනේරු පර්යේෂණ මධ්‍යස්ථානය
- භූ තොරතුරු විද්‍යා මධ්‍යස්ථානය
- සංඛ්‍යාත්මක ගණිත මධ්‍යස්ථානය
- දත්ත විද්‍යා මධ්‍යස්ථානය
- සයිබර් ආරක්ෂණ මධ්‍යස්ථානය

පහත සඳහන් අරමුණු සහිත ව පරිගණක හා තාක්ෂණය සඳහා කර්මාන්ත අන්තර් සම්බන්ධතා මධ්‍යස්ථානයක් පරිගණක සහ තාක්ෂණ පීඨය විසින් ස්ථාපිත කර ඇත.

01. විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ විශේෂඥයන්ට තම ඥානය/අත්දැකීම් මගින් ජාතික ආර්ථිකය සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීම දිරි ගැන්වීම

02. සිසුන්ට තථ්‍ය ලෝකයේ රැකියා සඳහා පුහුණුවීම් අවස්ථා සැලැස්වීම

03. පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා බාහිර විශේෂඥයන්ට පීඨය සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම දිරි ගැන්වීම

04. රාජ්‍ය අංශයට සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා අවශ්‍ය පරිගණක පාදක පද්ධති දැරිය හැකි මුදලකට සංවර්ධනය කිරීම

පරිගණක හා තාක්ෂණ පීඨය දැනට යුනිවසිටි ඩ්‍රයිව්, යන ස්ථානයේ ස්ථාපිත කර ඇත. ආසියානු සංවර්ධන බැංකුව මගින් ලබා දෙන මූල්‍යමය ආධාරයෙන් මෙම පීඨයට යෝජිත ගොඩනැගිලි සංකීර්ණය මුදුන් ඇළ, කැලණිය යන ප්‍රදේශයේ ගොඩනගනු ලබන අතර, 2023 වසරේදී පීඨය එම ස්ථානයේ ස්ථාන ගත කෙරෙනු ඇත.

**තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව**

පාඨමාලා අධ්‍යයන කාලය වසර හතරක් වන අතර, සාර්ථක ව නිම කිරීමේ දී කැලණිය විශ්වවිද්‍යාලය මඟින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය පිරිනමනු ලැබේ. මෙම උපාධි පාඨමාලාව සඳහා බඳවාගන්නා යෝජිත සිසුන් සංඛ්‍යාව 91 කි. තාක්ෂණවේදී විෂය ධාරාව හදාරන උසස් පෙළ සිසුහු මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලබති.

මෙම පාඨමාලාව මෘදුකාංග සංවර්ධකවරුන්, ජාලකරණ පරිපාලකවරුන් හා තොරතුරු හා සන්නිවේදන වෘත්තිකයන්, ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය කුසලතා, දැනුම හා ආකල්ප වර්ධනය කර ගැනීමට විද්‍යාර්ථීන්ට උපකාරී වෙයි. ඉලෙක්ට්‍රෝනික විද්‍යාව සහ දත්ත සන්නිවේදන පිළිබඳව ශක්තිමත් පදනමක් ලබා දීම හා ප්‍රායෝගික විද්‍යාගාර සැසිවාර තුළින් ක්ෂේත්‍රයේ පිළිගත් ප්‍රමිතීන්ට අනුව, මෘදුකාංග හා පරිගණක ජාල සැලසුම් කිරීමට, නිර්මාණයට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කුසලතා හා දැනුම වර්ධනය කිරීම, මෙම පාඨමාලාව තුළින් සිදු වේ. අතථ්‍යකරණය හා වළා පරිගණනය, ජාල කළමනාකරණය, රැහැන් රහිත හා ජංගම සන්නිවේදන විද්‍යාව, පරිගණක ආරක්ෂණය, වෙබ් ක්‍රමලේඛනය, පරිගණක ක්‍රීඩා හා සජීවීකරණය, අතථ්‍ය යථාර්ථය සහ ජංගම යෙදුම් සංවර්ධන විද්‍යාව වැනි විශේෂ විෂය ඒකක, විෂය ධාරාවට ඇතුළත් කිරීම මගින් විද්‍යාර්ථීන්ට තම අභිමත වෘත්තීය ධාරා ඔස්සේ විපුල දැනුමක් ලබාගැනීමේ අවකාශ සපයා දී ඇත. විෂය නිර්දේශයේ පළමු වසර දෙකෙහි ඉලක්කය වන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේද වෘත්තිකයන්ට තිබිය යුතු පොදු නිපුණතාවන් දියුණු කිරීම වන අතර, අවසන් වසර දෙකෙහි දී තෝරා ගත් විෂය ක්ෂේත්‍රයක විශේෂ නිපුණතා දියුණු කිරීම සඳහා වෙන් ව ඇත.

මූලික ව ලබා දී ඇති විශේෂඥතා ක්ෂේත්‍ර වන්නේ :

- පරිගණක ජාල (Computer Networks)
- මෘදුකාංග පද්ධති තාක්ෂණය (Software Systems Technology)
- පරිගණක ක්‍රීඩා සහ සජීවීකරණය (Games and Animation)

හතරවන වසරට අදාළ වන සය මාසික සීමාවාසික පුහුණු කාලය තුළ දී විද්‍යාර්ථීන්ට සැබෑ කර්මාන්ත පරිසරය තුළ කටයුතු කිරීමට ඉඩහසර ලබා දේ. උපදේශන හා විභාග භාෂා මාධ්‍යය ඉංග්‍රීසි පමණක් ම වේ.

**ඉංජිනේරු තාක්‍ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව**

පාඨමාලා අධ්‍යයන කාලය වසර හතරක් වන අතර, සාර්ථක ව නිම කිරීමේදී කැලණිය විශ්වවිද්‍යාලය මඟින් ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය පිරිනමනු ලැබේ. මෙම උපාධි පාඨමාලාව සඳහා බඳවා ගන්නා යෝජිත සිසුන් සංඛ්‍යාව 100 කි. තාක්ෂණවේදී විෂය ධාරාව හදාරන උසස්පෙළ සිසුහු මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලබති.

මෙම ඉංජිනේරු තාක්ෂණ උපාධි පාඨමාලාව උපාධිධාරීන්ව පුළුල් මෙන්ම විවිධ කර්මාන්ත යෙදුම් සඳහා සුදානම් කිරීම අරමුණු කොටගත් විද්‍යාව හා තාක්ෂණයේ ප්‍රායෝගික යෙදුම් මත ප්‍රබල ව ඉලක්ක වී ඇත. විෂය නිර්දේශයේ පළමු වසර දෙකෙහි ඉලක්කය වන්නේ ඉංජිනේරු තාක්ෂණවේදියකුට තිබිය යුතු පොදු නිපුණතාවන් දියුණු කිරීම වන අතර, අවසන් වසර දෙකෙහි දී තෝරා ගත් විෂය ක්ෂේත්‍රයක විශේෂ නිපුණතා දියුණු කිරීම සඳහා වෙන් ව ඇත.

මූලික ව ලබා දී ඇති විශේෂඥ ක්ෂේත්‍රයන් වන්නේ ඃ

- ද්‍රව්‍යමය සහ ක්‍රියාවලි ඉංජිනේරු තාක්ෂණය (Materials and Process Technology)
- කර්මාන්ත ස්වයංයන්ත්‍රකරණය හා රොබෝ විද්‍යාව (Industrial Automation and Robotics)
- තිරසර තාක්ෂණය (Sustainable Technology)

කර්මාන්ත ස්වයංයන්ත්‍රණය හදාරන විද්‍යාර්ථීන්ට, පරිගණක හෝ රොබෝ යන්ත්‍ර වැනි කාලීන පද්ධති භාවිත කිරීමට සහ කර්මාන්තවල විවිධ ක්‍රියාවලීන් සහ යන්ත්‍ර සූත්‍ර හැසිරවීමට අවශ්‍ය නිපුණතාවය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ. ද්‍රව්‍යමය සහ ක්‍රියාවලි ඉංජිනේරු තාක්ෂණ විශේෂඥ ක්ෂේත්‍රවල දී ඉලක්ක වන්නේ, අමුද්‍රව්‍ය සහ ප්‍රයෝජනවත් දෑ වටිනා භාණ්ඩ බවට පත්කිරීම සඳහා ක්‍රියාත්මක කිරීම හා පාලනය කිරීම, සැලසුම් කිරීම වේ. තිරසාර තාක්ෂණය විශේෂඥ ක්ෂේත්‍රයේ අරමුණ වන්නේ කාලීන ලෝක සහ ශ්‍රී ලාංකේය ආර්ථික-සමාජීය ගැටලුවලට තිරසාර විසඳුම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමයි.

කර්මාන්ත පුහුණුව උපාධි පාඨමාලාවේ අනිවාර්ය අංගයක් වේ. හතරවන වර්ෂයේ අවසාන අර්ධ වාර්ෂිකයේ දී විද්‍යාර්ථීන් ප්‍රසිද්ධ කර්මාන්ත ආයතනවල ආධුනිකයන් වශයෙන් යොමු කරනු ඇත.

උපදේශන හා විභාග භාෂා මාධ්‍යය ඉංග්‍රීසි පමණක් ම වේ.

**විද්‍යාවේදී ගෞරව පරිගණක විද්‍යා උපාධි පාඨමාලාව**

කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන සිව් අවුරුදු විද්‍යාවේදී ගෞරව පරිගණක විද්‍යා උපාධි පාඨමාලාව සඳහා යෝජිත සිසුන් සංඛ්‍යාව 70කි. භෞතික විද්‍යා විෂය ධාරාව හදාරන උසස්පෙළ සිසුහු මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලබති.

මෙම පාඨමාලාවෙහි ව්‍යුහය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි පරිගණනය පිළිබඳ ස්ථාවර කමිටුවෙහි නිර්දේශය මත සහ Institute of Electrical and Electronics Engineers (IEEE) සහ

Association for Computing Machinery (ACM) ආයතනයන් හි නිර්ණායකවලට අනුකූල ව සකසා ඇත.

මෙම පාඨමාලාව මගින් විද්‍යාර්ථීන්ට මෘදුකාංග නිපැයුම් කර්මාන්තය සඳහාත්, පර්යේෂණ හැසිරවීම හා පරිගණක විද්‍යාව පිළිබඳ දැනුම බෙදාහැරීම සඳහාත් අදාළ වන කුසලතා, දැනුම හා ආකල්ප වර්ධනය කර ගැනීමට සහාය ලබා දේ. පරිගණක තාක්ෂණය පිළිබඳ ගැඹුරු මූලික දැනුම ලබා දීම හා ප්‍රායෝගික විද්‍යාගාර සැසිවාර තුළින් කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල මෘදුකාංග විශ්ලේෂණය කිරීමට, සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කර පවත්වා ගෙන යාමට අදාළ කුසලතා හා දැනුම වර්ධනය කිරීම මෙම පාඨමාලාව තුළින් සිදු වේ. දත්ත සමුදාය (Databases), යාන්ත්‍රික ඉගැනුම් ක්‍රියාවලිය (Machine Learning), දත්ත ආරක්ෂණය (Data Security), සම්පාදක පිළිබඳ න්‍යාය (Theory of Compiler), සමාන්තර පරිගණනය (Parallel Computing), අධිකාර්ය සාධන පරිගණනය (High Performance Computing), සංඛ්‍යාංක අපරාධ/ අක්‍රමිකතා විමර්ශනය (Digital Forensics), විචාරයික ජාල (Semantic Web), විද්‍යුත් ව්‍යාපාර තාක්ෂණය (e-Business Technology), පරිගණක ක්‍රීඩා හා සජීවීකරණය (Computer Games & Animation) සහ අතථ්‍ය යථාර්ථය (Virtual Reality) ආදී විෂය ඒකක, විෂය ධාරාවට එක් ව තිබීම මඟින් විද්‍යාර්ථීන්ට සිය අභිමත වෘත්තීය ධාරාව ඔස්සේ විපුල දැනුමක් ලබා ගැනීමේ අවකාශය සලසා ඇත.

- දත්ත විද්‍යාව (Data Science)
- කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence)
- සයිබර් ආරක්ෂණය (Cyber Security)
- විද්‍යාත්මක පරිගණනය (Scientific Computing)

යන විෂය ක්ෂේත්‍ර අතුරින් සිසුන්ට කැමති එක් ක්ෂේත්‍රයක් මෙම පාඨමාලාව තුළ තෝරා ගත හැක.

සිව් වන වසර සඳහා අදාළ වන සය මසක සීමාවාසික පුහුණු කාලය තුළ දී විද්‍යාර්ථීන්ට සැබෑ කර්මාන්ත පරිසරය තුළ කටයුතු කිරීමට ඉඩහසර ලබා දේ. සියලු ම ඉගැන්වීම් හා විභාග ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. අවසන් වසරේ දී විද්‍යාර්ථීන් විසින් තම අභිමත විෂයන් ඔස්සේ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කළ යුතුය.

**පරිගණක හා තාක්ෂණ සඳහා කර්මාන්ත අන්තර් සම්බන්ධතා ඒකකය (*IICfCT*)**
කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨය ඉංජිනේරුමය සහ පරිගණක ආයතනවලට උපදේශන සේවා සැපයීම, මෙහෙයුම් සංවර්ධනය හා කඩිනමින් වෙළඳපොළ වෙත ළඟා කිරීමට සහ පීඨයත් කාර්මික ආයතනත් අතර සම්බන්ධතාවය ස්ථාපිත කිරීමට *IICfCT* (Industry Interaction Cell for Computing and Technology) හෙවත් පරිගණක හා තාක්ෂණ ආයතන සම්බන්ධතා ඒකකයක් පිහිටුවන ලදි.

රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමග සහයෝගිතා ව තුළින් විශ්වවිද්‍යාල සිසුන්ට අනුභූති අධ්‍යයනයකට ද ආචාර්ය මණ්ඩලයට සහයෝගිතා පර්යේෂණවලට ද ඉඩ සලසා දෙමින් කාර්මික ගැටලුවලට විශ්වාසවන්ත සහ පිරිවැය ඵලදායිතාවයකින් යුතු විසඳුම් ලබා දීම *IICfCT* හි අරමුණයි.

මෙම ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන මානව සම්පත් පීඨය තුළින් ම ලබා ගැනීමට *IICfCT* ය කටයුතු කරයි. මේ වන විටත් පීඨයේ ආචාර්ය මණ්ඩලය රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට පරිගණක සහ මෘදුකාංග විසඳුම් ලබා දෙමින් සිටියි.
වෘත්තිය ක්‍රියාකාරකම් සහ සේවා නියුක්ති ප්‍රවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය තුළින් සිසුන්ගේ මෘදු කුසලතාවයන්, දැනුම සහ සංස්ථාපන අංශය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම *IICfCT*

මගින් සිදු වෙයි. දැනට මෙම ඒකකයෙහි අධ්‍යක්ෂ ලෙස ආචාර්ය පී.ඩබ්ලිව්. සමරසේකර මහතා කටයුතු කරයි.

**ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපනය**
ශ්‍රී ලංකාවේ පළමු වරට, මෙම පීඨය මගින් පාඨමාලා සැකැස්ම හා ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් උපයෝගි කරගෙන ඇත. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ, ඔක්ස්ෆර්ඩ් ඉගෙනුම් ආයතනයේ, විශ්වවිද්‍යාල අධ්‍යාපන සංවර්ධනය සඳහා වන සම්මානිත මහාචාර්ය ලින් මැක්ඇල්පයින්ගේ මගපෙන්වීම යටතේ, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ දී සහ ශ්‍රී ලංකාවේදී කාර්යය මණ්ඩල පුහුණුව සහ ඉගෙනුම් කේන්ද්‍රීයකරණය පාදක කර ගත් විෂයමාලා සැකසීම පිළිබඳ වැඩමුළු මාලාවක් දියත් කෙරිණි.

ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපනය, ක්‍රියාශීලී ඉගෙනීමේ ප්‍රවේශය ප්‍රවර්ධනය කරන අතර, එහිදී පන්ති කාමරය තුළ සහ එයින් පිටත දී ශිෂ්‍ය ඉගෙනීම බලගන්වන, නිර්මාණය, කළමණාකරණය සහ ක්‍රියාකාරකම්වලට වැඩි අවධානයක් යොමු වේ.

ක්‍රියාකාරී අධ්‍යාපනයට අවශ්‍ය ශෛලිය, සාම්ප්‍රදායික දේශන ක්‍රමයෙන් වෙනස් වේ. ශිෂ්‍යයන් හට නිදහසේ ඉගෙනීමට පහසුකම් සැලසීම සඳහා, ඉගෙනුම් කේන්ද්‍රීය ප්‍රවේශයේදී වෙනස් ආකාරයක උපදෙස් සහ ඇගයීම් ක්‍රමවේදයක් භාවිත කෙරේ. අපේක්ෂිත ඉගෙනුම්ඵල ලබා ගැනීම සඳහා, කුඩා දේශනවලට (Mini Lectures) අමතරව, විවිධ උපක්‍රම භාවිතයෙන් අන්තර් ක්‍රියාකාරීත්වය ඇති කරවන උපක්‍රම කථිකාචාර්යවරයා විසින් තෝරා ගනු ඇත. සමස්ථ පාඨමාලා ඒකකයේ දී ම, පූර්වයේ සැලසුම් කළ උපදේශ ග්‍රන්ථ මත පදනම් ව, සෑම ශිෂ්‍යයෙකුගේ ම, අපේක්ෂිත ඉගෙනුම් ඵල සාක්ෂාත් කිරීමේ මට්ටම ඇගයීම සඳහා විවිධ සම්භවන (formative) සහ සමාකලන (summative) ඇගයීම් සමුදායක් ද කථිකාචාර්යවරයා විසින් භාවිත කෙරෙනු ඇත. මෙහි දී, සම්ප්‍රදායික අධ්‍යයන වාර අවසාන විභාග ක්‍රමය වෙත අඩු අවධානයක් යොමු කෙරෙන අතර, ඒකකය පුරාවට ම අඛණ්ඩ ඇගයීම්වලින් ශිෂ්‍යයා විසින් සැලකිය යුතු ලකුණු ප්‍රමාණයක් ලබා ගනු ඇත.

**කර්මාන්ත උපදේශක මණ්ඩලය**
කාර්මික ක්ෂේත්‍රයේ විද්වතුන් සහ කර්මාන්ත සහ සමාගම් නියෝජිතයින්ගෙන් සමන්විත කර්මාන්ත උපදේශක මණ්ඩලයක් පරිගණක හා තාක්ෂණ පීඨය විසින් පිහිටුවා ඇත.

පරිගණක හා තාක්ෂණ පීඨයේ, කාර්මික උපදේශන මණ්ඩලයේ කාර්යයභාරය වන්නේ, පරිගණක හා තාක්ෂණ පීඨයේ මෙන් ම, කර්මාන්ත හා ආයතනික කොටස්කරුවන් අතර සම්බන්ධීකාරක ලෙස කටයුතු කරමින්, පීඨයේ මෙහෙවර සහ ක්‍රමවේදවල අරමුණු සැකසීම හා සාක්ෂාත් කර ගැනීමයි. අධ්‍යයන වැඩසටහන්, පර්යේෂණ හා හවුල් ව්‍යාපාර වශයෙන් පරිගණක හා තාක්ෂණ පීඨය වෙත, කාර්මික දෘෂ්ටියකින්, නව කරුණු එක් කිරීමට සහ නිර්දේශ සැපයීමත්, පරිගණක හා තාක්ෂණ පීඨයෙහි ක්‍රමෝපායන්වලට ශිල්පීය වශයෙන් මග පෙන්වීමටත් එමගින් වැදගත් කාර්යභාරයක් සිදු කෙරේ.

**බාහිර පුහුණුව**
පරිගණක හා තාක්ෂණ පීඨය මගින් එහි සියලු විද්‍යාර්ථීන් සඳහා වාර්ෂික ව පවත්වන බාහිර පුහුණු වැඩසටහනක් හඳුන්වා දී ඇත. එතුළින් පීඨයේ ශිෂ්‍යයින්ගේ සාම්ප්‍රදායික පන්ති කාමර පරිසරයේ ඇති ආකල්ප හා චින්තනය වෙනස් කිරීමේ එක් පියවරක් තබා ඇත. තවද, එමගින් ඔවුන්ගේ කටයුතුවලට ධනාත්මක බලපෑමක් ඇති කරමින්, ජීවිත අභියෝග ජය ගැනීම සඳහා වටිනා ඉගෙනුම් අත්දැකීමක් සැපයේ.

**වාර්ෂික සම්මන්ත්‍රණය**

පරිගණක හා තාක්ෂණ ශක්‍යතා පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, කැලණිය විශ්වවිද්‍යාලයේ, පරිගණක හා තාක්ෂණ පීඨය මගින් සංවිධානය කරන අතර, එහි සමාරම්භය 2016 නොවැම්බර් 25 දින කොළඹ Hilton Residences හෝටලයේ පැවැත්විණි. වාර්  පවත්වනු ලබන මෙම සම්මන්ත්‍රණ මාලාවේ 8 වන සම්මන්ත්‍රණය 2023 වසරේදී පවත්වනු ලැබිණි.

පරිගණක ක්ෂේත්‍රයේ සෑම අංගයක් මෙන් ම, නැනෝ තාක්ෂණය, භෞතික උපාංග සහ ක්‍රියාවලි යාන්ත්‍රණය, රොබෝ තාක්ෂණය සහ ස්වයංක්‍රීය උපාංග භාවිතය වැනි සියලු ම පැතිකඩ ඔස්සේ සාකච්ඡා කිරීම, දැනට කෙරෙන කටයුතු පිළිබඳ දැනුම බෙදා ගැනීම හා ප්‍රවර්ධනය මෙන් ම මෑත කාලීන ජයග්‍රහණ පිළිබඳ අධ්‍යයන, රාජ්‍ය, කර්මාන්ත හා රාජ්‍ය නොවන සංවිධනවල පර්යේෂකයන්, අධ්‍යාපනඥයින්, විද්‍යාර්ථීන්, අදාළ කටයුතුවල නියැලෙන්නන්, තාක්ෂණවේදීන් සහ ප්‍රතිපත්ති සාදන්නන් ඒකරාශී කිරීම මෙම සම්මන්ත්‍රණයේ අරමුණයි.

## 13.1 ව්‍යවහාරික පරිගණන අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය ලාලිත එස්.අයි. ලියනගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II **(අංශ ප්‍රධාන)**
*B.Sc. (Special) (Perad'ya), M.Sc. (Mississippi State, USA), Ph.D. (Mississippi State, USA)*
ආචාර්ය ආර්.එල්.සී.එස්. පුෂ්පකුමාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(පීඨාධිපති)**
*B.Sc. (Special) (Kel'ya), Ph.D. (Sheffield Hallam, UK)*
ආචාර්ය පී.ඩබ්ලිව්. සමරසේකර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Special) (C'bo), Ph.D. (Houston, USA)*
ආචාර්ය බී.කේ.එස්.එල්. ප්‍රනාන්දු මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Special) (J'pura) M.Sc. (Louisville, USA), Ph.D. (Louisville, USA)*
ආචාර්ය ඩබ්ලිව්.ඩී.සී. උදයංග මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Special) in Engineering (Moratuwa), Ph.D. (NTU, Singapore)*
ආචාර්ය ශකිලා පතිරණ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. Eng. (Hons) (Moratuwa), MSc (Moratuwa), Mater of Sustainability Science (Tokyo), Ph.D. (Moratuwa), AMIESL*
ආචාර්ය අමිලා කේ. ජීවන්දර මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Special) in chemistry (UOC), Ph.D. in chemistry (USA)*
ආචාර්ය අයි.ඩබ්ලිව්. සිරිවර්ධන මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Special) in chemistry (UOC), M.Sc. in Nanomaterials (USA), Ph.D in Nanomaterials (UOC)*
ආචාර්ය තාරගා ශාමිලන්
*B.Tec (Hons),(UWU), Ph.D.(USJ)*
එම්.පී.ආර්.එල්. පීරිස් මයා - ආධුනික කථිකාචාර්ය
*B.Sc. (Special) in Mechanical & Manufacturing Engineering (UOR), M.Phil in Sustainable Manufacturing (UOP)*
ඒ.වී.වී.එස්. බණ්ඩාර මයා - ආධුනික කථිකාචාර්ය
*BTec. (Hons) in Engineering (OUSL)*
තිසර පතිරණ මයා - ආධුනික කථිකාචාර්ය
*B.Tec (Hons) in Engineering (OUSL)*

තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණවේදී උපාධි පාඨමාලාව සහ ඉංජිනේරු තාක්‍ෂණවේදී උපාධි පාඨමාලාව සඳහා ව්‍යවහාරික පරිගණන අධ්‍යයනාංශය එක් ප්‍රධාන දායකයෙකු වේ. කෘෂිකර්මය, අධ්‍යාපනය, සෞඛ්‍ය ආරක්ෂණය, ප්‍රවාහනය වැනි අනිකුත් විශේෂිත ක්ෂේත්‍රයන් සඳහා පරිගණක තාක්ෂණවේදයෙහි යෙදීම මෙම අධ්‍යයනාංශයේ ප්‍රධාන අරමුණ වේ. ප්‍රථම උපාධි පාඨමාලාවන්ට අමතර ව පරිගණක හා තාක්ෂණ පීඨය මඟින් යෝජිත පශ්චාද් උපාධි පාඨමාලාවන්ට ද මෙම අධ්‍යයනාංශය දායක වේ. එලෙස ම, පීඨයේ ස්ථාපිත කර්මාන්ත අන්තර්ක්‍රියා මධ්‍යස්ථානයට සහ පරිගණක තාක්ෂණ පීඨය මඟින් හඳුන්වා දී ඇති පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට මෙම අධ්‍යයනාංශය දායකත්වය ලබා දෙයි.

## 13.2 පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය කේ.ජී.එච්.ඩී. වීරසිංහ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.Sc. (Special) (Kel'ya), M.Sc. (Oakland, USA), Ph.D. (Oakland, USA)*
මහාචාර්ය එන්.ජී.ජේ. ඩයස් මයා - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.Sc. (Special) (C'bo), M.Sc. (Belfast, UK), Ph.D. (Wales, UK), MBCS, MIEEE*
ආචාර්ය රසික රාජපක්ෂ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*Post-Doctoral, Data Science (UWYO,USA), PhD Math (UCF,USA), MSc.(UCF,USA), MSc(UNF,USA), BSc. (Special), (Colombo), P.G.D(BCS,UK)*
*ආචාර්ය ආර්.එල්. තෙන්නකෝන් මයා* - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Special) in Computer Systems & Networks (UK), M.Sc. in Information Systems Security (UK), Ph.D. in Engineering (Japan)*
ආචාර්ය ඒ.එම්.ඩී. චන්ද්‍රසේන - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Special) (Kel'ya), MCS (UOC), MSc.(Texas,USA), Ph.D. (Texas,USA)*
ආචාර්ය එන්.එම්. හක්මනගේ - කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ)
*B.Sc. (Special) (Kel'ya), Ph.D. (Kel'ya)*
යූ.කේ.ඩී.එන්. මනීෂ මයා - ආධුනික කථිකාචාර්ය
*B.Sc. (Special) in Computer Science (Kel'ya)*
යූ.කේ. පැතුම් මිහිරංග මයා - ආධුනික කථිකාචාර්ය
*MBA in MOT - University of Moratuwa, B.Sc.Eng (Hons) University of Moratuwa, AMIESL,PMP-PMI (USA)*
පී.එච්.ඒ.එච්.කේ. යසෝදරා - ආධුනික කථිකාචාර්ය
*B.Tech (sp) in Engineering (OUSL)*
එල්.ඒ.ටී.ආර්. පෙරේරා- ආධුනික කථිකාචාර්ය
BICT *(Kel'ya)*

පීඨය මඟින් මෙහෙයවන පරිගණක හා තාක්ෂණ උපාධි පාඨමාලා සඳහා සියලු ම මූලික පාඨමාලාවන් පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය මඟින් පිරිනමනු ලබයි. සංඛ්‍යාත්මක ගණිතය, කෘත්‍රිම බුද්ධිය, පරිගණක පද්ධති, පරිගණක ජාල සහ දත්ත ආරක්ෂණය මෙම අධ්‍යයනාංශයෙහි විශේෂිත වූ මූලික ක්ෂේත්‍රයන් අතරින් කිහිපයක් වේ. ප්‍රථම උපාධි පාඨමාලාවන්ට අමතර ව පරිගණක හා තාක්ෂණ පීඨය මඟින් යෝජිත පශ්චාද් උපාධි පාඨමාලාවන්ට ද මෙම අධ්‍යයනාංශය දායක වේ. අදාළ සුදුසුකම් ඇති උපාධිධාරීන්ට දර්ශනපති උපාධිය සහ දර්ශන විශාරද උපාධිය අරමුණු කොට ගත් උසස් අධ්‍යාපනය ලබාගත හැකි ය. එලෙස ම, පීඨයේ ස්ථාපිත කර්මාන්ත අන්තර්ක්‍රියා මධ්‍යස්ථානයට සහ පරිගණක තාක්ෂණ පීඨය මඟින් හඳුන්වා දී ඇති පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට මෙම අධ්‍යයනාංශය දායකත්වය ලබා දෙයි.

## 13.3 මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයනාංශය

**ආචාර්ය මණ්ඩලය**

ආචාර්ය එස්.ආර්. ලියනගේ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(අංශ ප්‍රධාන)**
*B.Sc. (Special) (Kel'ya), M.Phil (Perad'ya), Ph.D. (NUS, Singapore)*
ආචාර්ය එම්.සී. විජේගුණසේකර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I (සප්තවාර්ෂික නිවාඩු)
*B.Sc. (Special) (Kel'ya), M.Sc. (Wales, UK), Ph.D. (Wales, UK)*
ආචාර්ය පී.ජී. විජයරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I **(සප්තවාර්ෂික නිවාඩු)**
*B.Sc. (Kel'ya), M.Eng. (Uni. of Electro-Communications, Japan),*
*Dr.Eng. (Uni. Electro Electro-Communications, Japan)*
ආචාර්ය එස්.පී. කස්තුරිආරච්චි මෙය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Hons) (Rajarata), M.Sc (Perad'ya), PhD (NCU, Taiwan)*
ආචාර්ය එම්.එච්.එම්.අර්. තිසේරා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Special) in Management Information Systems (Ireland), M.Sc. (UOC), Ph.D. (UOC)*
ආචාර්ය එම්.අයි. සබර් - - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Special)(C'bo), Ph.D (Perad'ya)*
එච්.ඒ.සී. ප්‍රියංකර මයා - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Hons) in IT (Mrt)*

එච්.එන්.එන්. ප්‍රේමරත්න මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Hons) in IT (SLIIT), M.Sc. (SLIIT)*
යූ.බී.එච්.එස්. උඩපොල මිය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Special) in Computer Science (Kel'ya)*
ඩබ්.කේ.ඩී. ජයමිණි මෙය - ආධුනික කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු)
*B.Sc. (Special) in Computer Science (Kel'ya)*

2015 දෙසැම්බර් 30 දින පරිගණක හා තාක්ෂණ පීඨය ස්ථාපිත කිරීමත් සමඟ ම මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයනාංශය ආරම්භ විය. අනෙක් අධ්‍යයනාංශ දෙක සමඟ එකතු ව මෙම අධ්‍යයනාංශය පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලාවන් සඳහා මූලික හා වෛකල්පිත පාඨමාලාවන් පිරිනමනු ලබයි.

මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, දත්ත විද්‍යාව, මානව පරිගණක අන්තර්ක්‍රියා, පරිගණක ක්‍රීඩා සහ සජීවීකරණය මෙම අධ්‍යයනාංශයෙහි විශේෂිත වූ මූලික ක්ෂේත්‍රයන් අතුරින් කිහිපයක් වේ. මීට අමතර ව අනිකුත් පීඨයන්ට පරිගණකයේ ඉගැන්වීම් සහ ආධාරක සේවාවන් සඳහා මෙම අධ්‍යයනාංශය වැඩි දුරටත් දායකත්වය ලබා දේ. එලෙස ම පශ්චාද් උපාධි පාඨමාලාවන් සඳහා ද මෙම අධ්‍යයනාංශය ක්‍රියාකාරී දායකත්වය ලබා දේ. අපේක්ෂිත උපාධිධාරීන්ට දර්ශනපති උපාධිය සහ දර්ශන විශාරද උපාධිය අරමුණු කොටගත් උසස් අධ්‍යාපනයක් ලබා ගත හැකි ය. එලෙස ම, පීඨයේ ස්ථාපිත කර්මාන්ත අන්තර්ක්‍රියා මධ්‍යස්ථානයට සහ පරිගණක හා තාක්ෂණ පීඨය මඟින් හඳුන්වා දී ඇති පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට මෙම අධ්‍යයනාංශය ඉහළ මට්ටමෙන් දායකත්වය ලබා දේ.

විද්‍යුත් ලිපිනය - @kln.ac.lk

# 14. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය



**පීඨාධිපති**
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න මයා
*B.Sc. (Kel'ya), Ph.D. (Wayne State, USA)*



**නියෝජ්‍ය ලේඛකාධිකාරි**
කේ.බී.එස්.එල්. විජේරත්න මයා
*BA (Kel'ya), MBA (PIM-USJ)*



**සහකාර මූල්‍යාධිකාරි**
එස්.එස්. ගෝනපීනුවල මිය
*B.Com. (Kel'ya)*

1987 අංක 3 දරන පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ නියමාවලියේ විධිවිධානවලට අනුව කැලණිය විශ්වවිද්‍යාලයීය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය 1998.12.01 දින ආරම්භ කරනු ලැබී ය. පීඨය මතු දැක්වෙන අධ්‍යයන මණ්ඩලවලින් සමන්විත වන අතර, ඒ ඒ මණ්ඩල යටතේ විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අයත් පශ්චාද් උපාධි පාඨමාලා රැසක් ක්‍රියාත්මක වේ:

- මානවශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලය
- සමාජීය විද්‍යා අධ්‍යයන මණ්ඩලය
- වාණිජ හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන මණ්ඩලය
- විද්‍යා අධ්‍යයන මණ්ඩලය
- වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය
- බහුවිෂයීය අධ්‍යයන මණ්ඩලය (Board of Study in Multi- Disciplinary Studies)
- Board of Study in Digital Learning
- The Board of Study in Computing
- The Board of Study in Technology

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මඟින් මතු දැක්වෙන පශ්චාද් උපාධි සහ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කෙරේ.

01. දර්ශන විශාරද (PhD) උපාධි
02. දර්ශනපති (MPhil) උපාධි

**සමාජීය විද්‍යා අධ්‍යයන මණ්ඩලය**
***සමාජීය විද්‍යාපති (MSSc) දෑවුරුදු උපාධි***

03. සමාජ විද්‍යාව (සිංහල මාධ්‍යය)
04. සමාජ විද්‍යාව (ඉංග්‍රිසි මාධ්‍යය)
05. ආර්ථික විද්‍යාව (සිංහල මාධ්‍යය)
06. ආර්ථික විද්‍යාව (ඉංග්‍රිසි මාධ්‍යය)
07. දේශපාලන විද්‍යාව
08. ජනසන්නිවේදනය
09. භූගෝල විද්‍යාව
10. දර්ශනය
11. ඉතිහාසය
12. පුස්තකාල හා විඥාපන විද්‍යාව
13. පුරාවිද්‍යාව

***එක් අවුරුදු ශාස්ත්‍රපති (MA) උපාධි***
14. සමාජ විද්‍යාව (සිංහල මාධ්‍යය)
15. සමාජ විද්‍යාව (ඉංග්‍රිසි මාධ්‍යය)
16. ආර්ථික විද්‍යාව (සිංහල මාධ්‍යය)
17. ආර්ථික විද්‍යාව (ඉංග්‍රිසි මාධ්‍යය)
18. දේශපාලන විද්‍යාව
19. ජනසන්නිවේදනය
20. භූගෝල විද්‍යාව
21. දර්ශනය
22. ඉතිහාසය
23. පුස්තකාල හා විඥාපන විද්‍යාව
24. පුරාවිද්‍යාව

**එක් අවුරුදු පශ්චාද් උපාධි ඩිප්ලෝමාව**
25. මහජන සම්බන්ධතා හා මාධ්‍ය කළමනාකරණ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව

**මානවශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලය**

26. ජපන් භාෂාව පිළිබඳ **එක් අවුරුදු** පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
27. වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති දෑවුරුදු - සිංහල මාධ්‍යය
28. වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (MA) **එක් අවුරුදු** - සිංහල මාධ්‍යය
29. වාග්විද්‍යාව පිළිබඳ දෑවුරුදු - ඉංග්‍රීසි මාධ්‍යය
30. වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (MA) **එක් අවුරුදු** - ඉංග්‍රීසි මාධ්‍යය
31. සිංහල දෑවුරුදු ශාස්ත්‍රපති (MA) උපාධිය
32. නාට්‍ය හා රංග කලාව ශාස්ත්‍රපති (MA) එක් අවුරුදු උපාධිය
33. සංගීතය පිළිබඳ දෑවුරුදු ශාස්ත්‍රපති (MA) උපාධිය
34. නර්තනය පිළිබඳ දෑවුරුදු ශාස්ත්‍රපති (MA) උපාධිය

35. ලලිත කලාපති (MFA) දැවුරුදු උපාධිය
36. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දැවුරුදු ශාස්ත්‍රපති උපාධිය - සිංහල මාධ්‍යය
37. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ එක් අවුරුදු (MA) ශාස්ත්‍රපති උපාධිය - සිංහල මාධ්‍යය
38. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දැවුරුදු උපාධිය - ඉංග්‍රීසි මාධ්‍යය
39. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ එක් අවුරුදු ශාස්ත්‍රපති (MA) උපාධිය - ඉංග්‍රීසි මාධ්‍යය
40. ක්‍රිස්තියානි අධ්‍යයනය පිළිබඳ එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන මණ්ඩලය**

41. Master of Professional Finance (MPF) [One years]
42. Master of Commerce (MCom) [Two years]
43. Master of Human Resource Management (MHRM) [Two year]
44. Master of Business Accounting / Master of Business Finance (MBus) [Two years]
45. Master of Finance (Two years)
46. Master of Management in Accounting (Two years)
47. Master of Business Studies (MBS) [One years]
48. Master of Business Administration (MBA) [Two years]
49. Master of Business Management in Marketing (MBM) [Two years]
50. Doctor of Business Administration (DBA) [Three years]

**විද්‍යා අධ්‍යයන මණ්ඩලය**

51. Master of Information Technology (One year)
52. Master of Data Analytics (One year)
53. Master of Environmental Management (One year)
54. Master of Crop Protection & Plant Biotechnology (One year)
55. Master of Science in Statistics (One year)
56. Master of Science in Applied Microbiology (Two years)
57. Master of Science in Food and Nutrition (Two years)
58. Master of Science in Industrial and Environmental Chemistry (Two years)
59. Master of Science in Crop Protection & Plant Biotechnology (Two years)
60. Master of Science in Aquaculture and Fisheries Management (Two years)
61. Master of Science in Environmental Management (Two years)
62. Master of Science in Analytical Chemistry (Two years)
63. Master of Science in Biochemical and Biotechnology (Two years)
64. Master of Science in Statistics (Two years)

**වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය**

65. Master of Public Health (Two years)

**පරිගණන අධ්‍යයන මණ්ඩලය**

66. Master of Science in Information Technology in Education (Two years)
67. Master of Science in Computer Science (Two years)

**බහු ශාස්ත්‍රීය අධ්‍යයන මණ්ඩලය**

68. Postgraduate Diploma in Health Economics (One year) - Under UGC approval
69. Postgraduate Diploma in Health Service Management (One year) - Under UGC approval
70. Postgraduate Diploma in Medical Statistics (One year) - Under UGC approval
71. Master of Health Economics (One year) - Under UGC approval
72. Master of Health Service Management (One year) - Under UGC approval
73. Master of Medical Statistics (One year) - Under UGC approval

පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවමින් වාර්ෂික ව දැන්වීම් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. පාඨමාලා සම්බන්ධ වැඩිදුර විස්තර පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයෙන් හෝ fgs.kln.ac.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

**විමසීම්**

පීඨාධිපති : 011-2986124/ 0112-903950
නියෝජ්‍ය ලේඛකාධිකාරී : 011-2903951/ 011-2908165
සහකාර මූල්‍යාධිකාරී : 011-2903528/011-2903786
පීඨ කාර්යාලය : 011-2903952/3, 011-2993918
විද්‍යුත් ලිපිනය : fgs@kln.ac.lk

# 15. ශිෂ්‍යත්ව, ස්වර්ණ මුද්‍රිකා සහ ත්‍යාග

## 15.1 ශිෂ්‍යත්ව

- **පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව දීර්ඝ කිරීම**
  පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වලාභී විද්‍යාර්ථීන්ට තම විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ද එකී ආධාර දීර්ඝ කරවා ගත හැකි ය. එසේ වුව ද මහපොළ ශිෂ්‍යත්ව හෝ ශිෂ්‍යාධාර පහසුකම් ලබන විද්‍යාර්ථීහු මේ සඳහා හිමිකම් නො ලබති. එවැනි විද්‍යාර්ථීන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සේවා) වෙත ඒ බව ලිඛිත ව දැනුම් දිය යුතු ය.

- **මහපොළ ශිෂ්‍යත්ව**
  මේ යටතේ සුදුසුකම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත අධ්‍යයන වර්ෂයකට වාරික 10ක උපරිමයකට යටත් ව මාසික ව අනුමත මුදල ගෙවනු ලැබේ. නිර්දේශිත ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛනයකට අනුව මහපොළ ශිෂ්‍යත්ව මුදල් විද්‍යාර්ථීන්ගේ බැංකු ගිණුම් වෙත මහපොළ භාරකාර අරමුදල මගින් බැර කරනු ලැබේ.

- **ශිෂ්‍යාධාර**
  ශිෂ්‍යාධාර ලැබීමට සුදුස්සන් තේරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ යටතේ සුදුසුකම් ලබන විද්‍යාර්ථීන්ට මාසික ව අනුමත මුදල ශිෂ්‍යාධාර වශයෙන් ගෙවනු ලැබේ. මහපොළ ශිෂ්‍යත්වය හෝ වෙනත් ශිෂ්‍යත්වයක් නොලබන ශිෂ්‍යයන්ට ශිෂ්‍යාධාර සඳහා ඉල්ලුම් කළ හැකි ය.

  මේ පිළිබඳ විස්තර ශිෂ්‍ය සේවා අංශය මඟින් විද්‍යාර්ථීන් වෙත විටින් විට දැන්වීම් මගින් දැනුම් දෙනු ලැබේ.

  **සැ.යු.**
  විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාට පහත සඳහන් හේතු මත ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර ප්‍රදානය සම්පූර්ණයෙන් නැවැත්වීමට හෝ තාවකාලිකව අත්හිටුවීමට හෝ වාරික කීපයක් අත්හිටුවීමට හෝ පිළිවන.

  (අ) දේශන, නිබන්ධන හා ප්‍රායෝගික පන්තිවලට ක්‍රමානුකූල ව නොපැමිණීම.
  (ආ) විශ්වවිද්‍යාලය තුළ හා ඉන් පිටත අනිසි ලෙස හැසිරීම.
  (ඇ) වෙනත් ශිෂ්‍යත්වයක් සඳහා හිමිකම් ලැබීම.
  (ඈ) අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි නොවීම.
  (ඉ) රැකියාවක නියුතු වීම (විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීමෙන් පසු ව රැකියාවක් ලදහොත්, ඒ බව ශිෂ්‍ය සේවා අංශය වෙත වාර්තා කළ යුතු ය.)

තව ද, ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්ව ලබා ගැනීමේ දී විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරන ලද හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව**
  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව සඳහා, වෙනත් ආධාර මුදලක් නොලබන ශිෂ්‍යයන්ගෙන් අයදුම්පත් කැඳවා සුදුස්සන් තෝරා ගනු ලැබේ.

- **රත්නාකාර ශිෂ්‍යත්වය - වාග්විද්‍යා අධ්‍යයනාංශය**
  වාග්විද්‍යාව විෂයයක් ලෙස හදාරන දෙවන, තෙවන හා සිව්වන වසරවල දක්ෂතම සහ ආර්ථික තත්ත්වයෙන් පහළ මට්ටමක පසුවන විද්‍යාර්ථීන් අතරින් ඉල්ලුම්පත් කැඳවා, ඔවුනතරින් තෝරාගනු ලබන එක් අයෙකුට හෝ කිහිප දෙනෙකුට **රත්නාකාර ශිෂ්‍යත්වය** පිරිනැමේ.

- **හින්දී විෂය හදාරන විද්‍යාර්ථීන් සඳහා ඉන්දියානු රජයේ ශිෂ්‍යත්ව**
  ශාස්ත්‍රවේදී හෝ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය සඳහා හින්දී විෂය අධ්‍යයනය කරන විද්‍යාර්ථීන්ට ඉන්දියානු රජයෙන් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව මත ඉන්දියාවේ ආග්‍රාහි **කේන්ද්‍රීය හින්දී සංස්ථාන්** ආයතනයේ මාස දහයක පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ඇත.

- **පූජ්‍ය හැවන්පොල ශ්‍රී රතනසාර ආනන්ද ශිෂ්‍යත්වය**
  අ.පො.ස. (උ.පෙ.) පරීක්ෂණයෙන් පාලි, බෞද්ධ ශිෂ්ටාචාරය හා බුද්ධ ධර්මය යන විෂයයන් අතුරින් එකකින් උපරිම ප්‍රතිඵල ලබා කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් ව, විශ්වවිද්‍යාලයේ දී පාලි හා බුද්ධ ධර්මය යන විෂයයන් හදාරන පැවිදි ශිෂ්‍යයෙකුට මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ.

- **මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න ශිෂ්‍යත්වය**
  බෞද්ධ දර්ශනය පිළිබඳ ප්‍රථම වර්ෂ පරීක්ෂණයෙන් විශිෂ්ට සාමර්ථ්‍යයක් ලබන, අඩු ආදායම්ලාභි ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක සඳහා මහභාරකාර දෙපාර්තමේන්තුව මඟින් මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ. මෙය මුදල් ත්‍යාගයකි.

- **ලිනී දිසානායක ශිෂ්‍යත්වය**
  ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවෙහි පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය හා බෞද්ධ මනෝවිද්‍යාව යන විෂයන්ගෙන් ප්‍රථම වර්ෂයේදී ඉහළ ම ලකුණු ලබාගන්නා ශිෂ්‍යාවන් සිව් දෙනෙකුට මෙම ශිෂ්‍යත්වය පිරිනමනු ලැබේ.

- **නෝර්විජියානු මේරිස් වෙනර් ශිෂ්‍යත්වය**
  ආර්ථික විද්‍යා විෂය ධාරාවන් හදාරන සිසුන් අතරින් තෝරා ගැනෙන කිහිප දෙනෙකු වෙනුවෙන් මෙය පිරිනැමේ.

- **මහාචාර්ය ෂෙල්ටන් ගුණරත්න කුසලතා ශිෂ්‍යත්ව**
  ඇමෙරිකා එක්සත් ජනපදයේ මිනසෝටා විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදනය පිළිබඳ මහාචාර්ය ෂෙල්ටන් ගුණරත්න, කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් වෙනුවෙන් මෙම ශිෂ්‍යත්ව පිරිනමයි. සෑම අධ්‍යයන වර්ෂයක ම ජනසන්නිවේදන ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව හදාරන පළමු, දෙවන හා තෙවන වසරවල විද්‍යාර්ථීන් අතරින් උපරිම ලකුණු ලබන අයට ශිෂ්‍යත්වය පිරිනැමේ. උපරිම ලකුණු හඳුනා ගැනීමේ දී ජනසන්නිවේදන ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාවට නියමිත අධ්‍යයන සම්භාර අයත් විෂය ඒකකවලින් ලබාගත් ලකුණුවල GPA අගය අනුව ගණනය කිරීම් සිදු කෙරේ. GPA අගය 3.0 වඩා ඉහළ මට්ටමක පවතින විද්‍යාර්ථීන් අතරින් සුදුසු අය තෝරනු ලැබේ. එක් අධ්‍යයන වර්ෂයක් සඳහා එක් වසරක දී උපරිම කුසලතා දක්වන, තෝරාගත් විද්‍යාර්ථීන්ට මෙම ශිෂ්‍යත්ව පිරිනැමේ.

- **මහාචාර්ය ජේ.කේ.පී. ආරියරත්න අනුස්මරණ ශිෂ්‍යත්වය**
  විද්‍යාවේදී උපාධි පාඨමාලාවෙහි ප්‍රථම මට්ටමෙහි අනිවාර්ය රසායන විද්‍යා පාඨමාලා ඒකක සඳහා වැඩිම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) අගය ලබා ගන්නා විද්‍යාර්ථියාට ප්‍රදානය කෙරේ.

- **මහාචාර්ය එච්.එච්. කොස්තා අනුස්මරණ ශිෂ්‍යත්වය**
  කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ජීව විද්‍යා විෂය ධාරාවෙන් විද්‍යාවේදී උපාධිය හදාරන, මහපොළ ශිෂ්‍යත්වය ලැබෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සිවු දෙනෙකුට, මහාචාර්ය එච්. එච්. කොස්තා අනුස්මරණ ශිෂ්‍යත්වය ප්‍රදානය කෙරේ. මෙහි දී සත්ත්ව විද්‍යා විෂය හදාරන සිසු සිසුවියන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

- **ඇග්නස් පේදුරු මව්පිය උපහාර ශිෂ්‍යත්වය**
  වෛද්‍ය විද්‍යා පාඨමාලාවේ හෝ විද්‍යා පාඨමාලාවේ හෝ ප්‍රථම වර්ෂ පරීක්ෂණයෙන් ඉහළ මට්ටමේ ලකුණු ලබා ගත් අඩු ආදායම් ලබන ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍යාවකට මෙය පිරිනැමේ.

- **ලක්ෂ්මි හප්පිටිය සහ දොන් ධර්මසේන අනුස්මරණ ශිෂ්‍යත්ව - ශාරීරික අධ්‍යාපන අංශය සහ ක්‍රීඩා උපදේශක මණ්ඩලය**
  ශාරීරික අධ්‍යාපන අංශය විසින් මෙහෙයවනු ලබන එක් ක්‍රීඩාවක් සඳහා වත් විශ්වවිද්‍යාල වර්ණ ලාභී වූ ඕනෑම පීඨයක දෙවන හෝ ඊට ඉහළ වසරක විද්‍යාර්ථීන් අතරින් ඉල්ලුම්පත් කැඳවා ඔවුන් අතරින් තෝරාගනු ලබන දෙදෙනෙකුට මෙම ශිෂ්‍යත්ව වාර්ෂික ව ප්‍රදානය කරනු ලැබේ.

- **වෛද්‍ය ඩිලූෂී සඳකැන් හෙට්ටිආරච්චි අනුස්මරණ ශිෂ්‍යත්වය - ශාරීරික අධ්‍යාපන අංශය සහ ක්‍රීඩා උපදේශක මණ්ඩලය**
  ශාරීරික අධ්‍යාපන අංශය විසින් මෙහෙයවනු ලබන එක් ක්‍රීඩාවක හෝ ක්‍රියාකාරීව නිරත වන වෛද්‍ය පීඨයේ තුන්වන හෝ ඊට ඉහළ වසරක සිටින දෙවන වසර කඩඉම් විභාගයේදී සියලු විෂයයන් එකවර සමත් වූ කාන්තා වෛද්‍ය විද්‍යාර්ථීන් අතරින් ඉල්ලුම්පත් කැඳවා ඔවුන් අතරින් තෝරාගනු ලබන එක් අයෙකුට මෙම ශිෂ්‍යත්වය වාර්ෂික ව ප්‍රදානය කරනු ලැබේ.

- **සුජාතා ගුරුගේ ශිෂ්‍යත්වය**
  ආනන්ද ඩබ්.පී. ගුරුගේ මහතා විසින් සුජාතා ගුරුගේ මහත්මිය අනුස්මරණය කිරීම සඳහා සුජාතා ගුරුගේ පදනම් භාරය මහා භාරකාර දෙපාර්තුමේන්තුවේ ස්ථාපිත කර ඇත.

  එම භාරයේ අරමුණ වනුයේ ශ්‍රි ලංකා විශ්වවිද්‍යාලයකට ඇතුළත්ව උපාධි ප්‍රථම වසර විභාගයේදී වැඩිම ලකුණු ලබාගත් සිසුවියන් සඳහා ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඵල කර ගැනීමට වාර්ෂික ත්‍යාගයක් ලෙසට මුදල් ප්‍රදානය කිරීමයි.

- **චීන තානාපති ශිෂ්‍යත්වය**
  මෙම ශිෂ්‍යත්වය උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් පිරිනමනු ලැබේ. සෑම වසරක ම වැඩි ම ශ්‍රේණි ලකුණු සාමාන්‍ය (GPA) අගය මත විද්‍යාර්ථීන් තොරා ගනු ලැබේ.

- **ශිෂ්‍ය භාර අරමුදල් ශිෂ්‍යත්වය - මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය**
  ව්‍යාපාර කළමනාකරණවේදි මානව සම්පත් ගෞරව උපාධිය සඳහා ඇතුළත් වන ප්‍රථම වසර අඩු ආදායම් ලාභි ශිෂ්‍යයන් දෙදෙනෙකුට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඵල කර ගැනීමට ප්‍රථම වසර තුළදී මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ.

- **මහාචාර්ය සුදත් කාලිංගමුදලි සහ ඔහුගේ පවුලේ ශිෂ්‍යත්වය - විද්‍යා පීඨය**
  මෙම ශිෂ්‍යත්වය සෑම අධ්‍යයන වර්ෂයකම පිරිනමන අතර විද්‍යාවේදී උපාධි පාඨමාළාවේ සිසුන් සිව් දෙනෙකුට සහ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාළාවේ සිසුන් දෙදෙනෙකුට පිරිනමනු ලැබේ.

15.2 ස්වර්ණ මුද්‍රිකා

**පහත සඳහන් ස්වර්ණ මුද්‍රිකා ලබා ගැනීම සඳහා විද්‍යාර්ථීන් විසින් ප්‍රථම පන්ති ගෞරව සමාර්ථය ලබා තිබිය යුතුය.**

**15.2.1 කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයන්හි උපාධිලාභීන් වෙත පිරිනමනු ලබන ස්වර්ණ මුද්‍රිකා**

- ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පරීක්ෂණයේ දී එක් එක් විෂයය සඳහා විශිෂ්ට කුසලතා දක්වන උපාධිලාභීන් වෙත කැලණිය විශ්වවිද්‍යාලයීය **මානවශාස්ත්‍ර පීඨ ශිෂ්‍යත්ව භාරය** මඟින් ස්වර්ණ මුද්‍රිකා පිරිනමනු ලැබේ.

| | | |
|---|---|---|
| මානවශාස්ත්‍ර පීඨය | - | අතිපූජ්‍ය කොටහේනේ ශ්‍රී ප්‍රඥාකීර්ති මාහිමි අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| ඉංග්‍රීසි | - | මහාචාර්ය ඩොරික් ද සූසා ස්වර්ණ මුද්‍රිකාව |
| හින්දි | - | මහාචාර්ය ඉන්ද්‍රා දසනායක අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| පාලි | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ.ඒ. ජයසූරිය අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| බෞද්ධ දර්ශනය | - | මහාචාර්ය තිලක් කාරියවසම් ස්වර්ණ මුද්‍රිකාව |
| බෞද්ධ සංස්කෘතිය | - | මහාචාර්ය කුඹුරුගමුවේ වජිර මාහිමි ස්වර්ණ මුද්‍රිකාව |
| බෞද්ධ මනෝවිද්‍යාව | - | පී.ඒ.පී.ඒ. චන්ද්‍රසේකර ස්වර්ණ මුද්‍රිකාව |
| ප්‍රංශ | - | මහාචාර්ය සැම්සන් වීරතුංග අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| ජර්මන් | - | මහාචාර්ය ඩබ්ලිව්.එස්. කරුණාතිලක අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| රුසියන් | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඔරුවල බන්දු අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| ව්‍යාපාරික හා ශාස්ත්‍රීය චීන | - | මහාචාර්ය සරත් අමුණුගම ස්වර්ණ මුද්‍රිකාව |
| වාග්විද්‍යාව | - | මහාචාර්ය එස්.එල්. කැකුළාවල අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| සංස්කෘත | - | මහාචාර්ය ඇම්.එච්.එෆ්. ජයසූරිය අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| දෘශ්‍ය කලා හා සැලසුම්කරණය | - | මහාචාර්ය ඇෂ්ලි හල්පේ ස්වර්ණ මුද්‍රිකාව |
| නාට්‍ය හා රංග කලාව | - | ආචාර්ය ඇම්.එච්. ගුණතිලක අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| ප්‍රතිබිම්බ කලා | - | මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු ස්වර්ණ මුද්‍රිකාව |
| ප්‍රාසංගික කලා | - | මහාචාර්ය වෝල්ටර් මාරසිංහ ස්වර්ණ මුද්‍රිකාව |
| බටහිර සම්භාව්‍ය සංස්කෘතිය | - | මහාචාර්ය මර්ලින් පීරිස් ස්වර්ණ මුද්‍රිකාව |
| ක්‍රිස්තියානි සංස්කෘතිය | - | ආචාර්ය ඇන්ටනී ප්‍රනාන්දු ස්වර්ණ මුද්‍රිකාව |
| සාහිත්‍ය විචාරය | - | මහාචාර්ය කුලතිලක කුමාරසිංහ ස්වර්ණ මුද්‍රිකාව |
| දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම | - | මහාචාර්ය මැණික් ගුණසේකර අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| ජපන් | - | මහාචාර්ය ආරිය රාජකරුණා ස්වර්ණ මුද්‍රිකාව |
| සිනමා හා රූපවාහිනී අධ්‍යයන | - | ආචාර්ය ඩී.බී. නිහාල්සිංහ අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |
| භාෂා පරිවර්තන අධ්‍යයනයන් | - | මහාචාර්ය ඩී. එම්. වික්‍රමසිංහ ස්වර්ණ මුද්‍රිකාව |
| කොරියන් | - | මහාචාර්ය දයා එදිරිසිංහ අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව |

සිංහල - මහාචාර්ය ආනන්ද ජයසේකර අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව
වාස්තුශාස්ත්‍ර - මහාචාර්ය එස්. ඒ. පී විජේසිංහ අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව

- **මහාචාර්ය ඞී. ජේ. විජයරත්න පදනම මඟින් පිරිනමනු ලබන ස්වර්ණ මුද්‍රිකාව**
  ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පරීක්ෂණයේ සිංහල විෂයයෙන් වැඩි ම ලකුණු ලබා ගන්නා උපාධිලාභියා වෙත **මහාචාර්ය ඞී. ජේ. විජයරත්න පදනම** මඟින් පිරිනමනු ලබන ස්වර්ණ මුද්‍රිකාව ප්‍රදානය කෙරේ.

- **කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් ප්‍රදානය කරනු ලබන අතිපූජ්‍ය කොටහේනේ ශ්‍රී ප්‍රඥාකීර්ති මහා ස්වාමීන්ද්‍ර අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව**
  අතිපූජ්‍ය කොටහේනේ ශ්‍රී පඤ්ඤාකිත්ති මහා ස්වාමීන්ද්‍ර අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව මානවශාස්ත්‍ර පීඨයේ වැඩි ම ලකුණු ලැබූ විද්‍යාර්ථියාට ප්‍රදානය කෙරේ.

- **කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් ප්‍රදානය කරනු ලබන අතිපූජ්‍ය බඹරැන්දේ සිරිසීවලී මහා ස්වාමීන්ද්‍ර අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව**
  සමාජීය විද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාවෙන් වැඩි ම ලකුණු ලැබූ විද්‍යාර්ථියාට අතිපූජ්‍ය බඹරැන්දේ සිරිසීවලී මහා ස්වාමීන්ද්‍ර අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව පිරිනමනු ලැබේ.

- **මහාචාර්ය හේමචන්ද්‍ර රායි අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව**
  මහාචාර්ය හේමචන්ද්‍ර රායි අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව - ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව හදාරා වැඩි ම ලකුණු ලැබූ විද්‍යාර්ථියාට ප්‍රදානය කෙරේ.

- **මහාචාර්ය එෆ්. ආර්. ජයසූරිය අනුස්මරණ පදනම මඟින් පිරිනමනු ලබන ස්වර්ණ මුද්‍රිකාව.**
  ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පරීක්ෂණයෙන් ආර්ථික විද්‍යාව විෂයයෙන් වැඩි ම ලකුණු ලබා ගත් විද්‍යාර්ථියා වෙත මහාචාර්ය එෆ්. ආර්. ජයසූරිය අනුස්මරණ පදනම මඟින් පිරිනමනු ලබන ස්වර්ණ මුද්‍රිකාව ප්‍රදානය කෙරේ.

- **කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් පිරිනැමෙන රන් පදක්කම ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, සමාජ සංඛ්‍යානය හෝ ජාත්‍යන්තර අධ්‍යයනය යන විෂයයන්ගෙන් ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පරීක්ෂණයේ දී ඉහළ ම සාමර්ථ්‍යය ලබන ශිෂ්‍යයාට/ශිෂ්‍යාවට ප්‍රදානය කෙරේ.

- **මහාචාර්ය පියදාස රණසිංහ අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව**
  පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාවෙන් වැඩිම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථියාට මෙම මුද්‍රිකාව ප්‍රදානය කෙරේ.

### 15.2.2 කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ උපාධිලාභීන් වෙත පිරිනමනු ලබන ස්වර්ණ මුද්‍රිකා

- **මහාචාර්ය රාහුල සංස්කෘත්‍යායන අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන සියලුම ගෞරව උපාධි පරීක්ෂණ අතරින් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථයින්ගේ සංසදය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන වාණිජවේදී ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන වාණිජවේදී ව්‍යාපාර තාක්ෂණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන වාණිජවේදී ව්‍යවසායකත්ව ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ලීනස් සිල්වා ශිෂ්‍යත්ව අරමුදල මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය මගින් පවත්වන සියලුම ගෞරව උපාධි පරීක්ෂණ අතරින් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **LB ෆිනෑන්ස් පීඑල්සී මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන වාණිජවේදී මූල්‍ය කළමනාකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **සහතිකලත් වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් සහ අනෙකුත් බාහිර කුසලතාවන් සැලකිල්ලට ගනිමින් ඉහළ ම ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් ගිණුම්කරණ ප්‍රයෝගික විෂය ඒකකය සඳහා ඉහළම ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **කොළඹ කොටස් හුවමාරුව මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පාඨමාලාවේ අවසන් වසරේ ගණකාධිකරණය පිළිබඳ විශිෂ්ටතම පර්යේෂණය සඳහා මෙය පිරිනමුනු ලබයි.

- **ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් කළමනාකරණ ගිණුම්කරණ විෂය සඳහා ඉහළ ම ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනය ශ්‍රී ලංකා පරිච්ඡේදය මගින් පිරිනමනු ලබන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදි විගණනය සහ ව්‍යවහාරික ගිණුම්කරණය ගෞරව උපාධි පාඨමාලාවේ විශිෂ්ඨතම කාර්ය සාදක විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදි ගිණුම්කරණ තොරතුරු පද්ධති ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **සහතිකලත් වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදි ගිණුම්කරණ තොරතුරු පද්ධති ගෞරව උපාධි පරීක්ෂණයෙන් සහ අනෙකුත් බාහිර කුසලතාවන් සැලකිල්ලට ගනිමින් ඉහළම ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදි ගිණුම්කරණ තොරතුරු පද්ධති ගෞරව උපාධි පරීක්ෂණයෙන් ගිණුම්කරණ වාර්තාකරණ විෂයයන් සඳහා ඉහළම ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂක සංගමය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධි පරීක්ෂණයේ සමස්ත කාර්යශූර්ය විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **කේ.පී.එම්.ජී.ශ්‍රී ලංකා ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් සමස්ථ කාර්යශූර්ය විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ජනශක්ති රක්ෂණ සමූහ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදි රක්ෂණය ගෞරව උපාධි පරීක්ෂණයෙන් සමස්ථ කා කාර්යශූර්ය විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **Acuity Knowledge Partners පුද්ගලික සමාගම මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු සමාර්ථය ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ඩිල්මා සිලෝන් ටී පෞද්ගලික ආයතනය මගින් පිරිනැමෙන මෙරිල් ජේ ප්‍රනාන්දු ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමණාකරණවේදී අලෙවිකරණ ගෞරව උපාධි පරීක්ෂණයේ විශිෂ්ටතම කාර්යශූර විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන මෙරිල් ජේ ප්‍රනාන්දු ස්වර්ණ මුද්‍රිකාව

- **අලෙවිකරණ ආදී විද්‍යාර්ථීන්ගේ සංගමය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණ ගෞරව උපාධි පරීක්ෂණයේ විශිෂ්ටත ම කාර්යශූර විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ඔගිල්වි ඩිජිටල් ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ඩිජිටල් අලෙවිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ශ්‍රී ලංකා වරලත් පිරිස් කළමනාකරණ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **AIA රක්ෂණ සමාගම මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් ගෞරව උපාධි පරීක්ෂණයේ විශිෂ්ටත ම කාර්ය සාධක විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **මානව සම්පත් කළමනාකරණපති උපාධි පාඨමාලාව මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් ගෞරව උපාධි පරීක්ෂණයේ වසරේ හොඳ ම මානව සම්පත් කළමනාකරණ විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී බැංකුකරණය ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **Softlogic ජීවිත රක්ෂණ සමාගම මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී රක්ෂණය ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

- **කොළඹ කොටස් හුවමාරුව මගින් පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කලමනාකරණ අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන ව්‍යාපාර කලමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධි පරීක්ෂණයේ ප්‍රාග්ධන වෙළඳපළ හා සම්බන්ධ විෂයන් සඳහා ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ස්වර්ණ මුද්‍රිකාව

### 15.2.3 කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ උපාධිලාභීන් වෙත පිරිනමනු ලබන ස්වර්ණ මුද්‍රිකා

- **මහාචාර්ය ජේ.කේ.පී. ආරියරත්න ස්වර්ණ මුද්‍රිකාව**
  විද්‍යාවේදී උපාධිය සඳහා රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ප්‍රථම පන්ති සාමාර්ථයක් ලැබ, රසායන විද්‍යා පාඨමාලා ඒකක සඳහා වැඩි ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) අගය ලබාගන්නා විද්‍යාර්ථියාට **මහාචාර්ය ජේ.කේ.පී. ආරියරත්න අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව** පිරිනැමේ.

- **මහාචාර්ය සී. දහනායක අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව - විද්‍යාවේදී උපාධිය**
  විද්‍යාවේදී උපාධිය සඳහා භෞතික විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා භෞතික විද්‍යා පාඨමාලා ඒකක සඳහා වැඩි ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) අගය සමඟ ප්‍රථම පන්ති සාමාර්ථයක් ලබා ගන්නා විද්‍යාර්ථියාට **මහාචාර්ය සී. දහනායක ස්වර්ණ මුද්‍රිකාව** පිරිනැමේ.

- **මහාචාර්ය සී. දහනායක අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව - භෞතික විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධිය**
  විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා භෞතික විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා අධ්‍යයන පාඨමාලාවේ සියලුම භෞතික විද්‍යා ඒකක සඳහා වැඩි ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) අගය සමඟ ප්‍රථම පන්ති සාමාර්ථයක් ලබා ගන්නා විද්‍යාර්ථියාට මහාචාර්ය සී. දහනායක ස්වර්ණ මුද්‍රිකාව පිරිනැමේ.

- **මහාචාර්ය එච්.එච්. කොස්තා අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව**
  සත්ත්ව විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව හදාරා, සත්ත්ව විද්‍යාව ගෞරව උපාධි පාඨමාලාවට පමණක් අයත් විෂය ඒකක සඳහා අවම වශයෙන් B ශ්‍රේණි ලැබ වැඩි ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) අගය සමඟ ප්‍රථම පන්ති සාමාර්ථයක් ලබා ගන්නා විද්‍යාර්ථියාට සත්ත්ව විද්‍යා හා පරිසර කළමනාකරණ අධ්‍යයනාංශ ආචාර්ය මණ්ඩලය මගින් පිරිනමනු ලබන **මහාචාර්ය එච්.එච්. කොස්තා අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව** ප්‍රදානය කෙරේ. මෙහිදී සත්ත්ව විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාවට පමණක් අයත් සත්ත්ව විද්‍යාව විෂය ඒකක සඳහා ඇති අධ්‍යයන සම්භාර (Credits) සංඛ්‍යාවෙන් අඩකටවත් A හෝ A+ සාමර්ථ්‍යයන් ලබා තිබීම අත්‍යවශ්‍යය වේ.

- **මහාචාර්ය අයි. බාලසූරිය අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකා**
  ශාක ජීව විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා ප්‍රථම පන්ති සාමාර්ථයක් සමඟ ශාක ජීව විද්‍යාව පාඨමාලා ඒකක සඳහා ඉහළ ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) අගය විද්‍යාවේදී උපාධිය සඳහා ලබා ගන්නා විද්‍යාර්ථියාට මහාචාර්ය අයි. බාලසූරිය අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකා පිරිනැමේ.

- **මහාචාර්ය එස්.බී.පී. වික්‍රමසූරිය අනුස්මර්ණ ස්වර්ණ මුද්‍රිකාව**
  විද්‍යාවේදී උපාධිය හදාරා ප්‍රථම පන්ති සාමාර්ථයක් සමඟ ව්‍යවහාරික ගණිතය විෂයයෙහි සියලු පාඨමාලා ඒකක සඳහා 3.5 නොඅඩු වැඩි ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) අගය ලබාගන්නා විද්‍යාර්ථියාට **මහාචාර්ය එස්.බී.පී. වික්‍රමසූරිය අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව** පිරිනැමේ.

- **මහාචාර්ය සී.ආර්. කුලතිලක අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව**
  ශුද්ධ ගණිතය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ප්‍රථම පන්ති සාමාර්ථයක් සමඟ ශුද්ධ ගණිතය පාඨමාලා ඒකක සඳහා 3.5 නොඅඩු වැඩිම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) අගය විද්‍යාවේදී උපාධිය සඳහා ලබාගන්නා විද්‍යාර්ථියාට **මහාචාර්ය සී.ආර්. කුලතිලක අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව** පිරිනැමේ.

- **සරෝජිනී ජයවර්ධන අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව ක්ෂුද්‍රජීව විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධිය**
  වාර්ෂික ව පිරිනැමෙන සරෝජිනී ජයවර්ධන අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව ක්ෂුද්‍රජීව විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධිය ප්‍රථම පන්ති සාමාර්ථයක් සහිත ව සමත් වන අය අතරින් ඉහළම කුසලතාවය පෙන්වන උපාධිධාරියා හට පිරිනැමේ.

- **කැලණිය විශ්වවිද්‍යාලයීය විද්‍යාපීඨ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් ප්‍රදානය කරනු ලබන ස්වර්ණ මුද්‍රිකා**
  විද්‍යා පීඨයේ පහත සඳහන් විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා හදාරා ප්‍රථම පන්ති සාමර්ථ්‍යයක් සමඟ වැඩිම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) අගය ලබාගන්නා විද්‍යාර්ථියාට විද්‍යා පීඨ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය කෙරේ.

  - ව්‍යාවහාරික රසායන විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - ජෛව රසායන විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - රසායන විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - පරිගණක විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - පරිගණක අධ්‍යයනය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ පරිගණක විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - ගණිතමය භෞතික විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - ගණිතය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - ක්ෂුද්‍රජීව විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - අණුකජීව විද්‍යාව සහ ශාක ජෛව තාක්ෂණය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - භෞතික විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - ශාක ජීවවිද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
  - මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

- ➢ ක්‍රීඩා විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
- ➢ සංඛ්‍යානය විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව
- ➢ සත්ත්ව විද්‍යාව විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

- **කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංසදය මඟින් ප්‍රදානය කරනු ලබන අතිපූජ්‍ය යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමි අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව**
  විද්‍යා පීඨයේ විද්‍යාවේදී ගෞරව උපාධිය හදාරා වැඩි ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය **(GPA)** අගය ලැබූ විද්‍යාර්ථියාට **අතිපූජ්‍ය යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමි අනුස්මරණ** ස්වර්ණ මුද්‍රිකාව පිරිනැමේ.

- **කැලණිය විශ්වවිද්‍යාලයේ පරිසර සංරක්ෂණය හා කළමනාකරණ ආදි විද්‍යාර්ථීන්ගේ සංසදය මඟින් ප්‍රදානය කරනු ලබන ස්වර්ණ මුද්‍රිකාව**
  පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය විද්‍යාවේදී උපාධිය හදාරා ප්‍රථම පන්ති සාමාර්ථයක් සමඟ පරිසර සංරක්ෂණය හා කළමනාකරණ පාඨමාලා ඒකක සඳහා වැඩි ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය **(GPA)** අගය ලැබූ විද්‍යාර්ථියාට මෙම ස්වර්ණ මුද්‍රිකාව පිරිනැමේ. මෙහිදී එම පාඨමාලා ඒකක සඳහා ඇති අධ්‍යයන සම්භාර (Credits) සංඛ්‍යාවෙන් අඩකටවත් A හෝ A+ සමාර්ථයන් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ.

- **කැලණිය විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා හා පරිසර කළමනාකරණ අධ්‍යයන අංශයේ ආචාර්ය මණ්ඩලය මඟින් ප්‍රදානය කරනු ලබන ස්වර්ණ මුද්‍රිකාව**
  විද්‍යාවේදී උපාධිය හදාරා ප්‍රථම පන්ති සාමාර්ථයක් සමඟ සත්ත්ව විද්‍යා අනිවාර්ය පාඨමාලා ඒකක සඳහා වැඩි ම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය **(GPA)** අගය ලැබූ විද්‍යාර්ථියාට මෙම ස්වර්ණ මුද්‍රිකාව පිරිනැමේ. මෙහිදී එම සත්ත්ව විද්‍යා පාඨමාලා ඒකක සඳහා ඇති අධ්‍යයන සම්භාර (Credits) සංඛ්‍යාවෙන් අඩකටවත් A හෝ A+ සමාර්ථයන් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ.

**15.2.4 කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ උපාධිලාභීන් වෙත ප්‍රදානය කරනු ලබන ස්වර්ණ මුද්‍රිකා (එක් එක් විෂය සඳහා වැඩි ම ලකුණු ලබාගත් පන්ති සමාර්ථයක් සහිත විද්‍යාර්ථියා වෙත මෙම ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය කරනු ලබයි.**

- **වෛද්‍ය උපාධි පළමු පරීක්ෂණය**
  භෞතවේද ස්වර්ණ මුද්‍රිකාව
  කායව්‍යවච්ඡේද ස්වර්ණ මුද්‍රිකාව
  ජීවරසායන විද්‍යාව විෂය වෙනුවෙන් මහාචාර්ය ලාල් චන්ද්‍රසේන ස්වර්ණ මුද්‍රිකාව

- වෛද්‍යවේදි උපාධි පළමු පරීක්ෂණයෙන් විශිෂ්ටත ම දක්ෂතාවය පෙන්නුම් කිරීම සඳහා මහාචාර්ය අසෝක දිසානායක ස්වර්ණ මුද්‍රිකාව

- **වෛද්‍යවේදි උපාධි දෙවන පරීක්ෂණය**
  පවුල් වෛද්‍ය ස්වර්ණ මුද්‍රිකාව
  අධිකරණ වෛද්‍ය විද්‍යා ස්වර්ණ මුද්‍රිකාව
  වෛද්‍ය ක්ෂුද්‍රජීව ස්වර්ණ මුද්‍රිකාව
  පරපෝෂිතවේදී ස්වර්ණ මුද්‍රිකාව
  ව්‍යාධිවේදී ස්වර්ණ මුද්‍රිකාව
  භෛෂජ්‍යවේදී ස්වර්ණ මුද්‍රිකාව
  මහජන සෞඛ්‍ය ස්වර්ණ මුද්‍රිකාව

- **වෛද්‍යවේදී උපාධි දෙවන පරීක්ෂණයේ විශිෂ්ටතම දක්ෂතාවය පෙන්නුම් කිරීම සඳහා පිරිනමන ස්වර්ණ මුද්‍රිකාව**

- **අවසාන වෛද්‍යවේදී උපාධි පරීක්ෂණය**
  වෛද්‍ය ස්වර්ණ මුද්‍රිකාව
  ළමාරෝග හා කෞමාරභෘතීය ස්වර්ණ මුද්‍රිකාව
  ප්‍රසව හා නාරිවේද ස්වර්ණ මුද්‍රිකාව
  ශල්‍ය වෛද්‍ය ස්වර්ණ මුද්‍රිකාව
  මනෝ වෛද්‍ය ස්වර්ණ මුද්‍රිකාව

- **අවසාන වෛද්‍යවේදී උපාධිය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංසදය මඟින් පිරිනමන අතිපූජ්‍ය කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමි අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව**

- **සියලුම විෂයන්වලින් විශිෂ්ටතම දක්ෂතාව පෙන්නුම් කිරීම සඳහා වන මහාචාර්ය කාලෝ ෆොන්සේකා ස්වර්ණ මුදකාව**

15.2.5 **කැලණිය විශ්වවිද්‍යාලයේ පරිගණක හා තාක්ෂණ පීඨයේ උපාධිලාභීන් වෙත ප්‍රධානය කරනු ලබන ස්වර්ණ මුද්‍රිකා (එක් එක් විෂය සඳහා වැඩිම ලකුණු ලබාගත් පන්ති සාමාර්ථයක් සහිත විද්‍යාර්ථියා වෙත මෙම ස්වර්ණ මුද්‍රිකා ප්‍රදානය කරනු ලබයි.)**
ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධි පාඨමාලාව
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

15.2.6 **කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් ප්‍රදානය කරනු ලබන අතිපූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහා නාහිමි අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව**
සියලු ම පීඨ අතරින් උපරිම දක්ෂතා දක්වන විද්‍යාර්ථියාට කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංසදය මඟින් අතිපූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක නාහිමි ස්වාමීන් අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව පිරිනැමේ.

15.2.7 **ක්‍රීඩා උපදේශක මණ්ඩල ස්වර්ණ මුද්‍රිකාව**
විශ්වවිද්‍යාලයේ හොඳ ම ක්‍රීඩකයා/ක්‍රීඩිකාව ලෙස නම් කරනු ලබන උපාධිලාභියා වෙත පිරිනමනු ලැබේ.

15.2.8 **එක් එක් පීඨයෙහි හොඳ ම ක්‍රීඩකයාට/ක්‍රීඩිකාවට පිරිනමනු ලබන ක්‍රීඩා උපදේශක මණ්ඩල ස්වර්ණ මුද්‍රිකාව**
වාණිජ හා කළමනාකරණ, මානවශාස්ත්‍ර, වෛද්‍ය, විද්‍යා, සමාජ විද්‍යා යන එක් එක් පීඨයෙහි හොඳ ම ක්‍රීඩකයා/ක්‍රීඩිකාව ලෙස නම් කරනු ලබන උපාධිලාභියා වෙත මෙම රන් පදක්කම පිරිනමනු ලැබේ.

## 15.3 ත්‍යාග

- **බුද්ධදාස ගලප්පත්ති ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රථම වර්ෂ පරීක්ෂණයෙන් සමත් ව නාට්‍ය හා රංග කලාව විෂයයට වැඩි ම ලකුණු ලබා එය ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය සඳහා ද තෝරා ගන්නා ශිෂ්‍යයාට හෝ ශිෂ්‍යාවට **බුද්ධදාස ගලප්පත්ති ත්‍යාගය** පිරිනැමේ.

- **පූජ්‍ය කුඩාවැල්ලේ ශ්‍රී වංගීස නාහිමි අනුස්මරණ ත්‍යාගය**
  ප්‍රථම වර්ෂ පරීක්ෂණය සඳහා වාග් විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා ඉහළ ම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථියාට **පූජ්‍ය කුඩාවැල්ලේ ශ්‍රී වංගීස නාහිමි අනුස්මරණ ත්‍යාගය** පිරිනැමේ.

- **මහාචාර්ය ඩොරික් ද සූසා අනුස්මරණ ත්‍යාගය**
  අදාළ අධ්‍යයන වර්ෂයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය මඟින් ඉදිරිපත් කරනු ලබන ප්‍රථම වර්ෂයට අයත් පාඨමාලා ඒකකයක් සඳහා ලියාපදිංචි ව, එම පාඨමාලා ඒකකයේ අවසාන පරීක්ෂණයෙන් වැඩි ම ලකුණු ලබා සමත් වන විද්‍යාර්ථියාට මහාචාර්ය ඩොරික් ද සූසා අනුස්මරණ ත්‍යාගය පිරිනමනු ලැබේ. මෙම විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා විශිෂ්ට සේවාවක් ඉටු කළ විද්වතෙකු වූ මහාචාර්ය ඩොරික් ද සූසා මහතා සිහිකිරීම පිණිස මෙම ත්‍යාගය පිහිටුවන ලද්දේ විශ්‍රාම ලත් ඉංග්‍රීසි උපදේශිකා ජී. එච්. ඩී. ලිවේරා මහත්මිය විසිනි.

- **කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් පිරිනමන ත්‍යාග**

  (i) කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් පිරිනැමෙන **කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගම් ත්‍යාගය** ප්‍රථම වසර පරීක්ෂණයේ දී ජාත්‍යන්තර අධ්‍යයනය විෂයයෙන් ඉහළ ම ලකුණු ලබා ගන්නා ශිෂ්‍යයාට/ශිෂ්‍යාවට ප්‍රදානය කෙරේ.

  (ii) කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් පිරිනැමෙන **කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගම් ත්‍යාගය** ශාස්ත්‍රපති / සමාජීය විද්‍යාපති ආර්ථික විද්‍යා පශ්චාද් උපාධි පාඨමාලාවේ ලිඛිත පරීක්ෂණයෙන් ඉහළ ම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාට/අපේක්ෂිකාවට ප්‍රදානය කෙරේ.

  (iii) කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් පිරිනැමෙන **කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගම් ත්‍යාගය** ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති දේශපාලන විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාවේ ලිඛිත පරීක්ෂණයෙන් ඉහළ ම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාට/අපේක්ෂිකාවට ප්‍රදානය කෙරේ.

- **මහාචාර්ය එෆ්. ආර්. ජයසූරිය අනුස්මරණ ත්‍යාගය**
  ප්‍රථම වර්ෂ පරීක්ෂණයේ දී ආර්ථික විද්‍යා විෂයයෙන් ඉහළ ම ලකුණු ලබා ගන්නා ශිෂ්‍යයාට/ශිෂ්‍යාවට **මහාචාර්ය එෆ්. ආර්. ජයසූරිය අනුස්මරණ ත්‍යාගය** ප්‍රදානය කෙරේ.

- **කථිකාචාර්ය කේ. පී. වී. කරුණාරත්න අනුස්මරණ ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් පිරිනමනු ලබන කථිකාචාර්ය කේ. පී. වී. කරුණාරත්න අනුස්මරණ ත්‍යාගය ප්‍රථම වර්ෂ පරීක්ෂණයේ දී සමාජ සංඛ්‍යානය විෂයයෙන් ඉහළ ම ලකුණු ලබා ගන්නා ශිෂ්‍යයාට/ශිෂ්‍යයාවට ප්‍රදානය කෙරේ.

- **මහාචාර්ය තිලක් රත්නකාර අනුස්මරණ ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් පිරිනැමෙන **මහාචාර්ය තිලක් රත්නකාර අනුස්මරණ ත්‍යාගය** ප්‍රථම වර්ෂ පරීක්ෂණයේ දී දේශපාලන විද්‍යා විෂයයෙන් ඉහළ ම ලකුණු ලබා ගන්නා ශිෂ්‍යයාට/ශිෂ්‍යාවට ප්‍රදානය කෙරේ.

- **වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය මඟින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය.

- **සහතිකලත් වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් සහ අනෙකුත් බාහිර කුසලතාවන් සැලකිල්ලට ගනිමින් ඉහළ ම ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය.

- **ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් ගිණුම්කරණ ප්‍රායෝගික විෂය ඒකකය සඳහා ඉහළ ම ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය.

- **කොළඹ කොටස් හුවමාරුව මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පාඨමාලාවේ අවසන් වසරේ ගණකාධිකරණය පිළිබඳ විශිෂ්ටතම පර්යේෂණය සඳහා පිරිනැමෙන මුදල් ත්‍යාගය.

- **ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී ගණකාධිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් කළමනාකරණ ගිණුම්කරණ විෂය සඳහා ඉහළ ම ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය.

- **ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය.

- **ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂක සංගමය මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධි පරීක්ෂණයෙන් සමස්ත කාර්යශූර්ය විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ලබන මුදල් ත්‍යාගය.

- **Softlogic ජීවිත රක්ෂණ සමාගම මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධි පරීක්ෂණයෙන් අවදානම් සහ රක්ෂණ කළමනාකරණ විෂය ඒකකය සඳහා ඉහළම ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය.

- **කොළඹ කොටස් හුවමාරුව මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධි පරීක්ෂණයේ ප්‍රාග්ධන වෙළඳපළ හා සම්බන්ධ විෂයන් සඳහා ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය.

- **ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ගෞරව උපාධි පරීක්ෂණයෙන් ප්‍රාග්ධන වෙළඳපොළ සම්බන්ධ විෂයන් සඳහා ඉහළ ම ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය.

- **ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී අලෙවිකරණ ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය.

- **ශ්‍රී ලංකා වරලත් පිරිස් කළමනාකරණ ආයතනය මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ලබන මුදල් ත්‍යාගය මානව සම්පත් කළමනාකරණපති උපාධි පාඨමාලාව සඳහා අර්ධ ශිෂ්‍යත්වයක් ලබා දේ.

- **AIA රක්ෂණ සමාගම මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් ගෞරව උපාධි පරීක්ෂණයෙන් විශිෂ්ටත ම කාර්ය සාධක විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය මානව සම්පත් කළමනාකරණපති උපාධි පාඨමාලාව සඳහා අර්ධ ශිෂ්‍යත්වයක් ලබා දේ.

- **මානව සම්පත් කළමනාකරණපති උපාධි පාඨමාලාව මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී මානව සම්පත් ගෞරව උපාධි පරීක්ෂණයෙන් වසරේ හොඳ ම මානව සම්පත් කළමනාකරණ විද්‍යාර්ථියා වෙත පිරිනැමෙන ශිෂ්‍යත්වය වසරේ හොඳ ම මානව සම්පත් කළමනාකරණ විද්‍යාර්ථියා වෙත මානව සම්පත් කළමනාකරණපති උපාධි පාඨමාලාව හැදෑරීමට සම්පූර්ණ ශිෂ්‍යත්වයක් ලබා දේ.

- **Softlogic ජීවිත රක්ෂණ සමාගම මගින් පිරිනැමෙන මුදල් ත්‍යාගය**
  කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණවේදී රක්ෂණය ගෞරව උපාධි පරීක්ෂණයෙන් ඉහළ ම ශ්‍රේණි ලකුණු ලබාගත් විද්‍යාර්ථයා වෙත පිරිනැමෙන මුදල් ත්‍යාගය

- **ශාක ජීව විද්‍යා සංගමය මඟින් පිරිනැමෙන ශිෂ්‍යත්ව**
  පළමු සහ දෙවන වසරවලදී ශාක ජීව විද්‍යා පාඨමාලා ඒකක සඳහා විශිෂ්ටත ම දක්ෂතා දක්වන විද්‍යාර්ථීන් දෙදෙනෙකුට (02) ශාක ජිව විද්‍යා සංගමය මඟන් පිරිනැමෙන ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ.

- **සරෝජනී ජයවර්ධන අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව ක්ෂුද්‍රජීව විද්‍යාව විද්‍යාවේදි උපාධිය**
  වාර්ෂිකව පිරිනැමෙන සරෝජිනි ජයවර්ධන අනුස්මරණ ස්වර්ණ මුද්‍රිකාව ක්ෂද්‍රජිව විද්‍යාව විද්‍යාවේදි උපාධිය අධ්‍යන වර්ෂ තුනක් තුළ සම්පූර්ණ කළ ක්ෂුද්‍රජිව විද්‍යාව විෂයට ඉහලම කුසලතාවය පෙන්වන ප්‍රථම පන්තියේ සාමාර්ථයක් සහිතව සමත්වන උපාධිධාරියා හට පිරිනැමේ.

- **මහාචාර්ය ඩී.ජේ. විජයරත්න පදනම මඟින් පිරිනමන ත්‍යාගය**
  ගාලු දිස්ත්‍රික්කයෙන් කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළුවන ඕනෑම පීඨයකට අයත් විද්‍යාර්ථීන් අතුරින් අ.පො.ස (උ.පෙ.) උපරිම ලකුණු ලබා ඇති විද්‍යාර්ථියාට **මහාචාර්ය ඩී.ජේ. විජයරත්න පදනම** මඟින් ත්‍යාගයක් පිරිනැමේ.

- **මහාචාර්ය එස්.බී.පී. වික්‍රමසූරිය අනුස්මරණ ත්‍යාගය**
  ගණිතය විද්‍යාවේදී ගෞරව උපාධිය හදාරා ව්‍යවහාරික ගණිතය විෂය සඳහා වැඩිම ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) අගය සහ ප්‍රථම පන්ති සාමාර්ථයක් ලබා ගන්නා විද්‍යාර්ථියාට මහාචාර්ය එස්.බී.පී. වික්‍රමසූරිය අනුස්මරණ ත්‍යාගය හිමිවේ.

- **MAS සම්මානය - විශිෂ්ටතම දක්ෂතාව දක්වන විද්‍යාර්ථියාට**
  විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය අවසන් වසරේ විශිෂ්ටත ම දක්ෂතාව දක්වන විද්‍යාර්ථියා වෙත මෙය පිරිනමනු ලැබේ.

- **මාස්ටර් කාඩ් ඩිජිටල් විශිෂ්ටතා සම්මානය**
  මෙය පිරිනමනු ලබන්නේ කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණය විද්‍යාවේදි ගෞරව උපාධිය හෝ තොරතුරු තාක්ෂණය විද්‍යාවේදි ගෞරව උපාධිය හදාරා ඩිජිටලීය පරිණාමනය හෝ ඩිජිටලීය නවෝත්පාදනය යන ක්ෂේත්‍රයන් ඔස්සේ තම සිව්වන වසරේ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා ඉහළ ම ලකුණු ලබාගත් උපාධිධාරියෙකුට ය. සම්මානය සඳහා සුදුසුකම් ලැබීමට නම් අදාළ උපාධිධාරියා පළමු පන්තියේ ගෞරව සාමාර්ථයක් සහ සිව්වන වසර පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා අවම වශයෙන් A ශ්‍රේණියක් ලබා තිබිය යුතුය.

  විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය අවසන් වසරේ විශිෂ්ටත ම දක්ෂතාව දක්වන විද්‍යාර්ථියා වෙත මෙය පිරිනමනු ලැබේ.

- **Hayley's Advantis පර්යේෂණ විශිෂ්ටතා සම්මානය - කළමනාකරණය සහ තාක්ෂණය**
  විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය අවසන් වසරේ දී කළමනාකරණය සහ තාක්ෂණය පිළිබඳ විශිෂ්ටත ම පර්යේෂණ සඳහා මෙය පිරිනමනු ලැබේ.

- **Virtusa පර්යේෂණ විශිෂ්ටතා සම්මානය - තොරතුරු තාක්ෂණය**
  විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය උපාධි පාඨමාලාවේ අවසන් වසරේ තොරතුරු තාක්ෂණය පිළිබඳ විශිෂ්ටතම පර්යේෂණ සඳහා මෙය පිරිනමනු ලැබේ.

- **Zone 24x7 තොරතුරු තාක්ෂණය ව්‍යාපෘතිය විශිෂ්ටතා සම්මානය**
  විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය උපාධි පාඨමාලාවේ තෙවන වසරේ විශිෂ්ටත ම තොරතුරු තාක්ෂණ, පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මෙය පිරිනමනු ලැබේ.

- **මහාචාර්ය ඩබ්ලිව්.එස්. කරුණාතිලක අනුස්මරණ ත්‍යාගය**
  මෙම ත්‍යාගය වර්ෂයකට එක් වරක් පමණක් ප්‍රදානය කරනු ලැබේ. පූජ්‍ය තපෝවනයේ සුතධර හිමියන් විසින් කැලණිය විශ්වවිද්‍යාලයට ප්‍රදානය කරනු ලැබූ අරමුදල්වලට අදාළ වාර්ෂික පොලිය සම කොටස් හයකට බෙදා පහත දැක්වෙන ත්‍යාග ප්‍රදානය කරනු ලැබේ.
  එක් කොටසක් ප්‍රථම වර්ෂ පරීක්ෂණයේ දී වාග්විද්‍යාව විෂයය සඳහා වැඩි ම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථියාට/විද්‍යාර්ථිනියට ද, දෙවන කොටස වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) පාඨමාලාවේ ප්‍රථම වර්ෂ පරීක්ෂණයේ දී වැඩිම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථියාට/විද්‍යාර්ථිනියට ද, තුන්වන කොටස වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) පාඨමාලාවේ දෙවන වසර පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථියාට/විද්‍යාර්ථිනියට ද, හතරවන කොටස වාග්විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) පාඨමාලාව හදාරා තුන්වන වසර පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථියාට/විද්‍යාරිථිනියට ද, පස්වන කොටස ප්‍රථම වර්ෂයේ දී වාග්විද්‍යාව සහ සංස්කෘත

විෂයයන් හදාරා සංස්කෘත විෂයය සඳහා වැඩිම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථියාට/විද්‍යාර්ථිනියට ද සයවන කොටස ප්‍රථම වර්ෂයේ දී වාග්විද්‍යාව හා බෞද්ධ පාලි විෂයයන් හදාරා පාලි විෂයය සඳහා වැඩිම ලකුණු ලබා ගන්නා විද්‍යාර්ථියාට/විද්‍යාථිනියට ද හිමි වේ.

- **පී.ඒ.පී.ඒ. චන්ද්‍රසේකර ශිෂ්‍යත්ව අරමුදල**
  බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය හා පාලි යන විෂයයන් හදාරන ශාස්ත්‍රවේදී ගෞරව දෙවන වසර දෙවැනි අර්ධ වාර්ෂිකයේ පැවැත්වෙන විභාගයෙන් ඉහළ ම ලකුණු ලබාගත් විද්‍යාර්ථීන් (03) තිදෙනෙකුට වාර්ෂික ප්‍රතිලාභවලින් 20% බැගින් හිමිවේ.

- **පූජ්‍ය සික් චින් සින් ස්වාමීන්ද්‍ර ත්‍යාගය**
  පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය යන විෂයයන්ට අදාළ ප්‍රථම වර්ෂ පරීක්ෂණවලින් වැඩිම ලකුණු ලබා එම විෂය ශාස්ත්‍රවේදී ගෞරව පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගන්නා ශිෂ්‍යාවන් තිදෙනෙකුට මෙම ත්‍යාගය පිරිනැමේ. (ඒ ඒ විෂයයන් සඳහා එක් ශිෂ්‍යාව බැගින් තෝරාගත යුතුය.)

- **පූජ්‍ය ආචාර්ය කාක්කපල්ලියේ අනුරුද්ධ නායක ස්වාමීන්ද්‍ර ත්‍යාගය**
  පාලි ගෞරව උපාධි පාඨමාලාව හදාරා වැඩිම ලකුණු ලබා පළමු පෙළ හෝ දෙවන (ඉහළ) සාමාර්ථ්‍යය ලබන විද්‍යාර්ථියාහට මෙම ත්‍යාගය පිරිනැමේ.

- **පූජ්‍ය පණ්ඩිත මුදුකටුවේ ශ්‍රී ඥානාරාම නායක ස්වාමීන්ද්‍ර ත්‍යාගය**
  බෞද්ධ දර්ශනය ගෞරව උපාධි පාඨමාලාව හදාරා වැඩිම ලකුණු ලබා පළමු පෙළ හෝ දෙවන (ඉහළ) සාමාර්ථ්‍යය ලබන විද්‍යාර්ථියාහට මෙම ත්‍යාගය පිරිනැමේ.

- **හැවැන්පොළ ශ්‍රී රතනසාර වැල්ලවත්තේ ආනන්ද ශිෂ්‍යත්ව අරමුදල**
  අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් පාලි, බෞද්ධ ශිෂ්ටාචාරය, බුද්ධ ධර්මය යන විෂයයන් අතුරෙන් එකකින් හෝ උපරිම ප්‍රතිඵල ලබා කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් ව පාලි හෝ බෞද්ධ දර්ශනය හදාරණ පැවිදි ශිෂ්‍යයෙකුට මෙම ත්‍යාගය පිරිනැමේ.

- **බෞද්ධ දර්ශනය පිළිබඳ පී.පී. ජයවර්ධන පශ්චාද් උපාධි ශිෂ්‍යත්වය**
  බෞද්ධ දර්ශනය පිළිබඳ පශ්චාත් උපාධියක්/ ශාස්ත්‍රපති උපාධියක්/ ආචාර්ය උපාධියක් සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ලියාපංදිංචි වී සිටින පශ්චාද් උපාධි අපේක්ෂකයකු මෙම ශිෂ්‍යත්වය ලැබීමට සුදුසු වනු ඇත. මෙම විද්‍යාර්ථියා ප්‍රථම උපාධි පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ප්‍රමාණයක් ලබාගත් අයෙකු විය යුතුය.

- **ජනසරණ සරසවි - ආචාර්ය සෝමා එදිරිසිංහ ශිෂ්‍ය අරමුදල**
  සිනමා හා රූපවාහිනි අධ්‍යයන උපාධි පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් අතරින් එක් වර්ෂයක් තුළ ඉහළ මට්ටමේ ලකුණු ලබාගත් විද්‍යාර්ථීන් අතරින් දස දෙනෙකු (10) තෝරා එක් වර්ෂයක් සඳහා මසකට රු.2,000 බැගින් ජනසරණ සරසවි අරමුදල ප්‍රදානය කෙරේ.

# විෂය පරිබාහිර ක්‍රියාකාරකම් සහ ශිෂ්‍ය සුභසාධන සේවා



# විෂය පරිබාහිර ක්‍රියාකාරකම් සහ ශිෂ්‍ය සුභසාධන සේවා



මහාචාර්ය උදා හෙට්ටිගේ මිය
සභාපති
කලා මණ්ඩලය



මහාචාර්ය දිල්කුෂි සේනාරත්න වැත්තෑව මිය
අධ්‍යක්ෂ
වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය



පූජ්‍ය ආචාර්ය දොඩම්කුඹුරේ ධම්මදස්සි හිමි
අධ්‍යක්ෂ
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය



ආචාර්ය ඊ.ඒ.ඩී. අනූෂා එදිරිසිංහ මහත්මිය
අධ්‍යක්ෂ
ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයන කේන්ද්‍රය



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.එල්.කේ.එන්.සී. ප්‍රේමවර්ධන මිය
අධ්‍යක්ෂ
ජාත්‍යන්තර සබඳතා මධ්‍යස්ථානය



ආචාර්ය වසන්ති සුභසිංහ මිය
අධ්‍යක්ෂ
තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS)



සමන් රාජපක්ෂ මයා
අධ්‍යක්ෂ
සන්නිවේදන හා මාධ්‍ය ඒකකය



එල්.බී.ටී.සී. ලොකුබාලසූරිය මිය
අධ්‍යක්ෂ
ආබාධ සහිත සිසුන් සඳහා සම්බන්ධීකාරක මධ්‍යස්ථානය



ටී.එම්.එම්.කේ. තෙන්නකෝන් මයා
සම්බන්ධීකාරක
සංස්කෘතික මධ්‍යස්ථානය



ආචාර්ය කේ.ආර්.එන්. හර්ෂණී මිය
අධ්‍යක්ෂ
කළණ මිතුරු සෙවණ



වෛද්‍ය චින්තක සංජීව රත්නායක
ප්‍රධාන වෛද්‍ය නිලධාරී
වෛද්‍ය මධ්‍යස්ථානය



ජී.ජී.යූ. සමන් කුමාර මයා
වැඩබලන ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ
ශාරීරික අධ්‍යාපන අංශය



මහාචාර්ය ඩී.එස්.ජී. මෙත්තානන්ද මයා
සභාපති
පර්යේෂණ සභාව



ඩී.එම්. නාමල් බණ්ඩාර මයා
ප්‍රධාන ආරක්ෂක නිලධාරී
ආරක්ෂක අංශය - කැලණිය විශ්වවිද්‍යාලය



ආචාර්ය කසුන් ප්‍රනාන්දු මයා
අධ්‍යක්ෂ
ශිෂ්‍ය කටයුතු



ආචාර්ය ප්‍රදීප් ඩබ්ලිව්. සමරසේකර
අධ්‍යක්ෂ
තාක්ෂණ වාණිජකරණ හා ව්‍යාපාර
සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (CTTIL)

# 16. කලා මණ්ඩලය

**සභාපති**
මහාචාර්ය උදා හෙට්ටිගේ මිය - මහාචාර්ය
*B.A. Hons(Kel'ya ), M.phil. (Kel'ya), Ph.D. (Kel'ya), FSLCA*

**ලේකම් - (සහකාර ලේඛකාධිකාරි/ ශිෂ්‍ය සේවා)**
ඩබ්. ඒ. කේ. බී. වෙත්තසිංහ මෙය
*B.Sc.(Kel'ya), Dip in Management (JIAT)*

කැලණිය විශ්වවිද්‍යාල ප්‍රජාවගේ සමාජ සහජීවනය මෙන් ම සෞන්දර්යාත්මක රස වින්දනය සහ කලා කුසලතා වර්ධනය කිරීම අරමුණු කොට ගෙන කලා කටයුතු සඳහා නන් අයුරින් සහයෝගය දැක්වීමත්, අනුබල දීමත් කලා මණ්ඩලයේ වගකීම වන අතර කලා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය වැඩකටයුතු සංවිධානය කිරීම

**මෙහි පරමාර්ථ,**

- විශ්වවිද්‍යාලයේ සංස්කෘතික හා කලා කටයුතුවල දියුණුව සඳහා ක්‍රියා කිරීම
- විශ්වවිද්‍යාල ප්‍රජාවගේ කලා රස වින්දනය හා කලා කුසලතා වර්ධනය කිරීම හා ඇගයීම
- විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ, අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ විධායක නිලධාරි මණ්ඩලයේ සාහිත්‍ය කලා රසාස්වාදනය වැඩි දියුණු කිරීම පිණිස වැඩසටහන් සම්පාදනය කිරීම
- විශ්වවිද්‍යාල ප්‍රජාවගේ කලා කෞෂල්‍යයන් වර්ධනය කිරීම සඳහා ප්‍රයෝගිකව ක්‍රියාත්මක වීම.

**කලා මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.**

1. සභාපතිතුමා ඇතුළු ව ස්ථිර ආචාර්ය මණ්ඩලයට අයත් කලා ක්ෂේත්‍රයෙහි උනන්දුවක් දක්වන සාමාජිකයන් 10 දෙනෙක්
3. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරු (6)
4. අධ්‍යක්ෂ - ශිෂ්‍ය කටයුතු / ප්‍රධාන ශිෂ්‍ය උපදේශක
5. කලා කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 05 දෙනෙක් (එක් අයෙකු නේවාසිකාගාරවරයෙකු ,උප පාලක හෝ උප පාලකවරියකු විය යුතුය.)
6. ශිෂ්‍යයින් අතරින් කලා කටයුතු පිළිබඳ ව උනන්දුවක් දක්වන සාමාජිකයින් 06 දෙනෙක් (පීඨ 06 නියෝජනය වන පරිදි)
7. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි හෝ සහකාර ලේඛකාධිකාරි ශිෂ්‍ය සේවා අංශය
8. විශ්වවිද්‍යාලයේ සංස්කෘතික මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක හෝ නියෝජිතයෙක්

මේ අනුව නානාවිධ කලා කුසලතා ඇති විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ට මෙන් ම අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල හවතුන්ට ඔවුන්ගේ දක්ෂතා දියුණු කර ගැනීමට සහ එළිදැක්වීමට අවශ්‍ය උපදෙස් ලබා දීමටත්, ඒ සඳහා සහයෝගය දැක්වීමටත්, විවිධ කලා කුසලතාවන්ගෙන් හෙබි ශිෂ්‍යයන් හා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල හවතුන් ඇගයීම ලක් කිරීමත් කලා මණ්ඩල වගකීම වේ.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 011 2903182 / 0112903875 |
| අභ්‍යන්තර අංක | - | 182 |
| (ව්‍යාපෘති සම්බන්ධීකාරක) | | |
| විද්‍යුත් ලිපිනය | - | artcouncil@kln.ac.lk |

# 17. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

**අධ්‍යක්ෂ**
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සී.ඩී.එස්. වැත්තෑව මිය - ඉංග්‍රීසි ඉගැන්වීමේ අධ්‍යයන අංශය
*PhD (Nijmegen, NL)*

**අධ්‍යයන උපදේශකවරු**
ආචාර්ය අයි. යූ. හේවාපතිරණ මිය - මෘදුකාංග ඉංජිනේරු ඉගැන්වීමේ ඒකකය
*B.Sc.Hons (C'bo), Ph.D.(Canterbury, NZ)*
වෛද්‍ය ලතිකා ආතාවුද මිය - මහජන සෞඛ්‍ය අධ්‍යයනාංශය
*Ph.D. (Auckland, NZ) MPH (Kel'ya), MBBS (J'pura), DipM (UK)*
ආචාර්ය ප්‍රදීප් සමරසේකර මයා - ව්‍යවහාරික පරිගණකකරණ අධ්‍යයනාංශය
*B.Sc. (C'bo)Ph.D. (Houston, USA)*
නිපුණ හේමින්ද බස්නායක මයා - සිංහල අධ්‍යයනාංශය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), PGD in Writership and Communication (S.J'pura)*
ජී.කේ.එස්. නිමේෂි මිය - වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය
*M.Entr (S.J'pura), B.Com*
ආචාර්ය පී. කේ. රෝෂිණි ජයවීර මිය - ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
*B.A. Hons in Econ (Perad'ya), Pg. Dip.(ISS,NL), MSSc.(Econ) NUS (Singapore), Ph.D. (Wollongong,AUS)*

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ දැක්ම වනුයේ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය සම්පූර්ණ කරන සියලුම උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය තහවුරු කිරීමේ මධ්‍යස්ථානය බවට පත්වීමයි. ජාතික හා ජාත්‍යන්තර තලයේදී තමාගේ අනන්‍යතාවය තහවුරු කරගෙන රටේ සංවර්ධනයට ධනාත්මක දායකත්වයක් ලබා දීමට අවශ්‍යවන වෘත්තීය අගයන්ගෙන් සිසුන් සවිබල ගැන්වීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය කැපවී සිටියි.

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේදී, සිසුනට සාර්ථක උපාධිධාරියෙකු ලෙස වැඩ ලෝකයට මුහුණ දීමට රට තුළ පවතින රැකියා අවස්ථා, ඔවුන්ගේ දැනුම හා කුසලතා නැංවීම සඳහා අනුගමනය කළයුතු පාඨමාලා, ඔවුන් නිරත විය යුතු විෂය බාහිර ක්‍රියාකාරකම් සහ ඔවුන් ලබා ගතයුතු අත්‍යාවශ්‍ය කුසලතා පිළිබඳ ව දැනුවත් කරනු ලැබේ.

ඉහත සඳහන් දෑ සාක්ෂාත් කරගැනීම සඳහා වාර්ෂික රැකියා පොළ, ආයතන සමග ඒකාබද්ධව සිදුකරනු ලබන වැඩසටහන්, ව්‍යවසායකත්ව වැඩසටහන්, පීඨ මට්ටමින් රැකියා සංවර්ධන වැඩසටහන්, සන්නිවේදන කුසලතා සංවර්ධන වැඩසටහන්, පෞර්ෂත්ව සංවර්ධන වැඩසටහන් සහ අධ්‍යයන සංවර්ධන වැඩසටහන් මෙම ඒකකය මගින් පවත්වනු ලැබේ. මීට අමතරව උපාධි අපේක්ෂකයන් සමග පෞද්ගලික හා රාජ්‍ය අංශය සම්බන්ධ කරවීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය අගනා කාර්යයක් ඉටු කරයි.

**කලණ මිතුරු සෙවණට** යාබද ව පිහිටුවා ඇති වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය සති අන්තයේ සහ නිවාඩු දිනවල හැර කාර්යාල වේලාවන්හි විවෘත ව පවතී.

| | |
|---|---|
| දුරකථන අංකය | 011 2917711 |
| අභ්‍යන්තර අංක | 180/181 |
| ෆැක්ස් අංකය | 011 2917711 |
| විද්‍යුත් ලිපිනය | careers@kln.ac.lk |

# 18. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**අධ්‍යක්ෂ**
ආචාර්ය පූජ්‍ය දොඩම්කුඹුරේ ධම්මදස්සි හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), Dip (Arch), M.A., M.Sc., Ph.D. (Kel'ya)*

**නියෝජ්‍ය අධ්‍යක්ෂ - ලියාපදිංචි කිරීම් හා විභාග**
පූජ්‍ය උඩවෙල රේවත හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), M.Phil. Royal Panditha*

**නියෝජ්‍ය අධ්‍යක්ෂ - ඉගෙනුම් සම්පත්**
එම්.පී. දර්ශන සම්පත් සෝමරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.A. (Kel'ya), MSSc. (Kel'ya)*

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි**
එස්. මනිවන්නන් මයා
*B.Sc. (Math), PGDip Business Administration (Kel'ya), Masters in Public Administration and management (C'bo)*

**සහකාර මූල්‍යාධිකාරි**
එස්.සී. වික්‍රමනායක මිය
*B.Sc. (Acc.) Sp. (S.J'pura), ACA, SAT*

කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මඟින් මානවශාස්ත්‍ර, සමාජීය විද්‍යා, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, වෛද්‍ය සහ විද්‍යා පීඨවලට අදාළ ව උපාධි පාඨමාලා පවත්වනු ලැබේ. 1993 වර්ෂයේ ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රවේදී (ගෞරව) සහ වාණිජ විද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලාවන්ගෙන් පමණක් ඇරඹි මෙම ශාස්ත්‍රීය සේවාව 1999 වර්ෂයේ සිට ව්‍යාපාර කළමනාකරණවේදී සහ විද්‍යාවේදී උපාධි පාඨමාලා දක්වා ව්‍යාප්ත කිරීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු යොදන ලදී. ඒ අනුව කැලණිය විශ්වවිද්‍යාලය මඟින් පහත සඳහන් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා පහසුකම් සලසා ඇත.

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව
2. විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව
3. ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව
4. වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව
5. විද්‍යාවේදී (භෞත චිකිත්සාව) උපාධි පාඨමාලාව

උක්ත පාඨමාලාවන් සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කිරීමේ සිට අදාළ උපාධිය පිරිනැමීම දක්වා වූ සියලු කටයුතු අදාළ විධි විධානවලට යටත් ව පවත්වාගෙන යාම පිළිබඳ සම්පූර්ණ වගකීම දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත පැවරී ඇත.
මෙහි අධ්‍යාපනය සඳහා දැනට ලියාපදිංචි වී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව (ආසන්න වශයෙන්) 105,000ක් පමණ වේ. මෙම උපාධි පාඨමාලා පිළිබඳ සියලු විස්තර *www.cdce.kln.ac.lk* යන වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි ය.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 011 2987000, 011 2987001, 011 2987002, 011 2987005, 011 2914478 |
| ෆැක්ස් අංකය | - | 011 2986606 |
| විද්‍යුත් ලිපිනය | - | cdce@kln.ac.lk |

# 19. ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයන කේන්ද්‍රය

**අධ්‍යක්ෂ**

ආචාර්ය ඊ.ඒ.ඩී. අනූෂා එදිරිසිංහ මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. Special in Sociology, Criminology and Criminal Justice (USJ)*
*M.A. and Ph.D. in Criminology (USJP and Uppsala University, Sweden)*

කැලණිය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයන මධ්‍යස්ථානය (සීජීඑස්යූකේ) අන්තර් විනය ඒකකයක් වන අතර එහි සාමාජිකත්වය විශ්වවිද්‍යාලය හරහා ලබා ගනී. එබැවින් එය කිසිදු පීඨයකට අනුයුක්ත කර නැති අතර උපකුලපති යටතේ ක්‍රියාත්මක වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයන මධ්‍යස්ථානය ( සීජීඑස්යූකේ ) පිහිටුවන ලද්දේ විශේෂයෙන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙනි. මෙම අධ්‍යයන කේන්ද්‍රය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ 2011 දී ස්ථාපනය කිරීම හා අඛණ්ඩ ව පවත්වාගෙන යාම සඳහා, මෙහි නිර්මාතෘ වන ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහයන් මහත් පරිශ්‍රමයක් දැරීය.

මධ්‍යස්ථානය මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය අවධාරණය කරන තිරසාර සංවර්ධන ඉලක්කය 5 (SDG 5) සාක්ෂාත් කර ගැනීම සඳහා ය. ඊට සමගාමීව, SDG 5 යටතේ අන්තර් සම්බන්ධිත ඉලක්ක ලෙස SDG 01 ( සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම ), SDG 03 ( නිරෝගී බව සහ යහපැවැත්ම ), SDG 04 (ගුණාත්මක අධ්‍යාපනය), SDG 08 (සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය), SDG 10 ( අව අසමානාත්මතා), SDG 13 (දේශගුණික ක්‍රියාකාරකම්), සහ SDG 16 (සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන) ක්‍රියා කරයි. මෙම අන්තර් සම්බන්ධිත ඉලක්ක සමග උපායමාර්ගිකව වැඩ පෙළගැස්වීමෙන්, මධ්‍යස්ථානය බහුවිධ අභියෝගවලට මුහුණ දීම සහ වඩාත් තිරසාර සහ සාධාරණ අනාගතයක් නිර්මාණය කිරීම අරමුණු කරයි.

මෙම මධ්‍යස්ථානයේ පරමාර්ථය වනුයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගුණාත්මක පර්යේෂණ ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරිම හා බෙදා හැරීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයනයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යාපනික හා පුහුණු වැඩසටහන් පැවැත්වීම (සියලු මට්ටම්වල ඩිප්ලෝමා සහ උපාධි ප්‍රදානය කිරීමේ විකල්පය සහිතව), ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්පත් මධ්‍යස්ථානය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය , සමානාත්මතාවයට අදාළ ගැටළු පිළිබඳ විශේෂ දැනුම හා උපදෙස් ලබා දීම, අධ්‍යාපනික ප්‍රජාව තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය අදාළ ගැටලු පිළිබඳව දැනුවත් කිරීමල කැලණිය විශ්වවිද්‍යාලයීය ස්ත්‍රී පුරුෂ සමජභාවය පිළිබඳ ප්‍රතිපත්ති සැකසීම, ක්‍රියාත්මක කිරීම, යාවත්කාලීන කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ මහ ජනයා තුළ විඥානය ඇති කිරීම.

තවද, අන්තර් විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් සම්පත් මධ්‍යස්ථානය නිසි පරිදි සකස් කිරීම. විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය, සිසුන් සහ අමුත්තන් සඳහා නවීන සම්පත් මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරන, විමර්ශන ආයතනය සහ එහි පුස්තකාලය, සම්පත් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දත්ත සමුදායන් දෘඪ හා විද්‍යුත් ආකෘතියෙන් යාවත්කාලීන කෙරේ.

**ව්‍යුහය සහ පාලනය**

උපදේශක මණ්ඩලය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥයින් 11 දෙනෙකුගෙන් සමන්විත වන අතර සියලු දෙනා ම කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්යවරුන් වේ.

සී.ජී.එස්.යූ.කේ හි මෙහෙයුම් කමිටුව සමන්විත වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ උනන්දුවක් ඇති කැලණිය විශ්වවිද්‍යාලයේ කණිෂ්ඨ අධ්‍යයන සාමාජිකයින් 12 දෙනෙකුගෙන් වන අතර අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ ප්‍රධාන පරිපාලන නිලධාරී (සම්බන්ධීකාරක) වේ.

අධ්‍යක්ෂ ලෙස සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඊ.ඒ.ඩී. අනූෂා එදිරිසිංහ ද,නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සුලෝචනා රාමනායක ද, කේ.ඒ. හර්ෂනී නිමේෂිකා කරුණානායක ප්‍රධාන පරිපාලන නිලධාරි (සම්බන්ධීකාරක) ලෙස කටයුතු කරයි.

**සාමාජිකත්වය**

සීජීඑස්යුකේ හි වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සඳහා සාමාජිකයින්ගේ මැදිහත්වීම මත පදනම්ව සෑම වසර දෙකකට වරක් සාමාජිකත්වය අලුත් කළ හැකි ය. සීජීඑස්යූකේ හි වැඩසටහන් පරිපාලනය හා සහභාගීත්වය සඳහා පහසුකම් සැපයීම සඳහා සීජීඑස්යූකේ සාමාජිකත්ව කාණ්ඩ දෙකක් (සාමාන්‍ය සාමාජිකත්වය සහ ශිෂ්‍ය සාමාජිකත්වය) යටතේ ලබා දේ. සීජීඑස්යුකේ වෙත පැමිණීමෙන් ඔබට ඔබේ සාමාජිකත්වය ලබා ගත හැකි ය.

**සාමාන්‍ය සාමාජිකත්වය**

- කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලය
- කැලණිය විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය
- කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අපේක්ෂකයින්
- කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්

**ශිෂ්‍ය සාමාජිකත්වය - ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාවය පිළිබඳ සංසදය**



ස්ත්‍රී පුරුෂ සමානත්තාවය හා සමානාත්මතාවය සංසදය 2019 නොවැම්බර් 27 වන දින අලුතින් දියත් කරන ලදී. ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ සමානාත්මතාවය පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අධ්‍යයනයන් සඳහා උනන්දුවක් දක්වන කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් සඳහා සාමාජිකත්වය පිරිනමනු ලැබේ. මෙම කෙටි කාලය තුළ සිසුන් 800 කට වැඩි සංඛ්‍යාවක් සාමාජිකත්වය ලබා ගෙන ඇත. සීජීඑස්යුකේ වෙත පැමිණීමෙන් ඔබේ සාමාජිකත්වය ලබා ගත හැකි ය.

මේ හැරුණු විට ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ස්ත්‍රී සවිබලකරණය, ස්ත්‍රීත්වය සහ පුරුෂත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාව මූලප්‍රවාහකරණය (අධ්‍යයන සහ අනධ්‍යයන ) , ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී හිංසනය, තරුණ කාන්තාවන්ට සහ පුරුෂයන්ට එරෙහිව සිදු වන සයිබර් හිංසනය, නවකවදය වැළැක්වීම, යන ක්ෂේත්‍රවල විවිධ අන්තර්ක්‍රියාකාරී වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ. වැඩමුළු, දේශන, දිශානතිය සහ අන්තර් විශ්වවිද්‍යාල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වැඩසටහන් මේ වන විට සිදු කර ඇති අතර අනාගතය සඳහා වැඩමුළු, පර්යේෂණ හා අන්තර්ක්‍රියාකාරී වැඩසටහන් සැලසුම් කර ඇත.

අමතන්න

ආචාර්ය ඊ.ඒ.ඩී අනුෂා එදිරිසිංහ - අධ්‍යක්ෂ

දුරකථන - 070 3 226 522

විද්‍යුත් තැපෑල - anusha_edirisinghe@yahoo.com / edirisinghe@kln.ac.lk

හර්ෂනි කරුණානායක - ප්‍රධාන පරිපාලන නිලධාරී (සම්බන්ධීකාරක)

දුරකථන සහ ෆැක්ස් - 011 2 908 939 Ext: 831

විද්‍යුත් තැපෑල - cgsuk@kln.ac.lk / gendercgsuk@gmail.com

Facebook - https://www.facebook.com/Centre-for-Gender-Studies-University-of-Kelaniya-1593402887538988/

වෙබ් අඩවිය - https://units.kln.ac.lk/genderstu/

ස්ථානය - 1 වන මහල, ජ්‍යෙෂ්ඨ පොදු කාමර ගොඩනැගිල්ල

UGC CGEE හි නවක වදය සහ ලිංගික හිංසනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය (SGBV) පිළිබඳ පැමිණිලි පද්ධතිය

Web

Ragging – https://www.eugc.ac.lk/rag/

SGBV - https://www.eugc.ac.lk/sgbv/

Direct Calls/ IVR on

Ragging - +94 11 2 123700

SGBV - +94 11 3 056885

Emails

Ragging –ragginghelp@ugc.ac.lk / helpme@ugc.ac.lk

SGBV - director_cgee@ugc.ac.lk

# 20. ජාත්‍යන්තර සබඳතා මධ්‍යස්ථානය

**අධ්‍යක්ෂ**
මහාචාර්ය කේ.එල්.කේ.එන්.සී. ප්‍රේමවර්ධන මිය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
*B.A., M.Phil. (Kel'ya), Ph.D. (Siegen), Deutschlehrer Dipl. (Munich)*

**ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය.**
කැලණිය විශ්වවිද්‍යාලයේ විදේශීය විද්‍යාර්ථීන් පන්සියයකට අධික සංඛ්‍යාවක් සිටින අතර දේශීය විද්‍යාර්ථීන් වාර්ෂික ව සියයකට අධික ශිෂ්‍යත්ව ප්‍රමාණයක් පිරිනමනු ලැබේ. කැලණිය විශ්වවිද්‍යාලයේ නූතන භාෂා අධ්‍යයන අංශය, සංස්කෘත, පාලි සහ බෞද්ධ අධ්‍යයන අංශය, ලලිත කලා අධ්‍යයන අංශය විදේශීය විද්‍යාර්ථීන්ගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත් වී ඇත. තවද ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය මගින් විදේශ විශ්වවිද්‍යාල සමඟ සිදුකරන ඒකාබද්ධ පර්යේෂණ කටයුතුවලට ද අවශ්‍ය සහය විවිධ අයුරින් ලබා දෙනු ලැබේ.

**ජාත්‍යන්තර සහයෝගිතා ඒකකය**
ජාත්‍යන්තර සහයෝගිතා ඒකකයෙහි අරමුණ වන්නේ අන්තර්ජාතික පාර්ශවකරුවන් සමඟ සහයෝගිතාවයන් ඇති කිරීම, පර්යේෂණ සඳහා මුල්‍ය ප්‍රතිපාදන හඳුනා ගැනීම, යුරෝපීය හා ආසියානු විශ්වවිද්‍යාල සමඟ සහයෝගිතා ගිවිසුම් ඇති කිරීම, ශාස්ත්‍රීය සහයෝගීතාවන් ප්‍රවර්ධනය කිරීම, තාක්ෂණික දැනුම හුවමාරු කිරීම, අන්තර්ජාතික සම්භාවනාවට පාත්‍ර වූ පර්යේෂකයන් සඳහා අධිශිෂ්‍යත්ව ලබා දීම මෙම ඒකකය මගින් සිදු කෙරේ.

ජාත්‍යන්තර සහයෝගිතා ඒකකය මගින් පර්යේෂණ කටයුතු සහ ජාත්‍යන්තර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, විශ්වවිද්‍යාලය තුළ සිදුවන ජාත්‍යන්තර සබඳතාවලට අදාළ විවිධ කටයුතු පිළිබඳ ව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියට තොරතුරු ලබාදීම සහ යාවත්කාලීන කිරීම, මූල්‍යමය ප්‍රදාන ලබාගැනීමට ඇති අවස්ථා හඳුනාගැනීම සහ ඒ පිළිබඳ ප්‍රචාරණය කිරීම, ශිෂ්‍යත්ව සහ ඒ සඳහා මූල්‍යමය ප්‍රදාන ලබාදෙන නියෝජිතායතන, අනුග්‍රාහකයන්, ජාත්‍යන්තර පර්යේෂණ සහ අධ්‍යයන ආයතන සහ වෙනත් විශ්වවිද්‍යාලවල ජාත්‍යන්තර සහයෝගිතා මධ්‍යස්ථාන සමඟ ක්‍රියාකාරී සබඳතා පවත්වා ගැනීම යනා දි කටයුතු මෙම ඒකකය මගින් සිදු කෙරේ.

**ජාත්‍යන්තර ශිෂ්‍ය කටයුතු ඒකකය**
ජාත්‍යන්තර ශිෂ්‍ය කටයුතු ඒකකය මගින් කැලණිය විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි පිළිබඳව අවශ්‍ය තොරතුරු, උපදෙස් සහ මඟ පෙන්වීම විදේශීය විද්‍යාර්ථීන්ට ලබා දේ. තවද උසස් අධ්‍යාපන අමාත්‍යංශය හා ඒකාබද්ධව ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ විදේශීය විද්‍යාර්ථීන් පිළිබඳ සම්බන්ධීකරණය හා සංස්කෘතික වැඩසටහන් සංවිධානය මෙම ඒකකය මගින් සිදු කෙරේ. විශ්වවිද්‍යාල වෙබ් අඩවිය ඔස්සේ ශිෂ්‍යත්ව ප්‍රවර්ධනය කිරීම, තෝරාගත් විද්‍යාර්ථීන්, අධ්‍යයන සහ පරිපාලන කාර්යමණ්ඩලය සඳහා Erasmus Mundus, Erasmus+ සහ DAAD ශිෂ්‍යත්ව ප්‍රදාන සම්බන්ධීකරණය කිරීම ද සිදු කෙරේ.


| | | |
|---|---|---|
| දුරකථන අංකය | - | 011 2903797 |
| අභ්‍යන්තර අංකය | - | 797 |
| විද්‍යුත් ලිපිනය | - | cinta@kln.ac.lk |
| ෆැක්ස් අංකය | - | 011 2911485 |

# 21. තිරසාර විසදුම් මධ්‍යස්ථානය (CSS)

**අධ්‍යක්ෂ**
ආචාර්ය වසන්ති සුහසිංහ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.Sc.(Hon)(C'bo), Ph.D. (Mich' State)*

පාරිසරික ප්‍රතිපත්තියක් අනුගමනය කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජ්‍ය විශ්වවිද්‍යාලය වන්නේ කැලණිය විශ්වවිද්‍යාලය (UOK) වන අතර එහි සියළුම පාර්ශ්වකරුවන් තම හැසිරීම් වලදී පරිසරය කෙරෙහි නිසි සැලකිල්ලක් දැක්වීමට බැඳි සිටී. තිරසාර විසඳුම් මධ්‍යස්ථානය (CSS) යනු විශ්වවිද්‍යාලය තුළ පාරිසරික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත මධ්‍යස්ථානයක් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ. CSS හි ක්‍රියාකාරකම් සඳහා පීඨ මට්ටමේ ශිෂ්‍ය සංගම්/ සමාජ සහ පීඨ මට්ටමේ හරිත ප්‍රයෝගික කමිටු සහාය ද නිරන්තරයෙන් ලැබේ. Green Metric ලෝක හරිත විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම හරිත විශ්වවිද්‍යාලය බවට පත්වීමට කැලණිය විශ්වවිද්‍යාලයට හැකි ව තිබේ (UI Green Metric World University Rankings; Web: https://greenmetric.ui.ac.id/).

**දැක්ම**
"රටේ තිරසාර සංවර්ධනය උදෙසා පරිසර හිතකාමී ලෙස දායකත්වය සැපයීම."

**මෙහෙවර**
"ආසියාවේ ප්‍රමුඛතම හරිත සරසවිය බවට පත්වීම."

CSS හි කළමනාකරණ කමිටුව සමන්විත වන්නේ විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමනාකරණ දැනුම සහ තිරසාර ගැටළු හැසිරවීමට කුසලතා ඇති විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙනි.

**කමිටුවේ සාමාජිකයින්**
ආචාර්ය වසන්ති සුහසිංහ (අධ්‍යක්ෂ)
ආචාර්ය ඩී. එම්. පි. වී. දිසානායක (නියෝජ්‍ය අධ්‍යක්ෂ)

වාණිජ හා කළමනාකරණ පීඨය : ආචාර්ය කේ.පී.එම්.නානායක්කාර,නවිනී පෙරේරා මහත්මිය, ඒ. ජේ. පී. සමරවික්‍රම මහතා

පරිගණක හා තාක්ෂණ පීඨය : ආචාර්ය චානක උදයංග, ආචාර්ය ශකිලා පතිරණ, ආචාර්ය අමිලා ජීවන්දර

මානව ශාස්ත්‍ර පීඨය : ආචාර්ය දිල්රුක්ෂි රත්නායක

වෛද්‍ය පීඨය : මහාචාර්ය ඩබ්ලිව්. නිර්මලා එස් පෙරේරා

විද්‍යා පීඨය : මහාචාර්ය රංගික බණ්ඩාර, මහාචාර්ය මංගලා යටවර, ආචාර්ය ජේ. ඒ. සෙනෙවිරත්න

සමාජ විද්‍යා පීඨය : හෂාන් විජේසිංහ මහතා
අරුණ ශාන්ත මහතා (උද්‍යාන සංරක්ෂක - උද්‍යාන අංශය)

වෙබ් අඩවිය: www.kln.ac.lk/units/css

මුහුණු පොත: Centre for Sustainability Solutions

**හරිත විශ්වවිද්‍යාලයක් සඳහා ශිෂ්‍ය මාර්ගෝපදේශය**
කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛත ම හරිත විශ්වවිද්‍යාලයයි. විශ්වවිද්‍යාලයට 2014 දෙසැම්බර් සිට ක්‍රියාත්මක මෙහෙයුම් පාරිසරික ප්‍රතිපත්තියක් ඇත (CSS). එමගින් නව උපාධි අපේක්ෂකයින් ඇතුළු ව එහි සියලු ම පාර්ශවකරුවන් තිරසාරභාවයට අදාළ සියලුම ප්‍රතිපත්ති අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කරයි.

**හරිත විශ්වවිද්‍යාලයක් යනු කුමක්ද?**

"හරිත" යන වචනය ඇසූ පමණින් අප මනසට නැගෙන්නේ ගස් වැල් ය. සරල ව කිවහොත්, හරිත විශ්වවිද්‍යාලයක් පරිසරයට අවම බලපෑමක් ඇති කරමින් එහි සාමාන්‍ය මෙහෙයුම් සිදු කරයි. මීට අමතරව, කැලණිය විශ්වවිද්‍යාලය විසින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 17 (SDGs) ක්‍රියාත්මක කරයි. ඔබට වැඩිදුර තොරතුරු සොයා ගැනීමට අවශ්‍ය නම් අපගේ වෙබ් අඩවියට (CSS) සහ විශ්වවිද්‍යාලයේ SDG ලුහුබැදුම (https://www.kln.ac.lk/sdgpt/index.php) වෙත පිවිසෙන්න.

**හරිත ක්‍රියාකරුවෙකු වීමට !**

ශිෂ්‍යයෙකු වශයෙන්, ඔබට පහත ක්ෂේත්‍ර සඳහා දායක විය හැක.

**කාර්යක්ෂම බලශක්ති භාවිතය**
බලශක්ති අවශ්‍යතා සඳහා අපි ෆොසිල ඉන්ධන මත යැපෙන්නෙමු. ලෝකයේ ෆොසිල ඉන්ධන සම්පත ශීඝ්‍රයෙන් ක්ෂය වෙමින් පවතින අතර ඒ සමග ම පොසිල ඉන්ධන භාවිතයෙන් කාබන් ඩයොක්සයිඩ් සහ අනෙකුත් හරිතාගාර වායු වායුගෝලයට විමෝචනය වන අතර එය ගෝලීය උණුසුම හා දේශගුණික විපර්යාසවලට දායක වේ. බලශක්තිය කාර්යක්ෂම ව භාවිත කිරීම දේශගුණික විපර්යාස කෙරෙහි ඔබේ බලපෑම අඩු කරයි.



- හැකි සෑම විටම ස්වභාවික වාතාශ්‍රය / ආලෝකය භාවිත කරන්න.
- භාවිත නොකරන විට විදුලි පහන්, විදුලි පංකා, වායු සමීකරණ සහ අනෙකුත් විදුලි උපාංග නිවා දමන්න.
- හැකි සෑමවිටම බලශක්ති ඉතිරිකිරීමේ උපකරණ වෙත මාරුවන්න.
- ඔබගේ පරිගණක, දුරකථනවල අඳුරු තේමාව (Dark mode) භාවිත කරන්න.
- සියලුම පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර භාවිතයේ නොමැති විට power saving mode තබා ගන්න.
- උදේ 9.00 සිට සවස 3.30 දක්වා වායුසමීකරණ යන්ත්‍ර භාවිත කිරීම වඩාත් සුදුසුය.
- විදුලි සෝපාන වෙනුවට පඩිපෙළ භාවිත කරන්න.
- ඔබට සතියකට අවශ්‍ය ඇඳුම් එකවර අයන් කරන්න.

**ජලය සංරක්ෂණය කරන්න**

අපගේ ග්‍රහලෝකයේ පවතින ජලයෙන් (1%) කට වඩා අඩු ප්‍රමාණයක් මිනිස් පරිභෝජනයට සුදුසු වන අතර පානීය ගුණාත්මක ජලය නිෂ්පාදනය කිරීම සඳහා විශාල මුදලක් වැය වේ.



- කරුණාකර ජල කාන්දුවීම් (කැඩුණු කරාම, කැඩුණු පයිප්ප, ආදිය) පරිපාලනයට වාර්තා කරන්න.
- දත් මදින විට ජල කරාමය වසා දමන්න.

**අපද්‍රව්‍ය කළමනාකරණය කරන්න**

හැකිතරම් සම්පත් භාවිතය අවම කරන්න/හැකි සෑම විට ම සම්පත් නැවත භාවිතා කරන්න. කසල බැහැර කරන විට කරුණාකර වර්ගීකරණය කරන්න, එවිට අපට පහසුවෙන් ප්‍රතිචක්‍රීකරණය කළ හැක.

පහත විස්තර කර ඇති වර්ණ කේත පද්ධතියට අනුව අපද්‍රව්‍ය වර්ග කිරීමට සහ බැහැර කිරීම විශ්වවිද්‍යාලයීය පරිශ්‍රයට පැමිණෙන සෑම පුද්ගලයෙක් විසින් ම සිදු කළ යුතු වේ.

ඉවතලන ඉඳුල් සහිත ආහාර





ප්ලාස්ටික්






කඩදාසි





වීදුරු





මීට අමතර ව, මුහුණු ආවරණ ඉවත් කිරීම සඳහා පමණක් ලා නිල් පැහැයෙන් ලේබල් කර ඇති බඳුන් පමණක් භාවිත කරන්න.

ලන්ච් ෂීට්, ප්ලාස්ටික් බීමබට සහ පොලිතින් බෑග් භාවිතය තහනම් කර ඇති අතර ඉවත දැමිය හැකි ජල බෝතල් සහ වෙනත් එක්වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් භාවිතයෙන් හැකි සෑම විටම වලකින්න.







- නැවත භාවිත කළ හැකි වතුර බෝතල්, කෑම පෙට්ටි සහ බෑග් භාවිත කරන්න.
- ඔබට තවදුරටත් අවශ්‍ය නොවන භාණ්ඩ පරිත්‍යාග කරන්න හෝ විකුණන්න.

**කාබන් පියසටහන් අඩු කරන්න**

ඔබගේ පුද්ගලික කාබන් පියසටහන අඩු කිරීමට ඔබට කළ හැකි වෙනත් ඕනෑම ක්‍රියාවක් ධනාත්මක දායකත්වයකි. ඔබට දායක විය හැකි ක්‍රම කිහිපයක්

  - ඇවිදින්න / පාපැදියක් භාවිත කරන්න
  - පොදු ප්‍රවාහනය භාවිත කරන්න
- හැකිතාක් ඔබ ප්‍රදේශයේ නිෂ්පාදිත දෑ මිලට ගැනීමට හුරුවන්න. මක්නිසාදයත්, නිෂ්පාදිත ස්ථානයේ සිට පරිභෝජනය කරන ස්ථානය පවතින දුර වැඩි වන විට ඔබගේ කාබන් පියසටහන ද වැඩි කරයි.
- ගසක් සිටුවන්න.
- සම්පත් නාස්ති නොකරන්න.

අවසාන වශයෙන් හැකි සෑම විටම,

- CSS ශිෂ්‍ය ක්‍රියාකාරකම් හෝ පීඨ මට්ටමේ හරිත සමාජ/සමාජ ක්‍රියාකාරකම්වලට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන්න.
- ඔබේ ප්‍රජාව තුළ හරිත සංකල්පය පිළිබඳ ව දැනුවත් කිරීම් සිදුකරන්න .

**අපට එක්ව ලෝකය වෙනස් කළ හැක.....!**

# 22. සන්නිවේදන හා මාධ්‍ය ඒකකය
# කැලණිය විශ්වවිද්‍යාලය

**අධ්‍යක්ෂ**
සමන් රාජපක්ෂ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I
*B.A. (Kel'ya), M.Phil (Kel'ya)*

2007 අගෝස්තු 13 වන දින ආරම්භ කරන ලද කැලණිය විශ්වවිද්‍යාලයීය සන්නිවේදන හා මාධ්‍ය ඒකකය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන, සංවර්ධන හා ශිෂ්‍ය කේන්ද්‍රීය කටයුතු පිළිබඳ තොරතුරු ජනගත කිරීමේ මුඛ්‍ය අරමුණින් ක්‍රියාත්මක වේ. විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කෙරෙන අවස්ථා සඳහා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආවරණ ලබා දීම, විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවිය වෙත තොරතුරු සම්පාදනය, විශ්වවිද්‍යාලයීය ෆේස්බුක් (Facebook), ට්විටර් (Twitter), ලින්ක්ඩින් (Linkedin) හා යූටියුබ් (YouTube) යන සමාජ මාධ්‍ය ගිණුම් යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය තොරතුරු, ඡායාරූප හා වීඩියෝ සම්පාදනය කිරීමත්, විශ්වවිද්‍යාලය මඟින් නිකුත් කරනු ලබන පුවත් හසුන (Newsletter) සඳහා ප්‍රවෘත්ති ඇතුළු ඡායාරූප සැපයීමත් සන්නිවේදන හා මාධ්‍ය ඒකකය මඟින් සිදු කෙරේ.

කැලණිය විශ්වවිද්‍යාලයීය විවිධ පීඨ මඟින් හා අධ්‍යයන අංශ මඟින් පවත්වනු ලබන උත්සව හා සැමරුම් සඳහා මාධ්‍ය ආවරණය ලබා දීම, විද්‍යාර්ථීන්ගේ විෂය සමගාමී කටයුතු මෙන් ම විෂය පරිබාහිර කටයුතු සඳහා මාධ්‍ය ආවරණයන් ලබා දීම, උපාධි ප්‍රදානෝත්සව, ජාතික හා අන්තර්ජාතික සම්මන්ත්‍රණ, විශ්වවිද්‍යාලයීය නව පාඨමාලා හා ආදී විශ්වවිද්‍යාලයීය අධ්‍යයන හා අනධ්‍යයන කටයුතු පිළිබඳ තොරතුරු සමාජගත කිරීමත්, ඒ හරහා අප විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර හා බාහිර මහජන සම්බන්ධතාවය අඛණ්ඩ ව පවත්වාගෙන යාමත් මෙම ඒකකය හරහා සිදු වේ.

එමෙන්ම කැලණිය විශ්වවිද්‍යාලය මූලිකත්වයෙන් සිදුකරන පර්යේෂණ ඔස්සේ සම්පාදිත නව දැනුම සමාජය වෙත ගෙන යාම හා විද්‍යාර්ථීන්ට විෂය සමගාමී පුහුණු අවස්ථා ලබා දීම සඳහා ද සන්නිවේදන හා මාධ්‍ය ඒකකය මඟින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සන්නිවේදන හා මාධ්‍ය ඒකකය මඟින් 'නේමඬල' නමින් අන්තර්ජාල පුවත්පතක්, 'විදුලකර TV' නමින් යූටියුබ් නාලිකාවක් සහ 'විදුලකර' නමින් පුවත්පතක් පවත්වාගෙන යනු ලබන අතර ඉන් විශ්වවිද්‍යාලීය විද්‍යාර්ථීන්ගේ නිර්මාණාත්මක කුසලතා හා හැකියාවන් ඔප් නැංවීමටත්, එම නිර්මාණ බාහිර ලෝකය වෙත ගෙන යාමටත් ඉඩ හසර ලබා දේ. එමෙන් ම කාලීන සමාජීය අවශ්‍යතා මත විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කරනු ලබන දැනුම්වත් කිරීමේ වැඩසටහන් මෙහෙය වීම, ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා මාධ්‍ය ආවරණ ලබා දීම සිදු කරනු ලබන්නේ ද සන්නිවේදන හා මාධ්‍ය ඒකකය මඟිනි.

නව දැනුම සමාජගත කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙසත්, විශ්වවිද්‍යාලයේ එදිනෙදා විශේෂ සිදුවීම් හා සංවර්ධනාත්මක තොරතුරු ජනගත කිරීම සහ විශ්වවිද්‍යාලීය ප්‍රජාව හා බාහිර සමාජය අතර හොඳ හිත පවත්වාගෙන යමින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය හා කීර්තිනාමය ප්‍රවර්ධනය කිරීමටත්, කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සහ අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අන්තර් සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමටත් සන්නිවේදන හා මාධ්‍ය ඒකකය විසින් සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන අංකය | - | 011 2908016 | ෆැක්ස් අංකය | - | 011 2908016 |
| අභ්‍යන්තර අංක | - | 644, 645 | විද්‍යුත් ලිපිනය | - | media@kln.ac.lk |

# 23. ආබාධ සහිත සිසුන් සඳහා සම්බන්ධීකාරක මධ්‍යස්ථානය

**අධ්‍යක්ෂ**

එල්.බී.ටී.සී. ලොකුබාලසූරිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II

ආබාධිතතා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය

*B.Sc. in Speech and Hearing Sciences (Sp. In Speech and Language Therapy) (Kel'ya), PhD (C'bo)*

ආබාධ සහිත සිසුන් සඳහා වන සම්බන්ධීකාරක මධ්‍යස්ථානය (CCSD), විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ආබාධ සහිත සියලු සිසුන්ට සමාන ප්‍රවේශයක් ලබාදීම අරමුණු කරගනිමින් ඔවුන්ට අවශ්‍ය සහාය දීම සඳහා පවත්වාගෙන යනු ලබන සම්බන්ධීකරණ කේන්ද්‍රයක් වේ. ආබාධ සහිත සිසුන්ගේ පුද්ගල වර්ධනය සහ ස්වාධීනත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කාලීන සහ නිසි උපදෙස්, මග පෙන්වීම, හා වෛද්‍ය මනෝසමාජීය සහ ශාස්ත්‍රීය සහය මෙම මධ්‍යස්ථානය මගින් සපයනු ලැබේ.

එමෙන්ම ආබාධ සහිත සිසුන් සඳහා වන සම්බන්ධීකාරක මධ්‍යස්ථානය බාධක අවම කිරීම සහ අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම මගින්, ආබාධ සහිත සිසුන්ගේ විශ්වවිද්‍යාල ජීවිතයේ සෑම අංශයකම විවිධත්වය, සමානත්වය සහ සමානාත්මතාවාදීත්වය දිරිමත් කරයි. ආබාධිතතාවය විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති සහ භාවිතයන් තුළට කේන්ද්‍රීකරණය කිරීම සඳහා පවත්නා ගොඩනැගිලි නවීකරණය සහ වැඩිදියුණු කිරීම්, වර්තමාන ව්‍යවස්ථාදායකයට අනුකූලව නව යටිතල පහසුකම් ව්‍යාපෘති සැලසුම් කිරීම, සනීපාරක්ෂක සහ වැසිකිළි පහසුකම් මෙන් ම සුදුසු නේවාසිකාගාර පහසුකම් හා පුස්තකාල සම්පත් පුළුල් කිරීම සම්බන්ධ උපදෙස් ලබාදීම මෙයට ඇතුළත් වේ.

**අරමුණු**

- ආබාධ සහිත සිසුන්ට ඔවුන්ගේ අවශ්‍යතා සහ වෛද්‍ය අධ්‍යාපන මනෝ හෝ සමාජ-ආර්ථික ගැටලු ඇතුළු විවිධ කරුණු පිළිබඳ උපදේශකයෙකු හමුවී සාකච්ඡා කර උපදෙස් ලබාගැනීම සඳහා අවශ්‍ය සුරක්ෂිත අවකාශයක් ලබා දීම
- ආබාධිත හිතකාමී ඉගෙනුම් ක්‍රම සහ ඉගැන්වීමේ පරිසරයක් ඇති කිරීම හරහා සමාන අධ්‍යාපන ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම සඳහා සිසුන් සහ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය අතර මැදිහත්කරුවකු වීම
- එක් එක් ශිෂ්‍යයාට අනුව සාධාරණ ආදේශක සහ විභාගවලදී විශේෂ විධි විධාන සඳහා උපදෙස් ලබාදීම
- දේශන සහ සරසවි ජීවිතයට හොඳ ප්‍රවේශයක් ලබා ගැනීමට අවශ්‍ය විශේෂ ආධාරක තාක්ෂණය සහ ආබාධිත තත්ත්වය සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික සහ රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය කිරීම
- ආබාධ සහිත සිසුන් සඳහා වඩා යෝග්‍ය භෞතික සහ අධ්‍යයන ප්‍රවේශයන් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය බාධක රහිත, සියලුම පිරිස් අන්තර්ගත සහ ආබාධ-හිතකාමී පරිසරයක් ඇති කිරීමට ඇති හැකියාව සොයා බැලීම

මීට අමතර ව ආබාධ සහිත සිසුන්ට විශ්වවිද්‍යාලය ජීවිතයේ පූර්ණ හා සමාන සහභාගීත්වය ලබාදීම හා ඔවුන් ධෛර්යමත් කරමින්, මුහුණ දෙනු ලබන අධ්‍යාපන, චලන, අභියෝග, සමාජීය සහ ආකල්පමය බාධාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ද සම්බන්ධීකාරක මධ්‍යස්ථානය විසින් මෙහෙයවනු ලබයි.

ආබාධිතතා අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලයෙන් යුතු උපදේශන මණ්ඩලයකින් ආබාධ සහිත සිසුන් සඳහා වන සම්බන්ධීකාරක මධ්‍යස්ථානය සමන්විත වේ. කමිටුවේ සාමාජිකයන් සිසුන්ට අවශ්‍ය පරිදි හමුවීමට හැකිවනු ඇත.

ස්ථානය - BLOCK F1 (Room F1 003)
දුරකථන අංකය - 011 2903184 (ext. 184), 011 2958251

**කැලණිය විශ්වවිද්‍යාලයේ විශේෂ/ සමාන ප්‍රවේශය පිලිබඳ ප්‍රතිපත්තිය**

1. ආබාධ සහිත සිසුන්ගේ විශේෂ අවශ්‍යතා/ අනන්‍යතාව පිලිබඳ ස්වයං වාර්තා කිරීම
   විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි සිසුන්හට විශේෂ ප්‍රවේශ ප්‍රතිපත්තිය යටතේ සපයනු ලබන ප්‍රතිලාභ පිළිබඳ සලකා බැලීමට අයදුම්කළ හැකි ය. නව අයදුම්පත් නවක සිසුන්ට වෙබ් අඩවියෙන් හෝ කලණ මිතුරු සෙවනින් ලබා ගත හැකි ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් කලණ මිතුරු සෙවන වෙත විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි විමෙන් සති දෙකක් ඇතුළත භාර දිය යුතු ය.

   අනෙක් සිසුන්හට කලණ මිතුරු සෙවනෙන් අයදුම්පත් ලබාගත හැක. අයදුම්පත සලකා බැලීමට ශිෂ්‍යයා පාඨමාලාවේ ලියාපදිංචිව සිටිය යුතු ය. විභාගවලදී ලබාදෙන සාධාරණ ආදේශක සහ අයදුම් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ තොරතුරු සඳහා නවක සහ වර්තමාන සිසුන්ට ආබාධ සහිත සිසුන් සඳහා වන සම්බන්ධීකාරක මධ්‍යස්ථානය ඇමතිය හැකි ය.

**විශේෂ ප්‍රවේශ ලබාදීම සඳහා සුදුසුකම්:**

අ. විශේෂ ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වන ස්ථිර ශාරීරික තත්ත්වයන් (දෘශ්‍යාබාධිත, ශ්‍රවණාබාධිත, කායික විකෘතිතා)

ආ. විශේෂ ප්‍රවේශයක් අවශ්‍ය වන තාවකාලික ශාරීරික තත්වයන් (තුවාල/ අස්ථි බිඳීම්).

ඇ. වර්තමාන තත්වය විශේෂ ප්‍රවේශ ප්‍රතිපත්තිය යටතේ නැවත සලකා බැලීම.

2. විශේෂ ප්‍රවේශය/ සාධාරණ ආදේශක ඉල්ලුම් පත්‍ර ඇගයීම.
   ඉල්ලුම් පත්‍ර ඇගයීම ආබාධ සහිත සිසුන් සඳහා වන සම්බන්ධීකාරක මධ්‍යස්ථානයේ කමිටුව විසින් සිදුකරනු ලැබේ. වරප්‍රසාද/ සාධාරණ ආදේශක/ යථාවත් කරගැනීම් පිළිබඳ අවසන් නිර්දේශ පීඨාධිපතීන් සහ අංශ ප්‍රධානීන්ට කමිටුව විසින් ඉදිරිපත් කෙරේ.

3. වරප්‍රසාද/ සාධාරණ ආදේශක/ යථාවත් කරගැනීම් ලබාදීම.
   වරප්‍රසාද/ සාධාරණ ආදේශක/ යථාවත් කරගැනීම් ලබාදීම එක් එක් තත්වය අනුව තීරණය කරනු ලැබේ. මෙම වරප්‍රසාද/ සාධාරණ ආදේශක/ යථාවත් කරගැනීම් තම උපරිම හැකියාවන් ලබා ගැනීමට ඇති බාධක අවම කරගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සපුරා ගැනීමක් වේ. දැනට ලැබී ඇති ප්‍රතිලාභ යටතේ අධ්‍යයන කටයුතු කරගෙනයාම අපහසු නම් ඔහු/ ඇයට සංශෝධන ඉල්ලා සිටින ලිපියක් සමග නැවත අයදුම් කළ හැකි ය. මෙම අයදුම් පත්‍රය නව අයදුම් පත්‍රයක් සඳහා විස්තර කර ඇති පරිදි සලකා බලනු ලැබේ.

   විභාග සම්බන්ධ නිදහස් කිරීම්/ සාධාරණ ආදේශක ලබාදීම විශ්වවිද්‍යාලයේ විභාග අතුරු නීතී රීතිවලට අනුව සලකා බලනු ලැබේ. විභාග සඳහා අමතර කාලයක් ලබාදීම ශිෂ්‍යයා විසින් ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය වාර්තා/ සහතිකවලට යටත් වේ.

4. විශේෂ ප්‍රවේශ ප්‍රතිපත්ති සමග අනුකූලවීම.
   ආබාධ සහිත සිසුන් සඳහා අවශ්‍ය ශාරීරික සහ මානසික උපකාර සැපයීම සඳහා විශ්වවිද්‍යාලය විසින් තම සීමාවන් තුළ උපරිම ප්‍රයත්නයක් දරනු ඇත.

# 24. සංස්කෘතික මධ්‍යස්ථානය

**සම්බන්ධීකාරක**
ටී. එම්. එම්. කේ තෙන්නකෝන් මයා - කථිකාචාර්ය (ආධුනික)
*B.P.A. (UVPA), Sangeet Vishard (Bhathkande Sangeet Vidyapeet - Lucknow)*

**බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය මඟින් අනුයුක්ත කරන ලද නිලධාරී.**
දීප්ති බස්නායක - ස්ථානභාර නිළධාරී
*B.A (Kelaniya)*

බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘතික මධ්‍යස්ථානය 2001 වර්ෂයේදී පිහිටුවන ලද අතර ලලිත කලා අධ්‍යයන අංශයේ අධීක්ෂණය යටතේ, ලලිත කලා අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයාගේ උපදේශකත්වය හා නිර්දේශය මත මානවශාස්ත්‍ර පීඨාධිපතිවරයා විසින් උපකුලපතිවරයා වෙත නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු එහි සම්බන්ධීකාරකවරයා ලෙස කටයුතු කරනු ලබයි. එම ප්‍රධාන මධ්‍යස්ථානය දැනට ශ්‍රී ධර්මාලෝක උපාධි ප්‍රදානෝත්සව ශාලා පරිශ්‍රයේ (BLOCK A-1–106) පවත්වාගෙන යනු ලබයි. මීට අනුබද්ධ ව රාගම වෛද්‍ය පීඨයේ ද සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත. මෙම මධ්‍යස්ථාන දෙකෙහි ම විශ්වවිද්‍යාල සම්බන්ධීකරණ සහ අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබන්නේ උපකුලපතිතුමාගේ අනුමැතියෙන් පත් කරනු ලබන ප්‍රධාන සම්බන්ධීකාරකවරයා විසිනි. එලෙස ම, අමාත්‍යාංශය සමග සෘජු සම්බන්ධීකරණය සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන ප්‍රධාන ස්ථානභාර සංස්කෘතික නිලධාරී මගින් සිදුකෙරෙන අතර රාගම වෛද්‍ය පීඨයේ පිහිටුවා ඇති උප මධ්‍යස්ථානයෙහි පරිපාලන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය එහි සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී විසින් ප්‍රධාන මධ්‍යස්ථානය භාර නිලධාරී මගින් අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි.

විශ්වවිද්‍යාල ප්‍රජාව විසින් සිදු කරනු ලබන සියලු ම කලා හා සංස්කෘතික කටයුතු සඳහා නන් අයුරින් දායක වීම ද, විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතුවලට සරිලන අයුරින් විද්‍යාර්ථීන් සඳහා මෙන් ම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල භවතුන් ඇතුළුව සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවගේ ම සමාජ සහජීවනය උදෙසා විවිධ සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද කැලණිය විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථ වේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ සියලු ම පීඨයන්හි විද්‍යාර්ථීන් මෙන් ම, එහි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට තම අධ්‍යයන සහ වෘත්තීය කටයුතුවලට අමතරව අතිරේක වශයෙන් කලා හා වෘත්තීය මාර්ගෝපදේශ පාඨමාලා හැදෑරීමට මෙමගින් අවස්ථාව සලසා දී ඇත. නර්තන (උඩරට, පහතරට, සබරගමු, රංග වින්‍යාස) සහ සංගීත (පෙරදිග සහ අපරදිග), සංගීත සංරචනය, නාට්‍ය හා රංග කලා පාඨමාලාව, ඡායාරූප ශිල්ප පාඨමාලාව, පරිගනක පාඨමාලාව වැනි ශාස්ත්‍රීය පාඨමාලා මෙන් ම, විශ්වවිද්‍යාලයේ අලුතෙන් ආරම්භ කර තිබෙන සෞන්දර්ය හා වෘත්තීය අභිමුඛ පාඨමාලා ඉදිරි වර්ෂයේදී හඳුන්වා දීමට බලාපොරොත්තු වේ. තවද රූපලාවන්‍ය සහ අත්කම් නිර්මාණ පාඨමාලාව ද මෙහි පවත්වාගෙන යනු ලැබේ. මෙම පාඨමාලා සඳහා අඛණ්ඩව සහභාගීවන විද්‍යාර්ථීන්ට සහ අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පාඨමාලා අවසානයේ පැවැත්වෙන ලිඛිත සහ ප්‍රායෝගික ඇගැයීම්වල ප්‍රතිඵල අනුව විශ්වවිද්‍යාලය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය එක් ව පිරිනමනු ලබන සහතිකයක් හිමි වේ. මෙම සංස්කෘතික මධ්‍යස්ථානයේ ලියාපදිංචි සාමාජික සාමාජිකාවන්ට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය මගින් වාර්ෂික ව පවත්වනු ලබන ජාතික හා ජාත්‍යන්තර වැඩසටහන් සඳහා සහභාගී වීමට ද අවස්ථාව සැලසේ.

එමෙන් ම ගෝලීය වශයෙන් හා ලාංකීය සමාජ සංස්කෘතියට මහත් බලපෑමක් ඇති කළ COVID 19 වසංගත තත්ත්වය යටතේ මෙම කලා හා සංස්කෘතික කටයුතු නව වැඩපිළිවෙලක් යටතේ මාර්ගගත අධ්‍යයන ක්‍රමවේදයක් යටතේ සිදු කිරීමට කටයුතු යොදා ඇත. මෙම පාඨමාලා වෙනුවෙන් න්‍යායික හා ප්‍රායෝගික අධ්‍යයන කටයුතු සඳහා ජාතික මට්ටමින් කලා ක්ෂේත්‍රයේ පළපුරුදු පුද්ගලයන් සහ විශ්වවිද්‍යාලයේ එම විෂය ක්ෂේත්‍ර හා අදාළ ප්‍රවීණත්වයක් ඇති ආචාර්ය භවතුන්ගේ දායකත්වය හා අධීක්ෂණය ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

සංස්කෘතික මධ්‍යස්ථානය විසින් එළිදක්වනු ලබන **සංසේවී** වාර්ෂික සංස්කෘතික සාර සංග්‍රහය විද්‍යාර්ථීන්ට මෙන්ම අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලයේ ශාස්ත්‍රීය නිර්මාණ ප්‍රකාශයට පත් කිරීම සඳහා 2021 වර්ෂයේ සිට කටයුතු සම්පාදනය කොට ඇති අතර මෙය නව මුහුණුවරකින් ප්‍රකාශයට පත් කිරීමටත් කටයුතු යොදා ඇත.

ශ්‍රී ලාංකීය ජන සමාජයෙහි සංස්කෘතික සහ කලා කටයුතු සංවර්ධනය උදෙසා අදාළ අමාත්‍යාංශය මගින් දියත් කරනු ලබන හරවත් වැඩසටහන් විශ්වවිද්‍යාලයෙහි ක්‍රියාත්මක කිරීම සහ විශ්වවිද්‍යාලය කේන්ද්‍ර කර ගනිමින් අවට ජන සාමාජයේ සංස්කෘතික ජන ජීවිතය හරවත් කිරීමට අවශ්‍ය යැයි හැඟෙන සංස්කෘතික ව්‍යාපෘති හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම ද මෙමගින් අපේක්ෂිත ය.

| | | | | |
|---|---|---|---|---|
| දුරකථන අංක | - | 071-5180518 | - | සම්බන්ධීකාරක |
| | - | 071-8071703 | - | ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී |
| අභ්‍යන්තර අංක | - | 770 | | |
| ෆැක්ස් අංකය | - | 011-2908787 | | |

# 25. කළණ මිතුරු සෙවණ

**අධ්‍යක්ෂ**

ආචාර්ය කේ. ආර්. එන්. හර්ෂණි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
*B.A.(Kel'ya), MSSc (Kel'ya), Ph.D. (Malaysia)*
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය

විද්‍යාර්ථීන්ගේ මානසික හා අධ්‍යාපනික ගැටලුවලට සහනයක් ලබා දීම පිණිස පිහිටුවන ලද උපදේශන මණ්ඩලයක් මගින් මනෝවිද්‍යාත්මක උපදේශන සේවාවක් විශ්වවිද්‍යාලයෙහි ක්‍රියාත්මක වේ. මෙම උපදේශන මණ්ඩල සාමාජිකයෝ සියල්ලෝ ම විශ්වවිද්‍යාලයේ ආචාර්යවරු වෙති. විද්‍යාර්ථීන්ගේ ගැටලු සහ ඒවාට විසඳුම් විද්‍යාර්ථීන්ට ම හඳුනා ගැනීම සඳහා උපකාර කිරීම මෙම උපදේශන සේවයේ පරමාර්ථය වේ. ගැටලුවලට සාවධාන ව සවන් දී පෞද්ගලික තොරතුරුවල රහස්‍ය භාවය ආරක්ෂා කොට ඔබ නියමිත මාර්ගය කරා යොමු කරවා, ඔබේ සරසවි ජීවිතය යහපත් තත්ත්වයකට පත් කිරීමට දයාබරිතව සහාය වීම මෙම උපදේශන මණ්ඩලයේ ප්‍රධාන කාර්යයකි. වඩාත් බරපතළ මානසික ගැටලුවල දී ප්‍රතිකර්මවලට යොමු කිරීම සඳහා අදාළ උපදෙස් මෙම සේවාව මගින් ලබාදෙනු ලැබේ. මීට අමතර ව ගැටලු වළක්වා ගැනීමට සහ සිසුන්ගේ සංවර්ධනයට අවශ්‍යය වැඩමුළු දේශන සහ දැනුවත් කිරීම් සේවා මේ මගින් සපයනු ලබයි. 2019 වර්ෂයේ සිට මෙම ඒකකය මගින් විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයන් සඳහා සහයෝගිතා උපදේශන සහතික පත්‍ර පාඨමාලාවක් හඳුන්වාදී ඇත.

**උපදේශකවරු**

පූජ්‍ය කුඹුකන්දන රේවත හිමි - දර්ශන අධ්‍යයනාංශය
*B.A. (Perad'ya), M.phil. (Kel'ya), Dip. in Counseling (IPS)*
පූජ්‍ය බෝපෙත්තේ සෝමානන්ද හිමි- පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය
*B.A. (Kel'ya)*
මහාචාර්ය එස්.එස්. වැලිගමගේ මිය - මූල්‍ය අධ්‍යයනාංශය
*B.Com. (Ruhuna), MBA (AIT- Thailand) MEB (ESCP-EAP-UK), Ph.D. (Panjab), CBA (CASL), PGD in Counseling (C'bo)*
ආචාර්ය අනුෂා නිල්මිණි සල්වතුර මිය - හින්දි අධ්‍යයනාංශය
*B.A. (Kel'ya), Mphil (Kel'ya), Ph.D. (Kel'ya)*
ආචාර්ය ඩී.එන්. වික්‍රමාරච්චි මිය - කර්මාන්ත පරිපාලන අධ්‍යයනාංශය
*B.Sc. (Kel'ya), M.Sc. (C'bo), Ph.D. (La Trobe, Australia)*
ආචාර්ය එන්.ඩී.ජී. ගයන්ත මයා - දර්ශන අධ්‍යයනාංශය
*B.A. (S.J'pura), Ph.D. (S.J'pura ), Dip in Counselling Psychology (SLMHF), Advanced Dip in Psychotherapy (SLMHF)*
බුද්ධික ජයසුන්දර මයා - සිංහල අධ්‍යයනාංශය
*B.A. (Kel'ya), M.phil. (Kel'ya)*
ආචාර්ය අමිල කලුආරච්චි මයා - පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
*B.A. in Buddhist Philosophy (S.J'pura), MA (PBU) Ph.D. (S.J'pura), Dip in Counselling Psychology (SLMHF)*
ඩී.ඒ.එස්.ජී. ගොඩමුණේ මෙය - ශාරීරික අධ්‍යාපන අංශය
*B.A. (Kel'ya), Dip in Exercises Sport Science (Perad'ya)*
එච්.ජේ.ආර්. බුද්ධික මයා - මූල්‍ය අධ්‍යයනාංශය
*B.B.Mgt. (Finance) (Kel'ya), M.A. (Kel'ya), MBA (PIM-SJP), ACPM, Reading for M.Phil (NIIBS)*
ආචාර්ය ජානි සමරකෝන් - නූතන භාෂා අධ්‍යයනාංශය
*B.A. (Kel'ya), M.A. in Linguistics (Kel'ya), Ph.D. (China)*
ඊ.ඒ. ඉමාලි එදිරිසූරිය මිය - නූතන භාෂා අධ්‍යයනාංශය
*B.A. (Kel'ya), M.A. (Korea)*

කේ.ඩී.එන්. ප්‍රනාන්දු මහත්මිය - දර්ශන අධ්‍යයනාංශය
*B.A. (Kel'ya), M.Phil. (S.J'pura)*
ඒ.එස්.පී. රූපසිංහ මහත්මිය - දර්ශන අධ්‍යයනාංශය
*B.A. (Perad'ya), M.Phil. (Perad'ya),Dip.in Couìeling (S'Jpura)*
ආචාර්ය එම්.එම්.එස්. හරිස්චන්ද්‍ර මහත්මිය - දර්ශන අධ්‍යයනාංශය
*B.A. (Kel'ya), M.S.Sc. (Kel'ya), Ph.D. (BPU)*
ආචාර්ය පී. පී. සී. සිරිවර්ධන මිය - දර්ශන අධ්‍යයනාංශය
*B.A. (Kel'ya),M.A.(Kel'ya),Ph.D. (S.J'pura)*
එම්.එම්.ඕ.වී. හේරත් මිය - දර්ශන අධ්‍යයනාංශය
*B.A. (Kel'ya), M.Phil. (C'bo),PQHRM (CIPM), Dip.in Counselling Psychology (RIPC),Dip. In English (AQUINAS)*
කේ.එම්.එස්. රුවින්ද මයා - සත්ත්ව විද්‍යා සහ පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය
*B.Sc. (Kel'ya), M.Phil. (Kel'ya)*
මහාචාර්ය එම්.කේ.බී.වීරසූරිය මිය - රසායනික විද්‍ය අධ්‍යයනාංශය
*B.Sc. (Kel'ya), Ph.D. (Bristol,UK)*
මහාචාර්ය පී.ඒ.එස්.ආර් වික්‍රමාරච්චි මිය - රසායන විද්‍යා අධ්‍යයනාංශය
*B.Sc. (Kel'ya), Ph.D. (Sheffield Hallam,UK)*
ආචාර්ය යූ.කේ. අබේවර්ණ මිය - භෞතික විද්‍යා ඉලෙක්ට්‍රෝනික විද්‍යා අධ්‍යයනාංශය
*B.Sc., M.Sc. (Perad'ya), Ph.D. (C'bo)*
ආචාර්ය එච්.ඒ.සී.සී. පෙරේරා - සත්ත්ව විද්‍යා සහ පාරිසරික විද්‍යා අධ්‍යයනාංශය
*B.Sc. (Kel'ya), MSc (Kel'ya), Ph.D. (China)*
විමංසා රණසිංහ මිය - මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය
*B.Sc. (Special) HRM (S.J'pura), MBA (PIM- S.J'pura ), National Dip. In Counselling*
රසිකා හර්ෂණී මිය - මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය
*B.B.Mgt. (Special) In HR, MBA (PIM)*
හර්ෂිකා ඒකනායක මිය - මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය
*B.B.Mgt. (Special), HRM ((Kel'ya), MBA in IT (Mora'wa) Reading, MHRM (Kel'ya) Reading, Dip in Counselling (MHF)*
ආචාර්ය මුදිතා තිසේරා මිය - මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයනාංශය
*B.Sc.in Management Information System (UCD,Ireland), MSc (C'bo), Ph.D. (C'bo)*
ආචාර්ය රසික රාජපක්ෂ මයා - පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය
*B.Sc.(Special)(SL),Ph.D Math(UCF,USA),M.Sc.(UCF,USA), M.Sc.(UNF,USA),P.G.D(BCS,UK), Post-Doctoral, Data Science (UWYO,USA)*
ආචාර්ය කසුන් ප්‍රනාන්දු මයා - ව්‍යවහාරික පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය
*B.Sc (Sp.) in Physics (S.J'pura), M.Sc. in physics(UofL, USA), Ph.D. (UofL,USA) in Electrical and Computer Engineering*
කෞමදී බමුණුසිංහ මිය - වාග්විද්‍යා අධ්‍යයනාංශය
*B.A. (Kel'ya), M.A. (Kel'ya), M.Phil. (Kel'ya)*
සම්පත් පෙරේරා මයා - නාට්‍ය සහ ප්‍රතිබිම්බ කලා ඒකකය
*B.A. (Hon) (Kel'ya), M.A. (Kel'ya), PGDE (C'bo)*
එම්.ආර්.ජී. කරුණාරත්න මයා - දර්ශන අධ්‍යයනාංශය
*B.A. (Perad'ya), M.Phil. (C'bo), Mssc.(Kel'ya)*
මහාචාර්ය ඕෂාන්ත එන්. තල්පාවිල මයා - දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය
*B.A. (C'bo), M.A. (C'bo), MSSc.(Kel'ya), Ph.D.(USM,Pulau Penang)*
ආචාර්ය චතුර ලියනගේ මයා - මූල්‍ය අධ්‍යයනාංශය
*B.B.Mgt. (Kel'ya), ACMA(UK), MBA(C'bo), Ph.D.(OUSL), PMP (USA)*
ආචාර්ය අමිලා ජීවන්දර මිය - ව්‍යවහාරික පරිගණක අධ්‍යයනාංශය
*BSc. (C'bo SL), MBA. (USA), Ph.D.(USA), GREENSL®AccP*
කේ. පී. එච්.එම්.කාරියවසම් - සහකාර ශිෂ්‍ය උපදේශක

*B.A. (Kel'ya), M.A.(Kel'ya), Dip in Counseling Psychology (MHF), Ad Dip in Psychology (MHF), Dip. In Drug Counseling (NDDCB)*

සතියේ දිනවල කාර්යාල වේලාවන්හි දී ඃ පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා මෙම උපදේශන සේවාව ක්‍රියාත්මක වෙයි. එම ඒකකය BLOCK F1 (F1 003) ගොඩනැගිල්ලේ පිහිටා ඇත.

| | | |
|---|---|---|
| දුරකථන අංක | - | 011 2903184, 011 2917710 |
| අභ්‍යන්තර අංකය | - | 184 |
| විද්‍යුත් ලිපිනය | - | kms@kln.ac.lk |

# 26. වෛද්‍ය මධ්‍යස්ථානය

**ප්‍රධාන වෛද්‍ය නිලධාරි**
වෛද්‍ය චින්තක සංජීව රත්නායක
*MBBS (Cey) MCGP(SL) PGPN (USA - Boston)*

**විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරි**
වෛද්‍ය එන්. තිවංක ද සිල්වා
*MBBS (C'bo), MNS (USA)*

විශ්වවිද්‍යාල සෞඛ්‍ය සේවය සංවිධානය වී ඇත්තේ සිසුන්ගේ හා සියලු ම විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලයේ ශාරිරික හා මානසික සෞඛ්‍ය ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යාම හා රෝගවලින් තොර ක්‍රියාශීලි ජීවිතයක් ගත කිරීම සඳහා දායකවීම අරමුණු කර ගෙනය. වෛද්‍ය මධ්‍යස්ථානයේ බාහිර රෝගී ප්‍රතිකාර, දිවා සුරැකුම් ප්‍රතිකාර කිරීම් සහ හදිසි ප්‍රතිකාර කිරීම් සිදු කරන අතර අවශ්‍යතාවය මත රෝගීන් අදාළ සායන හෝ රෝහල් වෙත යොමු කිරීම සිදු කරනු ලැබේ. මේ සඳහා අවශ්‍ය මනා පුහුණුව ලත් කාර්යය මණ්ඩලයක් මෙන් ම, රසායනාගාර පහසුකම්, ඖෂධ ලබාගැනීමේ පහසුකම් සියල්ල වෛද්‍ය මධ්‍යස්ථානය සතුය. මීට අමතර ව දන්ත වෛද්‍ය පහසුකම් මෙන්ම දේශීය ආයුර්වේද වෛද්‍ය පහසුකම් ලබාගැනීම සඳහා අවශ්‍ය සියලු ම පහසුකම් වෛද්‍ය මධ්‍යස්ථානය තුළ පවතී. මෙම සේවා සියල්ල විශ්වවිද්‍යාල ප්‍රජාව වෙත විශ්වවිද්‍යාලය මගින් නොමිලයේ සපයනු ලැබේ. රජයේ නිවාඩු දිනයන්හි සහ පෝය දිනයන්හි හැර සතියේ වැඩ කරන දිනයන්හිදී පෙ.ව.9.00 සිට ප.ව.4.00 දක්වා විශ්වවිද්‍යාලයීය වෛද්‍ය මධ්‍යස්ථානය විවෘතව තැබේ. මීට අමතර ව අවශ්‍යතාවය මත බාහිර රෝග ප්‍රතිකාර සේවාව පස්වරු 4.00 සිට රාත්‍රී 8.00 දක්වා සිසුන් සඳහා පමණක් සිදු කරනු ලබයි.

මීට අමතර ව විශේෂඥ මානසික සෞඛ්‍ය ඒකකයක් වෛද්‍ය මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇත. එහි සේවාවන් සෑම මසක ම තෙවරක් කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මනෝ විද්‍යා ඒකකය හා ඒකාබද්ධව සිදු කරනු ලැබේ. මෙමගින් සිසුන්ගේ මානසික ගැටලු සඳහා විශේෂඥ උපදෙස් සහ මානසික රෝග සඳහා වෛද්‍ය ප්‍රතිකාර නොමිලේ සිදු කරනු ලැබේ. තවද සිසුන්ගේ මානසික ගැටලු පිළිබඳ රහස්‍යභාවය මනා ලෙස ආරක්ෂා වන ආකාරයට මෙම සායනය සිදු කරනු ලැබේ. සිසුන්ගේ සෞඛ්‍ය හා රෝග නිවාරණ කටයුතු මෙන්ම ශිෂ්‍ය උපදේශනය පිළිබඳවද මනා පුහුණුවක් විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරීන් සතුය. ශිෂ්‍ය උපදේශන ලබාදෙන අවස්ථාවන්හිදී රහස්‍යභාවය මනා ලෙස ආරක්ෂා කරන අතර, උපදේශන සඳහා වෛද්‍ය මධ්‍යස්ථානය විවෘතව පවතින කාල සීමාවන් තුළ දුරකථන අංකය (0112903152) මගින් වෛද්‍යවරයා හමුවිය හැකි වේලාවක් ප්‍රධාන හෙදි පාලිකා මගින් ලබා ගත හැකි ය.

විශ්වවිද්‍යාලය තුළ ප්‍රජා සෞඛ්‍ය, සනීපාරක්ෂක කටයුතු සහ බෝවන රෝග නිවාරණය සම්බන්ධ ව සියලු කටයුතු විශ්වවිද්‍යාලයීය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් විශ්වවිද්‍යාලයීය ප්‍රධාන වෛද්‍ය නිලධාරී අධීක්ෂණය යටතේ සිදුකරනු ලැබේ.

**අසනීප අවස්ථාවන්හි දී නිවාඩු ලබා ගැනීමේ දී, සිසුන් විසින් වෛද්‍ය සහතික ඉදිරිපත් කළ යුතු ය. විශ්වවිද්‍යාල බලධාරීන් පහත දැක්වෙන වෛද්‍ය සහතික පමණක් පිළිගනු ලැබේ.**

**01. විශ්වවිද්‍යාල වෛද්‍ය සහතික**

විශ්වවිද්‍යාල වෛද්‍යවරයෙකු හෝ විශ්වවිද්‍යාල ආයුර්වේද වෛද්‍යවරයෙකු විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික.

**02. රජයේ රෝහලකින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික**

රජයේ වෛද්‍ය ආයතනයක හෝ රජයේ රෝහලක වෛද්‍ය සහතික සහ බෝවන රෝග සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකු **(MOH)** විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික

**03. පෞද්ගලික වෛද්‍ය සහතික**

ඍජයේ ලියාපදිංචි පුද්ගලික වෛද්‍ය නිලධාරී /විශේෂඥ වෛද්‍ය / පෞද්ගලික රෝහල් වලින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරිවරයෙකු විසින් සහතික කළ යුතු වේ. (එවැනි පුද්ගලික වෛද්‍ය සහතික සති දෙකක් ඇතුළත අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු ය.)

**විභාග ශාලාට පෙනී නොසිටීම හේතුවෙන් ඉදිරිපත් කරනු ලබන පුද්ගලික වෛද්‍ය සහතික විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් නිකුත් කළ වෛද්‍ය සහතික පමණක් අනුමත කරනු ලැබේ.**

**04. පෞද්ගලික ආයුර්වේද වෛද්‍ය සහතික**

යක්කල ආයුර්වේද රෝහලෙන් හෝ විශ්වවිද්‍යාල ආයුර්වේද වෛද්‍ය නිලධාරි විසින් පෞද්ගලික ආයුර්වේද වෛද්‍ය සහතික අනුමත කළ යුතු වේ.

සැ.යු: පුද්ගලික වෛද්‍යවරුන්ගෙන් ලබාගෙන ඉදිරිපත් කරන වෛද්‍ය සහතික වල අනන්‍යතාව තහවුරු කිරිම සඳහා සිසුන් විසින් වෛද්‍ය සහතිකයට අමතර ව අදාළ රෝග විනිශ්චය පත්‍ර,එක්ස් කිරණ, ලේ, මූත්‍රා වාර්තා, බෙහෙත් වට්ටෝරු ආදිය විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරින්ට (UMO) ඉදිරිපත් කළ යුතු ය. එවැනි වාර්තා පරීක්ෂා කිරිමෙන් පසුව විශ්වවිද්‍යාල වෛද්‍යවරයා සෑහිමකට පත්වන්නේ නම් පමණක් පෞද්ගලික වෛද්‍යවරුන්ගෙන් ලබාගත් වෛද්‍ය සහතික අනුමත කරනු ලැබේ. සිසුවෙකුගේ ආසන්න ම පවුලේ සාමාජිකයකුගේ අවමඟුල් කටයුත්තක් සඳහා නිවාඩු ලබාගැනිමේ දී, ඔහු හෝ ඇය විසින් මරණ සහතිකය වැනි ප්‍රමාණවත් සහතිකයක් විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු ව ඇත.

සියලුම සිසුන් විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරනු ලබන වෛද්‍ය වාර්තාව, රජයේ රෝහලක/MBBS වෛද්‍යවරයකු මගින් සහතික කර වෛද්‍ය මධ්‍යස්ථානයට යොමු කිරීම අනිවාර්යය වේ.

දුරකථන අංක

| | | |
|---|---|---|
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී (CMO) | - | 011 2903150 / 011 2917707 |
| විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී (UMO) | - | 011 2903155 |
| දන්ත වෛද්‍ය නිලධාරී (Dental Surgeon) | - | 011 2903154 |
| හෙදි පාලිකාව (Matron) | - | 011 2903152 |
| කාර්යාලය (Office) | - | 011 2903153 |
| විද්‍යුත් ලිපිනය | - | medc@kln.ac.lk |

# 27. ශාරීරික අධ්‍යාපන අංශය

**වැඩබලන ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ**
ජී.ජී.යූ. සමන් කුමාර මයා
*Dip in MOSO (IOC), Dip in Sports (NISS)*

**ශාරීරික අධ්‍යාපන උපදේශකවරු**
එච්.ඩී.එස්.පී. විජයගුණරත්න මයා
*B.Sc. (SP) in Mathematics (Kel'ya), PG Dip. in Applied Statistics (C'bo), Dip in MOSO (IOC)*
කේ.එන්.එස්. කුමාරි මිය
*B.A. (Kel'ya), Dip in Phy Ed. & Sports Mgt (Rajarata), Dip. in Exercises and Sports Science (Perad'ya)*
ජී.ඒ.එස්.ජී. ගොඩමුණේ මෙය
*M.A in Sociology , B.A. (SP) in Sports and Recreation Management (Kel'ya), Dip. in Exercises and Sports Science (Perad'ya), PG Dip in Physical Education (Perad'ya)*
එච්.එම්.කේ.ටී. කරුණාරත්න මිය
*B.A. (SP) in Sports and Recreation Management (Kel'ya), Dip. in Exercises and Sports Science (Perad'ya)*
එම්.අයි.පී. කුමාරි මෙය
*B.A. (SP) in Sport and Recreation Management (Kel'ya),M.Phil. in Sports Science, Dip. in Exercises and Sports Science(Perad'ya)*
ජේ.එම්.ජේ. අතුකෝරල මයා
*B.Sc. (Kel'ya), Dip. in Exercises and Sports Science (Perad'ya)*
ජී.ආර්.සී. කුලරත්න මයා
*B.Sc. (SP) in Sport Science and Management (Sabara'wa)*

විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා කටයුතු සංවිධානය කිරීම මෙම අංශයේ කාර්ය භාරයයි. මෙම අංශය මගින් පවත්වා ගෙන යනු ලබන ශාරීරික අධ්‍යාපන වැඩසටහන විශ්වවිද්‍යාල ප්‍රජාවගේ අවශ්‍යතාවන්ට අනුකූල ව සකස් කරන ලද සැලසුම් සහගත වැඩසටහනකි. මෙම ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපන වැඩසටහන විද්‍යාර්ථීන්ගේ ජීවන කුසලතා වර්ධන අත්දැකීමක් පමණක් නොව ඔවුන්ගේ සාමාන්‍ය ශාරීරික යෝග්‍යතාවය නිසිලෙස පවත්වාගෙන යාමටද සෘජුවම ඉවහල් වේ. ශාරීරික අධ්‍යාපන අංශය මගින් විද්‍යාර්ථීන් වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන පිළිගත් ක්‍රීඩා ප්‍රමාණය 27කි. එම ක්‍රීඩාවන් පහත පරිදි වේ:

| | | | |
|---|---|---|---|
| ඇරොබික්ස් ජිම්නාස්ටික් | (කාන්තා) | කරාටේ | (පිරිමි/කාන්තා) |
| බැඩ්මින්ටන් | (පිරිමි/කාන්තා) | රග්බි | (පිරිමි) |
| බේස් බෝල් | (පිරිමි/කාන්තා) | ස්ක්‍රැබල් | (පිරිමි/කාන්තා) |
| බොක්සිං | (පිරිමි) | පිහිනුම් | (පිරිමි/කාන්තා) |
| පැසිපන්දු | (පිරිමි/කාන්තා) | ඉලක්කයට වෙඩිතැබීම | (පිරිමි/කාන්තා) |
| කැරම් | (පිරිමි/කාන්තා) | මේස පන්දු | (පිරිමි/කාන්තා) |
| චෙස් | (පිරිමි/කාන්තා) | ටයිකොන්ඩො | (පිරිමි/කාන්තා) |
| ක්‍රිකට් | (පිරිමි) | ටෙනිස් | (පිරිමි/කාන්තා) |
| එල්ලේ | (පිරිමි/කාන්තා) | මලලක්‍රීඩා | (පිරිමි/කාන්තා) |
| පාපන්දු | (පිරිමි/කාන්තා) | වොලිබෝල | (පිරිමි/කාන්තා) |
| හොකි | (පිරිමි/කාන්තා) | බර ඉසිලීම | (පිරිමි/කාන්තා) |
| ජූඩෝ | (පිරිමි/කාන්තා) | වුෂු | (පිරිමි/කාන්තා) |
| නෙට්බෝල් | (කාන්තා) | මල්ලවපොර | (පිරිමි/කාන්තා) |
| කබඩි | (පිරිමි/කාන්තා) | යෝගා | (පිරිමි/කාන්තා) |

විශ්වවිද්‍යාලයේ සියලු ම සිසුන්ට මෙම ක්‍රීඩාවන්හි සංවිධානාත්මක පුහුණුවීම් සඳහා සහභාගි වීමට හැකියාව ඇත. සෑම අධ්‍යයන වර්ෂයක දී ම නවක සිසුන් සඳහා විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා වැඩ සටහන් හඳුන්වා දීමේ විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබන අතර, සෑම නවක විද්‍යාර්ථියකු ම මෙම විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන අංශය මඟින් නිකුත් කරනු ලබන නවක ශිෂ්‍ය ක්‍රීඩා තොරතුරු පත්‍රය නිසි ලෙසින් සම්පූර්ණ කර ශාරීරික අධ්‍යාපන අංශය වෙත භාරදීමෙන් අනතුරුව එම ක්‍රීඩා වැඩ සටහන් සඳහා සක්‍රීය සහභාගී වීමට හැකියා ව ලැබේ. මෙම අංශය මඟින් සංවිධානය කරනු ලබන ක්‍රීඩා වැඩසටහන් සංක්ෂිප්ත ව පහත දැක්වේ:

1. ශාරීරික යෝග්‍යතා වැඩසටහන
2. විශේෂිත පුහුණු වැඩසටහන
3. අභ්‍යන්තර හා බාහිර තරග වැඩසටහන
4. පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන
5. වාර්ෂික ඇගයීම් වැඩසටහන

ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන වැඩසටහන සඳහා සහභාගි වන සෑම ක්‍රීඩක ක්‍රීඩිකාවකගේ ම ක්‍රීඩා කුසලතා ඇගයීම වාර්ෂික ඇගයීම් වැඩසටහන යටතේ සිදු කරනු ලබයි. මෙම ඇගයීම් ප්‍රධාන ඒකක හතක් යටතේ සිදු කරනු ලැබේ.

1. ක්‍රීඩා පුහුණු සහභාගීත්වය සහ පුහුණු වැඩමුළු
2. ශරීරික යෝග්‍යතා පරීක්ෂණය
3. අන්තර් පීඨ සහ විවෘත තරඟ
4. ක්‍රීඩා තරඟ සහභාගීත්වය හා දක්ෂතා ඇගයීම
5. නායකත්ව පුහුණු වැඩසටහන
6. ක්‍රීඩා අධ්‍යාපනික වැඩ සටහන
7. ආරාධිත තරඟ

මෙම ක්‍රීඩා වැඩසටහන පළමුවන හා දෙවන අර්ධ වාර්ෂිකයන්හි ක්‍රියාත්මක කරනු ලබන අතර, ඇගයීම් සඳහා උපයා ගත යුතු ලකුණු සටහන අධ්‍යයන වර්ෂය ආරම්භයේ දී ශාරීරික අධ්‍යාපන අංශය මඟින් නිවේදනය කරනු ඇත.

මෙම වැඩ සටහන්වලට අමතර ව ජාතික ක්‍රීඩා සංගම් මඟින් පවත්වනු ලබන ජාතික තරඟ වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාල කණ්ඩායම් සහභාගී කරවීම ද, අන්තර් විශ්වවිද්‍යාලයීය, ආසියානු විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා තරඟ සහ ලෝක විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා තරඟ සඳහා යොමු කර වීම මෙන් ම ජාතික පුහුණු සංචිත සඳහා විශ්වවිද්‍යාල නියෝජනය කිරීමට අවකාශ ලබා දීම ද මෙමඟින් සිදු කෙරේ.

සාමාජීය විද්‍යා, මානවශාස්ත්‍ර සහ විද්‍යා පීඨවල සාමාන්‍යවේදී උපාධිය හැදෑරීම සඳහා පළමු වසරේ දී ඇතුළත් වූ විද්‍යාර්ථීන්, විශේෂවේදී උපාධිය හැදෑරීම සඳහා තෝරා ගැනීමේ දී විශ්වවිද්‍යාල කාලය තුළ දක්වන ක්‍රීඩා දායකත්වය සහ දක්ෂතාවය මත ලකුණු පිරිනැමීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. ඒ යටතේ සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වර්ණ දිනාගැනීම, ක්‍රීඩා කණ්ඩායම්වල තනතුරු දැරීම, නවක, අන්තර් පීඨ, අන්තර් විශ්වවිද්‍යාල ශුරතාවලදී ජයග්‍රහණය කිරීම හෝ ජයග්‍රාහී කණ්ඩායමක සාමාජිකයෙකු වීම, විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ පසු ව කිසියම් ක්‍රීඩාවකින් ශ්‍රී ලංකාව නියෝජනය කිරීම හෝ ජාතික ශුරතාවලියේ දී ජයග්‍රහණයන් ලබා ගැනීම සහ ඒකාබද්ධ විශ්වවිද්‍යාල කණ්ඩායමක් නියෝජනය කිරීම හෝ නායකත්වය දැරීම යන අංශ යටතේ මෙම ලකුණු උපයා ගත හැකි ය.

ක්‍රීඩා වැඩසටහන් සහ පුහුණුවීම් පිළිබඳ සියලු උපදෙස් හා තොරතුරු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පිහිටා ඇති ශාරීරික අධ්‍යාපන අංශයෙන් ලබා ගත හැකි ය.

ප්‍රධාන ක්‍රීඩාපිටි දෙකක්, ටෙනිස් පිටියක්, වොලිබෝල් පිටියක්, දැල්පන්දු පිටියක්, පැසිපන්දු පිටියක්, ගෘහස්ථ ක්‍රීඩාගාර තුනක්, ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ ඒකකයක් සහ ශක්ති යෝග්‍යතා ව්‍යායාම ඒකක තුනක පහසුකම් ශාරීරික අධ්‍යාපන අංශය සතුව පවතින අතර තාක්ෂණික අංගෝපාංගයන්ගෙන් සමන්විත දේශන ශාලාවක් සහ ශාස්ත්‍රීය ක්‍රීඩා ග්‍රන්ථ ඇතුළත් පුස්තකාලයක් ද ඇත.

| | | |
|---|---|---|
| දුරකථන අංකය | - | 011 2913853<br>011 2903161 |
| අභ්‍යන්තර අංක | - | 161, 162, 163, 845 |
| විද්‍යුත් ලිපිනය | - | sports@kln.ac.lk |

# 28. පර්යේෂණ සභාව

**සභාපති**
මහාචාර්ය ඩී.එස්.ජී. මෙත්තානන්ද මයා - මහාචාර්ය
*MBBS(Col) MDPaed(Col) DPhil(Oxon) FRCPCH(UK) FRCP(Lond) FRCP(Edin)*
*Professor of Paediatrics*

කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව 2014 වර්ෂයේ දී පිහිටුු වන ලද අතර එය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ පර්යේෂණ සඳහා සහාය දක්වන එවැනි පළමු ආයතනය වේ. පරිසරය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් සහ සොබාදහම සංරක්ෂණය කිරීම තුළින් මානව වර්ගයාගේ යහපැවැත්ම උදෙසා දැනුම වැඩි දියුණු කිරීම සහ ජාතික සංවර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීම සඳහා පර්යේෂණ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාවේ මෙහෙවරයි. පර්යේෂණ සභාව විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංස්කෘතිය පෝෂණය කිරීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. Innovative Pilot Research Funding Scheme, Multidisciplinary Research Grants සහ Strengthening Research Output Grants සහ Research Grants for Publishing Papers and Repair and Maintenance of Equipment යන පර්යේෂණ ප්‍රදානයන් යටතේ පර්යේෂකයන්ට උසස් තත්ත්වයේ ඉලක්කගත පර්යේෂණ කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයයි. ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම සඳහා ප්‍රකාශන ගාස්තු (publication charges), දේශීය සම්මන්ත්‍රණ සඳහා ලියාපදිංචි ගාස්තු (registration fees for local symposia) සහ විදේශ සංචාරක ප්‍රදාන (foreign travel grants) ලබා දීමෙන් පර්යේෂකයන්ගේ පර්යේෂණ ප්‍රතිපාදනයන් දිරිමත් කිරීම සඳහා පර්යේෂණ සභාව කටයුතු සිදු කරනු ලබයි. ඉහළ පිළිගැනීමක් ඇති සඟරාවල පළකරන පර්යේෂණ පත්‍රිකා සහ පේටන්ට් බලපත්‍ර ලබා ගන්නා අයට සනාතන සහා ගෞරව සම්මාන ප්‍රදානය කිරීමෙන් පර්යේෂකයන්ගේ ඉහළ ජයග්‍රහණ පර්යේෂණ සභාව විසින් ඇගයීමට ලක් කරනු ලබයි. ගෝලීය ශ්‍රේණිගත කිරීම සඳහා අත්‍යවශ්‍ය වන විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රතිදානය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම සහ විද්‍යුත් ප්‍රකාශන ගබඩාවක් (E-repository) පවත්වාගෙන යාම සඳහා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරමින් විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීමට පර්යේෂණ සභාව දායක වේ.

දුරකථන අංකය - 011 2903539
අභ්‍යන්තර අංකය - 539
විද්‍යුත් ලිපිනය - officerc@kln.ac.lk

# 29. ආරක්ෂක අංශය - කැලණිය විශ්වවිද්‍යාලය

**ප්‍රධාන ආරක්ෂක නිලධාරි**
ඩී.එම්. නාමල් බණ්ඩාර මයා
*B.Com. (SP), M.A. (Econ)(Kel'ya), Former Lieutenant of Sri Lanka Navy*

**නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරි**
ඒ.ටී. රංජිත් පීරිස් මයා

කැලණිය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අංශය විශ්වවිද්‍යාලයේ දේපලවල මෙන්ම ජීවිතවල ආරක්ෂාව සැලසීම වෙනුවෙන් පැය 24 පුරා ම ක්‍රියාත්මක වේ. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර හා පෞද්ගලික ආරක්ෂක අංශය යන පාර්ශවයන්ගේ එකතුවෙන් විශ්වවිද්‍යාල ආරක්ෂක කටයුතු පවත්වාගෙන යන අතර මෙම කටයුතු වඩාත් විධිමත් ව අධීක්ෂණය කිරීම ප්‍රධාන ආරක්ෂක නිලධාරි මඟින් සිදු කරයි.

විශ්වවිද්‍යාලයේ ආරක්ෂක කටයුතු සිදු කිරීමේ දී ශිෂ්‍යයන්ගේ සියලු උත්සව, සුභසාධක කටයුතු, හදිසි තත්ත්වයන්වලදී සහය දීම සිදු කරන අතර පරිපාලන කටයුතු මනාව පවත්වා ගෙනයාම සඳහා පරිපාලන නිලධාරින්ට සහ ආචාර්යවරුන්ට සහය ලබාදීම සිදු කරනු ලබයි.

හදිසි අවස්ථාවක දී පහත සඳහන් දුරකථන අංක අමතා ආරක්ෂක අංශයේ සහය ලබා ගත හැකිය.

දුරකථන අංක 011 2917714, 011 2903143, 011 2903144, 011 2903147

# විනයාරක්ෂක නිලධාරීන්

වී.වී.එන්.එස්. විදානගේ මිය
*Dip in HRM (HR House), Dip in IT (IBMS), Major of Sri Lanka Army (RETD)*
ජංගම දුරකථන අංකය - 076 3617369

එච්.ජී.ඩබ්. පෙරේරා මයා -රණශූර පදක්කම් හිමි
*Dip in Psychology (SNIOPC), Dip in HRM, Dip in IT (IBMS), Dip in IR (NILS),Master of Hypnotherapist -CHP*
*Major of Sri Lanka Army (RETD)*
ජංගම දුරකථන අංකය - 0777250045

එච්.ඩී. අබේරත්න මයා
*BA (Perad'ya) Dip in Public and Media Relation (Kel'ya), PSV*
*Lieutenant Commander of Sri Lanka Navy (RETD)*
ජංගම දුරකථන අංකය - 076 4859230

ආර්.එස්.කේ. රත්නායක මයා
*BSc (Ruhuna), Former Lieutenant of Sri Lanka Navy*
ජංගම දුරකථන අංකය - 076 0969217

කේ.පී.එස්. ප්‍රනාන්දු මයා
*BSc (KDU) Lieutenant Commander (Navigation & Directions) of Sri Lanka Navy (RETD)*
ජංගම දුරකථන අංකය - 076 9687472

ඩී.ජී.පී.අයි. ආරච්චි මයා
*BSc in Eng (Hons) - KDU, Former Lieutenant of Sri Lanka Army*
ජංගම දුරකථන අංකය - 071 7031540

එස්.ජී.එම්.පී. සතරසිංහ මයා
*JP- All Island, Dip in OSH (NIOSH), Frogman International Diving (Pakistan),*
*Lieutenant Commander (SBS) of Sri Lanka Navy (RETD)*
ජංගම දුරකථන අංක - 076 1275588

විනයාරක්ෂක නිලධාරිහු ශිෂ්‍ය කටයුතු අධ්‍යක්ෂකගේ සෘජු මාර්ගෝපදේශකත්වය යටතේ ක්‍රියා කරන අතර ශිෂ්‍ය විනය පවත්වාගෙන යාම සහ විශ්වවිද්‍යාලය තුළ සාමකාමී සහ ආරක්ෂිත පරිසරයක් ඇති කිරීමට සහය වෙති.

# 30. ශිෂ්‍ය උපදේශක සේවය

**අධ්‍යක්ෂ - ශිෂ්‍ය කටයුතු**
**ආචාර්ය කසුන් ප්‍රනාන්දු මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ෂෂ**
***PhD (UofL,USA) in Electrical and Computer Engineering, M.Sc in physics (UofL, USA), B.Sc (Sp) in physics (USJP,SL)***

**නියෝජ්‍ය ශිෂ්‍ය කටයුතු අධ්‍යක්ෂ (භික්ෂු කටයුතු)**
පූජ්‍ය බෝපෙත්තේ සෝමානන්ද හිමි

**නියෝජ්‍ය ශිෂ්‍ය කටයුතු අධ්‍යක්ෂ (කාන්තා කටයුතු)**
ආචාර්ය කේ.ආර්.එන්. හර්ෂණී මිය

**අධ්‍යක්ෂ ශිෂ්‍ය කටයුතු කාර්යාලය**
විශ්වවිද්‍යාල පරිපාලන ගොඩනැගිල්ලේ ප්‍රධාන දොරටුවෙන් ඇතුළු වූ විට ඔබේ වම්පසින් ඇති කාමරය ශිෂ්‍ය කටයුතු අධ්‍යක්ෂක කාර්යාලයයි. එහි කාර්යාල වේලාවන්, ශිෂ්‍යසේවා අංශය, ශිෂ්‍ය මධ්‍යස්ථානය, නේවාසිකාගාර සහ ඒ ඒ පීඨයන්හි ප්‍රධාන දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කෙරෙනු ඇත. පහත සඳහන් කරන ලද ශිෂ්‍ය උපදේශක මණ්ඩල සාමාජික/ සාමාජිකාවන් ඔවුන්ගේ අධ්‍යයනාංශවල දී ද ඔබට හමු වීමට පුළුවන.

**ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන්**

| | |
|---|---|
| ආචාර්ය කේ.ඩී.බී.එච්. ගුණවර්ධන මයා | විද්‍යා පීඨය |
| වෛද්‍ය එස්.ඒ.එෆ්. කුරුකුලසූරිය මිය | වෛද්‍ය පීඨය |
| මහාචාර්ය කේ.කේ. තිලකසිරි මයා | වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය |
| ආර්.එම්.සී. රණසිංහ මයා | මානවශාස්ත්‍ර පීඨය |
| දර්ශන සෝමරත්න මයා | සමාජීය විද්‍යා පීඨය |

**ශිෂ්‍ය උපදේශකවරු**

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

| | |
|---|---|
| ආචාර්ය ඩී.එම්.එන්.එස්.ඩබ්. දිසානායක මයා | වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය |
| එස්.ටී.එම්.එස්. තෙන්නකෝන් මිය | මූල්‍ය අධ්‍යයනාංශය |
| ටී.ආර්. හෙට්ටිආරච්චි මිය | මූල්‍ය අධ්‍යයනාංශය |
| පී.වී.එම්.වී.ඩී. උඩෝවිට මිය | අලෙවි කළමනාකරණ  අධ්‍යයනාංශය |
| එම්.ආර්.එච්. පෙරේරා මිය | ගණකාධිකරණ අධ්‍යයනාංශය |
| එච්.එම්.එම්.එන්. හේරත් මයා | ගණකාධිකරණ අධ්‍යයනාංශය |
| ඒ.පී.එච්.එස්.කේ. විජේරත්න මෙය | ගණකාධිකරණ අධ්‍යයනාංශය |
| වී.එල්. වීරවික්‍රම මයා | ගණකාධිකරණ අධ්‍යයනාංශය |
| ආර්.ඒ.එස්. රාජපක්ෂ මායා | ගණකාධිකරණ අධ්‍යයනාංශය |
| එච්. මුතුනායක මයා | ගණකාධිකරණ අධ්‍යයනාංශය |

**මානවශාස්ත්‍ර පීඨය**

| | |
|---|---|
| මහාචාර්ය එච්.එම්.කේ. හේරත් මිය | සිංහල අධ්‍යයනාංශය |
| පූජ්‍ය එම්. පඤ්ඤාලෝක හිමි | පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය |
| පූජ්‍ය යූ. ධම්මවිමල හිමි | වාග්විද්‍යා අධ්‍යයනාංශය |
| බී.ඒ.කේ.එම්. බමුණුසිංහ මිය | වාග්විද්‍යා අධ්‍යයනාංශය |

| | |
|---|---|
| ආචර්ය. ඊ.ජේ.ඒ. සමරකෝන් මිය | නූතන භාෂා අධ්‍යයනාංශය |
| බී.එම්.එස්. කුරේ මෙය | නූතන භාෂා අධ්‍යයනාංශය |
| ඩී.එම්.ඒ.එස්.පී. රත්නායක මිය | නූතන භාෂා අධ්‍යයනාංශය |
| අයි.අයි.පී. නුවන්සිරි මයා | නූතන භාෂා අධ්‍යයනාංශය |
| ආචාර්ය කේ.ඩී.එල්. මනරංජනී මිය | ලලිත කලා අධ්‍යයනාංශය |
| ඩබ්.එස්.කේ. පෙරේරා මයා | ලලිත කලා අධ්‍යයනාංශය |
| ටී.එස්.එන්. ගුණරත්න මයා | ලලිත කලා අධ්‍යයනාංශය |
| ඩබ්.කේ.පී. පෙරේරා මිය | බටහිර සම්භාව්‍ය අධ්‍යයනාංශය |

**වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| මහාචාර්ය ඩබ්.එන්.එස්. පෙරේරා මිය | අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| වෛද්‍ය වයි. තිවාහරන් මිය | අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| වෛද්‍ය කේ.කේ.ජී. කොඩිකාර මිය | වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය |
| වෛද්‍ය ඒ.කේ.ඒ.බී. බැම්මිණිවත්ත මයා | මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |

**විද්‍යා පීඨය**

| | |
|---|---|
| ආචාර්ය එෆ්.එස්.බී. කාෆී මිය | භෞතික විද්‍යා සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයනාංශය |
| ආචාර්ය එච්.ඒ.සී.සී. පෙරේරා මිය | සත්ත්ව විද්‍යා සහ පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය |
| ආචාර්ය කේ. සුභසිංහ මිය | සත්ත්ව විද්‍යා සහ පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය |
| ආචාර්ය එච්.එම්.ටී.ආර්. සමරකෝන් මිය | සත්ත්ව විද්‍යා සහ පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය |
| ආචාර්ය ඒ.පී.එම්. ගුණරත්න මිය | රසායන විද්‍යා අධ්‍යයනාංශය |
| ආචාර්ය ඩී.ඩී.සී. ද එස්.වන්නිආරච්චි මිය | රසායන විද්‍යා අධ්‍යයනාංශය |
| ආචාර්ය ජේ.එන්. දහනායක මිය | රසායන විද්‍යා අධ්‍යයනාංශය |
| ආචාර්ය සී.සී. කඩිගමුව මයා | රසායන විද්‍යා අධ්‍යයනාංශය |

**සමාජීය විද්‍යා පීඨය**

| | |
|---|---|
| ඩබ්ලිව්.එම්.එම්.එස්.කේ. වේරකෝ මිය | ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය |
| ආචාර්ය පී.ඩී.සී.එස්. ධර්මදාස මිය | ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය |
| ඒ.ජී.ඒ.යූ. නන්දසිරි මෙය | ජනසන්නිවේදන අධ්‍යයනාංශය |
| යූ.එල්.ඩී.ඒ.එම්. විජේසිංහ මයා | ජනසන්නිවේදන අධ්‍යයනාංශය |
| ආර්.එම්.ජී.ඩබ්. දිසානායක මයා | ඉතිහාසය අධ්‍යයනාංශය |
| ආචාර්ය.එච්.එම්.එස්.බී. හේරත් මයා | ඉතිහාසය අධ්‍යයනාංශය |
| ඊ.ඩබ්.ඒ.එච්.සී. ගුණසිංහ මයා | ඉතිහාසය අධ්‍යයනාංශය |
| ආචාර්ය ආර්.ඩී.පී.එස්. රාජපක්ෂ මයා | දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය |
| ආචාර්ය ඩබ්.එම්. ප්‍රියන්ත මයා | දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය |
| කේ.බී.අයි.එස්. රන්වැල්ල මයා | භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය |
| ඩී.ආර්.ඒ.කේ. ධනසේකර මෙය | භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය |
| කේ.එල්.ඩබ්.අයි. ගුණතිලක මිය | භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය |
| පී.එම්.එස්.වී. අපොන්සු මයා | පුරාවිද්‍යා අධ්‍යයනාංශය |
| එන්.එච්. නාමල්ගමුව මයා | පුරාවිද්‍යා අධ්‍යයනාංශය |
| යූ.ආර්. රම්මුන්ගොඩ මිය | පුරාවිද්‍යා අධ්‍යයනාංශය |
| පී.බී.අයි. වීරසිංහ මිය | පුරාවිද්‍යා අධ්‍යයනාංශය |

| | |
|---|---|
| කේ.අයි.ඩී. සේනාරත්න මිය | පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය |

**පරිගණක හා තාක්ෂණ පීඨය**

| | |
|---|---|
| ආචාර්ය ආර්.ආර්.එල්.යූ.අයි. රාජපක්ෂ මයා | පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය |
| ආචාර්ය ඒ.එම්.ඩී. චන්ද්‍රසේන මිය | පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය |
| එල්.ඒ.ටී.ආර්. පෙරේරා මයා | පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය |
| යූ.කේ.පී. මිහිරංග මයා | පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය |
| ආචාර්ය එන්.එම්. හක්මනගේ මෙය | පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය |
| ආචාර්ය අයි.ඩබ්. සිරිවර්ධන මිය | ව්‍යවහාරික පරිගණන අධ්‍යයනාංශය |
| ආචාර්ය එස්. තරංගා මිය | ව්‍යවහාරික පරිගණන අධ්‍යයනාංශය |
| ආචාර්ය ඒ.කේ. ජීවන්දර මිය | ව්‍යවහාරික පරිගණන අධ්‍යයනාංශය |

**ශිෂ්‍ය උපදේශකවරුන්ගේ කාර්යභාරය**

i. විද්‍යාර්ථීන් විසින් කරනු ලබන පැමිණිලි හා විමසීම් ආදිය පරීක්‍ෂා කර බලා ස්වකීය නිරීක්‍ෂණ ද සමඟ අදාළ අංශවලට යොමු කිරීම සහ අවස්ථානුකූල ව උපදෙස් දීම.

ii. විද්‍යාර්ථීන්ගේ නිවාඩු ඉල්ලීම් පිළිබඳ කටයුතුවල දී උපදෙස් දීම.

iii. විද්‍යාර්ථීන්ගේ චාරිකා හා ගමන් සංවිධානය කිරීමේ කටයුතු සහ ඒ සඳහා උපදෙස් දීම.

iv. විශ්වවිද්‍යාල භූමිය තුළ විද්‍යාර්ථීන් විසින් මුදල් එකතු කරනු ලැබීමේ කටයුතු පාලනය කිරීම.

v. විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන හා ශිෂ්‍ය සංගම් පිළිබඳ කටයුතු අධීක්ෂණය කිරීම.

vi. රැස්වීම් සඳහා බාහිර දේශකයන් ගෙන්වීම සහ එවැනි රැස්වීම් පාලනය කිරීම හා හසුරුවාලීම.

vii. චිත්‍රපට දර්ශන, නාට්‍ය දර්ශන ආදිය අධීක්ෂණය කිරීම, හසුරුවාලීම සහ වෙනත් ශිෂ්‍ය සුභසාධක හා විනය කටයුතු පිළිබඳ ව උපකුලපතිතුමාට නිර්දේශ ඉදිරිපත් කිරීම.

හදිසි අවස්ථාවක දී ඔබ මුලින් ම හමු වන ඕනෑ ම පීඨයකට අයත් ශිෂ්‍ය උපදේශකවරයා/ උපදේශකවරිය වෙත ඔබේ ගැටලුව නොපැකිලිව ඉදිරිපත් කරන්න.

ශිෂ්‍ය උපදේශක සේවය පවතින්නේ විද්‍යාර්ථීන්ගේ ගැටලු විසඳා ගැනීමට සහාය වීම සඳහා පමණක් ම නොවේ. විද්‍යාර්ථීන්ගේ හැකියාවන් ඉහළ ඇගයීමකට පාත්‍ර වන සේ ඔවුන් විසින් සංවිධානය කරනු ලබන විෂයානුබද්ධ සහ විෂය පරිබාහිර ක්‍රියාකාරකම්වලදී ද විද්‍යාර්ථීන්ට ශිෂ්‍ය උපදේශක මණ්ඩලය සහාය වෙයි.

# 31. තාක්ෂණ වාණිජකරණ හා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (CTTIL)

**අධ්‍යක්ෂ**
ආචාර්ය ප්‍රදීප් ඩබ්ලිව්. සමරසේකර - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II
*B.Sc. (Special) (C'bo), Ph.D. (Houston, USA)*

ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් චක්‍රලේඛ අංක 10/2016ට අදාළ ව 2018 වසරේදි විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකරණ ඒකකය (UBL Cell) නමින් තාක්ෂණ වාණිජකරණ හා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (CTTIL) ස්ථාපිත කර ඇත. එවකට විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකරණ ඒකකය (UBL Cell) පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථය වූයේ විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දැනුම හා තාක්ෂණය පුළුල් ප්‍රජාවක් සමඟ බෙදා හැරීම සහ අවසානයේ රටේ සංවර්ධනයට දායක වීමයි.

2024 වන විට, කාරක සභාවේ අනුමැතියෙන් පසුව, විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකරණ ඒකකය (UBL Cell) තාක්ෂණ වාණිජකරණ හා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (CTTIL) ලෙස නැවත නම් කරන ලදි.

**හැඳින්වීම**
කැලණිය විශ්වවිද්‍යාලයේ තාක්ෂණ වාණිජකරණ හා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (CTTIL) විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන් සහ ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති, අවශ්‍ය කර්මාන්ත සමඟ සම්බන්ධ කිරීමට දැඩි උද්‍යෝගයක් දක්වයි. අපගේ අවසාන ඉලක්කය වන්නේ රටේ ආර්ථික හා සමාජ සංවර්ධනය විස්තාරණය කිරීම සඳහා විශ්වවිද්‍යාල පදනම් කරගත් නවෝත්පාදනයන් වාණිජකරණය කළ හැකි, විශ්වවිද්‍යාලය සහ රජය, රාජ්‍ය නොවන සංවිධාන අතර සහයෝගිතාවය සකස් කිරීමයි.

**Centre for Technology Transfer & Industry Linkage යටතේ සපයනු ලබන සේවාවන්,**

01. පර්යේෂණ ප්‍රජාව සහ උපාධි අපේක්ෂකයින් තුළ බුද්ධිමය දේපළ (IP) හි වැදගත්කම සහ නිසි බුද්ධිමය දේපළ (IP) කළමනාකරණයේ අවශ්‍යතාවය පිළිබඳ ව දැනුවත් කිරීමයි.
02. බුද්ධිමය දේපළ (IP) ආශ්‍රිත සේවාවන් සැපයීමෙන් පර්යේෂණ ප්‍රජාවට ඔවුන්ගේ නව්‍යකරණයන් සඳහා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට පෙළඹවීම.
03. සමාජයේ අභිවෘද්ධිය සඳහා පර්යේෂණ ප්‍රතිඵල හඳුනා ගැනීම, සුරක්ෂිත කිරීම, ඇගයීම සහ වාණිජකරණය කිරීම සඳහා විශ්වවිද්‍යාලය තුළ ප්‍රතිපත්ති හා ක්‍රියාවලීන් උත්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
04. කර්මාන්ත අවශ්‍යතා සහ විශ්වවිද්‍යාල පර්යේෂණ හැකියාවන් අතර බැඳීමක් ඇති කිරීම.
05. පර්යේෂණ පරිචයන් සහ පර්යේෂණ ප්‍රතිඵල රටේ සහ විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දේපළ (IP) කළමනාකරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සමඟ සමපාත වන බවට සහතික වීම.
06. රජයේ හෝ පෞද්ගලික සංවිධාන සහ විශ්වවිද්‍යාලය අතර නිෂ්පාදන වාණිජකරණය සහ බලපත්‍ර ගිවිසුමේ සියලු අංශ කළමනාකරණය කිරීම.
07. පර්යේෂණ ප්‍රජාවට බුද්ධිමය දේපළ (IP) විශේෂඥතාව, උපදේශන සේවා සහ අවශ්‍ය වාණිජ දත්ත සමුදායන් වෙත ප්‍රවේශය ලබා දීම.

08. ප්‍රධාන වශයෙන් බලපත්‍ර ලබා දීමෙන් තාක්ෂණය, කර්මාන්තයට හා සමාජයට හුවමාරු කිරීම සඳහා පහසුකම් සැලසීම.

09. කර්මාන්ත උපදේශනය, කර්මාන්ත හා විශ්වවිද්‍යාලය අතර සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති සහ වැඩමුළු සහ සාකච්ඡා සංවිධානය කිරීම සඳහා සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.

10. විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට තාක්ෂණික සංවර්ධනය පුහුණු වැඩසටහන් ලබා දීම.

11. ප්‍රමුඛ පෙළේ ව්‍යවසායකයින්ගේ සහය ඇති ව සිසුන් අතර ව්‍යවසායකත්ව සංස්කෘතිය වර්ධනය කිරීම.

| | |
|---|---|
| Telephone No | - 0112 903216 |
| Web Site | - https://ublc.kln.ac.lk/index.php/ip-filing |
| Email | - cttil@kln.ac.lk |
| FaceBook | - Centre for Technology Transfer & Industry Linkage – Uok |
| LinkedIn | - Centre for Technology Transfer & Industry Linkage– Uok |

**තාක්ෂණ හා නවෝත්පාදන ආධාරක මධ්‍යස්ථානය (TISC)**

**අධ්‍යක්ෂ**

මහාචාර්ය අයි. වී. එන්. රත්නායක - මහාචාර්ය

*B.Sc.(Kel'ya), M.Sc.(NUS, Singapore),Ph.D. (UniSA, Australia)*

තාක්ෂණ හා නවෝත්පාදන ආධාරක මධ්‍යස්ථානය (TISC) තාක්ෂණ වාණිජකරණ හා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (CTTIL) යටතේ ක්‍රියාත්මක වන අතර එය විශ්වවිද්‍යාලය, ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) සහ ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ (NIPO) ඒකාබද්ධ ව්‍යාපෘතියකි.

විශ්වවිද්‍යාලයේ තාක්ෂණ හා නවෝත්පාදන ආධාරක මධ්‍යස්ථානය (TISC) සැලසුම්කර ඇත්තේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට සහ විද්‍යාර්ථයන්ට දේශීය ව, උසස් තත්ත්වයේ තාක්ෂණික තොරතුරු සහ අදාළ සේවාවන් සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි අයුරිනි. (TISC) නවෝත්පාදනයන් පෝෂණය කරන අතර විද්‍යාර්ථීන් සහ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය අතර ව්‍යවසායකත්ව කුසලතා දිරිමත් කරයි. මෙයට අමතර ව විද්‍යාර්ථයන්ට ව්‍යවසායකත්වයට අවශ්‍ය උපදේශනය, ජාලකරණය ඇතුළු විවිධ අවස්ථාවන් රැසක් පිරිනමනු ලබයි.

**අරමුණු**

- විද්‍යාර්ථයන් හා කාර්ය මණ්ඩලය නවෝත්පාදන අදහස් උත්පාදනය සහ නිෂ්පාදන වර්ධනය සඳහා දිරිමත් කිරීම.
- උපාධි අපේක්ෂකයින්ගේ ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම සහ ව්‍යවසායකත්ව වෘත්තීන් සඳහා ඔවුන් බලමුළු ගැන්වීම.
- නව්‍ය අදහසක්, නිෂ්පාදනයක් බවට පරිවර්තනය කිරීම සඳහා බීජ අරමුදල් සැපයීම.

- ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ විද්‍යාර්ථයන් සහ පීඨ සඳහා වැඩමුළු සංවිධානය කිරීම.
- පේටන්ට් බලපත්‍ර ක්‍රියාවලියට උපදෙස් ලබාදීම සඳහා උපකාරී වීම.
- පේටන්ට් බලපත්‍ර ලබාගත හැකි ආකාරයේ නව්‍ය අදහස් ජනනය කිරීම.

වැඩි විස්තර - https://units.kln.ac.lk/tisc/index.php

ඇමුණුම 01

# ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා
# කැලණිය විශ්වවිද්‍යාලය

---

1985 අංක 7 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 (1) (ඇ) වගන්තිය සමග කියවිය යුතු 29 (ග) වගන්තිය ප්‍රකාරව සකස් කළ මෙම අතුරු ව්‍යවස්ථා 2014 අංක 01 දරන ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2014 අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන සේ සැලකිය යුතුය.

2009 අංක 01 දරන අතුරු ව්‍යවස්ථාව සහ ශිෂ්‍ය විනය පිළිබඳ බලපැවැත් වූ වෙනත් අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු වේ.

1985 අංක 7 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 (6) (ආ) වගන්තිය ප්‍රකාර, විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වාගෙන යාම සඳහා උපකුලපතිවරයා වගකිව යුතුය.

මෙම අතුරු ව්‍යවස්ථා විධිවිධානයන් කවරාකාරයෙන් සඳහන් වුව ද විශ්වවිද්‍යාලයේ විනය පවත්වා ගෙන යාම සඳහා සුදුසු යයි හැඟෙන ඕනෑ ම ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම හා සම්බන්ධ බලය උපකුලපතිවරයා සතු වේ. වරින් වර සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත (මින් මතු "පනත" යනුවෙන් සඳහන් වන) මගින් හෝ වෙනත් සාධන පත්‍රයක් මගින් උපකුලපතිවරයා වෙත පවරන ලද හෝ පනවන ලද බලතල, යුතුකම් සහ කාර්යයන් සීමා කිරීමක් මෙම අතුරු ව්‍යවස්ථා මගින් සිදුකරනු නොලැබේ.

පාලක සභාව වෙත පනත මගින් හෝ වෙනත් සාධන පත්‍රයක් මගින් හෝ පවරන ලද හෝ පනවන ලද හෝ බලතල, යුතුකම් සහ කාර්යයන්ට හානියක් නොවන පරිදි මෙම අතුරු ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම පිළිබඳ වගකීම පාලක සභාව සතු වේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ (මින් මතු "විශ්වවිද්‍යාලය" ලෙස හඳුන්වනු ලබන) සෑම ශිෂ්‍යයකු ම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව බලපවත්වයි.

## 1වන කොටස - ශිෂ්‍ය ලියාපදිංචිය සහ අනන්‍යතාව

1.1 කැලණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන යම් ශිෂ්‍යයකු, ඒ සඳහා විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක් මගින්, අවශ්‍යයයි විශ්වවිද්‍යාලය මගින් නියම කරනු ලබන තොරතුරු සහ ලේඛන ද සමග, අයදුම් කළ විට ලේඛකාධිකාරීවරයා එම ශිෂ්‍යයා විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථියකු වශයෙන් ලියාපදිංචි කර, ඔහුගේ /ඇයගේ මෑතකදී ලබාගන්නා ලද ඡායාරූපයක් ඇතුළත් ශිෂ්‍ය හැඳුනුම්පතක් සහ ශිෂ්‍ය වාර්තා පොතක් නිකුත් කළ යුතු ය. *ශිෂ්‍ය හැඳුනුම්පත/ වාර්තා පොත*

1.2 විශ්වවිද්‍යාලයේ නේවාසික පහසුකම් ලබාදෙන සෑම ශිෂ්‍යයකුටම ඔහුගේ/ඇයගේ ඡායාරූපය ඇතුළත්, ශිෂ්‍ය ලියාපදිංචි අංකය සහ නේවාසිකාගාරයේ නම සඳහන් කරන ලද නේවාසික ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය. *නේවාසික ප්‍රවේශ පත්‍රය*

1.3 සෑම ශිෂ්‍යයකු ම විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ සිටින සෑම අවස්ථාවකම එකී හැඳුනුම්පත සහ නේවාසික ශිෂ්‍යයකු නම් එකී නේවාසික ප්‍රවේශ පත ද ළඟ තබා ගත යුතු අතර, අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩලවල කවර හෝ සාමාජිකයකු හෝ විශ්වවිද්‍යාල ආරක්ෂක අංශයේ නිලධරයකු හෝ විනයාරක්ෂක නිලධාරී (මාර්ෂල්) හෝ උපකුලපතිවරයා විසින් බලය පවරන ලද විශ්වවිද්‍යාලයේ වෙනත් කවර හෝ තැනැත්තකු ඉල්ලා සිටි විට එම හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය. *හැඳුනුම්පත් ළඟ තබා ගැනීම*

## 2වන කොටස - විනය කාර්ය පටිපාටිය

2.1 ශිෂ්‍යයකුට එරෙහිව ඇති විෂමාචාරය/විනය කඩ කිරීම පිළිබඳ යම් චෝදනාවක්, ප්‍රථම අවස්ථාවේ දී උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

*විෂමාචාරය පිළිබඳ පැමිණිල්ල*

2.2 විෂමාචාරයක් පිළිබඳ තොරතුරු උපකුලපතිවරයා වෙත ලැබුණ විට, තව දුරටත් විස්තර ලබා ගත යුතු යයි ඔහු අදහස් කරන්නේ නම්, අදාළ ස්ථානය හෝ පුද්ගලයා වෙත ගොස් හැකි පරිදි ඉක්මනින් වාර්තා කිරීම පිණිස විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු යොදා ගැනීම ඔහුට කළ හැකිය.

*වැඩිදුර තොරතුරු ලබා ගැනීම.*

2.3 විෂමාචාරයක් පිළිබඳ පැමිණිල්ලක් උපකුලපතිවරයා වෙත ඉදිරිපත් වීමෙන් පසු පහත සඳහන් අයුරින් ක්‍රියා කිරීමට ඔහුට පුළුවන.

කරුණු විමර්ශනය කොට උපකුලපතිවරයා වෙත නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහාː

2.3.1 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් එක් අයකු හෝ ඊට වැඩි ගණනක් පත් කිරීම

හෝ

2.3.2 විශ්වවිද්‍යාලයෙන් බාහිර පුද්ගලයකු හෝ පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම.

2.3.3 එකී විමර්ශන කටයුතු සිදුවෙමින් පවතින අතරතුරදී උපකුලපති විසින් සුදුසු යැයි සිතන අතුරු විනය ක්‍රියාමාර්ගයක් ගැනීම.

*විෂමාචාර පැමිණිල්ල පිළිබඳ උපකුලපතිවරයාගේ කාර්යය*

2.4 ඉහත සඳහන් කමිටු විසින් අදාළ සිද්ධිය පිළිබඳ ව විමර්ශනය කොට නිර්දේශ උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි නිර්දේශයක් විෂමාචාරය/විෂමාචාරයන් හි ස්වභාවය අනුව අවස්ථානුකූලව දඬුවම් පැමිණවීම සඳහා හෝ විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා වන නිර්දේශයක් විය හැකි ය.

මෙහිදී අනුගමනය කරනු ලැබිය යුතු ක්‍රියා පටිපාටිය 1 වන උපලේඛනයේ දක්වේ.

*කමිටු නිර්දේශ*

2.5 ඉහත 2.4 යටතේ නිර්දේශයන් උපකුලපතිවරයා වෙත ලැබුණු කල්හි, එතුමාට,

2.5.1 ශිෂ්‍යයා /ශිෂ්‍යයන් නිදහස් කිරීම / සමාව දීම /අවවාද කිරීම

2.5.2 II වන උපලේඛනයේ විෂය පථය තුළ යම් දඬුවමක් තීරණය කිරීම සඳහා විනය මණ්ඩලය වෙත යොමු කිරීම සිදු කළ හැකි ය.

*කමිටු නිර්දේශ පිළිබඳ උපකුලපතිවරයාගේ කාර්යය*

2.6 එකී විනය මණ්ඩලය උපකුලපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

*විනය මණ්ඩලය*

2.7 ඉහත අංක 2.3 යටතේ විස්තර වන තැනැත්තන් හෝ කමිටු විසින් මෙහි II වන උපලේඛනයේ දක්වෙන දඬුවම් පැනවීම සඳහා උපකුලපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

*දඬුවම් නිර්දේශ කිරීම.*

2.8 උපකුලපතිවරයා විසින් පත් කරනු ලබන පරීක්ෂණ කමිටුවට, අදාළ වන පරිදි, එවැනි කිසියම් පරීක්ෂණයකට පෙනී සිටින ලෙස ඕනෑම ශිෂ්‍යයකුට නියම කිරීමට, ඒ සඳහා කැඳවීමට, එහිදී සාක්ෂි දෙන ලෙස නියම කිරීමට සහ එහි දී කවර හෝ ශිෂ්‍යයකුට තම ක්‍රියා කලාපය හා හැසිරීම සම්බන්ධයෙන් හෝ විශ්වවිද්‍යාලය තුළ වෙනත් ශිෂ්‍යයකුගේ ක්‍රියා කලාපය හා හැසිරීම සම්බන්ධයෙන් හෝ ලිඛිත ප්‍රකාශයක් කරන ලෙස නියම කිරීමට බලය ඇත.

*කමිටු හමුවේ සාක්ෂි දීම.*

## 3වන කොටස - ශිෂ්‍ය උපදේශන සේවය

3.1 ශිෂ්‍ය උපදේශන සේවය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් ශිෂ්‍ය උපදේශකවරුන් කිහිප දෙනෙකු උපකුලපතිවරයා විසින් පත් කළ යුතුය. ඔවුන් අතරින්, පීඨ නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය

*ශිෂ්‍ය උපදේශකවරුන් පත් කිරීම.*

උපදේශකවරුන් පත් කළ හැකි වන අතර එක් ප්‍රධාන ශිෂ්‍ය උපදේශකවරයකු පත් කළ යුතු ය.

3.2 සියලුම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන් ප්‍රධාන ශිෂ්‍ය උපදේශකවරයාට වගකිව යුතු අතර, ප්‍රධාන ශිෂ්‍ය උපදේශකවරයා උපකුලපතිවරයාට සහාය විය යුතු ය. *ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන් පත් කිරීම.*

3.3 ප්‍රධාන ශිෂ්‍ය උපදේශකවරයාට, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන්ට, ශිෂ්‍ය උපදේශකවරුන්ට පහත සඳහන් බලතල තිබේ: *ශිෂ්‍ය උපදේශකවරුන්ගේ බලතල*

3.3.1 ඕනෑම ශිෂ්‍යයකුට සිය ශිෂ්‍ය වාර්තා පොත හෝ ශිෂ්‍ය හැඳුනුම්පත හෝ ඉදිරිපත් කරන ලෙස නියෝග කිරීම.

3.3.2 විශ්වවිද්‍යාලයේ විනය පවත්වාගෙන යාම පිළිබඳ කරුණක් සම්බන්ධයෙන් ශිෂ්‍යයකුට තම කාර්යාලයන්ට පැමිණ ලිඛිත ප්‍රකාශයක් කරන ලෙස නියෝග කිරීම.

3.3.3 ශිෂ්‍යයකුට විශ්වවිද්‍යාල භූමියෙන් පිටමං වන සේ නියෝග කිරීම (එවැනි අවස්ථාවක උපකුලපතිවරයාට නොපමාව වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය)

3.3.4 මෙම අතුරු ව්‍යවස්ථාවන් හි කිනම් හෝ විධිවිධානයක් ශිෂ්‍යයකු විසින් උල්ලංඝනය කළ බවට ඔවුන්ගේ හැඟීම වේ නම්, උපකුලපතිවරයාට වාර්තා කිරීම.

3.4 ශිෂ්‍ය උපදේශන සේවය යටතේ විශ්වවිද්‍යාලයේ කවර හෝ ආචාර්යවරයෙකුට පහත සඳහන් බලතල ඇත. *ආචාර්යවරුන්ගේ බලතල*

3.4.1 තම ශිෂ්‍ය වාර්තා පොත හෝ ශිෂ්‍ය හැඳුනුම්පත ඉදිරිපත් කරන ලෙස ඕනෑම ශිෂ්‍යයකුට නියෝග කර සිටීම.

3.4.2 ශිෂ්‍යයකුට දේශනාගාරයෙන්, විද්‍යාගාරයෙන්, පංති කාමරයෙන් හෝ පුස්තකාලයෙන් පිටමං වන ලෙස නියෝග කිරීම.

3.4.3 ඔහුගේ හැඟීමේ ආකාරයට මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කිසියම් විධිවිධානයක් හෝ උල්ලංඝනය කළ බවට හැඟී ගියවිට ඒ සම්බන්ධයෙන් අදාළ පීඨාධිපති හෝ පුස්තකාලයාධිකාරී හෝ ප්‍රධාන ශිෂ්‍ය උපදේශක මාර්ගයෙන් උපකුලපතිවරයා වෙත වාර්තා කිරීම.

3.5 විශ්වවිද්‍යාලයේ විනයාරක්ෂක නිලධාරී (මාර්ෂල්) ලේඛකාධිකාරීට වගකිව යුතු අතර ඔහු උපකුලපතිවරයා සහ ලේඛකාධිකාරී විසින් දෙනු ලබන උපදෙස් හා නියෝගයන් පරිදි කටයුතු කළ යුතු ය. *විනයාරක්ෂක නිලධාරී*

3.6 විනයාරක්ෂක නිලධාරීට, *විනයාරක්ෂක නිලධාරීගේ බලතල*

3.6.1 ශිෂ්‍යයකුට /ශිෂ්‍යාවකට විශ්වවිද්‍යාලයෙන් නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත හෝ හැඳුනුම්පත ඉදිරිපත් කරන ලෙස ඔහුට /ඇයට නියම කිරීමට.

3.6.2 යම් ශිෂ්‍යයකු /ශිෂ්‍යාවක මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යම් කොන්දේසියක් කඩ කර ඇති බවට විශ්වාස කිරීමට හේතු ඇත්නම් ඔහු/ඇය පිළිබඳව ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරයාට හෝ ශිෂ්‍ය උපදේශකවරයකුට වාර්තා කිරීමට බලය ඇත්තේය.

## 4වන කොටස - අර්ථ නිරූපණය

1. <u>පාලක සභාව</u>
"පාලක සභාව" යනු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ 1985 අංක 07 දරන (සංශෝධන) විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපනය කරන ලද පාලක සභාවයි.

<u>සනාතන සභාව</u>
"සනාතන සභාව" යනු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ 1985 අංක 07 දරන (සංශෝධන) විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපනය කරන ලද සනාතන සභාවයි.

**<u>ලේඛකාධිකාරී</u>**
"ලේඛකාධිකාරී" යනු කැලණිය විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී, වැඩ බලන ලේඛකාධිකාරී හෝ ඔහු වෙනුවට හෝ ඔහු සඳහා හෝ අත්සන් කිරීමට බලය ලත් නියෝජ්‍ය ලේඛකාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, සහකාර ලේඛකාධිකාරී සහ වෙනත් ඕනෑම නිලධරයකු විය යුතුය.

**<u>උපකුලපතිවරයා</u>**
කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා සහ නියෝජ්‍ය උපකුලපතිවරයා හෝ කිසියම් කාලයක් සඳහා වැඩ බලන උපකුලපතිවරයා /නියෝජ්‍ය උපකුලපතිවරයා වේ.

**<u>ශිෂ්‍යයා</u>**
කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථියකු වශයෙන් ලියාපදිංචි වී සිටින ශිෂ්‍යයකු/ශිෂ්‍යයන් හෝ ශිෂ්‍යාවක/ශිෂ්‍යාවන් වේ. බාහිර උපාධි සඳහා ලියාපදිංචි වී ඇති විද්‍යාර්ථීන්, මුදල් ගෙවා හදාරනු ලබන පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇති විද්‍යාර්ථීන් මෙයට ඇතුලත් නොවේ.

**<u>ප්‍රධාන ශිෂ්‍ය උපදේශක</u>**
කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය සහිතව උපකුලපතිවරයා විසින් පත්කරනු ලබන ශිෂ්‍ය කටයුතු පිළිබඳ අධ්‍යක්‍ෂවරයා හෝ ඊට සමගාමී වෙනත් නිලයක් ද අදහස් කෙරේ.

2. අතුරු ව්‍යවස්ථාවන් පිළිබඳ කවර හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පැන නඟින ගැටළු පාලක සභාව වෙත යොමු කළයුතු අතර, ඒ සම්බන්ධයෙන් පාලක සභාවේ තීරණය අවසාන තීරණය වේ.

# I උපලේඛනය

1. විෂමාචාර චෝදනාවක් හා සම්බන්ධ මූලික පරීක්‍ෂණයක දී, පැමිණිලිකරු/ කරුවන්ගෙන් සහ සැකකාර ශිෂ්‍යයාගෙන් කරුණු විමසිය යුතුය.

2. අධිකරණයේ දී අනුගමනය කරනු ලබන පරීක්‍ෂණ පරිපාටිය මෙහි ලා අනුගමනය කිරීම අනිවාර්ය නොවේ.

3. විෂමාචාර චෝදනාවක් හා සම්බන්ධ ශිෂ්‍යයකුට ඒ පිළිබඳව දැනුම් දීමේ දී විෂමාචාරයේ ස්වභාවය, එය සිදු වූ ස්ථානය, වේලාව හෝ දිනය සහ ඊට සම්බන්ධ කිසියම් පුද්ගලයකු නැත්නම් දේපළ පිළිබඳ විස්තර සහිතව එය සිදු කළ යුතුය.

4. සැකයට /චෝදනාවට ලක් වූ ශිෂ්‍යයාට විරුද්ධව ඇති පැමිණිල්ලට අදාළ කරුණු දැනුම් දීම ද ඒ පිළිබඳව නිදහසට කරුණු දැක්වීමට අවස්ථාව ලබා දීම ද කළ යුතුය.

5. අදාළ සාක්ෂිකරුවන් සහ විෂමාචාර චෝදනාවට/සැකයට ලක් වූ ශිෂ්‍යයා ප්‍රශ්න කිරීමේ දී එය එකිනෙකා අබියස නොව වෙන් වෙන්ව සිදු කළ හැකිය.

6. ශිෂ්‍යයකුට විරුද්ධව විෂමාචාරය සම්බන්ධ පැමිණිල්ලක් පරීක්‍ෂා කරන මූලික පරීක්‍ෂණ අවස්ථාවෙහි එම ශිෂ්‍යයාට එරෙහි සාක්ෂිකරුවකුගෙන් ප්‍රශ්න කිරීමට හෝ හරස් ප්‍රශ්න ඇසීමට ද, ඔහු වෙනුවෙන් වෙනත් නියෝජිතයකු රඳවා ගැනීමට ද සැකකාර ශිෂ්‍යයාට අයිතිවාසිකමක් නොමැත.

7. බරපතල විෂමාචාර චෝදනාවක් සම්බන්ධයෙන්, පත්කරන ලද කමිටුවක් විසින් සිදු කරනු ලබන මූලික පරීක්‍ෂණය/විමර්ශනය අවසානයේ දී අවස්ථානුකූලව සුදුසු දඬුවම් නිර්දේශ කිරීම හෝ ඒ පිළිබඳ විධිමත් පරීක්‍ෂණයක් පැවැත්විය යුතු බවට එම කමිටුවට නිර්දේශ කළ හැකිය.

8. ඉහත 7 ඡේදයෙහි සඳහන් පරිදි විධිමත් පරීක්‍ෂණයක් පැවැත්වීම සුදුසු බවට නිර්දේශයක් කරන ලද අවස්ථාවක එවැනි පරීක්‍ෂණයක් පවත්වා තීරණයක් ලැබෙන තුරු, සුදුසු යයි තමා අදහස් කරන තාවකාලික විනය ක්‍රියාමාර්ගයක් ගෙන එවැනි ක්‍රියාමාර්ගයන් අනුමත කිරීම හෝ සංශෝධනය කිරීම සඳහා සනාතන සභාව සහ පාලක සභාව වෙත වාර්තා කිරීමට උපකුලපතිවරයාට හැකිය.

## විධිමත් පරීක්‍ෂණය

9. විධිමත් පරීක්ෂයක් පැවැත්වීම සුදුසු බවට නිර්දේශයක් උපකුලපතිවරයා වෙත ලැබුනු අවස්ථාවක දී, ලිඛිත චෝදනා පත්‍රයක් චෝදනාවට ලක් වූ ශිෂ්‍යයා වෙත අවස්ථානුකූලව ඔහුගේ පෞද්ගලික ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යැවීම හෝ අතින් භාර දීම කළ යුතු ය.

10. චෝදනා පත්‍රයක අඩංගු චෝදනා නිශ්චිත විය යුතු අතර, චූදිත ශිෂ්‍යයාට එකී චෝදනාවන්ට වරදකරුද නිවැරදිකරු ද යන්න ප්‍රකාශ කරන ලෙසට විධානයක් එහි අඩංගු විය යුතු ය. චූදිත ශිෂ්‍යයා එකී චෝදනා පත්‍රය මගින් නියම කරන ලද කාලසීමාවක් තුළ ලිඛිතව ඊට පිළිතුරු සැපයිය යුතු ය.

11. චූදිත ශිෂ්‍යයා චෝදනා පත්‍රයේ අඩංගු චෝදනාවලට වරද පිළිගන්නා අවස්ථාවක අදාළ චෝදනා සම්බන්ධයෙන් සුදුසු විනය නියෝගයක් කිරීමට උපකුලපතිවරයාට හැකි වන අතර, ඒ පිළිබඳව සනාතන සභාවට සහ පාලක සභාවට වාර්තා කළ යුතු ය.

12. චූදිත ශිෂ්‍යයා චෝදනා පත්‍රයට පිළිතුරු සැපයීම පැහැර හරින ලද අවස්ථාවක ඒක පාර්ශ්විකව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා සුදුසු විනය නියෝගයක් කිරීමට උපකුලපතිවරයාට හැකි වන අතර, ඒ පිළිබඳව සනාතන සභාවට සහ පාලක සභාවට වාර්තා කළ යුතු ය.

13 විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු/සාමාජිකයන් තිදෙනකුට නොවැඩි කමිටුවක්, බාහිර පුද්ගලයකු /බාහිර පුද්ගලයන් තිදෙනකුට නොවැඩි කමිටුවක් අවස්ථාවෝචිත පරිදි උපකුලපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

14. පැමිණිලි පාර්ශවය වෙනුවෙන් හෝ චූදිත පාර්ශ්වය වෙනුවෙන් හෝ කැඳවීමට ඉල්ලා සිටින සාක්ෂිකරුවන් හෝ සාක්ෂි ලබාගැනීම සඳහා අවශ්‍ය යැයි හැගෙන ඕනෑම අයකු තමන් හමුවට කැඳවීමට පරීක්ෂණ කමිටුවට හැකියාව ඇත.

15. විධිමත් පරීක්ෂණයේ දී පාර්ශවකරුවන්ගේ ඉල්ලීම පරිදි තමන් වෙනුවෙන් සාක්ෂිකරුවන් සහ/හෝ ලේඛන ඉදිරිපත් කිරීමට ද පැමිණිල්ල/විත්තිය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ද පැමිණිලිකාර/ චූදිත පාර්ශ්වයට අවස්ථාව ලැබේ.

16. පැමිණිල්ලේ ස්වභාවය අනුව පැමිණිල්ලේ යම් සාක්ෂිකරුවකු පරීක්ෂණ කමිටුව හමුවට නොකැඳවා ඔහුගේ/ඇයගේ ලිඛිත ප්‍රකාශයක් ලබාගැනීමට තීරණය කිරීමට පරීක්ෂණ කමිටුවට හැකිය. එලෙස ලිඛිත ප්‍රකාශ ඉදිරිපත් කරන සාක්ෂිකරුවකුගෙන් ප්‍රශ්න කිරීමේ අවස්ථාව චූදිත පාර්ශවයට අහිමි වන අතර, එවැනි විටකදී අදාළ සාක්ෂිකරුගෙන් චෝදනාවලට අදාළ පැහැදිලි කිරීම් පරීක්ෂණ කමිටුව හරහා ලිඛිතව විමසා ලබාගැනීමට චූදිත පාර්ශ්වයට අවස්ථාව ලබාදිය හැකි ය.

17. පරීක්ෂණය අවසානයේ පරීක්ෂණ කමිටුව සිය තීරණය සහ එම තීරණයට එළඹීමට හේතු ඇතුළත් වාර්තාවක් උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

18. ඉහත සඳහන් පරිදි වාර්තාවක් ලැබුණු විට උපකුලපතිවරයා විසින්, චූදිත ශිෂ්‍යයාට /ශිෂ්‍යයන්ට පනවනු ලැබිය යුතු දඬුවම තීරණය කිරීම සඳහා එම වාර්තාව විනය මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු අතර, එවැනි දඬුවම් පාලක සභාවේ අනුමැතිය මත ක්‍රියාත්මක කළ යුතු ය.

19. දඬුවම් නියම කිරීමෙන් පසු චූදිත ශිෂ්‍යයා වෙත ඒ බව අවස්ථානුකූලව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාරදීමෙන් දැන්විය යුතු ය.

20. තමාට එරෙහිව එවැනි විනය ක්‍රියාමාර්ගයක් ගනු ලැබ ඇති යම් ශිෂ්‍යයකුට /ශිෂ්‍යයන්ට, එවැනි තීරණයකට එරෙහිව එම තීරණය ලැබුණු දින සිට දින දාහතර (14) ක කාල සීමාවක් තුළ උපකුලපතිවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

## අභියාචනා කාර්ය පටිපාටිය

1. ශිෂ්‍යයකුට / ශිෂ්‍යයන්ට දඬුවම් පැනවීමට ගෙන ඇති තීරණයකට එරෙහිව ශිෂ්‍යයකු /ශිෂ්‍යයන් කරන අභියාචනයන් උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

2. උපකුලපතිවරයා එවැනි අභියාචනයක් ඉක්බිතිව ම එළඹෙන රැස්වීමේ දී පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. පාලක සභාව විසින් එහි සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත අභියාචන කමිටුවක් මෙම කාරණය සඳහා පත් කළ යුතුය. අභියාචනා කමිටුව එහි සභාපති පත් කර ගත යුතුය. ලේඛකාධිකාරීවරයා අභියාචනා කමිටුවේ ලේකම්වරයා විය යුතු ය.

4. පාලක සභාවේ අභියාචනා කමිටුව වෙත ඉදිරිපත් වන සියලු අභියාචනා සලකා බලා, අභියාචනය කමිටුව වෙත ලැබී සති දෙකක කාලයක් තුළ පාලක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

5. පාලක සභාව විසින් අභියාචනා කමිටුවේ වාර්තාව සලකා බලන අවස්ථාවේ දී ප්‍රස්තුත අභියාචනයට අදාල විනය කමිටුවේ සාමාජිකයන් (ඔවුන් පාලක සභාවේ සාමාජිකයන් වේ නම්) පාලක සභා රැස්වීමට සහභාගී නො විය යුතු ය.

6. අභියාචන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, ශිෂ්‍යයාට එරෙහිව විනය ක්‍රියා මාර්ගය සම්බන්ධ ව ගෙන ඇති තීරණය වෙනස් කිරීමට පාලක සභාවට බලය ඇත. ශිෂ්‍යයා /ශිෂ්‍යයන් විසින් කරන ලද අභියාචනය පිළිබඳ පාලක සභාවේ තීරණය අවසානාත්මක වේ.

7. උපකුලපතිවරයා පාලක සභාවේ තීරණය අභියාචක ශිෂ්‍යයාට /ශිෂ්‍යයන්ට ලියාපදිංචි තැපැල් මගින් දැන්විය යුතුය. එලෙස දැනුම් දෙන තීරණය අවසන් සහ තීරණාත්මක වේ.

## I උපලේඛනය

| වරද | නිර්දේශිත උපරිම දඬුවම |
|---|---|
| i. උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, වෙනත් කවර හෝ නිලධරයකු, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හෝ පරිපාලන කාර්ය මණ්ඩලයේ හෝ ආරක්ෂක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු හෝ උපකුලපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් කවර හෝ තැනැත්තකු හෝ ශිෂ්‍ය හැඳුනුම්පත පරීක්ෂා කිරීම ඉල්ලා සිටි විට එය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂෙප කිරීම හෝ පැහැර හැරීම.<br><br><u>පැහැදිලි කිරීම:</u><br>ඉල්ලා සිටි විට ශිෂ්‍ය හැඳුනුම්පත ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂෙප කරන කවර හෝ ශිෂ්‍යයකු අනවසරයෙන් රැඳී සිටින්නකු ලෙස සැලකෙන අතර ඔහු/ඇය සම්බන්ධයෙන් රට තුළ බලපවත්වන සාමාන්‍ය නීතිය අනුව ද කටයුතු කරනු ලැබිය හැකි ය. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ. වරදෙහි බරපතලකම අනුව එක් ලිත් වසරකට නොවැඩි කාල සීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ. උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| ii. විශ්වවිද්‍යාලයේ නේවාසික පහසුකම්වලට අදාළ අතුරු ව්‍යවස්ථා කඩ කිරීම | යම් අනු නීති කඩකිරීමක ප්‍රතිඵලයක් වශයෙන් විශ්වවිද්‍යාලයට දරන්නට සිදු වී ඇති අලාභය අයකර ගැනීම සහ වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ. වරදෙහි බරපතලකම අනුව එක් ලිත් වසරකට නොවැඩි කාල සීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>සහ /හෝ<br>ආ. ඉදිරි කාලය සඳහා නේවාසික පහසුකම් ලබා නොදීම.<br>හෝ<br>ඇ. උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම.<br><br>ඉහත දඬුවම්, විශ්වවිද්‍යාලයේ වෙනත් කවර හෝ අනු නීති කඩකිරීම වෙනුවෙන් පනවනු ලැබිය හැකි වෙනත් කවර හෝ දඬුවම්වලට අමතර ව විය හැකි ය. |
| iii. විශ්වවිද්‍යාලයට අයත් හෝ විශ්වවිද්‍යාලය භාරයේ තිබෙන හෝ විශ්වවිද්‍යාලය විසින් තාවකාලිකව දරා සිටින යම් කිසි දේපළක් විනාශ කිරීම, දේපළකට හානි පැමිණවීම, විකෘති කිරීම, අන්සතු කිරීම, අනිසි ලෙස පරිහරණය කිරීම හෝ තමන් සතු කර ගැනීම. | ප්‍රතිස්ථාපන වටිනාකම හෝ අනිසි පරිහරණයෙහි පිරිවැය මෙන් තුන් (03) ගුණයකට සහ එවැනි වටිනාකමෙන් හෝ පිරිවැයෙන් 25% කට සමාන දඩයක්<br>සහ<br>වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ. ලිත් වර්ෂ දෙකක කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාගවලට පෙනී සිටීම වැළැක්වීම. |
| iv. විශ්වවිද්‍යාලයේ යම් අතුරු ව්‍යවස්ථාවක්, රෙගුලාසියක් හෝ නීතියක් උල්ලංඝනය කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ. වරදෙහි බරපතලකම අනුව එක් ලිත් වර්ෂයකට නොවැඩි කාල සීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාගවලට පෙනී සිටීම වැළැක්වීම<br>හෝ |

| | |
|---|---|
| | ආ. උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| v. උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, වෙනත් කවර හෝ නිලධරයකු, අධ්‍යයන හෝ පරිපාලන හෝ ආරක්ෂක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු හෝ උපකුලපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් කවර හෝ තැනැත්තකු විසින් නිකුත් කරනු ලබන කිසියම් නීත්‍යානුකූල නියෝගයක් පිළිපැදීම ප්‍රතික්ෂේප කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ. වරදෙහි බරපතලකම අනුව එක් ලිත් වර්ෂයකට නොවැඩි කාල සීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ. උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| vi. විශ්වවිද්‍යාලයට සත්‍ය තොරතුරු දැනගැනීමට අයිතියක් ඇති කිසියම් කාරණාවක් සම්බන්ධයෙන්, උපකුලපතිවරයාගේ මතය අනුව සිතාමතා ම විශ්වවිද්‍යාල බලමණ්ඩල නොමග යැවීමේ අදහසින්, විශ්වවිද්‍යාලය වෙත අසත්‍ය තොරතුරු සැපයීම. | අ. ලේඛන පිළිබඳ වංචා කිරීමේ වරද සඳහා විශ්වවිද්‍යාලයෙන් නෙරපීම.<br>හෝ<br>ආ. අනෙකුත් අවස්ථාවන් සඳහා එක් ලිත් වර්ෂයකට විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ. උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| vii. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ දී මත්පැන් ගඳ වහනය වීම හෝ මත්ද්‍රව්‍ය, මත්පැන්, මත්කරන හෝ වෙනත් ඇබ්බැහි වූ මත්ද්‍රව්‍ය භාවිත කොට තිබීම හෝ ළඟ තබා ගැනීම, මත්පැන්, මත්කරන ද්‍රව්‍ය, ඇබ්බැහි වූ මත්ද්‍රව්‍ය පරිභෝජනය කිරීම හෝ සැපයීම හෝ සූදු ක්‍රීඩා කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ. ලිත් වර්ෂ දෙකකට නොවැඩි කාල සීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ/හෝ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ. උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| viii. විශ්වවිද්‍යාල සීමාව තුළ පුද්ගලයන්ට හෝ දේපළට හානි කිරීමේ අරමුණින් යුද්ධායුධ, ආයුධ සහ/හෝ වෙනත් කිසියම් ද්‍රව්‍යයක් සන්තකයෙහි තබා ගැනීම, ගබඩා කිරීම හෝ දරා සිටීම හෝ භාවිත කිරීම. | අ. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ යුද්ධායුධ සහ ආයුධ සන්තකයෙහි තබා ගැනීම, ගබඩා කිරීම හෝ භාවිත කිරීම නිසා විශ්වවිද්‍යාලයෙන් නෙරපීම.<br>හෝ<br>ආ. පුද්ගලයන්ට හෝ දේපළට හානි කිරීමේ අරමුණින් වෙනත් කිසියම් ද්‍රව්‍යයක් සන්තකයෙහි තබා ගැනීම හෝ ගබඩා කිරීම හෝ දරා සිටීම සඳහා ලිත් වර්ෂ තුනකට විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ/හෝ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම. |
| ix. විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි කිරීමේ, ඉගැන්වීමේ, අධ්‍යයන, පර්යේෂණ හෝ විභාග කටයුතු හෝ විශ්වවිද්‍යාලයේ පරිපාලනය කඩාකප්පල් විය හැකි ආකාරයේ ක්‍රියාවන්හි නිරත වීම හෝ විශ්වවිද්‍යාලය විසින් එහි පරිශ්‍රය තුළ හෝ ඉන් පිටත සංවිධානය කරන ලද කටයුත්තකට බාධා කිරීම හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වනු ලබන වෙනත් අවසරලත් කටයුත්තකට බාධා පැමිණවීම හෝ කඩාකප්පල් කිරීම. | එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ/හෝ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම සහ බාධා කිරීමෙහි හෝ කඩාකප්පල් කිරීමහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන මූල්‍යමය පාඩු අයකර ගැනීම. |

| | |
|---|---|
| x. විශ්වවිද්‍යාලයේ නිලධරයකුට, අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයකුට විශ්වවිද්‍යාලයේ වෙනත් කවර හෝ සේවකයකුට හෝ වෙනත් කවර හෝ අවසරලත් තැනැත්තකුට සිය නිල කාර්ය ඉටු කිරීමට බාධා පැමිණවීම හෝ හිරිහැර කිරීම. | ලිත් වර්ෂ දෙකක කාලයක් සඳහා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම. |
| xi.කිසියම් ශිෂ්‍යයකුගේ අධ්‍යයන හෝ පර්යේෂණ කටයුතු කරගෙන යාමට බාධා කිරීම හෝ වැළැක්වීම හෝ පිළිගත් ශිෂ්‍ය සමිතියක/ සමාගමක/ සංගමයක නීත්‍යානුකූල ක්‍රියාකාරකම් කඩාකප්පල් කිරීම. | එක් ලිත් වර්ෂයක කාලයක් සඳහා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම. |
| xii.විශ්වවිද්‍යාලය විසින් කලින් කලට සාදනු ලබන රීතින් හෝ වෙනත් ප්‍රතිපාදනවලට අනුකූල ව හැර වෙනත් ආකාරයට හෝ උපකුලපතිවරයාගේ හෝ අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයාගේ අවසරය නොමැති ව විශ්වවිද්‍යාල දේපළෙහි පදිංචි ව සිටීම හෝ පරිහරණය කිරීම. | එක් ලිත් වර්ෂයක කාලයක් සඳහා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම. |
| xiii.උපකුලපතිවරයාගේ මතය අනුව විශ්වවිද්‍යාලයේ හොඳ නමට හෝ විශ්වවිද්‍යාලය තුළ විනය හා ශික්ෂණය පවත්වාගෙන යාමට හානිදායක අයුරින් හැසිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ.වරදෙහි බරපතලකම අනුව ලිත් වර්ෂ දෙකකට නොවැඩි කාල සීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xiv.(අ) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකුට, උපකුලපතිවරයාට, නියෝජ්‍ය උපකුලපතිවරයාට, වෙනත් කවර හෝ නිලධරයකුට, අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට, වෙනත් කවර හෝ සේවකයකුට හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ ඉන් පිටත රැඳී සිටීමට බලයලත් වෙනත් කවර හෝ තැනැත්තකුට පරිභව කිරීම, හිරිහැර කිරීම (කවර ආකාරයක හෝ නවක වදය දීම/අතවර කිරීම ඇතුළු ව) ලිංගික හිරිහැර කිරීම සහ හෝ මානසික හෝ ශාරීරික ව තැති ගැන්වීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ.ලිත් වර්ෂ දෙකකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| ආ. කවර හෝ ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යයන් විසින් විශ්වවිද්‍යාලයට, විශ්වවිද්‍යාලයේ උපකුලපති වරයාට, වෙනත් යම් නිලධරයකුට, අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයකුට, විශ්වවිද්‍යාලයේ වෙනත් යම් සේවකයකුට තර්ජනාත්මක හෝ අපකීර්තිකර පෝස්ටර් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ.ලිත් වර්ෂ දෙකකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ |

| | |
|---|---|
| | ඈ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xv.විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකුට, උපකුලපති වරයාට, වෙනත් යම් නිලධරයකුට, අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයකුට විශ්වවිද්‍යාලයේ වෙනත් යම් සේවකයකුට හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ විශ්වවිද්‍යාලයේ අවසරය ඇතිව සංවිධානය කරන ලද අවස්ථාවකට පැමිණ සිටීමට බලයලත් වෙනත් යම් තැනැත්තකුට ශාරීරික තුවාල හෝ ශාරීරික පීඩා සිදු කිරීම හෝ එවැන්නක් සිදු කරන බවට තර්ජනය කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ.ලිත් වර්ෂ දෙකකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ.එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඈ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xvi.උපකුලපතිවරයා, නියෝජ්‍ය උපකුලපති වරයා, වෙනත් නිලධරයකු, අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයකු, විශ්වවිද්‍යාලයේ යම් ශිෂ්‍යයකු, සේවකයකු හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ විශ්වවිද්‍යාලයේ අවසරය ඇති ව සංවිධානය කරන ලද අවස්ථාවකට පැමිණ සිටීමට බලයලත් වෙනත් යම් තැනැත්තකු පැහැරගෙන යාම, ප්‍රාණ ඇපකරුවකු වශයෙන් රඳවා තබා ගැනීම, පැහැරගෙන යාමට තැත් කිරීම හෝ ප්‍රාණ ඇපකරුවකු වශයෙන් රඳවා තබා ගැනීමට තැත් කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ.ලිත් වර්ෂ දෙකකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ.එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඈ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xvii.විශ්වවිද්‍යාලයේ නීත්‍යානුකූල කාර්යයන් කඩාකප්පල් කිරීම සඳහා ශිෂ්‍යයන් පෙළඹ වීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ.ලිත් වර්ෂ දෙකකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ.එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඈ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xviii.විශ්වවිද්‍යාලයට අයත් දේපළක් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ දී සොරකම් කිරීම, සොරකම් කිරීමට තැත් කිරීම, එලෙස සොරකම් කරන ලද දේපළක් සන්තකයෙහි තබා ගැනීම හෝ විශ්වවිද්‍යාල දේපළට හෝ විශ්වවිද්‍යාලයේ නිලධරයකුට, අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයකුට, සේවකයකුට හෝ ශිෂ්‍යයකුට, විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ විශ්වවිද්‍යාලයේ අවසරය ඇති ව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ ඉන් පිටත සංවිධානය කරන ලද අවස්ථාවකට පැමිණ සිටීමට බලයලත් වෙනත් යම් තැනැත්තකුට | |

අයත් දේපළවලට සිතාමතා හානි කීරීම සිදු කළ කවර හෝ ශිෂ්‍යයකු:

| | |
|---|---|
| (1). සොරකම | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන, ප්‍රතිස්ථාපන වටිනාකම සහ එවැනි වටිනාකමින් 25% කට සමාන දඩයක් සහ,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ.ලිත් වර්ෂ දෙකකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඈ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| (2). සිතාමතා හානි සිදු කිරීම | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන, ප්‍රතිස්ථාපන වටිනාකම සහ එවැනි වටිනාකමින් 25% කට සමාන දඩයක් සහ,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ.ලිත් වර්ෂ දෙකකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඈ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| (3). සොරකම් කිරීමට තැත් කිරීම. | දඬුවම් පැමිණවීම සඳහා වන කමිටුව විසින් නිර්දේශ කරනු ලබන දඩයක් සහ<br>අ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| (4). සොරකම් කරන ලද දේපළ ළඟ තබා ගැනිම | දේපළ ආපසු භාරදීම සහ දඬුවම් පැමිණවීම සඳහා වන කමිටුව විසින් නිර්දේශ කරනු ලබන දඩයක්. |
| xix. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ රැඳී සිටීම සඳහා වන කාල සීමාවන් උල්ලංඝනය කිරීම හෝ නියමිත කාලසීමාවන්ට හෝ උපකුලපතිවරයා විසින් විශේෂයෙන් දනුම් දී ඇති කාල සීමාවන්ට පෙර හෝ පසුව, උපකුලපතිවරයාගේ හෝ වෙනත් අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයකුගේ අවසරය නොමැති ව විශ්වවිද්‍යාලයට ඇතුලුවීමට උත්සාහ කිරීම. | උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |

| | |
|---|---|
| xx. විශ්වවිද්‍යාලයේ යම් සේවකයකුට, එම සේවකයා විසින් හෝ විශ්වවිද්‍යාලයේ වෙනත් යම් සේවකයකු විසින් යම් රාජකාරී කටයුත්තක් ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීම සඳහා හෝ කඩිනම් කිරීම, සීමා කිරීම හෝ වැළැක්වීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තුටු පඬුරක් පිරිනැමීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ. මාස 6 කට නොඅඩු සහ ලිත් වර්ෂ දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම. |
| xxi. විශ්වවිද්‍යාලය විසින් පිළිගනු නොලැබූ ශිෂ්‍ය කණ්ඩායමක, යම් සමිතියක හෝ සමාගමක හෝ සංගමයක හෝ විශ්වවිද්‍යාලයේ පූර්ව අනුමැතිය රහිත ව රැස්වීමක්/රැස්වීම් කැඳවීම හෝ උපකුලපතිවරයාගේ හෝ උපකුලපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තෙකුගේ අවසරය නොමැති ව ප්‍රකාශන/පෝස්ටර් විශ්වවිද්‍යාලයේ ප්‍රදර්ශනය කිරීම හෝ බෙදා හැරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xxii. සංශෝධනය කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අදාළ වගන්තිය මගින් ප්‍රතිපාදන සලස්වා ඇති පරිදි සහ/හෝ ඒ සඳහා අනුමත කාර්ය පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව යම් සමිතියක් හෝ සමාගමක් හෝ සංගමයක් පිහිටුවීම හෝ පිහිටුවීමට ආධාර කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xxiii. යම් සමිතියක /සමාගමක/සංගමයක කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ ව විශ්වවිද්‍යාලය විසින් සාදන ලද නීති හා රෙගුලාසි පිළිපදීමට අපොහොසත් වීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xxiv. විශ්වවිද්‍යාලයේ යම් සමිතියක/ සමාගමක/ සංගමයක ව්‍යවස්ථාවට පටහැනි ලෙස විශ්වවිද්‍යාල සීමාව තුළ, ශිෂ්‍යයන්ගේ යම් රැස්වීමක් කැඳවීම හෝ එවැනි රැස්වීමකට සහභාගී වීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xxv.යම් පිළිගත් සමිතියක්/ සමාගමක්/ සංගමයක් හෝ උපකුලපතිවරයා, නියෝජ්‍ය උපකුලපතිවරයා, යම් නිලධරයකු/ අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩලය සාමාජිකයකු, සේවකයකු හෝ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රය ඇතුළත හෝ විශ්වවිද්‍යාලයේ අවසරය ඇති ව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ ඉන් පිටත සංවිධානය කරන ලද අවස්ථාවකට පැමිණ සිටීමට බලයලත් වෙනත් යම් තැනැත්තකු අපහාසයට හෝ | වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ.ලිත් වර්ෂ දෙකක කාලයකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ |

| | |
|---|---|
| දෝෂාරෝපණයට ලක් කරන දේ මුද්‍රණ/ ශබ්ද/ වීඩියෝ/ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය භාවිත කරමින් බෙදා හැරීම සහ/ හෝ ප්‍රදර්ශනය කිරීම සහ/හෝ ප්‍රසිද්ධ කිරීම. | ඈ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xxvi.උපකුලපතිවරයාට, නියෝජ්‍ය උපකුලපතිවරයාට, වෙනත් යම් නිලධරයකුට, අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයකුට, සේවකයකුට, විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකුට හෝ විශ්වවිද්‍යාලය ඇතුළත හෝ විශ්වවිද්‍යාලයේ අවසරය ඇති ව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ ඉන් පිටත සංවිධානය කරන ලද අවස්ථාවකට පැමිණ සිටීමට බලයලත් වෙනත් යම් තැනැත්තකුට අයත් දේපළක් විරූපී කිරීම හෝ අවලක්ෂණ කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ.ලිත් වර්ෂ දෙකක කාලයකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඈ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xxvii. උපකුලපතිවරයාගේ හෝ මෙම කාර්යය සඳහා නම් කරන ලද වෙනත් ආචාර්යවරයකුගේ හෝ නිලධරයකුගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැති ව, විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු වශයෙන් හෝ ශිෂ්‍යයන් වෙනුවෙන් හෝ ශිෂ්‍යයන්ගේ ඉල්ලීම මත හෝ ශිෂ්‍යයන් ඇමතීම සඳහා විශ්වවිද්‍යාලයෙන් පිටස්තර යම් කථිකයකුට හෝ විශ්වවිද්‍යාලය තුළ යම් කාර්යයක් සඳහා යම් පිටස්තර පුද්ගලයකුට ආරාධනා කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xxviii. උපකුලපතිවරයාගේ හෝ මෙම කාර්යය සඳහා උපකුලපතිවරයා විසින් නම් කරන ලද වෙනත් ආචාර්යවරයකුගේ හෝ නිලධරයකුගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැති ව, විශ්වවිද්‍යාල සීමාව තුළ හෝ ඉන් පිටත, විශ්වවිද්‍යාලය නමින් කිසිදු මුදල් හෝ භාණ්ඩ රැස්කිරීමකට කටයුතු සම්පාදනය කිරීම හෝ සංවිධානය කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලටගෙන,<br>අ.ලිත් වර්ෂ දෙකක කාලයකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ආ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xxix. ලිත් මාස 12 ක් ඇතුළත තෙවරක් අවවාද ලබා ඇති ශිෂ්‍යයකු. | අවසාන අවවාද කිරීමේ දින සිට මාස 12 ක කාල සීමාවක් සඳහා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම. |
| xxx. තදින් අවවාද කිරීම පිළිපැදීමට අසමත් වීම. | එක් අධ්‍යයන වර්ෂයකට විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම. |
| xxxi. ශිෂ්‍යභාවය අත්හිටුවීමකට ලක්ව සිටින ශිෂ්‍යයකු තවත් වරදක් සිදු කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාලයෙන් නෙරපීමට හෝ වැඩිදුර කාලසීමාවක් සඳහා ශිෂ්‍යභාවය අත්හිටුවීම. |
| xxxii. බලධරයන්ගේ අවසර නොමැති ව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ දැන්වීම්, පෝස්ටර් ප්‍රසිද්ධ කිරීම. | ලිත් මාස 3 කට ශිෂ්‍යභාවය අත්හිටුවීම. |
| xxxiii. උපකුලපතිවරයාගේ අනුමැතිය නොමැති ව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පුවත්පත්/ වාර ප්‍රකාශන විකිණීම හෝ අත්පත්‍රිකා බෙදා හැරීම. | ලිත් මාස 3 කට ශිෂ්‍යභාවය අත්හිටුවීම. |

| | |
|---|---|
| xxxiv. උපකුලපතිවරයා මගින් නොමැති ව ඉහළ බලධරයන් හා සම්බන්ධ වීම. | ලිත් මාස 6 කට ශිෂ්‍යභාවය අත්හිටුවීම. |
| xxxv.උපකුලපතිවරයාගේ එකඟත්වය නොමැති ව මාධ්‍ය හා සම්බන්ධ වීම. | එක් අධ්‍යයන වර්ෂයකට විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම. |
| xxxvi.ලිත් මාස 12 ක් ඇතුළත තෙවරක් අවවාද ලබා ඇති ශිෂ්‍යයකු | අවසාන අවවාද කිරීමේ දින සිට මාස 12 ක කාල සීමාවක් සඳහා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම. |
| xxxvii.අවවාද කිරීම පිළිපැදීමට අසමත් වීම. | එක් අධ්‍යයන වර්ෂයකට විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම. |
| xxxviii. ශිෂ්‍යභාවය අත්හිටුවීමකට ලක්ව සිටින ශිෂ්‍යයකු තවත් වරදක් සිදු කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන වැඩිදුර කාලසීමාවක් සඳහා ශිෂ්‍යභාවය අත්හිටුවීම හෝ විශ්වවිද්‍යාලයෙන් නෙරපීම. |
| xxxix. විශ්වවිද්‍යාලයේ පරිගණක පද්ධතිය/ ජාලය අනවසරයෙන් හෝ අනිසි ලෙස පරිහරණය කිරීම. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ.ලිත් වර්ෂ දෙකක කාලයකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඈ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |
| xl. II උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් කර නොමැති වෙනත් යම් වරදක් හෝ විනය කඩ කිරීමක්. | වරදෙහි බරපතලකම සැලකිල්ලට ගෙන,<br>අ. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම<br>හෝ<br>ආ.ලිත් වර්ෂ දෙකක කාලයකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනීම.<br>හෝ<br>ඇ. එක් ලිත් වර්ෂයකට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යභාවය අත්හිටුවීම සහ සුදුසු පරිදි විභාග ප්‍රතිඵල හෝ සහතික රඳවා ගැනී ම.<br>හෝ<br>ඈ.උපකුලපතිවරයා විසින්, ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවෙහි ඒ පිළිබඳ වාර්තාවක් සහිත ව, තදින් අවවාද කිරීම. |

## 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත

(සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 29 වන දින)

එල්.ඩී.ඕ 7/98

**අධ්‍යාපන ආයතනවලින් නවකවදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා ද, ක්‍රෑර, අමානුෂික සහ නින්දිත සැලකීම ද තුරන් කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රි සමජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬුනාමය**

1. මේ පනත 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) අධ්‍යාපන ආයතනයක් තුළ දී හෝ ඉන් පිටත දී හෝ නවකවදය සිදු කරන්නා වූ හෝ එහි ලා සහභාගී වන්නා වූ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇති ව බන්ධනාගාර ගත කරනු ලැබීමට යටත් විය යුතු ය. තව ද වරද සිදු කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානිය සඳහා අධිකරණය විසින් තීරණය කරනු ලබන මුදලකින් වන්දි ගෙවන ලෙස ද, ඒ පළමු ව සඳහන් කළ තැනැත්තාට ආඥා කරනු ලැබිය හැකි ය.

**නවක වදය**

(2) අධ්‍යාපන ආයතනයක යම් ශිෂ්‍යයකුට හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ නවක වදය සිදු කරන අතරතුර, ඒ ශිෂ්‍යයාට හෝ සාමාජිකයාට ලිංගික අතවරයක් හෝ බරපතල තුවාල සිදුකරන්නා වූ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය. තව ද වරද සිදුකරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදුකරන ලද හානිය සඳහා, අධිකරණය විසින් තීරණය කරනු ලබන මුදලකින් වන්දි ගෙවන ලෙස, ඒ පළමු ව සඳහන් කළ තැනැත්තාට ආඥා කරනු ලැබිය හැකි ය.

**සාපරාධි භයගැන්වීම**

3. මේ වගන්තියෙහි 'තර්ජිත තැනැත්තා' යනුවෙන් සඳහන් කරනු ලබන, අධ්‍යාපන ආයතනයක යම් ශිෂ්‍යයකු හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයකු හෝ තුළ බිය ඇතිකිරීමේ චේතනාව ඇති ව හෝ තර්ජිත තැනැත්තාට නීතියෙන් නොමැති යම් ක්‍රියාවක් කරන ලෙස හෝ කිරීමට ඒ තැනැත්තාට අයිතිය තිබෙන යම් ක්‍රියාවක් නොකර හරින ලෙස හෝ තර්ජිත තැනැත්තාට බලකිරීමේ චේතනාව ඇති ව, ඒ අධ්‍යාපන ආයතනය තුළ දී හෝ ඉන් පිටත දී හෝ ඒ ශිෂ්‍යයාගේ හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයාගේ ශරීරයට, කීර්තියට හෝ දේපළට, තර්ජිත තැනැත්තාට සම්බන්ධතාවයක් ඇති වෙනත් යම් තැනැත්තකුගේ ශරීරයට, කීර්තියට, හෝ දේපළට හානි සිදුකරන බවට, වාචික ව හෝ ලිඛිත ව, තර්ජන කරන්නා වූ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු 05ක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇති ව බන්ධනාගාර ගත කරනු ලැබීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**අඩස්සියට ගැනීම**

4. යම් අධ්‍යාපන ආයතනයක් ඇතුළත දී හෝ ඒ අධ්‍යාපන ආයතනයේ කළමනාකරණය හා පාලනය යටතේ වූ යම් පරිශ්‍රයක් ඇතුළත දී නීත්‍යානුකූල යුක්ති සහගත භාවයකින් තොර ව ද, යම් විශේෂ ක්‍රියාමාර්ගයක් ගැනීමට ඒ අධ්‍යාපන ආයතනයේ යම් ශිෂ්‍යයකුට, එහි කාර්යය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ වෙනත් තැනැත්තකුට බලකිරීමේ කාර්ය සඳහා ද, ඒ ශිෂ්‍යයාගේ හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයාගේ හෝ වෙනත් තැනැත්තකු හෝ පෞද්ගලික නිදහස සහ යාමර්මේ නිදහස අවහිර කරන්නා වූ යම් ක්‍රියාවක් කරන, යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු 07ක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇති ව බන්ධනාගාර ගත කරනු ලැබීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**අයුතු ලෙස අවහිර කිරීම**

5. අධ්‍යාපන ආයතනයක යම් ශිෂ්‍යයකුට හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ යම් අයිතිවාසිකමක් ඇති යම් පැත්තකට යාමේ ඒ ශිෂ්‍යයා හෝ සාමාජිකයා වලක්වන යම් ආකාරයකින් ඒ ශිෂ්‍යයාට හෝ සාමාජිකයාට නීති විරෝධී ලෙස බාධා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත් ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට

අවුරුදු 07ක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇති ව බන්ධනාගාර ගත කරනු ලැබීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

6. අධ්‍යාපන ආයතනයක යම් ශිෂ්‍යයකු හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයකු ඇතැම් පරිමිත සීමාවලින් ඔබ්බට යාම වළක්වාලන යම් ආකාරයකින් ඒ ශිෂ්‍යයාට හෝ සාමාජිකයාට නීති විරෝධී ලෙස අවහිර කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු 07ක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට, ඒ තැනැත්තා යටත් විය යුතු ය. — අයුතු ලෙස පියවර තැබීම

7. (1) අධ්‍යාපන ආයතනයකට අයත් වූ හෝ එහි කළමනාකරණය හෝ පාලනය යටතේ පවත්නා වූ හෝ යම් පරිශ්‍රයක නීත්‍යනුකූල හේතුවක් නොමැති ව, බලහත්කාරයෙන් පදිංචි වන්නා වූ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඩුවම් දෙකට ම හෝ, ඒ තැනැත්තාට යටත් විය යුතු ය. — අධ්‍යාපන ආයතනයක දේපළෙහි බලහත්කාරයෙන් පදිංචිවීම හා දේපළට අලාභහානි කිරීම

(2) අධ්‍යාපන ආයතනයකට අයත් වූ හෝ එහි කළමනාකරණය හෝ පාලනය යටතේ පවත්නා යම් දේපළක් සම්බන්ධයෙන් අනර්ථය සිදුකරන, යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට සහ රුපියල් පන්දහසක් හෝ ඒ දේපළ සම්බන්ධයෙන් සිදුකරන ලද පාඩුවේ හෝ අලාභ හානියේ ප්‍රමාණය මෙන් තුන්ගුණයක් යන මේ දෙකින් වඩා වැඩි ප්‍රමාණයේ දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

8. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් වරදේ බරපතලකම සැලකිල්ලටගෙන, — නෙරපීමේ හෝ පහ කිරීමේ ආඥා

(අ) වරදකරු කරනු ලැබූ තැනැත්තා අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයකු වන යම් විටක, ඒ තැනැත්තා ඒ ආයතනයෙන් නෙරපන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය.

(ආ) වරදකරු කරනු ලැබූ තැනැත්තා අධ්‍යාපන ආයතනයක කාර්යය මණ්ඩලයේ සාමාජිකයකු වන යම් විටක, ඒ තැනැත්තා ඒ අධ්‍යාපන ආයතනයෙන් පහ කරන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය.

9. (1) මේ පනතේ 2වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් සැක කරනු ලැබූ හෝ චෝදනාකරනු ලැබූ තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද මහාධිකරණයක විනිශ්චයකාරවරයා විසින් හැර, ඇප පිට මුදා හරිනු නොලැබිය යුතු ය. ඇප ප්‍රදානය කිරීම පිණිස ස්වකීය අභිමතය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඒ විනිශ්චයකාරවරයා විසින් 1997 අංක 30 දරන ඇප පනතේ 14 වන වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය. — ඇප

(2) මේ පනතේ 2වන වගන්තියේ (2) වන උප වගන්තිය හෝ 4වන වගන්තිය යටතේ වූ වරදකට තැනැත්තකු වරදකරු කරනු ලැබ එසේ වරදකරු කිරීමට විරුද්ධ ව අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූ අධිකරණය කර ඇති අවස්ථාවක, ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූ අධිකරණය විසින් වරදෙහි බරපතලකම සහ වරදකරු කරනු ලැබූ තැනැත්තාගේ පූර්ව ක්‍රියාකලාපය සැලකිල්ලට ගෙන, ඒ තැනැත්තා, ඇප පිට මුදාහරිනු ලැබිය හැකි ය. නැතහොත් මුදාහැරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

10. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කුමක් සඳහා ඇත ද, මේ පනතේ 2වන වගන්තියේ (2) වන උප වගන්තිය හෝ 4 වන වගන්තිය හෝ යටතේ වූ යම් වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් හෝ යම් අධිකරණයක් ඉදිරියෙහි මේ පනත යටතේ වූ වැරදි සංඥෙය වැරදි වශයෙන් සලකනු ලැබිය යුතු ය.
මේ පනත යටතේ වූ වැරදි සංඥෙය වැරදි වශයෙන් සලකනු ලැබිය යුතු බව

(අ)වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වනවිට, එකී අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(ආ)වරදකරු බව පිළිගන්නා හෝ වරදකරු බවට තීරණය කරනු ලැබූ හෝ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එකී අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තියේ විධිවිධාන අදාළ නො විය යුතු ය.

11. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පළමුවන උපලේඛනයේ කුමක් සඳහන් ව ඇත ද ඒ පනතේ ද විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා, මේ පනත යටතේ වූ සියලු වැරදි සංඥේය වැරදි වශයෙන් සලකනු ලැබිය යුතු ය.

12. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක දී, යම් තැනැත්තකු අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයකු හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයකු වේද, නැතහොත් යම් පරිශ්‍රයක් හෝ දේපළක් අධ්‍යාපන ආයතනයක් සතු හෝ එහි කළමනාකරණය හා පාලනය යටතේ පවත්නා දේපළක් වේද, යන්න පිළිබඳ ව ප්‍රශ්නයක් පැන නැඟුණ අවස්ථාවක, ඒ අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියාගේ හෝ වෙනත් නිලධාරියෙකුගේ අත්සන යටතේ යැයි කියනු ලබන සහතිකයක නම් කර ඇති ශිෂ්‍යයා හෝ සාමාජිකයා ඒ අධ්‍යාපන ආයතනයේ ශිෂ්‍යයකු හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයකු බවට හෝ ඒ සහතිකයේ නිශ්චිත ව සඳහන් කර ඇති පරිශ්‍රයක් හෝ දේපළක්, ඒ අධ්‍යාපන ආයතනය සතු පරිශ්‍රයක් හෝ දේපළක් බවට නැතහොත් ඒ අධ්‍යාපන ආයතනයේ කළමනාකරණය හා පාලනය යටතේ පවත්නා පරිශ්‍රයක් හෝ දේපළක් බවට ඒ සහතිකය, එහි අත්සන පිළිබඳ ඔප්පු කිරීමකින් තොර ව සාක්ෂියේ දී ආවේශ විය යුතු ය. තව ද ඒ සහතිකය එහි ප්‍රකාශ කර ඇති සිද්ධි පිළිබඳ ව මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය. සහතිකය

13. (1) මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් නඩු විභාගයක් පවත්වාගෙන යන අතරතුර, ඒ සම්බන්ධයෙන් පවත්වනු ලැබූ යම් විමර්ශනයක දී යම් සාක්ෂිකරුවකු, ඔහු විසින් කලින් කරනු ලැබූ යම් ප්‍රකාශයක් එහි වූ යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් ප්‍රකාශිත ව ම හෝ අවශ්‍ය ව්‍යංගයෙන් ප්‍රතිෂේධ කරතහොත්, ප්‍රකාශය කරන ලද්දේ යම් අවස්ථාගත කරුණු යටතේ ද, ඒ අවස්ථාගත කරුණු පිළිබඳ යථා පරිදි කරන ලද පරීක්ෂණයකින් පසු ව, ආරක්ෂා සහිත යැයි ද සාධාරණයැයි ද, නඩුව විභාග කරන මහේස්ත්‍රාත්වරයා සලකන්නේ නම්, ඒ මහේස්ත්‍රාත්වරයා විසින් - සාක්ෂ්‍යයේ දී ප්‍රකාශය ආවේශා කිරීම

(අ) ඒ සාක්ෂිකරු විසින් විමර්ශනයේ දී කරන ලද ප්‍රකාශනය, එහි වැදගත් කරුණු සම්බන්ධයෙන් ස්වාධීන ප්‍රභවයකින් ලැබුණු සාක්ෂිවලින් තහවුරු වන්නේ නම්, ඒ ප්‍රකාශය අනුව ක්‍රියා කිරීම, සහ

(ආ) ඒ නඩු විභාගය අවසාන වූ පසු, අධිකරණ කටයුත්තක යම් අවස්ථාවක දී සිතාමතා බොරු සාක්ෂි දීම පිළිබඳ ව ඒ සාක්ෂිකරු ඒ අධිකරණය ඉදිරියේ චෝදනාවක් මත නඩු විභාග කිරීම, නිත්‍යානුකූල වන්නේ ය.

(2) චුදිතයා විසින් කරන ලදැයි චෝදනාවෙහි දැක්වෙන ප්‍රතිෂේධ ප්‍රකාශ චුදිතයා විසින් කරන ලැදැයි ඔප්පු කිරීම (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ යටතේ පැවැත්වෙන නඩු විභාගයක දී ප්‍රමාණවත් වන අතර අසත්‍ය ප්‍රකාශය ඒ ප්‍රකාශවලින් කවරක් ද යන්න ඔප්පු කිරීම අවශ්‍ය නො වන්නේ ය.

14. මේ පනතේ විධිවිධාන දණ්ඩ නීති සංග්‍රහයේ, 1994 අංක 22 දරන වධ දීමට සහ අනෙකුත් ක්‍රෑර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහි වූ සම්මුති පනතේ හෝ වෙනත් යම් නීතියක හෝ විධිවිධාන හීන කිරීම පිණිස නොව ඒ විධිවිධානවලට අතිරේක ව විය යුතු ය.

15. මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ ඇති යම් තැනැත්තකුගේ නඩු විභාගය සඳහා ද එවැනි යම් වරදක් සඳහා යම් තැනැත්තකු වරදකරු කිරීමකින් හා ඒ වරදකරු කිරීමෙන් නියම කරන ලද යම් දඬුවමකින් වූ යම් අභියාචනයක් විභාග කිරීම සඳහා ද, සෑම අධිකරණයක් විසින් ම ප්‍රමුඛතාව සැලකිය යුතු ය.

මේ පනතේ විධිවිධාන දණ්ඩ නීති සංග්‍රහය ආදියේ විධිවිධාන හීන කිරීම පිණිස නොව, ඒ විධිවිධානවලට අතිරේක ව විය යුතු බව මේ පනත යටතේ වූ නඩු විභාගය සහ අභියාචනා සඳහා ප්‍රමුඛතාවය සැලසීම

මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතින් -
'' සාපරාධී බලහත්කාර'' ''බිය'' ''බලහත්කාරය''
''බරපතල තුවාලය'', ''තුවාලය'' සහ ''අනර්ථය''

යන්නෙහි දණ්ඩ නීති සංග්‍රහයේ පිළිවෙළින්
ඒවාට දී ඇති අර්ථ ම ඇත්තේ ය..

''අධ්‍යාපන ආයතනය'' යන්නෙන් -

(අ) උසස් අධ්‍යාපන ආයතනයක් ..

(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ iv වන පරිච්ඡේදය යටතේ පිළිගත් වෙනත් යම් ආයතනයක්..

(ඇ) 1981 අංක 77 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,

(ඈ) 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ පනතින් පිහිටුවන ලද බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය,

(ඉ) 1999 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද යම් ආයතනයක්,

(ඊ) 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පනත යටතේ පිහිටුවන ලද යම් උසස් තාක්ෂණ ආයතනයක්,

(උ) 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත යටතේ පිහිටුවන ලද පිරිවෙන් අභ්‍යාස ආයතනයක් ද ඇතුළු ව, ඒ පනත යටතේ ලියාපදිංචි කරන ලද සහ රජයේ අරමුදල්වලින් ආධාර ලබන පිරිවෙනක්,

(ඌ) ශ්‍රී ලංකා නීති විද්‍යාලය,

(එ) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනතින් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනය,

(ඒ) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනතින් පිහිටුවන ලද අධ්‍යාපනික විද්‍යායතනක් හෝ රජයේ අභ්‍යාස විද්‍යාලයක්,

(ඔ) (185 වන අධිකාරිය වූ) අධ්‍යාපන ආඥා පනතේ අර්ථානුකූල වූ රජයේ පාසලක් හෝ උපකෘත පාසලක් හෝ ආධාර නො ලබන පාසලක් අදහස් වන අතර, අධ්‍යාපනය, ඉගැන්වීම හෝ පුහුණු කිරීම ලබාදීමේ කාර්යය සඳහා පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක් ද එයට ඇතුළත් වේ.

''අධ්‍යාපන ආයතනයක ප්‍රධාන ස්වාමීන් වහන්සේ, අධ්‍යක්ෂවරයා, පීඨාධිපතිවරයා, විදුහල්පතිවරයා හෝ ඒ අධ්‍යාපන ආයතනයේ පරිපාලන හා කළමනාකරණ භාර ව සිටින කවර හෝ ආකාරයකින් නමෝද්දිෂ්ට වෙනත් යම් තැනැත්තෙක් අදහස් වේ.

''උසස් අධ්‍යාපන ආයතනවල'' යන්නට, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

''නවක වදය'' යන්නෙන්, අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයකුට හෝ කාර්යය මණ්ඩලයේ සාමාජිකයකුට ශාරීරික හෝ මානසික හානියක් හෝ මානසික වේදනාවක් හෝ බියක් සිදුකරන හෝ සිදුකිරීමට ඉඩ ඇති යම් ක්‍රියාවක් අදහස් වේ.

''ශිෂ්‍යයා'' යන්නෙන්, අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයෙක් අදහස් වේ.

''ලිංගික අතවරය'' යන්නෙන්, අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ලිංගික හිරිහැරයක් හෝ අතවරයක් හෝ සිදුකිරීම පිණිස සාපරාධී බලහත්කාරය පෑම, වචන හෝ ක්‍රියා භාවිත කිරීම අදහස් වේ.

# 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 2015 මාර්තු මස 07 වැනි දින]

එල්.ඩී.—ඕ. 46/2007.

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිණිස ද ; වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට අදාළ සුදුසු ජාත්‍යන්තර ප්‍රතිමාන, ප්‍රමිති සහ යහපත් පරිචයක් බලාත්මක කිරීම පිණිස ද; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියක් පිහිටුවීම; කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය; ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය පිහිටුවීම පිණිස ද; අපරාධයක වින්දිතයන්ට වන්දි ගෙවීම; අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. (1) මේ පනත 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

(2) මේ වගන්තිය හැර, පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක දී හෝ දිනවල දී ක්‍රියාත්මක විය යුතු ය. මේ පනතේ විවිධ කොටස් ක්‍රියාත්මක වන දිනය සඳහා අමාත්‍යවරයා විසින් විවිධ දින නියම කරනු ලැබිය හැකි ය.

2—PL 008488—2,825 (2014/09)

# 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත

1 වන කොටස

**පනතේ අරමුණු**

පනතේ අරමුණු.

**2.** මේ පනතේ අරමුණු වන්නේ -

(අ) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම, ස්ථිර කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක් සැලසීම ;

(ආ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව ලබාදීම ;

(ඇ) අපරාධයක වින්දිතයන්ට එරෙහිව වරදක් සිදුකිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගෙන් වින්දිතයන් හට වන්දි මුදල් ලබාගැනීමට සැලැස්වීම ;

(ඈ) ප්‍රතිෂ්ඨාපනය, වන්දි, හානිපූරණය සහ පුනරුත්ථාපනය ඇතුළුව, අපරාධයක වින්දිතයන්ට සහන ලබාගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඉ) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් වර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම උදෙසා වූ, රජයේ, අධිකරණ නිලධරයන්ගේ සහ රජයේ නිලධරයන්ගේ කාර්ය සහ වගකීම් දැක්වීම ;

(ඊ) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුකළ හැකි වැරදි සඳහන් කිරීම සහ ඒ වැරදි සිදුකරන තැනැත්තන් උදෙසා පැනවිය හැකි දණ්ඩන නියම කිරීම ; සහ

(උ) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට අදාළව යහපත් ප්‍රතිපත්ති පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

II වන කොටස

## අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම්

3. (1) අපරාධයක වින්දිතයකු හට :- *අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම්.*

(අ) සමානව, සාධාරණව සහ එම වින්දිතයාගේ ගරුත්වයට සහ පෞද්ගලිකත්වයට ගෞරව වන සේ සලකවා ගනු ලැබීමට ;

(ආ) එම වින්දිතයා ළමා වින්දිතයකු වන අවස්ථාවක දී, එම ළමයාගේ උපරිම යහපත තහවුරු වන ආකාරයකට සලකවා ගනු ලැබීමට ;

(ඇ) අපරාධයක වින්දිතයකු වීම හේතුවෙන් විඳින යම් හානියක්, අලාභයක් හෝ පාඩුවක් සඳහා සහ ඒ වෙනුවෙන් හානිපූරණය සහ ප්‍රතිෂ්ඨාපනය ඇතුළුව නියම කරන ලද ක්‍රියාපටිපාටියකට අනුකූලව අප්‍රමාදව සුදුසු සහ සාධාරණ සහනයක් ලබා ගැනීමට ;

(ඈ) සිදුවිය හැකි යම් තර්ජන, බියගැන්වීම්, පළිගැනීම් හෝ ප්‍රතිප්‍රහාරයන් ඇතුළුව යම් හානියකින් නිසි ආකාරයෙන් ආරක්ෂා වීමට;

(ඉ) අපරාධයක වින්දිතයකු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් මානසික හෝ කායික හිංසාවකින්, හානියකින්, ඌනතාවයකින් හෝ ආබාධයකින් පෙලෙයි නම්, ඒ සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට ;

(ඊ) එම වින්දිතයා විසින් ඉල්ලීමක් කිරීමේ දී,

(i) අලාභ ලබා ගැනීම සඳහා ඇති සිවිල් ප්‍රතිකර්ම සහ ඊට අදාළ කාලාවරෝධ කාලසීමා ඇතුළුව, ඔහු විසින් විඳ ඇති යම් හිංසාවක් සඳහා සහන සලස්වා ගැනීමට පවතින නෛතික ප්‍රතිකර්ම පිළිබඳව අධිකාරිය මගින් හෝ කොට්ඨාසය මගින් දැනුවත් වීම සඳහා;

(ii) විමර්ශනය කරනු ලබන අදාළ පොලිස් ස්ථානාධිපති මගින් හෝ වෙනත් යම් අධිකාරියක් මගින් පැවැත්වෙන, කරගෙන යනු ලබන යම් විමර්ශනයකට අගතියක් නොමැතිව, එම අපරාධයක වින්දිතයා විසින් එකී පොලිස් ස්ථානය වෙත හෝ විමර්ශනය පවත්වනු ලබන වෙනත් යම් අධිකාරියක් වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් කර ගෙන යනු ලබන විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳ දැනුවත් වීම සඳහා;

4 **2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත**

(iii) අවස්ථාවෝචිත පරිදි, අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා හෝ විමර්ශනය පවත්වනු ලබන වෙනත් යම් අධිකාරියක්, නීතිපතිවරයා හෝ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා මගින් ලඝු නොවන පරීක්ෂණය, නඩු විභාගය, අභියාචනය සහ ප්‍රතිශෝධන ඉල්ලීම ඇතුළුව, අධිකාරිය මගින් වින්දිතයා විසින් පැමිණිලි කර සිටින වරදට අදාළ අධිකරණ කටයුතු විභාග කිරීම සඳහා නියම කර ඇති දින හා එම අධිකරණ කටයුතුවල ප්‍රගතිය සහ බැහැර කිරීම පිළිබඳව මෙන්ම එම නීති කෘත්‍යවලට අදාළව අපරාධයක වින්දිතයාගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව ද අධිකාරිය මගින් දැනුවත් වීම සඳහා ;

(iv) අවස්ථාවෝචිත පරිදි, විමර්ශනය පවත්වනු ලබන අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති හෝ විමර්ශනය පවත්වනු ලබන වෙනත් යම් අධිකාරියක් නීතිපතිවරයා, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ බන්ධනාගාර අධිකාරි මගින් පහත සඳහන් කරුණු සඳහා නියමකර ඇති දින පිළිබඳ ව එනම් :—

(අ) ඇප මත මුදා හැරීම සම්බන්ධයෙන්;

(ආ) සැකකරු නිදහස් කිරීම සම්බන්ධයෙන්;

(ඇ) චූදිතයාට එරෙහිව අපරාධ නඩු කටයුතු ගොනු කිරීම සම්බන්ධයෙන්;

(ඈ) සැකකරු හෝ චූදිතයා වරදකරු කිරීම, දණ්ඩන පැනවීම හෝ නිදොස් කොට නිදහස් කිරීම සම්බන්ධයෙන් ; සහ

(ඉ) අපරාධයක වින්දිතයාට එරෙහිව වරදක් සිදු කර ඇති හෝ සිදු කර ඇති ලෙස සලකනු ලබන වැරදිකරු බන්ධනාගාරයෙන් මුදා හැරීම හා ඊට අදාළ හේතු සම්බන්ධයෙන්,

දැනුවත් වීම සඳහා ; සහ

(v) අපරාධයක වින්දිතයාට සිදු වී ඇති යම් හානියක් සඳහා ප්‍රතිකාර හා උපස්ථාන ලබාගැනීම සඳහා ඇති වෛද්‍ය, සමාජ සේවා සහ වෙනත් යම් සහායයක් පිළිබඳව අධිකාරිය මගින් දැනුවත් වීම සඳහා;

(ඇ) වරදක් සිදු කිරීමට අදාළව වාචිකව හෝ ලිඛිතව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට සහ යම් පොලිස් ස්ථානයක හෝ පොලිස් දෙපාර්තමේන්තුවේ වෙනත් ඒකකයක දී හෝ අංශයක දී එම පැමිණිල්ල පොලිස් නිලධරයකු ලවා වාර්ථාගත කරවා ගැනීමට සහ අදාළ විමර්ශනය පවත්වන අධිකාරිය විසින් එම පැමිණිල්ල අපක්ෂපාතීව සහ සම්පූර්ණයෙන් ම විමර්ශනය කරවා ගැනීමට ;

(ඈ) සිදුකරමින් පවතින යම් විමර්ශනයකට අගතියක් නොවන පරිදි, එම වින්දිතයාට එරෙහිව සිදුකරන ලැදැයි කියනු ලබන වරදකට අදාළව සිදුකරනු ලබන අපරාධ සහ අධිකරණ සහ අධිකරණ වෛද්‍ය විමර්ශන සහ මහේස්ත්‍රාත් පරීක්ෂණ ඇතුළුව, විමර්ශනයක් පවත්වන කාලය තුළ දී නීතිඥවරයකු මගින් පෙනී සිටීමට සහ එම විමර්ශන පවත්වනු ලබන නීති අධිකාරීන් වෙත අවශ්‍ය නියෝජනයන් සිදු කිරීමට ;

(එ) දැනට පවත්නා හෝ අවසන් කළ විමර්ශනයකට අගතියක් නොවන පරිදි, මරණයකට හේතුව දැක්වෙන ආකෘතිපත්‍රවල, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවල, අධිකරණ වෛද්‍ය වාර්තාවල, ඇඟිලි සලකුණු පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ වාර්තාවල, රජයේ රස පරීක්ෂකවරයාගේ වාර්තාවල, විශේෂඥයකුගේ වෙනත් යම් වාර්තාවල සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 115,116 සහ 120 වන වගන්ති මගින් නියම කර ඇති පරිදි පොලිසිය විසින් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ගොනු කළ යුතු වාර්තාවල සහතික පිටපත් ලබා ගැනීමට:

එසේ වුව ද, මේ ඡේදයේ සඳහන් වාර්තාවල සහතික පිටපත් ලබා ගැනීමේ කාර්ය සඳහා ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, එම වාර්තා නිකුත් කිරීම මගින්, ඒ වාර්තාවලට අදාළව පොලිසිය විසින් පවත්වන විමර්ශනයට යම් අගතියක් සිදුවේ ද යන්න පිළිබඳව ඉල්ලීම ඉදිරිපත් කෙරෙනු ලැබුවා වූ මහේස්ත්‍රාත්වරයා විසින්, පොලිසියෙන් විමසිය යුතු අතර, එම වාර්තා එකක් හෝ ඊට වැඩි ගණනක් නිකුත් කිරීම මගින් දැනට පවත්නා විමර්ශනයට

අගතියක් සිදුවීමට ඉඩ ඇති අවස්ථාවක, එම වාර්තාවක් හෝ වාර්තා නිකුත් කිරීම මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය;

(ඒ) ඒ වින්දිතයාට එරෙහිව සිදු කරනු ලැබ ඇතැ යි කියන වරදක දී පවත්වන විමර්ශනයකට පෙරාතුව සහ එම විමර්ශනය පවත්නා කාලය තුළ දී හා විමර්ශනයට පසුව සහ ලඝු නොවන පරීක්ෂණ, නඩු විභාග සහ අභියාචනා ඇතුළුව නඩු කටයුත්තක් පවත්වාගෙන යාමට පෙරාතුව සහ ඒ නඩු කටයුත්ත පවත්වාගෙන යන කාලය තුළ දී නීතිපතිවරයා වෙත නීති උපදේශකයකු මාර්ගයෙන් ලිඛිත සන්නිවේදන ඉදිරිපත් කිරීමට හෝ නියෝජනයන් සිදු කිරීමට;

(ඔ) ඒ අදාළ අපරාධයක වින්දිතයාට එරෙහිව සිදු කරනු ලබන වරදක් පිළිබඳව විමර්ශනයක් පවත්වන විමර්ශකයකු වෙත ලිඛිත සන්නිවේදන ඉදිරිපත් කිරීමට හෝ නීති උපදේශකයකු මාර්ගයෙන් නියෝජනයන් සිදු කිරීමට සහ එම සන්නිවේදනයට හෝ නියෝජනයට ප්‍රතිචාරයක් ලබාගැනීමට ;

(ඕ) යම් නඩු කටයුත්තක ඇතැම් කොටස් විමසන කාලය තුළ දී ඒ වින්දිතයා පෙනී සිටීම බැහැර කිරීමෙන් පමණක් යුක්තිය නිසි ලෙස සුරක්ෂිත කරනු ලැබිය හැකි බවට හෝ එම නඩු කටයුත්තේ දී ඔහු විසින් වෙනත් සාක්ෂිවලට කන්දීම ඔහුගේ සාක්ෂිවලට වැදගත් ලෙස බලපෑ හැකි යයි අධිකරණය, කොමිෂන් සභාව හෝ වෙනත් විනිශ්චය සභාවක් තීරණය කර ඇත්නම් මිස, ලඝු නොවන පරීක්ෂණ, නඩු විභාග, අභියාචන සහ යම් ප්‍රතිශෝධන ඉල්ලීම් ඇතුළුව වරදට අදාළවන සියලු අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුතුවලට පෙනී සිටීමට ;

(ක) ඔහුට එරෙහිව සිදුකරන ලද වරදට අදාළ අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුතුවලට යොමුවීමට සහ සහභාගිවීමට අවශ්‍ය කරන යම් සහාය ලබා ගැනීමට ;

(ග) පැමිණිල්ලට අගතියක් නොවන පරිදි, ලඝු නොවන පරීක්ෂණ, නඩු විභාග, අභියාචන සහ ප්‍රතිශෝධන ඉල්ලීම් ඇතුළුව වරදකට අදාළ අපරාධ නඩු කටයුත්තක විවිධ

අවස්ථාවල දී, නීති උපදේශකයකු මාර්ගයෙන් පෙනී සිටීමට සහ ඉල්ලීමක් කළ අවස්ථාවක දී, ඒ කාර්යය සඳහා නීතිමය සහාය ලබාගැනීමට;

(ච) වරද සිදු කරනු ලැබූ තැනැත්තා වරදකරු කිරීමෙන් පසුව සහ දඬුවම තීරණය කිරීමට පෙරාතුව, අදාළ වරද ඔහුගේ ශරීරයට, මානසික තත්ත්වයට, රැකියාවට, වෘත්තියට හෝ රක්ෂාවට, ආදායමට, පවුලේ ජීවන තත්වයට, දේපල සහ ඔහුගේ ජීවිතයට අදාළ වන වෙනත් කාරණා ඇතුළුව ඔහුගේ ජීවිතය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳව පුද්ගලිකව හෝ නීති උපදේශකයකු මාර්ගයෙන්, අධිකරණයට ගෙනහැර දැක්වීමට ;

(ඡ) වරදක් සිදුකරනු ලැබීමෙන් වරදකරු වූ තැනැත්තකු විසින් පුද්ගලිකව හෝ නීති උපදේශකයකු මාර්ගයෙන් අභියාචනයක් හෝ ප්‍රතිශෝධන ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, එම අභියාචනය හෝ ප්‍රතිශෝධන ඉල්ලීම විනිශ්චය කරනු ලබන අධිකරණය වෙත, අදාළ වරද ඔහුගේ ශරීරයට, මානසික තත්වයට, රැකියාවට, වෘත්තියට හෝ රක්ෂාවට, ආදායමට, පවුලේ ජීවන තත්ත්වයට, දේපල සහ ඔහුගේ ජීවිතයට අදාළ වන වෙනත් කාරණා ඇතුළුව ඔහුගේ ජීවිතය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳව ගෙනහැර දැක්වීමට ; සහ

(ට) වරදක් සිදුකරනු ලැබීමෙන් වරදකරු වූ යම් තැනැත්තකු වෙත සමාව ප්‍රදානය කිරීම හෝ පනවන ලද දඬුවමක් ලිහිල් කිරීම පිළිබඳව යම් බලයලත් තැනැත්තකු විසින් සලකා බලනු ලබන අවස්ථාවක දී, ඒ පිළිබඳ දැන්වීමක් ලැබීමටත්, අදාළ වරද ඔහුගේ ශරීරයට, මානසික තත්ත්වයට, රැකියාවට, වෘත්තියට හෝ රක්ෂාවට, ආදායමට, පවුලේ ජීවන තත්වයට, දේපල සහ ඔහුගේ ජීවිතයට අදාළ වන වෙනත් කාරණා ඇතුළුව ඔහුගේ ජීවිතය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳව එසේ සමාව ප්‍රදානය කරන හෝ දඬුවම ලිහිල් කිරීම කරන තැනැත්තා වෙත අධිකාරිය මගින් ගෙනහැර දැක්වීමට ;

අයිතිය තිබිය යුතු ය.

වින්දිතයකුගේ හිමිකම්.

**4.** (1) උද්දේශිත වරදක් සිදු කිරීමට හෝ උද්දේශිත මූලික අයිතිවාසිකමක් කඩකිරීමකට හෝ උද්දේශිත මානව හිමිකමක් උල්ලංඝනය වීමකට අදාළව යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට දී පවත්වනු ලබන යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුත්තකට සහභාගී වීම හා සිදු වූ වරදේ ප්‍රතිඵලයක් වශයෙන් අපරාධයක වින්දිතයකුට දරන්නට සිදු වූ වියදම් සලකා බැලීමේ දී, අධිකාරියෙන් මුදලක් ලබා ගැනීමට, අපරාධයක වින්දිතයාට හිමිකමක් තිබිය යුතු ය.

(2) රජයට අවශ්‍ය සම්පත් ඇති අවස්ථාවක දී, අපරාධයක වින්දිතයකු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් විඳින ලද කායික හෝ මානසික හිංසාවක්, හානියක් ඌනතාවයක් හෝ ආබාධයක් සම්බන්ධයෙන් සුදුසු වෛද්‍ය සේවා, බෙහෙත් සහ වෙනත් වෛද්‍ය පහසුකම් ඇතුළුව, යම් අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සහ අවශ්‍ය පුනරුත්ථාපන සහ උපදේශන සේවා රජයෙන් ඉල්ලා සිටීමට සහ ලබාගැනීමට, අපරාධයක වින්දිතයකුට හිමිකමක් තිබිය යුතු ය.

(3) අවශ්‍ය කරන සම්පත් නොමැතිකම හෝ හිඟකම නිසා (2) වන උපවගන්තිය යටතේ අපරාධයක වින්දිතයකු විසින් ඉල්ලා සිටින සේවා සැපයීමට රජයට නොහැකි වන අවස්ථාවක දී, අපරාධයක වින්දිතයකු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් විඳින ලද කායික හෝ මානසික හිංසාවක්, හානියක් හෝ ඌනතාවයක් සම්බන්ධයෙන් අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමට සහ අවශ්‍ය කරන යම් පුනරුත්ථාපන සහ උපදේශන සේවා සඳහා, අධිකාරියට ඉල්ලීමක් කිරීමට ඒ වින්දිතයාට හිමිකම තිබිය යුතු ය.

සාක්ෂිකරුවන්ගේ හිමිකම්.

**5.** (1) සාක්ෂිකරුවකු හට, විමර්ශන, අර්ධ අධිකරණ සහ අධිකරණ බලධරයන්ගෙන්, එම සාක්ෂිකරුගේ ගෞරවයට සහ පුද්ගලිකත්වයට සාධාරණයක් වන සේ සහ ගෞරවයෙන් සලකවා ගනු ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(2) සාක්ෂිකරුවකු :—

(අ) වරදක් සිදු කිරීමට අදාළව හෝ යම් මූලික අයිතිවාසිකමක් කඩ කිරීමකට හෝ මානව හිමිකමක් උල්ලංඝනය කිරීමකට අදාළව තොරතුරු සැපයීමේ ;

(ආ) යම් වරදක් පිළිබඳ විමර්ශනයක් හෝ යම් මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ මානව හිමිකමක් උල්ලංඝනය කිරීම පිළිබඳ විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පවත්වන අතරතුර දී ස්වේච්ඡාවෙන් ප්‍රකාශයක් කිරීමේ ; හෝ

(ඇ) උද්දේශිත වරදක් සිදු කිරීමකට හෝ උද්දේශිත මූලික අයිතිවාසිකම් කඩ කිරීමකට හෝ මානව හිමිකම් උල්ලංඝනය කිරීමකට අදාළව අධිකරණයක දී හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට දී සාක්ෂි ලබා දීමේ,

ප්‍රතිඵලයක් වශයෙන් ඒ අතරතුර දී හෝ ඉන් පසුව, කවර හෝ ආකාරයේ හිරිහැරයකට, බියගැන්වීමකට, බල කිරීමකට, හෝ බිඳවීමකට පත් නොකළ යුතු ය. ;

(3) යම් තැනැත්තකු විසින් සිදු කරනු ලැබූ වරදකට හෝ මූලික අයිතිවාසිකම් කඩකිරීමකට හෝ මානව හිමිකම් උල්ලංඝනය කිරීමකට අදාළව, සාක්ෂිකරුවකු විසින් යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට තොරතුරු සැපයීම හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හෝ කටඋත්තරයක් දීම හෝ යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට සාක්ෂි කිසිවක් ලබාදීම හෝ නඩු කටයුත්තක් පැවැරීම හේතුවෙන් එම සාක්ෂිකරුහට සිදුවන හෝ සිදුවිය හැකි යම් හානියකට, තර්ජනයකට, බියගැන්වීමකට, පළිගැනීමකට, ප්‍රතිප්‍රහාරයකට එරෙහිව ආරක්ෂාව ලබාගැනීමට, ඒ සාක්ෂිකරුවකු හට හිමිකමක් තිබිය යුතු ය.

ඇතැම් අවස්ථාවන්හි දී ආරක්ෂාව ලැබීමට යම් තැනැත්තන් හට හිමිකමක් ඇති බව.

**6.** සාක්ෂිකරුවකු වන හෝ නොවන තැනැත්තකු හට, ඒ තැනැත්තාගේ සේවා ස්ථානයේ දී හෝ ඒ තැනැත්තාගේ සේවා වටපිටාවේ දී සිදු වූ වරදකට හෝ මූලික අයිතිවාසිකම් කඩවීමකට හෝ මානව හිමිකම් උල්ලංඝනය වීමකට අදාළව ඒ තැනැත්තා විසින් නීතිය බලාත්මක කිරීමේ යම් අධිකාරියක් වෙත හෝ යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් වෙත තොරතුරු සැපයීමේ, පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ හෝ කටඋත්තරයක් දීමේ හෝ යම් අධිකරණයක හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට සාක්ෂියක් ලබා දීමේ හේතුවෙන් හෝ එහි ප්‍රතිඵලයක් ලෙස:—

(අ) ඔහුට මානසිකව, කායිකව හෝ ඔහුගේ කීර්තිනාමයට හානියක් හෝ අලාභයක් සිදුවීම හේතුවෙන් වන යම් හිරිහැරයකට, බියගැන්වීමකට, බලකිරීමකට හෝ බිඳවීමකට; හෝ

(ආ) ඔහුගේ රැකියාවේ ඇතිවන අහිතකර වෙනස්වීමකට,

එරෙහිව, ආරක්ෂාව ඉල්ලා සිටීමට ඔහුට හිමිකමක් තිබිය යුතු ය.

අයිතිවාසිකම් සහ හිමිකම්වලට ගරුකිරීම් ආදිය, රජයේ සහ අධිකරණ නිලධරයන්ගේ කාර්යක් බව.

**7.** මේ පනතේ 3 වන, 4 සහ 5 වන සහ 6 වන වගන්තිවල සඳහන් කරන ලද අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සන්නද්ධ හමුදාවල සාමාජිකයන් හා පොලිස් නිලධරයන් ද ඇතුළුව සෑම රජයේ නිලධරයකුගේම සහ සෑම අධිකරණ නිලධරයකුගේ ම කාර්ය විය යුතු ය.

## III වන කොටස

### අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව වන වැරදි

වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව වන වැරදි.

8.(1) යම් තැනැත්තකු විසින් —

(අ) අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු තැති ගැන්වීමේ හෝ අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක ඒ තැනැත්තාට එරෙහිව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් හෝ යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ කටයුත්තක දී සාක්ෂි දීමෙන් වැළැක්වීමේ හෝ ඒ තැනැත්තාට එරෙහිව කරනු ලැබූ පැමිණිල්ලක් හෝ පවරනු ලැබූ නඩු කටයුත්තක් ඉල්ලා අස්කර ගැනීමට බල කිරීමේ අරමුණින්, අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ ශරීරියට, කීර්තිනාමයට හෝ දේපලවලට නැතහොත් එම වින්දිතයාට හෝ සාක්ෂිකරුට සම්බන්ධයක් ඇති වෙනත් යම් තැනැත්තකුගේ ශරීරයට, කීර්තිනාමයට හෝ දේපලවලට හානියක් සිදු කර තර්ජනය කිරීමෙන් ; හෝ

(ආ) නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක ඒ තැනැත්තාට එරෙහිව අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් හෝ යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී සාක්ෂි දීමෙන් වැළැක්වීමේ හෝ ඒ තැනැත්තාට එරෙහිව පවරනු ලැබූ

නඩු කටයුත්තක් හෝ කරනු ලැබූ පැමිණිල්ලක් ඉල්ලා අස්කර ගැනීමේ අරමුණින් හෝ ඒ තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට එම අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරුවකු විසින් දෙන ලද කටඋත්තරයක් හෝ සපයන ලද සාක්ෂිකයක් සඳහා ප්‍රතිහිංසා කිරීමක් වශයෙන් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ස්වේච්ඡාවෙන් ම තුවාල සිදු කිරීමෙන්,

ඒ තැනැත්තා වරදක් සිදුකරන ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දහයකට නොවැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට සහ රුපියල් විසිදහසක දඩයකට හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක ඒ තැනැත්තාට එරෙහිව අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් වැළැක්වීමේ හෝ යම් අධිරකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී ඒ තැනැත්තාට එරෙහිව සාක්ෂි දීමෙන් වැළැක්වීමේ හෝ ඒ තැනැත්තාට එරෙහිව පවරනු ලැබූ නඩු කටයුත්තක් හෝ කරනු ලැබූ පැමිණිල්ලක් ඉල්ලා අස්කර ගැනීමට බලකිරීමේ අරමුණින් හෝ ඒ තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට ඒ අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු විසින් දෙන ලද කටඋත්තරයක් හෝ සපයන ලද සාක්ෂියක් සඳහා ප්‍රතිහිංසා කිරීමක් වශයෙන්,

(අ) අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට ස්වේච්ඡාවෙන් බරපතල තුවාල සිදු කිරීමෙන් ; හෝ

(ආ) අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට අයුතු ලෙස අවහිර කිරීමෙන්,

ඒ තැනැත්තා, වරදක් සිදුකරන ලබන අතර. මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දොළහකට නොවැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට සහ රුපියල් තිස්දහසක දඩයකට ඔහු යටත්විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක ඒ තැනැත්තාට එරෙහිව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් හෝ කටඋත්තරයක් දීමෙන් හෝ යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී ඒ තැනැත්තාට එරෙහිව සාක්ෂි දීමෙන් වැළැක්වීමේ අරමුණින් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් නීතිය බලාත්මක කිරීමේ අධිකාරයක් වෙත එම තැනැත්තාට එරෙහිව කරන ලද ප්‍රකාශයක් හෝ යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී ඒ තැනැත්තාට එරෙහිව දෙන ලද සාක්ෂියක් සඳහා ප්‍රතිහිංසා කිරීමක් වශයෙන්-

(අ) අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු යම් ස්ථානයකින් පිටකිරීම සඳහා, බලකිරීමකින් හෝ වංචා සහගත උපක්‍රම මගින් බලය අනිසි ලෙස යෙදීමෙන් හෝ වෙනත් යම් බලකිරීමකින් පොළඹවා ගනු ලැබීමෙන්; හෝ

(ආ) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ දේපලවලට අයුතු සහගත පාඩුවක්, අලාභයක් හෝ විනාශයක් සිදු කිරීමට අදහස් කරන හෝ එසේ විය හැකි බව දැන දැනම ඒ අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ දේපලවලට එම පාඩුව, අලාභය හෝ විනාශය සිදු කරනු ලැබීමෙන්,

ඒ තැනැත්තා, වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දොළහකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට සහ රුපියල් තිස්දහසක දඩයකට ඔහු යටත් විය යුතු ය.

(4) යම් තැනැත්තකුට සිදු වූ වරදකට හෝ එම තැනැත්තාගේ මූලික අයිතිවාසිකම් කඩවීමකට හෝ මානව හිමිකම් උල්ලංඝනය වීමකට අදාළව නඩු කටයුත්තක් පැවරීම හෝ යම් අධිකරණයක් තුළ හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට සාක්ෂි ලබාදීම හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් හෝ අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් වෙත යම් තොරතුරු සැපයීම හෝ පැමිණිල්ලක් කිරීම හෝ කටඋත්තරයක් දීම නිසා හෝ එහි ප්‍රතිඵලයක් ලෙස,

(අ) ඒ තැනැත්තාට යම් හිරිහැරයක්, බිය ගැන්වීමක්, බලකිරීමක්, බිඳවීමක්, කායික හෝ මානසික වේදනාවක්, ඔහුගේ කීර්තියට හානියක් හෝ අලාභයක් සිදු කරන; හෝ

(ආ) ඒ තැනැත්තාගේ සේවා ස්ථානයේ සේවා තත්ත්වයට අහිතකර වෙනස්කමක් සිදු කරන,

වෙනත් යම් තැනැත්තකු, වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කිරීමේ දී අවුරුදු හතකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට හෝ රුපියල් පහළොස් දහසක දඩයකට යටත් විය යුතු ය.

(5) සද්භාවයෙන් සහ—

(අ) නීතියෙන් සාදන ලද යම් විධිවිධාන හෝ ක්‍රියාපටිපාටිවලට;

(ආ) අධිකරණ නිලධරයකු විසින් කරන ලද නියමයක්; හෝ

(ඇ) යම් නීතියක් මගින් හෝ ඒ යටතේ විධානයක් නිකුත් කිරීමට නිසි බලයලත් තැනැත්තකු විසින් කරනු ලබන විධානයකට,

අනුව හෝ ඊට අනුකූලවීමක දී හැර,

(අ) වරදක් පිළිබඳ විමර්ශනයක් ආරම්භ කිරීමේ හෝ පවත්වාගෙන යාමේ කාර්ය සඳහා දෙන ලද තොරතුරු ලබා ගනිමින්;

(ආ) වරදක් පිළිබඳ විමර්ශන ක්‍රියාවලියේ දී තොරතුරු රැස්කර ගනිමින්; හෝ

(ඇ) වෙනත් යම් තැනැත්තකුගෙන් (අ) සහ (ආ) ඡේදවල සඳහන් කරන ලද යම් තොරතුරු ලබා ගනිමින්,

අදාළ අපරාධයක වින්දිතයා හෝ ඒ තොරතුරු සපයන ලද පිළිගත හැකි සාක්ෂිකරු හෝ ඔත්තුකරුගේ අනන්‍යතාව පිළිබඳව තුන්වන පාර්ශවයකට තොරතුරු හෝ ඉන් කොටසක් සපයන හෝ නිකුත් කරන හෝ ලබාදෙන හෝ ප්‍රසිද්ධියට පත් කරන නැතහොත් එම තොරතුරු හෝ එයින් කොටසක් බෙදා හැර ඒ මගින් ඒ අපරාධයක වින්දිතයාගේ, පිළිගත හැකි සාක්ෂිකරුගේ හෝ ඔත්තුකරුගේ ජීවිතය අනතුරකට ලක්කරන යම් තැනැත්තකු, වරදක් සිදු කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා අවුරුදු හතකට නොවැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට සහ රුපියල් පහළොස් දහසක දඩයකට හෝ යටත් විය යුතු ය.

(6) වරදක් සිදුකරන ලද බවට සැකකරන හෝ චෝදනා ලබන යම් තැනැත්තකු—

(අ) ඒ වරද සිදුකිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට එරෙහිව නඩු කටයුත්තක් පැවරීමට අදහස්කරන හෝ සූදානම්වන; හෝ

(ආ) නීතිය බලාත්මක කිරීමේ යම් අධිකාරියකට, කොමිෂන් සභාවකට හෝ අධිකරණයකට ඒ තැනැත්තාට එරෙහිව තොරතුරු හෝ සාක්ෂි සැපයීමට සූදානම් වන,

වෙනත් තැනැත්තකුට, ඒ තැනැත්තා විසින් ඒ වරද සිදුකරන ලද බවට සැකකරන හෝ චෝදනා ලබන ඒ පළමුව සඳහන් කළ තැනැත්තාට එරෙහිව නඩු කටයුත්තක් පැවරීමෙන් හෝ සත්‍ය තොරතුරු හෝ සාක්ෂි සැපයීම වැළැක්වීමේ, අධෛර්යට පත්කිරීමේ හෝ අවහිර කිරීමේ අරමුණින්, ඔහුට යම් අල්ලසක් ප්‍රදානය කිරීමෙන්, සැපයීමෙන් හෝ ලබා දීමෙන්, වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා අවුරුදු හතකට නොවැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට සහ රුපියල් පහළොස් දහසක දඩයකට, යටත් විය යුතු ය.

(7) වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ කොට්ඨාසය, අධිකරණය හෝ කොමිෂන් සභාව ඇතුළුව අධිකාරියෙන්, පොලිසියෙන් යම් ආරක්ෂාවක් හෝ සහයෝගයක් ලබා ගැනීමේ අරමුණින් යම් තැනැත්තකු විසින් දැන දැනම අසත්‍ය තොරතුරු සැපයීම හෝ අසත්‍ය යයි විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති තොරතුරු කිසිවක් සැපයීමෙන් වරදක් සිදුකරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කිරීමේ දී ඒ තැනැත්තා අවුරුදු හතකට නොවැඩි බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට සහ රුපියල් පහළොස් දහසක දඩයකට යටත් විය යුතු ය.

(8) සද්භාවයෙන් සහ—

(i) නීතියෙන් සාදන ලද විධිවිධාන හෝ ක්‍රියා පටිපාටිවලට;

(ii) අධිකරණ නිලධරයකු විසින් කරන ලද නියමයක්; හෝ

(iii) යම් නීතියක් මගින් හෝ ඒ යටතේ විධානයක් නිකුත් කිරීමට නිසි බලය දෙන ලද තැනැත්තකු විසින් නිකුත් කරනු ලබන විධානවලට,

අනුව හෝ ඊට අනුකූලවීමක දී හැර, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව සැපයීම භාරව සිටින හෝ ආරක්ෂාව සැපයීමේ දී සහභාගි වන හෝ සහයවන හෝ අන්‍යාකාරයෙන් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට සපයන ආරක්ෂාවට අදාළවන තොරතුරු සන්තකයේ දරන යම් තැනැත්තකු විසින්, ඒ තොරතුරු වෙනත් තැනැත්තකුට සැපයීමෙන්, නිකුත් කිරීමෙන් හෝ ලබා දීමෙන් ඒ අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ ජීවිතය අනතුරට ලක් කිරීමෙන් වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කිරීමේ දී, ඒ තැනැත්තා අවුරුදු හතකට නොවැඩි බන්ධනාගාර ගත කිරීමේ දඬුවමකට හෝ රුපියල් පහළොස් දහසක දඩයකට යටත් විය යුතු ය.

8 වන වගන්තිය යටතේ වරදක් සිදුකිරීමට තැත්කිරීම හෝ පෙළඹවීම වරදක් බව.

**9.** 8 වන වගන්තියේ සඳහන් යම් වරදක් සිදුකිරීමට තැත් කරන, වෙනත් තැනැත්තකුව වරදක් කිරීමට පොළඹවන හෝ චේතනාන්විතව සහය වන හෝ වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණයක යෙදෙන තැනැත්තෙක්, වරදකට වරදකරු වන අතර, මහාධිකරණය මගින් වරදකරු කිරීමෙන් පසු ඒ වගන්තිය මගින් ඒ වරද සඳහා පනවන ලද එම දඬුවමම ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

8 වන සහ 9 වන වගන්ති යටතේ වූ වරදක් සංඥෙය සහ ඇපදිය නොහැකි වරදක් බව.

**10.**(1)(අ) 8 වන වගන්තිය සහ 9 වන වගන්තිය යටතේ වූ වරදක් සංඥෙය සහ ඇප දියනොහැකි වරදක් විය යුතු අතර, අභියාචනාධිකරණය මගින් දෙන ලද ව්‍යතිරේකීය අවස්ථානුගත කරුණු යටතේ හැර, එවැනි වරදක් සඳහා සැක කරනු ලැබ සිටින, චෝදනා ලද හෝ වරදකරුවකු වූ කිසිදු තැනැත්තකු ඇප පිට මුදා හැරීම නොකළ යුතු ය;

(ආ) යම් තැනැත්තකු ඇපපිට මුදා හැරීමේ දී, සැකකරු විසින් වරද සිදු කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා සමග සහ ඒ ඇප ප්‍රදානය කරන නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තන් සමග සන්නිවේදන පවත්වාගෙන යාම හෝ සමීපයට පැමිණීම තහනම් කිරීමේ කොන්දේසියක් පැනවීමට, අභියාචනාධිකරණයට බලතල තිබිය යුතු ය.

(2) 8 වන වගන්තිය හෝ 9 වන වගන්තිය යටතේ යම් වරදක් සිදුකර ඇතැයි චෝදනා ලැබූ තැනැත්තකුට එරෙහිව පවත්වන නඩු

විභාගයක්, ඒ අධිකරණයේ වෙනත් නඩු කටයුත්තක් ඇසීමට පෙරාතුව විභාගයට ගත යුතු අතර, වාර්තා ගත කළ හැකි නොවැළැක්විය හැකි හේතු මත මිස, දිනපතා පැවැත්වෙන නඩු විභාගයක් ලෙස පවත්වාගෙන යා යුතු අතර, එම නඩු විභාගය අතරතුර දී කල් දැමීම ද නොකළ යුතු ය.

(3) යම් උද්දේශිත වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් ඇපමත සිටින යම් තැනැත්තකු, 8 වන වගන්තිය හෝ 9 වන වගන්තිය යටතේ වරදක් සිදුකර ඇති බවට නිගමනය කිරීම සඳහා බැලූ බැල්මට පෙනෙන කරුණු ඇති බවට විමර්ෂණයක් කිරීමෙන් පසුව අධිකරණය විසින් අනාවරණය කරගනු ලබන අවස්ථාවක දී, එම විමර්ෂණය පවත්වනු ලැබූ අධිකරණය විසින්, එකී තැනැත්තාට ප්‍රදානය කරනු ලැබූ ඇප අවලංගු කළ යුතු අතර, ඇප මත මුදා හරිනු ලැබ ඇත්තා වූ එම තැනැත්තාගේ වරද සම්න්ධයෙන් වූ නඩු විභාගය අවසන්වන තෙක් එම තැනැත්තාව, රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියක් පිහිටුවීම

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය.

**11.** (1) (මෙහි "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය වශයෙන් හඳුන්වනු ලබන අධිකාරියක්, පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අධිකාරිය අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, එකී නාමයෙන් එය විසින් ද නඩු පැවරීම හා පවරනු ලැබීම කළ හැකි ය.

අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය.

**12.** (1) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයකට පැවැරිය යුතු ය:—

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වූ සාමාජිකයන්—

(i) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයා විසින් නම් කළ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(ii) පොලිස් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කළ එකී අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(iii) කාන්තා කටයුතු විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කළ එකී අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(iv) ළමයින් පිළිබඳ විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කළ එකී අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(v) 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නම් කළ එකී සභාවේ සාමාජිකයකු;

(vi) නීතිපතිවරයාගේ නාමිකයකු; හෝ

(vii) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ ධුරය දරන පොලිස්පතිවරයාගේ නාමිකයකු;

එසේ වුව ද, මෙම ඡේදයේ (iii) වන සහ (iv) වන අනුඡේදවල නිශ්චිතව සඳහන් කර ඇති විෂයයන් එක් අමාත්‍යවරයකුට පවරා ඇති විටක හෝ භාරයේ පවතින අවස්ථාවක දී, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට පමණක්, මෙම ඡේදය යටතේ මණ්ඩලයේ සාමාජිකයකු බවට පත්වීමට හිමිකම ඇත්තේ ය.

(ආ) ජනාධිපතිවරයා විසින්, අපරාධවේදය, අපරාධ යුක්ති පද්ධතිය, මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම හෝ වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත හෝ ඒ හා සම්බන්ධිත

වෘත්තීන්වල හෝ වෘත්තීමය ක්ෂේත්‍රවල අධ්‍යාපනික හෝ වෘත්තීමය සුදුසුකම් ලත් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතරින් ජනාධිපතිවරයා විසින් තෝරා පත් කර ගත් සාමාජිකයන් පස්දෙනෙකු.

(2) ජනාධිපතිවරයා විසින්, මණ්ඩලයේ පත්කළ සාමාජිකයන් අතරින් මණ්ඩලයේ සභාපතිවරයා තෝරා පත්කළ යුතු අතර, ඔහු අධිකාරියේ සභාපතිවරයා ද විය යුතු ය.

(3) මේ පනතේ උපලේඛනයේ විධිවිධාන, මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීමට, මණ්ඩලයේ රැස්වීම්වලට, සාමාජිකයන්ට ගෙවනු ලබන පාරිශ්‍රමිකවලට සහ මණ්ඩලයේ මුද්‍රාවට සහ ඒ හා සම්බන්ධයෙන්, අදාළ කරගත යුතු ය.

අධිකාරියේ කාර්ය සහ කර්තව්‍යයන්.

**13.** (1) අධිකාරියේ කාර්ය සහ කර්තව්‍යයන් විය යුත්තේ:—

(අ) අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනාගැනීම සහ ඒවාට ගෞරවය කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ආ) සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනාගැනීම සහ ඒවාට ගෞරවය කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ඇ) අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම හෝ ආරක්ෂා කිරීමට සැලැස්වීම;

(ඈ) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් කඩකරන ලදැයි යන්න පිළිබඳව ලැබුණු පැමිණිල්ලක් හෝ යම් තොරතුරු මත, මේ පනත යටතේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම උදෙසා, කරන ලදැයි කියන කඩකිරීම පිළිබඳව විමර්ශනය කර ඒ සම්බන්ධයෙන් සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අදාළ අධිකාරීන්ගෙන් ඉල්ලා සිටීම;

(ඉ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට අවශ්‍ය ප්‍රතිකාර, හානිපූරණය, ප්‍රතිෂ්ඨාපනය සහ පුනරුත්ථාපන පියවර ගැනීම ඇතුළුව අවශ්‍ය සහාය සැපයීම;

(ඊ) අපරාධයක වින්දිතයන් හට මේ පනතේ 29 වන වගන්තිය මගින් පිහිටුවන ලද අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම;

(උ) මේ පනත මගින් සලසා ඇති අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව මහජනයා දැනුවත් කිරීම;

(ඌ) විශේෂයෙන්ම අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට—

(i) ඵලදායි ආරක්ෂාව;

(ii) අවශ්‍ය ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ උපදේශනය; සහ

(iii) වෙනත් සුදුසු සහායන්,

සැපයීම ඇතුළුව, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට මෙම පනතින් සලසා ඇති අයිතිවාසිකම් සහ හිමිකම්වලට බලාත්මක භාවයක් ලබාදීම පිණිස යොදා ගත යුතු, පිළිගත යුතු හෝ ක්‍රියාත්මක කළ යුතු සුදුසු සහ විශේෂිත පියවර පිළිබඳ සාමාන්‍යයෙන් හෝ එක් එක් අවස්ථාවන් වෙන් වෙන්ව සලකා බැලීමේ පදනම මත, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට සහ වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තුවකට, ව්‍යවස්ථාපිත ආයතනයකට සහ රජයේ නිලධරයන්ට, උපදෙස් දීම සහ නිර්දේශ කිරීම;

(එ) විවිධ අධිකාරීන් විසින් පිළිගත් සහ අනුගමනය කරන, දැනට පවතින ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියාමාර්ග සහ ක්‍රියාපටිපාටි අපරාධයක වින්දිතයන්ගේ සහ

සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට අදාළව පිළිගත් සම්මතයන්ට සහ යහපත් පරිචයන්ට අනුකූල බව තහවුරු කර ගැනීම උදෙසා ඒවා සමාලෝචනය කිරීම හා එම සමාලෝචනයන් පදනම් කර ගනිමින්, සුදුසු ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියාමාර්ග පිළිගැනීම, සංශෝධනය කිරීම සහ යොදාගැනීම පිළිබඳව නිර්දේශ කිරීම;

(ඒ) යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් හෝ වෙන යම් තැනැත්තකුගේ ඉල්ලීම මත, සමකාලීන හෝ ආසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්බන්ධකයක් මගින් සාක්ෂි ලබා ගැනීමේ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිබඳව තොරතුරු ලබා දීමට සැලැස්වීම;

(ඔ) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, භාෂාව, සංස්කෘතික විශ්වාසයන් සහ පුරුදු, ජන වාර්ගික හෝ සමාජ ප්‍රභවයන් හෝ ආබාධිත බව හෝ වෙනත් යම් හේතූන් නිසා සිදුවන හානි හෝ සිදුවිය හැකි හානිවල ප්‍රතිඵලයන් ලෙස අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට පැන නගින අවශ්‍යතා සහ සුවිශේෂ කණ්ඩායම්වලට අයත් අපරාධයක වින්දිතයන්ට පැන නගින විශේෂ අවශ්‍යතා මත, ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන්, පරිවාස සහ සමාජ සේවාවලට සම්බන්ධ රජයේ නිලධරයන් ඇතුළුව, නීතිය බලාත්මක කිරීමට සම්බන්ධ රජයේ නිලධරයන් සංවේදීකරණය කිරීමට පියවර ගැනීම;

(ඕ) ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ වෛද්‍ය නිලධරයන් සහ රජයේ සමාජ සේවා ආයතනවල නිලධරයන් ඇතුළුව, නීතිය බලාත්මක කිරීමට අදාළ අධිකරණ, කොමිෂන් සභා, වෙනත් යම් විනිශ්චය සභා, රජයේ නිලධරයන් සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවා නියුක්තයන් විසින්, අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීමට අදාළ පාලන සංග්‍රහයන් සහ පිළිගත් ප්‍රතිමාන සහ යහපත් පරිචයන් පිළිපැදීම සහ අදාළ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ නිර්දේශ කිරීම;

(ක) (i) අපරාධ සිදුවීම අඩුකළ හැකි;

(ii) නිශ්චිත අපරාධවලින් වින්දිතයන් හට සිදුවන බලපෑම අවම කළ හැකි හෝ වැළැක්විය හැකි;

(iii) වින්දිතයන්ට ඵලදායි ලෙස ප්‍රතිකාර කළ හැකි, පුනරුත්ථාපනය කළ හැකි, උපදේශනය කළ හැකි, සහාය දිය හැකි, වන්දි ගෙවිය හැකි සහ ආරක්ෂා කළ හැකි;

(iv) නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් ඉදිරිපිට හෝ අධිකරණයක් ඉදිරිපිට සහ වෙනත් කොමිෂන් සභාවක් ඉදිරිපිට සහ වෙනත් විනිශ්චය සභාවක් ඉදිරිපිට වූ නඩු කටයුත්තක දී, බියෙන් තොරව සාක්ෂිකරුවන් හට ප්‍රකාශයන් කිරීමට හෝ සාක්ෂි දීමට උපකාරී වන පරිසරයක් නිර්මාණය කළ හැකි;

(v) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව සැලසිය හැකි,

ක්‍රම සහ විධි පිළිබඳව පර්යේෂණ පැවැත්වීම හෝ එසේ පැවැත්වීම ප්‍රවර්ධනය කිරීම;

(ග) අපරාධ සිදුවීම් අඩුකිරීම සඳහා සහ අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව පිළිබඳ පහසුකම් සැලැස්වීම සඳහා අදාළ රජයේ ආයතනවලට ඒ ආයතන මගින් තෝරාගනු ලැබිය හැකි සමාජ, සෞඛ්‍ය, අධ්‍යාපනික, ආර්ථික සහ අපරාධ වැළැක්වීමේ ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ කිරීම;

(ච) අපරාධ යුක්ති පද්ධතිය තුළ දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන් අපරාධයක වින්දිතයන් පෙර සිටි තත්ත්වයට ගැනීමේ පියවර වර්ධනය කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීම;

(ජ) අපරාධ යුක්ති පරිපාලනය කිරීමේ ක්‍රමයක් ලෙස සහ අපරාධ යුක්ති පද්ධතිය තුළ දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන්, පෙර තිබූ තත්ත්වයට පැමිණවීම සඳහා යුක්ති සහගත පියවර ගැනීම වර්ධනය කිරීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීම;

(ට) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය සැපයීම සඳහා යෝජනා ක්‍රමයක් වැඩිදියුණු කිරීම, යොදාගැනීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඩ) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අදාළ නියමු උපදේශන නිකුත් කිරීම;

(ණ) (i) අධිකාරිය විසින් මේ පනතේ අරමුණුවලට බලාත්මක භාවයක් දී ඇති ආකාරය;

(ii) අධිකාරියේ කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම; සහ

(iii) අවශ්‍ය ප්‍රතිපත්තිමය සහ නීතිමය ප්‍රතිසංස්කරණ,

පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ත) මේ පනතේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය විය හැකි වැඩිදුරටත් වූ යම් කර්තව්‍ය හා කාර්යයන් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම.

(2) යම් තැනැත්තකු හෝ අධිකාරියක් වෙත, අධිකාරිය විසින් යම් නිර්දේශ කරනු ලබන අවස්ථාවක දී හෝ (1) වන උපවගන්තිය යටතේ යම් පියවර ගන්නා ලෙස යම් තැනැත්තකුට හෝ අධිකාරියකට නියම කරනු ලබන අවස්ථාවක—

(අ) එම නිර්දේශය ක්‍රියාත්මක කොට හෝ එම පියවර ඉටුකර ඒ පිළිබඳව අධිකාරිය වෙත වාර්තා කිරීම; හෝ

(ආ) එම නිර්දේශ බලාත්මක කිරීමට හෝ පියවර ගැනීමට එම තැනැත්තාට හෝ අදාළ අධිකාරියට නොහැකි වන අවස්ථාවක, ඒ සඳහා හේතු ඉදිරිපත් කරමින් ඒ නොහැකියාව පිළිබඳව අධිකාරිය වෙත වාර්තා කිරීම,

එම තැනැත්තාගේ හෝ අදාළ අධිකාරියේ කාර්යය වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යම් තැනැත්තකු හෝ අදාළ අධිකාරියක් විසින් ප්‍රමාණවත් පරිදි සහ නිසි ආකාරයට යම් නිර්දේශ හෝ පියවර ගැනීම බලාත්මක කරන බවට හෝ කරගෙන යන බවට සහතික වීමේ කාර්ය සඳහා අදාළ නිර්දේශ බලාත්මක කිරීමේ දී හෝ පියවර ගැනීමේ දී එම තැනැත්තා හෝ අධිකාරිය විසින් ඉටු කරනු ලබන සියලු කටයුතු නියාමනය කිරීමට අධිකාරියට බලය ඇත්තේ ය.

14. (1) අධිකාරියට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:— අධිකාරියේ බලතල.

(අ) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකමක් හෝ හිමිකමක් කඩවීමක් පිළිබඳව හෝ අත්‍යසන්ත කඩවීමක් පිළිබඳව විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා:—

(i) අධිකරණ නිලධරයකු හෝ කොමිෂන් සභාවක කොමසාරිස්වරයකු නොවන වෙනත් යම් තැනැත්තකුට, අධිකාරිය ඉදිරියට පැමිණෙන ලෙස සහ පරීක්ෂණයකට හෝ විභාගයකට සහභාගිවීමට නියම කිරීම;

(ii) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් නොවන යම් තැනැත්තකුට, පරීක්ෂා කිරීම සහ පිටපත් කිරීම සඳහා පොලිස් පරීක්ෂණ සටහන්, තොරතුරු සටහන් පොත්වල උද්ධෘත, නිලධාරීන්ගේ හමුවීමේ පොත්වල උද්ධෘත ඇතුළුව ඔහුගේ හෝ එහි සන්තකයේ හෝ භාරයේ තිබෙන යම් ලේඛනයක්, එහි සහතික කළ පිටපතක් හෝ වෙනත් දෙයක් අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමට නියම කිරීම;

(iii) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් නොවන වෙනත් තැනැත්තකුට, ඔහු හෝ එය සන්තකයේ තිබිය හැකි යම් තොරතුරු ලිඛිතව අධිකාරිය වෙත සැපයීමට නියම කිරීම;

(iv) අධිකරණ නිලධරයකු හෝ කොමිෂන් සභාවක කොමසාරිස්වරයකු නොවන යම් තැනැත්තකු සමග සම්මුඛ සාකච්ඡාවක් පවත්වා එම තැනැත්තාගේ ප්‍රකාශය සටහන් කිරීම;

(v) යම් අධිකරණයකට හෝ කොමිෂන් සභාවකට ඉල්ලීමක් ඉදිරිපත් කර එමගින් එම අධිකරණයේ හෝ කොමිෂන් සභාවේ යම් නඩුවක වාර්තා, යම් නඩුවක හෝ වෙනත් වාර්තාවල සහ එම අධිකරණයේ හෝ කොමිෂන් සභාවේ නඩු වාර්තාවක හෝ ගොනුවක ගොනුකර ඇති වෙනත් දෙයක් පිළිබඳ සහතික කළ පිටපත් ලබා ගැනීම;

(vi) යම් විමර්ශනයක්, පරීක්ෂණයක්, නඩු විභාගයක් හෝ වෙනත් කටයුත්තක් ඇතුළුව, යම් ස්ථානයක සිදුවන යම් සිද්ධියක්, ස්ථානගත කිරීමක් හෝ ක්‍රියාවලියක් පරීක්ෂා කිරීමට, විභාග කිරීමට හෝ නිරීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට එම ස්ථානයට ඇතුළුවීම;

(vii) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීම හෝ ආරක්ෂා කිරීම සඳහා හෝ අදාළ අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ අයිතිවාසිකම් හෝ හිමිකම් කඩකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ යම් අලාභයක් සඳහා ප්‍රතිකර්ම යෙදීම සඳහා උචිත නියමයක් කිරීම සහ ඒ සම්බන්ධයෙන් පියවර ගැනීමට විධාන කිරීම, උපදෙස් දීම හෝ නිර්දේශ කිරීම;

(ආ) යම් නිශ්චල හෝ චංචල දේපලක් අත්කර ගැනීම, දැරීම, කුලියට හෝ බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම;

(ඇ) එහි කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ඈ) එහි අරමුදලේ බැරට ඇති මුදල්, සුදුසු සහ ආරක්ෂිත ආකාරයකින් ආයෝජනය කිරීම සහ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ සහ තැන්පතු ගිණුම් ආරම්භ කර ඒවා පවත්වාගෙන යාම;

(ඉ) එහි කාර්යයන් සහ කර්තව්‍යයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි නිළධරයන්, උපදේශකවරු සහ උපදෙස් දෙන්නන් පත්කිරීම, ඉවත් කිරීම සහ ඔවුන් පිළිබඳ විනය පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම;

(ඊ) 24 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව වූ මූලාශ්‍රවලින් පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ සහ ප්‍රදාන ඉල්ලා සිටීම, පිළිගැනීම සහ ලබාගැනීම සහ එහි කාර්යයන් සහ කර්තව්‍යයන් නිසි ලෙස ඉටු කිරීම උදෙසා ඒවා යොදා ගැනීම;

(උ) මේ පනත යටතේ එහි කාර්යන් සහ කර්තව්‍යයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් සහ වැඩිදුරටත් වූ සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ, අධිකාරිය විසින් පනවන ලද යම් නියමයකට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින යම් තැනැත්තෙක් අධිකාරියට අපහාස කිරීමේ වරදකට වරදකරු විය යුතු ය.

(3) අධිකාරියට විරුද්ධව සිදු කරන ලද සෑම අපහාස වරදක් සම්බන්ධයෙන්, ඒ වරද ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකාරයට විරුද්ධව සිදු කරන ලද අපහාස වරදක් වූවාක් මෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, ඒ සෑම වරදක්ම විභාග කිරීමේ අධිකරණ බලය මෙයින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැවරෙන්නේ ය.

(4) යම් තැනැත්තකු විසින් (2) වන උපවගන්තිය යටතේ යම් අපහාස වරදක් සිදුකර ඇති බවට අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, අධිකාරිය විසින් ඒ නිශ්චය කිරීම දැක්වෙන සහතිකයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යැවිය හැකි ය. ඒ සෑම සහතිකයක් ම අධිකාරියේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි, සැලකිල්ලට ගැනීම සුදුසු යයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකනු ලබන අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා වූ යම් නඩු කටයුත්තක දී (4) වන උපවගන්තිය යටතේ අත්සන් කරන ලද සහ අධිකරණය වෙත යවන ලද සහතිකයක් බවට උද්දේශිත යම් ලේඛනයක්-

(අ) සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස, වැඩිදුර ඔප්පු කිරීමක් නොමැතිව එය එසේ වූ සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) සහතිකයේ දැක්වෙන නිශ්චය කිරීම අධිකාරිය විසින් කරන ලද බවට සහ නිශ්චය කිරීමේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි විය යුතු ය.

(6) අධිකාරියට විරුද්ධව කරන ලද වරදක් යයි කියනු ලබන යම් අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම පිණිස මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි පවත්වනු ලබන යම් නඩු කටයුතුවල දී, අධිකාරියේ කිසිම සාමාජිකයකු වූ මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඔහුගේ කැමැත්ත ඇතිව හැර, සාක්ෂිකරුවකු වශයෙන් කැඳවීම හෝ ඔහුගෙන් ප්‍රශ්න කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා.

**15.** (1) වෘත්තීමය සුදුසුකමක් ඇති සහ අපරාධ යුක්ති පද්ධතිය හෝ නීතිය බලාත්මක කිරීම හා සම්බන්ධ වෘත්තීමය කටයුත්තක පළපුරුද්ද ඇති තැනැත්තකු, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු ය.

(2) මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, අධිකාරියේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය යම් සියලු කාර්යන් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය.

(4) මණ්ඩලය විසින් අධිකාරියේ කාර්ය සහ කර්තව්‍යවලින් යම් කාර්ය සහ කර්තව්‍ය, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි අතර, එම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මණ්ඩලයේ බලතල ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි ය.

නිරීක්ෂණ සහ පරීක්ෂණ.

**16.** (1) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකම් හෝ හිමිකම් කඩවීමක් පිළිබඳ හෝ අත්‍යාසන්න කඩවීමක් පිළිබඳව වූ යම් පැමිණිල්ලක් හෝ තොරතුරු පිළිබඳව නිරීක්ෂණයක්, අධිකාරිය වෙනුවෙන් එහි නිලධරයකු විසින් කරගෙන යායුතු අතර, එම නිරීක්ෂණයේ සටහන් ද ඇතුළුව එහි වාර්තාව මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

(2) (අ) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අයිතිවාසිකම් හෝ හිමිකම් කඩවීමක් හෝ අත්‍යාසන්න කඩවීමක් පිළිබඳව එම වාර්තාවෙන් අනාවරණය වන බවට මණ්ඩලයේ මතය වන අවස්ථාවක, මණ්ඩලය විසින්, ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට, මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් තෝරා පත්කර ගනු ලබන මණ්ඩලයේ සාමාජිකයන් තුන්දෙනකුගෙන් සමන්විත වූ මූල මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) මණ්ඩලය විසින් එම මූල මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එක් අයකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(3) 14 වන වගන්තියේ (අ) ඡේදයේ (i) සිට (iv) දක්වා වූ අනුඡේදවල විධිවිධාන මූල මණ්ඩලය විසින් පවත්වනු ලබන පරීක්ෂණය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) පරීක්ෂණය පවත්වනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් මූල මණ්ඩලයේ සාමාජිකයන් අතර මතභේදයක් ඇති වූ අවස්ථාවක, බහුතරයකගේ මතය ක්‍රියාත්මක විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ පරීක්ෂණයක් අවසන්වීමේ දී, පරීක්ෂණය පවත්වන ලද කාරණය සම්බන්ධයෙන් ස්වකීය නිර්දේශ සමග එම කරුණු පිළිබඳ වාර්තාවක් මූල මණ්ඩලය විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(6) මූල මණ්ඩලයේ වාර්තාව ලැබීමෙන් පසු මණ්ඩලය විසින් සුදුසු සහ උචිත යයි සලකනු ලබන ආකාරයට එම වාර්තාව සම්බන්ධයෙන් වූ ක්‍රියාමාර්ගයක් ගත යුතු ය.

විමර්ශනවල දී අධ්‍යක්ෂ-ජනරාල්වරයා සහාය ලබාදිය යුතු බව.

**17.** මේ පනත යටතේ පරීක්ෂණයක් පැවැත්වීමේ දී අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මූල මණ්ඩලයට සහාය ලබාදිය යුතු ය.

අධිකාරියේ අරමුදල සහ එහි මුදල් වර්ෂය.

**18.** (1) අධිකාරියට ස්වකීය අරමුදලක් තිබිය යුතු ය.

(2) අධිකාරියේ අරමුදලට:—

(අ) අධිකාරියේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට සම්මත කරනු ලැබිය හැකි යම් සියලු මුදල්; සහ

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව වූ මූලාශ්‍රවලින් පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ සහ ප්‍රදාන ලෙස අධිකාරියට ලබාදෙනු ලබන සියලු මුදල්,

බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය කාර්යන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද වියදම් පියවා ගැනීමට අවශ්‍ය විය හැකි සියලු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලය විසින් අධිකාරියේ ලැබීම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අධිකාරියේ වෙනත් ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(5) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

## V වන කොටස

## අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය

වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය.

**19.** (1) පොලිස්පතිවරයා විසින්, අපරාධයක වින්දිතයන්ට සහ සාකෂිකරුවන්ට සහාය සහ ආරක්ෂාව සැපයීමේ කාර්යය සඳහා (මේ පනතේ "කොට්ඨාසය" යනුවෙන් සඳහන් කරනු ලබන) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු කොට්ඨාසයක්, අධිකාරිය විමසමින් සහ ඒ කාර්යය සඳහා අධිකාරිය විසින් නිකුත් කරනු ලබන උපදේශන අනුගමනය කරමින්, පිහිටුවා පවත්වාගෙන යා යුතු ය.

(2) 12 (1) (අ) (vii) වන වගන්තිය යටතේ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කළ පොලිස්පතිවරයාගේ නාමිකයකුගේ අධීක්ෂණය යටතේ එන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයකු කොට්ඨාසය භාර ප්‍රධානියා ලෙස පත් කළ යුතු ය.

(3) (අ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට යෝග්‍ය සහ අවශ්‍ය ආරක්ෂාව සැලසීම; සහ

(ආ) අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහ ඔවුන්ගේ දේපලවලට සිදු කරනු ලබන තර්ජන, පළිගැනීම්, බිය ගැන්වීම්, ප්‍රතිප්‍රහාරයන් හෝ පෙළඹවීම්, හානි කිරීම් හෝ හිරිහැර කිරීම්වලට අදාළ යම් පැමිණිල්ලක්, චෝදනාවක් හෝ තොරතුරක් පිළිබඳව සහ මේ පනතේ 8 වන හෝ 9 වන වගන්ති යටතේ සිදු කරනු ලබන වැරැද්දක් පිළිබඳව කොට්ඨාසය විසින්ම හෝ යම් පොලිස් නිලධරයකුගේ සහාය ඇතිව, විමර්ශනය කිරීම,

කොට්ඨාසයේ කාර්යය විය යුතු ය.

වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක වැඩ සටහන්.

**20.** (1) ඇති විය හැකි හෝ පවතින තර්ජන, හානි, පළිගැනීම්, ප්‍රතිප්‍රහාරයන් සහ බියගැන්වීම්වලින් අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ට සහාය වීම සඳහා, කොට්ඨාසය විසින් අවශ්‍ය කාර්යක්ෂම පියවර ගැනීමට විධිවිධාන සලසන "අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහයක සහ ආරක්ෂක වැඩසටහනක්" තත් කාර්යය සඳහා අධිකාරිය විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු ය.

(2) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට, යම් තර්ජනයකට, හානියකට, පළිගැනීමකට, ප්‍රතිප්‍රහාරයකට සහ බියගැන්වීමකට මුහුණ දීමට සිදුවීමේ දී ගනු ලැබිය හැකි ක්‍රියාමාර්ග සහ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක වැඩසටහන යටතේ එම අපරාධයේ වින්දිතයන් හෝ සාක්ෂිකරුවන් හට සහය සහ ආරක්ෂාව ලබා ගැනීමට ඉල්ලුම් කළ යුතු ආකාරය ඇතුළුව, (1) වන උපවගන්තිය යටතේ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ වැඩසටහන පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම, කොට්ඨාසයේ කාර්යය වන්නේ ය.

(3) කොට්ඨාසය මගින්—

(අ) අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත;

(ආ) අධිකාරිය විසින් කරනු ලබන නිර්දේශයක් මත ;

(ඇ) යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් හෝ රජයේ නිලධරයකු විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවක් මත ; හෝ

(ඈ) අධිකරණයකින් හෝ කොමිෂන් සභාවකින් ලැබුන නිවේදනයක් මත,

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක වැඩසටහනට, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු ඇතුළත් කිරීම බාරගනු ලැබිය හැකි ය.

(4) අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට සහාය සහ ආරක්ෂාව සැලසීම, තර්ජනයේ බරපතලකම පිළිබඳව තක්සේරුවක් පැවැත්වීමෙන් පසු සහ ඊට භාජනය වු අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ කැමැත්ත ඇතිව, ඒ කොට්ඨාසය මගින් කළ යුතු ය.

(5) අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පෙරාතුව, අදාළ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට කොට්ඨාසය සමග අවබෝධතා ගිවිසුමකට ඇතුළත් වීමට කොට්ඨාසය විසින් නියම කරනු ලැබිය හැකි ය.

## VI වන කොටස

### ආරක්ෂාව ලබාගැනීමට අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ඇති හිමිකම්

අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීමේ කාර්යය.

**21.** (1) වරදක දී හෝ මූලික අයිතිවාසිකමක් කඩකිරීමක දී හෝ මානව හිමිකමක් උල්ලංඝනය වීමක දී පවත්වන යම් විමර්ශනයකට හෝ පරීක්ෂණයකට සහයෝගය දැක්වීම හෝ සහභාගි වීම නිසා හෝ යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී තම සහයෝගය හෝ සහභාගිත්වය ලබා දීම නිසා, තමන්ට යම් හානියක් සිදුවිය හැකි බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු හට, ඒ යම් සත්‍ය හෝ අනුමාන කළ හැකි හානියකින් ආරක්ෂාව ලබා ගැනීමට, හිමිකමක් තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආරක්ෂාව සඳහා කරන ඉල්ලීමක්, අධිකාරිය, කොට්ඨාසය, නඩු කටයුත්ත ආරම්භ කිරීමට සැලසුම් කර ඇති හෝ නඩු කටයුත්තක් කෙරෙමින් පවතින හෝ මෙහෙයවා ඇති අධිකරණයක්, කොමිෂන් සභාවක් හෝ යම් පොලීසියක ස්ථානාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

ආරක්ෂාව, ප්‍රදානය කරන ආකාරය, ආරම්භ කිරීම, පවත්වන කාලය සහ නතර කිරීම.

**22.** (1) ආරක්ෂාව සඳහා වූ අවශ්‍යතාවය සහ පවතින සම්පත් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව සහ පවත්නා නීතින් යටතේ අධිකාරිය, කොට්ඨාසය හෝ කොමිෂන් සභාව විසින් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු වෙනුවෙන් ගත යුතු පියවරවලට—

(අ) ඒ තැනැත්තාට සහ දේපලවලට ආරක්ෂාව සැපයීම;

(ආ) රැකවරණය ඇතුළුව තාවකාලික නවාතැන් සැපයීම;

(ඇ) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අනුමතය ඇතිව ස්ථිර ස්ථානගත කිරීම;

(ඈ) තාවකාලික හෝ ස්ථිර රැකියා ලබාදීම;

(ඉ) නව හැඳුනුමක් ලබාදීම;

(ඊ) අධිකාරිය, කොට්ඨාසය හෝ කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකන වෙනත් යම් පියවර ගැනීම,

ඇතුළත් විය හැකි ය.

(2) අපරාධ විමර්ශනයක් පවත්වන කාලය තුළ දී හෝ ඉන්පසුව, කොමිෂන් සභාව විසින් කරනු ලබන යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට පෙරාතුව, එය පැවැත්වෙන කාලය තුළ දී හෝ පැවැත්වීමෙන් පසුව සහ යම් නඩු කටයුත්තකට පෙරාතුව, එය පැවැත්වෙන කාලය තුළ දී හෝ පැවැත්වීමෙන් පසුව වුව ද, යම් තොරතුරක්, සන්නිවේදනයක් හෝ පැමිණිල්ලක් යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකුගෙන් ලැබුණු වහාම, අධිකාරිය, කොට්ඨාසය හෝ කොමිෂන් සභාව විසින් එම අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට, ආරක්ෂාව සැලසිය හැකි ය.

(3) යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව සහ සහාය සපයන විටක දී, අධිකාරිය විසින් දෙනු ලබන උපදෙස් සහ නිර්දේශවලට අනුකූලව කොට්ඨාසය ක්‍රියා කළ යුතු ය.

(4) යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාවක් හෝ සහායක් සැපයීම සඳහා සහායක් යම් අමාත්‍යාංශයකින්, රජයේ දෙපාර්තමේන්තුවකින්, ව්‍යවස්ථාපිත ආයතනයකින් හෝ යම් රජයේ නිලධරයකුගෙන් කොට්ඨාසය විසින් ඉල්ලා ඇති අවස්ථාවක දී, අදාළ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට සෘජුවම එම ආරක්ෂාව හෝ සහාය සැපයීම හෝ ඉල්ලන ලද සහය කොට්ඨාසය වෙත ලබාදීම, ඒ අමාත්‍යාංශයේ, රජයේ දෙපාර්තමේන්තුවේ, ව්‍යවස්ථාපිත ආයතනයේ හෝ ඒ රජයේ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(5) අධිකාරිය, කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා හෝ කොමිෂන් සභාව විසින් යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු හට ආරක්ෂාව හෝ සහාය සැපයීමේ දී—

(අ) එසේ එම ආරක්ෂාව හෝ සහාය තවදුරටත් ලබාදීමට අවශ්‍යතාවයක් නොමැති අවස්ථාවක;

(ආ) ඒ අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරුවා—

(i) එසේ එම ආරක්ෂාව හෝ සහාය ලබාදීම නතර කරන ලෙස ඉල්ලා සිටින අවස්ථාවක;

(ii) එම ආරක්ෂාව හෝ සහාය ලබාගැනීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක;

(iii) ප්‍රදානය කරන ලද ආරක්ෂාව හෝ සහාය අනිසි ලෙස පාවිච්චි කළ අවස්ථාවක;

(iv) නඩු දැමිය හැකි වරදක් හෝ සාමය කඩකිරීමක් සිදුකළ අවස්ථාවක;

(v) ගිවිසගත් අවබෝධතා ගිවිසුමේ නියමයන්ට පටහැනිව ක්‍රියාකළ අවස්ථාවක; හෝ

(vi) ආරක්ෂාව හෝ සහාය ලබගැනීම පිණිස යම් අසත්‍ය තොරතුරු, ප්‍රකාශ, පැමිණිලි හෝ සාක්ෂි සපයා ඇති බව හෝ මේ පනතේ නියමයන් ප්‍රකාරව ආරක්ෂාව හෝ සහාය ලබාගැනීමෙන් අනතුරුව යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට, අධිකරණයකට හෝ කොමිෂන් සභාවකට වැරදි තොරතුරු, ප්‍රකාශ, පැමිණිලි හෝ සාක්ෂි සපයන බව සොයාගත් අවස්ථාවක දී,

එම ආරක්ෂාව හෝ සහාය සැපයීම නතර කළ යුතු ය.

අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකුගේ ඉල්ලීමක් ලැබුණු පසු පොලිස් ස්ථානාධිපතිවරයා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව.

**23.** 21 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ලබන පොලිස් ස්ථානාධිපතිවරයා විසින්, එසේ ලැබුනු ඉල්ලීම පිළිබඳව නොපමාව විමර්ශනය කිරීමට හෝ පරීක්ෂා කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු අතර, අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වේ නම්, නොපමාව අවශ්‍ය යම් ආරක්ෂාවක් සලසා, ලැබුනු තොරතුරුවලට අදාළව ඔහුගේ තීන්දුව ඇතුළුව ඒ ඉල්ලීම ලැබීම පිළිබඳව සහ ඒ ඉල්ලීම ලැබීමෙන් අනතුරුව ඔහු විසින් ගත් ක්‍රියාමාර්ගවලට අදාළ තොරතුරු, අධිකාරියට හෝ කොට්ඨාසයට දැන්විය යුතු ය.

අධිකාරිය හෝ කොමිෂන් සභාව විසින් අපරාධයකට ගොදුරු විය හැකි වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කළ යුතු බව.

**24.** (1) යම් සුවිශේෂ අවස්ථාවන් යටතේ අවධානමකට ලක්විය හැකි අපරාධයක වින්දිතයනගේ හෝ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින්, අධිකාරියට, අධිකරණයකින් හෝ කොමිෂන් සභාවකින් ලැබුන දැන්වීමක් මත හෝ ස්වකීය මෝසමක් මත, අධිකාරිය විසින් හෝ යම් නියමිත රජයේ නිලධරයකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ සංවිධානයක සහාය ඇතිව, එම අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට ඍජුවම ආරක්ෂාව සැලසිය හැකිය.

(2) (අ) අවධානමකට ලක්විය හැකි අපරාධයක වින්දිතයන්ගේ හෝ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින්, කොමිෂන් සභාව විසින්, අධිකාරියට පූර්ව දැණුම් දීමකින් පසු, අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ ඉල්ලීමක් මත හෝ ස්වකීය මෝසමක් මත, කොමිෂන් සභාව විසින් හෝ රජයේ යම් නියමිත නිලධරයකුගේ සහය ඇතිව, කොමිෂන් සභාව විසින් සටහන් කර ගැනීමට අදහස් කරන හෝ දැනටමත් සටහන් කරගෙන ඇති ප්‍රකාශයක් හෝ සාක්ෂියක් දෙන ලද, එම අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට සෘජුවම ආරක්ෂාව සැලසිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් තත්ත්වයක දී , කොට්ඨාසය මගින් අදාළ කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ඇතිව සහ එයට අදාළව අධිකාරියට දැන්වීමක් නිකුත් කිරීමෙන් පසුව පමණක්, එම අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට ආරක්ෂාව සැලසිය යුතු ය.

(ඇ) කොමිෂන් සභාවක් විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ නියමිත රජයේ නිලධරයකුගේ සහාය ඇතිව, අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව සැලසීමට තීරණය කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් රජයේ නිලධරයෙක් නොවන යම් තැනැත්තකුගෙන් සම්පත් ඇතුළුව, එම කාර්යය සඳහා උපදෙස්, සේවා හෝ සහාය ලබා නොගත යුතු ය:

එසේ වුව ද, කොමිෂන් සභාව විසින්, එවැනි අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව සැපයීමේ වගකීම ඕනෑම අවස්ථාවක දී අධිකාරියට හෝ කොට්ඨාසයට පැවරිය හැකි අතර, එසේ වගකීම පවරනු ලබන අවස්ථාවක දී, ඒ වින්දිතයාට හෝ සාක්ෂිකරුට අවශ්‍ය ආරක්ෂාව සැපයීම, අධිකාරියේ හෝ කොට්ඨාසයේ කාර්යය වන්නේ ය.

(3) අධිකාරිය, කොට්ඨාසය හෝ කොමිෂන් සභාව විසින්, නීතිපතිවරයාගේ සහ විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමතය ඇතිව මිස, අපාරධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු හට සහාය හෝ ආරක්ෂාව සැපයීමට යම් විදේශීය රජයකින් හෝ විදේශීය ජාතියකුගෙන් හෝ විදේශීය හෝ ජාත්‍යන්තර සංවිධානයකින් සහාය ලබා ගැනීම නොකළ යුතු අතර, එම පූර්ව අනුමතය ලබා දීම පිළිබඳව නීතිපතිවරයා සහ එම ලේකම්වරයා විසින් හැකිතාක් ඉක්මණින් සලකා බලා තීරණය කළ යුතු ය.

අධිකරණය සහ කොමිෂන් සභා විසින් ආරක්ෂාව නියම කිරීම.

**25.** (1) යම් අධිකරණයක් ඉදිරිපිට හෝ යම් කොමිෂන් සභාවක් ඉදිරිපිට වූ යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට එවැනි නඩු කටයුත්තකට පැමිණ ඊට සහභාගී වීම හේතුවෙන් ඇතිවිය හැකි හානියකින්, තර්ජනයකින්, පළිගැනීමකින්, ප්‍රතිප්‍රහාරයකින් හෝ බිය ගැන්වීමකින් ආරක්ෂාව ලැබිය යුතු බවට විශ්වාස කිරීමට ඒ අධිකරණයට හෝ කොමිෂන් සභාවට සාධාරණ හේතු පවතින විට, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, එම අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් ඒ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට එම සහාය සහ ආරක්ෂාව සැපයීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට සපයනු ලැබිය හැකි ආරක්ෂාව සහ සහාය මගින්, අදාළ වරද සම්බන්ධයෙන් සැකකරන හෝ චෝදනා ලැබ ඇති තැනැත්තාගේ අයිතිවාසිකමකට හෝ හිමිකමකට, කිසිදු අගතියක් නොවීම හෝ අදාළ අපරධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුවාගේ මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ මානව හිමිකමක් උල්ලංඝනය කිරීම නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සපයනු ලැබිය හැකි ආරක්ෂාවට සහ සහායට-

(අ) ළමයින්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා විශේෂයෙන් ගනු ලබන පියවර යොදා ගැනීම සහ අපරාධයක ළමා වින්දිතයන්ගේ හෝ ළමා සාක්ෂිකරුවන්ගේ උපරිම යහපත සහතික කිරීම ;

(ආ) අධිකරණ හෝ අර්ධ අධිකරණ සම්පූර්ණ නඩු කටයුත්ත හෝ එහි කොටසක් රහිසිගතව පැවැත්වීම;

(ඇ) නඩු විභාගය හෝ පරීක්ෂණය පවත්වන ස්ථානයේ පෙනී සිටින චූදිතයා දැකීමෙන් ඇතිවිය හැකි අනවශ්‍ය හිරිහැරවලින්, බියගැන්වීම්වලින්, බලකිරීම්වලින්,

බිඳවැටීම්වලින් හෝ බලපෑම්වලින්, අදාළ අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු වළක්වා ගැනීමට අවශ්‍ය වන්නා වූ පියවර යොදා ගැනීම;

(ඇ) අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අනන්‍යතාව සහ අදාළ පසුබිම් තොරතුරු අනාවරණය කිරීමෙන් වැළැක්වීම ; සහ

(ඉ) අදාළ චූදිතයාට සහ ඔහුගේ නීතිඥවරයාට හැර වෙනත් තැනැත්තන්ට, ඒ අපාරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ අනන්‍යතාව හෝ ඔහුගේ සම්පූර්ණ සාක්ෂිය හෝ ඉන් කොටසක්, හෙළිදරව් වීම වැළැක්වීමට සුදුසු පියවර ගැනීම. එසේ පිළිගත් පියවරවලට අදාළ අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ අනන්‍යතාවයට අදාළව තොරතුරු පළ කිරීමට, ප්‍රචාරය කිරීමට, විකාශනය කිරීමට හෝ අන්‍යාකාරයකින් පතුරුවා හැරීමට එරෙහිව මාධ්‍ය ආයතන, මාධ්‍යකරුවන් සහ වෙනත් නිශ්චිතව සඳහන් කළ තැනැත්තන්ට විධානය කිරීම සඳහා වූ බලතල,

ඇතුළත් විය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින්, තත්කාර්යය සඳහා නිකුත් කළ නිවේදයක් මගින්, ඒ නිවේදනයේ සඳහන් කරන ලද ආරක්ෂාව අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට සපයන ලෙස, අධිකාරියෙන් හෝ කොට්ඨාසයෙන් ඉල්ලා සිටිය හැකි ය. එවැනි ඉල්ලීමක් ලැබුණු විට, අවශ්‍ය යම් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු ඒ ආරක්ෂාව සැපයීම අවශ්‍ය බවට එහි මතය වන අවස්ථාවක දී, අදාළ අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට ඉල්ලා සිටින ලද ආරක්ෂාව සැපයීමට අවශ්‍ය සියලු පියවර ගැනීම, අධිකාරියේ හෝ කොට්ඨාසයේ කාර්ය විය යුතු ය.

නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් සහ රජයේ නිලධරයන් විසින් ආරක්ෂාව සැපයිය යුතු බව.

**26.** යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තකට පැමිණීමේ දී හෝ සහභාගී වීමේදී සිදුවිය හැකි යම් හානියකින්, තර්ජනයකින්, පළිගැනීමකින්, ප්‍රතිප්‍රහාරයකින් හෝ බියගැන්වීමකින් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු හට සහාය සහ ආරක්ෂාව අවශ්‍ය යැයි නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් හෝ යම් රජයේ නිලධරයකු විශ්වාස කිරීමේ දී, ඒ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය

හෝ රජයේ නිලධරයා විසින් අධිකාරියට හා කොට්ඨාසයට ඒ සම්බන්ධයෙන් වහාම නිවේදනයක් නිකුත්කළ යුතු ය.

ආරක්ෂාව සහ සහාය ලබාගන්නා අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ කාර්ය.

**27.** (1) මේ පනත යටතේ යම් සහායක් හෝ ආරක්ෂාවක් ලබා ඇති යම් අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින්-

(අ) ප්‍රදානය කරන ලද ඒ සහාය හෝ ආරක්ෂාව අනිසි ලෙස භාවිත කිරීම;

(ආ) යම් විමර්ශන නියෝජ්‍යායතනයකට, අධිකරණයකට හෝ කොමිෂන් සභාවකට ව්‍යාජ තොරතුරු හෝ සාක්ෂි සැපයීම ; හෝ

(ඇ) අදාළ සහාය හෝ ආරක්ෂාව සැපයූ අධිකාරිය, කොට්ඨාසය හෝ කොමිෂන් සභාව සමග එළඹුනු අවබෝධතා ගිවිසුමේ නියමයන්ට පටහැනිව ක්‍රියා,

නොකළ යුතු ය.

(2) අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු (1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කරන අවස්ථාවක දී, එම අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට මේ පනත යටතේ සහාය හෝ ආරක්ෂාව සැපයූ යම් නිලධරයකු හෝ අධිකාරයක් විසින් එම සහාය හෝ ආරක්ෂාව සැපයීම නවතාලිය යුතු ය.

## VII වන කොටස

## වන්දි

වන්දි.

**28.** (1) අධිකරණ සංවිධාන පනතෙහි සහ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතෙහි එරෙහිව කුමක් වුව ද, සෑම මහාධිකරණයක් සහ සෑම මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් ම වරදක් සම්බන්ධයෙන් ඒ අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට, එම වරදකරු කිරීමෙන් අනතුරුව ඒ තැනැත්තා වෙත පනවනු ලැබිය හැකි යම් දණ්ඩනයකට අමතරව,

(අ) (i) වන්දියක් ලෙස අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු වෙත ගෙවිය යුතු රුපියල් මිලියනයකට නොවැඩි මුදලක් ; හෝ

(ii) ඒ වරද සඳහා ගෙවිය යුතු උපරිම දඩ මුදලින් සියයට විස්සකට නොවැඩි මුදල් ප්‍රමාණයක් ; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් වන්දි මුදල සහ ගෙවිය යුතු උපරිම දඩ මුදල යන දෙකම,

අධිකරණයට ගෙවීමට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ පනවනු ලැබිය හැකි වන්දි ප්‍රමාණය පිළිබඳ තීරණයකට පැමිණීමට පොරාතුව, මහාධිකරණය විසින් හෝ මහේස්ත්‍රාත් අධිකරණය විසින්-

(අ) වරදකරු වූ තැනැත්තා විසින් සිදුකළ වරදට යටත් වීමේ ප්‍රතිඵලයක් ලෙස අපරාධයක වින්දිතයකුට විඳීමට සිදු වී ඇති අලාභයේ, පාඩුවේ හෝ හානියේ ස්වභාවය සහ ප්‍රමාණය නිශ්චය කිරීමට අධිකරණයට හැකි වන පරිදි, ඒ වින්දිතයා පරීක්ෂා කරනු ලැබූ රජයේ වෛද්‍ය නිලධරයාගේ වාර්තාව ඇතුළුව වින්දිතයාට අදාළ සියලු තොරතුරු ;

(ආ) වින්දිතයාට අපරාධයෙන් සිදු වූ අපරාධයේ බලපෑම පිළිබඳව අපරාධයක වින්දිතයා විසින් හෝ ඔහුගේ නීති නියෝජිතයා විසින් කරන ලද නියෝජයන් හෝ ඉදිරිපත් කිරීම ; සහ

(ඇ) යම් අධිකරණයක් විසින්, අධිකාරිය විසින් හෝ වෙනත් යම් ප්‍රභවයකින් ඒ වින්දිතයාට දැනටමත් ගෙවනු ලැබ තිබිය හැකි අන්‍යාකාරයකින් ඔහුට ලැබුණු යම් වන්දි මුදලකට අදාළ වන්නා වූ තොරතුරු,

ගෙන්වා, එම තොරතුරු පරීක්ෂා කර සළකා බැලිය යුතු ය.

(3) මහාධිකරණයේ මුලසුන දරන විනිශ්චයකාරවරයා හෝ මහේස්ත්‍රාත්වරයා විසින්-

(අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (1) වන අනුඡේදය යටතේ වන්දියක් ලෙස ගෙවන ලද මුදල අපරාධයක වින්දිතයාට හෝ ඔහුගේ යැපෙන්නාට හෝ ළඟම ඥාතියකුට ප්‍රේෂණය කළ යුතු ය ;

(ආ) (1) වන උපවගන්තියේ (අ) ඡෙදයේ (ii) වන අනුඡේදය යටතේ ගෙවා ඇති මුදල මේ පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදලට, ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය ;

(ඇ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගෙවන ලද මුදල, මෙම උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් අනුරූපිත ආකාරයට ප්‍රේෂණය කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද යම් ගෙවීමක් සිදු කිරීමට වරදකරු කරනු ලැබූ තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක දී, මහාධිකරණයේ මුලසුන දරන විනිශ්චයකාරවරයා හෝ මහේස්ත්‍රාත්වරයා විසින්, ඒ මුදල් ගෙවීම පැහැර හැරීම වෙනුවට, වරදකරු විසින් විඳීමට අවශ්‍ය පැහැර හැරීම සඳහා වූ බන්ධනාගාරගත කිරීමේ කාලයක් නිශ්චයකර, ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, (1) වන උපවගන්තිය යටතේ පනවන ලද ගෙවීමක් සිදු කිරීමට අවශ්‍ය මූල්‍ය සම්පත් වරදකරු කරනු ලැබූ තැනැත්තා හට නොමැති බවට මහාධිකරණයේ මුලසුන දරන විනිශ්චයකාරවරයා හෝ මහේස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂණයකින් පසු සෑහීමකට පත්වන අවස්ථාවක දී, ඒ මුලසුන දරන විනිශ්චයකාරවරයා හෝ මහේස්ත්‍රාත්වරයා විසින්, ප්‍රජා පාදක විශෝධන ආඥාවක් කළ යුතු අතර, එවැනි ආඥාවක් කළ අවස්ථාවක දී, 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනතේ අඩංගු ප්‍රජා පාදක විශෝධන ආඥාවකට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ආඥාව සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනු ඡේදය යටතේ අපරාධයක වින්දිතයකු විසින් වන්දි ලබාගැනීම, ඒ වින්දිතයා විසින් යම් සිවිල් නඩු කටයුත්තක දී අලාභ ඉල්ලා සිටීමකට ඉන් අගතියක් නොවිය යුතු වුව ද, ප්‍රදානය කළ යුතු අලාභය නිගමනය කිරීමේ දී ඒ සිවිල් අධිකරණය විසින්, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ ඒ වින්දිතයා විසින් ලැබූ වන්දි මුදල සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහයක සහ ආරක්ෂණ අරමුදල.

**29.** (1) (මෙහි මින්මතු ''ආරක්ෂණ අරමුදල'' යනුවෙන් හඳුන්වනු ලබන) වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් තිබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් ආරක්ෂණ අරමුදල පරිපාලනය සහ කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(3) ආරක්ෂණ අරමුදලට-

(අ) ඒ අරමුදල සඳහා පාර්ලිමේන්තුවෙන් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ගෙවනු ලැබිය යුතු ය :

(ආ) යම් දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ත්‍යාග, පරිත්‍යාග, ආධාරක මුදල්, රික්තවරණ සහ ප්‍රදාන වශයෙන් ආරක්ෂණ අරමුදලට ප්‍රේෂණය කිරීම සඳහා අධිකාරියට ලැබිය හැකි සියලු මුදල් ගෙවනු ලැබිය යුතු ය ; සහ

(ඇ) මේ පනතේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ අධිකරණයක් විසින් ප්‍රේෂණය කරනු ලබන සියලු මුදල් ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද දඩ මුදලක ආකාරයෙන් අධිකරණයක් විසින් එකතු කරනු ලබන යම් මුදලක්, ආරක්ෂණ අරමුදලට ප්‍රේෂණය නොකළ යුතු ය.

(4) පහත දැක්වෙන ගෙවීම් සඳහා මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ආරක්ෂණ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) අපරාධයක වින්දිතයකු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් විඳින්නට සිදු වූ කායික හෝ මානසික හානි හෝ දේපලවලට වූ පාඩු හෝ අලාභ වෙනුවෙන් අපරාධයක වින්දිතයකුට ගෙවන වන්දි ;

(ආ) අපරාධයක වින්දිතයකු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මියගොස් හෝ කායිකව හෝ මානසිකව අශක්නුතාවට පත්ව ඇති, අපරාධයක වින්දිතයකු මත යැපෙන පවුලේ සාමාජිකයන්ට, ලඟම ඥාතීන්ට සහ වෙනත් යම් තැනැත්තන්ට යැපීම සඳහා ගෙවන වන්දි.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා ආරක්ෂණ අරමුදලේ ප්‍රධාන විගණන නිලධරයා විය යුතු අතර, ඔහු විසින් ඒ අරමුදලේ ආදායම් සහ වියදම් හා වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි ගිණුම් තැබීමට සලස්වනු ලැබිය යුතු ය.

(6) ආරක්ෂණ අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

වන්දි සහ සහාය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට ඇති හිමිකම.

**30.** (1) (අ) අපරාධයක වින්දිතයකු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් විඳීමට සිදු වූ කායික හෝ මානසික හිංසා හෝ දුබලතා හෝ දේපලවලට සිදු වූ පාඩු හෝ අලාභ සම්බන්ධයෙන් වන්දි ගෙවීම සඳහා ; සහ

(ආ) අපරාධයක වින්දිතයකු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපරාධයක වින්දිතයකුට විඳීමට සිදු වූ යම් කායික හෝ මානසික හිංසා හෝ දුබලතා සම්බන්ධයෙන් වෛද්‍ය ප්‍රතිකාර හෝ පුනරුත්ථාපන හෝ උපදේශන සේවා ලබා ගැනීමට අවශ්‍ය කරන මුදල් ගෙවීම සඳහා,

අධිකාරියට ඉල්ලුම් කිරීමට, අපරාධයක වින්දිතයකුට හිමිකමක් ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන අපරාධයක වින්දිතයකුහට වන්දි මුදලක් ගෙවනු ලැබිය යුතු ද යන්න තීරණය කිරීමේ දී, අධිකාරිය විසින්, 28 වන වගන්තිය යටතේ වන්දි මුදලක්

ලෙස එම අපරාධයක වින්දිතයා විසින් දැනටමත් ලබාගෙන ඇති හෝ යම් අධිකරණයක් මගින් කරන ලද නියමයක් මත ඔහුට ලැබුන හෝ වෙනත් යම් මූලාශ්‍රයකින් අන්‍යාකාරයකින් ඔහුට ලැබුන මුදල් පිළිබඳව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) අධිකරණයක් විසින් අපරාධයක වින්දිතයකුට වන්දියක් ගෙවීමට තීන්දු කිරීමට පෙර, (1) වන උපවගන්තිය යටතේ ඒ අපරාධයක වින්දිතයකුට යම් වන්දියක් හෝ වියදමක් ගෙවා ඇති විට, (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් කර ඇති ඒ ගෙවීම්, අධිකරණය විසින් වන්දියක් ගෙවන තුරු, අපරාධයක වින්දිතයාට ප්‍රදානය කරනු ලබන තාවකාලික සහනයක් ලෙස සැළකිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අපරාධයක වින්දිතයකුට වන්දියක් සහ යම් වියදමක් ප්‍රදානය කිරීමේ දී, තත්කාර්යය සඳහා සාදනු ලැබිය හැකි යම් නියෝගවල අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

VIII වන කොටස

**ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක මගින් සාක්ෂි දීම**

සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක මගින් සාක්ෂි හෝ ප්‍රකාශ සටහන් කිරීම.

31. (1) හඳුනාගැනීමේ පෙරට්ටුවක්, ළඟු නොවන පරීක්ෂණයක් හෝ වෙනත් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් පවත්වන අධිකරණයක් හෝ විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පවත්වන කොමිෂන් සභාවක් හෝ විමර්ශනයක් පවත්වන නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් යුක්තිය පසිඳලීමේ යහපත උදෙසා හෝ-

(අ) අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ආරක්ෂාව ලබා දීමේ පියවරක් ලෙස හෝ ;

(ආ) කඩිනමින් සාක්ෂි ලබාගැනීම සඳහා,

අවශ්‍ය වන්නේ නම් සහ අපරාධයේ වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ උපරිම යහපත සැලකිල්ලට ගෙන අධිකරණය හෝ කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය සහ ශ්‍රී ලංකාව තුළ (මෙහි මින් මතු “දුරස්ථ ස්ථානය” යනුවෙන් සඳහන් කරනු ලබන) එම තැනැත්තා සාක්ෂි දෙන හෝ ප්‍රකාශය කරන වෙනත් ඕනෑම

ස්ථානයක් අතර සමකාලීන හෝ අත්‍යාසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධයක් තහවුරු කරගත හැකි වන්නා වූ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රමයක් මගින්, ඒ අධිකරණය, කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය ඉදිරියේ පෞද්ගලිකව පෙනී සිටීමෙන් තොරව, ඒ තැනැත්තාගේ සාක්ෂිය හෝ ප්‍රකාශය ලබා ගැනීම කළ හැකි ය.

(2) 32 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අධිකරණය, කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින්, (1) වන උපවගන්තිය ප්‍රකාරව, සාක්ෂිය හෝ ප්‍රකාශය ලබා ගැනීමට හෝ වාර්තාගත කිරීමට පෙර අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බාධකය තාක්ෂණික වශයෙන් නිවැරිදි බවටත්, ඒ මත විශ්වාසය තැබිය හැකි බවටත් ඒ අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු සාක්ෂි දීමට හෝ ප්‍රකාශය කිරීමට බලාපොරොත්තු වන අවස්ථාවක, අදාළ අධිකරණය, කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් නම් කරනු ලබන අධිකරණ නිලධරයකු හෝ රජයේ නිලධරයකු අදාළ ස්ථානයේ සිටින බවටත් සෑහීමට පත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නම්කර ඇති දුරස්ථ ස්ථානයේ සිට අපරාධයක වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ සාක්ෂිය හෝ අදාල ප්‍රකාශය ලබා ගැනීම හෝ වාර්තා ගත කිරීම ආරම්භ කිරීමට පෙර, අදාළ අධිකරණය, කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් නීතිපතිවරයාගේ ද, අමාත්‍යාවරයාගේ ද, අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද, නිර්දේශය මත සහ 32 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බාධකය සවි කිරීම සහ ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය මුල්‍ය හා වෙනත් සම්පත් අධිකාරියෙන් ලබාගත හැකි ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "අධිකරණය" යන්නෙන් අපරාධ නඩු පවත්වන්නා වූ අධිකරණයක් අදහස් වේ.

ඇතැම් අවස්ථානුගත කරුණුවල දී 31 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් සහාය දීම අවශ්‍ය නොවන බව.

**32.** (1) (අ) 31 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හඳුනාගත් දුරස්ථ ස්ථානයේ සිට -

(i) අපරාධයක වින්දිතයාගෙන් හෝ සාක්ෂිකරුවාගෙන් සාක්ෂි හෝ ප්‍රකාශ ලබා ගැනීම ජාතික ආරක්ෂාව ඇතුළුව ජාතික යහපත උදෙසා ප්‍රයෝජනවත් නොවන බවට ; හෝ

(ii) අදාළ අපරාධයේ වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ සාක්ෂිය හෝ ප්‍රකාශය ලබා ගැනීම පහසු නොවන බවට, නීතිපතිවරයා සහ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිර්දේශ කරන අවස්ථාවක, නීතිපතිවරයා විසින් තම මතය අදාළ අධිකරණය, කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය වෙත දැනුම් දිය යුතු ය.

(ආ) වෙනත් යම් උචිත විකල්ප දුරස්ථ ස්ථානයක සිට එම සාක්ෂි හෝ ප්‍රකාශය ලබා ගැනීම යුක්තිය පසිඳලීමේ යහපත උදෙසා වන බවට නීතිපතිවරයාගේ මතය වන අවස්ථාවක, නීතිපතිවරයා විසින් එම විකල්ප ස්ථානය අදාළ අධිකරණය, කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(2) (අ) යම් විශේෂිත දුරස්ථ ස්ථානයක සිට අපරාධයක වින්දිතයකුගෙන් හෝ සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි වාර්තාගත කිරීම හෝ ප්‍රකාශ ලබාගැනීම නුසුදුසු බවට නීතිපතිවරයාගේ මතය ප්‍රකාශ කර ඇති අවස්ථාවක, එම දුරස්ථ ස්ථානයේ සිට සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බාධකය හරහා අදාළ අපරාධයේ වින්දිතයාගෙන් හෝ සාක්ෂිකරුගෙන් සාක්ෂි හෝ ප්‍රකාශ ලබා ගැනීමට හෝ වාර්තාගත කිරීමට අදාළ අධිකරණය, කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය කටයුතු නොකළ යුතු අතර, ඒ අනුව 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අධිකරණය, කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය වෙත, අධිකාරිය විසින් යම් අවශ්‍ය සහයක් ලබාදීම හෝ මූල්‍ය හෝ වෙනත් සම්පත් ලබාදීම අවශ්‍ය නොවන්නේ ය.

(ආ) අදාළ දුරස්ථ ස්ථානය (1) වන උපවගන්තිය යටතේ නීතිපතිවරයා විසින් නිර්දේශ කරන ලද ස්ථානය දක්වා වෙනස් කිරීමට අධිකරණය, කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය තීරණය කරන අවස්ථාවක, එම අධිකරණය, කොමිෂන් සභාව හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය විසින් 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අධිකාරියේ සහාය ලබා ගැනීමට කටයුතු කළ හැකි ය.

**33.** (1) 31 වන වගන්තියේ විධිවිධාන යටතේ අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ සාක්ෂි වාර්තාගත කිරීමට අදහස් කරන අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින් මුලින් සාක්ෂිය වාර්තාගත කර ගැනීමට කටයුතු සලස්වා, එම ප්‍රකාශය නීතිපතිවරයාට ද, අපරාධයේ වින්දිතයාට හෝ සාක්ෂිකරුට ද එම ප්‍රකාශයෙන් තම නෛතික අයිතිවාසිකම්වලට බලපෑමක් සිදුවන යම් තැනැත්තකුට හෝ ඔහුගේ නීති නියෝජිතයාට ද ලබාදීමට සැලැස්විය යුතු අතර, අදාළ අපරාධයේ වින්දිතයාගේ හෝ සාක්ෂිකරුගේ සාක්ෂිය වාර්තාගත කිරීමට නියමිත දිනයට දින තිහකට නොඅඩු කාලයක් සඳහා වූ නිවේදනයක් ද, අදාළ සියලු පාර්ශ්වයන්ට ලබාදිය යුතු ය. සාක්ෂි හෝ ප්‍රකාශ වාර්තාගත කිරීමේ කාර්ය පටිපාටිය.

(2) අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු සාක්ෂි දීමට හෝ ප්‍රකාශය කිරීමට යෝජිත අදාළ දුරස්ථ ස්ථානයට පැමිණ සිටිය යුතු බවට 31 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් විසින් නම් කරනු ලබන අධිකරණ නිලධරයකු හෝ තැනැත්තකු විසින්, අදාළ අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු සහ වෙනත් අදාළ තැනැත්තකුගෙන් අවශ්‍ය අවස්ථාවල දී කරුණු විමසා, ඔහුගේ නිර්දේශ ඉදිරිපත් කළ යුතු අතර, නියම කළ යුතු යැයි නියමිත කරුණු සම්බන්ධයෙන් අධිකරණය හෝ කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාව සහ එම අධිකරණය හෝ කොමිෂන් සභාව ඉදිරිපිට ඇති වෙනත් අදාළ දේ එම අධිකරණය හෝ කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් පසු, එම සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකය හරහා දෙන ලද සාක්ෂි හෝ ප්‍රකාශ භාර ගැනීම යුක්තිය පසිඳලීමේ යහපත පිණිස වන්නේ ද සහ වාර්තාගත කරන ලද එම සාක්ෂි හෝ ප්‍රකාශය ආවේශ්‍ය කළ හැකි ද සහ භාවිත කළ හැකි ද යන කරුණු පිළිබඳව එම අධිකරණය හෝ කොමිෂන් සභාව තීරණයකට එළඹිය යුතු ය.

**34.** මේ පනතේ මේ කොටසේ විධිවිධාන මගින් තත්කාර්ය සඳහා පනවා ඇති නියමයන්ට අනුකූලව මිස, කිසිදු අධිකරණයක්, කොමිෂන් සභාවක් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින්, සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බාධකයක් හරහා අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ සාක්ෂි හෝ ප්‍රකාශ ලබා ගැනීම හෝ වාර්තාගත කිරීම නොකළ යුතු ය. ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බාධක හරහා සාක්ෂි ලබා ගැනීම හෝ වාර්තාගත කිරීම මේ කොටසට අනුකූලව සිදු විය යුතු බව.

## IX වන කොටස

### සාමාන්‍ය

කාර්ය ඉටුකිරීම ආදියේ දී මැදිහත් වීම.

**35.** මේ පනත යටතේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී යම් අධිකරණයකට, කොමිෂන් සභාවකට, අධිකාරියකට, මණ්ඩලයකට, කොට්ඨාසයකට හෝ යම් රාජ්‍ය හෝ අධිකරණ නිලධරයකුගේ කටයුත්තකට නීත්‍යානුකූල අවසරයක් නොමැතිව මැදිහත් වන හෝ බාධා කරන, නැතහොත් මැදිහත්වීමට හෝ බාධා කිරීමට උත්සාහ කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

රහස්‍ය භාවය.

**36.** (1) මේ පනතේ විධිවිධානවලට බලාත්මක භාවයක් දීමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නේ නම් මිස, අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු මේ පනත යටතේ සහාය හෝ ආරක්ෂාව ලබන බවට හෝ ලබා ඇති බවට හෙළිදරව් කිරීමට කිසිම තැනැත්තකුට බලපෑමක් නොකළ යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලට බලාත්මක භාවයක් දීමේ හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට අනුකූල වීමේ කාර්යය සඳහා හැර, කිසිදු තැනැත්තකු විසින්, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු මේ පනත යටතේ සහාය හෝ ආරක්ෂාව ලබන බවට හෝ ලබා ඇති බවට වෙනත් යම් තැනැත්තකුට හෙළි දරව් නොකළ යුතු ය.

සාක්ෂිවල විශ්වාසනීයත්වය පිළිබඳව තක්සේරුව.

**37.** යම් අධිකරණයක දී හෝ කොමිෂන් සභාවක දී, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු විසින් දෙන ලද සාක්ෂියක විශ්වාසනීයත්වය තක්සේරු කිරීමේ දී, මේ පනත යටතේ ඒ අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරු යම් සහයක් හෝ ආරක්ෂාවක් ලබන බවට හෝ ලබා ඇති බවට වූ කාරණාව නිර්ණායකයක් නොවිය යුතු ය.

**38.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

මේ පනතේ විධිවිධාන වෙනත් නීති අභිබවා ක්‍රියාත්මක විය යුතු බව.

**39.** (1) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ අරමුදලේ සහ ආරක්ෂණ අරමුදලේ ගිණුම් විගණනය කිරීමට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ගිණුම් විගණනය.

(2) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (1) වන උපවගන්තියේ සඳහන් අරමුදල්වල ගිණුම් සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

**40.** (1) අධිකාරියේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ ද, ඒ නිලධරයා සේවයේ නියුක්ත කර ඇත්තේ යම් අමාත්‍යාංශ ලේකම්වරයකු විසින් හෝ යටතේ ද, එම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් සඳහා, අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත්කිරීම.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ නිලධරයන් රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**41.** මණ්ඩලයේ සාමාජිකයන්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අධිකාරියේ වෙනත් නිලධරයන් සහ සේවා නියුක්තිකයන්, උපදේශන කොමිෂන් සභාවේ සාමාජිකයන්, අධිකාරිය මගින් පත්කළ උපදේශකවරුන් සහ උපදෙස් දෙන්නන් පිළිවෙලින් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ සහ දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යන් සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**42.** අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩලවලට එරෙහිව නඩු.

**43.** මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී-

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක් නම් එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ප්‍රධාන විධායක නිලධරයකු හා ලේකම්වරයකු ද ;

(ආ) එම පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම්, එම හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම සහ එහි ප්‍රධාන විධායක නිලධරයා ද ;

(ඇ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක් නම් එම පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයකුම සහ එහි ප්‍රධාන විධායක නිලධරයා ද ;

(ඇ) එම පුද්ගල මණ්ඩලය පළාත් පාලන අධිකාරියක් නම් හෝ පළාත් පාලන අධිකාරියක් වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා පළාත් පාලන අධිකාරියට අදාළ යම් නීතියක් යටතේ පත් කරන ලද වෙනත් යම් අධිකාරියක් නම්, එම පළාත් පාලන ආයතනයේ හෝ අධිකාරියේ සභාපතිවරයා ද,

එම වරදට වරදකරු විය යුතු ය :

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, යම් සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ප්‍රධාන විධායක නිලධරයකු සහ ලේකම්වරයකු හෝ යම් සමාගමක සෑම හවුල්කරුවකුම සහ ප්‍රධාන විධායක නිලධරයා ද නැතහොත් සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක සෑම සාමාජිකයකුම සහ ප්‍රධාන විධායක නිලධරයා හෝ පළාත් පාලන ආයතනයක සභාපතිවරයා ද එම වරද සිදු කරනු ලැබුවේ තමාගේ අනුදැනුම නොමැතිව බවට හෝ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවට අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන්නේ නම්, එම තැනැත්තා මේ වගන්තිය යටතේ වූ වරදකට වරදකරු නොවන්නේ ය.

**44.** (1) අමාත්‍යවරයා විසින් අධිකාරියේ නිර්දේශය මත, මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම පිණිස විධිවිධාන සැලසීම අවශ්‍ය වියහැකි යම් කාරණා සම්බන්ධයෙන් සහ නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයේ සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ බලාත්මක විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද සියලු නියෝග ඒවා ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) නියෝග පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පලකරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**45.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**46.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි :–

"අපරාධයක ළමා වින්දිතයා" සහ "ළමා සාක්ෂිකරු" යන්නෙන්, පිළිවෙලින් වයස අවුරුදු දහඅටට අඩු, අපරාධයක වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු අදහස් වේ ;

"අපරාධ නඩු විධාන සංග්‍රහ පනත" යන්නෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත අදහස් වේ ;

"කොමිෂන් සභාව යන්නෙන්" -

(අ) (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කළ පරීක්ෂණ කොමිෂන් සභාවක් ;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ජනාධිපති විශේෂ පරීක්ෂණ කොමිෂන් සභාව ;

(ඇ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ විමර්ශන කිරීමේ කොමිෂන් සභාව ; සහ

(ඈ) 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,

අදහස් වේ.

"නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය" යන්නෙන්, වරදක් සිදු කිරීම පිළිබඳ විමර්ශනය කිරීමට යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ බලය දුන් යම් ව්‍යවස්ථාපිත අධිකාරියක්, රජයේ නිලධරයෙක් හෝ වෙනත් යම් තැනැත්තෙක් අදහස් වේ ;

"අධිකරණ සංවිධාන පනත" යන්නෙන්, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත අදහස් වේ.

"අපරාධයක වින්දිතයා" යන්නෙන්, ළමා වින්දිතයකු ඇතුළුව,

(අ) යම් නීතියක් යටතේ උද්දේශික වරදක් සංයුක්ත වන්නා වූ ; හෝ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව හෝ 13 (1) හෝ (2) වන ව්‍යවස්ථා යටතේ සුරක්ෂිත කොට ඇති මූලික අයිතිවාසිකමක්, උද්දේශිත උල්ලංඝනය කිරීමක් සංයුක්ත වන්නා වූ ද,

යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් ලෙස යම් කායික හෝ මානසික, චිත්තාවේගී, ආර්ථික හෝ වෙනත් අලාභයක් වන්නා වූ යම් හිංසාවක්, හානියක්, දුබලතාවයක් හෝ ආබාධයක් අත්විඳින තැනැත්තකු අදහස් වන අතර, ඒ තැනැත්තාට සහාය වීමේ දී හෝ වරදක් සිදු කිරීම වැළැක්වීමේ දී මැදිහත් වීමේ ප්‍රතිඵලයක් ලෙස හානියක් විඳින තැනැත්තකු සහ අපරාධයක ළමා වින්දිතයකුගේ මව්පියන් හෝ භාරකරු සහ එම තැනැත්තාගේ පවුලේ සාමාජිකයකු සහ ලඟම ඥාතීන්, යැපෙන්නන් සහ ඒ තැනැත්තාට සුවිශේෂී වටිනාකමක් ඇති වෙනත් තැනැත්තකු ද, ඇතුළත් වේ.

"සාක්ෂිකරුවකු " යන්නෙන්,

(අ) නීතිය බලාත්මක කිරීමේ නිලධරයකු වෙත තොරතුරු සපයා හෝ පැමිණිල්ලක් කර, ඒ තොරතුරු හෝ පැමිණිල්ල පදනම් කරගෙන යම් උද්දේශිත වරදක් සිදු කිරීම හෝ මූලික අයිතිවාසිකමක් කඩවීම හෝ මානව හිමිකමක් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ආරම්භ කළ හැකි හෝ ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට යන විමර්ශනයක දී හෝ පරීක්ෂණයක දී, එසේ එම තොරතුරු සපයා ඇති හෝ පැමිණිල්ල කර ඇති තැනැත්තකු ;

(ආ) යම් උද්දේශිත වරදක් සිදුකිරීම හෝ මූලික අයිතිවාසිකමක් කඩකිරීම හෝ මානව හිමිකමක් උල්ලංඝනය කිරීම

පිළිබඳව නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් පවත්වනු ලබන යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් අතරතුර දී, තොරතුරු සපයා ඇති හෝ තමා ප්‍රශ්න කිරීම සම්බන්ධයෙන් වූ කාරණා ඇතුළත් ප්‍රකාශයක් කර ඇති තැනැත්තකු ;

(ඇ) අපරාධයක වින්දිතයකු විසින් කර ඇති පැමිණිල්ලක් හෝ පනවා ඇති නඩු කටයුත්තකට සහාය වීමක් වශයෙන් යම් දිවුරුම් පෙත්සමක් සපයා ඇති හෝ ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති තැනැත්තකු ;

(ඈ) කොමිෂන් සභාවකට තොරතුරු හෝ නිවේදනයන් සපයා ඇති නැතැත්තකු ;

(ඉ) නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකට හෝ කොමිෂන් සභාවකට සපයන ලද තොරතුරු හෝ කරන ලද ප්‍රකාශයන් මුල් කරගෙන යම් තැනැත්තකුට එරෙහි වූ යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී ප්‍රකාශයක් කිරීමට හෝ සාක්ෂි දීමට එම අධිකරණය විසින් හෝ කොමිෂන් සභාව විසින් එම තොරතුරු සැපයූ හෝ ප්‍රකාශය කළ තැනැත්තා කැඳවන බවට, සාධාරණ හේතු මත ඔහු විශ්වාස කරන්නේ නම් ඒ යම් තැනැත්තකු ;

(ඊ) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට පැවැත්වෙන යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී, ප්‍රකාශයන් කිරීමට, සාක්ෂි දීමට හෝ යම් ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට එම අධිකරණයෙන් හෝ කොමිෂන් සභාවෙන් සිතාසියක් ලැබූ තැනැත්තකු ; හෝ

(උ) යම් උද්දේශිත වරදක් සිදුකිරීම හෝ යම් උද්දේශිත මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ මානව හිමිකමක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කර ඇති රජයේ නිලධරයකු,

අදහස් වන අතර, අපරාධයක වින්දිතයකු, ළමා සාක්ෂිකරුවකු, ළමා සාක්ෂිකරුගේ මව්පියන් හෝ භාරකරුවකු, එවැනි සාක්ෂිකරුවකුගේ පවුලේ සාමාජිකයෙක් හෝ යැපෙන්නෙක් හෝ ඒ තැනැත්තාට සුවිශේෂී වැදගත්කමක් ඇති වෙනත් යම් තැනැත්තකු,

විශේෂඥ සාක්ෂිකරුවකු සහ උද්දේශිත වරදක් කරන ලද බවට හෝ උද්දේශිත මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ මානව හිමිකමක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සැක කරන හෝ චෝදනා ලත් තැනැත්තකු වෙනුවෙන් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට සාක්ෂිදීම සඳහා කැඳවනු ලැබ ඇති තැනැත්තකු ද, අදහස් වේ.

‘‘ලිඛිත සන්නිවේදන’’ යන්නෙන් සාමාන්‍ය, ලියාපදිංචි තැපෑල, ෆැක්ස් සහ විද්‍යුත් තැපෑල වැනි කවර හෝ මාධ්‍යයක් හරහා යවනු ලබන ලිපියක් අදහස් වේ.

# 54 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත

උපලේඛනය [11 (3) වගන්තිය]

1. යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත් ;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකු වීම නැවතී ඇත්නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ, සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ අඛණ්ඩව කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු වන්නේ ය.

2. මණ්ඩලයේ සෑම පත්කළ සාමාජිකයකු ම, මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම මගින් කලින් ඔහුගේ ධුරය හිස් කර ඇත්නම් මිස ඔහු පත්කළ දින සිට වසර තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත්කර ඇත්නම් මිස, නැවත පත්කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

එසේ වුව ද, මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ධුරය හිස්කර ඇති සාමාජිකයකු වෙනුවට පත්කළ සාමාජිකයකු, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

3. මණ්ඩලයට පත්කළ සාමාජිකයකු, ස්වකීය කාර්යන් විෂමාචාර ආකාරයෙන් සිදු කිරීම නිසා හෝ වංක හෝ වංචනික භාවයට සම්බන්ධ වරදක් සඳහා එවැනි සාමාජිකයකු වරදකරු වූ විටක දී, 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඒ පත්කළ සාමාජිකයා පත්කිරීම සඳහා විමසීමට අවශ්‍ය කරන ඒ තැනැත්තන් විමසා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ඉවත් කරනු ලබන පත්කළ සාමාජිකයකු ඒ නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට හෝ ඉන් පසු, ධුරය දැරීම අවසන් කළ යුතු ය.

4. මණ්ඩලයේ පත්කළ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එසේ එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගත් දින සිට බලපැවැත්විය යුතු ය.

**5.** මණ්ඩලයේ පත්කළ සාමාජිකයකුගේ ධුරය, මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා හිස් වන අවස්ථාවක දී, 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ තැනැත්තා වෙනුවට අනුප්‍රාප්ත වීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එම සාමාජිකයා වෙනුවට එසේ පත්කළ යම් තැනැත්තකු ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

**6.** මණ්ඩලයේ පත්කළ සාමාජිකයකුට අසනීපයක්, අශක්නුතාවයක් හෝ මාස තුනකට නොඅඩු කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම යන හේතු මත තාවකාලිකව ස්වකීය කාර්යන් ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ඒ නොහැකියාව පිළිබඳව පත්කිරීමේ අධිකාරිය වෙත ලිඛිතව දැනුම් දීම ඒ සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. එවිට 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගැනීමෙන් පසු, ඒ කාලය තුළ දී ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය.

**7.** මණ්ඩලයේ සාමාජිකයන්ට අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් පාරිශ්‍රමික, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

**8.** (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටීනම්, මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගෙන් එක් අයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වූ සණ පූරණය, සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය.

(3) මණ්ඩලයේ මුලසුන දරන තැනැත්තාට, ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(4) මේ ඡේදයේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය හෝ කොමිෂන් සභාව විසින් ඒ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යෑම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

**9.** මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ ක්‍රියා පටිපාටියක් එහි යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් පත්කළ සාමාජිකයකුගේ පත්වීම සම්බන්ධයෙන් වූ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් නිර්බල වන්නාක් සේ නොසැලකිය යුතු ය.

**10.** (1) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලය විසින් නිශ්චිය කොට සකස්කර ගනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ මුද්‍රාව කළින් කළ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය.

(3) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලයේ අනුමතය ඇතිව සහ තමන් පැමිණ සිටින බවට සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කළයුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර, කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(4) මණ්ඩලය විසින් මුද්‍රාව තබා ඇති සාධන පත්‍ර සහ ලේඛනවල රෙජිස්ටරයක්, පවත්වාගෙන යා යුතු ය.

11. (1) මණ්ඩලයේ සභාපතිවරයාට, අසනීපයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුව නිසා තාවකාලිකව ස්වකීය ධුරයේ කටයුතු ඉටුකිරීමට නොහැකිව ඇත්නම්, 11 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු වෙනුවට කටයුතු කිරීමට මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත්කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් මණ්ඩලයේ සභාපතිවරයාට සිය සභාපති ධුරයෙන් ඕනෑම අවස්ථාවක දී ඉල්ලා අස්විය හැකි ය. අමාත්‍යවරයා විසින් එය ලිඛිතව පිළිගැනීමෙන් පසු ඒ ඉල්ලා අස්වීම බලපැවැත්විය යුතු ය.

# 2017 අංක 27 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2017 නොවැම්බර් මස 17 වන දින]

එල්.ඩී.— ඕ. 48/2016

**2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2017 අංක 27 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2015 අංක 4 දරන පනතේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "ශ්‍රී ලංකාව තුළ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

> "(1අ) (1) වන උපවගන්තිය යටතේ යම් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් සාක්ෂියක් හෝ ප්‍රකාශයක් ශ්‍රී ලංකාවෙන් පිටත යම් දුරස්ථ ස්ථානයක දී ලබා ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු සාක්ෂි දීමට හෝ ප්‍රකාශය කිරීමට බලාපොරොත්තු වන්නා වූ රටෙහි ශ්‍රී ලංකා රජයේ දූත මණ්ඩල කාර්යාලයේ දී එය වාර්තාගත කරනු ලැබිය යුතු ය." ; සහ

(3) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

2—PL 005338 -2862 (2017/07)

"(4) මේ වගන්තියේ කාර්ය සඳහා —

(අ) "අධිකරණය" යන්නෙන්, අපරාධ නඩු කටයුතු පවත්වන්නා වූ අධිකරණයක් අදහස් වේ ; සහ

(ආ) "රජයේ නිලධරයා" යන්නට, ශ්‍රී ලංකා විදේශ සේවයේ සේවය කරන නිලධරයෙක් ද ඇතුළත් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## ආදි විද්‍යාර්ථී සංසද

- කැලණිය විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය
- විද්‍යා පීඨ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය
- කැලණිය වෛද්‍ය පීඨ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය
- ආර්ථික විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය
- පුස්තකාල හා විඥාපන විද්‍යා ආදී විද්‍යාර්ථීන්ගේ සංගමය
- ජනසන්නිවේදන ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය
- ගණකාධිකරණ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය
- අලෙවි කළමනාකරණ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය

## කැලණිය විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය

කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය (AAUOK) 1986 වර්ෂයේදී ආදි විද්‍යාර්ථීන් සුළු පිරිසකගේ සහභාගිත්වයෙන් නිල වශයෙන් ආරම්භ කරන ලදි. වර්තමානයේ එහි සාමාජිකත්වය 3000ට අධික ය. දිස්ත්‍රික් සහ පලාත් ශාඛා කිහිපයක් ද පිහිටුවා ඇත. රජයේ ගැසට් නිවේදනයක් මගින් ලියාපදිංචි කරන ලද සංගමයකි. ශ්‍රී ලංකා සමාජවාදි ප්‍රජාතන්ත්‍රවාදි ජනරජය සහ විශ්වවිද්‍යාල පරිපාලනය විසින් පිළිගනු ලැබූ සංගමයකි. වස 38කට පෙර ආරම්භ කළ සංගමය ලබා ගත් සාර්ථකත්වය ගැන අපි නිහතමානීව සතුටු වෙමු. කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය සිය සාමාජික ප්‍රජාව සමග පමණක් නො ව විශ්වවිද්‍යාලයීය වත්මන් ශිෂ්‍ය ප්‍රජාව සමඟ ද සමීප ව කටයුතු කරයි.

පවුලේ මූල්‍ය තත්ත්වය සහ ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයේ සතුටුදායක මට්ටම සලකා බලා කුශලතා පදනම මත තෝරා ගන්නා උපාධි අපේක්ෂකයින්ට අධ්‍යයන කටයුතු සාර්ථක ව කරගෙන යාමට වාර්ෂික ව ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම අප සංගමයේ ප්‍රධාන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය 2005 වර්ෂයේ දී ආරම්භ කොට ඉදිරියට පවත්වාගෙන යන්නකි. වර්තමානයේ සෑම ශිෂ්‍යත්වලාභියකුට ම වසර 3ක් 4ක් හෝ 5ක් (උපාධියට අනුව) සඳහා රුපියල් 2,500 බැගින් වසරකට වාරික 10 ක් වාර්ෂික ව රුපියල් 25,000/- මුදලක් ප්‍රදානය කෙරේ. මෙම ශිෂ්‍යත්ව වැඩසටහන රටේ දුෂ්කර ප්‍රදේශවල බොහෝ වරප්‍රසාද නොමැති ගම්මානවලින් කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ උපාධි අපේක්ෂකයින්ට ආශිර්වාදයක් වී ඇත. උපාධි අපේක්ෂකයින් 150 කට අධික පිරිසකට වාර්ෂික ව රුපියල් මිලියන 3.75 ක පමණ මුදලක් වැය වේ. ශිෂ්‍යත්ව ප්‍රදානයට අමතර ව ශිෂ්‍ය අවශ්‍යතා ඉදිරිපත් කරන අවස්ථාවල දී හැකි උපරිමයෙන් එම කටයුතු සපුරාදීමට සංගමය විසින් කටයුතු කරනු ලැබේ.

විද්‍යාර්ථීන්ගේ කුශලතා අගයනු වස් පීඨ හයේ වැඩි ම ලකුණු ලබාගත් විද්‍යාර්ථීන්ට වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේ දී වෙන වෙන ම රන් පදක්කම් පිරිනමනු ලැබේ. විශ්වවිද්‍යාලයීය විශ්‍රාමික ආචාර්යවරුන් ඇගයීම වාර්ෂික මහාසභා රැස්වීමේ දී වාර්ෂික ව සිදුකරනු ලැබේ.

දූරකථන අංකය 0112903838

විද්‍යුත් තැපැල alumniuok2@gmail.com

ශිෂ්‍යත්ව අයදුම් පත් https://units.kln.ac.lk/alumni-relations/index.php/scholarship-application-form